272 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 272 - இல. 9
Volume 272 - No. 9

2019 ජූලි 11වන බ්‍රහස්පතින්දා
2019 யூலை 11 , வியாழக்கிழமை
Thursday, 11th July, 2019

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
පළමුවන වර කියවන ලදි

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) – [ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය] - පළමුවන වර කියවන ලදී

අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංගත්වය
යෝජනාව නිශ්ප්‍රභ විය

பிரதான உள்ளடக்கம்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்:
முதன் முறை மதிப்பிடப்பட்டது

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
இலங்கை பிளாஸ்ரிக் மற்றும் இறப்பர் நிறுவகம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன] - முதன் முறை மதிப்பிடப்பட்டது

பிரதம அமைச்சர், அமைச்சரவை உள்ளிட்ட அரசாங்கம்மீதான நம்பிக்கையின்மை
பிரேரணை தோல்வியுற்றது

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
Plastics and Rubber Institute of Sri Lanka (Incorporation) - [The Hon. (Dr.) (Mrs.) Thusitha Wijemanna] - Read the First time

VOTE OF NO CONFIDENCE IN PRIME MINISTER, CABINET AND GOVERNMENT
Motion Negatived

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2019 ජූලි 11වන බ්‍රහස්පතින්දා
2019 யூலை 11 , வியாழக்கிழமை
Thursday, 11th July, 2019

පූ. භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப.10.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2019 ජූලි මස 11 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පූර්ව භාග 11.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

- 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIX කොටස සහ නවවැනි කාණ්ඩයේ XI කොටස;
- 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIV කොටස;
- 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVIII කොටස සහ තෙවැනි කාණ්ඩයේ VI කොටස; සහ
- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ VII සහ XXXV කොටස්

මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளு மன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්

මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

- 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ
- 2016 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව

එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

(i) 2015/2016 වර්ෂය සඳහා සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2014 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ වාර්තාව එකී ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ජෝන් අමරතුංග මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිනිය - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු රංජිත් අලුවිහාරේ මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා සහ කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩ බලන අමාත්‍යතුමා)
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சரும் கைத்தொழில், வாணிப அலுவல்கள், நீண்டகாலமாக இடம்பெயர்ந்த நபர்களின் மீள்குடியேற்றம் மற்றும் கூட்டுறவுத்துறை அபிவிருத்தி பதில் அமைச்சரும்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce and Acting Minister of Industry and Commerce, Resettlement of Protracted Displaced Persons and Co-opertive Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) රත්නපුර, නව රෝහල පාර, අංක 25/1 දරන ස්ථානයේ පදිංචි එම්.ඒ.ඩී.එස්. කුලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) තිහගොඩ, කපුදූව, වලව්වත්ත, "ධම්මික" යන ලිපිනයේ පදිංචි එම්.ඩී.ජී.ජී. රණවීර මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) කෑගල්ල, හැලමඩ, ගල්කඩුව, මහ ගෙදර යන ලිපිනයේ පිදංචි පී.ජී. පතිරත්න මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) වැලිගම, කප්පරතොට, "ආරිය නිවස" යන ලිපිනයේ පදිංචි එස්.පී. හේවාවිතාරණ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அச்சுவேலி தெற்கு, அச்சுவேலி எனும் முகவரியில் வதியும் திரு. நாகராஜா பகீதரன் என்பவரிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவைச் சமர்ப்பிக்கின்றேன்.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කන්තලේ, 87 පෙදෙස, අංක 21 දරන ස්ථානයෙහි පදිංචි එම්.එම්. චාන්දනී මාරකෝන් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 -11/'18- (3), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -92/'18- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වී අලෙවි මණ්ඩලය මිලදී ගත් වී: විස්තර
நெல் சந்தைப்படுத்தல் சபையினால் கொள்வனவு செய்யப்பட்ட நெல்: விபரம்
PADDY PURCHASED BY PADDY MARKETING BOARD : DETAILS

149/’18

3. ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා යල හා මහ කන්නවලදී වී අලෙවි මණ්ඩලයෙන් මිලදී ගත් වී ප්‍රමාණය, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ මිලදී ගත් වී අතරින් සහල් බවට පත් කර දේශීය වෙළෙඳ පොළට නිකුත් කළ සහල් ප්‍රමාණය කොපමණද;

(iii) එම කාලසීමාව තුළ සත්ව ආහාර සඳහා වී අළෙවි කර තිබේ නම්, එසේ වී මිලදී ගත් පුද්ගලයන්ගේ හා ආයතනවල නම් සහ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப் பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டிலிருந்து இற்றைவரை சிறு போகம் மற்றும் பெரும் போகத்தில் நெல் சந்தைப்படுத்தல் சபையின் மூலம் கொள்வனவு செய்யப்பட்ட நெல்லின் அளவு ஒவ்வொரு மாவட்ட வாரியாக தனித்தனியாக யாது என்பதையும்;

(ii) அவ்வாறு கொள்வனவு செய்யப்பட்ட நெல்லி லிருந்து அரிசியாக்கப்பட்டு உள்நாட்டுச் சந்தைக்கு அனுப்பப்பட்ட அரிசியின் அளவு யாது என்பதையும்;

(iii) இக்காலப் பகுதியில் விலங்குத் தீவனத்திற்காக நெல் விற்கப்பட்டிருக்குமாயின், அவ்வாறு நெல்லை கொள்வனவு செய்த ஆட்கள் மற்றும் நிறுவனங்களின் பெயர்களும் விலைகளும் தனித்தனியாக யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the quantity of paddy purchased by the Paddy Marketing Board in the Yala and Maha seasons from 2010, to date in respect of each district, separately;

(ii) out of the volume, the amount that was converted into rice and released to the domestic market; and

(iii) if paddy has been sold as animal feed during that period, the names of persons who bought paddy and the prices at which they were bought, separately?

(b) If not, why?

ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කරමි. (ඇමුණුම 01 **සභාගත*** කරමි.)

(ii) ඇමුණුම 02 හි දැක්වේ.

(ඇමුණුම 02)

සහල් වර්ගය	ප්‍රමාණය (කිලෝග්‍රෑම්)
සුදු කැකුළු	7,585
රතු කැකුළු	4,425
රතු නාඩු	2,092
ගෝල්ඩන් රයිස්	61,024
මුළු ප්‍රමාණය	**75,126**

(iii) ඇමුණුම 03 හි දැක්වේ.

සත්ව ආහාර සඳහා වී තොග නිකුත් කිරීම
වී අලෙවි මණ්ඩලය

(ඇමුණුම 03)

අනු අංකය	වී මිලදී ගැනීම සිදු කළ සමාගමේ නම	කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රු.
1	ෆෝචූන් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම	24.00
2	සී අයි සී ෆීඩ්ස් (පුද්) සමාගම	24.00
3	පුස්සැල්ල මීට් ප්‍රඩියුසර්ස් (පුද්) සමාගම	24.00
4	සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම	24.00
5	නිව් හෝප් ලංකා සමාගම	24.00
6	ගෝල්ඩ් කොයින් ලංකා සමාගම	24.00
7	ආරෝග්‍යා ෆාම් (පුද්) සමාගම	24.00
8	සුපර් ෆීඩ් (පුද්) සමාගම	24.00
9	නෙල්නා ෆාම් (පුද්) සමාගම	24.00

(ආ) අදාළ නොවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, පිළිතුරු ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චමින්ද විජේසිරි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා 2019 වර්ෂයේ වී මිලදී ගැනීම් විශාල ප්‍රමාණයක්, දිස්ත්‍රික්ක වශයෙන් කළාය කියන කාරණය සඳහන් කළා. මගේ දෙවැනි ප්‍රශ්නයෙන් මම ඇහුවේ මෙයයි. අපේ වෙළෙඳ පොළට එහෙම නැත්නම් අපේ රටේ හාල් පාරිභෝජනය කරන පාරිභෝගිකයන්ට අවශ්‍ය කරන හාල් ප්‍රමාණයේ නිෂ්පාදනයක් දකින්නේ නැහැ. මිලදී ගැනීම විතරක් වී අලෙවි මණ්ඩලයෙන් කෙරෙන කාර්යභාරයක් කියන කාරණය අපට හිතන්න බැහැ, ගරු ඇමතිතුමනි. අපි දකිනවා, දීර්ඝ කාලයක් තිස්සේ මේ වැඩ පිළිවෙළ මෙසේ සිද්ධ වුණා කියලා. වී මිලදී ගැනීම් කරනවා; ගබඩා කරනවා; අඩු මිලට සපයනවා. ඒ විතරක් නොවෙයි, දැන් සමහර පවුල්වලට කන්නත් නැහැ. සමහර වී සත්ව ආහාරවලට පවා දීලා තිබෙනවා. ඔබතුමා මේ අමාත්‍යාංශය භාරගෙන සුළු කාලයක් බව අපි දන්නවා. නමුත්, මේ සුළු කාලය තුළ ඔබතුමා විශාල කාර්යභාරයක් කළා. ගරු ඇමතිතුමනි, මේ වී සහල් බවට පත් කරලා දේශීය අවශ්‍යතාවටත් අරගෙන, අතිරික්තය විදෙස් රටවලට යැවිය හැකි වැඩ පිළිවෙළක් නිර්මාණය කළ හැකිව තිබෙනවා. අපි එය පැහැදිලිව දකිනවා. රටේ තිබෙන අනෙක් පෞද්ගලික ව්‍යාපාර දිහා බැලුවාම ඔවුන් දිනෙන් දින ලාභ ලබනවා විතරක් නොවෙයි, සුවිශේෂී විධියට රට පුරා තමන්ගේ ඒකාධිකාරය මෙහෙයවනවා. මේ ඒකාධිකාරය නොමැතිව රටේ පුරවැසියා හරහා රටේ ආර්ථිකයට ශක්තියක් දෙන්න පුළුවන් වැඩ පිළිවෙළක අවශ්‍යතාව වර්තමානය තුළ අපි දකිනවා, ගරු අමාත්‍යතුමනි. මම හිතනවා, ඔබතුමාට ඒ ඉලක්කය කරා යන්න පුළුවන් ශක්තිය සහ ආශීර්වාදය තිබෙනවා කියලා. එවැනි වැඩ පිළිවෙළක් මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවාද? ඉතිහාසයේ සිදු කළ ඒ අකර්මණ්‍ය වූ වැඩ පිළිවෙළ ඔබතුමන්ලාත් දිගින් දිගටම ඉදිරියට ගෙන යනවාද කියන කාරණය තමයි මට අහන්න තිබෙන්නේ.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් රටේ වී නිෂ්පාදනයෙන් සියයට 10කට ආසන්න ප්‍රමාණයක් තමයි වී අලෙවි මණ්ඩලයෙන් මිලදී ගැනීම කරන්නේ. සියයට 90කට ආසන්න ප්‍රමාණයක් පෞද්ගලික අංශයෙන් මිලදී ගැනීම සිදු කරනු ලබනවා. සහල් නිෂ්පාදනය වෙනුවෙන් අපි දැනටමත් ක්‍රියා මාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම මෙවර වී මිලදී ගැනීම දිසාපතිවරු හරහා සිදු කරනු ලැබුවා. ඒ අන් කවරක් නිසාවත් නොවෙයි, පසුගිය කාලවල ඇති වුණු යම් යම් ප්‍රශ්න සහ ඇති වුණු අක්‍රමිකතා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහායි. ඒ වාගේම, දිසාපතිවරු හරහා එම වී අළෙවි කරලා කුඩා මෝල් හිමියන්ට ඒ වී තොග ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වනවා. ඒ තුළින් කුඩා මෝල් හිමියන්ගේ කර්මාන්තය දියුණු කරනවා වාගේම, සාධාරණ මිලකට වෙළෙඳ පොළට ඒ සහල් අළෙවි කිරීමේ වැඩසටහනක් අපි දැනටමත් ක්‍රියාත්මක කර ගෙන යනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සමාජයේ, රටේ, දේශපාලනයේ දී චෝදනා කරන්නේ, පෞද්ගලික කණ්ඩායමක -මාෆියාවක් හැටියට තිබෙන - අවශ්‍යතාව වෙනුවෙන් වී අලෙවි මණ්ඩලය කටයුතු කරන බවයි. කෙදිනවත් රජය විධියට වී අලෙවි මණ්ඩලයෙන් යම් වැඩ පිළිවෙළක් සිදු වන්නේ නැහැ කියලායි. මේ වනකොටත් විශාල වී තොගයක් මිලදී ගැනීම අතිසාර්ථකව කරලා තිබෙන බව පැහැදිලිවම අපි දකිනවා. අවසානයේ දී සිද්ධ වෙන්නේ, එම වී තොග නැවතත් වංචනිකයන් කරා යැම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් යොදන එකයි. එවැනි චෝදනාවක් ඔබතුමාට එල්ල කරනවා. එම චෝදනාවට ඔබතුමා දෙන පිළිතුර මොකක්ද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියපු කාරණය නිවැරැදියි. විවෘත වෙළෙඳ පොළේ වෙන්දේසි කළාම ප්‍රධාන වී මෝල් හිමියන් කිහිපදෙනා තමයි මේ මිලදී ගැනීම් සිදු කරන්නේ. ඒ නිසා තමයි අපි මෙවර දිසාපතිවරුන් හරහා වී මිලදී ගැනීම වාගේම දිසාපතිවරුන් හරහා වී අළෙවි කිරීමත් සිදු කරන්න බලාපොරොත්තු වෙන්නේ. එහිදී කුඩා වී මෝල් හිමියන්ට විශේෂත්වයක් වන විධියට ඒ කටයුත්ත කරන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ.

ත්‍රිවිධ හමුදාවේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරින් : විස්තර

முப்படைகளில் பணியாற்றும் மருத்துவர்களின் எண்ணிக்கை: விபரம்

MEDICAL OFFICERS SERVING IN TRI FORCES: DETAILS

221/'18

4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවය කරනු ලබන වෛද්‍ය නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංක එක් එක් හමුදාව අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை இராணுவத்தில், இலங்கைக் கடற்படையில் மற்றும் இலங்கை விமானப் படையில் பணியாற்றும் மருத்துவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) இவர்களின் பெயர்கள் மற்றும் இவர்களின் இலங்கை மருத்துவ சங்கப் பதிவு இலக்கங்கள் ஒவ்வொரு படைகளுக்கும் ஏற்ப தனித்தனியாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House-

(i) separately the number of medical officers serving in Sri Lanka Army, Sri Lanka Navy and Sri Lanka Air Force; and

(ii) separately in terms of each force the names of those medical officers and their numbers of registration with Sri Lanka Medical Council?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - 224

ශ්‍රී ලංකා නාවික හමුදාව- 56

ශ්‍රී ලංකා ගුවන් හමුදාව - 43

(ii) ඔව්. ඇමුණුම (i), (ii), (iii) හි දැක්වේ.

* ඇමුණුම් සභාගත කරමි.

(ආ) අදාළ නොවේ.

(ඇමුණුම i)

** සභාමේසය මත තබන ලද ඇමුණුම්:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
**Annexes tabled:*

<u>යුද්ධ හමුදා වෛද්‍ය - නිත්‍ය බලකාය</u>

අ:අ:	නි:අංකය	නිලය	නම	ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	නි/60089	මේජර් ජෙනරාල්	කේපී සුමනපාල	9105
2	නි/61891	බ්‍රිගේඩියර්	එච්ටී වික්‍රමසේකර	86
3	නි/61631	කර්නල්	පීඑස් තිලකරත්න	10563
4	නි/63392	කර්නල්	කේපීඑන් පතිරණ	12912
5	නි/63393	කර්නල්	එච්එම්ඩබ්ලිව් හේරත් යූඑස්පී	10236
6	නි/63398	කර්නල්	ඩබ්එච්යූඩී විජේරත්න	13599
7	නි/61848	කර්නල්	ඒඑම්සී අත්තනායක යූඑස්පී	10509
8	නි/61509	කර්නල්	කේජීකේඑච් විජේවර්ධන ආර්එස්පී යූඑස්පී	14146
9	නි/63396	ලුතිනන් කර්නල්	කේකේඑම් කන්නන්ගර	13630
10	නි/62162	ලුතිනන් කර්නල්	ඩීකේඑස්එස් දොඩංගොඩ ආර්එස්පී යූඑස්පී	14157
11	නි/62202	ලුතිනන් කර්නල්	එස්එල්එස් කුමාරගේ යූඑස්පී	14741
12	නි/62523	ලුතිනන් කර්නල්	ආර්කේපී පුෂ්ප කුමාර ආර්එස්පී	15523
13	නි/64581	ලුතිනන් කර්නල්	එස්ජී ශාන්ත කුමාර	16442
14	නි/64578	ලුතිනන් කර්නල්	එම්පීඑස්ආර් අමරසේකර යූඑස්පී	16472
15	නි/64715	ලුතිනන් කර්නල්	ඩබ්ලිව්පී ධර්මප්‍රිය යූඑස්පී	16729
16	න/64580	ලුතිනන් කර්නල්	ඩීආර්එස්ජී ජයමාන්න ආර්එස්පී යූඑස්පී	16794
17	නි/62197	ලුතිනන් කර්නල්	ආර්එම්යූකේ රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී	13676
18	නි/65532	ලුතිනන් කර්නල්	කේඑම්ජීපීකේ කහන්තේන් යූඑස්පී	18300
19	නි/62190	මේජර්	එස්ජීකේ පීරිස් ආර්එස්පී	14711
20	නි/64714	මේජර්	ඩබ්ලිව්එච්කේ විමලරත්න යූඑස්පී	16951
21	නි/65187	මේජර්	ඩබ්ලිව්එම්එච්එස් වීරසූරිය	19368
22	නි/65525	මේජර්	එම්ඩීඑච්ආර් සුමනසේකර ආර්එස්පී	19856

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

23	නි/65529	මේජර්	එන්එම් නිෆ්ලාර් යූඑස්පී	19699
24	නි/65523	මේජර්	ඩීඑම්ඩීජේ දිසානායක ආර්එස්පී යූඑස්පී	20246
25	නි/65685	මේජර්	එම්එස් සමරවික්‍රම යූඑස්පී	20923
26	නි/65530	මේජර්	එම්එස් නියාස් යූඑස්පී	21077
27	නි/65527	මේජර්	ආර්එම්ඩීබී රාජපක්ෂ යූඑස්පී	21310
28	නි/65755	මේජර්	ටීඑම්ජීඑන්කේ තෙන්නකෝන් යූඑස්පී	21146
29	නි/65695	මේජර්	එන්එච්යූ පෙරේරා	21373
30	නි/65696	මේජර්	එන්ඩබ්ලිව්එම්යූබී නක්කාවිට යූඑස්පී	21503
31	නි/65603	මේජර්	එච්පීඩී ගල්ගොඩැල්ල	22422
32	නි/65772	මේජර්	කේඩබ්ලිව්ඩබ්ලිව්එම්පීජ්ඩබ්ලිව්එන්පී විජේකෝන්	23161
33	නි/65775	මේජර්	වීජ්එම්එන් ද සිල්වා	22639
34	නි/65698	මේජර්	එච්එම්එස්අයි රණවීර	23451
35	නි/65526	මේජර්	කේකේටී ආරියතිලක	22512
36	නි/66030	මේජර්	එස්එච්එස් මධුභාෂිණී	24727
37	නි/66031	මේජර්	කේආර්ජී පෙරේරා	24649
38	නි/66105	මේජර්	ඩබ්ලිව්පීවයිජී පතිරණ	24645
39	නි/65531	මේජර්	පීජීජේ රෝහිත ආර්එස්පී	24330
40	නි/65773	මේජර්	ටීඩීඑන්ආර් ප්‍රනාන්දු	24422
41	නි/65973	මේජර්	එල්ඩී රත්නවීර	25561
42	නි/66269	මේජර්	එන්පීඑස් හදපාන්ගොඩ ආර්එස්පී	26302
43	නි/68466	මේජර්	කේපී හසන්ත	26177
44	නි/67478	මේජර්	ඩබ්ලිව්ජ්එන්සී විජේසිංහ	26556
45	නි/66262	මේජර්	එම්එම්ජීසී මාරසිංහ	27031
46	නි/66263	මේජර්	එල්අයි මාදුළුගේ	26798
47	නි/67836	මේජර්	පීඑල්ජ්ජ් ලේකම්ගේ	27129
48	නි/67480	මේජර්	ඩබ්ලිව්එෆ්අයි පෙරේරා	27216
49	නි/67481	මේජර්	ඩීවයිඑස් කුමාර	27147

50	නි/67896	මේජර්	ආර්පීඑම් ප්‍රසංග	27205
51	නි/67901	මේජර්	එච්ජ් ධර්මසිරි	27336
52	නි/67902	මේජර්	ඩී විජේසිංහ	27010
53	නි/66270	මේජර්	කේඑච් පතිරාජ	27632
54	නි/68464	මේජර්	පීඑස්එන් ඩයස්	27558
55	නි/66271	මේජර්	එම්පීබියූ උළුවිටිගේ	28407
56	නි/66261	මේජර්	ඩීඑම්ආර් වික්‍රමසිංහ	28307
57	නි/67903	මේජර්	ජීකේඑස් ප්‍රියරත්න	28469
58	නි/68455	මේජර්	පීජ්එස්ඩී ජෝතිපාල	27713
59	නි/66543	මේජර්	එන්එල්ඩීසී සඳරුවන්	28679
60	නි/67904	මේජර්	ජේටීඑස් මධුරංග	28665
61	නි/68463	මේජර්	ජේජ්ඩීසීඑච් ජයසිංහ	29216
62	නි/67475	මේජර්	එස්ජීඩී සසංක	28795
63	නි/68454	මේජර්	ජ්ජීඑන්පී ජයසිංහ	29220
64	නි/68457	මේජර්	එස්එම් තිලකරත්න(බිබිඑස් මධුරංග)	29682
65	නි/68103	මේජර්	පිකේවිජී කපුගමගේ	29709
66	නි/68458	මේජර්	ඩබ්ජීඑල් ජයරත්න	29695
67	නි/67477	කපිතන්	ඩබ්එල්එස් ඩයස්	24342
68	නි/68761	කපිතන්	ජ්එම්කේ අත්තනායක	23893
69	නි/67110	කපිතන්	එල්වී ජයසිංහ	28841
70	නි/67097	කපිතන්	එම්ඩබ්ඩීටීබී රඹුක්වැල්ල	29590
71	නි/68460	කපිතන්	ආර්එම්ඩීඅයි රත්නායක	29703
72	නි/68938	කපිතන්	එම්බීබීඑල්එන් බණ්ඩාර	29546
73	නි/67101	කපිතන්	එම්පිආර්වයි ප්‍රනාන්දු	29744
74	නි/65518	කපිතන්	ටීඑම්එස් තෙන්නකෝන්	30619
75	නි/68983	කපිතන්	ඩීඑම්ඩීඑන් දිසානායක	30663
76	නි/68990	කපිතන්	ඩබ්ඩීකේඑල් ආරියවංශ	30482

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

77	නි/67912	කපිතන්	එස්ඩබ්ආර් සෝමවීර	30593
78	නි/68940	කපිතන්	කේඑම්එස්ටී කුලතුංග	29926
79	නි/68104	කපිතන්	එස්එච්ටී දිසෙන්කා	30265
80	නි/69154	කපිතන්	එස්ජීඑස් ද සිල්වා	30271
81	නි/67913	කපිතන්	එස්ජෙ හලංගොඩ	31085
82	නි/68461	කපිතන්	එන්ජීසී ප්‍රියශාන්ත	31175
83	නි/69152	කපිතන්	ජීජීඑල්එම් ගුණසේකර	31164
84	නි/68981	කපිතන්	ඊ සෙනවිරත්න	31434
85	නි/67100	කපිතන්	ඩබ්එම්ජ් වනසිංහ	32165
86	නි/68726	කපිතන්	ඩීටී මාරසිංහ	31254
87	නි/68757	කපිතන්	ඩීඩබ්එස්එම්කේ සිල්වා	31360
88	නි/68758	කපිතන්	පීටීපී පින්නදූව (පීටී පැතුම්)	31479
89	නි/68759	කපිතන්	යූඅයි මාපලගම	32639
90	නි/68964	කපිතන්	සීඩී රාජසේකර	32788
91	නි/68965	කපිතන්	එච්එම්යූසී හෙරත්	32621
92	නි/68966	කපිතන්	එස්එස් රත්නවීර	33244
93	නි/69246	කපිතන්	කේඑම්ඩීටී ගුණරත්න	33341
94	නි/69646	කපිතන්	එච්කේඑස් නිරෝෂාන්	32768
95	නි/69634	කපිතන්	ජ්එම්එම්ඩී අල්විස්	32677
96	නි/69643	කපිතන්	ඩබ්ජ්එම්ටීබී අබේසේකර	32657
97	නි/69639	කපිතන්	එන්අයි රත්නායක	32797
98	නි/69641	කපිතන්	එම්එල්ජේ කරුණාරත්න	32746
99	නි/69640	කපිතන්	බීකේසීකේකේ බද්දේගම	32667
100	නි/69644	කපිතන්	ඩබ්ජ්ඩීපී කරුණාරත්න	32740
101	නි/69645	කපිතන්	ඩබ්අයි මහේන්ද්‍ර	32755
102	නි/69642	කපිතන්	එම්සීඑස් රණවීර	32839
103	නි/69638	කපිතන්	ඩීජීටීඅයි දොඩන්ගොඩ	32686
104	නි/69636	කපිතන්	ජීඑම්ජේජේ ගාල්ලගේ	32695
105	නි/69633	කපිතන්	ජ්ඩී මුතුමාල	32975
106	නි/69635	කපිතන්	ජීඩීකේබී ආරියරත්න	32656
107	නි/69647	කපිතන්	ඩබ්සීඊ වික්‍රමරත්න	32833
108	නි/69637	කපිතන්	ඩීඩබ්පීකේජීපීඑම් ගුණවර්ධන	32925
109	නි/68978	කපිතන්	ජීජීආර්පී විමලසේන	33962
110	නි/68984	කපිතන්	කේජ්ජීඩී සෝමවික්‍රම	33993

111	නි/69245	කපිතන්	ඩබ්ජේඑල්එස් අභයනන්ද	33797
112	නි/68999	කපිතන්	කේසි ජයසේකර	34041
113	නි/69548	කපිතන්	ඩීඩබ්ජේඑස් ඉසංක	34300
114	නි/69425	කපිතන්	කේඑම්බීඑන් ගලගෙදර	34225
115	නි/69549	කපිතන්	ජීටිආර් අපොන්සු	34072
116	නි/69890	කපිතන්	ඩබ්පිජේඑම් අබේසේකර	34239
117	නි/69888	කපිතන්	ආර්කේඑස් දිලංක	34249
118	නි/69879	කපිතන්	ටිජේඑස්එල් කරුණාරත්න	34310
119	නි/69875	කපිතන්	කේඑම් පරාක්‍රම	34625
120	නි/69874	කපිතන්	ඒඩබ් ගෝනිවර්ධන	34238
121	නි/69876	කපිතන්	කේඑම්ජීඑල් ඩයස්	34272
122	නි/69884	කපිතන්	පිඩබ්එල් සම්පත්	34240
123	නි/69887	කපිතන්	එම්සියු දසනායක	34273
124	නි/69889	කපිතන්	එල්පි අරවින්ද	34257
125	නි/69882	කපිතන්	ඩීඑස් ජයවීර	34027
126	නි/69878	කපිතන්	ටිජේකේපි තිලකරත්න	34358
127	නි/69885	කපිතන්	පිඑම්ටි දිවිදු	34277
128	නි/69883	කපිතන්	එන්එන්එන් මදුශංක	34248
129	නි/69881	කපිතන්	ඩීඑල්එම් ප්‍රසාද්	35384
130	නි/69886	කපිතන්	එම්කේඩීජී ජයරත්න	35376
131	නි/69877	කපිතන්	ටිජේඑස්පි ජයතිලක	35430
132	නි/68992	කපිතන්	එම්එස්එල් කුරේ	36281
133	නි/69792	කපිතන්	කේවිජී මදුසංක	35490
134	නි/69740	කපිතන්	එන්ටි වික්‍රමසිංහ	35753
135	නි/69741	කපිතන්	ඩබ්ජේඅයියු වන්නිආරච්චි	36251
136	නි/69724	කපිතන්	අයි වික්‍රමආරච්චි	36259
137	නි/69742	කපිතන්	පිඑම්වයි කල්හාරි	36130
138	නි/69880	කපිතන්	ඩීඑම්අයිටි බණ්ඩාර	36045
139	නි/70117	කපිතන්	යුඑච් කපුගේ	36133
140	නි/70119	කපිතන්	ජිබි නයනජිත්	36180
141	නි/70120	කපිතන්	සි ජයසිංහ	36120
142	නි/70121	කපිතන්	ජේජේවිඩබ් ජයතුංග	36124
143	නි/70122	කපිතන්	ජේඑච්පිඩබ්බි ජයමහ	36118
144	නි/70123	කපිතන්	ජේපිඩීඑම් පතිරණ	36190
145	නි/70124	කපිතන්	ඩීපිඩී පෙරේරා	36193
146	නි/70125	කපිතන්	එන්ඩබ්ටිඩිබි නාගහපිටිය	36178
147	නි/70126	කපිතන්	පිඑන් වඩුගේ	36248
148	නි/70127	කපිතන්	එම්එස් අබේසිංහ	36032
149	නි/70128	කපිතන්	එම්අයිඩී පෙරේරා	36192
150	නි/70129	කපිතන්	ආර්එස්පි ප්‍රේමරත්න	36204

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

151	නි/70130	කපිතන්	ආර්පිජේ රඹුක්කන	36565
152	නි/70131	කපිතන්	ඩබ්ල්ඩීජ්කේ රත්නසේකර	36216
153	නි/70132	කපිතන්	ඩබ්ල්ඩීඩීටී රත්නසේකර	36217
154	නි/70133	කපිතන්	ඩබ්එම්ඩීකේබී වීරසිංහ	36253
155	නි/70134	කපිතන්	එච්ටීආර්ඩබ් දිසානායක	36076
156	නි/70135	කපිතන්	එච්එම්සී හේරත්	36106
157	නි/70136	කපිතන්	එල්පීඑස් ද සිල්වා	36064
158	නි/70115	කපිතන්	ඩබ්ජීඑස් සඳරුවන්	36810

යුද්ධ හමුදා වෛද්‍ය - ස්වේච්ඡා බලකාය

අනු අංකය	නි අංකය	නිලය	නම	ශ්‍රීලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	නි/4677	කර්නල්	බීඑල් රණසිංහ	11631
2	නි/8297	ලුතිතන් කර්නල්	එච්එච්එල්කේ ප්‍රනාන්දු	13860
3	නි/5501	මේජර්	එම්එම් රිස්වි ආර්එස්පී	15465
4	නි/5805	මේජර්	ආර්ජ්ඩබ් විජයසිංහ	20243
5	නි/5809	මේජර්	කේඩීපී ද ඒ විජේසිංහ	20379
6	නි/5811	කපිතන්	ආර්එස් මානවිකම	35398
7	නි/10610	කපිතන්	පීඑස් හෙට්ටිආරච්චි	22624

යුද්ධ හමුදා වෛද්‍ය - නිත්‍ය බලකාය

අනු අංකය	නි අංකය	නිලය	නම	ශ්‍රීලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	නි/64840	මේජර්	එල් සී කුලතුංග යූඑස්පී	2766
2	නි/64841	මේජර්	එස්එච්පීසී ද සිල්වා යූඑස්පී	2812
3	නි/64842	මේජර්	ජේආර්කේ සමරකෝන් යූඑස්පී	2782
4	නි/64843	මේජර්	එච්බී නිහාල් ආර්එස්පී යූඑස්පී	2821
5	නි/64845	මේජර්	බීඑම්එන් පුෂ්පකුමාර යූඑස්පී	2768
6	නි/64846	මේජර්	ජ්කේජීඩී විනිතකුමාර යූඑස්පී	2825
7	නි/64847	මේජර්	ආර්යූ වීරසිංහ ආර්එස්පී	2839
8	නි/64848	මේජර්	ඩබ්බීඑම්කේපී බණ්ඩාර යූඑස්පී	2814
9	නි/64900	මේජර්	ආර්එස් ගුණවර්ධන	2753
10	නි/66977	මේජර්	ඩීඩබ්ආර් හිරන්ත	2972
11	නි/66978	මේජර්	එම්බීර් ප්‍රදීප්	2978
12	නි/66979	මේජර්	ජීඅයි හේවාගම ආර්එස්පී	2971
13	නි/68468	මේජර්	බීඑම්ජී විජේකුමාර	2985
14	නි/68469	කපිතන්	ආර්සී අඹේපිටිය	2982
15	නි/66980	කපිතන්	එච්ජීඩබ්ජ්ඩියූ බණ්ඩාර	3005
16	නි/66976	තා/කපිතන්((උපා) කාර්මික)	එස් යෝගරාජන්	2981

යුද හමුදා විශේෂඥ වෛද්‍ය - නිත්‍ය බලකාය

අ:අ:	නි:අංකය	නිලය	නම	විශේෂය	ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	නි/60547	මේජර් ජෙනරාල්	එස්එච් මුණසිංහ ආර්ඩබලිව්පී ආර්එස්පී යූඑස්පී	විකිරණ රශ්මි කිරණ විශේෂඥ වෛද්‍ය	8665
2	නි/63149	බ්‍රිගේඩියර්	ඩීටීඑන් මුණසිංහ යූඑස්පී	විකිරණ රශ්මි කිරණ විශේෂඥ වෛද්‍ය	8938
3	නි/65624	බ්‍රිගේඩියර්	එම්ජ්ජ් මන්ත්‍රිරත්න	ළමාරෝග විශේෂඥ වෛද්‍ය	8302
4	නි/66202	බ්‍රිගේඩියර්	ජීඑම් ජයවීර	රසායනික ව්‍යාධවේදී විශේෂඥ වෛද්‍ය	9713
5	නි/61629	බ්‍රිගේඩියර්	පීජ්සී ප්‍රනාන්දු යූඑස්පී	නිර්වින්දන විශේෂඥ වෛද්‍ය	10234
6	නි/61634	කර්නල්	ඩබ්ලිව්පීආර්පී පීරිස්	විකලාංග ශල්‍ය විශේෂඥ වෛද්‍ය	8221
7	නි/67911	කර්නල්	කේඩී දුමින්ද	කායික රෝග විශේෂඥ වෛද්‍ය	14933
8	නි/62179	කර්නල්	ආර්එම්එම් මොණරාගල යූඑස්පී	මානසික රෝග විශේෂඥ වෛද්‍ය	14287
9	නි/68760	කර්නල්	ඩීසීජේ වික්‍රමආරච්චි	ප්‍රසව හා නාරිවේදී විශේෂඥ වෛද්‍ය	8366
10	නි/69156	කර්නල්	පීජ්එස් වාස්	විකිරණ රශ්මි කිරණ විශේෂඥ වෛද්‍ය	12817
11	නි/62200	කර්නල්	එස්එන් සේමගේ යූඑස්පී	ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය	14159
12	නි/64716	ලුතිː කර්නල්	කේජ්එල්එන් කුලරත්න	විකලාංග ශල්‍ය විශේෂඥ වෛද්‍ය	17871
13	නි/69841	ලුතිː කර්නල්	ඩීඑස් හෙයියන්තුඩුව	වෘක්කවේදී විශේෂඥ වෛද්‍ය	11737
14	නි/70112	ලුතිː කර්නල්	එස්එච් එගොඩගේ	විකිරණ රශ්මි කිරණ විශේෂඥ වෛද්‍ය	21026
15	නි/70113	ලුතිː කර්නල්	එන්එච්වීඑන්එම් පෙරේරා	රක්ත ව්‍යාධවේදී විශේෂඥ වෛද්‍ය	14330
16	නි/70234	ලුතිː කර්නල්	ජීකේ රාජපක්ෂ	ප්ලාස්ටික් ශල්‍ය වෛද්‍ය විශේෂඥ	20046
17	නි/70151	ලුතිː කර්නල්	එස්ජී උඩුගම	ක්ෂුද්‍රජීව විශේෂඥ වෛද්‍ය	18826
18	නි/70217	ලුතිː කර්නල්	ජේජ්පීඑන් ජයසිංහ	ළමා රෝග විශේෂඥ වෛද්‍ය	13008
19	නි/85220	ලුතිː කර්නල්	එස්ජ්ඩීවීආර් සේනාරත්න	ශල්‍ය වෛද්‍ය විශේෂඥ	20030
20	නි/85372	ලුතිː කර්නල්	කේජීඑන්යූ ජයසිංහ	කායික රෝග විශේෂඥ වෛද්‍ය	22711
21	නි/86160	ලුතිː කර්නල්	එම්ජ්එම්එස් කුරේ	කායික රෝග විශේෂඥ වෛද්‍ය	22608
22	නි/86183	ලුතිː කර්නල්	ජ්එම්පී ද්‍රාහ්මන්	ඇස,කන,නාස විශේෂඥ	22083

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

යුද්ධ හමුදා විශේෂඥ වෛද්‍ය - ස්වේච්ඡා බලකාය

අ:අ:	නි:අංකය	නිලය	නම	විශේෂය	ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	නි/6660	බ්‍රිගේඩියර්	පීටීආර් මකුලෝළුව	නිර්වින්දන විශේෂඥ වෛද්‍ය	8523
2	නි/7203	කර්නල්	යූඒඑල්ඩී පෙරේරා	නිර්වින්දන විශේෂඥ වෛද්‍ය	9287
3	නි/9479	ලුති:කර්නල්	ඒ බාලසූරිය	ප්‍රජා විශේෂඥ වෛද්‍ය	9845
4	නි/10052	ලුති:කර්නල්	ආර්ජේඑස් රත්නායක	සාමාන්‍ය ශල්‍ය විශේෂඥ වෛද්‍ය	16353
5	නි/10765	ලුති:කර්නල්	සීඑස් අබේසිංහ	නිර්වින්දන විශේෂඥ වෛද්‍ය	15927
6	නි/34021	ලුති:කර්නල්	ආර්ජ්ආර්එම්ආර්සීබී රාජකරුණා	විශේෂඥ ශල්‍ය වෛද්‍ය	16915
7	නි/34022	ලුති:කර්නල්	ඊඩබ්ආර්ර් විතාරණ	කායික රෝග විශේෂඥ වෛද්‍ය	16123
8	නි/34148	ලුති:කර්නල්	ඩී.එස්. ගුණසේන	නිර්වින්දන විශේෂඥ වෛද්‍ය	
9	නි/34149	ලුති:කර්නල්	ජේ.ඒ.එස්.බී. ජයසුන්දර	විශේෂඥ ශල්‍ය වෛද්‍ය	
10	නි/34150	ලුති:කර්නල්	ටී. වීරසුතාන්	කායික රෝග විශේෂඥ වෛද්‍ය	
11	නි/34151	ලුති.කර්නල්	ආර්.එල්.ගුණවර්ධන	විකලාංග විශේෂඥ වෛද්‍ය	

යුද්ධ හමුදා විශේෂඥ වෛද්‍ය - කොන්ත්‍රාත් පදනම මත

අ:අ:	නි:අංකය	නිලය	නම	විශේෂය	ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	නි/61640	බ්‍රිගේඩියර් (විශ්‍රාමික)	කේඑස්ඩී කරුණාරත් න	විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍ය	5084
2	නි/62683	බ්‍රිගේඩියර් (විශ්‍රාමික)	එන්කේ ආරියරත්න	කායික රෝග විශේෂඥ වෛද්‍ය	7218
3	නි/62670	බ්‍රිගේඩියර් (විශ්‍රාමික)	ජේඑස්එම් විජේවර්ධන	කායික රෝග විශේෂඥ වෛද්‍ය	7343
4	නි/5623	බ්‍රිගේඩියර් (විශ්‍රාමික)	එම් මුතුමාල	මුඛ හා හනුක විශේෂඥ ශල්‍ය වෛද්‍ය	481
5	නි/62679	බ්‍රිගේඩියර් (විශ්‍රාමික)	ඩබ්එම්ටීකියුපී විජේරත්න	ශල්‍ය විශේෂඥ වෛද්‍ය	6510
6	නි/5622	බ්‍රිගේඩියර් (විශ්‍රාමික)	පීජී වික්‍රමසූරිය	මුඛ හා හනුක ශල්‍ය වෛද්‍ය විශේෂඥ	778
7	-	-	එල්එම් අමරසිංහ	ප්ලාස්ටික් ශල්‍ය වෛද	4096
8	-	-	එච්ඩීජී ලීලානි පනංගල්ල	සන්ධි රෝග හා පුනරුත්ථාපන විශේෂඥ වෛද්‍ය	7649
9	-	-	ගාමිණී ගුණතිලක	ශල්‍ය විශේෂඥ වෛද්‍ය	5778
10	-	-	කේඒඑස් කුලතුංග	ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය	8134

(ඇමුණුම ii)

ශ්‍රී ලංකා නාවික හමුදාව

අනු අංකය	සේවා අංකය	නිලය	නම	වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	එන්ආර්එම් 0305	වෛද්‍ය රියර් අද්මිරාල්	ජීඑස්ආර් ජයවර්ධන	9361
2	එන්ආර්එම් 0848	වෛද්‍ය කොමදෝරු	පීජේබී මාරඹේ	12444
3	එන්ආර්එම් 0851	වෛද්‍ය කොමදෝරු	එම්බීපීසී විජේදාස	13647
4	එන්ආර්එම් 1381	වෛද්‍ය කපිතාන්	ඒඑච් මුල්ලේගම	13878
5	එන්ආර්එම් 1323	වෛද්‍ය කපිතාන්	එස්එම්ඩී චන්ද්‍රගුප්ත	15901
6	එන්ආර්එම් 1438	වෛද්‍ය කපිතාන්	එම් විජේනායක	17674
7	එන්වීඑම් 5700	වෛද්‍ය කපිතාන් (ස්වේච්ඡා)	එන්ආර්පී පෙරේරා	19042
8	එන්වීඑම් 5805	වෛද්‍ය කපිතාන් (ස්වේච්ඡා)	ටී.ඒ.හේනේගම	21312
9	එන්වීඑම් 5873	වෛද්‍ය කපිතාන් (ස්වේච්ඡා)	බීඑල්පීපී බාලසූරිය	20802
10	එන්වීඑම් 5874	වෛද්‍ය කපිතාන් (ස්වේච්ඡා)	එස්එන්කේ රොද්‍රිගෝ	13587
11	එන්ආර්එම් 1439	වෛද්‍ය කපිතාන්	එච්ඩීඅයි සමරවික්‍රම	18402
12	එන්ආර්එම් 1608	වෛද්‍ය කොමාණ්ඩර්	එම්.වී.එස්. අතුකෝරළ	17956
13	එන්ආර්එම් 1609	වෛද්‍ය කොමාණ්ඩර්	එච්.එම්.ඒ.ඒ.එස්. හේරත්	18842
14	එන්ආර්එම් 1811	වෛද්‍ය කොමාණ්ඩර්	ඩී.කේ. ආරියදේව	18806
15	එන්ආර්එම් 1611	වෛද්‍ය කොමාණ්ඩර්	එන්එල් උල්ලුවිස්හේවා	19165
16	එන්ආර්එම් 1612	වෛද්‍ය කොමාණ්ඩර්	එස්පීඑස් ජයසුමන	19346
17	එන්ආර්එම් 1810	වෛද්‍ය කොමාණ්ඩර්	ආර්එම්එස්කේ රාජපක්ෂ	19655
18	එන්ආර්එම් 1613	වෛද්‍ය කොමාණ්ඩර්	සී. අමරසේකර	20585
19	එන්ආර්එම් 1816	වෛද්‍ය කොමාණ්ඩර්	එන්එච්එම්සී අත්තනායක	20552
20	එන්ආර්එම් 1444	වෛද්‍ය කොමාණ්ඩර්	ඩබ්කේකේඩීසීඩී කොඩිතුවක්කු	21498
21	එන්ආර්එම් 1815	වෛද්‍ය කොමාණ්ඩර්	ඩබ්ජේසීබී වික්‍රමආරච්චි	20642
22	එන්වීඑම් 5829	වෛද්‍ය කොමාණ්ඩර් (ස්වේච්ඡා)	ඒඑන් සේනානායක	21234
23	එන්වීඑම් 5830	වෛද්‍ය කොමාණ්ඩර් (ස්වේච්ඡා)	ජී සේනානායක	21235
24	එන්වීඑම් 5760	වෛද්‍ය කොමාණ්ඩර් (ස්වේච්ඡා)	ආර්එම්එස් රත්නායක	16074
25	එන්ආර්එම් 1814	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	එච්යූඑස් සිල්වා	22363

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

26	එන්ආර්එම් 2556	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	එල් බුද්ධික	24397
27	එන්ආර්එම් 1619	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	එච්කේ ධර්මවීර	24711
28	එන්ආර්එම් 2405	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	ඩබ්ඩීපීඅයි තිලකවර්ධන	24915
29	එන්ආර්එම් 2408	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	ටීඑම්අයිජී බංඩාර	26372
30	එන්ආර්එම් 2409	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	වයිකේ අමරසිංහ	26225
31	එන්ආර්එම් 2785	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	කේඅයිඑස් බංඩාර	27755
32	එන්ආර්එම් 2783	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	ජීජේඑන්එස්එස් විජේවර්ධන	28695
33	එන්ආර්එම් 2784	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	ඩබ්ජේඑන් වික්‍රමසිංහ	28708
34	එන්ආර්එම් 2280	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	ඩීඑල්ඩීසීපීඑන් දන්වත්ත	29552
35	එන්ආර්එම් 2835	වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර්	ඩීඑම්ආර්එස් විජයපාල	29684
36	එන්ආර්එම් 2406	වෛද්‍ය ලුතිනන්	ජීඅයිඩී ද සිල්වා	25646
37	එන්ආර්එම් 3081	වෛද්‍ය ලුතිනන්	එච්එස්ඩී කුඩාහෙට්ටි	30001
38	එන්ආර්එම් 2457	වෛද්‍ය ලුතිනන්	එස්ආර් සමරවීර	30508
39	එන්ආර්එම් 2833	වෛද්‍ය ලුතිනන්	කේකේඩීටී අරුග්ගොඩ	32468
40	එන්ආර්එම් 3083	වෛද්‍ය ලුතිනන්	ඩබ්කේජ්පී ගුණසේකර	33343
41	එන්ආර්එම් 2984	වෛද්‍ය ලුතිනන්	බීඑල්එල් කරුණාතිලක	32742
42	එන්ආර්එම් 2985	වෛද්‍ය ලුතිනන්	එස්එස් වලතරආරච්චි	32835
43	එන්ආර්එම් 2986	වෛද්‍ය ලුතිනන්	එල්ජීඩබ් මදූෂාන්	32758
44	එන්ආර්එම් 2987	වෛද්‍ය ලුතිනන්	පීඑල්පී රත්නසේකර	33502
45	එන්ආර්එම් 2988	වෛද්‍ය ලුතිනන්	වයිබී වීරසිංහ	32844
46	එන්ආර්එම් 2828	වෛද්‍ය ලුතිනන්	යූකේ ජයසුන්දර	34783
47	එන්ආර්එම් 2829	වෛද්‍ය ලුතිනන්	එම්එම්ටීඑස් කුමාරි	34567
48	එන්ආර්එම් 3084	වෛද්‍ය ලුතිනන්	වීඑන්ඩබ් රණසිංහ	34346
49	එන්ආර්එම් 3085	වෛද්‍ය ලුතිනන්	බීජ්එම්අයි බස්නායක	34261
50	එන්ආර්එම් 3086	වෛද්‍ය ලුතිනන්	ඩීයූඑස්ජ් දිසානායක	35408
51	එන්ආර්එම් 2830	වෛද්‍ය ලුතිනන්	එම්ඩීඑච් සිල්වා	36062
52	එන්ආර්එම් 3184	වෛද්‍ය ලුතිනන්	බීටීඑම්පීඑස් ගුණවර්ධන	36100
53	එන්ආර්එම් 3326	වෛද්‍ය ලුතිනන්	ටීඑස් හක්මනආරච්චි	36102
54	එන්ආර්එම් 3178	උප ලුතිනන්	කේකේඩීඑම් රණවීර	37765
55	එන්ආර්එම් 3179	උප ලුතිනන්	ආර්ජ්එච්කේ ගුණවර්ධන	37567
56	එන්ආර්එම් 3746	වැ/බ උප ලුතිනන්	ඩබ්එන්එස් රජිත	37944

(ඇමුණුම iii)

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අනු අංකය	සේවා අංකය	නිලය	නම	වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය
1	01634	එයාර් වයිස් මාර්ෂල්	පී ඩී ජේ මාරිස්ටෙලා	8497
2	01877	එයාර් වයිස් මාර්ෂල්	එල් අර් ජයවීර	12898
3	01876	ගෘෘප් කැප්ටන්	එන් ඩී බී අබේසේකර	11744
4	01974	ගෘෘප් කැප්ටන්	ඒ එච් පී පී කාරියප්පෙරුම	13268
5	01992	ගෘෘප් කැප්ටන්	පී ජේ වී පද්මපෙරුම	15562
6	02154	ගෘෘප් කැප්ටන්	ටී වී එස් එස් අල්විස්	15861
7	02295	විංග් කමාන්ඩර්	ඒ ජයසේකර	17126
8	01889	විංග් කමාන්ඩර්	එච් පී ජේ එස් හේවාවසම්	17340
9	02155	විංග් කමාන්ඩර්	පී එස් එස් පෙරේරා	16443
10	02422	විංග් කමාන්ඩර්	එම් වෙදෝදයන්	17299
11	01901	විංග් කමාන්ඩර්	බී ආර් බුසෝ	17902
12	02342	විංග් කමාන්ඩර්	එස් ජේ සමරසිංහ	18538
13	02294	විංග් කමාන්ඩර්	එච් එම් ඒ පී විජේනායක	18316
14	02500	ස්කොඩ්‍රන් ලීඩර්	එස් පී වීරසිංහ	21339
15	02501	ස්කොඩ්‍රන් ලීඩර්	පී ඩී රාජපක්ෂ	21340
16	02644	ස්කොඩ්‍රන් ලීඩර්	එස් මද්දුමසූරිය	23863
17	02645	ස්කොඩ්‍රන් ලීඩර්	එස් සී රාජකරුණා	23683
18	02646	ස්කොඩ්‍රන් ලීඩර්	කේ පී සී ප්‍රනාන්දු	24472
19	02643	ස්කොඩ්‍රන් ලීඩර්	ඒ ආර් ගුණවර්ධන	23910
20	02647	ස්කොඩ්‍රන් ලීඩර්	එන් එම් ඩබ්ලිව් වැන්දර්පුට්	23910
21	02648	ස්කොඩ්‍රන් ලීඩර්	ඩබ්ලිව් පී බී පී වනසිංහ	25851
22	02653	ස්කොඩ්‍රන් ලීඩර්	ජේ ඩී එන් පෙරේරා	25723
23	02651	ස්කොඩ්‍රන් ලීඩර්	ඒ එන් එච් මෙන්ඩිස්	26532
24	02650	ස්කොඩ්‍රන් ලීඩර්	ආර් එස් එස් ජයතිලක	26756
25	02654	ස්කොඩ්‍රන් ලීඩර්	එස් සී බී මදුරාවල	27727
26	03375	ස්කොඩ්‍රන් ලීඩර්	එල් එච් වී එම් ලොකුහිට්ගේ	30304
27	03501	ස්කොඩ්‍රන් ලීඩර්	එම් එම් මහේන්ද්‍රරාජ්	29957
28	03123	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	එස් ඩබ් ඩී ආර් සී සිරිමාන්න	32813
29	03124	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	බී ඒ ගුරුකුල	32922
30	03125	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	ඒ ඩී ඩී වයි පී පෙරියප්පෙරුම	32999
31	03149	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	ඩී පී ජේ ඒ එන් ජයවර්ධන	32950
32	03234	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	පී ජේ එම් විජයසේකර	34368
33	03122	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	එල් ඩබ් සෙනවිරත්න	32812
34	03235	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	වයි කේ කේ එස් බන්ඩාර	35407
35	03507	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	එස් එෆ් නාදියා	33909
36	03392	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	එස් ඒ ඩී ආර් පී විජේසුන්දර	36265
37	03393	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	කේ එල් පී පෙරේරා	36198
38	03506	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	බී ජේ ඒ එස් සිරිමාන්න	36307
39	03739	ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට්	ජේ ජේ ඒ එස් විජේසිංහ	36455
40	03505	ෆ්ලයිං ඔෆිසර්	පී ර ගලප්පත්ති	36533
41	V/0432	විංග් කමාන්ඩර්	සී වයි වීරසේන	2801
42	V/0373	විංග් කමාන්ඩර්	ර ඩී ආර් ප්‍රනාන්දු	2158
43	V/0431	ස්කොඩ්‍රන් ලීඩර්	ජී පී ගල්කොලගේ	2968

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, දෙවැනි ප්‍රශ්නයට අදාළව ඔබතුමා සඳහන් කළ යුද හමුදාවේ 224, නාවික හමුදාවේ 56 සහ ගුවන් හමුදාවේ 43 කියන වෛද්‍ය නිලධාරීන් සියලුදෙනාටම ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංක තිබෙනවාද? ඒ අයගේ නමින් නමට විස්තර ඕනෑ නැහැ; අංකයෙන් අංකයට ඕනෑ නැහැ. එම නිලධාරීන් 224දෙනාටම ලියාපදිංචි අංක තියෙනවාද කිව්වොත් ඇති.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මම ඔබතුමාට මේ ලැයිස්තුව එවන්නම්. ඒ හැම කෙනෙකුගේම නිල අංකය, නිලය, නම, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය කියලා තමයි සඳහන් කරලා තිබෙන්නේ. බැලූ බැල්මට හැම එක්කෙනාගේම ලියා පදිංචි අංකය තියෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන ගැටලුව මේකයි. අපේ රටේ කිසිම වෛද්‍යවරයෙකුට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නැතුව ප්‍රතිකාර කරන්නට බැහැ. රජයේ විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය උපාධිය අරගෙන එළියට ඇවිල්ලා සීමාවාසික පුහුණුව ලබලා තමයි වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. සීමාවාසික පුහුණුව ලබාගන්නා තුරුත් දෙන්නේ තාවකාලික ලියාපදිංචියක්. විශේෂයෙන් මේ විදේශ වෛද්‍ය උපාධිධාරීන් පිටරටවලින් උපාධිය අරගෙන ආවාම ඉස්සෙල්ලාම ලංකාවේ වෛද්‍ය සභාව මගින් පවත්වන Act 16 කියන විභාගයට ලියන්න ඕනෑ. එසේ ලිව්වාට පස්සේ තමයි ඔවුන්ට සීමාවාසික පුහුණුව ලබන්න පුළුවන් වන්නේ. හැබැයි, ඔය හමුදාවල එහෙම වෛද්‍ය සභාවේ ලියාපදිංචි නොවූ, සීමාවාසික පුහුණුව ලබානොගත් අය සේවය කරන බව මම දන්නවා. ඒකට හමුදාව පැත්තෙන් දෙන උත්තරය තමයි අපි advertise කළාට, ලංකාවේ අය ඒකට ඉල්ලුම් කරන්නේ නැහැ කියන එක. මේ ප්‍රශ්නයට අපි උත්තරයක් හොයා ගන්න ඕනෑ නිසායි මේ ප්‍රශ්නය මා ඉදිරිපත් කළේ. ලංකාවේ නීතියට අනුව වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නැති අය අපේ හමුදාවේ හෝ කොහේ හෝ සේවය කරනවා නම් ඒක එතරම් සුදුසු නැහැ. මොකද, ඔවුන්ගේ අත්දැකීම් අනුව තමයි වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා දෙන්නේ. ඒ නිසා කවුරු හෝ හමුදාවල සේවය සඳහා ඉල්ලන්නේ නැත්නම් අපේ රටට එන විදේශ උපාධිධාරීන්ගේ සුදුසුකම් නොබලා අපේ හමුදාවේ සේවය සඳහා බඳවා ගැනීම නොවෙයි ඒකට උත්තරය වන්නේ. ඒ කාරණය පිළිබඳව ඔබතුමා ආරක්ෂක අමාත්‍යවරයාගේ හෝ සෞඛ්‍ය අමාත්‍යවරයාගේ හෝ ආණ්ඩුවේ අවධානය යොමු කරනු ඇතැයි මා බලාපොරොත්තු වනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මා එතුමන්ලාගේ අවධානයට මේ කාරණය යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 5 - 267/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 366/'18 - (1), ගරු වේලු කුමාර් මහතා.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Speaker, I ask for three months' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය ලියාපදිංචි නොකිරීම: හේතු
கிளிநொச்சி மாவட்ட கிரிக்கெட் சங்கம் பதிவு செய்யப்படாமை: காரணம்
NON-REGISTRATION OF KILINOCHCHI DISTRICT CRICKET ASSOCIATION: REASONS

550/'19

7. ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) දිවයිනෙහි දිස්ත්‍රික්ක විසිපහ සඳහා ක්‍රිකට් සංගම් විසිපහක් තිබේද;

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අවසර ලබා නොදීමට හේතු කවරේද;

(iii) කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලියාපදිංචිය සඳහා කිහිප විටක්ම අයදුම් කර ඇතත්, මෙතෙක් එය ලියාපදිංචි නොකිරීමට හේතු කවරේද;

(iv) 2010 වර්ෂයෙන් පසුව කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට ඔබ අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ආධාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டிலுள்ள இருபத்தைந்து மாவட்டங்களிலும் கிரிக்கெட் சங்கங்கள் இருபத்தைந்து உள்ளனவா என்பதையும்;

(ii) கிளிநொச்சி மாவட்டத்திற்காக கிரிக்கெட் சங்க மொன்றை நிறுவுவதற்கு இதுவரை அனுமதி வழங்காமைக்கான காரணம் என்னவென் பதையும்;

(iii) கிளிநொச்சி மாவட்ட கிரிக்கெட் சங்கமானது இலங்கை கிரிக்கெட் நிறுவனத்தின் பதிவிற் காகப் பலமுறை விண்ணப்பித்த போதிலும், இதுவரை அதனைப் பதிவு செய்யாமைக்கான காரணம் யாது என்பதையும்;

(iv) 2010 ஆம் ஆண்டின் பின்னர், கிளிநொச்சி மாவட்ட கிரிக்கெட் சங்கத்திற்கு உங்களது அமைச்சினால் வழங்கப்பட்டுள்ள உதவிகள் எவையென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication, Foreign Employment and Sports:

(a) Will he inform this House-

(i) whether there are twenty five Cricket Associations in the twenty five districts in the Island;

(ii) the reasons for approval has not been granted for the establishment of the cricket association in Kilinochchi District yet;

(iii) the reason for the Kilinochchi District cricket association has not been registered in the Sri Lanka Cricket yet though applications have been submitted for it several times; and

(iv) the assistance granted by your Ministry to the Kilinochchi District cricket association after the year 2010?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

දිස්ත්‍රික් සංගම් පිහිටුවීම ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදු නොකරන අතර, දිස්ත්‍රික්කය තුළ පිහිටි ක්‍රීඩා සමාජ සහ අනෙකුත් ආයතන එක්ව දිස්ත්‍රික් සංගමයක් පිහිටුවා ගැනීම සිදු කරනු ලබයි. මේ සඳහා කිසිදු අයුරකින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මැදිහත් නොවේ.

(ii) ඉහත කී පරිදි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් පිහිටුවීම සිදු නොකරන අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත එවැනි ඉල්ලීමක් ද සිදු කර නොමැත.

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව අනුව, දිස්ත්‍රික් සංගමයක් වෙත සාමාජිකත්වය පිරිනැමීම සඳහා එම සංගමය විසින් මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය. එසේ මූලික සුදුසුකම් සපුරා නොමැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබයි. සුදුසුකම් සපුරා ඇති යම් දිස්ත්‍රික් සංගමයක් විසින් සාමාජිකත්වය ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විධායක කමිටුව වෙත ඉදිරිපත් කරන අතර, එහිදී සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව වාර්ෂික මහා සභා රැස්වීමක් වෙත ඉදිරිපත් කරනු ලැබේ. එම වාර්ෂික මහා සභා රැස්වීමේදී බහුතර සාමාජික සංඛ්‍යාවකගේ කැමැත්ත හිමිවෙයි නම් පමණක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සාමාජිකත්වය අදාළ ක්‍රීඩා සමාජය හෝ සංගමය වෙත හිමිවේ. ඒ අනුව, කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට මේ වන තෙක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සාමාජිකත්වය හිමි වී නොමැත.

(iv) අමාත්‍යාංශය මඟින් කිසිදු ආධාරයක් ලබා දී නොමැත.

(ආ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, you may ask your Supplementary Questions.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, கிளிநொச்சி மாவட்டம் ஒரு தனியான மாவட்டமாகும். இலங்கையிலே அனைத்து மாவட்டங்களுக்கும் கிரிக்கெட் சங்கங்கள் இருக்கின்றபோது, அனைத்துத் தகைமைகளையும் கொண்டிருந்தும், அதற்குரிய சகல ஆவணங்களும் சமர்ப்பிக்கப்பட்டும் இதுவரை கிளிநொச்சி மாவட்ட கிரிக்கெட் சங்கம் பதிவு செய்யப்படாமல் புறக்கணிக்கப்படுகின்றது. ஆகவே, இதற்கான வேறு வழி என்ன என்பதைத் தெரிவிக்குமாறு கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු මන්ත්‍රීතුමනි, උත්තරයේ තිබෙන විධියට නම් මහා සභාවේ එකඟතාව ලැබුණොත් තමයි සුදුසුකම් සපුරා තිබෙන දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයක් වෙත සාමාජිකත්වය ලබා දෙන්නේ. ඔබතුමා කියන විධියට කිලිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයට එම සුදුසුකම තිබෙනවා නම් ඒ ගැන නැවත සොයා බලන ලෙසට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න අපට පුළුවන්.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

හොඳයි.

ලංකා විදුලිබල මණ්ඩලය පාඩු ලැබීම: වැළැක්වීමේ පියවර

இலங்கை மின்சார சபை நட்டமடைதல்: தடுப்பு நடவடிக்கை

LOSSES INCURRED BY CEYLON ELECTRICITY BOARD: PREVENTIVE STEPS

573/'19

8. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එයට හේතුව කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය පාඩු ලැබීම වළක්වා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

(iv) විදුලි පාරිභෝගිකයන් විසින් ගෙවිය යුතු විදුලි ගාස්තු ගණනය කරනු ලබන වර්තමාන ක්‍රමය අසාධාරණ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மின்சார சபையை தனியார் மயப்படுத்த நடவடிக்கை மேற்கொள்ளப்படு கின்றதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணம் யாது என்பதையும்;

(iii) இலங்கை மின்சார சபை நட்டம் அடைவதை தடுப்பதற்காக அமைச்சினால் மேற்கொள்ளப் பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) மின்சார வாடிக்கையாளர்களினால் செலுத்த வேண்டிய மின்சாரக் கட்டணம் கணிப்பிடப் படுகின்ற தற்போதைய முறை அநீதியானது என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்ப தையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Business Development:

(a) Will he inform this House -

(i) whether action will be taken to privatize the Ceylon Electricity Board;

(ii) if so, the reason behind such action;

(iii) the steps taken by the Ministry to prevent the incurring of losses by the Ceylon Electricity Board; and

(iv) whether he admits that the method adopted to calculate the charges payable by consumers of electricity is not fair?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා (විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மின்வலு, எரிசக்தி மற்றும் தொழில் துறை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Power, Energy and Business Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලීකරණය කිරීම රජයේ ප්‍රතිපත්තිය නොවේ.

(iii) ලංකා විදුලිබල මණ්ඩලය විදුලි සේවාව ලබා දීමේදී අය කරනු ලබන ගාස්තු මඟින් විදුලි සේවාව ලබා දීම සඳහා වන වියදම ලබා ගැනීමට - for cost recovery - කටයුතු කරනු ලබයි. සහන ගාස්තු ක්‍රමයක් මත පදනම්ව මෙරට විදුලි පාරිභෝගිකයන් සඳහා කාණ්ඩ කිහිපයක් යටතේ විදුලි සේවාව ලබා දෙයි. මෙසේ කාණ්ඩ කිහිපයකට සහන මිල ගණන් යටතේ විදුලිය ලබා දීම රාජ්‍ය ප්‍රතිපත්තිය වන අතර, එම සහනාධාර ලබා දීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත වැය වන මුදල මහා භාණ්ඩාගාරයෙන් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දිය යුතු වේ. මෙලෙස විදුලි පාරිභෝගිකයන් සඳහා ලබා දෙන සහන ඇමුණුම 01හි දැක්වේ. සියලු පාරිභෝගික කාණ්ඩ සඳහා වන විදුලි ගාස්තු අයක්‍රම ඇමුණුම 02හි දැක්වේ.

මෙම සහනාධාර ලබා දීම තුළ ලංකා විදුලිබල මණ්ඩලය 2018 වර්ෂය තුළ දරන ලද වියදම රුපියල් මිලියන 60,429කි. එමෙන්ම, පසුගිය වර්ෂ දෙක තුළ පැවැති දැඩි වියළි කාලගුණ තත්ත්වය සමඟ ජල විදුලි නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, 2017 හා 2018 වර්ෂවලදී ජල විදුලි නිෂ්පාදන දායකත්වය පිළිවෙළින් සියයට 21ක් හා සියයට 33ක් විය.

මේ තත්ත්වය තුළ අඛණ්ඩව විදුලිය සම්පාදනය කිරීමට තාප බලාගාර වැඩි වශයෙන් උපයෝගි කර ගැනීමට සිදුවීම හේතුවෙන් විදුලි ජනන පිරිවැය ඉහළ ගොස් ඇත.

2018 වර්ෂයේ විදුලි සැපයුම් පිරිවැයේ සාමාන්‍ය අගය එක් ඒකකයකට රුපියල් 19.12ක් වූ අතර, විදුලිය ඒකකයක් විකිණීමෙන් ලද ආදායමේ සාමාන්‍ය අගය රුපියල් 16.29ක් වේ.

ගරු මන්ත්‍රීතුමනි, ඒකකයකට රුපියල් 19.12ක් වන්නේ මෙහෙමයි. Transmission සහ distribution cost එක ලෙස රුපියල් 2.83ක් එකතු කරන්න අවශ්‍යයි.

එබැවින් විදුලි ජනන ගාස්තු අඩු කර ගැනීම සඳහා අවශ්‍ය නිවැරැදි ජනන සම්මිශ්‍රණය අඩු පිරිවැය සහිත බලශක්ති ප්‍රභව බලශක්ති සුරක්ෂිතභාවය තහවුරු වන ආකාරයට තෝරා ගැනීම සිදු කරනු ලැබේ. එමෙන්ම 2015 වර්ෂයේ සිට සුළං හා සූර්ය බලාගාර ඉදිකිරීමේ දී තරගකාරී මිල ගණන් කැඳවීම හඳුන්වා දීම සිදු කරන ලද අතර, ඒ තත්ත්වය තුළ සුළං හා සූර්ය බලාගාරවලින් විදුලිය මිල දී ගැනීමේ දී අය කරන ගාස්තුව සියයට 50ක ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකි විය. මෙවැනි විවිධ වූ ක්‍රමෝපායයන් අනුගමනය කරමින් ලංකා විදුලිබල මණ්ඩලයේ ජනන වියදම් අඩු කර ගැනීමට කටයුතු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගෙන ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය මේ කටයුතු ඉදිරියට කරගෙන ගියත්, ගත වූ අවුරුදු හතර තුළ කිසිදු ආකාරයකට විදුලිය ජනනයක් කෙරෙමින් තිබුණේ නැහැ. න්‍යායාත්මක මට්ටමින් උත්තර දුන්නාට, එය ප්‍රායෝගිකව කිසිසේත් වුණේ නැහැ කියන කාරණය මා වගකීමෙන් කියන්න කැමැතියි. ඒ නිසා තමයි අප අලුත් ක්‍රමයක් ඉදිරිපත් කර තිබෙන්නේ. පරිසර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා තිබෙනවා නම් ඒ ඕනෑම කෙනකුට පුළුවන් තරම් ඉක්මනට අදාළ

සහතිකය සහ අවසරය ලබා දීම සඳහා අපි දැන් අමාත්‍යාංශය මඟින් කටයුතු කරගෙන යනවා.

(iv) රජයේ ප්‍රතිපත්තිය අනුව වත්මන් ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක කර ඇත. කෙසේ නමුත් සියලු පාරිභෝගිකයන් විදුලි සේවාව ලබා ගැනීමේදී ඒ සඳහා දරන වියදම ආවරණය වන පරිදි ගෙවීම සඳහා ගාස්තු ක්‍රමය යාවත්කාලීන කිරීම සුදුසු බව පෙනේ.

(ආ) අදාළ නොවේ.
ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු ඇමතිතුමනි, සවිස්තරාත්මක පිළිතුරක් ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහජන උපයෝගිතා කොමිෂන් සභාව - Public Utilities Commission - නිර්දේශ කර තිබෙනවා, අය කළ යුතු ගාස්තු.

මට පෙනෙන විදියට ඒක අසාධාරණයි. යම් තැන්වල අවශ්‍ය මට්ටමට වැඩිය අය කරනවා. අනෙක් තැන්වල අඩුවෙන් අය කරනවා. අලුත් කොමිසමක් පත් කරලා ඒ තුළින් මේ සියලු දේ සංශෝධනයට ලක් කරන්න තමයි අපි අදහස් කරන්නේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ලංකා විදුලිබල මණ්ඩලය තමයි අපේ රටේ බලශක්තිය සපයන ප්‍රධානම ආයතනය. මෙම ආයතනය දිගින් දිගටම පාඩු ලබන ආයතනයක් හැටියට තමයි දැන් සැලකෙන්නේ. හැබැයි, එහෙම වෙන්න බැහැ. මෙහි වැරැද්ද තිබෙන්නේ කොතැනද කියලා අපි ඉස්සෙල්ලාම සොයන්න ඕනෑ. අපි ඒ ගැන ගරු රවි කරුණානායක මැතිතුමාට චෝදනා කරනවා නොවෙයි. එතුමාට බොහොම මෑත කාලයේදී තමයි මෙම අමාත්‍යාංශය ලැබුණේ. මම දන්න හැටියට මේ අමාත්‍යාංශය මෙහෙයවපු ක්‍රමවේදවල වැරැද්දක් නිසා තමයි මෙහෙම වෙන්නේ. එතකොට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. දැන් ඔබතුමාම කියනවා, "පසුගිය වසර දෙක තුළ දැඩි නියඟයක් තිබුණා. ඒ නිසා ජලවිදුලිය උත්පාදනය කර ගන්නට හැකියාවක් ලැබුණේ නැහැ. ඒ නිසා ඉන්ධනවලින් විදුලිය උත්පාදනය වන ක්‍රම සඳහා යා යුතුව තිබුණා. ඒ නිසා අපේ වියදම වැඩි වුණා" කියලා. ගරු ඇමතිතුමනි, අපේ ජාතික විදුලි පද්ධතියට විදුලිබලය ලැබෙන ආකාර කිහිපයක් තිබෙනවා. එකක් තමයි, පුනර්ජනනීය බලශක්තිය. ස්වාභාවික ප්‍රභවවලින් විදුලිය උත්පාදනය කිරීම තවත් ක්‍රමයක්. අනෙක තමයි ජල විදුලිය. තව ආකාරයක් තමයි ඉන්ධන භාවිත කිරීම. හැබැයි, ලංකා විදුලිබල මණ්ඩලය තුළ සිටින ඉංජිනේරුවන් නිරන්තරයෙන් උත්සාහ කරන්නේ ඉන්ධන භාවිතයෙන් ජාතික විදුලි පද්ධතියට විදුලිය සපයන වැඩසටහන්වලට යන්නයි.

හිරු එළිය උපයෝගී කරගෙන, සුළං බලය උපයෝගී කරගෙන විදුලිය නිපදවීම වැනි කරුණු වැඩි දියුණු කරන්නට පසුගිය කාල පරිච්ඡේදය තුළම මෙම ආයතනයේ ඉන්න නිලධාරින්ගේ සහයෝගයක් ලැබුණේ නැහැ. ඔබතුමාත් දිගින් දිගටම ඒ මාෆියාවට යට වෙනවාද? එහෙම නැත්නම්, ඒ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කිරීම පිළිබඳව ඔබතුමන්ගේ ආකල්පය මොකක්ද කියන එක ගැන මම දැන ගන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ ප්‍රශ්නය ඇසීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි. මේ පුනර්ජනනීය බලශක්තිය නිපදවීම ගැන වැරදි මතයක් තිබෙනවා. අව්ව තිබෙන ඒ මොහොතේදී electricity ලැබෙනවා කියලා. ඒ සංකල්පය ගෙවල්වලට හෝ යම් යම් වෙනත් ස්ථානවලට හොඳයි. ඒ වාගේම, මෙහි ස්ථිර ජනනය කිරීමේ - firm generation - වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වැඩපිළිවෙළ තමයි national grid එකට එකතු වෙන්නේ. ඒ තුළින් තමයි අවශ්‍ය ඉල්ලුම හා සැපයුම සඳහා කටයුතු කරන්නේ. පුනර්ජනනීය වැඩ පිළිවෙළ යටතේ solar power භාවිත කළොත් එහෙම නැත්නම් හුළං භාවිත කළොත් ඒ ගබඩා කිරීම බැටරියක් තුළින් කළේ නැත්නම් ඔය ප්‍රශ්නය එනවා. හුඟ දෙනෙක් හිතනවා, අපි ඕනෑකමින්ම මේ වැඩ පිළිවෙළ නවත්වනවා කියලා. ඇත්තටම මාත් එතැනට ගියාට පසුවයි මේ ගැන දැනුවත්කම ලබා ගත්තේ.

තාප බලාගාර සෑදීමට යම් රුචිකත්වයක් තිබෙනවා. මොකද, ඒවා ඕනෑ තැනක ලේසියෙන් සෑදීමට පුළුවන් නිසා. නමුත්, ස්ථිර ජනනය කිරීමේ වැඩ පිළිවෙළ තුළ අප මේ තත්ත්වය වෙනස් කර ගෙන යනවා. මිශ්‍ර ජනනීය කිරීමේ වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යනවා. තුනෙන් එකක් පුනර්ජනනීය වැඩ පිළිවෙළ යටතේ කරගෙන යනවා, තව තුනෙන් එකක් ගල් අඟුරුවලිනුත්, තවත් තුනෙන් එකක් LNG තුළිනුත් කරගෙන යනවා. අප මේ අවස්ථාවේදී අඩුම මට්ටමේ ජනනය කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ඒකකයක මිල රුපියල් 15කට, රුපියල් 16කට ඉලක්ක කරන්නේ. අපි හිතන්නේ, මේ විදුලිය අවුරුදු 2කින් ලබා ගන්න පුළුවන් කියලායි. එහෙම ලබා ගැනීමේ හැකියාව තිබෙන නිසා දැන් ඉදිරි සැලසුම්වලදී රුපියල් 15, රුපියල් 16 ඉක්මවා යන මිලදී ගැනීම්වලට අපි අත්සන් කරන්නේ නැහැ.

ලංකා විදුලිබල මණ්ඩලයටත්, අපේ පාරිභෝගිකයින්ටත් ඒ තුළින් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය අහපු එක මම අගය කරනවා. ඒකෙදී කොයි ආකාරයෙන්ද කටයුතු කරන්නේ කියන එක අනිවාර්යයෙන්ම අපේ විදුලිබල අමාත්‍යාංශය තුළින් නිර්දේශ කරගෙන යනවා. හැබැයි, එක කාරණයක් තිබෙනවා. ඒ කෙරෙන වැඩ පිළිවෙළ හරි හෙමින් කෙරෙන්නේ. අපි සියයට සියයක් යන්න හිතුවත් ඒ අය උපක්‍රමශීලිව සියයට 10ට, 15ට පවත්වා ගෙන යන ස්වරූපයක් තමයි තිබෙන්නේ. ඒ තීන්දු ගැනීමේ ස්වරූපය නිසා ඇති වෙලා තිබෙන ප්‍රතිවිපාකය ඒකයි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය.

මේ වන විට වැටුප් පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් තුළ නොසන්සුන්තාවක් ඇති වී තිබෙනවා ගරු ඇමතිතුමනි. විශේෂයෙන් තාක්ෂණික, කාර්මික අංශයේ සේවකයන්ගේ. ඉංජිනේරුවන්ගෙන් පහළ විදුලි අධිකාරිවරුන්, තාක්ෂණික නිලධාරින්, කණුවල බඩ ගාන්නන්ගේ සිට

*** පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

සියලුදෙනාට වැටුප්වලින් කොටසයි මේ වන කොට ලැබෙන්නේ කියලා ඔවුන්ගේ අදෝනාවක් තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමා මැදිහත් වෙන්නේ කොයි ආකාරයෙන්ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒකට අවංකව උත්තරයක් දුන්නොත්, මම හිතන විධියට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් හොඳ වැටුපක් ලබා ගන්නවා. නමුත්, ඒ අයගේ තිබෙන තාක්ෂණික දැනුම තුළ මීට වැඩිය වෙනස්කම් ඇති කළාට මට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ අය පඩි ලබා ගන්නවා වාගේම ඒ ආකාරයටම වැඩ කරන ස්වරූපයක් තිබෙනවා නම් ඒ පඩි වැඩි කිරීම ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත්, නිකරුණේ කේවල් කරලා පඩි ලබා ගත්තාට, ඊට සමාන මට්ටමට ප්‍රතිලාභයක් පෙනෙන්න නොමැතිකමයි තිබෙන ප්‍රශ්නය. ඒත් අපි මේ සංශෝධන කරගෙන යනවා. ඉංජිනේරුවන් සහ අනෙක් අය අතරත් ප්‍රශ්නයක් තිබෙනවා කියලා කියනවා. මම නම් හිතන්නේ එවැනි ප්‍රශ්නයක් නැහැ කියලයි. සමස්තයක් වශයෙන් ගත්තොත්, සියලුදෙනාටම ප්‍රශ්න තිබෙනවා.

ඒකට අපි අවංක වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. අගෝස්තු මාසයේ 30වැනි දා වන විට මේ තිබෙන විෂමතා සියල්ලම එකතු කරලා, සොයා බලා, ඒ විෂමතා නැති කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුරක් දුන්නොත් හොඳයි. සූර්යබල ශක්තිය සම්බන්ධයෙන් ඔබතුමා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මගේ පළමුවැනි ප්‍රශ්නය තමයි, unit එකක ගාස්තුව රුපියල් 22කට තිබෙන එක රුපියල් 19.75 දක්වා අඩු කරන්න තීරණය කරලා තිබෙනවා ද කියන එක. දෙවැනි ප්‍රශ්නය තමයි, net metering කියන එක අඩු කිරීම තුළ අවුරුදු ගණනක් ගෙවීම සම්බන්ධව විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, වෙනදා zero bill එකක් ආපු මිනිසුන්ට දැන් මුදල් ගෙවිය යුතු bills එන්න පටන් ගෙන තිබෙනවා. සූර්ය බල ශක්තිය පාවිච්චි කිරීම ගැන හැම ගමකම මිනිසුන් තුළ ලොකු උද්‍යෝගයක් තිබුණා. හැබැයි, දැන් ඒ වැඩ පිළිවෙළ පොඩ්ඩක් කඩා වැටිලා තිබෙනවා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් යම් තීරණයක් ගන්නවා ද කියලා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක සමිති දෙකක දෙදෙනෙකුගේ තිබෙන මානසික ප්‍රශ්නයක්. අද වන විට අපේ රටේ ගෙවල් 6,500,000ක් තිබෙනවා. ඒකෙන් ගෙවල් 21,000ක් අවුරුදු 10ක් තුළ මේ වැඩ පිළිවෙළට ඇතුළත් කිරීමේදී ඇතිව තිබෙන ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. මේ එක ගිවිසුමක්වත් අත් හිටුවලාත් නැහැ, වෙනස් කරන්නෙත් නැහැ. නමුත්, මේ වාගේ බොරු ප්‍රචාර ඇති කරලා තිබෙනවා. අප කියන්නේ පාරිභෝගිකයන්ගෙන් අය කරන විදුලි ගාස්තු වැඩියි කියන එකයි. මේක අඩු කරන්න ඕනෑ. අප ගාස්තු අඩුම ජනනය කිරීමේ වැඩ පිළිවෙළක් තුළින් යනකොට තව අවුරුදු එකහමාරකින් අපේ දැන් තිබෙන දළ නිෂ්පාදන වියදම රුපියල් 23 සිට රුපියල් 15ට, 16ට ගේන්න පුළුවන් හැකියාව තිබෙනවා. ඒ නිසා දැන් අවුරුදු 20කට, 22ක ගිවිසුමකට අත්සන් කරන්නේ මොන පදනමටද? අපි ඒකකය රුපියල් 45ට තිබෙන ගණන අඩු කිරීමේ ස්වරූපයේ වැඩ පිළිවෙළක් තමයි ගෙනියන්නේ. ඇයි පොහොසත් අයට යුනිට් එකකට රුපියල් 45ක් දීලා, සාමාන්‍ය එක්කෙනාට රුපියල් 22ක් දෙන තත්ත්වයක තියෙන්නේ? අපි හැමදෙනාටම ඒකකයකට සමාන මිලක් දෙනවා. ඒක තමයි අපි ඇති කරලා තිබෙන්නේ. එතැන net metering, net accounting මේ ඔක්කෝම තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් විශේෂ කොමිටියක් පත් කරලා තිබෙනවා. අපි එක වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරනවා. හැම දෙනාටම එක මිලක් නියම කරනවා. එක්කෙනකුගේ ඒකකයකට රුපියල් 45කුත් තව කෙනෙකුට රුපියල් 22කුත් දෙන ඒ ස්වරූපය අපි වෙනස් කරනවා. ඒ හැමෝටම සාමාන්‍ය එක මට්ටමක් අපි ලබා දෙනවා. මේක දෙදෙනෙකුගේ තිබෙන ප්‍රශ්නයක්. එක්කෙනෙක් අවංකව, මේ සම්බන්ධයෙන් ඒ ගොල්ලන්ගේ තිබෙන ද්විත්ව ස්වරූපය පෙන්වනවා. පුනර්ජනනීය ශක්තිය මේ දවස් 163 තුළ මෙගාවොට් 285ක් එකතු කරලා තිබෙනවා. ඒ අයට ඔය ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. වහල උඩ ගහන කිලෝවොට් 50ක, 40ක, 30ක ඒවා සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයක්. ලෝකයට පෙන්වන්නේ එක දෙයක්. ඇතුළේ ඒ ගොල්ලන් කරන්න හදන්නේ ඒකකයක් රුපියල් 45කට තිබෙන මිල අඩු කරලා විදුලිබල මණ්ඩලයට ප්‍රශ්නයක් ඇති කරන එක.

මගේ සටන වන්නේ පාරිභෝගිකයාගේ මිල රුපියල් 45 සිට රුපියල් 25 දක්වා අඩු කරන එකයි; ජනනය කිරීමේ වියදම රුපියල් 23ට තිබෙන එක රුපියල් 15 දක්වා අඩු කරන එකයි. ඒක අපි කරගෙන යනවා. ඉදිරියේදී ඒ වාසිය පාරිභෝගිකයාට ලබා දීමට අපි කටයුතු කරගෙන යනවා.

අඩු ආදායම්ලාභීන්ගේ නිවාසවලට විදුලි සැපයුම: ණය පහසුකම්
குறைந்த வருமானம் ஈட்டுவோரின் வீடுகளுக்கான மின்சார இணைப்பு: கடன் வசதி
PROVISION OF ELECTRICITY FOR LOW-INCOME HOUSEHOLDS: LOAN FACILITY

603/'18

9. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අඩු ආදායම්ලාභීන්ට විදුලි සැපයුම ලබා ගැනීම සඳහා රු. 40,000/-ක ණය මුදලක් ලබා දී ණය වාරිකය මාසික විදුලි බිල සමඟ ගෙවීමට ලබා දී තිබූ පහසුකම මේ වන විටත් පවතින්නේද;

(ii) එසේ නම්, එවැනි අවස්ථාවල නිවසක් වයරින් කිරීමේදී විදුලි බුබුලු 05, විදුලි පේනු 01 හා බෙදා හැරීමේ පුවරුව සඳහා රු. 21,000/- ක පමණ මුදලක් අය කරන්නේද;

(iii) එසේ නම්, මෙම මුදල වෙළෙඳපොළ මිලට වඩා කොපමණ වැඩි වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மின்சார இணைப்புக்களைப் பெற்றுக்கொள்வ தற்காக குறைந்த வருமானம் ஈட்டுவோருக்கு ரூபா 40,000/- ஐக் கடனாக வழங்கி அதற்கான தவணைக் கட்டணத்தை மாதாந்த மின் கட்டணப் பட்டியலுடன் இணைத்து செலுத்துவதற்காக வழங்கப்பட்டிருந்த வசதி இன்றளவிலும் நடைமுறையில் உள்ளதா என்பதையும்;

(ii) ஆமெனின், அவ்வாறான சந்தர்ப்பங்களில் வீடொன்றுக்கான மின் சுற்றுக் கம்பிகளை இணைக்கையில் 05 மின் குமிழ்கள், 01 செருகி மற்றும் மின் வழங்கல் பெட்டி ஒன்றுக்காக சுமார் ரூபா 21,000 அறவிடப்படுகின்றதா என்பதையும்;

(iii) அவ்வாறாயின், இக்கட்டணம் சந்தைக் கட்ட ணத்தை விட எவ்வளவு அதிகரிக்கின்றது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Business Development :

(a) Will he inform this House-

(i) whether the loan facility of Rs. 40,000 that had been granted to low-income earners to get the electricity supply and to pay the loan instalment together with the monthly electricity bill is still being implemented;

(ii) if so, in granting that loan for wiring a house, whether a sum of about Rs. 21,000 is charged for installing five electric bulbs, one plug point and the distribution board; and

(iii) if so, how greater is this amount as against the market price?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම අමාත්‍යාංශය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහය ඇතිව සිදු කරන ලද සමීක්ෂණ අනුව, මුදල් අග හිඟකම් හේතුවෙන් විදුලිය ලබා ගැනීමට නොහැකිව සිටින පවුල් 274,639ක් පමණ 2016 වර්ෂය වන විට රට තුළ සිටින බව වාර්තා වී තිබිණ.

හැබැයි, අද වන විට මේ සංඛ්‍යාව 215,000කට අඩුවෙලා තිබෙනවා කියලායි මම දන්නේ.

ඒ අයට විදුලි සම්බන්ධතා සඳහා මුදල් ගෙවීමට පමණක් නොව තම නිවස තතැඳුම් - wiring - කර ගැනීම සඳහා ද මූල්‍ය හැකියාවක්ද නොතිබිණ. මේ නිසා සියයට 7ක වාර්ෂික පොලී අනුපාතිකයක් අනුව ගණනය කරන ලද සමාන මාසික වාරික 72කින් මාසික විදුලි බිල සමඟ අය කර ගැනීමේ පදනම මත රුපියල් 40,000ක උපරිමයකට යටත්ව ණය මුදලක් ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ප්‍රදානය කරන ලදී. මෙම සහනදායි ණය ක්‍රමය යටතේ වසරක කාලය තුළ පවුල් 239,783කට විදුලිය ලබා දී, ඒ වන විට වාර්තා වී තිබූ සියලු නිවාසවලට විදුලිය ලබා දී අවසන් කරන ලදී. මෙම සහනදායි ක්‍රමය යටතේ නිවස තතැඳුම් - wiring - කර ගැනීමට අවශ්‍ය මුදල් නොමැති පවුල් ඒකක සඳහා රුපියල් 17,500ක මිලකට, ලංකා විදුලිබල මණ්ඩලය මඟින් පවත්වා ගෙන යනු ලබන සුදුසුකම් සහිත විදුලි කාර්මික ලේඛනයේ ලියා පදිංචි වී ඇති විදුලි කාර්මිකයකු ලවා එම කාර්යය ඉටු කර ගැනීමට පහසුකම් සලසන ලද අතර, විදුලි සම්බන්ධතාව ලබා ගැනීමේ ගාස්තුව ද ඇතුළුව ලබා දුන් උපරිම මුදල රුපියල් 40,000ක් වේ. සියලු නිවාස සඳහා විදුලිය ලබා දී අවසන් වූ පසුව 2016.12.31 දින මෙම සහනදායි ක්‍රමය අවසන් කරන ලදී. මින් පසුව ලැබී ඇති ඉල්ලීම් සලකා බලා 2019 සැප්තැම්බර් 12 දක්වා විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා පමණක් රුපියල් 22,500ක ණය මුදලක් සියයට 14ක පොලියක් හා මාස 24කින් අය කර ගැනීමේ පදනම මත ලබා දීමේ ක්‍රමවේදයක් මේ වන විට ක්‍රියාත්මක වේ.

(ii) එම ක්‍රමය දැනට ක්‍රියාත්මක නොවේ. දැනට ක්‍රියාත්මක වනුයේ විදුලි සම්බන්ධතාව ලබා ගැනීම සඳහා රුපියල් 22,500ක ණය මුදලක් ලබා දෙන යෝජනා ක්‍රමයකි.

(iii) නිවාස තතැඳුම් - wiring - කිරීම සඳහා ලබා දුන් සහන ණය මුදල එවකට වෙළෙඳ පොළ පැවති මිල හා සමාන මුදලකි. මෙම රුපියල් 17,500ක මුදල ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවක් නොවුණු අතර, මෙය ලබාදෙනු ලැබුයේ තම නිවස තතැඳුම් කර ගැනීමට හැකියාවක් නොමැති අය සඳහා වූ අනුග්‍රහයක් වශයෙනි.

(ආ) අදාළ නොවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු ඇමතිතුමනි, මුලින්ම ඔබතුමා ලබා දුන් පිළිතුර හරියාකාරව පැහැදිලි කරගන්න ඕනෑ, අතුරු ප්‍රශ්නය අහන්න පෙර. ඔබතුමා කියන විධියට දැන් මේ සහනදායි ක්‍රමය ක්‍රියාත්මක නැහැ නේද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කලින් හිටපු ඇමති 2016.12.31 වැනි දා ඒක අහෝසි කරලා - [බාධාකිරීමක්] එවකට හිටපු ඇමති ඒ ක්‍රමය අහෝසි කරලා තිබෙනවා. හැබැයි, අපි ඒක නැවත ආරම්භ කරලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ලබා දෙන මුදල කීයද? ඔබතුමා ලබා දුන් පිළිතුරේ ඒ ගැන සඳහන් වෙලා තිබුණා. නමුත් ඒක පැහැදිලි වුණේ නැහැ. ඉස්සෙල්ලා රුපියල් 40,000ක් දුන්නා. දැන් දෙන්නේ - [බාධා කිරීමක්] මට ඇහුණේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
රුපියල් 22,500යි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නිවස wiring කිරීම, විදුලි බුබුළු පහක් සඳහා පමණ වුවමනා කරන විදුලි ජේනුවට සහ බෙදාහැරීමේ පුවරුව සවිකිරීම සඳහා යන මුදල අනුව ද, ඔබතුමන්ලා රුපියල් 22,500ක් ලෙස මේ මුදල ගණනය කරලා තිබෙන්නේ? මේ කාර්යය ඒ නිවාස තුළ සිදුකිරීමේ වගකීම විදුලිබල මණ්ඩලයෙන්ද ඉටු කරන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය නැවත සෘජුව අහන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
විදුලි සම්බන්ධතාවක් ලබා ගැනීම සඳහා ලබා දෙන රුපියල් 22,500 ණය මුදල යටතේ එම ගෙවල්වලට විදුලිය ලබාදෙන්න කලින් ඒ සම්බන්ධයෙන් කෙරෙන්න ඕනෑ දේවල් තිබෙනවා නේ. ඒ කටයුතු කරවන්නේ විදුලිබල මණ්ඩලය විසින් යොදවන කාර්මිකයන් මඟින්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඒක තමයි මුලින් කිව්වේ. මණ්ඩලයේ ඒ වාගේ ලියා පදිංචි කරපු කාර්මිකයන් සිටිනවා. සුදුසුකම් සහිත විදුලි කාර්මික ලේඛනයේ ලියා පදිංචි වී සිටින අයට මේ කටයුත්ත කරන්න පුළුවන් කියලා තිබෙනවා. ඒ නාම ලේඛනය ඉදිරිපත් කරනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක තමයි මම අහන්නේ. එසේ අයකරන ගණන වෙළෙඳ පොළේ තිබෙන මිල ගණන්වලට වඩා වැඩියි නේද කියලා ඔබතුමා විමසා බලන්න. ඒ අනුව වෙළෙඳ පොළේ තිබෙන මිල ගණන්වලට අනුව එම ගාස්තුව නැවත පහළ හෙළීමට ඔබතුමා සලකා බලන්නය කියන එකයි මගේ ඉල්ලීම.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ භාණ්ඩත් සමඟ නේ, මන්ත්‍රීතුමා. ඉතින් ඒ වාගේ විදුලි පහන් පහ-හයකට, wiring කරන්න, connection එක ගන්න 22,500ක් අයකිරීම සාමාන්‍යයෙන් ප්‍රශ්නයක් නොවෙයි. 2016 දෙසැම්බර් මාසයේ රුපියල් 17,900කට තිබුණු මිල ගණන අවුරුදු තුනකට පසුව 22,500ක් වෙන එක එච්චර ප්‍රශ්නයක් නොවෙයි. ඉතින් සාධාරණ මිලක් ලෙස තමයි මම මෙය සලකන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම මේ ප්‍රශ්නය අහන වේලාවේ තිබුණු මිල ගණන් අනුව නේ ප්‍රශ්නය ඇසුවේ. මේ ප්‍රශ්නය අද අහපු ප්‍රශ්නයක් නොවෙයි නේ, මීට මාස කිහිපයකට කලින් දීපු ප්‍රශ්නයක්. මම කියන්නේ මෙකයි. කරුණාකර බලන්න, අද වෙළෙඳ පොළේ තිබෙන මිල ගණන හා මේ අයකරන මිල ගණන අතර පරතරයක් තිබෙනවාද කියලා. එසේ තිබෙනවා නම්, ඔබතුමා ඒ සම්බන්ධයෙන් යුක්තියක් ඉටු කරන්න බලන්න.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේ ගැන බලා තිබෙනවා. මහජන උපයෝගිතා කොමිසම තුළින් තමයි මේ වාගේ ඉලක්ක ඉදිරිපත් කරලා තිබෙන්නේ.

කොච්චර අය කරන්න ඕනෑද කියන එක ආදී ඔක්කෝම තීරණය කරන්නේ මහජන උපයෝගිතා කොමිසම. ඒ තුළ යම් විෂමතා තිබෙනවා. ඒක මම පිළිගන්නවා. එක ගෙදරකට එක මිලකුත්, ඒ ළඟ තිබෙන ගෙදරකට වෙන මිලකුත් අය කරන එක අසාධාරණයි කියලා මම හිතනවා. නමුත්, මේ මුදල අසාධාරණ නැහැයි කියලා මේ අවස්ථාවේදී බොහොම වග කීමකින් මට කියන්න පුළුවන්.

සූර්යබල සංග්‍රාමය වැඩසටහන: විස්තර
"சூர்ய பல சங்கிராமய" நிகழ்ச்சித்திட்டம்: விபரம்
"SOORYA BALA SANGRAMAYA" PROGRAMME: DETAILS

607/'18

10. ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) ශ්‍රී ලංකාවේ,

(i) දෛනික විදුලි ඒකක නිෂ්පාදනය කොපමණද;

(ii) දෛනික විදුලි ඒකක ඉල්ලුම දිවා, රාත්‍රී වශයෙන් කොපමණද;

(iii) දිනකට, පෞද්ගලික අංශයේ විදුලි ඒකක දායකත්වය;

(iv) දිනකට, පුනර්ජනනීය බලශක්ති මඟින් නිපදවන විදුලි ඒකක සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) සූර්යබල සංග්‍රාමය වැඩසටහනෙහි,

(i) මූලික අරමුණු කවරේද;

(ii) එහි ප්‍රතිලාභ කවරේද;

(iii) ඔබ අමාත්‍යාංශයේ කාර්යභාරය කවරේද;

(iv) සූර්යබල ව්‍යාපෘති ඉටු කරන ලියාපදිංචි ආයතන කවරේද;

(v) ඉහත ආයතන ලියාපදිංචි කිරීම සඳහා සලකා බලන ප්‍රමිතීන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) ශ්‍රී ලංකාව දූපතක් වන බැවින්, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස මුහුදු රැළි උපයෝගී කරගැනීමේ අවස්ථාවක් තිබියදීත්, අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු උනන්දුවක් නොදක්වන බව පිළිගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் நாளாந்த மின் அலகு உற்பத்தி யாது என்பதையும்;

(ii) நாளாந்த மின் அலகு கேள்வியானது பகல், இரவு அடிப்படையில் யாது என்பதையும்;

(iii) நாளொன்றுக்கு தனியார் துறையின் மின் அலகுப் பங்களிப்பு;

(iv) நாளொன்றுக்கு புதுப்பிக்கத்தக்க எரிசக்தி மூலம் உற்பத்தி செய்யப்படுகின்ற மின் அலகுகளின் எண்ணிக்கை;

தனித்தனியே யாது என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) "சூர்ய பல சங்கிராமய" நிகழ்ச்சித்திட்டத்தின்,

(i) அடிப்படை நோக்கம் யாது என்பதையும்;

(ii) அதன் பயன்கள் யாவை என்பதையும்;

(iii) உங்கள் அமைச்சின் செயற்பணி யாது என்பதையும்;

(iv) சூரியசக்தி கருத்திட்டங்களை அமுல்படுத்துகின்ற பதிவு செய்யப்பட்ட நிறுவனங்கள் யாவை என்பதையும்;

(v) மேற்படி நிறுவனங்களைப் பதிவு செய்வதற்காக கவனத்தில் கொள்ளப்படுகின்ற நியமங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இலங்கை ஒரு தீவாக இருப்பதனால் புதுப்பிக்கத்தக்க எரிசக்தி மூலமொன்றாக கடல் அலைகளைப் பயன்படுத்திக் கொள்வதற்கான வாய்ப்பு உள்ள நிலையில், அமைச்சினால் அது தொடர்பில் குறிப்பிடத்தக்களவு ஊக்கம் செலுத்தப்படுவதில்லை என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Business Development:

(a) Will he inform this House separately -

(i) the total number of units of electricity generated in Sri Lanka daily;

(ii) the daily demand of electricity during the day and the night in units;

(iii) the number of units of electricity contributed daily by the private sector; and

(iv) the number of units of electricity generated daily through renewable energy?

(b) Will he also inform this House-

(i) the primary objectives of the "Soorya Bala Sangramaya" Programme;

(ii) the benefits of that programme;

(iii) the role of the Ministry in implementing that programme;

(iv) the names of the registered institutes that implement solar power projects; and

(v) the standards that will be considered in registering the aforesaid institutes?

(c) Will he also state whether he will admit that the Ministry does not show any considerable interest in utilizing sea waves for generating electricity despite that there are ample opportunities for utilizing sea waves as a renewable energy source as Sri Lanka is an island?

(d) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ශ්‍රී ලංකාවේ දෛනික විදුලි උත්පාදනයේ සාමාන්‍ය

2018 වර්ෂයේ දී කිලෝවොට් පැය 43,610,000 වේ. (ඇමුණුම 01-A)

2019 කිලෝවොට් පැය (ජනවාරි සිට මාර්තු දක්වා) කිලෝවොට් පැය 45,131,000 (ඇමුණුම 01 - B)

(ii) එය ස්ථිර අගයක් නොවේ. එය විචලනය වේ. 2019 වර්ෂයේ ජනවාරි සිට ජුනි කාල සීමාව තුළ දිවා රාත්‍රී උපරිම විදුලි ඉල්ලුම ඇමුණුම 02හි දක්වා ඇත.

(iii) පෞද්ගලික අංශය විසින් ශ්‍රී ලංකාවේ උත්පාදනය කරනු ලබන දෛනික විදුලියෙහි සාමාන්‍යය

2018 වර්ෂයේ දී කිලෝවොට් පැය 9,600,000 (ඇමුණුම 01)

2019 වර්ෂයේ දී (ජනවාරි සිට මාර්තු දක්වා) කිලෝවොට් පැය 11,050,000 පමණ වේ. (ඇමුණුම 01-B)

(iv) පුනර්ජනනීය බලශක්ති මඟින් දෛනික උත්පාදනයේ සාමාන්‍යය

2018 වර්ෂයේ දී 18,990,000 kwh වේ. (ඇමුණුම 01-A)

2019 වර්ෂයේ දී (ජනවාරි සිට මාර්තු දක්වා) 12,249,000 kwh වේ. (ඇමුණුම 01-B)

(ආ) (i) "සූර්ය බල සංග්‍රාමය" වැඩසටහන පියවර 04ක් යටතේ ක්‍රියාත්මක වේ.

<u>අදියර I</u>

2025 වසර වනවිට වහල මත සවිකරන සූර්ය කෝෂ මඟින් මෙගාවොට් 1,000 සිට මෙගාවොට් 1,000,000 දක්වා

<u>අදියර II</u>

මෙගාවොට් 01 සහිත සූර්ය බල ව්‍යාපෘති 300 ප්‍රමාණයක් වශයෙන් මෙගාවොට් 300

<u>අදියර III</u>

මෙගාවොට් 10 සහිත සූර්ය බල ව්‍යාපෘති 05 වශයෙන් මෙගාවොට් 50

[ගරු රවි කරුණානායක මහතා]

අදියර IV

මාදුරු ඔය පාවෙන සූර්ය බල උද්‍යානය මඟින් මෙගාවොට් 100

පුනරින් සූර්ය බල උද්‍යානය මඟින් මෙගාවොට් 100x2

මොනරාගල සූර්ය බල උද්‍යානය මඟින් මෙගාවොට් 100 වශයෙන් මෙගාවොට් 400ක් විදුලිබල පද්ධතියට එකතු කරන්න බලාපොරොත්තු වනවා.

(ii) මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභ

i. වසර 2020 වනවිට ලංවිම විදුලි ජාලය වෙත මෙගාවොට් 200 ධාරිතාවක් එකතු කිරීම.

ii. වසර 2025 වන විට මෙගාවොට් 1000ක සූර්යබල ධාරිතාවක් දක්වා වැඩි කිරීම.

iii. අනාගතයේදී මිල අධික තාප විදුලිබල උත්පාදන ජාලය වෙත එකතු කිරීම සීමා කිරීම.

iv. පරිසර හිතකාමී උත්පාදන විකල්ප ප්‍රවර්ධනය.

v. සූර්ය පද්ධති සවිකරනු ලැබූ පාරිභෝගිකයන් වෙත සැලකිය යුතු ආදායමක් ලබා ගැනීමට අවස්ථාවක්.

(iii) බලශක්ති අංශයේ ප්‍රතිපත්ති සම්පාදන සඳහා වගකීම් දරන ප්‍රධාන අමාත්‍යාංශය විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයයි. එබැවින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා අදාළ ගැටලු නිරාකරණය මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය ලෙස සැලකිය හැකිය. මෙම බලතල ලබා දී ඇත්තේ 2015.09.21 දිනැති අංක 1933/13 සහ 2018.12.28 දිනැති අංක 2103/22 දරන අති විශේෂ ගැසට් පත්‍ර මඟිනි.

(iv) ලියාපදිංචි වී තිබෙන ආයතන 243 සහිත ලැයිස්තුව ඇමුණුම 03 ලෙස අමුණා තිබේ.

(v) "සූර්ය බල සංග්‍රාමය" වැඩසටහන කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සේවාදායකයන් වන ආයතන හෝ පුද්ගලයන් වෙත නිර්දේශිත ලිපි නිකුත් කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් පහත සඳහන් ලේඛන සලකා බලනු ලැබේ.

(i) සමාගම් ලියාපදිංචිය සහ අනෙකුත් විස්තර

(ii) සවිකරනු ලබන මාදිලිය (මොඩල්) (සූර්ය පැනල/අපවර්තක)

(iii) මාදිලිවලට අදාළ පිරිවිතර

(iv) ප්‍රමිතියට අනුව උපකරණ පරීක්ෂාව ශ්‍රී ලංකාවේ සිදු කිරීමට පහසුකම් නොමැති බැවින් ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර විසින් නිකුත් කරන ලද පරීක්ෂණ සහතික (සහතික කරනු ලබන ආයතනය - TUV/ SAA/SGS යනාදී වශයෙන්)

සූර්ය පැනල සඳහා - IEC (IEC61730, IEC61215, IEC61701, IEC627)

(v) ජාතික ජාලය සහ අනෙකුත් පිරිවිතර සම්බන්ධ කිරීමට අපවර්තකයට ඇති හැකියාව - අපවර්තක සඳහා IEC/IEEE/ VDE (සහතික කරනු ලබන ආයතනය TUV/SAA/SGS/ යනාදී වශයෙන්)

(vi) මව් සමාගමේ නිර්දේශිත ලිපි

(vii) තෝරාගත් මාදිලි සඳහා (IEEE1547) මොරටුව විශ්වවිද්‍යාලයේ විදුලි ඉංජිනේරු පීඨයේ පරීක්ෂණ සහතිකය

(viii) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඒකාබද්ධව සූර්යබල පද්ධති සහ උපකරණ සඳහා ප්‍රමිති 17ක් පමණ හඳුන්වා දී ඇත.

පහත සඳහන් ආයතනවල නිලධාරින්ගෙන් යුත් ක්‍රියාකාරී තාක්ෂණික කමිටුවක් පත් කරනු ලැබ ඇති අතර, මෙම කමිටුව හරහා නිර්දේශ නිකුත් කිරීමට පියවර ගනු ලැබේ.

(i) මොරටුව විශ්වවිද්‍යාලය

(ii) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම

(iii) විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය

(iv) ලංකා විදුලිබල මණ්ඩලය

(v) ලංකා විදුලි පුද්ගලික සමාගම

(vi) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

(vii) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

(viii) ශ්‍රී ලංකා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

(ඇ) නැත. ප්‍රතික්ෂේප කරමි.

(ඈ) ශ්‍රී ලංකාවේ සංවර්ධනය කළ හැකි සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස සමුද්‍ර තරංග සලකනු ලැබේ. එය ලංකා විදුලිබල මණ්ඩලයේ 2020-2039 සඳහා වන දිගුකාලීන උත්පාදන සැලැස්මේ කෙටුම්පතෙහි 5.4.7 වගන්තිය යටතේ වෙනත් පුනර්ජනනීය ප්‍රභවයක් ලෙස හඳුන්වා දෙනු ලැබේ.

සමුද්‍ර තාප බලශක්ති අනුවර්තනය (OTEC), සමුද්‍ර බලශක්ති (තරංග) අනුවර්තනය, භෞමික තාප බලශක්ති අනුවර්තනය, සම්පීඩිත වායු මූලික බලශක්ති උත්පාදනය, ජීව වායු බලශක්ති උත්පාදනය සහ සුළඟින් සමන්විත බලශක්ති මාරුව (energy shifting) හා දෙමුහුන් පද්ධතිය සූර්ය PV සහ බලශක්ති ගබඩා කිරීම ආදී අනෙකුත් ගබඩා කිරීමේ යෙදවුම් යනාදී නව පුනර්ජනනීය තාක්ෂණික යෙදවුම් සංවර්ධනය කිරීම සඳහා 2019.01.30 දින ජාත්‍යන්තර යෝජනා ඉල්ලා සිටිමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෑතදී ආරම්භ කරන ලද නව පුනර්ජනනීය ප්‍රභව සංවර්ධනය කිරීම අරඹා ඇත. මෙම ආරම්භය විදේශික (exotic) බලශක්ති සංවර්ධනය ලෙස නම් කර ඇති අතර, දේශීය පුනර්ජනනීය බලශක්ති සම්පත සංවර්ධනය කරන අතරම, නව තාක්ෂණික අත් දැකීම් ගෙන ඒමට අපේක්ෂා කෙරේ. වාණිජ ගණයේ මෙහෙයුම් සඳහා සංවර්ධනය කරන ලද ඉහත හඳුනාගත් තාක්ෂණය වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ග්‍රිඩ් අන්තර් සම්බන්ධතා පහසුකම සපයනු ලැබේ.

සමුද්‍ර තරංග බලශක්ති සංවර්ධනය සඳහා අදාළ ලංසුකරුවන්ගෙන් ලංසු ලේඛන දෙකක් ලබාගෙන ඇති නමුත්, ඉදිරිපත් කිරීමට අවසාන දිනය වන 2019.05.15 දින දක්වා දීර්ඝ කරන ලද කාල සීමාව තුළ ලංසුකරුවන් විසින් කිසිදු ඉදිරිපත් කිරීමක් කර නොතිබුණි.

අදාළ ඇමුණුම් සියල්ල **සභාගත*** කරමි.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම අපි පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් හැටියට කටයුතු කළ කාලයේ සිට විවිධ ආණ්ඩු තුළ පත් වුණු විදුලිබල අමාත්‍යතුමන්ලාට අපි විවිධ අවස්ථාවලදී කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා, විදුලි කණු සිටුවීමේදී මාර්ග සීමා තුළ සිටුවීම නොකළ යුතු බවට. අද ග්‍රාමීය මාර්ගවල තදබදය ඇති වීමට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ, විදුලිබල අමාත්‍යාංශය විසින් විදුලි කණු සිටුවීමේදී මාර්ග සීමාව නොතකා අනවශ්‍ය තැන්වල සිටුවීමයි.

ඊළඟට වැටවල් ඒ විදුලි කණු කරා එනවා. ඊට පස්සේ කානුව ඒ විදුලි කණු කරා එනවා. විදුලි කණු පාර මැද තිබෙන නිසා මාර්ග සංවර්ධනය කිරීමේදී පළාත් පාලන ආයතනවලට එය මහා ගැටලුවක් වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඊයේ පෙරේදා මේ අමාත්‍යාංශය භාර ගත්තත්, අපි පළාත් සභාවේ ඉන්න කාලයේදීත්, ඒ වාගේම පළාත් පාලන ආයතනවල ඉන්න කාලයේදීත් දිගින්-දිගටම මේ පිළිබඳ දැඩි අර්බුදයක් මේ රටේ තිබුණා. මේ ප්‍රශ්නය චක්‍රලේඛයකින් හෝ සියලු පළාත් පාලන ආයතන දැනුවත් කරලා, ලංකා විදුලිබල මණ්ඩලය හා පළාත් පාලන ආයතනවල ඉන්න නිලධාරීන් සමඟ සම්බන්ධවෙලා මේ විදුලි කණු සිටුවීමේ කාර්යය කරනවා නම් අපි විශ්වාසයක් ඇති කර ගන්නවා. මා හිතන හැටියට දැන් රට පුරා විදුලි කණු සිටුවා හමාරයි. ඒ වුණත් නැවත කණු සිටුවීමේදී හෝ ප්‍රතිසංස්කරණය කරන වෙලාවේදී හෝ අඩුම ගණනේ පළාත් පාලන ආයතනවලට සහ පළාත් සභාවලට අයිති මාර්ග තුළ කණු සිටුවීමේදී, ඒ මාර්ග සීමාවේ කණු සිටුවනවා නම් වැටවල් සහ තාප්ප මාර්ගයට එන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මේ කාරණය පළාත් පාලන ආයතනවලට මහා දැවැන්ත ගැටලුවක්වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මාර්ග දෙපස ගස්වල අතු සහ අනිකුත් බාධා ඉවත් කිරීමේදී ඔබතුමන්ලා ඒ කාර්යය පවරා තිබෙන්නේ කොන්ත්‍රාත්කරුවන්ටයි. කිසි කෙනෙක් ඒ කපන ලද අත්ත පාරෙන් ඉවත් කරන්නේ නැහැ. ඒ නිසා පයින් ගමන් කරන පුද්ගලයන්ටත් ගැටලුවක් ඇති වෙනවා. ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කරන්න. පළාත් පාලන ආයතනවලට අයිති මාර්ග සහ පළාත් සභාවලට අයිති මාර්ගවල මේ කටයුතු කිරීමේදී, විශේෂයෙන් විදුලි කණු සිටුවීමේදීත්, විදුලි රැහැන් අලුත්වැඩියා කිරීමේදීත් සහ කොන්ත්‍රාත්කරුවන් විසින් බාධා ඉවත් කිරීමේදීත් ගැටලු ඇති වෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අදහස දැන ගැනීමට මා කැමැතියි.

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, අදහස් විමසලා ඒ අනුව ක්‍රියාත්මක කරනවා. නමුත් දවසින්, දවස් දෙකෙන් යටිතල පහසුකම් පිළිබඳ ප්‍රශ්නය විසඳන්න බැහැ. ලංකා විදුලිබල මණ්ඩලයත්, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයත්, ජල සම්පාදන අමාත්‍යාංශයත් එකතුවෙලා public corridors හදන්න කටයුතු කරනවා. මාර්ග දිගේ මේ කටයුතු කළේ නැත්නම් විශාල ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ කටයුතු දැන්වත් ක්‍රියාත්මක කරන්න අපි අත්වැල් බැඳගන්න අවශ්‍යයි. නමුත් මට පෙනෙන්නේ නැහැ, ඒ කටයුතු සිද්ධ වෙනවාය කියලා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, පැහැදිලි කර ගැනීමක් තිබෙනවා. ඔබතුමාත් කියනවා නම් මේ කටයුතු කෙරෙනවා පෙනෙන්න නැහැයි කියලා, මේ ප්‍රශ්නය විසඳෙන්නේ කවදාද කියන එක තමයි ගැටලුව තිබෙන්නේ. මෙය රටේ මහා දැවැන්ත ප්‍රශ්නයක්; මාර්ග තදබදයට එක හේතුවක්. තාප්ප ඉදිකිරීම මාර්ග සීමාවෙයි කරලා තිබෙන්නේ. මා හිතන හැටියට සියයට 75ක්ම මාර්ග සීමාවේ තමයි විදුලි කණු සිටුවා තිබෙන්නේ. මේ විදුලි කණු මායිම් හැටියට සිටුවන නිසායි මේ බාධක තිබෙන්නේ.

ඔබතුමා මේ කාරණය විශේෂ කාරණයක් සේ සලකා මෙතැනින් එහාටවත් මේ තත්ත්වය ඇති නොවන විධියට සියලු ආයතන කැඳවා සාකච්ඡා කොට පිළියමක් යොදන ලෙස මම ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විතරක් නොවෙයි, මේ ප්‍රශ්නය උසාවියටත් යනවා. යම් තැනක විදුලි කණුවක් දමන්න හැදුවොත්, ඊට විරුද්ධව උසාවි දුවනවා. එතකොට අවුරුදු තුන හතර එතැන හිර වෙනවා. එතැන සංවර්ධනය ඇන හිටිනවා. ඒ නිසා දෙකෙන් එකක් කරන්න ඕනෑ. සංවර්ධනය සාධාරණව කළ යුතුයි. නමුත් මේ කටයුතු ඉක්මන් කිරීමේ වැඩපිළිවෙළක් ගෙනයන්නත් අවශ්‍යයි.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා විදුලිබල ඇමතිවරයා වශයෙන් වැඩ භාරගත් අවස්ථාවේ කිව්වා, නැවත විදුලිය බිඳ වැටෙන්න දෙන්නේ නැහැ, නිරන්තරයෙන් රට පුරා විදුලිය ලබා දීමට කටයුතු කරනවා කියලා. නමුත් මම හිතන හැටියට පසුගිය දවසක ඔබතුමාත් නිදාගෙන ඇහැරෙනකොට රාත්‍රී 2.00 සිට උදෑසන 5.00 වෙනතුරු විදුලිය කපා තිබුණා. පිට පළාත්වල රාත්‍රී 9.00 සිට අලුයම 2.00 දක්වා විදුලිය කපා තිබුණා. දැන් උසස් පෙළ විභාගය පැවැත්වීමට ආසන්න වෙලා තිබෙනවා. ඒ වාගේම දෙසැම්බර් මාසයේ සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වීමට නියමිතයි. නමුත් මේ ආකාරයට විදුලිය විසන්ධි කිරීම නිසා, ළමයින්ට උදේට නැඟිටලා පාසල් යන්න, ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු කර ගන්න තිබෙන අවස්ථාව සහ අනෙකුත් සියලු රාජකාරි කටයුතු නොසිතූ ආකාරයෙන් බිඳ වැටෙනවා. ඒ නිසා ඔබතුමා කියූ පරිදි ඒ කාරණය ඉෂ්ට නොවීම පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

ඒ වාගේම කුරගල ප්‍රදේශයේ ඇති වී තිබෙන දැවැන්ත විදුලි බල අර්බුදය පිළිබඳ ප්‍රශ්නය ඔබතුමාට දිගින් දිගටම යොමු කරලා තිබෙනවා. මේ ප්‍රශ්න පිළිබඳව ඔබතුමාගේ ආකල්පය කුමක්ද කියලා දැන ගන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයේ පළමු කොටස සම්බන්ධයෙන් මට කියන්න පුළුවන් වන්නේ, අපේ ගණනය කිරීම අනුව දවසකට මෙගාවොට් 4100ක් ඇති කිරීමේ හැකියාව තිබෙන බවයි. නමුත් පැය තුනකට මෙගාවොට් 175ක්අඩු වෙලා තිබෙනවා. එය සිදුවුණේ විදුලි බල මණ්ඩලයේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. මුදල් අමාත්‍යාංශයෙන් අපට රුපියල් කෝටි 8,100ක් දෙන්න තිබෙනවා. ඒකෙන් අපි ඛනිජ තෙල් සංස්ථාවට රුපියල් කෝටි 6,900ක් දෙන්න තියෙනවා. ඔය දෙක අතර තිබෙන විෂමතාව තමයි ප්‍රශ්නය. ඛනිජ තෙල් සංස්ථාව කිව්වා, සල්ලි දෙන්නේ නැත්නම් තෙල් දෙන්නේ නැහැ කියලා. ඒ ප්‍රශ්නය පැය හතරක් තිබුණා. ප්‍රශ්නය වුණේ එතැනයි. ඊට පසුව දා උදේ මම ඉතා ඕනෑකමින් කථා කරලා ප්‍රශ්නය සමතයට පත් කළා. නමුත් ප්‍රශ්නය උග්‍ර තත්ත්වයට ගිහිල්ලා තිබුණා. ඒ ප්‍රශ්නය නැවත ඇති නොවෙයි කියලා මා අනිවාර්යයෙන් විශ්වාස කරනවා. නමුත් මුදල් අමාත්‍යාංශය නින්දෙන් නැඟිටලා කටයුතු කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේ මතක් කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, කුරගල සම්බන්ධයෙන් තිබෙන්නේ බොහොම අසතුටුදායක තත්ත්වයක්. නායක ස්වාමීන් වහන්සේලා සහ ඒ ප්‍රදේශයේ සිටින මන්ත්‍රීවරු කීප දෙනෙක්ම මේ සම්බන්ධව අපෙන් ඉල්ලීමක් කළා. දවස් හතරක් ඇතුළත කුරගලට විදුලි කණු 26ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය පරිදි ලබා දෙන්න අප සූදානම්.

අපි ඒ වැඩ කටයුතු පටන් අරගෙන දවසක් කටයුතු කරනකොට දෙවැනි දවසේ ඒ කටයුතු නවත්වන්න කියලා ඉහළ නියෝගයක් ඇවිල්ලා තිබුණා. ලක්ෂ දහයකට බලපාන ප්‍රශ්නය අපට දවස් හතරකින් විසඳන්න පුළුවන්. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසරය ලැබෙන්නේ නැති නිසායි ඒ වැඩ කටයුතු කිරීමට නොහැකිවෙලා තිබෙන්නේ. පොලීසියත් එක්ක කථා කරලා ඒ වැඩ කටයුතු කරන්න දැන් අපි බලාපොරොත්තු වනවා. මේ ප්‍රශ්නය ඒ අයගේ දැවෙන ප්‍රශ්නයක් ලෙස සලකනවා. මෙහිදී ආගමික ප්‍රශ්නයක් ඇති නොවන විධියට කටයුතු කරන්න අවශ්‍යයි. මේ ප්‍රශ්නය තිබෙන්නේ කාටද කියන කාරණය සම්බන්ධයෙන් තමයි අපි දැනුවත් කරලා තිබෙන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමකට අවසර දෙන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කුරගල පුරාණ විහාරස්ථානයට විදුලිය ලබා දීම පිළිබඳව සඳහන් කළා. ඉරාජ් වීරරත්න ඇතුළු කණ්ඩායම ඔබතුමාගෙන් කරපු ඉල්ලීම පරිදි කුරගල පුරාණ විහාරස්ථානයට විදුලිය ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක වුණා. දැන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තිබෙන්නේත් මේ ආණ්ඩුව යටතේනේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කියන්නේ විපක්ෂයට අයිති දෙපාර්තමේන්තුවක් නොවෙයිනේ. මා දන්න විධියට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අයිති සජිත් ප්‍රේමදාස ඇමතිතුමාටයි. ලංකා විදුලිබල මණ්ඩලය කුරගල පුරාණ විහාරස්ථානයට විදුලිය ලබා දෙන්න හදනකොට මා දන්න විධියට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මුලින් ඒ සඳහා අනුමැතිය ලබා දෙනවා. නමුත් පැය 24කින් පසුව ඒ අනුමැතිය ඉවත් කර ගන්නවා. මුලින් අනුමැතිය දීලා, පසුව අනුමැතිය ඉවත් කර ගත්තේ ඇයි? මේක පුරාවිද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් හානිකර දෙයක් නම් මුලදීත් ඊට අනුමැතිය නොදී සිටිය හැකියි. අනුමැතිය දීමෙන් පෙනෙන්නේ මෙහි වැරැද්දක් නැහැ කියන එකයි. පසුව ඒ අනුමැතිය ඉවත් කර ගන්නවා. ඒ කියන්නේ, එය කිසියම් දේශපාලන තීරණයක් නේ. ඒ තීරණය නිලධාරි මට්ටමේ තීරණයක් නොවෙයි. ඔබතුමාගේම ඇමති මණ්ඩලයේ සිටින සජිත් ප්‍රේමදාස ඇමතිතුමාත් එක්ක මේ ගැන සාකච්ඡා කරලා විසඳාගෙන, කුරගල පුරාණ විහාරයට විදුලිය ලබා දීමේ කාර්යය ඉටු කරන්න බැරිද කියන එකයි මා ඔබතුමාගෙන් අහන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ කාර්යය ඉටු කරන්න පුළුවන්. ඒ කටයුතු කරගෙන යනවා. නමුත් මා කලිනුත් කිව්වා වාගේ අපි ඒ ආයතන තුළින් අවසර ලබා ගෙන, එම ඉදිකිරීමේ කටයුතු කරන්න සූදානමින් සිටිනවා. වැඩ පටන් ගත්තාට පසුව එක වර ඒ කටයුතු නවත්වා තිබෙනවා. එහෙම වැඩ නැවැත්වූයේ ඇයි කියලා අපි අහනවා. ඉහළ නියෝගයක් අනුව තමයි ඒ කටයුතු නවත්වා තිබෙන්නේ. මේ කාරණය ගැන අපි කැබිනට් මණ්ඩලයේදීත් කථා කළා. එම ප්‍රශ්නය සමථයට පත් විය යුතු උත්තරයක් දැන් යම් විධියකින් ලබා ගත යුතුයි. උත්තරයක් ලබා නොදෙන්නේ ඇයි කියන්න මා දන්නේ නැහැ.

ඒ වාගේම තමයි වියදම. ඒකට ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම රුපියල් ලක්ෂ 11යි. නමුත් ඒක,-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු ඇමතිතුමා, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, මේ ප්‍රශ්නය මෙතැනින් අවසාන වෙන්න ඕනෑ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ කාරණය කියලා මා අවසන් කරනවා.

ගරු ඇමතිතුමා, ඒ සිද්ධියෙන් පසුව ඉරාජ් වීරරත්න කියන ගායකයාගේ ලක්ෂ 11ක පාඨක පිරිසක් හිටපු Facebook page එක පවා block කරනවා. ඒ කියන්නේ, ආණ්ඩුවේ කිසියම් බලධාරියෙකු ඒ Facebook page එක සම්බන්ධයෙන් ඉන්දියාවේ තිබෙන head office එක දැනුවත් කරලා, block කරනවා. මෙහෙම පිටු 1,500කට වඩා block කරලා තිබෙනවා. සජිත් ප්‍රේමදාස අමාත්‍යවරයා ඔබතුමාට ඒ කටයුත්ත කරන්න ඉඩ දීලා, ඒවා නුදුන්නා නොවෙයි. ඔබතුමා ළඟට ඒ ප්‍රශ්නය ගෙනාපු පුද්ගලයාගේ හෝ -ඒ ගෝලයෝ- ආණ්ඩුව හදලා තිබෙන වෙනත් system එකකට අනුව හෝ මේ කටයුතු සිදු වනවාද කියා කියන්න මා දන්නේ නැහැ.

ඉරාජ් වීරරත්නගේ Facebook page එක පවා block කරලා තිබෙන්නේ. අන්තිමට කුරගල පුරාණ විහාරස්ථානයට විදුලියත් නැහැ; ඉරාජ් වීරරත්නගේ Facebook page එකත් නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම විදුලිබල, බලශක්ති ඇමතිවරයා. ඔබතුමා ඒ ගැන ඇසිය යුත්තේ, Telecommunications Regulatory Commission එකෙන්. මම කාරුණිකව කියන්නේ මෙයයි. ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුව තාවකාලික පදනමකින් තොර ස්ථිර නිවසක සිටින ඕනෑ කෙනෙකුට අපි විදුලිය සපයනවා. ඒ ප්‍රදේශයේ අපි කිලෝමීටර් 4ක් දක්වා විදුලිය ලබා දීලා තිබෙනවා. ඉතුරු කණු 28 දැමීම සඳහා තමයි අවසරය අවශ්‍ය වන්නේ. අවසර ගැනීමෙන් අනතුරුව අපි පුළුවන් තරම් ඉක්මනට විදුලිය ලබා දෙනවා. නැත්නම් ඒ ප්‍රශ්නය නැවත ඇති නොවන්නට, මෙන්න මේ අවසරය තිබෙනවා කියලා පොලිසියට කියලා, එය ඉදි කිරීම සඳහා කටයුතු කරන්න විදුලිබල මණ්ඩලය තීන්දු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 11 - 620/'18 - (1), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ජාතික ලොතරැයි මණ්ඩලය නිකුත් කරන ලොතරැයිපත්: විස්තර

தேசிய லொத்தர் சபையினால் வெளியிடப்படும் லொத்தர் சீட்டுக்கள்: விபரம்

LOTTERY TICKETS ISSUED BY NATIONAL LOTTERIES BOARD: DETAILS

637/'19

12. ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන ලොතරැයිපත් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) වර්ෂ 2010 සිට 2018 දක්වා එම එක් එක් ලොතරැයිපත,

(i) අළෙවියෙන් ලැබූ ආදායම;

(ii) අළෙවියෙන් ලැබෙන ආදායමෙන් දිනුම් වශයෙන් වෙන් කරනු ලබන මුදල හෝ මුළු ආදායමේ ප්‍රතිශතය;

(iii) අළෙවියෙන් පසු කුඩාම දිනුමේ සිට ඉහළම දිනුම දක්වා දිනුම්ලාභීන් සංඛ්‍යාව;

(iv) දිනුම් හිමි ලොතරැයිපත් අළෙවි නොවීමෙන් හෝ අළෙවි වී ඇති දිනුම් හිමි ලොතරැයිපත් සඳහා පුද්ගලයන් ඉදිරිපත් නොවීමෙන් වාර්ෂිකව රජයට ඉතුරු වී ඇති මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) தேசிய லொத்தர் சபையினால் வெளியிடப்படும் லொத்தர் சீட்டுக்கள் யாவை என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) 2010 தொடக்கம் 2018 ஆம் ஆண்டு வரையில் அந்த ஒவ்வொரு லொத்தர் சீட்டு தொடர்பிலும்,

(i) விற்பனையில் கிடைத்த வருமானம் எவ்வள வென்பதையும்;

(ii) விற்பனையில் கிடைத்த வருமானத்தில் வெற்றி பெற்றவர்களுக்காக ஒதுக்கப்படும் தொகை அல்லது மொத்த வருமானத்தின் சதவீதம் எவ்வளவென்பதையும்;

(iii) விற்பனையின் பின்னர் குறைந்த வெற்றித் தொகையிலிருந்து அதிகூடிய வெற்றித்தொகை வரை வெற்றியாளர்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(iv) வெற்றிக்குரிய லொத்தர் சீட்டு விற்பனை செய் யப்படாமை அல்லது விற்பனை செய்யப்பட்ட வெற்றிக்குரிய லொத்தர் சீட்டு உரிமையாளர் வெற்றியைப் பெற முன்வராமையினால் அரசாங் கத்திற்கு வருடாந் தம் எஞ்சிய தொகை எவ்வள வென்பதையும்;

ஒவ்வொரு ஆண்டு அடிப்படையில் தனித்தனியே எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House what the lottery tickets issued by the National Lotteries Board are?

(b) Will he also inform this House separately, according to each year-

(i) the revenue earned from sales;

(ii) the amount or the percentage allocated as prize money from the total revenue earned from sales;

(iii) the number of winners in the ascending order of the prize money won after sales; and

(iv) the amount left with the government annually from the unsold lottery tickets with prizes or due to unclaimed prize money;

from each lottery issued during the period 2010-2018?

(c) If not, why ?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දැනට පවත්වාගෙන යනු ලබන ලොතරැයිපත් පහත පරිදි වේ.

මහජන සම්පත

වාසනා සම්පත

ගොවිසෙත

සුපිරි වාසනා

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ජාතික සම්පත
නීරෝගා
මෙගා පවර්
සෙවණ (දිනුම් අදින)
ධන නිධානය
ඩොලර් ෆෝචූන්
සමෘද්ධි
සෙවණ (ක්ෂණික)

(ආ) (i) ඇමුණුම 01හි දක්වා ඇත. මම එම ඇමුණුම **සභාගත** කරන්නම්. අවශ්‍ය නම් එහි හරය කියවන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, සභාගත කරනවාට ඔබතුමා එකඟද?

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
එකඟයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිරි පිළිතුරු සහ ඇමුණුම් 01,02,03 මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(ආ) (ii) එක් එක් ලොතරැයි වර්ගය අනුව අළෙවි ආදායමෙන් ත්‍යාග වශයෙන් වෙන් කරනු ලබන ප්‍රතිශතය පහත පරිදි වේ.

ලොතරැයි වර්ගය	ත්‍යාග වශයෙන් වෙන් කරන ප්‍රතිශතය
ගොවිසෙත	47%
මහජන සම්පත	49%
වාසනා සම්පත	47%
සුපිරි වාසනා	47%
ජාතික සම්පත	47%
නීරෝගා	49%
මෙගා පවර්	48%
සෙවණ (දිනුම් අදින)	49%
ධන නිධානය	47%
ක්ෂණික ලොතරැයි	
සමෘද්ධි	49%
සෙවණ - රු.20/-	53%
සෙවණ - රු.50/-	53%
සෙවණ - රු.10/-	49%

(iii) වර්ෂ 2014 සිට 2018 දක්වා ලොතරැයිපත් අනුව දිනුම්ලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ලබාගත හැකි වූ අතර, එය ඇමුණුම (02)**හි දක්වා ඇත.

(iv) පිළිතුර ඇමුණුම (03)**හි දක්වා ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මගේ අතුරු ප්‍රශ්න දෙක මම අහන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහලා තිබෙනවා, දිනුම් හිමි ලොතරැයිපත් සඳහා වූ ත්‍යාග බෙදිලා නැතුව ඉතුරු වෙච්ච මුදල් ගැන. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම මුදල් පාවිච්චි වෙන්නේ කුමන කාර්යයක් සඳහාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම ඒක උදාහරණයකින් කිව්වොත් මෙහෙමයි. අපි මහජන සම්පත ගනිමු. මහජන සම්පත අළෙවියෙන් ලැබෙන මුළු ආදායමෙන් සියයට 49ක්ම යන්නේ දිනපු අයට ගෙවීමටයි. ඒකෙන් සියයට 16.5ක් යන්නේ ඒකාබද්ධ අරමුදලට. ඒ කියන්නේ සියයට 65.5යි. ඊට අමතරව දිස්ත්‍රික්ක ඒජන්තවරුන්ටත්, අනෙකුත් ඒජන්තවරුන්ටත් අළෙවි කිරීම වෙනුවෙන් දළ වශයෙන් සියයට 17.5ක් යනවා.

ඒවායේ මුළු එකතුව සියයට 83ක් පමණ වෙනවා. එතකොට, ඉතිරි සියයට 17 තමයි වියදමට සහ ක්‍රියාවලිය සඳහා ලොතරැයි මණ්ඩලයට ඉතිරි වන්නේ.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මට මතක හැටියට, 1980 ගණන්වල සංවර්ධන ලොතරැයියෙන් තමයි ලොතරැයි ක්‍රමය පටන් ගත්තේ. ඒ කාලයේ එක ලොතරැයියක් විතරයි තිබුණේ. අද වනවිට ලොතරැයි ගණනාවක්ම බිහිවෙලා තිබෙනවා. අද කෘෂිකර්ම කටයුතු වෙනුවෙන් එක් ලොතරැයියක් තිබෙනවා. ඒ වාගේ එක එක කටයුතු සඳහා නොයෙක් නොයෙක් ලොතරැයි අද තිබෙනවා. වාරිමාර්ග කටයුත්තක් තිබෙනවා කියලා අපි හිතමු. ලොතරැයිවලින් ලැබෙන මුදල්වලින් ඉතිරි වන කොටසක් විවිධ පළාත්වල තිබෙන එවැනි වාරිමාර්ග කටයුතු සාර්ථක කරගන්න ලබා දෙන්න බැරිද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඒක, ඒ ඒ ලොතරැයිය අනුව කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට "ගොවිසෙත" ලොතරැයිය ගත්තොත්, ඒකෙන් සියයට 10ක් ගොවීන්ගේ භාරකාර අරමුදලට යනවා. එම මුදල එතැනට ගියාට පස්සේ, එම මුදල පාවිච්චි කරන්නේ කොහොමද කියන එක තීරණය කරන්නේ එතැන සිටින භාරකරුවන්. ඒ විධියට මහජන සම්පත ලොතරැයිය ඒකාබද්ධ අරමුදලටත්, වාසනා සම්පත ලොතරැයිය ඒකාබද්ධ අරමුදලටත්, ගොවිසෙත ලොතරැයිය ගොවීන්ගේ භාරකාර අරමුදලටත්, සුපිරි වාසනා

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සම්පත ලොතරැයිය රණවිරු සේවා අරමුදලට, ක්‍රීඩා අරමුදලට සහ සමාජ සේවා අරමුදලටත්, ජාතික සම්පත ලොතරැයිය ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට සහ ශ්‍රම වාසනා අරමුදලටත්, නීරෝගා ලොතරැයිය ජාතික වකුගඩු අරමුදලටත්, මෙගා පවර් ලොතරැයිය ඒකාබද්ධ අරමුදලටත්, සෙවණ ලොතරැයිය සෙවණ අරමුදලටත්, ධන නිධානය ලොතරැයිය ඒකාබද්ධ අරමුදලටත් දායකත්වය දක්වනවා.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මට පොඩි පැහැදිලි කර ගැනීමකට අවස්ථාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, කියන්න.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, විසඳී නැති එවැනි ප්‍රශ්න ගණනාවක් දැන් මේ රටේ තිබෙනවා. අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය උදාහරණයක් විධියට ගනිමු. අපේ ගම් පළාත්වල තිබෙන රෝහල්වල අද අඩු පාඩු රාශියක් තිබෙනවා. අන්න ඒ වාගේ අඩු පාඩු සපුරන්න පුළුවන් ක්‍රමවේදයකට මෙම මුදල් යොදවන්න පුළුවන් නම් හොඳයි කියන එක තමයි මගේ යෝජනාව. ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම ඔබතුමාට භාරයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ස්තුතියි. ඒ යෝජනාව මම ඉදිරිපත් කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 13 -679/'19- (1), ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14 -682/'18- (2), ගරු කනක හේරත් මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රාදේශීය ළමාරක්ෂක නිලධාරි තනතුර: පත්වීම්
பிரதேச சிறுவர் பாதுகாப்பு உத்தியோகத்தர் பதவி: நியமனம்
POST OF DIVISIONAL CHILD PROTECTION OFFICER: APPOINTMENTS

687/'18

15. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රාදේශීය ළමාරක්ෂක නිලධාරි තනතුරු (MA03-iii ශ්‍රේණිය) සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට සම්මුඛ පරීක්ෂණයක් පැවැත් වූ බවත්;

(ii) එම පරීක්ෂණයෙන් සමත්වූවන්ට, ඔවුන් සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වූ බව හා එම තනතුර සඳහා තෝරාගෙන ඇති බව දන්වා ඇති බවත්;

(iii) ඊට අදාළ පත්වීම් ලිපිය යථා කාලයේදී එවන බව ජාතික ළමාරක්ෂක අධිකාරියේ සභාපතිනියගේ අත්සන සහිත අංක NCPA/AU/418(i)(06) හා 2017.12.14 දිනැති ලිපිය මඟින් නුගේගොඩ, උඩහමුල්ල, කුඹුක්කන්ගහ පොකුණ පාර, 3 වැනි මාවතේ, අංක 58/5 දරන නිවසේ පදිංචි එච්.එල්.ඒ. ලුණුවිල මහත්මියට දන්වා ඇති බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) මෙලෙස තෝරාගත් පුද්ගලයන් වෙනුවට දේශපාලන සම්බන්ධකම් පදනම් කර ගනිමින් වෙනත් පිරිසක් බඳවා ගැනීමට ක්‍රියා කරමින් පවතින්නේද;

(ii) ලුණුවිල මහත්මිය ඇතුළු සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වූ පුද්ගලයන්ට පත්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම පත්වීම් ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் உலர் வலய அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பிராந்திய சிறுவர் பாதுகாப்பு உத்தியோகத்தர் பதவிகளுக்காக (MA 03-iii தரம்) தகுதி வாய்ந்தவர்களைத் தெரிவு செய்வதற்காக நேர்முகப் பரீட்சையொன்று நடத்தப்பட்டது என்பதையும்;

(ii) அந்த பரீட்சையில் சித்தியடைந்தவர்களுக்கு அவர்கள் சித்தியடைந்துள்ளதாகவும் அப் பதவி களுக்காக தெரிவுசெய்யப்பட்டுள்ளதாகவும் அறிவிக்கப்பட்டுள்ளது என்பதையும்;

(iii) அதற்குரிய நியமனக் கடிதம் உரிய காலத்தில் அனுப்பி வைக்கப்படுமென தேசிய சிறுவர் பாதுகாப்பு அதிகார சபையின் தலைவியின் ஒப்பத்துடன் NCPA/AU/418(i)(06) ஆம் இலக்க மற்றும் 2017.12.14 ஆம் திகதிய கடிதத்தின் மூலம் நுகேகொட, உடஹமுல்ல, கும்புக்கன்கஹ பொக்குன வீதி, 3 ஆம் மாவத்தை, 58/5 இலக்கமுடைய வீட்டில் வதியும் திருமதி. எச். எல். ஏ. லுணுவில அவர்களுக்கு அறிவிக்கப் பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இவ்வாறு தெரிவு செய்யப்பட்ட ஆட்களுக்குப் பதிலாக அரசியல் தொடர்புகளை அடிப் படையாகக் கொண்டு வேறு குழுவினரை ஆட்சேர்ப்புச் செய்வதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றனவா என்பதையும்;

(ii) திருமதி லுணுவில உள்ளிட்ட நேர்முகப் பரீட்சையில் சித்தியடைந்தவர்களுக்கு நியமனங் கள் வழங்கப்படுமா என்பதையும்;

[ගරු බිමල් රත්නායක මහතා]

(iii) ஆமெனில், குறிப்பிட்ட நியமனங்கள் வழங்கப் படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs and Dry Zone Development:

(a) Is she aware that-

(i) an interview was held to select suitable candidates for the post of Divisional Child Protection Officer (Grade MA03-iii);

(ii) the candidates who passed the said interview have been informed that they have passed the interview and selected for the aforesaid post; and

(iii) Mrs. H.L.A. Lunuwila of No. 58/5, 3rd Lane, Kumbukkangaha Pokuna Rd., Udahamulla, Nugegoda was informed by letter No. NCPA/AU/418(i)(06) dated 14.12.2017 signed by the Chairperson of the National Child Protection Authority that the relevant appointment letter will be sent to her in due course?

(b) Will she inform this Houses-

(i) whether action is being taken to recruit a group of some other persons based on political connections instead of recruiting those who were selected in the above-mentioned manner?

(ii) whether those who passed the interview including Mrs. Lunuwila will be granted appointments; and

(iii) if so, the date on which appointments will be given to them?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i), (ii), (iii) ඔව්.

(ආ) (i) නැත.

(ii) මේ වන විටත් පත්වීම ලබා දී ඇත.

(iii) 2018 ඔක්තෝබර් 11වන දින පත්වීම් ලබා දී ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කලින් කිව යුතුයි, ගරු ඇමතිතුමා කියවපු පිළිතුර මට පැහැදිලි වුණේ නැති බව.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේ පිළිතුර දිහා බැලුවාම මටත් ඒ බව පෙනෙනවා. ගරු ඇමතිතුමිය අද ඇවිල්ලාත් නැහැ. ඇත්ත වශයෙන්ම, පිළිතුරත් පැහැදිලි නැහැ. මට හිතෙන විධියට පිළිතුර නැවත ගෙන්වා ගන්න වෙයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට පෙනෙනවා ඇති, මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ 2017 වර්ෂයට පසුවයි කියන එක. ඒ නිසා නැවත මේ ප්‍රශ්නය ඉදිරිපත් කළොත් මේ පාර්ලිමේන්තු වාරයේදී මේ ප්‍රශ්නයට උත්තර ලබා ගන්න වෙන්නේ නැහැ. ඔබතුමා අවශ්‍ය සාධාරණය ඉටු කරනවා ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුරක් යවන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් ලැස්ති කරන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පුළුවන් වුණොත්, අපි හෙටම ඔබතුමාට ලිඛිතව පිළිතුර දෙන්න බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවන වටය.

LED බල්බ මිලියන 10ක් බෙදා දීමේ ව්‍යාපෘතිය: විස්තර
10 மில்லியன் LED மின்குமிழ்களைப் பகிர்ந்தளிக்கும் கருத்திட்டம்: விபரம்
PROJECT FOR DISTRIBUTION OF 10 MILLION LED BULBS: DETAILS

11/'18

1. ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna on behalf of the Hon. Hesha Withanage)
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) LED බල්බ මිලියන 10ක් විදුලි පාරිභෝගිකයන් අතර බෙදා දීමට කටයුතු කරන ලද්දේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය සඳහා වැයවූ මුදල කොපමණද;

(iii) එකී ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල විදුලි පාරිභෝගිකයන්ගෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කිරීම අසාධාරණ බව පිළිගන්නේද;

(iv) ඉහත ව්‍යාපෘතිය මෙහෙයවන ලද ආයතනය කවරේද;

(v) එම ව්‍යාපෘතිය අසාර්ථක වූ බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு, எரிசக்தி மற்றும் தொழில்துறை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 10 மில்லியன் LED மின்குமிழ்களை வாடிக்கை யாளர்களிடையே பகிர்ந்தளிக்க நடவடிக்கை மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கருத்திட்டத்திற்கு செல வான பணத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்திற்கு செலவிடப்பட்ட பணத் தொகையை மின் வாடிக்கையாளர் களிடமிருந்து மீளஅறவிட்டுக் கொள்வதற்கு நடவடிக்கை மேற்கொள்வது அநீதியானது என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்தை வழிப்படுத்திய நிறுவனம் யாது என்பதையும்;

(v) மேற்படி கருத்திட்டம் தோல்வியடைந்துள்ளது என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power, Energy and Business Development:

(a) Will he inform this House-

(i) whether action was taken to distribute 10 million LED bulbs among power consumers;

(ii) if so, the cost of that project;

(iii) whether he admits that taking action to recover the cost of the said project from consumers is unfair;

(iv) the institution that monitored the said project; and

(v) whether he admits that the said project was a failure?

(b) If not, why?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණය පිළිබඳ ජාතික වැඩසටහන යටතේ මෙරට විදුලි පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම LED විදුලි පහන් භාවිතය ප්‍රචලිත කිරීම සඳහා සහ අකාර්යක්ෂම සූත්‍රිකා විදුලි පහන් භාවිතය අවම කිරීම සඳහා සහන මිලට LED විදුලි පහන් බෙදා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත. (**ඇමුණුම*** 01)

විදුලි පාරිභෝගිකයන් අතර මෙතෙක් LED විදුලි පහන් බෙදා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇති අතර මේ සඳහා වන නියමු ව්‍යාපෘති 03ක් කොළොන්නාව, කෑගල්ල හා හොරණ ප්‍රදේශයන්හි සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. ඒ යටතේ LED විදුලි පහන් ලබා දීම සිදු කර ඇත.

(ii) මෙම වැඩසටහන යටතේ පළමු LED විදුලි පහන් ප්‍රමාණය ලෙස ලක්ෂ 10ක් සැපයිය යුතු අතර, සියලු බදු ඇතුළත් මිල රුපියල් 169,602,797.98කි. සැපයුම්කරු මෙවැනි තොග 10ක් මෙම මිලටම සැපයීමට එකඟ වී ඇත. ඒ අනුව වැඩසටහන සඳහා වන සම්පූර්ණ ආයෝජනය රුපියල් 1,696,027,979.80ක් වේ. (**ඇමුණුම*** 02)

(iii) කාර්යක්ෂම LED විදුලි පහන් භාවිතය තුළින් විදුලි පාරිභෝගිකයන්ගේ විදුලි පරිභෝජනය අඩු වන අතර, එම තත්ත්වය තුළ විදුලි පාරිභෝගිකයන්ගේ විදුලිය සඳහා වන වියදම අඩු වේ. එමෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් 1,696,027,979.80ක වියදමක් දැරීමට සිදු වේ. ඉහත (අ) (i) හි දක්වා ඇති සහන වැඩ පිළිවෙළ යටතේ මෙම විදුලි පහන් සඳහා යන වියදම පොලී රහිත මාසික වාරික 24කින් පාරිභෝගිකයන් වෙතින් අය කර ගැනීම අසාධාරණ නොවේ.

(iv) ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකායේ මෙහෙයවීම මත ඉල්ලුම් පාර්ශවීය බලශක්ති කළමනාකරණ මෙහෙයුම් කමිටුව, විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්.) සමාගම හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය.

(v) වැඩසටහන තවමත් මූලික අදියරේ ඇති බැවින් එම වැඩසටහනේ සාර්ථක හෝ අසාර්ථක බව තක්සේරු කිරීමට කාලය ප්‍රමාණවත් නැත.

(ආ) අදාළ නොවේ.

ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග : වවුනියාව දිස්ත්‍රික්කය
புனரமைக்கப்பட்ட நீர்ப்பாசனத்திட்டங்கள்: வவுனியா மாவட்டம்
RENOVATED IRRIGATION SCHEMES : VAVUNIYA DISTRICT

267/'18

5. ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී වව්නියාව දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

[ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப் பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015, 2016 மற்றும் 2017 ஆம் ஆண்டுகளில் வவுனியா மாவட்டத்தில் புனரமைக்கப்பட்ட சிறிய, மத்திய மற்றும் பாரிய அளவிலான நீர்ப்பாசனத் திட்டங்கள் யாவையென்பதையும்;

(ii) ஒவ்வொரு புனரமைப்புப் பணிக்காகவும் மதிப் பிடப்பட்ட பணத்தொகை தனித்தனியாக எவ்வளவென்பதையும்;

(iii) மேற்படி புனரமைப்புப் பணிகளுக்காக கேள்விப் பத்திரங்கள் கோரப்பட்டனவா என்பதையும்;

(iv) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களைப் பெற்றுக்கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டிய லொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு வருடத்துக்கும் ஏற்புடைய தான புனரமைப்புப் பணிகளின் பௌதீக மற்றும் நிதிசார் முன்னேற்றம் தனித்தனியாக யாதென் பதையும்;

(vi) மேற்படி புனரமைப்புப் பணிகளுக்கான சாத்தியக்கூறு ஆய்வு, சுற்றாடல் மற்றும் பொறியியல் அறிக்கைகளை சமர்ப்பிப்பாரா என்பதையும்;

(vii) மேற்படி புனரமைப்புப் பணிகளின் போது அகற்றப்பட்ட வண்டல் படிவு, மண் அல்லது மணலுக்காக கேள்விப் பத்திரங்கள் கோரப் பட்டனவா என்பதையும்;

(viii) ஆமெனில், அக் கேள்விப் பத்திரங்களை பெற்றுக் கொண்ட ஒப்பந்தகாரர்களின் பட்டியலொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the minor, medium and major-scale irrigation schemes renovated in Vavuniya District in the years 2015, 2016 and 2017;

(ii) the estimated amount for each renovation work, separately;

(iii) whether tenders were called for the said renovation work;

(iv) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted;

(v) the physical and financial progress of the renovation work of that contract with relevance to each of the aforesaid years;

(vi) whether the feasibility study, environmental and engineering reports relevant to that renovation work will be submitted;

(vii) whether tenders were called for the silt, soil or sand removed in renovation work; and

(viii) if so, whether a list of names of the contractors who obtained those tenders will be submitted?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

වර්ෂය	සුළු පරිමාණ වාරිමාර්ග
2015	සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය
2016	වැව් ප්‍රතිසංස්කරණය
	අතහැර දමන ලද වැව්
	ඇලමාර්ග
	ගංවතුර හානි
2017	අත්හැර දමන ලද අමුණු ප්‍රතිසංස්කරණය
	අත්හැර දමන ලද වැව් පිළිසකර කිරිම
	වැව් ප්‍රතිසංස්කරණය
	වැව් සුළු අලුත්වැඩියා
	විශේෂ ව්‍යාපෘති

මධ්‍යම පරිමාණ වාරිමාර්ග - 2015, 2016, 2017 වසරවල මරුතමඩු, රජේන්ද්‍රකුලම්, යන මධ්‍ය වාරිමාර්ග ව්‍යාපාරවල වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායී වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු , ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු, දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනීම, ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

මහා පරිමාණ වාරිමාර්ග - 2015,2016,2017 වසරවලදී පාවට්කුලම් (Pavatkulam), මුහන්තන්කුලම්, ඉරට්පෙරියකුලම්, යන මහා වාරිමාර්ග ව්‍යාපාරයේ වාරිමාර්ග පද්ධති මෙහෙයුම් හා නඩත්තු, නිර්මිත ඉදිකිරීම් සහ මුලස්ථායී වැඩ ප්‍රතිසංස්කරණය, කෘෂි මාර්ග නඩත්තු කටයුතු , ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු , දෙපාර්තමේන්තු ඉඩම් හා අනෙකුත් වත්කම් ආරක්ෂා කර ගැනිම , ගංවතුර හානි අලුත්වැඩියාවන් සිදු කර ඇත.

(ii)

වර්ෂය	සුළු පරිමාණ වාරිමාර්ග	ඇස්තමේන්තු මුදල (රු.)	මුළු ඇස්තමේන්තු මුදල (රු.)
2015	සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය	25,508,510.00	25,508,510.00
2016	වැව් ප්‍රතිසංස්කරණය	65,753,900.00	193,930,577.60
	අතහැර දමන ලද වැව්	12,570,000.00	
	ඇලමාර්ග	34,488,000.00	
	ගංවතුර හානි	81,118,677.60	
2017	අත්හැර දමන ලද අමුණු ප්‍රතිසංස්කරණය	21,831,623.85	183,615,454.95
	අත්හැර දමන ලද වැව් පිළිසකර කිරිම	19,206,519.27	
	වැව් ප්‍රතිසංස්කරණය	110,520,891.83	
	වැව් සුළු අලුත්වැඩියා	2,826,120.00	
	විශේෂ ව්‍යාපෘති	29,230,300.00	
2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.)			**403,054,542.55**

වර්ෂය හා වාරි ව්‍යාපාරය		මධ්‍යම පරිමාණ වාරිමාර්ග	ඇස්තමේන්තු මුදල (රු.)	මුළු ඇස්තමේන්තු මුදල (රු.)
2015	මරුතමඩු / රජේන්ද්‍රකුලම් / කැලබෝගස්වැව / කල්ආරු	මෙහෙයුම් හා නඩත්තු	1,955,373.00	16,358,099.00
		ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු	6,035,000.00	
		කෘෂි මාර්ග නඩත්තු කිරීම	8,095,726.00	
		නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම	272,000.00	
2016	මරුතමඩු / රජේන්ද්‍රකුලම් / කැලබෝගස්වැව / කල්ආරු	මෙහෙයුම් හා නඩත්තු	640,780.00	27,894,241.00
		ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු	23,997,000.00	
		කෘෂි මාර්ග නඩත්තු කිරීම	2,004,000.00	
		නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම	1,252,461.00	
2017	මරුතමඩු / රජේන්ද්‍රකුලම් / කැලබෝගස්වැව / කල්ආරු	මෙහෙයුම් හා නඩත්තු	468,880.00	5,174,976.00
		ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු	2,045,000.00	
		කෘෂි මාර්ග නඩත්තු කිරීම	2,093,000.00	
		නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම	568,096.00	
2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.)				49,427,316.00

වර්ෂය හා වාරි ව්‍යාපාරය		මහා පරිමාණ වාරිමාර්ග	ඇස්තමේන්තු මුදල (රු.)	මුළු ඇස්තමේන්තු මුදල (රු.)
2015	පාවට්ටකුලම් (Pavatkulam) / මුහන්තන්කුලම් / ඉරටිපෙරියකුලම්	මෙහෙයුම් හා නඩත්තු	5,467,397.00	44,993,770.00
		ගංවතුරහානි අලුත්වැඩියාවන්	595,000.00	
		ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු	20,835,536.00	
		නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම	1,171,611.00	
		කෘෂි මාර්ග නඩත්තු කිරීම	16,924,226.00	
2016		මෙහෙයුම් හා නඩත්තු	7,528,761.00	34,072,514.00
		ගංවතුරහානි අලුත්වැඩියාවන්	494,700.00	
	පාවට්ටකුලම් (Pavatkulam) / මුහන්තන්කුලම් / ඉරටිපෙරියකුලම්	ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු	18,572,536.00	
		නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම	3,251,517.00	
		කෘෂි මාර්ග නඩත්තු කිරීම	4,225,000.00	
2017	පාවට්ටකුලම් (Pavatkulam) / මුහන්තන්කුලම් / ඉරටිපෙරියකුලම්	මෙහෙයුම් හා නඩත්තු	5,804,905.00	14,123,711.00
		ඇල මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු	4,200,000.00	
		නිර්මිත ඉදිකිරීම් හා මූලස්ථායි වැඩ ශක්තිමත් කිරීම	1,873,806.00	
		කෘෂි මාර්ග නඩත්තු කිරීම	2,245,000.00	
2015, 2016, 2017 වසර සඳහා මුළු ඇස්තමේන්තු මුදල (රු.)				93,189,995.00

(iii) **සුළු පරිමාණ වාරිමාර්ග** - ක්‍රියාත්මක කරන ලද රු. මිලියන 05 ට අඩු ව්‍යාපෘති සෘජු කොන්ත්‍රාත් ලෙස අදාල ගොවි සංවිධාන වෙත පවරා ඉටුකරන ලද අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වව්නියාව දිස්ත්‍රික්කය වෙත ලබා දෙන අතර දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරු විසින් අදාල කොන්ත්‍රාත් පිරිනමනු ලැබේ.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - ටෙන්ඩර් කැඳවීමෙන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලද ව්‍යාපෘති නැත.

(iv) **සුළු පරිමාණ වාරිමාර්ග** - ඉදිරිපත් කළ හැක.

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - නැත

(v) **සුළු පරිමාණ වාරිමාර්ග**

වර්ෂය	වියදම (රු.)	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය	
			වැඩ අවසන්	අඛණ්ඩව
2015	24,217,042.52	94.93	24	-
2016	163,413,743.53	84.26	58	-
2017	131,655,138.14	71.70	58	-

මහා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග - සියලු ම කාර්යයන් වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ අවසන් කර ඇති අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% වේ.

(vi) **සුළු පරිමාණ වාරිමාර්ග** - අදාල නොවේ

මධ්‍ය හා මහා පරිමාණ වාරිමාර්ග - දැනට පවතින ව්‍යාපාරවල ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා අලුත්වැඩියා කිරීම් කටයුතු සඳහා ශක්‍යතා අධ්‍යයන වාර්තා සහ පරිසර වාර්තා සකස් කිරීම අවශ්‍ය නොවේ. සියලු කාර්යයන් සඳහා නිලධාරින් විසින් ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කර සැලසුම් කිරීමෙන් අනතුරුව ඇස්තමේන්තු සකස් කර ඇත.

(vii) නැත.

(viii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This answer is also placed in the Library.]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 11 -620/'18- (1), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 13 -676/'19- (1), ගරු චන්දිම ගමගේ මහතා.

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஷிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කල්බදු ක්‍රමයට ගත් ගුවන් යානය නැවත බදු දීම: විස්තර

குத்தகைக்குப் பெற்ற விமானத்தை மீளக் குத்தகைக்குவிடல்: விபரம்
SUBLEASE OF AIRCRAFT TAKEN ON LEASE: DETAILS

682/'18

14.ගරු විමල් වීරවංශ මහතා (ගරු කනක හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு கனக ஹேரத் சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon. Kanaka Herath)

මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

[ගරු විමල් වීරවංශ මහතා]

(අ) (i) සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගම විසින් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ගුවන් යානයක් එම සමාගම විසින් කල්බදු ක්‍රමය යටතේ වෙනත් ගුවන් සමාගමකට නැවත ලබා දී තිබේද;

(ii) එම ගුවන් යානය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ලීසිං සමාගම සඳහා සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගම විසින් ගෙවනු ලබන මාසික කල්බදු වාරිකය කොපමණද;

(iii) නැවත කල්බදු ක්‍රමය යටතේ ලබා දී ඇති ආයතනය විසින් සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර්ලයින් සමාගමට ගෙවනු ලබන මාසික කල්බදු වාරිකය කොපමණද;

(iv) ඉහත ගුවන් යානය ගුවන් මෙහෙයුම් බලපත්‍රයට සහ සිවිල් ගුවන් යානා ලියා පදිංචි ලේඛනයට ඇතුළත් වන්නේද;

(v) එම ගුවන් යානයට ලියා පදිංචි අංකයක් තිබේ නම්, එම අංකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீலங்கன் விமான நிறுவனத்தினால் குத்தகை அடிப்படையில் பெற்றுக் கொள்ளப்பட்ட விமானமொன்று இந்நிறுவனத்தினால் குத்தகை அடிப்படையில் வேறு நிறுவனமொன்றுக்கு மீளளிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி விமானம் குத்தகை அடிப்படையில் பெறப்பட்ட லீசிங் நிறுவனத்திற்கு ஸ்ரீலங்கன் விமான நிறுவனத்தினால் செலுத்தப்படும் மாதாந்த குத்தகை தவணைப் பணம் எவ்வளவென்பதையும்;

(iii) மீண்டும் குத்தகை அடிப்படையில் பெற்றுக் கொடுக்கப்பட்ட நிறுவனத்தினால் ஸ்ரீலங்கன் விமான நிறுவனத்திற்கு செலுத்தப்படும் மாதாந்த குத்தகை தவணைப் பணம் எவ்வள வென்பதையும்;

(iv) மேற்படி விமானம் விமானப் பயண அனுமதிப் பத்திரம் மற்றும் சிவில் விமானங்கள் பதிவு பட்டியலுக்குள் உள்ளடக்கப்படுமா என்பதையும்;

(v) மேற்படி விமானத்திற்கு பதிவிலக்கம் இருக்குமெனின், அவ்விலக்கம் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance :

(a) Will he inform this House-

(i) whether an aeroplane leased out by SriLankan Airlines had been sublet to another airline by the SriLankan Airlines itself;

(ii) the monthly lease rental paid by SriLankan Airlines to the leasing company from which the aeroplane was leased out;

(iii) the monthly lease rental paid to the SriLankan Airlines by the airline for which the aeroplane was sublet;

(iv) whether the aforesaid aeroplane has been included in the Aero Operation License and Civil Aviation Registry; and

(v) the registration number of the aforesaid aeroplane, if there is any such registration number?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2017 ජුනි 16 දින Aercap මඟින් කල්බදු ගනු ලැබූ MSN 1008 ගුවන් යානය 2017 ජුනි 16 සිට 2018 සැප්තැම්බර් 30 දක්වා වන කාල සීමාව සඳහා HI FLY TRANSPORTERS SA සමාගමට නැවත කල්බදු දෙනු ලැබිය. මෙසේ කල්බදු දෙනු ලැබූ කාල සීමාව අවසන් වීමෙන් පසු ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් නැවත වෙනත් ගුවන් සමාගමකට කල්බදු දී නොමැත.

(ii) ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් වර්තමානයේ කල්බදු සමාගමට ඇමෙරිකානු ඩොලර් 585,000ක් ගෙවන අතර මෙම අගය 2023 ජුනි 16 දින සිට ඉතිරි කල්බදු කාල සීමාව සඳහා ඇමෙරිකානු ඩොලර් 485,000ක් වනු ඇත.

(iii)

කල්බදු කාලය	බදු කුලී ප්‍රමාණය
2017 සැප්තැම්බර් 30 ඇතුළත්ව ආපසු ලබා දීමේ දිනය	US$ 490,000
2018 මාර්තු 31 ඇතුළුව 2017 ඔක්තෝබර් 01 සිට	US$ 150,000
2018 අප්‍රේල් 01 දින සිට කාලය අවසන් වන දිනය	US$ 490,000

(iv) ශ්‍රී ලන්කන් ගුවන් සමාගම සිවිල් ගුවන් යානා ලියා පදිංචි ලේඛනයේ ලියා පදිංචි වී ඇති අතර ගුවන් මෙහෙයුම් බලපත්‍රය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් සිටී.

(v) 4R-ALS MSN 1008 (A330-200)

(ආ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳව දැනුම් දීම.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Douglas Devananda?

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 22/7 இன்கீழான என்னுடைய 3 கேள்விகளுக்கான பதில்களை இன்று தருவதாகச் சொல்லப்பட்டது. ஆனால், இதுவரை அதற்கான பதில்கள் கிடைக்கப்பெறவில்லை. ஆனபடியால், இன்றோ நாளையோ எனக்கு அந்தப் பதில்களைக் கிடைக்கச்செய்தால் வரவேற்கக்கூடியதாக விருக்கும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපි කිව්වේ, අඩු ගණනේ මේ සතිය ඇතුළතදීවත් මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා කියායි, නේද ගරු සභානායකතුමනි?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we have informed the Hon. Ministers, but they have not responded. I think you should take some action in this regard.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I think we should take it up at the Party Leaders' Meeting today.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes, Sir.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත
குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவை (திருத்தம்) சட்டமூலம்
CODE OF CRIMINAL PROCEDURE (AMENDMENT) BILL

"1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2019 ජූලි 23වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர் சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2019 யூலை 23, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற் பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice and Prison Reforms; to be read a Second time upon Tuesday, 23rd July, 2019 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இலங்கை பிளாஸ்ரிக் மற்றும் இறப்பர் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
PLASTICS AND RUBBER INSTITUTE OF SRI LANKA (INCORPORATION) BILL

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

*වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත කර්මාන්ත හා වාණිජ කටයුතු **කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම,සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා** වෙත පවරන ලදී.*

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள், நீண்டகாலமாக இடம்பெயர்ந்த நபர்களின் மீள்குடியேற்றம் மற்றும் கூட்டுறவுத்துறை அபிவிருத்தி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Industry and Commerce, Resettlement of Protracted Displaced Persons and Co-operative Development and Vocational Training and Skills Development for report.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය විසින් අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද, "ශ්‍රී ලංකා ප්ලාස්ටික් සහ රබර් ආයතනය (සංස්ථාගත කිරීමේ)" පනත් කෙටුම්පතේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ(5) (අ) ව්‍යවස්ථාවට යටත් වන බව නීතිපතිතුමා විසින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 51(2) (අ) යටතේ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස එම පනත් කෙටුම්පතෙහි පිටපත් එක් එක් පළාත් සභාවට යොමු කරන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරමි.

අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංගත්වය
பிரதம அமைச்சர், அமைச்சரவை உள்ளிட்ட அரசாங்கம்மீதான நம்பிக்கையின்மை
VOTE OF NO CONFIDENCE IN PRIME MINISTER, CABINET AND GOVERNMENT

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී
*ඊට අදාළ ප්‍රශ්නය **[2019 ජූලි 10]***
ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.
சம்பந்தப்பட்ட வினா - [2019, யூலை 10]

Order read for resuming Adjourned Debate on Question - [10th July, 2019]

"ගරු අනුර දිසානායක මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු බිමල් රත්නායක මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,- අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංගත්වය,- වර්ෂ 2019 අප්‍රේල් 21 වැනි පාස්කු ඉරිදා දින කොළඹ, මීගමුව සහ මඩකලපුව යන ප්‍රදේශවල සිදු වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ඇතුළු දෙසිය පනහකට අධික පිරිසක් ඝාතනය වීමත්, තවත් පන්සියයකට ආසන්න පිරිසක් තුවාල ලැබීමත් සහ එකී බෝම්බ ප්‍රහාර හේතුවෙන් වූ දේපළ හානිය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් නිසි තොරතුරු ලැබී තිබියදී සාපරාධී නොසැලකිල්ලෙන් පහත සඳහන් කෙරෙන ක්‍රියාවන් කරමින් හෝ නොකර හැරීමෙන් ද:-

(අ) 2019.05.08 වැනි දින අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ පරිදි 2014 වර්ෂයේ සිට අයිඑස්අයිඑස් -ISIS- ජාත්‍යන්තර ඉස්ලාම් අන්තවාදී සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ පිරිස් විවිධ සබඳතා පැවැත්වූ බවත්, විවිධ ක්‍රියාකාරකම්වල යෙදුණු බවත් දැන සිටියදී ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට අපොහොසත් වීම;

(ආ) විවිධ ඉස්ලාම් ආගමික අන්තවාදී සංවිධාන මුස්ලිම් සමාජය තුළ ක්‍රියාත්මක වන බවට මුස්ලිම් ප්‍රජාව විසින්ම විවිධාකාරයෙන් ආණ්ඩුව සහ වගකිව යුතු ආයතන දැනුවත් කර තිබියදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම;

(ඇ) කාත්තන්කුඩි ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට විවිධ අවස්ථාවල එල්ල කරන ලද තර්ජන සහ ප්‍රහාර සම්බන්ධයෙන් 2019 අප්‍රේල් 21 වැනි දින බෝම්බ පුපුරවාගෙන මිය ගිය සහරාන් හෂීම් සහ 2019 අප්‍රේල් 26 වැනි දින සයින්දමරුදුහිදී බෝම්බ පුපුරුවාගෙන මිය ගිය ඒ. එල්. එම්. නියාස් යන අයවලුන්ට එරෙහිව අධිකරණය විසින් වරෙන්තු නිකුත් කර තිබියදී සහ එකී වරෙන්තුකරුවන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ප්‍රසිද්ධව විවිධ ක්‍රියාකාරකම්වල යෙදී සිටියදී ඔවුන් අත්අඩංගුවට ගැනීමට හෝ නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම;

(ඈ) වර්ෂ 2018 දෙසැම්බර් 24 වැනි දින මාවනැල්ලේ දී බුද්ධ ප්‍රතිමාවන්ට හානි කිරීම සම්බන්ධයෙන් සහරාන් හෂීම් ප්‍රමුඛ කණ්ඩායමක් සම්බන්ධ බවට ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය විසින් ජාතික බුද්ධි අංශය වෙත 2018 දෙසැම්බර් 28 වැනි දින දැනුම් දී තිබියදීත්, හා මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් සැක කරමින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබියදීත් විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යාම වළක්වමින් ඒ සඳහා මැදිහත් වීම් තිබුණු බව ආණ්ඩුවේ අමාත්‍යවරයකු විසින්ම ප්‍රකාශ කර තිබීම;

(ඉ) මෙම ප්‍රහාරයන්ට සැලකිය යුතු කාලයකට පෙර සිට ශ්‍රී ලංකාව තුළ ඉස්ලාම් අන්තවාදී සංවිධානවල විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂයෙන් සැලකිය යුතු ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණයක් අයිඑස්අයිඑස් - ISIS- සංවිධානය සමඟ බැඳී කටයුතු කිරීම ඇතුළු කරුණු සම්බන්ධයෙන් නීතිමය සහ ආරක්‍ෂක පියවර ගැනීමට අපොහොසත් වීම;

(ඊ) ආරක්‍ෂක මණ්ඩලයේ සාමාජිකයකු වන අග්‍රාමාත්‍යවරයා ආරක්ෂක මණ්ඩල සභාවාරයන්ට සහභාගි නොවීමෙන් රට වැසියා වෙත ඔහු විසින් ඉටු කළ යුතු මූලික වගකීම් පැහැර හැරීම;

(උ) විදේශීය ඔත්තු සේවාවන් විසින් ශ්‍රී ලංකාව තුළ කතෝලික දේවස්ථාන හා හෝටල් ඉලක්ක කරගෙන මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කෙරෙන බවත්, එයට සම්බන්ධ පුද්ගලයන් හා ඔවුන්ගේ දුරකථන අංක, ජාතික හැඳුනුම්පත් අංක ඇතුළු නිශ්චිත තොරතුරු ලබා දී තිබියදී එම තොරතුරු මත පදනම්ව කටයුතු කිරීම පැහැර හැරීම;

වැඩිමනත් ලෙස 2019.04.21 වැනි දින ප්‍රහාරයන්ට පෙර අදාළ විදේශ ඔත්තු සේවාවන් විසින් නැවතත් මෙම ප්‍රහාරයන් සම්බන්ධයෙන් නිශ්චිතව අනතුරු අඟවා තිබියදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පැහැර හැරීම;

(ඌ) 2019.04.11 වැනි දින නියෝජ්‍ය පොලිස්පති, විශේෂ ආරක්ෂක දිසාව ප්‍රියලාල් දසනායක මහතා විසින් ``Information of an alleged plan attack" යන ශීර්ෂය හා අංක DIG/SPR/126/4.19 දරන ලිපිය මඟින් 2019 අප්‍රේල් 21 වැනි දින නිශ්චිත ස්ථාන ඉලක්ක කරගෙන සැලසුම්ගත මරාගෙන මැරෙන ප්‍රහාරයන් එල්ල වන බවට, එනම් "ජාතික තව්හිත් ජමාත් නායක මොහොමඩ් සහරාන් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරක් සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව මඟින් ලබා දී තිබූ වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින්" යනුවෙන් සඳහන් ලිපිය පහත නම් සඳහන් එනම්,

අධ්‍යක්‍ෂ/ඇමති ආරක්‍ෂක කොට්ඨාසය

අධ්‍යක්‍ෂ / අධිකරණ ආරක්‍ෂක කොට්ඨාසය

අධ්‍යක්‍ෂ / විශ්‍රාමික ජනාධිපති ආරක්‍ෂක කොට්ඨාසය

වැඩ බලන අධ්‍යක්‍ෂ/තානාපති ආරක්‍ෂක කොට්ඨාසය (iv)

වැඩ බලන අධ්‍යක්‍ෂ/ විශ්‍රාමික ජනාධිපති ආරක්‍ෂක කොට්ඨාසය (v)

අයවලුන්ට පූර්වයෙන් ලබා දී තිබීම හා ඒ පිළිබඳ කටයුතු කිරීම පැහැර හැරීම, යන ඉහත කරුණු අනුව 2019.04.21 වැනි දින සිවිල් වැසියන් ඉලක්ක කර ගනිමින් සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය අවශ්‍යයෙන්ම වළකා ගැනීමට හෝ හානිය අවම කරගත හැකිව තිබූ හෙයින්ද;

(එ) 2019.04.21 වැනි දින සිදු කරනු ලැබූ ප්‍රහාර මාලාවෙන් පසුව අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍යවරුන් විසින් එකී ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් වූ වගකීම භාර නොගෙන එම වගකීම වෙනත් පාර්ශ්වයන්ට පැවරීමට උත්සාහ කරමින්ද, රජයේ අමාත්‍යවරුන් විසින් වගකීම් විරහිත, පරස්පර සහ සාවද්‍ය ප්‍රකාශයන් සිදු කරමින් රටේ සාමාන්‍ය ජන ජීවිතය හා මහජන ආරක්‍ෂාව සම්බන්ධයෙන් ව්‍යාකූලභාවයක් සහ අනාරක්‍ෂිතභාවයක් ඇති වන පරිදි කටයුතු කර ඇති හෙයින්ද;

(ඒ) 2019.04.21 වැනි පාස්කු ඉරිදා දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාවලියට බාධා කරමින් සහ එකී අපරාධයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට බාධා කරමින් හෝ වළක්වමින් ආණ්ඩුවේ සමහර අමාත්‍යවරුන් කටයුතු කර ඇති හෙයින්ද;

(ඔ) 2019.04.21 වැනි දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර මාලාවෙන් පසුව තවත් එවැනි ප්‍රහාර මාලාවක් ඇති වීම හෝ වෙනත් ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදු කිරීම මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය පූර්ණ නීති මාලාවක් රාජ්‍යය සතුව තිබියදී 2019.05.13 වැනි දින ගම්පහ ප්‍රදේශයේ සහ වයඹ පළාතේ සිදු වූ අන්තවාදී ප්‍රචණ්ඩකාරී ක්‍රියා, එනම් මනුෂ්‍ය ඝාතන, දේපළ හානි සහ ජනතාව අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා නිසි අවධානයකින් සහ වගකීමෙන් කටයුතු නොකිරීමේ සහ එකී සිද්ධීන් මැඩපැවැත්වීම සඳහා ගතයුතු නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මත ජනතාව සම්බන්ධයෙන් රජය විසින් ඉටු කළ යුතු යුතුකම් වගකීම් නිසි ආකාරයෙන් ඉෂ්ට කිරීම පැහැර හැරීමෙන් සහ 2019.04.21 වැනි දින ප්‍රහාර මාලාවෙන් පසුව රටෙහි විවිධ ජන වර්ගයන් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් සහ

ප්‍රහාරයන්වලට යොමු වීමේ ප්‍රවණතාවයක් තිබියදී එකී ප්‍රහාරයන් වළක්වා ගැනීමට කටයුතු නොකළ හෙයින්ද;

(ඔ) එකී පාස්කු ඉරිදා දින ප්‍රහාරයෙන් මාසයක් ගතවී තිබියදී, රටෙහි සාමාන්‍ය ආර්ථික ක්‍රියාවලිය නැවත ගොඩ නැඟීමට අසමත් වී ඇති හෙයින්ද, රටෙහි පාසල් සහ සරසවි අධ්‍යාපන ක්‍රියාවලිය නැවත ගොඩ නැඟීමට අසමත් වී ඇති හෙයින්ද, රාජ්‍ය සහ පුද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය නැවත යථා තත්ත්වයට පත් කිරීමට අසමත් වී ඇති හෙයින්ද, ආණ්ඩුවක් වශයෙන් රටෙහි ජනතාව වෙත තමන් විසින් ඉටුකළ යුතු වගකීම් සහ වගවීම් පැහැර හැර ඇති හෙයින්ද; සහ

2019.04.21 වැනි දින ප්‍රහාර මාලාව වැළැක්වීමට අසමත් වූ නිසා මෙන්ම ඉන් පසුවද රටේ ආරක්‍ෂක තත්ත්වය සහ සිවිල් ජන ජීවිතය යථා තත්ත්වයට පත් නොකිරීම නිසා ඇති වී තිබෙන අරාජික තත්ත්වය මත රටේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට විදේශ රාජ්‍යයන්ට ඉඩකඩ හරිමින් ක්‍රියා කර ඇති හෙයින්ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය ඇතුළු ආණ්ඩුව සම්බන්ධයෙන් තවදුරටත් විශ්වාස භංගත්‍වයට පත්ව ඇති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි."

"கௌரவ அநுர திசாநாயக்க
கௌரவ விஜித ஹேரத்
கௌரவ நிஹால் கலப்பத்தி
கௌரவ சுனில் ஹந்துன்னெத்தி
கௌரவ பிமல் ரத்நாயக்க

கௌரவ (டாக்டர்) நளிந்த ஜயதிஸ்ஸ,- பிரதம அமைச்சர், அமைச்சரவை உள்ளிட்ட அரசாங்கம் மீதான நம்பிக்கையின்மை,- 2019 ஏப்ரல் 21 ஆம் திகதி உயிர்த்த ஞாயிறு தினத்தன்று கொழும்பு, நீர்கொழும்பு மற்றும் மட்டக்களப்பு ஆகிய பிரதேசங்களில் இடம்பெற்ற தற்கொலை பயங்கரவாத தாக்குதல்கள் காரணமாக இலங்கைப் பிரசைகள் உள்ளிட்ட இருநூற்றைம்பதுக்கு மேற்பட்ட எண்ணிக்கை யானோர் படுகொலை செய்யப்பட்டமை, மேலும் ஐநூறுக்குக் கிட்டிய எண்ணிக்கையுடையோர் காயமடைந்தமை மற்றும் மேற்படி குண்டுத் தாக்குதல் காரணமாக ஏற்பட்ட ஆதனச் சேதம் தொடர்பில் பிரதம அமைச்சர், அமைச்சரவை மற்றும் அரசாங்கத்திற்கு உத்தியோக பூர்வரீதியாக தகவல்கள் கிடைத்திருந்த போதிலும் வன்மமான உதாசீனத்துடன் கீழே குறிப்பிட்ட செயல்களைப் புரிந்தமை அல்லது புரியாமல் விட்டமையால் :-

(அ) 2019.05.08 ஆம் திகதி பிரதம அமைச்சர் பாராளுமன்றத்தில் குறிப்பிட்டதன் பிரகாரம் 2014 ஆம் ஆண்டிலிருந்து ஐஎஸ்ஐஎஸ் (ISIS) சர்வதேச இஸ்லாம் தீவிரவாத அமைப்புடன் இலங்கையைச் சேர்ந்த குழுவினர் உறவுகளைப் பேணிவந்ததாகவும் பல்வேறு செயற்பாடுகளில் ஈடுபட்டு வந்ததாகவும் அறிந்திருந்தும் அது சம்பந்தமாக உரிய நடவடிக்கைகளை மேற்கொள்ளத் தவறியமை;

(ஆ) பல்வேறு இஸ்லாம் சமய தீவிரவாத அமைப்புகள் முஸ்லிம் சமூகத்தில் இயங்கி வருவதாக முஸ்லிம் சமுதாயத்தின ராலேயே பல்வேறு விதத்தில் அரசாங்கத்திற்கும் பொறுப்புக் கூறவேண்டிய நிறுவனங்களுக்கும் விழிப்புணர்வூட்டி இருக்கையில் அது சம்பந்தமாக செயலாற்றத் தவறியமை;

(இ) காத்தான்குடி பிரதேசத்தில் வாழ்கின்ற மக்கள்மீது பல்வேறு சந்தர்ப்பங்களில் விடுத்துள்ள எச்சரிக்கைகள் மற்றும் தாக்குதல்கள் தொடர்பாக 2019 ஏப்ரல் 21 ஆம் திகதி குண்டு வெடிக்கச் செய்வித்து இறந்த சஹ்ரான் ஹஷீம் மற்றும் 2019 ஏப்ரல் 26 ஆம் திகதி சாய்ந்தமருதுவில் குண்டு வெடிக்கச் செய்வித்து இறந்த ஏ.எல்.எம். நியாஸ் ஆகியவர்களுக்கு எதிராக நீதிமன்றத்தினால் பிடியாணை விடுத்துள்ள போதிலும் மற்றும் மேற்படி பிடியாணை பிறப்பிக்கப் பட்டவர்கள் காத்தான்குடி பிரதேசத்தில் வெளிப்படையாகவே பல்வேறு செயற்பாடுகளில் ஈடுபடும் போது அவர்களை கைதுசெய்யவோ அல்லது உரிய சட்டப்படி நடவடிக்கை மேற்கொள்ளவோ தவறியமை;

(ஈ) 2018 ஆம் ஆண்டு திசெம்பர் 24 ஆம் திகதி மாவனெல்லயில் புத்தர் சிலைகளை சேதப்படுத்தல் தொடர்பாக சஹ்ரான் ஹஷீம் முதன்மையாகக்கொண்ட குழுவொன்றுக்கு தொடர்பு இருப்பதாக ஸ்ரீ லங்கா முஸ்லிம் பேரவையினால் தேசிய புலனாய்வு பிரிவிற்கு 2018 திசெம்பர் 28 ஆம் திகதி அறிவித்துள்ள போதிலும் மற்றும் இத்தாக்குதல் தொடர்பாக சந்தேகத்தின் பேரில் சிலர் கைதுசெய்யப்பட்ட போதிலும் விசாரணைகள் முன்னெடுப்பதைத் தடுத்து அதில் தலையீடுகள் மேற்கொண்டதாக அரசாங்கத்தின் அமைச்ச ரொருவரை குறிப்பிட்டிருந்தமை;

(உ) மேற்படி தாக்குதல்களுக்கு கணிசமான காலத்திற்கு முன்பிருந்தே இலங்கைக்குள் இஸ்லாமிய தீவிரவாத அமைப்புகளின் பல்வேறு செயற்பாடுகள் தொடர்பாக விசேடமாக கணிசமான எண்ணிக்கைகொண்ட இலங்கையர் ஐ.எஸ்.ஐ.எஸ். (ISIS) அமைப்பில் சேர்ந்து செயற்படுதல் உள்ளிட்ட விடயங்கள் தொடர்பான சட்டரீதியான மற்றும் பாதுகாப்பு நடவடிக்கை மேற்கொள்ளத் தவறியமை;

(ஊ) பாதுகாப்பு சபையின் அங்கத்தவராகிய பிரதம அமைச்சர், பாதுகாப்புச் சபை கூட்டத்தொடர்களில் கலந்து கொள்ளாமை யின் மூலம் நாட்டு மக்களுக்கு அவரால் ஆற்றப்பட வேண்டிய அடிப்படைப் பொறுப்புகளைத் தவறவிட்டமை;

(எ) இலங்கையில் கத்தோலிக்க தேவாலயங்கள் மற்றும் ஹோட்டல்களை இலக்குவைத்து தற்கொலைக் குண்டுத் தாக்குதல்கள் முன்னெடுக்கப்படவுள்ளதாகவும், இதனுடன் தொடர்புடைய நபர்கள் மற்றும் அவர்களது தொலைபேசி இலக்கங்கள், தேசிய அடையாள அட்டை இலக்கங்கள் உள்ளிட்ட உரிய தகவல்கள் வெளிநாட்டு புலனாய்வு சேவைகளினால் வழங்கப்பட்டிருக்கையில், அத்தகவல்களை அடிப்படையாகக் கொண்டு நடவடிக்கை மேற்கொள்வதைத் தவறவிட்டமை;

மேலும் 2019.04.21 ஆம் திகதி, குறிப்பிட்ட தாக்குதல்களுக்கு முன்னதாக குறிப்பிட்ட வெளிநாட்டு புலனாய்வு சேவைகள் மீண்டும் இத் தாக்குதல்கள் தொடர்பில் திட்டவட்டமான முன்னெச்சரிக்கைகளை விடுத்திருக்கையில் இது தொடர்பில் நடவடிக்கை மேற்கொள்வதைத் தவறவிட்டமை;

(ஏ) 2019.04.11 ஆம் திகதி பிரதி பொலிஸ் மா அதிபர் - விஷேட பாதுகாப்பு பிரிவின் திரு. பிறியலால் தசநாயக்க, "Information of an alleged plan attack" எனும் தலைப்பு மற்றும் DIG/ SPR/126/4.19 ஆம் இலக்கக் கடிதத்தின் மூலம், 2019 ஏப்ரல் 21 ஆம் திகதி திட்டவட்டமான இடங்களை இலக்குவைத்து திட்டமிடப்பட்ட கொலைத் தாக்குதல் இடம்பெறுமென அதாவது "தேசிய தவ்ஹீத் ஜமாத் அமைப்பின் தலைவர் மொஹமட் சஹ்ரான் இந்நாட்டில் தற்கொலைத் தாக்குதல் ஒன்றை நடாத்துவதற்கு திட்டமிடுவதாக கிடைத்த தகவல் தொடர்பாக அரச புலனாய்வு சேவையினால் வழங்கப் பட்டிருந்த அறிக்கையில் உள்ளடங்கிய விடயங்கள் தொடர்பாக விசேட கவனத்தினைச் செலுத்தி" எனப்படும் கடிதம் பின்வரும் பெயர்கள் குறிப்பிடப்பட்டுள்ள அதாவது;

பணிப்பாளர்/ அமைச்சர் பாதுகாப்புப் பிரிவு

பணிப்பாளர்/ நீதித்துறை பாதுகாப்புப் பிரிவு

பணிப்பாளர்/ ஓய்வு பெற்ற சனாதிபதி பாதுகாப்புப் பிரிவு

பதில் பணிப்பாளர்/ தூதுவர் பாதுகாப்புப் பிரிவு (iv)

பதில் பணிப்பாளர்/ ஓய்வு பெற்ற சனாதிபதி பாதுகாப்புப் பிரிவு (v)

ஆகியோருக்கு முதலில் வழங்கப்பட்டிருத்தலும் அது தொடர்பான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவது புறக்கணிக்கப்பட்டிருத்தலும் ஆகிய மேற்படி விடயங்களின் பிரகாரம் 2019.04.21 ஆம் திகதி சிவில் மக்களை இலக்காகக் கொண்டு மேற்கொள்ளப்பட்ட பயங்கரவாதத் தாக்குதலைக் கட்டாயமாகத் தடுப்பதற்கு அல்லது சேதத்தினைக் குறைத்துக் கொள்ள இயலுமானதாக இருந்ததனாலும்;

(ஐ) 2019.04. 21 ஆம் திகதி மேற்கொள்ளப்பட்ட தொடர் தாக்குதலின் பின்னர் பிரதம அமைச்சர் மற்றும் அமைச்சர்கள் அத்தாக்குதல் தொடரின் பொறுப்பினை ஏற்காமல் அப் பொறுப்பினை வேறு தரப்புகளுக்குச் சாட்டுவதற்கு முயற்சித் துக்கொண்டு, அரசாங்கத்தின் அமைச்சர்கள் பொறுப் பற்றதும், ஒன்றுக்கொன்று முரணானதும் பொய்யானதுமான கூற்றுக்களை முன்வைத்து நாட்டின் இயல்பு வாழ்க்கை மற்றும் பொது மக்கள் பாதுகாப்பு என்பன தொடர்பாக

குழப்பமானதும் பாதுகாப்பற்றதுமான நிலைமை ஏற்படக் கூடிய வகையில் செய்யப்பட்டுள்ளதனாலும்;

(ஒ) 2019.04.21 ஆம் திகதி உயிர்த்த ஞாயிறு தினத்தன்று மேற்கொள்ளப்பட்ட தாக்குதல் தொடர்பாக கைது செய்யப்பட்ட சந்தேக நபர்கள் தொடர்பான புலனாய்வுச் செயன்முறைக்கு தடைகளை ஏற்படுத்தியும், அக் குற்றச்செயல்கள் தொடர்பாக சட்டத்தை நடைமுறைப் படுத்துவதற்கு தடைகளை ஏற்படுத்தியும் அல்லது தடுத்தும் அரசாங்கத்தின் சில அமைச்சர்கள் செயற்பட்டுள்ளதனாலும்;

(ஓ) 2019.04.21 திகதி மேற்கொள்ளப்பட்ட பயங்கரவாத தொடர் தாக்குதல்களின் பின்னர் மீண்டும் அவ்வாறானதொரு தொடர் தாக்குதல் மேற்கொள்ளப்படுதல் அல்லது வேறு வகையிலான வன்முறைச் சம்பவங்கள் இடம்பெறுவதை தடுப்பதற்கு அவசியமான பூரணமான சட்டங்கள் இலங்கை அரசிடம் காணப்பட்ட போதும், 2019.05.13 திகதி கம்பஹா பிரதேசத்திலும் வடமேல் மாகாணத்திலும் மேற்கொள்ளப் பட்ட தீவிரவாத வன்முறைச் சம்பவங்கள் அதாவது ஆட்கொலைகள், சொத்துக்களுக்கு சேதம் விளைவித்தல் மற்றும் மக்களிடையே மோதல்கள் ஏற்படுவதை தடுப்பதற்காக உரிய கவனத்துடனும் பொறுப் புடனும் நடந்துகொள்ளாமை அத்துடன் அவ்வாறான சம்பவங்களை கட்டுப்படுத்துவதற்கு எடுக்கவேண்டிய உரிய வழிமுறைகளை முறையாக பின்பற்றாததால் பொதுமக்கள் தொடர்பில் அரசாங்கத்தால் நிறைவேற்ற வேண்டிய கடமைகள் மற்றும் பொறுப்புக்கள் உரிய முறையில் நிறைவேற்றப்படுவதை தவறவிட்டமை அத்துடன் 2019.04.21 திகதி நடத்தப்பட்ட தொடர் தாக்குதல்களின் பின்னர் நாட்டிலுள்ள பல்லின மக்களிடையே அமைதியின்மை மற்றும் தாக்குதல்களில் ஈடுபடுவதற்கான முனைப்பு காணப்பட்ட போதும் அவ்வாறான தாக்குதல்களை தடுக்க நடவடிக்கை எடுக்காததாலும்;

(ஔ) மேற்சொல்லப்பட்ட உயிர்த்த ஞாயிறு தாக்குதல் நடத்தப்பட்டு ஒரு மாதம் கடந்துள்ள நிலையில் நாட்டின் வழமையான பொருளாதார செயற்பாட்டினை மீண்டும் கட்டியெழுப்புவதில் தோல்வி கண்டுள்ளதாலும், நாட்டில் பாடசாலைகள் மற்றும் பல்கலைக்கழகங்களின் கல்விச் செயற்பாடுகளை மீண்டும் கட்டியெழுப்பத் தவறியுள்ளதாலும், அரச மற்றும் தனியார் துறையின் செயற்பாடுகளை மீள இயல்பு நிலைக்கு கொண்டு வர தவறியுள்ளதாலும் அரசாங்கம் என்ற வகையில் நாட்டு மக்களுக்கு தாம் ஆற்ற வேண்டிய பொறுப்புகளையும் கடமைகளையும் ஆற்றுவதற்கு தவறியுள்ளதாலும்; மற்றும்

2019.04.21 ஆம் திகதியன்று இடம்பெற்ற தொடர் தாக்குதல்களை தடுக்க தவறியுள்ள காரணத்தினாலும் அதைத் தொடர்ந்தும் கூட நாட்டின் பாதுகாப்பு நிலைமை மற்றும் சிவில் மக்கள் வாழ்வை இயல்பு நிலைக்கு கொண்டு வராத காரணத்தினால் ஏற்பட்டுள்ள அராஜக நிலைமையின் பேரில் நாட்டின் உள்ளக நடவடிக்கைகளில் தலையீடு செய்வதற்கு வெளிநாடுகளுக்கு இடமளிக்கும் வகையில் செயற்பட்டுள்ளதாலும்;

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் பிரதம அமைச்சர், அமைச்சரவை உள்ளிட்ட அரசாங்கம் மீது இனியும் நம்பிக்கை இல்லை என இப்பாராளுமன்றம் தீர்மானம் நிறைவேற்றுமாக".

"Hon. Anura Dissanayaka
Hon. Vijitha Herath
Hon. Nihal Galappaththi
Hon. Sunil Handunnetti
Hon. Bimal Rathnayake
Hon. (Dr.) Nalinda Jayathissa,- Vote of No Confidence in Prime Minister, Cabinet and Government,- Vote of No Confidence in Prime Minister, Cabinet and Government, Whereas despite the fact that proper information had been made available regarding suicide terrorist attacks that occurred in Colombo, Negombo and Batticaloa areas on Easter Sunday which fell on 21st April 2019 to the Prime Minister, the Cabinet and the government, whose action amount to criminal negligence or omission by the commission or omission of acts as specified below as a result of which over 250 persons including Sri Lankan citizens have been killed, nearly 500 more have been wounded and properties have been damaged:

(a) Failure to take any action despite the knowledge that certain sections of Sri Lankans had maintained various relationships with the international Islamic extremist organization ISIS and had been engaged in various activities since 2014 as has been stated by the Prime Minister on 08.05.2019 in Parliament;

(b) Failure to take action although the Muslim community itself had informed the government and relevant institutions responsible that various Islamic religious extremist organizations are functioning within the Muslim society;

(c) Failure to apprehend or properly enforce the law against Saharan Hashim who killed himself by exploding a bomb on the 21st April 2019 in relation to threats and attacks unleashed on the people living in Kaththankudy area at various instances and A. L. M. Niyaz who killed himself by exploding a bomb in Saindamarudu on 26th April 2019, despite warrants being issued against them by the court while the perpetrators were engaging in various activities in Kaththankudy area in public;

(d) Despite the Sri Lanka Muslim Council informing the National Intelligence wing on the 28th December 2018 that a group led by Saharan Hashim was involved in damaging Buddha statues in Mawanella on the 24th of December 2018 and despite a few people having being taken into custody in suspicion of this attack a Minister of the Government himself has stated that there were interventions obstructing the continuation of those investigations;

(f) Failure to take legal and security measures in relation to various activities of Islamic extremist organizations well before these attacks took place and particularly about the involvement of a significant number of Sri Lankans with the ISIS organization and doing various activities with it;

(g) The neglect of the fundamental responsibilities the Hon. Prime Minister is expected to fulfil to the people of the country, by the Hon. Prime Minister who is a member of the Security Council, not participating at the sessions of the Security Council;

Notwithstanding specific information provided by foreign intelligence services that suicide bomb attacks would be carried out in Sri Lanka including the persons involved, their telephone numbers and National Identity Card numbers, targeting Catholic churches and hotels, neglecting to act upon such information;

Moreover, neglecting to act, despite specific warnings regarding these attacks made again by foreign intelligence services prior to such attacks on 21.04.2019;

(h) Failing to act upon, notwithstanding prior information being provided to;

Director/ Ministerial Security Division

Director/ Judicial Security Division

Director/ Former Presidents' Security Division

Acting Director/ Diplomatic Security Division (iv)

Acting Director/ Former Presidents' Security Division (v)

through letter No. DIG/SPR/126/4.19 titled "Information of an alleged plan attack" dated 11.04.2019 by Deputy Inspector General of Police, Priyalal Dassanayake in charge of Special Protection Range stating that planned suicide attacks would be launched targeting specific locations i.e. "Drawing special attention to matters included in the report provided by the State Intelligence Service as regards information to the effect that a suicide attack had been planned in the country by Mohammead Zahran, the leader of the National Thowheeth Jamath";

and whereas, as per the aforesaid matters, the terrorist attack carried out on 21.04.2019 targeting civilians could have essentially been prevented or damage could have been minimized;

(i) Whereas the Prime Minister and the Ministers have acted in such a way to create confusion and insecurity in relation to ordinary public life and public security subsequent to the series

of attacks carried out on 21.04.2019 by not accepting the responsibility for the said series of attacks but trying to put the blame on other parties, with the Ministers of the government making irresponsible, contradictory and false statements;

(j) Whereas certain Ministers of the government have acted to obstruct the investigation process regarding the suspects arrested in relation to the Easter Sunday attack on 21.04.2019 and to obstruct or prevent law enforcement in relation to the said crimes;

(k) Whereas the government has omitted to fulfill its duties and obligations to the people by failing to act with due vigilance and responsibility and by failing to follow the proper procedure to suppress such incidents to prevent the extremist violent actions, such as homicides, damages to property and conflicts among people that occurred in Gampaha and the North Western Province on 13.05.2019 despite the possession of comprehensive set of laws to suppress the recurrence of a similar series of attacks or perpetration of crimes of any other form subsequent to the series of terrorist attacks that took place on 21.04.2019 and failed to prevent such attacks despite the unrest among different communities and the tendency to carry out attacks that prevailed in the country subsequent to the series of attacks on 21.04.2019;

(l) Whereas it has been unable to restore the normal economic processes of the country even after the lapse of a period of one month since the Easter Sunday attack, and it has failed to bring the school and university systems in the country back to normalcy, and it has failed to restore the functioning of public and private sectors, and where as it has neglected its duties and responsibilities as a government towards the citizens of this country; and

Whereas it has acted creating room for foreign countries to interfere in internal affairs of the country on the grounds of the anarchic situation that has been created in the country consequent to its failure to prevent the serial attacks on 21.04.2019 and due to its failure to restore the security situation and the civil life of the country back normalcy;

That this Parliament resolves that it has further lost confidence in Prime Minister, Cabinet and Government of the Democratic Socialist Republic of Sri Lanka."

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.
Question again proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු විමල් වීරවංශ මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 11.40]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබී තිබෙන ඉතා කෙටි කාලය ඇතුළත, ජනතා විමුක්ති පෙරමුණ විසින් ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව සම්බන්ධ කරුණු කිහිපයක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

කියුබාවේ අසහාය නායක පිදෙල් කැස්ත්‍රෝ සහෝදරයා කියා තිබෙනවා, "කියුබානු විප්ලවවාදීන් වූ අප අතින් වැරැදි සිදුවී ඇත. ඉදිරියේදීද වැරැදි සිදු වීමට හැක. එහෙත් දේශද්‍රෝහී වීමේ වරද නම් අප අතින් කවදාකවත් සිදු නොවනු ඇත" කියලා. දේශපාලන ව්‍යාපාර හැටියට, එහෙම නැත්නම් වමේ ව්‍යාපාර හැටියට, ජාතිකවාදි ව්‍යාපාර හැටියට ඒවායේ කටයුතු කරන අප අතින් වැරැදි සිදුවී තිබෙන්නට පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත් වන්නේ දේශ ද්‍රෝහීන් වීමේ වැරැද්ද අප අතින් සිදු නොවීමේ හැකියාව අප සතුව තිබීමයි.

2015 ජනවාරි 8 වෙනි දා බලපෙරළියට කර ගහපු ජනතා විමුක්ති පෙරමුණ, දින 100 ආණ්ඩුවේ දූෂණ විමර්ශනය කරන මහා කමිටුවේ බලසම්පන්න සාමාජිකයකු හැටියට කටයුතු කරපු ජනතා විමුක්ති පෙරමුණ, මේ දේශද්‍රෝහී ආණ්ඩුව නිර්මාණය කරන්න ඉතා ඉහළ දායකත්වයක් දක්වපු ජනතා විමුක්ති පෙරමුණ, ඒ වාගේම පසුගිය "දින 51" ආණ්ඩුව පිහිටවපු වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහත්තයාට නැවත අග්‍රාමාත්‍ය තනතුර අරගෙන දෙන්න නොසැහෙන පුදුමාකාර ජීවගුණයකින්, උද්යෝගයකින්, උනන්දුවකින්, කැපවීමකින් කටයුතු කරපු ජනතා විමුක්ති පෙරමුණ මාස තුන හතරක් යනකොට විශ්වාස භංග යෝජනාවක් අරගෙන ඇවිල්ලා කියනවා අගමැතිතුමාට ගෙදර යන්න ලූ, ආණ්ඩුවට ගෙදර යන්න ලූ! මේ යෝජනාව ගෙනාවාට එතුමන්ලා දන්නවා පාර්ලිමේන්තුව ඇතුළේ යෝජනාවට බහුතරයක් දිනා ගන්න නොහැකි වෙනවා කියලා. ඒ නොහැකිවීම පත්තරයේ පළ වෙනවා. එතකොට රනිල්ගේ අගමැති තනතුරට එයින් පොඩි තිරිහන්වීමක් ලැබෙනවා. ඒ තිරිහන්වීම, ඒ ප්‍රතිශක්තිකරණය ලබාදීමේ යටි අරමුණින් තමයි එතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. මේ ආණ්ඩුවට එරෙහි විශ්වාස භංග යෝජනාවක් හෝ ආණ්ඩු විරෝධී යෝජනාවක් මොන අර්ථයෙන් ගෙනාවත් ඒකට අපි අපේ පක්ෂපාතිත්වය දක්වනවා. හැබැයි, ඒවා ගෙන එන අයගේ සූක්ෂම අරමුණු නොදැන නොව ඒක ඉතාම පැහැදිලිව දැන ගෙනයි අපි එහෙම කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් විමසන ලද ප්‍රශ්නකට එතුමා SOFA එක හා ACSA එක ගැන පිළිතුරු දුන්නා. එතුමා කිව්වා, "ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක ගෝඨාභය රාජපක්ෂ මහත්තයා අත්සන් කරපු ACSA එකේ ගිවිසුම පිටු 9යි. වර්තමාන ආණ්ඩුව අත්සන් කරපු ගිවිසුමේ පිටු 5යි තිබෙන්නේ" කියලා. මේ තිබෙන්නේ, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ කාලයේ අත්සන් කරපු සම්පූර්ණ ACSA ගිවිසුමේ පිටපතක්. මේකේ පිටු 9ක් තිබෙනවා. ඒ පිටු 9ට අමතරව annexes මොකුත් නැහැ. මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස මම මේ ගිවිසුමේ පිටපත **සභාගත*** කරනවා.

මේ තිබෙන්නේ, තමුන්නාන්සේලාගේ අගමැතිතුමා කැබිනට් මණ්ඩලයට දැමූ ACSA එකේ සිංහල පිටපත. එතුමා කිව්වාට පිටු 5යි කියලා පළමු පිටුව නැතිව පිටු 7ක් තිබෙනවා. මේ තමයි කැබිනට් මණ්ඩලයට දැමූ එක. මම මේ ගිවිසුමේ පිටපතත් මේ ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස **සභාගත** කරනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා අගමැතිතුමාගෙන් ඒ සම්පූර්ණ ගිවිසුම දෙන්න කියලා කාරුණිකව ඉල්លුවා. නමුත්, අගමැතිතුමා ඒ ඉල්ලීම බොහොම සූක්ෂම විධියට මඟහැරලා ගියා. මේ තමයි කැබිනට් මණ්ඩලයට දැමූ එක. මේකේ පිටු 09යි. මෙන්න තිබෙනවා ඇත්ත ACSA එක; අගමැතිතුමා මේ ගරු සභාවට නොදෙන එක; කොළේ වහලා ගහපු ACSA එක.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විමල් වීරවංශ මහතා]

මේ ගිවිසුම බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා මේ ගිවිසුම දැකලා නැහැ; මේ කැබිනට් ඇමතිවරු දැකලා නැහැ. මේක තමයි ඇත්ත ACSA ගිවිසුම. මේකේ පිටු 83යි. ඇමුණුම් 50කට වැඩිය තිබෙනවා. මේකේ මූලික කොටස තමයි සිංහලට පරිවර්තනය කරලා කැබිනට් මණ්ඩලයට දැම්මේ. මෙහෙම අගමැති කෙනෙකු ඉන්න ආණ්ඩුවක් තිබෙන්න ඕනෑද? අමාත්‍ය මණ්ඩලයටත් කොළේ වහලා මේ රටට බලපාන ගිවිසුම් අත්සන් කරනවා. රටේ ජනාධිපති කියනවා, "මම පත්තරෙන් දැක්කේ" කියලා. මෙහෙම ආණ්ඩුවක් තිබියදී මේ රටට ඉර පායනවාද?

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා මම මේ ගිවිසුම් සහ ඇමුණුම් - annexes - සභාගත කළා

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුල් ගිවිසුමේ තිබෙනවා, ඇමෙරිකානු ආරක්ෂක හමුදාවලට හදිසි තත්ත්වයකදී, කලින් නොදැකපු තත්ත්වයකදී - unforeseen situation එකකදී - එන්න පුළුවන් කියලා. ඒක ගෝඨාභය රාජපක්ෂ මහත්මයා අත්සන් කරපු ගිවිසුමේත් තිබෙනවා. මේ ගිවිසුමේත් තිබෙනවා. හැබැයි, අර ගිවිසුමේ එහෙම තිබුණාට ඒකේ නැහැ, මොන මොන හමුදා අනුබණ්ඩද ඒකට අදාළ වෙන්නේ කියලා. හැබැයි, මේ ගිවිසුමේ තිබෙනවා, මෙන්න මේ හමුදා අනුබණ්ඩ තමයි එවැනි හදිසි තත්ත්වයකදී එන්න අදාළ වෙන්නේ කියලා. එතකොට නැවත අවසර ගැනීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. කලින් නොදැකපු තත්ත්වයක් ඇති වුණොත්, අවසර ගැනීමක් අවශ්‍ය වන්නේ නැහැ. ඒ නිසා-

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු මන්ත්‍රීතුමනි, -

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කට වහ ගෙන ඉන්න. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තිබෙන්නේ විනාඩි 12යි. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, එතුමාට බාධා කරන්න එපා. කථාව කරගෙන යන්න ඉඩ දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තමන්ම රවටා ගෙන මේ විධියට ගිවිසුම් අත්සන් කරන ආණ්ඩුවකට පවතින්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම ආණ්ඩුවකට පවතින්න පුළුවන්ද? ඒ විතරක් නොවෙයි - [බාධා කිරීමක්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
එතුමා හමුදා අනුබණ්ඩ රාශියක් ගැන කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කරුණාකර, මගේ වෙලාව දෙන්න. ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට, මා ළඟ තිබෙනවා, ශ්‍රී ලංකා ජනාධිපති අත්සන් කරපු ලිපියක්, "ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත" කියන මාතෘකාව යටතේ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අත්සන් කරලා තිබෙන්නේ, 2019 අප්‍රේල් මස 22 වන දින. ජනාධිපතිතුමාගේ අත්සන සහිත මෙම ලිපියත් කලින් ගිවිසුම් සමඟම සභාගත කරන්න කියා ඉල්ලා සිටිනවා.

මේ ලිපියේ අන්තිම ඡේදයේ මෙසේ සඳහන් වනවා:

"තවද ඉහත යෝජනාවට අනුගත වන පරිදි යෝජිත ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නොකිරීමටත්, දැනට ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2019/03/27 දින පළ කරන ලද ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධ ගැසට් නිවේදනය අවලංගු කිරීමටත් අවශ්‍ය කටයුතු කිරීම සුදුසු යයි යෝජනා කරමි. "

අපට - මේ සභාවට - ලැබී තිබෙනවා, ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත. ඒකට විරුද්ධව උසාවි ගිහිල්ලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත එන්නේ "Millennium Challenge Corporation" කියන ඇමෙරිකානු ආයතනයත් එක්ක ආණ්ඩුව ඇවිල්ලා තිබෙන ගිවිසුමට අනුවයි. ඒ කෙටුම්පතින් යෝජනා කරනවා, මේ රටේ ඉඩම් වෙළෙඳපොළ සක්‍රිය කරන්න. මේ රටේ සියයට 84ක් ඉඩම්, රාජ්‍ය ඉඩම්. ඒවා බලපත්‍ර ඉඩම් හැටියට, සාරභූමි ඔප්පු ඉඩම් හැටියට එක එක විධියට පුරවැසියන් භාවිත කරනවා. එසේ භාවිත කළාට, රජයට තමයි ඒවායේ සින්නක්කර අයිතිය තිබෙන්නේ. එලෙස සියයට 84ක් වන රාජ්‍ය ඉඩම්වලට ඔප්පු දීලා වෙළෙඳපොළ සක්‍රිය කරන්න, විකිණෙන ප්‍රවණතාව වැඩි කරන්න, විදේශිකයන්ට ඒ ඉඩම් ගන්න පුළුවන් ප්‍රවණතාව වැඩි කරන්න තමයි Millennium Challenge Corporation එක ඉඩම් (විශේෂ විධි විධාන) පනත් කෙටුම්පත ගෙනෙන්න කියන්නේ. දැන් ඊට අදාළ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ගියා. නමුත් අනුමත වුණේ නැහැ. ජනාධිපතිවරයා ඒ පනත් කෙටුම්පත තවදුරටත් සලකා බලන්න පසුවට තිබ්බා. එහෙම තියෙද්දී තමයි ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ගැසට් එක ගැහුවේ. ඒ නිසා තමයි ජනාධිපතිවරයා 2019 අප්‍රේල් මස 22 වැනි දින කියන්නේ, "ඉඩම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධ ගැසට් නිවේදනය අවලංගු කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සුදුසු යයි යෝජනා කරමි" කියලා. මෙහෙම ආණ්ඩුවක් මොකට ද?

ඊළඟට බලන්න. මේ තිබෙන්නේ, 2019 අප්‍රේල් මස 5 වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණය ගැන ජනාධිපතිතුමාගේ අත්සන සහිත ලිපිය. මෙයින් කියනවා, "මේ අනුව අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි අවශ්‍ය සංශෝධන ඇතුළත් කිරීමෙන් අනතුරුව යෝජිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්..." යනුවෙන්. ඒ කියන්නේ, අවශ්‍ය සංශෝධන ඇතුළත් කිරීමෙන් අනතුරුව. ඒ සංශෝධන කැබිනට් මණ්ඩලයට ආවේ නැහැ. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුවයි ඒ කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පුළුවන්. "අදාළ සංශෝධන ඇතුළත් කරන තෙක් යෝජිත ඉඩම් (විශේෂ විධි විධාන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් නොකළ යුතු බවත්, ගරු ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙත දැන්වීමට යෝජනා කරමි" කියනවා, 2019 අප්‍රේල් මස 05 වැනි දින. මම ඒ ලිපියත් මීට කලින් ඉදිරිපත් ලේඛන සමඟම **සභාගත*** කරන ලෙස ඉල්ලා සිටිනවා.

රටේ ජනාධිපතිතුමා කියනවා, "මෙයට අවශ්‍ය සංශෝධන කරන්න. එතෙක් මෙය පාර්ලිමේන්තුවට ගෙන යන්න එපා" කියලා. ඊළඟට කියනවා, අවශ්‍ය සංශෝධන කරන්න කියලා. නමුත් එහෙම සංශෝධන කළේ නැහැ. ඒ අනුව මේ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයේ පූර්ණ අනුමතියකට ලක් වුණේ නැහැ. සංශෝධන කර ගෙන එන්න කියලා නතර කළ පනත් කෙටුම්පතක් කැබිනට් මණ්ඩලයේ නිසි අවසරයකින් තොරව අගමැතිවරයාට Millennium Challenge Corporation එකත් එක්ක තිබෙන බැඳීම නිසා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් හරහා හොර පාරෙන් ගැසට් නිවේදනය ගහනවා. එහෙම ගැසට් නිවේදනය ගහලා පාර්ලිමේන්තුවට යවනවා. එහෙම පනත් කෙටුම්පත් ගෙනෙන්න පුළුවන් ද? දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කොහොමද තමුන්නාන්සේලා සම්මත කළේ? අධිකරණය ඒ යම් යම් ව්‍යවස්ථාවලට නියෝග දුන්නා, ඒවා සම්මත කරනවා නම් ජනමත විචාරණයකට යන්න කියලා. ජනමත විචාරණයකට යා යුතු කරුණු තමුන්නාන්සේලා කාරක සභාව අවස්ථාවේදී දැම්මා; අධිකරණයට කොළය වහලා ගැහුවා. මේක එහෙව් පාලනයක්! මේවා මේ රටේ ඉතිහාසයේ කවදාවත් නොවෙච්ච දේවල්. එහෙව් පාලනයකට මේ රටේ රාජ්‍ය බලය දරන්න සදාචාරාත්මක, යුක්තිසහගත අයිතියක් තිබෙනවාද? එම නිසා -මෙතැන තමුන්නාන්සේලා - අපි කථා කරන සාතන, සහරාන් ඇතුළු වහාබ් අන්තවාදීන්ගේ ඒ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර ගැන අප්‍රේල් 11 වෙනකොට දැන ගෙන හිටියා. ඒ සියලු තොරතුරු බුද්ධි අංශ විසින් දැනුවත් කර තිබුණා. එහෙම තියෙද්දී ඒ අපරාධය වෙන්නට ඉඩ හැර බලාගෙන සිටියා. දැන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් පොලිස්පති අත් අඩංගුවට ගන්න කියනවා, හිටපු ආරක්ෂක ලේකම්ව අත් අඩංගුවට ගන්න කියනවා. ඒ දෙදෙනා අත් අඩංගුවට ගන්නවා වාගේම, පට ගාලා ඇප ලැබෙනවා. මේ අමුතු විගඩම්කාරී ජවනිකා බල බලා, අර මැරිච්ච මිනිසුන්ගේ සොහොන් කොත්වලට අවමන් කරනවා බලාගෙන ඉන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ මැරිච්ච මිනිසුන්ට යුක්තිය හා සාධාරණය ඉෂ්ට වෙන්නේ නැහැ. [බාධා කිරීම්] ජනාධිපතියි, අගමැතියි, කැබිනට් මණ්ඩලයයි ඔක්කොම. ආණ්ඩුව කියන්නේ ඒ ඔක්කොටම. [බාධා කිරීම්] ජනාධිපති හදා ගත්තේ ඔබතුමන්ලා මිස අපි නොවෙයි. ජනාධිපතිට ඡන්දය දෙන්න හංසයාගේ පිටිපස්සේ ගිය ගොන් වහන්සේලා අපි නොවෙයි, ඔබතුමන්ලා. හංසයාට කතිරය ගහපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දැන් ජනාධිපති අපිට භාර දෙන්න එන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට අද මේ වළට ඇද වට්ටා දමලා තිබෙනවා. සහරාන් ඇතුළු වහාබ් අන්තවාදී ත්‍රස්ත ව්‍යාපාරයේ ඒ මිනීමරු ප්‍රහාරයට ලක් වෙලා ජීවිත අහිමි වෙච්ච මිනිස්සු, තුවාල වෙච්ච මිනිස්සු තමයි අද අන්තිමට වැරදිකාරයෝ වෙලා තිබෙන්නේ. ඒ මිනිස්සු පල්ලි ගිය එක තමයි වරද. අර සංචාරක හෝටලයට උදේට කන්න ගිය එක, පාස්කු ඉරිදා breakfast ගන්න හෝටලයට ගිය එක තමයි වැරදි. ඒ ඉරණමට මේ රට වට්ටලා තිබෙනවා. තමන්ට එරෙහි මේ සාපරාධී ක්‍රියාව කරපු බලවේගයට විරුද්ධව ගනු ලබන ප්‍රබල හා බලවත් පියවර තිබෙනවා කියලා ඒ වින්දිතයාට පෙනෙන්නේ නැහැ. එතකොට තමයි වින්දිතයා කඩා වැටෙන්නේ, නීතිය අතට ගන්න හිතන්නේ. වෙන රටක මෙහෙම දෙයක් වුණා නම් වින්දිතයාට එහෙම හිතන්නට ඉඩ දෙන්නේ නැහැ. අපරාධකරුවා සහ අපරාධකරුවා පිටුපස සිටින දේශපාලන හස්තය -ඒ සියල්ල- බලයේ සිටින පාලනයෙන් -රජයෙන්- මුලිනුපුටා දමන බව පෙනෙනවා නම්, රටවැසියාට නීතිය අතට ගැනීමේ හැඟීමක් හෝ පහළ වන්නේ නැහැ. අද තමුන්නාන්සේලා වහාබ් අන්තවාදීන් ආණ්ඩුව ඇතුළේ තියාගෙන හුරතල් කරනවා. සහරාන්ගේ පියවරු සහරාන්ගේ බාප්පොච්චිලා ආණ්ඩුව ඇතුළේ තියා ගෙන හුරතල් කරනවා. ඒ තමයි වහාබ් අන්තවාදය. තවමත් තව්හීද් ජමාත් කාර්යාල මාලිගාවත්තේ ඇරලා තිබෙනවා. ඒවාට නිදහසේ තවමත් වැඩෙන්න ඉඩ දීලා, ගලාගෙන යන්න ඉඩ දීලා, "අපි ISIS ඉවර කළා. ලෝකයේ ISIS ඉවර කරපු හොඳම රට අපියි" කියමින් උජෝ, උජෝ ගගා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව නිකම් විකාර බහුබූත දොඩවනවා. ඒ නිසා මෙහෙම ආණ්ඩුවක් පවතිනවාය කියන්නේ රට වැසියා භීතියකින් ජීවත් වෙනවා කියන එකයි. මෙහෙම ආණ්ඩුවක් පවතිනවාය කියන්නේ මහජනයා භීතියෙන්, ත්‍රස්තව, මුසපත්ව ජීවත් වෙනවා කියන එක; මහජනයා අවාසනාවන්ත ඉරණමකට ඇද වැටෙනවා කියන එක. අද රටේ ආර්ථිකය වැටිලා තිබෙන්නේ සහරාන්ගේ ත්‍රස්ත ප්‍රහාරයත්, ඒ වාගේම මේ ආණ්ඩුව එල්ල කරන බදු ප්‍රහාරයත්, දෙකම හින්දා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හින්දා අද මේ රටට ඕනෑ වෙලා තිබෙන්නේ බොරු පූච්චානම් කථා නොවෙයි. ජාතිය අද ඉල්ලනවා, නව මාවතක්. ජාතික අද ඉල්ලනවා, අලුත් මාර්ගයක්. වසර 70කට වඩා ඉපැරැණි මාර්ගය වෙනුවට අලුතින් හිතලා, මේ රටට ආවේණික බෞද්ධ ධර්මය මත පදනම් වෙච්ච, ඒ දාර්ශනික පදනම මත පදනම් වෙච්ච නව මාවතක් මේ පොළොව ඉල්ලා සිටිනවා. ඒ පොළොව ඉල්ලා සිටින මාවත නිර්මාණය කිරීම සඳහා ප්‍රධානම අවශ්‍යතාව වන්නේ මේ පරගැති නිවට ආණ්ඩුව පළවා හැරීමයි. ඒ සඳහා මේ පාර්ලිමේන්තුවේ ඉන්න රටට, දැයට අබමල් රොනකින් හරි ආදරය කරන මිනිහෙක් ඉන්නවා නම්, සියලුදෙනාම එක්ව ඒ වෙනුවෙන් ඇප කැප වෙමු කියන ආරාධනය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

[පූ.භා.11.53]

ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විසින් මේ රජයට එරෙහිව ඉදිරිපත් කරලා තිබෙන විශ්වාස භංග යෝජනාවේ සාරය වන්නේ, පසුගිය පාස්කු ඉරිදා සිදු වෙච්ච ප්‍රහාරය වළක්වාගත හැකිව තිබියදී ඒ සම්බන්ධයෙන් පියවර

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු පායලී චම්පික රණවක මහතා]

නොගැනීමෙන් ආණ්ඩුව විශාල ජන ඝාතනයකට ඉඩ කඩ සලසා දුන්නා කියන එකත්, ඉන් පසුව ඇති වෙච්ච සිදුවීම් පාලනය කරන්න ප්‍රමාණවත් පියවර ගත්තේ නැහැ කියන එකත්. මේ සිදුවීමේ ක්‍රියාදාමය දිහා බැලුවාම මේ පිළිබඳව ආණ්ඩුවට, ආරක්ෂක අංශවලට, බුද්ධි අංශවලට ඒ වගකීමෙන් ගැලවෙන්න බැහැ. ඇමතිවරයකු හැටියට මටත්, ඒ වාගේම සමස්ත ආණ්ඩුවටමත්, ආරක්ෂක අංශවලටත්, බුද්ධි අංශවලටත් මේ ඛේදවාචකය වළක්වා ගැනීමට නොහැකිවීමේ වගකීමෙන් ගැලවෙන්න බැහැ. ඒකට පිළිතුර ආණ්ඩුව ඉල්ලා අස්වීම ද, ආණ්ඩුව අස් වෙලා ගෙදර යන එකද, රට ඒ ආකාරයට අරාජික කරලා, රාජ්‍ය තවදුරටත් දුර්වල කිරීම සඳහා අන්තර්ජාතික ත්‍රස්තවාදයට ඉඩ කඩ ලබා දෙන එකද, නැත්නම් අප කළ යුත්තේ, මේ ප්‍රශ්නය දේශපාලන භේදයෙන් ඔබ්බට ගිය ප්‍රශ්නයක් හැටියට සලකා, ත්‍රස්තවාදයට එරෙහිව සියලු දේශපාලන පක්ෂ, සියලු ක්‍රියාධරයන් එකට එකතු වෙලා ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා ඒකාබද්ධ ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරවීමද කියන එක අපි විමසා සිටිය යුතුයි. මේ රටේ හැම දාමත් සිද්ධ වුණේ ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වෙච්ච වහාම ඒ පිළිබඳ වෙච්ච දේශපාලන වගකීම කාට හරි දාලා, කවුරු හරි වැරැදිකාරයා කරලා, ත්‍රස්තවාදයට වක්‍රාකාරයකින් ශක්තිය ලබාදීමයි. අපේ රටේ පසුගිය තිස් අවුරුදු කාලය තුළ එල්ටීටීඊ ත්‍රස්තවාදය ව්‍යාප්තවීමටත් හේතු සාධක වුණේ මේ කාරණයයි. ඒ නිසා මේ ප්‍රශ්නය විසඳීම සඳහා අද විධිමත් ත්‍රස්ත විරෝධී වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අද ලෝකයේ නව ආර්ථිකයක් තිබෙන්නේ. අන්තර්ජාලය මත පදනම් වෙච්ච නව ආර්ථිකයක් තිබෙන්නේ; නව තාක්ෂණයක් තිබෙන්නේ. ඒ වාගේම නව ත්‍රස්තවාදයක් තමයි මේ ලෝකයේ තිබෙන්නේ. එය පැරැණි එල්ටීටීඊ ත්‍රස්තවාදය හෝ ජනතා විමුක්ති පෙරමුණේ කැරලිකාරිත්වය විසින් ඇති කරපු ගරිල්ලා මාදිලියේ ත්‍රස්තවාදයක් නොවෙයි. ඒ නිසා මේ නව ත්‍රස්තවාදයට මුහුණදීමට ඒ සඳහාම බුද්ධි අංශ ප්‍රතිසංවිධානයක් කරලා, ඒ සඳහාම වෙච්ච ආරක්ෂක මෙහෙයුම් ප්‍රතිසංවිධානයක් කරලා, රටක් හැටියට මේ සමාජයේ ආරක්ෂාව තහවුරු කරලා, ජනතාවගේ බිය සැක දුරු කරලා විශ්වාසය තහවුරු කිරීමට අපි කටයුතු කරන්න ඕනෑ. එතැනදී, ප්‍රධාන වශයෙන්ම වැරැදුණේ කොතැනද කියන ප්‍රශ්නය නිවැරැදිව හඳුනාගෙන, ඉන් පස්සේ වැරැදිකාරයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමයි සිදු විය යුත්තේ. මෙහිදී දේශපාලන අධිකාරියත්, ජනාධිපතිතුමා ප්‍රමුඛ සේනාධිනායකත්වයත්, බුද්ධි අංශයත්, ආරක්ෂක මෙහෙයුම් අංශත් කියන මේ තුන් ගොල්ලන් අතරේ මනා සම්බන්ධීකරණයක් නොතිබිච්ච බවත්, තැන් තැන්වල විශාල හිඩැස් පැවති බවත් අපට ඉතාම පැහැදිලියි. එහෙම නම් අනාගතයේ මෙවැනි ප්‍රහාර වළක්වා ගැනීමට අප කළ යුත්තේ මනා සම්බන්ධීකරණයකින් යුතු ක්‍රියාකාරිත්වයක් සහිත ආරක්ෂක මෙහෙයුමක් ඇති කිරීම මිස, ආණ්ඩුවට එරෙහි විශ්වාස භංග යෝජනා ගෙන ඒම නොවෙයි. මනා ක්‍රියාකාරිත්වයක් සහිත ආරක්ෂක මෙහෙයුමක් ඇති කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණත් දායක වෙන්න ඕනෑ; පොදුජන පෙරමුණත් දායක වෙන්න ඕනෑ; දෙමළ ජාතික සන්ධානයත් දායක වෙන්න ඕනෑ. සියලු අය ඒ ක්‍රියාකාරිත්වයට දායක වෙන්න ඕනෑ. මොකද, මිනිස්සු මිය යද්දී මිය යන්නේ මිනිස්සු නිසා මිස පක්ෂ පිළිබඳව හිතලා නොවෙයි. ඒ නිසා අපි ඒ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වන පොදු ජාතික ඒකාග්‍රතාවක් ඇති කරගත යුතුයි.

ඊළඟට ඉදිරිපත් කරන ප්‍රධාන තර්කයක් වන්නේ, ජනාධිපතිත්, අගමැතිත් අතර තිබෙන බල ගැටුම නිසා මේ ත්‍රස්තවාදී ක්‍රියාවලිය සිදු වුණා ය; දුර්වල රාජ්‍යයක් පැවතීම නිසා මේ ත්‍රස්තවාදී ක්‍රියාවලියට මුල පැදුණා ය කියන තර්කය.

මේ රට තුළ ජනාධිපතිවරයාගේ අත්තනෝමතික ක්‍රියා කලාපයත්, පසුගිය ආණ්ඩුවල තිබුණු අත්තනෝමතික බලය පාවිච්චි කිරීමත් නිසා ජනාධිපති ධුරයත් පාර්ලිමේන්තුවත් අතර බල සමතුලිතතාවක් ඇති කර ගැනීම සඳහා තමයි 2015දී ඒ ජනවරම මේ ආණ්ඩුවට ලැබුණේ. රට බේරා ගත්තාය කියපු මහින්ද රාජපක්ෂ මහත්තයා පරාජය කරන්නට මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ජනතාව ඉදිරිපත් වුණේ, "යම් බල තුලනයක් අවශ්‍යයි, අත්තනෝමතික පවුල්වාදයකට ඉඩ දෙන්නට බැහැ"යි කියලා හිතපු නිසායි. එහෙම නම් මේ බල තුලනය මේ රටේ ජනතාව ඉල්ලා සිටි දෙයක්. හැබැයි, අපි ගැඹුරින් එක කාරණයක් මතක තබා ගත යුතුයි. ජනාධිපතිත්, අගමැතිත් අතර පවතින මේ ගැටුම පසෙකට දමා, රාජ්‍යයේ ස්ථාවරත්වයත්, ප්‍රජාතන්ත්‍රවාදය විසින් ලබා දෙන පුද්ගල නිදහසත් අතර සමතුලිතතාවක් අපි ඇති කර ගත්තේ නැත්නම්, රාජ්‍ය ආරක්ෂාවට සහ රාජ්‍යයේ ස්ථාවරත්වයට වැඩි බර තබන ප්‍රතිපත්තියක් අනුගමනය කළේ නැත්නම් පුද්ගල නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය අභාවයට යනවා. ඒ වාගේම පුද්ගල නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය ඕනෑවට වඩා වගකීම් විරහිතව ඉලිප්පීම නිසා රාජ්‍ය ආරක්ෂාව සහ ස්ථාවරත්වය බිඳ වැටෙනවා. එම නිසා මේ දෙක අතර සමතුලිතතාවක් ඇති කර ගැනීම ගැන අපි කථා කළ යුතුයි.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රශ්න තිබෙනවා නම් එය විසඳා ගැනීම කළ යුතුයි. එහෙම නැතිව එය අහෝසි කර නැවත වතාවක් අත්තනෝමතික බලතල ජනාධිපතිවරයාට ලබාදීමෙන් මේ ප්‍රශ්න විසඳා ගන්නට බැහැ. එම නිසා ඉදිරි කාලවලදී රාජ්‍යයේ ස්ථාවරත්වය සහ ආරක්ෂක ප්‍රශ්නය පිළිබඳවත්, ඒ වාගේම ඒ හා බැඳුණු රාජ්‍ය ආරක්ෂාව පිළිබඳවත්, ප්‍රජාතන්ත්‍රික නිදහස පිළිබඳවත් සමතුලිතතාවක් ඇති කර ගැනීම අත්‍යවශ්‍යයි කියන එක අපි යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මෙතැනදී පාර්ලිමේන්තුවට නිශ්චිත වගකීමක් තිබෙනවා; අපි 225දෙනාටම නිශ්චිත වගකීමක් තිබෙනවා. ජනතාව තුළ බියක් ඇතිවෙලා තිබෙනවා නම්, ජනතාව තුළ අනාරක්ෂිතභාවයක් ඇතිවෙලා තිබෙනවා නම්, ජනතාව තුළ අසහනයක් ඇතිවෙලා තිබෙනවා නම්, ජනතාව තුළ ආතතියක් ඇතිවෙලා තිබෙනවා නම් ඒ සියල්ල නිම කරන්නට පුළුවන් වෙන්නේ මේ පාර්ලිමේන්තුව උත්තරීතර ආයතනය හැටියට නව නීති රීති පැනවීමෙන් පමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලබන 21වෙනි දාට මේ මරාගෙන මැරෙන ප්‍රහාර සිදුවී මාස තුනක් සපිරෙනවා. එම නිසා මේ පාර්ලිමේන්තුවේ වගකීම තමයි විවිධ ආකාරයෙන් අද මේ රටේ තිබෙන ගැටලුවලට විසඳුම් සෙවීම. මද්‍රසා පාසල් වෙන්නට පුළුවන්, ෂරියා විශ්වවිද්‍යාල වෙන්නට පුළුවන්, බුර්කා ඇඳුම වෙන්න පුළුවන්, විවාහ නීතිය වෙන්න පුළුවන්, දික්කසාද නීතිය වෙන්න පුළුවන්, පෞද්ගලික නීති වෙන්න පුළුවන්, ඉඩම් නීති වෙන්න පුළුවන් මේවා සම්බන්ධයෙන් ජනතාව තුළ තිබෙන සැක බිය දුරු කර ගැනීම සඳහා නව නීති රීති පැනවීමේ සහ වෛරය ප්‍රකාශ කරන ක්‍රියාවලි, අන්‍ය ආගම් හෙළා දකින ක්‍රියාවලි සම්බන්ධයෙන් ශක්තිමත් නීති පද්ධතියක් ගොඩ නැඟීමේ වගකීම මේ පාර්ලිමේන්තුවට තිබෙනවා. ඒ වගකීම ආණ්ඩුවට පමණක් නොවෙයි මේ මන්ත්‍රීවරුන් 225දෙනාටම තිබෙනවා. අපේ ජනතාවගේ අනාරක්ෂිතභාවය, බිය, සැකය දුරු කිරීම සඳහා නීති පැනවීමට අපට වගකීමක් තිබෙනවා. ඒ නීති පැනවීම ඉදිරි කෙටි කාලය තුළ සිදු නොවුණහොත් ඊළඟ දේශපාලන වෙනස සඳහා - ජනාධිපතිවරණයට- රට ගමන් කරන්නේ අනාරක්ෂිත හැඟීමෙන්. එවිට ඒ ජනාධිපතිවරණය තීරණය වෙන්නේ ප්‍රතිපත්ති මත නොවෙයි, බිය, සැක මතයි. එම නිසා ඒ බිය ඇතිව රටේ ජනාධිපතිවරයා, රාජ්‍ය නායකයා තෝරා ගැනීම වැළැක්වීමේ වගකීම තිබෙන්නෙත් මේ පාර්ලිමේන්තුවට, මේ ආණ්ඩුවට විතරක් නොවෙයි මේ මන්ත්‍රීවරුන් 225 දෙනාටම බව අපි ප්‍රකාශ කරන්නට ඕනෑ.

මේ පාර්ලිමේන්තුවේත්, යම් යම් ස්ථානවලත් නොයෙක් ආකාරයෙන් ප්‍රකාශ කරන කාරණයක් ගැන මගේ අදහස්

දක්වන්නට කැමැතියි. ඒ තමයි, කොළඹ සිට ත්‍රිකුණාමලයට ආර්ථික කොරිඩෝ එකක් හදලා තිබෙනවා, ඒක හදන්නේ ඇමෙරිකාවේ CIA එකට ඕනෑ විධියටයි කියන එක. ඇත්තටම මේ රටේ ජාතික භෞතික සැලසුමක් තිබෙනවා. ඒ ජාතික භෞතික සැලසුම 2008දී හැදුවා; 2011දී ගැසට් කළා. අවුරුදු 10න් 10ට රටේ වෘත්තීයවේදීන්, විද්වතුන් දහස් ගණනක් එකතුවෙලා මේ ජාතික භෞතික සැලසුම සකස් කරනවා. මෙවර මේ රජය යටතේ, අපේ අමාත්‍යාංශය යටතේ දේශීය විද්වතුන් තුන්දහසක්, - එහි එකම ඇමෙරිකානුවෙකුවත් නැහැ.- එකතුවෙලා තමයි මේ ජාතික භෞතික සැලසුම හැදුවේ. ඒ සඳහා සාකච්ඡා වාර සහා සිය ගණනක් පවත්වලා තිබෙනවා. එහිදී අපි රටේ අධ්‍යාපන මට්ටම, රටේ ඉඩම් අවශ්‍යතාව, රටේ ජල අවශ්‍යතාව, රටේ පරිසර සංරක්ෂණය කියන කාරණා සියල්ල සලකා බලා, ආර්ථික හා ජනගහන කොරිඩෝ හතරක් හඳුනා ගත්තා. ඒවායින් එකක් කොළඹ ඉඳන් ත්‍රිකුණාමලයට; එකක් අම්බලන්ගොඩ සිට අම්බලන්තොටට; තව එකක් ත්‍රිකුණාමලය පහළ කොටස වන මුතූර් ප්‍රදේශයේ සිට අම්පාරට සහ, අනෙක් එක යාපනයේ සිට කිලිනොච්චියට. මීට අමතරව උප නගර 9ක්, තවත් නගර 24ක් අපි හඳුනාගෙන තිබෙනවා ඉදිරි කාලයේදී සංවර්ධන කටයුතු කරන්නට. මේවා CIA එකේ වුවමනාවට කෙරෙනවා කියලා කියන්නේ අට අසමත්, දේශපාලන කුමන්ත්‍රණ විධියට විතරක් මේ ලෝකය දකින තක්කඩින් බව අපි කියන්නට ඕනෑ. අපේ මේ ක්‍රියාදාමය ඉතාම පැහැදිලි විද්‍යාත්මක ක්‍රියාදාමයක්.

අපි ත්‍රිකුණාමලය විවෘත කරන්නට යනවා, ඒ මුළු නැඟෙනහිර කලාපයම විවෘත කරන්නට යනවා, නැඟෙන ආසියාවත් එක්ක; නැඟෙන ආසියාවේ බංගලාදේශයත් එක්ක. ඒ වාගේම චීනයේ කුන්මිං නගරයත් එක්ක. ඒ වාගේම මියන්මාරය, ලාඕසය, වියට්නාමය, තායිලන්තය සහ මැලේසියාවත් එක්ක. මෙතැන තිබෙනවා ට්‍රිලියන දෙකහමාරක ආර්ථිකයක්. මේ ට්‍රිලියන දෙකහමාරක ආර්ථිකයට නැඟෙනහිර පළාත විවෘත කිරීම තමයි මෙහි තිබෙන ප්‍රධානම අරමුණ.

එම නිසා අපි එකක් අවබෝධ කරගත යුතුයි. අද මේ ලෝකයේ ගැටුමක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඒක පිළිගත යුතුයි. ලෝකයේ ඉතිහාසය පිළිබඳව ඉතාම වැදගත් දේශපාලන කෘතියක් මේ ළඟදී නිකුත් වුණා. ඒ තමයි මහාචාර්ය ග්‍රැහැම් ඇලිසන් විසින් ලියන ලද "Destined for War" කියන කෘතිය. එම කෘතියේ පෙන්වා දීලා තිබෙනවා, පසුගිය අවුරුදු 500ක කාලය තුළ ලෝකයේ බලවත් රාජ්‍ය පහුකරන්න දෙවැනියෙක් උත්සාහ කළ 16 වතාවකින්, 12 වතාවක්ම යුද්ධ ඇති වෙච්ච බව. දැන් ඇමෙරිකා එක්සත් ජනපදයත්, චීනයත් අතර එවැනි ගැටුමක් ඇති වෙලා තිබෙනවා. මේ රටේ අය හැටියට අපි චීන ගැත්තන් වෙන්නවත්, ඇමෙරිකානු ගැත්තන් වෙන්නවත් ඕනෑ නැහැ. මේ ඉන්දියානු සාගරයේ අපට තිබෙන වැදගත් භූගෝලීය පිහිටීම පාවිච්චි කරලා මේ රට ආර්ථික හා සමාජමය අතින් බලවත් රාජ්‍යයක් බවට පත් කිරීමයි අපට අවශ්‍ය වන්නේ. ඒ නිසා කිසිම ආකාරයකින් මේ රජය රහසේ ගිවිසුම් අත්සන් කරන්නේ නැහැ. අපි ඒක බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. ඇමෙරිකානු පුරවැසියකු වෙච්ච ගෝඨාභය රාජපක්ෂ, ඇමෙරිකානු පුරවැසියකු වෙච්ච රොබට් ඕ. බ්ලේක් එක්ක එකතු වෙලා 2017දී ගහපු ගිවිසුම කිසිම කැබිනට් මණ්ඩලයකට ගෙනාවේ නැහැ. නමුත් මේ ගිවිසුම අපි කැබිනට් මණ්ඩලයට ගෙනැවිත් තිබෙනවා. එසේ ගෙනැවිත් තිබෙනවා විතරක් නොවෙයි, කවර-කවර අනුකණ්ඩ කොතැනට-කොතැනටද ගමන් කරන්නේ කියලා විස්තරාත්මකව කරුණු ලබා දීලා තිබෙනවා. නමුත් ගෝඨාභයගේ ගිවිසුමේ හැටියට ඇමෙරිකානු හමුදාවේ ඕනෑම අනු කණ්ඩයකට රටට මැදිහත් වීමේ අයිතිය තිබුණු බව මතක් කරන්න ඕනෑ. අද රොබට් ඕ. බ්ලේක් ගෙනැල්ලා රාජපක්ෂගේ අනාගතය ගොඩනඟා ගැනීම ගැන මුදල් දීලා දේශන පැවැත්වීම ගැන මේ ඇමෙරිකානු විරෝධීන්, මේ යැංකි විරෝධීන් කියන්නේ මොකක්ද කියලා අපි අහන්න ඕනෑ.

අපේ රට ඇමෙරිකා එක්සත් ජනපදයේ හෝ චීනයේ හෝ වෙනත් රටක හෝ යටත් විජිතයක් කරන්න, අපේ රටේ ස්වාධිපත්‍ය යටපත් කරන්න හෝ පාර්ලිමේන්තුවට තිබෙන නීති සෑදීමේ අයිතිය අහෝසි කරන්න කිසිම ආකාරයකින් අපි ඉඩ නොදෙන බව පමණක් බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. මේ රටේ බුද්ධිමත් ජනතාව තේරුම් ගත යුතුයි, කිසිම ආකාරයක අධ්‍යාපන සුදුසුකමක් නැති අයගේ මේ දේශපාලන කෑදැති කථාවලට රටේ ජනතාව මුළා විය යුතු නැති බව. ඒ වාගේම අපි මතක තබා ගන්න ඕනෑ, අතීතයේදීත් -ජයවර්ධන ජනාධිපතිතුමාගේ යුගයේදීත්, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ යුගයේදීත්- ලෝක බල අරගළයේ එක පැත්තක් ගන්න ගිහිල්ලා මේ රටට බලගතු විනාශයක් සිද්ධ වුණු බව. අපේ නොබැඳි පිළිවෙත -මේ ඉන්දියානු සාගරයේ අපේ නොබැඳි පිළිවෙත, කිසිම බලගතු රාජ්‍යයකට යට නොවී ගමන් කරන නොබැඳි පිළිවෙත- ආරක්ෂා කර ගැනීමෙන් මේ රටට බලවත් තත්ත්වයකට පත් වෙන්න පුළුවන්. විශේෂයෙන්ම අපගේ අනාගතය රැඳී තිබෙන්නේ මේ මුහුදු මාර්ග පාලනය කරන්න අපි කොයිතරම් උත්සාහ දරනවාද කියන කාරණය මතයි. ඒ නිසා අනාගතයේ මේ රටේ ආරක්ෂාව මෙන්ම ආර්ථික දියුණුවේත් මර්මස්ථානය වෙන්නේ නාවික හමුදාවයි. ඒ නිසා බලගතු නාවික හමුදාවක් මඟින් මුහුදු මාර්ග පාලනය කිරීමටත්, ඒ වාගේම අනෙක් අතින් ගුවන් මාර්ග පාලනය කිරීමටත් ගමන් කරන වැඩ පිළිවෙළක් සකස් කරගත්තොත්, අපට ඉතාම වැදගත් ආකාරයට මේ රට වැදගත්, බලවත්, ඔදවත් රටක් බවට පරිවර්තනය කරන්න පුළුවන් බව ප්‍රකාශ කරමින්, ඒ සඳහා අවශ්‍ය වැදගත් ප්‍රතිපත්ති සාකච්ඡා කරන මණ්ඩපයක් බවට මේ පාර්ලිමේන්තුව පත් විය යුතුයි කියන එකත් ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා.12.05]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 අගෝස්තු මාසයේ පත් වෙච්ච ආණ්ඩුවේ පාලන කාලයෙන් අවුරුදු හතරක් ගත වෙනකොට, මේ ආණ්ඩුව සියලු ක්ෂේත්‍රවලින් අසමත් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව රටේ ආර්ථිකය ගොඩනැඟීමෙන් අසමත්; රටේ ජනතාවට සහන දීමෙන් අසමත්; රටේ ව්‍යාපාර කර්මාන්ත දියුණු කිරීමෙන් අසමත්; පොරොන්දු වෙච්ච ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමෙන් අසමත්; මහජන ආරක්ෂාව තහවුරු කිරීමෙනුත් අසමත්. අපි මේ විශ්වාස භංග යෝජනාව ආණ්ඩුවට එරෙහිව ගෙනැල්ලා තිබෙන්නේ, මේ ආණ්ඩුවේ ආර්ථික අසමත්කමටවත්, එහෙම නැත්නම් මහ බැංකු කොල්ලයට විරුද්ධවවත්, පොරොන්දු වෙච්ච ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් නොකිරීමට එරෙහිවවත් නොවෙයි. මේ මොහොතේ මතු වෙලා තිබෙන නිශ්චිත ප්‍රශ්නය වන පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය සම්බන්ධ ප්‍රශ්නයේදී ආණ්ඩුවේ වගකීම පැහැර හැරීම සම්බන්ධයෙන් තමයි විපක්ෂය හැටියට, ජනතා විමුක්ති පෙරමුණ හැටියට මේ විශ්වාසභංග යෝජනාව අපි අරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වාසභංග යෝජනාව පිළිබඳව අධ්‍යයනය කරන ඕනෑ කෙනෙකුට අනාගතයේ හොඳ පාර්ලිමේන්තු ලියවිල්ලක් බවට මේ විශ්වාසභංග යෝජනාව පත් වෙයි කියලා මා හිතනවා. මොකද, මෙම යෝජනාවේ කිසිම තැනක "අහවලා මට කියපු නිසා, අහවලා, අහවලාට කියපු නිසා,

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

අහවල් website එකේ තිබුණු නිසා, අහවල් පත්තරේ තිබුණු නිසා" වැනි දේවල් සඳහන් වෙලා නැහැ. මෙය පැහැදිලි, නිශ්චිත කරුණු සහිතව ඉදිරිපත් කරලා තිබෙන විශ්වාසභංග යෝජනාවක්. අපි මෙම යෝජනාවේ සඳහන් කරුණු 13 ඉදිරිපත් කරලා තිබෙන්නේ ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේයි. පළමුවැනි කාරණය තමයි පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් අවශ්‍ය තරම් තොරතුරු ලැබී තිබියදී, එය වළක්වා ගැනීමට ආණ්ඩුව අසමත් වීම. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව -අපි කාටත් තිබුණු සාමාන්‍ය අවබෝධයේ හැටියට- මේ රටේ සිංහල සහ මුස්ලිම් ජනතාව අතර ගැටුමක් ඇතිවීමේ ඉඩකඩ තිබුණා. එය වැළැක්වීමට ආණ්ඩුව අසමත්වීම දෙවැනි කාරණයයි.

තුන්වැනි කාරණය තමයි, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන වේලාව වනවිටත්, අද වනවිට මාස දෙකහමාරක් ගත වෙලාත්, මේ රටේ ආර්ථිකය, සංචාරක ව්‍යාපාරය, කර්මාන්ත යථාවත් කරන්නට ආණ්ඩුව අසමත් වීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙපාර්ශ්වයේම කථිකයන් රාශියක් සිටින නිසා අපි දිවා ආහාර විවේකයෙන් තොරව විවාදය දිගටම ගෙන යමු කියා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හතරවෙනි කාරණය, පාස්කු ඉරිදා ප්‍රහාරය පදනම් කර ගෙන ACSA, SOFA වැනි විවිධ ගිවිසුම් හරහා, විවිධ බුද්ධි සේවා හරහා වෙන්න පුළුවන්, අපේ රටට ඇතිවන විදේශීය මැදිහත්වීම්වලට ආණ්ඩුව පාර කපා තිබෙන එක. මෙන්න මේ පැහැදිලි ක්ෂේත්‍ර හතර ඔස්සේ කරුණු පෙළගස්වා ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාවක් තමයි අපි ඉදිරිපත් කර තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ජනතාවගේ විරෝධය විවිධාකාරයෙන් ප්‍රකාශයට පත් වුණා. අපි දැක්කා, සමහරු තමන්ගේ විරෝධය මාධ්‍යවලින් ප්‍රකාශයට පත් කරන ආකාරය. සමහරු ආණ්ඩුවේ ඇමතිවරුන්ට සමහර තැන්වලදී ඒ සම්බන්ධයෙන් විරෝධය එල්ල කළා. විශේෂයෙන් මීගමුව, කටුවාපිටිය වැනි ප්‍රදේශයන්හිදී. ඒ වාගේම සමහර තැන්වල උද්ඝෝෂණ පවත්වමින් පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් ආණ්ඩුවේ අසමත්කම පෙන්වීමට ජනතාවගේ විරෝධය එල්ල වුණා. ඒ වාගේම තමයි තවත් කණ්ඩායම්, සිවිල් සංවිධාන, කතෝලික පූජකතුමන්ලා ආදී අය ශ්‍රේෂ්ඨාධිකරණයේ පිහිට පතා තිබෙනවා, ආණ්ඩුවේ අසමත්කම හේතුවෙන් තමන්ට අසාධාරණයක් වුණාය කියලා. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මේ ආණ්ඩුවට හරිහමන් විධියට විරෝධය එල්ල කර ගන්න ලැබුණු හොඳම -ප්‍රශස්තම- අවස්ථාව තමයි, මේ විශ්වාස භංග යෝජනාව. අපි මේ සිද්ධිය ගැන පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කළා; විවාද කළා; යෝජනා ගෙනාවා. හැබැයි, ඒ හැමට වඩා පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව ආණ්ඩුවේ අසමත්කම පිළිබඳව කරුණු කාරණා සහිතව ස්ථිරසාරව ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත් කරපු ලියවිල්ල බවට මේ විශ්වාස භංග යෝජනාව පත්වනවා. දැන් මේ විශ්වාස භංග යෝජනාව ගැන කථා කරන කොට සමහරු හිතන්නේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ගෙනෙන පළමුවෙනි විශ්වාස භංග යෝජනාව මෙය කියලායි. අපේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවෙනි විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ 1949 සැප්තැම්බර් 20වෙනි දා ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මහතායි. ඒ, එවකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ සිටි ජී.ජී. පොන්නම්බලම් මහත්මයාට එල්ල වූ චෝදනාවලට එරෙහිව අගමැතිවරයා ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් ගෙනා විශ්වාස භංග යෝජනාව. ඒ විශ්වාස භංග යෝජනාවට මොකද වුණේ? ඒ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්ද 30ක් ද, විරුද්ධව ඡන්ද 55ක් ද ලැබුණා. හැබැයි, ඒකෙන් අදහස් වන්නේ නැහැ, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා ඒ විශ්වාස භංග යෝජනාව ගෙනා එක වැරදියි කියලා. ආණ්ඩුවේ ඇමතිවරයෙකුට එරෙහිව තිබුණු ඒ චෝදනා විභාග නොකිරීම සම්බන්ධයෙන් විපක්ෂ මන්ත්‍රීවරයකු හැටියට එතුමා ගෙනා විශ්වාස භංග යෝජනාවෙන් ආණ්ඩුවට තිබුණු විරෝධය ප්‍රකාශයට පත් වුණා. එතැනින් පසු අපේ රටේ විවිධ කාලවල විවිධ ආණ්ඩුවලට එරෙහිව විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා තිබෙනවා. 1977දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට හයෙන් පහක බලයක් තිබියදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන අටකට පහත වැටී තිබියදී, ඊට පස්සේ අතුරු මැතිවරණ හරහා තවත් ආසන කීපයක් දිනාගෙන තිබියදී, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුවෙන් පළවා හැර තිබියදීත් විපක්ෂය ආණ්ඩුවට එරෙහි විශ්වාස භංග යෝජනා ගෙනාවා. ඒ ආණ්ඩුවට එරෙහිව 1984 අප්‍රේල් මාසයේ 6වෙනි දා විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. ඒ, ආණ්ඩුවේ සමස්ත ආර්ථික ප්‍රතිපත්තියට එරෙහිව. ඒ, විශ්වාස භංග යෝජනාවට පක්ෂව ලැබුණේ ඡන්ද 10යි, විපක්ෂව ඡන්ද 126ක් ලැබුණා. හැබැයි, ඒකෙන් ආණ්ඩුව කෙරෙහි විපක්ෂයේ තිබුණු විරෝධය ප්‍රකාශයට පත්වුණා. ඒක තමයි ට ආණ්ඩුව කෙරෙහි තිබෙන විරෝධය ප්‍රකාශයට පත් කරන්න විපක්ෂයට තිබෙන අවස්ථාව.

මේ එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව බලයට පැමිණි පසු විපක්ෂයෙන් ගෙනෙන පළමුවෙනි විශ්වාස භංග යෝජනාව මෙය නොවෙයි. මීට කලින් රවි කරුණානායක හිටපු මුදල් ඇමතිවරයාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා, ඒකාබද්ධ විපක්ෂය විසින්. මහ බැංකු බැඳුම්කර වංචාව ඇතුළුව එතුමාගේ අමාත්‍ය ධුරයේ වගකීම හරියට ඉෂ්ට කළේ නැහැයි කියන එක සම්බන්ධයෙන් තමයි එම විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. ඒ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ලැබුණේ ඡන්ද 51යි, විපක්ෂව ඡන්ද 145යි. ඒ අනුව, විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළේ නැහැ. හැබැයි, එයින් අදහස් කරන්නේ නැහැ, රවි කරුණානායක මහතාට එරෙහිව ගෙනා විශ්වාස භංග යෝජනාවේ තිබුණු චෝදනාවලින් එතුමා නිවැරදි වුණාය කියලා.

ඒ වාගේම රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට එරෙහිව - විශේෂයෙන්ම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන්- ඒකාබද්ධ විපක්ෂයෙන් විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා, 2018 අප්‍රේල් මාසයේ 4වෙනි දා. ඒ වෙලාවේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව හම්බ වුණේ ඡන්ද 76යි. විපක්ෂව, ඡන්ද 122යි. 26දෙනෙක් පාර්ලිමේන්තුවට ඇවිත් නැතුව ඉඳලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අපි හය දෙනාම එදා ඡන්දය පාවිච්චි කලා. හැබැයි, ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, විශ්වාස භංග යෝජනාව මේ පාර්ලිමේන්තුවේ පරාජයට පත් වුණාය කියලා මහ බැංකු බැඳුම්කර වංචාව ගැන අගමැතිවරයාගේ තිබෙන සම්බන්ධය ලිහිල් වෙනවා කියලා. විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන කොට දිනනවා; පරදිනවා. හැබැයි, මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන අවස්ථාව විශේෂ අවස්ථාවක්. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් ප්‍රමාණය 106ට සීමා වෙලා තිබෙනවා. විපක්ෂයේ ප්‍රමාණය 118කට වැඩි වෙලා තිබෙනවා. ඒක නිසා මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන්න පුළුවන්.

මහින්ද රාජපක්ෂ මහත්මයාට විපක්ෂ නායකවරයා හැටියට ඉතිහාස ගත වෙන්න මෙයින් අවස්ථාව ලැබිලා තිබෙනවා. මේ යෝජනාව ජනතා විමුක්ති පෙරමුණ ගෙනාවත් විපක්ෂ නායකවරයා හැටියට විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන් එකතු කරගෙන -දෙමළ ජාතික සන්ධානයත් එකතු කරගෙන- මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරලා ඉතිහාසගත වෙන පියවරකට එතුමාට යන්න පුළුවන්. අවස්ථාවක් තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාව අපි කිසිවෙකුත් පැහැර හැරිය යුතු නැහැ. මම දැක්කා, සමහර මන්ත්‍රීවරුන් ප්‍රශ්න කරනවා -විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ අය- ජනාධිපතිවරයා මේකට වග කියන්න ඕනෑ කියලා. ඔව්, පාස්කු ඉරිදා මේ ප්‍රහාරය එල්ල වෙන වෙලාවේ මේ රටේ ආරක්ෂාව භාර ආරක්ෂක අමාත්‍යවරයා විතරක් නොවෙයි, පොලිසිය භාර අමාත්‍යවරයා හැටියටත් හිටපු ජනාධිපතිවරයාට මේ වග කීමෙන් ගැලවෙන්න බැහැ.

අපි ආණ්ඩුව හැටියට හඳුන්වන්නේ ආණ්ඩුවේ ප්‍රධානියා වෙච්ච ජනාධිපතිවරයාත් එක්ක. මාතෘකාව විධියට සඳහන් කර තිබෙන්නේ අගමැතිවරයා සහ ආණ්ඩුව. ඒක ඇතුළේ ජනාධිපතිවරයාත් ඉන්නවා. හැබැයි, කවුරු හරි කියනවා නම්, "පාස්කු ඉරිදා ප්‍රහාරයට ජනාධිපතිවරයා සෘජුව වග කියන්නට ඕනෑ. එතුමාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙනෙන්න ඕනෑ" කියලා, ගෙනෙන්න. අපි ඒකටත් අත්සන් කරනවා. ඒක ගෙනෙන්න. හැබැයි, තමුන්නාන්සේ දන්නවා, අපේ ව්‍යවස්ථාවේ හැටියට දෝෂාභියෝගයක් කථානායකවරයා භාර ගන්නට නම් අඩුම ගණනේ මන්ත්‍රීවරුන් 75ක් අත්සන් කරලා තිබෙන්නට ඕනෑ බව. ඒ මත කථානායකවරයාගේ කැමැත්ත තීන්දු වෙනවා. ඔබතුමන්ලා එහෙම එකක් ගෙනෙන්න. අපි ඒකට අත්සන් කරන්නම්. හැබැයි, විවාදයට ගන්න පුළුවන් ආකාරයට ආණ්ඩුවම වරදකරුවන් කරලා මේ විශ්වාස භංග යෝජනාව අපි ගෙනැවිත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ ප්‍රහාරය වළක්වා ගැනීමට බැරි වීම සම්බන්ධ කරුණු කාරණා ගණනාවක් මේ පාර්ලිමේන්තුවේ එළිදරව් වුණා. මේ වෙන කොට එක පැත්තකින් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඉදිරියේත්, අනෙක් පැත්තෙන් අධිකරණ ඉදිරියේත් මීට සම්බන්ධ කරුණු ගණනාවක් එළියට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා ඒ සමහර කරුණු රහසිගත කරුණු නොවෙයි. ඒ සමහර රහස්‍ය ලේඛන, අතිරහස්‍ය යැයි කියන ඒවා, "top secret" කියන ඒවා, "eyes only" කියන ඒවා රහසිගත ලේඛන නොවෙයි. දැන් ඒවා public documents බවට පත් වෙලායි තිබෙන්නේ. අප්‍රේල් 7වැනි දාට පස්සේ විදේශ බුද්ධි අංශයෙන් ලැබුණු තොරතුරු මත වාර්තා කරපු කරුණක් පිළිබඳව -ලිපියක් පිළිබඳව- දැන් මේ රටේ සියලුදෙනාම දන්නවා. ජාතික තවුහිද් ජමාත් සංවිධානය, එහෙම නැත්නම් මේ සහරාන්ගේ කල්ලිය පදනම් වෙලා තිබුණේ කාත්තන්කුඩි ප්‍රදේශය ආශ්‍රිතව. සහරාන් දේශනා කරලා තිබෙන්නේ කාත්තන්කුඩියේ. සහරාන් විවිධ නීති දාලා තිබෙන්නේ කාත්තන්කුඩියේ. සහරාන් 2015 අගෝස්තු මාසයේ මැතිවරණයට කලින් එක්සත් ජාතික පෙරමුණ, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයෝත් එක්ක ගිවිසුම් අත්සන් කරලා තිබෙන්නේ කාත්තන්කුඩියේ සිට. සහරාන් ගැටුම හදා ගත්තේ 2017 මාර්තු10 වැනි දා කාත්තන්කුඩියේ. කාත්තන්කුඩිය තමයි මේ සංවිධානයේ මර්මස්ථානය බවට පත් වෙලා තිබෙන්නේ; පුහුණුව දෙන, දේශනා දෙන තැන බවට පත් වෙලා තිබෙන්නේ. මේ බුද්ධි අංශ වාර්තාවලින් පුද්ගලයන් කිහිප දෙනෙක් නම් කරලා තිබෙනවා. එහි තිබෙනවා, සහරාන් අක්කරෙයිපත්තු, ඔලුවිල්වල සැඟවිලා ඉන්නවා කියලා. සහරාන්ගේ මල්ලි රිල්වාන් කාත්තන්කුඩි ලිපිනයේ පදිංචි වෙලා ඉන්නවා, ඔහුත් ඔලුවිල්වල සැඟවිලා ඉන්නවා කියලා. ඒ වාගේම රිල්වාන් රාත්‍රී කාලයේ බිරිඳ බලන්න ආරියම්පතිවලට යනවා කියලා. ආමි මොහිදීන් කියන කෙනා වාලච්චේන ප්‍රදේශයේ රහසිගත ස්ථානයක සැඟවිලා ඉඳිමින් කාත්තන්කුඩි ලිපිනයට එනවා කියලා. මේ විධියට කාත්තන්කුඩි නැත්නම් මඩකලපුව, අම්පාර දිස්ත්‍රික්කවල තමයි මොවුන් සැරිසරලා තිබෙන බවයි බුද්ධි අංශ වාර්තා කරලා තිබෙන්නේ.

හැබැයි, අපි අහන කොට ඒවාට උත්තර දීපු හැටි මේ රටේ ජනතාව මාධ්‍යවලින් දැක්කා. මේ සම්බන්ධයෙන් කිසිම තොරතුරක් කාත්තන්කුඩි පොලිසිය දන්නේ නැහැ. අපි එතැනින් එහාටක් අහලා බැලුවා. මේ සම්බන්ධ කිසිම තොරතුරක් මඩකලපුව, අම්පාර පොලිස් අධිකාරිවරු දන්නේ නැහැ. අඩු ගණනේ මෙහෙම කණ්ඩායමක් මේ ප්‍රදේශවල සැරිසරනවා කියලා, මෙවැනි ප්‍රහාරයක් එල්ල වීමට අවදානමක් තිබෙනවා කියලා, ඒකට සම්බන්ධ සහරාන්, රිල්වාන් ඇතුළු කණ්ඩායමයි කියලා, ඒ ගොල්ලන් කතෝලික පල්ලිවලට, හෝටල්වලට සහ ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයට ගහන්න යන්නේ කියලා, ඒක suicide attack එකක්, truck attack එකක්, life attack එකක් වෙන්න පුළුවන් කියලා බුද්ධි තොරතුරු දීලා තිබුණත් ඒ නිලධාරින් ඒ ගැන දන්නේ නැහැ. එහෙම තොරතුරු කියලා තිබියදීත්, අඩු තරමින් නැඟෙනහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාත් ඒක දන්නේ නැහැ. එතකොට මොකක්ද මේ කරලා තිබෙන්නේ? නිශ්චිතව මේ ප්‍රදේශය භාර පොලිස් නිලධාරින් මේ තොරතුරු දන්නේ නැහැ කියලා කියනවා. එතකොට ආරක්ෂක අංශවල බරපතළ අඩු පාඩුවක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, හමුදාපතිවරයා දන්නේත් නැහැ මෙවැනි ආකාරයේ ලිපියක් ලැබුණාය කියලා. එහෙම නම්, රටේ මහ ජන ආරක්ෂාව තහවුරු කරලා තිබෙන්නේ කොහේද? ආරක්ෂාවක් තිබිලා තියෙන්නේ කොහේද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් දන්නවා ඇති, ප්‍රභූ ආරක්ෂක ඒකකයට, හිටපු ජනාධිපති ආරක්ෂක ඒකකයට හෝ මේ බව දැනුම් දීලා නැති බව. ඒ ජනාධිපතිවරු - ප්‍රභූවරු - ආරක්ෂා කරගැනීමට නොවෙයි, අඩු තරමින් ඒ ප්‍රදේශවල පොලිස් ස්ථානවලටවත් මේ ලිපිය ගැන හරියට දැනුම් දීලා නැහැ.

ඒ විතරක් නොවෙයි. දැන් මේ තිබෙන අසමත්කම ගැන කිව්වොත්, 21 වන දා උදේ ඒ ප්‍රහාරය එල්ල වෙනවා. 20 වෙනි දින අපේ රටේ බුද්ධි අංශය එවන ලද වාර්තාවල තිබෙනවාද, මේ ප්‍රහාරකයෝ මෙන්න මේ තැන්වල ස්ථානගත වෙලා සිටියා කියලා? ඔවුන් සඳහන් කරනවා කටුවාපිටිය ප්‍රහාරකයා මොහොමඩ් හස්තුන් ගැන. හැබැයි, මොහොමඩ් හස්තුන් ගැන කියන්නේ ඔහු ප්‍රහාරකයෙක් හැටියට නොවෙයි. සහරාන්ගේ බිරිඳත් එක්ක තව කෙනෙක් ඉන්නවා සාරා කියලා. සාරාගේ ස්වාමිපුරුෂයා තමයි හස්තුන්. හැබැයි, පහුවෙනි දා -20වැනි දා-

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

බුද්ධි වාර්තාවේ හස්තුන්ගේ නම එනවා. 21 වෙනි දා ඔහු මරාගෙන මැරෙන ප්‍රහාරයක් කරලා තිබෙනවා කටුවාපිටියේ පල්ලියේදී. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඔබතුමාට පෙනෙනවා ඇති දුර්වලකම තිබෙන්නේ කොතැනද කියලා.

මේ සියල්ල තිබියදී අපේ රටේ දේශපාලන නායකත්වය විසින්, ආණ්ඩුව විසින් මේ ආරක්ෂක අංශවලට නායකත්වය දෙනවා. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. මේ රටේ ආරක්ෂාව කියන්නේ බරපතළ විෂයක්. ඒ විෂය සම්බන්ධයෙන් හැමෝටම තීන්දු-තීරණ ගන්න බැරි නිසා ඒකට අවශ්‍ය බුද්ධි තොරතුරු, ඒකට අවශ්‍ය මෙහෙයුම් හා ක්‍රියාන්විත සැලසුම් කරන්නට සහ ඒවාට අවශ්‍ය තීන්දු රාජ්‍ය නායක මට්ටමින් ගන්න ඕනෑ නිසා තමයි ලෝකයේ රටවල ආරක්ෂක කවුන්සිලය - Security Council - කියලා එකක් හදලා තිබෙන්නේ. ඒකට හැමෝටම යන්න බැහැ. ඒකට ගෙන්වා ගන්නා නිශ්චිත පුද්ගලයන් පිරිසක් ඉන්නවා. හැබැයි, කනගාටුවට කරුණ මේකයි. අපේ රටේ ආරක්ෂක කවුන්සිලයට දීලා තිබෙන තැන මොකක්ද කියලා දැන් මේ රටම දන්නවා. 2018 ජූලි මාසයේ කැඳෙව්වාට පස්සේ ආරක්ෂක කවුන්සිලය නැවත කැඳවා තිබෙන්නේ ඔක්තෝබර් මාසයේ. සාමාන්‍යයෙන් ගමේ මරණාධාර සමිතියත් මාසයකට සැරයක් කැඳවනවා. නමුත් මාස තුනකට සැරයක්, ජනාධිපතිතුමාට පුළුවන් වෙලාවක, කැමැති වුණොත් කැඳවන වර්ගයේ ඒවා තමයි, "ආරක්ෂක කවුන්සිල්" කියන ඒවා. එහෙම නේ දැන් වෙලා තිබෙන්නේ. 2019 පෙබරවාරි මාසයේ කැඳෙව්වාට පස්සේ ඒ කවුන්සිලය කැඳවලා නැහැ. මේ ප්‍රහාරය වුණේ නැත්නම් සමහරවිට තවමත් කැඳවන්නේ නැහැ.

මේ ආරක්ෂක කවුන්සිලයට සහභාගි වූ හිටපු ආරක්ෂක ලේකම්වරයා ඇවිල්ලා කියනවා, එසේ කැඳවූවත් එහිදී කථා කළේ මොනවාද කියලා. ඒ කථා කරපු දේවල්වල ප්‍රමුඛතාවයි අපට වැදගත් වෙන්නේ.

ඊයේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඇවිල්ලා කිව්වා, අපේ රටේ රාජ්‍ය බුද්ධි අංශ විසින් මේ සම්බන්ධයෙන් ලේඛන 600ක්, 700ක් පසුගිය කාලය ඇතුළතදී ආරක්ෂක කවුන්සිලයට නිකුත් කරලා තිබෙනවා, එවලා තිබෙනවා කියලා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ආරක්ෂක කවුන්සිලයට කැඳවපු එක වෙනම තිබියදී, එතුමා කියපු තොරතුර අපි ගනිමු. එතුමා කියපු තොරතුර ගත්තොත්, ලේඛන 600ක,700ක ප්‍රමාණයක් ආරක්ෂක කවුන්සිලයට ඉදිරිපත් කරලා තිබෙනවා නම්, ඒවාට ප්‍රමුඛතාව නොදුන්නේ ඇයි කියලා අපි අහන්න කැමැතියි. හිටපු ආරක්ෂක ලේකම්වරයා කියනවා, මොනවාටද ප්‍රමුඛතාව දුන්නේ කියලා. ඔහු කියනවා එක වෙලාවක, වෙනිසියුලාවේ ජනාධිපතිවරයාට drone attack එකක් ආවා, මෙහාටත් drone attack එකක් එයිද දන්නේ නැහැ කියලා ඒ ගැන කථා කළාලු. ඊළඟට, speargunsවලින් මෝරු මරන හැටි කථා කළා ලු. ඊට අමතරව ගොවි උද්ඝෝෂණ ගැන කථා කළා ලු. ඔන්න, ආරක්ෂක කවුන්සිලයේදී කථා කරලා තිබෙන දේවල්! ආරක්ෂක කවුන්සිලය විසින් ප්‍රමුඛතාව දිය යුතු දේට ප්‍රමුඛතාව දීලා නැහැ. ඒකයි ප්‍රශ්නය. තොරතුරු හැම තැනම තිබෙනවා. තොරතුරු තිබියදී, ඒ අනුව මෙහෙයවන්න නායකත්වය දීලා නැහැ. නමුත්, එතැනට විතරක් චෝදනා කරලා හරියන්නේ නැහැ.

මම කැමැතියි රුවන් විජේවර්ධන රාජ්‍ය ඇමතිවරයා මේ සභාවේ හිටියා නම්. එතුමා තමයි බුද්ධි සමාලෝචන රැස්වීම කැඳවන්නේ. එතුමා තමයි ඒකේ මූලිකයා. අප්‍රේල් 9 වැනි දා තිබුණු බුද්ධි සමාලෝචන රැස්වීමට රුවන් විජේවර්ධන රාජ්‍ය ඇමතිවරයා ගියේ නැත්තේ ඇයි? මේ තොරතුර ඇවිල්ලා තිබෙනකොට, අඩු තරමින් මේ තොරතුර මත පදනම් වෙලා තීන්දුවක් ගන්න පුළුවන් තැනක් තමයි එතැන. හැබැයි, එතුමා එදා ගිහිල්ලා නැහැ. මට හිතෙන හැටියට එදා විතරක් නොවෙයි, ඊට කලිනුත් එතුමා එහෙම ගිහින් නැහැ. එහෙම නම්, එතුමාට මෙය අදාළ වෙලා නැහැ. එතුමා ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා වුණත්, ආරක්ෂක කවුන්සලයට එතුමා කැඳෙව්වේ නැති වුණාට පස්සේ ඒ ගැන වචනයක්වත් කථා කරන්නේ නැති ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයෙක් නම් ඉන්නේ, ඒ ගැන කථා කරන්නේ නැති අගමැතිවරයෙක් නම් ඉන්නේ, බුද්ධි සමාලෝචන රැස්වීමේ ප්‍රධානියා වෙලා ඉන්න ඕනෑ වුණත් ඒ ගැන කථා නොකරන ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයෙක් නම් ඉන්නේ අපට තව කථා කරන්න තිබෙන්නේ මොනවාද? ඒ රැස්වීමේදී මොනවාද කථා කළේ කියලා එතුමා විමසීමක්වත් කරන්න ඇතියි කියලා මා හිතන්නේ නැහැ. එතුමා එහෙම කරලා නැහැ. එදාත් ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් මොනවා හෝ කථා කර තිබෙනවා. ඔන්න ඕක තමයි, අපේ රටේ ආරක්ෂාවට තිබෙන තැන, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි, දැන් ආණ්ඩුවට චෝදනා එල්ල වෙනවා. විශ්වාස භංග යෝජනාවේ සඳහන් කරන්න බැරි වුණත් ඊට පස්සේ හෙළි වුණු කරුණක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාලක ද සිල්වා මහත්මයා ත්‍රස්ත විමර්ශන ඒකකයේ ප්‍රධානියා වශයෙන් සිටි අවස්ථාවේ, 2017දී ඔහු නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා යවා තිබෙනවා, ජාතික තව්හිද් ජමාත් සංවිධානය තහනම් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දෙන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවශ්‍ය ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කාලයෙන් ලබා ගන්නවා.

NTJ එක තහනම් කරන්න කියලා 2017 සිට දන්වා තිබියදීත්, නීතිපති දෙපාර්තමේන්තුව කිසිවක් කරලා නැහැ. අද වන තුරු ඒ පිළිබඳව ප්‍රතිචාර දක්වා නැහැ. එවැනි ඉල්ලීමක් කර තිබියදී, පොලීසිය භාර ඇමතිවරයා ඒ සම්බන්ධයෙන් මොනවාද කළේ? නීතිපති දෙපාර්තමේන්තුව භාර අපේ රටේ අධිකරණ ඇමතිවරිය මොනවාද කළේ? ඒ කාරණාත් මේ විශ්වාස භංග යෝජනාවට ඇතුළත් වෙන්නට ඕනෑ. වගකිව යුතු සියලුදෙනා ඒ සියලු කරුණු පැහැර හැර තිබෙනවා; අමතක කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ පැහැදිලිවම ආණ්ඩුවට විරුද්ධවයි. ජනාධිපතිවරයා, අගමැතිවරයා, ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා, මෙයට උදවු කළාය කියන ඇමතිවරුන්, අධිකරණ ඇමතිවරිය ඇතුළු ආණ්ඩුවේ සියලුදෙනාගේ අසමත්කමයි මේ සිද්ධියෙන් පෙන්නුම් කරන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ සිටින සියලු මන්ත්‍රීවරුන්ට අපි කියනවා, හෘදය සාක්ෂියට එකඟව මේ විශ්වාස භංග යෝජනාවට පාව්ච්චි කරන්න කියලා.

ආණ්ඩු පක්ෂයේ සිටින නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිවරයා, කවින්ද ජයවර්ධන, හෙක්ටර් අප්පුහාමි වැනි කතෝලික මන්ත්‍රීවරු පසුගිය දවස්වල බොහොම ආවේගයෙන්, බොහොම ශෝකී ස්වරයෙන් මේ ප්‍රශ්නය පිළිබඳව කථා හැටි අපි දැක්කා. එතුමන්ලා බොහොම සංවේදීව මේ ගැන කථා කළා. තමුන්ගේ ජනතාව ඉදිරියට ගිහින් හැඬූ කඳුළින් යුතුව සිටියා.

තමන්ගේ ජනතාවගේ දුක දැනෙන එක හොඳයි. හැබැයි අපි පැහැදිලිවම කියන්නේ, තමන් ආශ්‍රය කරන තමන්ගේ ඥාති හිත මිතුරන්, තමන්ගේ ඡන්ද කොට්ඨාසයේ ජීවත්වන, තමන්ට ඡන්දය දෙන ඒ අහිංසක කතෝලික ජනතාව වෙනුවෙන් මාධ්‍ය ඉදිරියට ගිහින් කඳුළු හෙළුවාට අමතරව, රජයේ අසමත්කමට එරෙහිව ඇඟිල්ල දිගු කරන්නටත් දැන් තමුන්නාන්සේලාට අවස්ථාවක් ලැබී තිබෙන බවයි. ඒකට ආණ්ඩුවේ සිටිනවාද, නැද්ද කියන එක සලකන්න එපා. එතුමන්ලා අඩු තරමින් හෘදය සාක්ෂියට මුල් තැන දීලා කටයුතු කරන්න පටන් ගත්තොත්, එතුමන්ලාට මේ විශ්වාස භංග යෝජනාවේදී ආණ්ඩුව ආරක්ෂා කරන්න කිසිම හේතුවක් නැහැ. එහෙම නැති වුණොත්, එතුමන්ලා හෘදය සාක්ෂිය පාවාදීලා, ලැබෙන වරප්‍රසාද මත, ඇමති ධුරය වෙනුවෙන් හෝ අධීක්ෂණ මන්ත්‍රී ධුරය වෙනුවෙන්ම ලැබෙන, වාහනය, ඉන්ධන මත පදනම්වෙලා තමයි මේ විශ්වාස භංග යෝජනාවේදී ආණ්ඩුවට පක්ෂව අත උස්සනවා නම් අත උස්සන්නේ. එතුමන්ලාගේ ජනතාව ගැන හිතනවා නම්, පසුගිය දවස්වල එතුමන්ලා හමුවුණු කතෝලික පියතුමන්ලා ගැන හිතනවා නම්, කාදිනල්තුමාගේ වචන ගැන හිතනවා නම්, එතුමන්ලාට මේ විශ්වාස භංග යෝජනාවේදී ආණ්ඩුව රකින්න වුවමනාවක් නැහැ කියා මා හිතනවා.

මම තවත් කාරණයක් කියන්න ඕනෑ. විපක්ෂයේ පක්ෂයක් හැටියට ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස භංග යෝජනාවක් ගෙනැවිත් තිබෙන මේ අවස්ථාවේදී, ආණ්ඩු පක්ෂය පැත්තෙන් ප්‍රහාර එන එක අපට තේරුම් ගන්න පුළුවන්. ඒ, අපි ආණ්ඩුව ඉලක්ක කරලා මෙම විශ්වාස භංග යෝජනාව ගෙනැත් තිබෙන නිසා. අපි නිවැරදි තැනට ගල ගහලා තිබෙනවා. නමුත් විපක්ෂයේ සිටින සමහර මන්ත්‍රීවරුන් මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය පටන් ගත් වෙලාවේ සිටම අපට චෝදනා කරනවා. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් කථාව පටන් ගන්නකොටම ජනතා විමුක්ති පෙරමුණට පහර දීලා තමයි කථාව පටන් ගත්තේ; JVP එකට ගහලා තමයි කථාව කරගෙන කරගෙන ගියේ. ඇයි, මේ? අපි ගහන්නේ ආණ්ඩුවටයි; අපි ගහන්නේ, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඇතුළු ආණ්ඩුවටයි. මලිත්ට ගහනකොට වංචලාට රිදෙන්නේ ඇයි? වංචලා අඬන්න එපා, මලිත්ටයි ගහන්නේ. මලිත්ට ගහනකොට වංචලාට රිදෙන්න නම්, එතැන වෙනත් case එකක් තිබෙන්න ඕනෑ. ඒ නිසා මලිත්ට ගහනකොට වංචලා අඬන්න එපා. රනිල්ට ගහනකොට විමල් අඬන්න එපා. එහෙම නම්, ආණ්ඩුව ආරක්ෂා කිරීමේ වෙන වුවමනාවක් යටින් තිබෙන්න ඕනෑ. මේක විපක්ෂය ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාවක්. විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමාගේ අදහස ඍජුව ප්‍රකාශයට පත් කළ නිසා. මේ විශ්වාස භංග යෝජනාවේදී ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙන්න කියලා එතුමා එතුමාගේ මන්ත්‍රී කණ්ඩායමට කිව්වා. අන්න එහෙම කෙළින් හිට ගත්තොත්, මේ විශ්වාස භංග යෝජනාවේදී ආණ්ඩුව පරාජයට පත් කිරීමේ අවස්ථාවක් තිබෙනවා. ඒ අවස්ථාව අපි පාවිච්චි කරමු. මොකද, ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්න බැරි නම් මේ ආණ්ඩුව තව මොහොතක්වත් මේ රටේ පාලන බලය හෙබවිය යුතු නැහැ. අපි ආණ්ඩුව පරාජයට පත් කරමු. ඊළඟට පාර්ලිමේන්තුව විසුරුවා ගනිමු. ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරන්න පුළුවන් විධියේ ආණ්ඩුවක් පත් කර ගන්නට ජනතාවට අවස්ථාවක් දෙමු. අන්න ඒ අවස්ථාවයි මේ ඉල්ලා සිටින්නේ. ඒ නිසා, තම තමන්ගේ හෘදය සාක්ෂියට ඉඩ දෙමින් මේ විශ්වාස භංග යෝජනාවේදී කටයුතු කරන්න. විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම කියන්න කැමැතියි, මේ වෙලාවේ තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව ඡන්දය පාවිච්චි කරන්න කියලා. සියල්ල ආරක්ෂා කරගන්න ඕනෑය, ඔක්කොම කරගන්න ඕනෑය කියා හිතලා, තමුන්නාන්සේලා මේ විශ්වාස භංග යෝජනාවේදී මේ අසමත් ආණ්ඩුව වෙනුවෙන් අත උස්සලා ආයෙත් ගමට යන්න නම් බලාපොරොත්තු වෙන්න එපා. එහෙම ගමට යන්න හිතාගෙන ඉන්නවා නම්, අඩුම තරමින් මේ යෝජනාවට ඡන්දය දෙන්න නැවිත් ඉන්න කියා ඉල්ලමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා අතිරේකව විනාඩි තුනක කාලයක් ලබාගෙන තිබෙනවා. ඒ කාලය ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට වෙන්ව ඇති කාලයෙන් අඩු කරනවා.

මීළඟට, ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.28]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න ඉතා කෙටි කාලයයි තිබෙන්නේ. නමුත් මගේ කථාව පටන් ගන්න කලින්, විමල් වීරවංශ මන්ත්‍රීවරයා කළ චෝදනාවලට උත්තරයක් දෙන්න ඕනෑය කියා මම හිතුවා. එතුමා කථා කළ විලාසය සහ යටිගිරියෙන් කෑ ගැසූ විධිය දැක්කාම මටත් බය හිතුනා, ඇත්තටම මොනවාද මේ කියන්නේ කියලා. ඇත්ත වශයෙන්ම, එතුමන්ලාගේ සාමාන්‍ය ක්‍රමවේදය තමයි ඔය විධියට කථා කිරීම. රටේ ජනතාව ඉදිරියේ බිල්ලෙක් මවලා, යථාර්ථය වෙනස් විධියකට ජනතාවට ඒත්තු ගන්වන්න කටයුතු කරන එක තමයි එතුමන්ලාගේ ස්වරූපය. එතුමා SOFA එක ගැනත්, ACSA එක ගැනත් කිව්වා. එහෙම ගිවිසුමක් නැති බවත්, එහි තිබෙන තත්ත්වය පිළිබඳවත් ගරු අගමැතිතුමා ඊයේ පැහැදිලිව විස්තර කළා. නමුත් තවදුරටත් දිගින් දිගටම ඒ ගැන බිල්ලෙක් මවමින් කටයුතු කරන එක තමයි එතුමා අද කළේ.

එතුමා ACSA එක ගැනත් කිව්වා. අප නිකම් යුද ගිවිසුමක් අත්සන් කළා වාගේ තමයි ඒ ගැනත් එතුමා කථා කරන්නේ. මේ ACSA එක 2007දී ගෝඨාභය රාජපක්ෂ මහත්මයා අත්සන් කරද්දී එතුමන්ලාට ඒ ගැන ප්‍රශ්නයක් මතු වුණේ නැහැ. එතකොට ඒක දේශ ප්‍රේමීයි; ජාතිවාදී නැහැ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා American citizen කෙනෙක් වෙලාත්, එතුමා ඒක අත්සන් කරද්දි විමල් වීරවංශ මන්ත්‍රීතුමන්ලාට ප්‍රශ්නයක් මතු වුණේ නැහැ. ඒ ගිවිසුමම 2017දී -අපේ ආණ්ඩුව කාලයේ- අලුත් කරද්දී, renew කරද්දී මේ රටට පෙන්වන්න හදනවා, ඇමෙරිකාවට අපේ රට පාවා දෙන්න යනවාය කියලා. එහෙම නැත්නම් ඒකට වෙනත් අර්ථ කථනයක් දෙන්න හදනවා. මේක තමයි, මේ ගොල්ලන් හැම දාම පවත්වන සංදර්ශනය.

ඇමෙරිකාව රටවල් 102ක් සමඟ මේ ACSA එක අත්සන් කර තිබෙනවා. මේක මහ ලොකු දෙයක් නොවෙයි. ලංකාවට ඇමෙරිකන් නැව් ඇතුළු අනිකුත් නැව් එනකොට ඒවාට පහසුකම් - logistics - දෙන්නයි මේ කටයුත්ත කරන්නේ. ඒ අයට කෑම බීම, ජලය, medical පහසුකම් සැපයීම සම්බන්ධයෙන් කටයුතු කරන්නයි මේ ගිවිසුම අත්සන් කර තිබෙන්නේ. ඊට එහා දෙයක් මෙතැන නැහැ. යුද ආයුධ ගනුදෙනු කිරීම හෝ වෙන කිසි දෙයක් මේ ගිවිසුම තුළ නැහැ. නමුත් මෙතුමන්ලා කියන දේවල් බලන්න. මෙහි තිබෙන ඇමුණුම් පිළිබඳව මෙතුමන්ලා කථා කරනවා. මේ ඇමුණුම්වල තිබෙන්නේ ඒ agencies ටික පිළිබඳ විස්තර; ඒ

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ආයතන ගැන විස්තර. ඒකයි මේ ඇමුණුම් වැඩිවෙලා තිබෙන්නේ. ඒ නිසා රටේ ජනතාව මෝඩයෝ කියා හිතාගෙන තමුන්නාන්සේලා නිකම් බිල්ලෝ මවන්න එපා. තමුන්නාන්සේලා ජනතාවට ඒත්තු ගන්වන්න හදන්නේ සම්පූර්ණයෙන් වෙනස් දෙයක්.

මේ ගිවිසුම 2007දී අත්සන් කරනකොට තමුන්නාන්සේලාට ප්‍රශ්නයක් මතු වුණේ නැහැ. හැබැයි 2017දී අත්සන් කරද්දී ප්‍රශ්නයක් මතු වෙනවා. ඒක තමයි, කාරණය.

ඉඩම්වලට සින්නක්කර ඔප්පු ලබාදීම පිළිබඳවත් එතුමා කිව්වා. ඩී.එස්. සේනානායක මැතිතුමා, ගොවි ජනපද ඇති කරද්දීත් මෙහෙම වුණා. ඒක කුමන්ත්‍රණයක් බව කියමින් ඒ කාලයේ එතුමාටත් පහර ගහලා තිබෙනවා. දැන් මේ මොකක්ද කරන්නේ? කාලයක් තිස්සේ අපේ රටේ මිනිස්සු මේ ඉඩම් පරිහරණය කරලා, භුක්ති විඳලා, පරම්පරාවෙන් පරම්පරාවට ඒවා රැකගෙන ආවත් ඔවුන්ට තවමත් ඒ ඉඩම්වලට හරි හැටි ඔප්පුවක් ලැබී නැහැ. ඉතින් ඒ අයට ඔප්පුවක් ලබාදෙන එක වැරැද්දක්ද? මේ කියන විධියට, ඒ ලබාදෙන ඉඩම් කැබලි ටිකත් ඇමරිකන්කාරයෝ සල්ලිවලට ගනියි කියන විධියට තමයි විමල් වීරවංශ මැතිතුමා කථා කරන්නේ. ඇමෙරිකාව ඒ ඉඩම් සල්ලිවලට ගන්නවා වාගේ කථාවක් තමයි එතුමා කියන්නේ. ගම්වල අහිංසක ජනතාව මේ ඉඩම් පරිහරණය කළාට, ඒ ඉඩමට ඔප්පුවක් නැති වුණාම මොකද වෙන්නේ කියලා අපි දන්නවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දරුවෙකුට හදිසියක් වුණාම, නැත්නම් දරුවෙකුට අධ්‍යාපනය ලබාදෙන්න -සමහරුන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දෙන්න, පිට රටකට යවන්න- ඔවුන් සතු ඉඩම් සමහර වෙලාවට උගස් තියනවා. ඒවා ඊට පස්සේ බේරාගන්නවා. එහෙමත් නැත්නම් කසාදයක් බඳින කොට දැවැද්ද දෙන්න මේ ඉඩම් පාවිච්චි කරනවා වෙන්න පුළුවන්. එහෙම නැත්නම් වෙනත් වත්කමක් විධියටත් මේ ඉඩම් පාවිච්චි කරනවා.

අහිංසක මිනිසුන්ට මේ අයිතිය දෙන ඒවා ගැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. දසදහස් ගණනකට - ලක්ෂ ගණනකට - ඉඩම් ඔප්පු ලබා දුන්නාම දේශපාලන වශයෙන් මේ අයට ප්‍රශ්නයක් ඇති වනවානේ. ඒ මිනිස්සු ඊට පසේස් අපේ ආණ්ඩුවට සහයෝගය ලබා දෙයි නේ. මෙන්න මේකයි තිබෙන ප්‍රශ්නය. වෙන ප්‍රශ්නයක් නොවෙයි මේ තිබෙන්නේ. දැන් හැම එකකටම අපට විරුද්ධව විකුණන්නේ ජාතිවාදයයි, වර්ගවාදයයි, ආගම්වාදයයි. හරි ලස්සනට සමහර මාධ්‍යවල ඒවා විකාශනය කරනවා. මොන අර්ථකථන කළත් මේ රටේ ජනතාව මේ කාරණය තේරුම් ගනීවි කියලා මා විශ්වාස කරනවා. ලුණු ඇඹුල් දාලා, ඒ බොරුව රස කරලා කියන්න පුළුවන් විධියට ලස්සන වචන මාලාවක් දීලා තිබෙනවා. ඒ නිසා ඒ කාරණය ජනතාව තේරුම් ගනීවි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විශ්වාස භංග යෝජනාවට විරුද්ධව ඡන්දය දීලා අපි ආණ්ඩුව ජයග්‍රහණය කරනවා. ඒ ගැන සැකයක් නැහැ. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අප්‍රේල් 21 සිද්ධිය වෙද්දී රටේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමේ බලය හා වගකීම ගරු ජනාධිපතිතුමාට තමයි පැවරිලා තිබුණේ. එහෙම වුණත් මේ සිද්ධිය ඇති වුණාම ගරු අගමැතිතුමා ආණ්ඩුවක් විධියට වාගේම කැබිනට් මණ්ඩලය විධියට මේ සම්බන්ධයෙන් ගන්න ඕනෑ හැම පියවරක්ම ගත් බව අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒ තුළින් අපට මේ තත්ත්වය මර්දනය කරන්න පුළුවන් වුණා. ඒ සිද්ධියට සම්බන්ධ ලංකාවේ අය විතරක් නොවෙයි, විදේශවල හිටපු සියයට 98ක්ම අත්අඩංගුවට ගන්න මේ වනකොට අපේ රජයට පුළුවන්වෙලා තිබෙනවා. අද ආරක්ෂාව තහවුරු කරලා තිබෙනවා. පාසල් පිළිබඳව බියක් ඇති කළා. පාසල් වසා තැබීමට දේශපාලනඥයන්ට හුහක් වුවමනා වුණා. නමුත් අපි ඒකට ඉඩ දුන්නේ නැහැ. අපි සියලු පාසල් පටන් ගත්තා. අද සියලු පාසල් යථා තත්ත්වයට පත් වෙමින් පවතිනවා. ඒ වාගේම අපි රජයක් විධියට මෙහි සත්‍ය තොරතුරු හඳුනා ගැනීම සඳහා විශේෂ කාරක සභාවක් - Select Committee එකක් - පත් කළා. මේ සිද්ධිය ඇති වුණේ කොහොමද කියලා අපි බොහොම විනිවිදභාවයෙන් යුතුව රටටම පෙන්නුම් කළා. අද රටම මේ කාරණය තේරුම් අරගෙන ඉන්නවා. ඒ සිද්ධිය අපේ ඇඟ මතට දමන්න අද විවිධ මතවාද, අර්ථකථන ඉදිරිපත් කරන්න හදනවා. නමුත් රජයක් විධියට අපට ගන්න පුළුවන් හැම ක්‍රියාමාර්ගයක්ම ගත් නිසා දැන් රට යථා තත්ත්වයට පත් වෙමින් පවතිනවා. අපේ ප්‍රදේශවලත් යම් යම් සිද්ධි ඇති වුණා. ඒ වෙනුවෙන් පහර එල්ල කරනවා මා දැක්කා.

මගේ ආසනය වන කුලියාපිටිය ආසනය ගත්තොත්, එක්සත් ජාතික පක්ෂය ඡන්ද සියයට 50කට වැඩිය අරගෙන දිනුවත් අපට ප්‍රාදේශීය සභාව තනියම පිහිටුවන්න බැරි වුණා. රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිවරයා - වෙනම ඉල්ලපු කණ්ඩායම - පොහොට්ටුව එක්ක ගනුදෙනු කරලා තමයි ප්‍රාදේශීය සභාව පිහිටුවා ගත්තේ. රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිවරයා අල්ලාගෙන, ඒ ගොල්ලන්ගේ මන්ත්‍රීවරුන් එක්ක ඩීල් එකක් දාලා සභාව පිහිටුවන්න විපක්ෂයේ ඉන්න නායකයන්ට හොඳයි. හැබැයි, අපි එක්ක ඡන්දය ඉල්ලන දේශපාලනඥයන්ට ජාතිවාදී විධියට - එක එක විධියට - පහර දෙනවා. ඕනෑ කෙනෙකු වැරැද්දක් කරලා තිබෙනවා නම් මේ Select Committee එකෙන් හෝ අධිකරණයෙන් දඬුවම් ලබා දෙන්න ඕනෑ. හැබැයි, කන්න ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා කර ගැනීමේ න්‍යායක් තමයි මෙතුමන්ලාට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රජයක් විධියට වේගයෙන් ඉස්සරහට යමින් පවතිද්දි කවුරුවත් හිතපු නැති විධියට අප්‍රේල් 21 වැනි දා මේ ගැටලුව ආවා. ඒ ගැටලුවෙන් පසුව අපට ඉතාම කෙටි කාලයක් තුළ නැවත යථා තත්ත්වයට පත් වෙන්න පුළුවන්කම ලැබුණා. දැන් සංචාරක ව්‍යාපාරය ක්‍රමයෙන් දියුණු වෙගෙන එනවා. වේගවත් සංවර්ධනයක් කරමින් යනවා. විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ඇති කරමින් යනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වාගේම ගම් මට්ටමින් "ගම්පෙරළිය" වැඩසටහන යටතේත් විශාල දියුණුවක් ඇති කරමින් යනවා.

පසුගිය කාලයේ දේශපාලනය නිසාම සමෘද්ධිය නොලැබුණු ලක්ෂ හයක පමණ පිරිසක් හිටියා. අපි දැන් ඒ ගොල්ලන්ට සමෘද්ධි දීමනාව ලබා දෙමින් යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විශ්වාස භංග යෝජනාව තුළින් අපේ ආණ්ඩුව තවත් ශක්තිමත් කරගෙන ඉදිරි කාලයේදී කටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.36]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මට අදහස් දක්වන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධව රජයට එරෙහිව අද ඉදිරිපත් කරලා තිබෙන විශ්වාස භංග යෝජනාව

පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ, විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන පාර්ශ්වය කවුද යන්න අපට එතරම් වැදගත් වන්නේ නැහැ. විශ්වාස භංග යෝජනාවේ අන්තර්ගත කරුණු පිළිබඳව අවධානය යොමු කළාම සැබෑ ලෙසම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට -මන්ත්‍රී කණ්ඩායමක් හැටියට- මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය ප්‍රකාශ කිරීමේ යුතුකම විපක්ෂයේ අපට තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 ජනවාරි මාසයේ 08වැනි දා යහ පාලන ආණ්ඩුව බලයට පත් කිරීම සඳහා සිය උපරිම කැපවීම, දායකත්වය ලබා දුන් ජනතා විමුක්ති පෙරමුණ, දින 100 ආණ්ඩුව ගෙනාපු අතුරු සම්මත ගිණුමේ -අතුරු අය වැයේ- සිට ඒ සියලු දේවල්වලට රජයට සහයෝගය දීපු ජනතා විමුක්ති පෙරමුණ, පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධව සෘජුවම රජයට චෝදනා කරන මට්ටමට පැමිණීම ගැන අපි එක අතකින් සතුටු වනවා. මොකද, මේ රජය බලයට පත් කරවන්න කොටස්කාරයින් වූ, මේ යහ පාලන රජය පවත්වාගෙන යෑම සඳහා සහයෝගය දීපු කණ්ඩායමක් වෙතින් අද මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් වීම එක පැත්තකින් දෛවයේ සරදමක් වෙන්න පුළුවන්. ඒ කෙසේ නමුත්, අපි මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජයට තවදුරටත් ඉදිරියට යා නොහැකියි. ඒ බවට අපට කිසිම සැකයක් හෝ අවිශ්වාසයක් නැහැ. ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරපු ආකාරයට, රටේ ජනතාව ඉදිරියේ ප්‍රකාශ කරපු ආකාරයට, අද පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රී බලයක් සහිත ආණ්ඩුවක් නොවෙයි මේ තිබෙන්නේ. අද සුළුතර මන්ත්‍රී කණ්ඩායමක් ඉන්න, සුළුතර ආණ්ඩුවක් තිබෙන්නේ. පසුගිය වසර හතරහමාරක කාල පරිච්ඡේදය තුළ මේ රජය අනුගමනය කරපු ක්‍රියා මාර්ග තුළ රජයේ කිසිම නායකයකුට, අඩුම තරමින් මේ රජයට සහයෝගය දෙන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුටවත් ප්‍රකාශ කිරීමේ හැකියාවක් නැහැ, "මෙන්න මේ අංශයෙන්, මේ ප්‍රශ්නයෙන් අපි මේ රට ගොඩ ගත්තා" කියලා. "අපි මෙන්න මේ ටික කළාය" කියන්න හෝ ජනතාවට පිළිගත හැකි ආකාරයෙන් කිසිවක් ඉදිරිපත් කිරීමේ හැකියාවක් නැති අසාර්ථක ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ. ඒ වාගේම ජාතික ආරක්ෂාව පැත්තෙන් ගත්තත්, ජාතික දේපළ පැත්තෙන් ගත්තත්, රට පැත්තෙන් ගත්තත්, හැම පැත්තෙන්ම අසාර්ථක ආණ්ඩුවක් වාගේම, රටට මහා විනාශයක් කරපු ආණ්ඩුවක් හැටියට මේ ආණ්ඩුව ඉතිහාසයට එකතු වනවා. එසේ නම් එවැනි ආණ්ඩුවකට නැවත වතාවක් පාර්ලිමේන්තුවේ බලය ලබාගත හැකිද?

මට පෙර කථා කරපු අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මහතා ප්‍රකාශ කළා, මේ විශ්වාස භංග යෝජනාව ස්ථිර වශයෙන්ම අද දවසේදී දිනනවා කියලා. පාර්ලිමේන්තුව තුළ සුළුතර කණ්ඩායමක් වුවත්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂයේ සමහර කණ්ඩායම්වල සහයෝගය අරගෙන හෝ කුමන ක්‍රමයකින් හෝ ජයග්‍රහණය කරාවිය කියලා අපි හිතුවත්, අපි ඉතා පැහැදිලිව කියනවා, පාස්කු ඉරිදා ප්‍රහාරයේ වගකීම සහ මේ විශ්වාස භංග යෝජනාවේ අරමුණ පරාජය කිරීමට කිසිසේත්ම රජයට හැකියාවක් නැහැ කියලා. ඒ අරමුණ ජයග්‍රහණය කරනවා. මම එය ඉතා පැහැදිලිව කියනවා.

ඊයේ ගරු සභානායකතුමා එතුමාගේ අදහස් දැක්වීමේදී ප්‍රකාශ කළා, "ඒ ප්‍රහාර සිදු වනතෙක් අපි දැනගෙන හිටියේ නැහැ. අවුරුදු දහයක් යනතෙක්ම රටේ කිසිම ත්‍රස්තවාදී ප්‍රශ්නයක් උද්ගත වෙලා තිබුණේ නැහැ" කියලා. හැබැයි විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට, අපි මේ පාර්ලිමේන්තුව තුළත් පාර්ලිමේන්තුවෙන් පිටතදීත් අවස්ථා ගණනාවකදී ප්‍රකාශ කළා, "ඉස්ලාම් බෙදුම්වාදී අන්තවාදය රට පුරා හිස ඔසවමින් පවතිනවා. මේ සඳහා සෘජුව මැදිහත් වෙන්න" කියලා. ඒ අවස්ථාවලදී කිව්වේ, "රාජපක්ෂවාදීන්ට, රාජපක්ෂ වහල්ලුන්ට ලේ සහ මළ මිනී දකින්නේ නැතුව දේශපාලනය කරන්න බැහැ" කියලායි. ආණ්ඩුවේ ඉදිරි පෙළ ඉන්න මේ ප්‍රබල ඇමතිවරු කිව්වේ, "කුමන හේතුවක් නිසාවත් මේ යහ පාලන ආණ්ඩුව යටතේ ආයෙත් ත්‍රස්තවාදයට හිස එසවීමට කිසිසේත්ම අවස්ථාවක් නැහැ" කියලායි. පුවත් පත් සාකච්ඡා, මාධ්‍ය සාකච්ඡා ඇතුළු හැම තැනකදීම කිව්වේ එහෙමයි. හැබැයි, තමන්ගේ ගේ ඉස්සරහට ඉස්ලාම් අන්තවාදී පිස්සු බල්ලන් පැනලා බෝම්බ පුපුරවනකොට ඒ ගැන ඒ කිසි කෙනෙක් දැනගෙන හිටියේ නැහැ. දැනගෙන නොසිටියා නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැනගෙන හිටියා. හැබැයි, ආණ්ඩුව ආරක්ෂා කර ගැනීම සඳහා සුළුතරයකගේ ඡන්ද ටික ලබා ගැනීමේ අවශ්‍යතාව නිසා ඒ අය විසින් මේ සියල්ල දෙස ඇස්-කන් පියාගෙන බලාගෙන හිටියා. ඉස්ලාම් අන්තවාදය පෝෂණය වෙන්න අවශ්‍ය කරන පසුබිම සහ වාතාවරණය සකස් කරලා දුන්නා. ඒවා ගැන කථා කරනකොට අපට කිව්වා සංහිඳියාවට විරුද්ධ, සහජීවනයට විරුද්ධ, ජාතීන් අතර එකඟතාවට විරුද්ධ රාජපක්ෂ වහල්ලු ටික ආණ්ඩුවට දොස් කියනවා කියලා. එසේ කියමින්, අපට අපහාස උපහාස කළා. හැබැයි, අන්තිමට දේවස්ථානවල හා සංචාරක හෝටල්වල බෝම්බ පුපුරනකොට තමයි ආණ්ඩුවේ නායකයන්ගේ ඇස්දෙක ඇරුණේ. එදා රාජපක්ෂ වහල්ලු කියලා අපහාස කරපු අය කියපු දේ ඇත්ත නේන්නම් කියලා මේ ආණ්ඩුවේ උදවියට තේරුම් ගන්න සිද්ධ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ඉරිදා ප්‍රහාරය ගැන ගරු අගමැතිතුමා ඇතුළු ඇමති මණ්ඩලය දන්නේ නැහැ ලු. හරියට එතුමන්ලා තොත්ත බබාලා වාගේයි. එතුමන්ලා කිසිම දෙයක් දන්නේ නැහැයි කිව්වාට මාවනැල්ලේ බුදු පිළිම කඩනකොට එදා සභානායකතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ, "පුරාවිද්‍යාත්මක වටිනාකමක් නැති බුදු පිළිම තමයි කඩා තිබෙන්නේ. අපි ඒ ගැන හොයනවා. ඒ සම්බන්ධයෙන් බොරු බියක් මවන්න එපා" කියලායි. එතුමා ඒ ගැන ප්‍රසිද්ධියේ අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය දිනවල කාත්තන්කුඩියේදී බයිසිකල් බෝම්බයක් පිපිරුණා. ඒක වහගන්න කිව්වා, "අකුණක් වැදිලා බයිසිකලේ පිපිරුණා" කියලා. සහරාන් කියන ත්‍රස්තවාදියා පිළිබඳව බුද්ධි අංශ විසින්, විදේශීය ඔත්තු සේවා විසින් සියලු තොරතුරු සම්පාදනය කරලා රජයට ලබා දී තිබියදී ඇහැ කන පියාගෙන සිටියා වාගේම, මාස 5ක් යනකල් ආරක්ෂක මණ්ඩලය රැස් වුණේ නැහැයි කියලා, ජනාධිපතිතුමා කැඳවන රැස්වීම්වලට අගමැතිතුමා ගියේ නැහැයි කියලා, "ඒවා අපි දන්නේ නැහැ"යි කියලා අගමැතිතුමාටවත්, ජනාධිපතිතුමාටවත්, රජයටවත් පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයේ චෝදනාවෙන් බැහැරව අත සෝදාගත නොහැකියි. කවුරු අත සෝදා ගත්තත්, මිය ගිය 300කට අධික ජීවිත ගැන, 500කට අධික ආබාධිත වූ අය ගැන, හානියට පත් වූ කෝටි, ප්‍රකෝටි ගණනක් වන ජාතික දේපළ ගැන බලන්නේ නැතුව අද ආණ්ඩුව ඇහැ කන් පියාගෙන ඉන්නවා.

පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය වුණේ කොහොමද කියලා සොයන්න විශේෂ කාරක සභා පත් කරන ආණ්ඩුව, ලෙඩ ඇඳේ සිටින මිනිසුන් ගැන සොයන්නේ බලන්නේ නැහැ. මැති ඇමතිවරු මාධ්‍ය ආයතනවල රූපවාහිනී කැමරා අටවාගෙන ගිහිල්ලා ඒ අයට චෙක්පත් දෙනවා. හැබැයි, ඒ මිනිස්සු මැති ඇමතිවරුන්ට ගහලා පන්නනවා. මෙන්න මේක තමයි රටේ ඇතිවෙලා තිබෙන තත්ත්වය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් කියයි, "අපි විශ්වාස භංග යෝජනාව පරද්දනවා" කියලා. වැරැදිකරුවන් කියලා ජනතාව හඳුනාගෙන තිබෙන උදවිය විශේෂ කමිටුවට ගෙනැල්ලා හෝදලා, පිරිසිදු කරලා සමාජයට දමන්න හැදුවත්, පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය දිහා බැලුවාම රටේ

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

ආරක්ෂාව තහවුරු කිරීම අතින් ආණ්ඩුව අසමත්. එම නිසා මෙවැනි අසමත් ආණ්ඩුවක් තව දුරටත් කුමන ආකාරයේ තර්ක විතර්ක ගෙනැල්ලා, කුමන ආකාරයේ උප්පරවැට්ටි යොදලා, පාර්ලිමේන්තුව තුළදී මෙම විශ්වාස භංග යෝජනාව පරාද කළත්, විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපේ උපරිම කැප කිරීම හා ධෛර්යය යොදවලා පාර්ලිමේන්තුවට ගෙන ආ මෙම විශ්වාස භංග යෝජනාවට සහයෝගය ප්‍රකාශ කරලා ආණ්ඩුව පැත්තට ඓතිහාසික තර්ජනයක් එල්ල කරන විශ්වාස භංග යෝජනාවක් බවට මෙම යෝජනාව පත් කරන බව අපි ඉතා පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ. තමුන්නාන්සේලා කුමන තර්ක විතර්ක ඉදිරිපත් කළත්, මේ වැඩ බැරි ආණ්ඩුව, අසමත් ආණ්ඩුව, ජනතාවගේ නාමයෙන් වහාම ඉල්ලා අස්වෙලා ජනතාවට බලය පැවරීම සඳහා මැතිවරණයක් කැඳවන්න කියන ඉල්ලීම කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ***නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා.12.44]

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරය සම්බන්ධයෙන් ආණ්ඩුවට විරුද්ධව විපක්ෂය විසින් ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාව විවාදයට ගැනෙන මේ මොහොත වන විට සභානායකතුමා සහ තවත් මන්ත්‍රීවරයෙක් හැර ආණ්ඩු පක්ෂයේ අනෙකුත් අය මේ සභාවේ පෙනෙන්නට නැහැ. කොහොම වුණත් අපි දන්නවා, මේ ආණ්ඩුව කෙරෙහි ජනතාවට විශ්වාසයක් නැහැ. ජනතාව තුළ මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් නැහැ.

2018 පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල දිහා බැලුවාම, බලයේ සිටින ආණ්ඩුවක් අවුරුදු තුනකට වඩා අඩු කාලයක් තුළ බරපතළ පරාජයකට පත් වුණා. ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කර ගන්නට බැරි වුණු නිසායි එසේ බරපතළ පරාජයකට පත් වුණේ. පෞද්ගලික නිදහසත්, ප්‍රජාතන්ත්‍රවාදයත් ස්ථාපිත කරනවාය කියලා බලයට ආපු ආණ්ඩුව, ජනතාවගේ පෞද්ගලික නිදහසවත්, ජීවත් වීමේ අයිතියවත් ලබා දුන්නාද? පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය පිළිබඳව ලංකාවේ බුද්ධි අංශ විතරක් නොවෙයි, ඉන්දියාවේ බුද්ධි අංශය වැනි විදේශීය බුද්ධි අංශත් තොරතුරු දන්වා තිබියදී එම ප්‍රහාරය වළක්වාගන්නට අසමත් වුණා. එම ප්‍රහාරය වළක්වා ගන්නට අසමත් වුණා විතරක් නොවෙයි, ඒ ප්‍රහාරය සඳහා වගකිව යුතු අය, සහරාන් ඇතුළු ඉස්ලාම් ත්‍රස්තවාදය පෝෂණය කරපු අය, ඔවුන් හදා වඩා ගත් අය මේ ආණ්ඩුව තුළත් ඉන්නවා. ආණ්ඩුව මේ පිළිබඳව අවධානය යොමු නොකළත්, මේ රටේ බුද්ධිමත් ජනතාව ඇඟිල්ල දිගු කළා, මෙන්න මේ අය තමයි සහරාන්ලා පෝෂණය කළේ, අන්තවාදීන් පෝෂණය කළේ, ඉස්ලාම් අන්තවාදීන් පෝෂණය කළේ කියලා. හැබැයි, ආණ්ඩුව අද ඒ අන්තවාදීන්, ඒ ත්‍රස්තවාදීන්, ත්‍රස්තවාදීන්ට උඩ ගෙඩි දුන් අය ආරක්ෂා කරන පිළිවෙතකට යනවා. අගමැතිතුමා කියනවා, මේ වෙනකොට සියලු අන්තවාදීන් අල්ලලා තිබෙන්නේ, ඒ නිසා භයක් සැකක් ඇති කර ගන්න අවශ්‍ය නැහැ කියලා. හැබැයි, එහෙම කියලා වැඩි කාලයක් යන්නට කලින් ගුවන් තොටුපළේදී අහු වුණා, පුහුණුව ලැබූ ත්‍රස්තවාදීන් මේ රටින් පැනලා යන්න හදනකොට. ඊට පසු දිනක අපි දැක්කා, මරාගෙන මැරෙන පුහුණු කඳවුරුවල පුහුණුව ලැබූ ත්‍රස්තවාදීන් අහු වෙන අන්දම. ඒ නිසා ඉස්ලාම් ත්‍රස්තවාදය අවසන් වුණාය කියන්න අපට අමාරුයි. ඒ ත්‍රස්තවාදය නිසා පුද්ගලයන් 250කට අධික පිරිසක් මිය ගියා විතරක් නොව, රටේ ජන ජීවිතය ද ත්‍රස්ත තත්ත්වයකට පත් වුණා. අගමැතිතුමාගේත්, යහ පාලන ආණ්ඩුවේත් ක්‍රියා කලාපය දිහා බැලුවාම අපට පෙනෙනවා, අගමැතිතුමාත්, යහ පාලන ආණ්ඩුවත් ක්‍රියා කර තිබෙන්නේ මේ රටේ ජනතාවගේ විශ්වාසය නැති වන විධියටයි කියන එක. මේ රටේ ආර්ථිකය, ස්වාධීනත්වය, ජාතික ආරක්ෂාව අනතුරට ලක් වන විධියට මේ ආණ්ඩුව කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගිවිසුම් ගැන කතා කරන කොට අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා කිව්වා, "විපක්ෂය ගිවිසුම් ගැන කතා කළත්, ඒ ගිවිසුම්වලින් කිසිම හානියක් වෙන්නේ නැහැ කියලා අගමැතිතුමා කිව්වා" කියලා. කවුද අගමැතිතුමා කියන දේවල් පිළිගන්නේ?

මහ බැංකු බැඳුම්කර වංචාව සිදුවූ වෙලාවේත් අගමැතිතුමා ඇවිල්ලා මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් කතා කරමින් අර්ජුන මහේන්ද්‍රන් නිදොස් කොට නිදහස් කළා. එතුමා කමිටුවක් පත් කරලා ඒ කමිටුවේ වාර්තාව පවා ප්‍රකාශයට පත් කළා. සිංගප්පූරු-ශ්‍රී ලංකා ගිවිසුම අද ක්‍රියාත්මක වෙනවා. ඒ ගිවිසුම්වලින් මොකක්ද වෙන්නේ? ඒවායෙන් රටට විශාල වෙළඳ අවාසියක් සිද්ධ වෙනවා. හැබැයි, ඒවා ගැන අගමැතිතුමා කථා කරන්නේත් නැහැ, මේ ආණ්ඩුවේ මැති ඇමතිවරු කතා කරන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දන්නවා, මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන්න කැමැති ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් ඉන්න බව. හැබැයි, අගමැතිතුමා එතුමන්ලාට හෘදය සාක්ෂියට අනුව ඒක කරන්න ඉඩ දෙන්නේ නැහැ. අගමැතිතුමා එතුමන්ලා භය කරලා, එතුමන්ලාට අනතුරු අඟවලා එතුමන්ලාගේ ඡන්ද ආණ්ඩුව ආරක්ෂා කර ගන්න කොහොම හරි ලබා ගන්නවා. එහෙම නොකර ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීන්ට -ඒ ජනතා නියෝජිතයන්ට- හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන්න ඉඩ දුන්නොත්, එතුමන්ලා මේ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙනවා. හැබැයි, අපි එක් දෙයක් කියනවා. මේ විශ්වාසභංග යෝජනාව පරාජය කරලා ආණ්ඩුව ජයග්‍රහණය ලැබුවත්, ජනතාව තුළ මේ ආණ්ඩුව ගැන අබමල් රේණුවක හෝ විශ්වාසයක් නැහැ. මේ රටේ ආර්ථිකයට ප්‍රහාර එල්ල කරපු, මේ රටේ සංස්කෘතියට ප්‍රහාර එල්ල කරපු, මේ රටේ සමාජ සාර ධර්මවලට ප්‍රහාර එල්ල කරපු, මේ රටේ ජාතික ආරක්ෂාවට ප්‍රහාර එල්ල කරපු, මේ රටේ ස්වාධීනත්වයට සහ මේ රටේ ජාතික

සම්පත්වලට බරපතළ ප්‍රහාර එල්ල කරපු මේ ආණ්ඩුවට ජනතාවගෙන් ගැලවීමක් නැහැයි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා එන්න මහ මැතිවරණයකට. මහ මැතිවරණයකට හෝ ජනාධිපතිවරණයකට හෝ ආවාම ආණ්ඩුවට තේරුම් යාවි, කරපු බරපතළ වැරැදිවල ස්වභාවය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව තමන්ගේ වැරැදි, තමන්ගේ අඩු පාඩු, මේ රටට කරන විනාශය පිළිගත්තේ නැති වුණාට වැඩි කල් යන්න කලින් මේ රටේ ජනතාව මෙතුමන්ලාට ඒවා අවබෝධ කරලා දේවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කතාව ඉවරද?

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ඔව්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. (Dr.) Bandula Gunawardane.

[අ.භා.12.50]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ රැගෙන ආ විශ්වාස භංග යෝජනාවට ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි පක්ෂව ඡන්දය ලබා දෙන බව පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. මක්නිසා ද යත්, 2015 වර්ෂයේ යහ පාලන රජය බලයට පත් වූ දිනයේ පටන් අද වන කල් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තියට විරුද්ධව කවර ආකාරයේ විශ්වාස භංග යෝජනාවක් කවුරුන් ගෙනාවත් ඒ විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් ඒකාබද්ධ විපක්ෂය ආණ්ඩුවට විරුද්ධ පැත්තේ -ජනතාවගේ පැත්තේ,- දිගටම සිටගත් දේශපාලන ව්‍යාපාරයක් වන නිසායි. එබැවින් ඒකාබද්ධ විපක්ෂය මේ අවස්ථාවේදීත් රජයට විරුද්ධව ඡන්දය පාවිච්චි කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පැවැති මහින්ද රාජපක්ෂ රජය පරාජය කළොත්, මහින්ද රාජපක්ෂ රජය වෙනස් කළොත් මේ රටේ ජනතාවට උඩින් පායන අව්වත්, වටින් හමනා සුළඟත් හැර වෙනත් කිසිම උවන්දිරමක් වැද්ද සිද්ධ වෙන්නට නොදී සංවර්ධනයේ අරුණාලෝකයේ පහන් සිළු දැල්වෙනවා කියලා එදා කිව්වා. සියලුදෙනා පාහේ එදා කිව්වේ, මහින්ද රාජපක්ෂ ගෙදර යැව්වාම රටේ නිෂ්පාදනය වැඩි වෙනවා, ආදායම වැඩි වෙනවා, දුප්පත්කම අඩු වෙනවා, ආයෝජකයන් වැඩි වශයෙන් එනවා කියලායි. මෙතුමන්ලා එදා කිව්වේ, රටේ සියලු ප්‍රශ්න විසඳිලා වඩා වේගයෙන් ඉදිරියට යන රටක් බවට මේ රට පත් කරනවා කියලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිළිඳු රට මැදි ආදායම් ලබන රටක් බවට පත් කරලා මේ රටේ සංවර්ධනය අතින් ස්වර්ණමය යුගය සනිටුහන් කරපු පාලනයක් පෙරළා දාලා තමයි යහ පාලන රජය බලයට පත් වුණේ. ඒ සඳහා විශාල කාර්ය භාරයක් ජනතා විමුක්ති පෙරමුණ ඉෂ්ට කළා. ඔවුන් ප්‍රකාශ කරපු දේ ජනතාව විශ්වාස කළා. මහින්ද රාජපක්ෂ රජය වෙනස් කළාට පස්සේ එක්සත් ජාතික පක්ෂයට වුවමනා විධියට ආණ්ඩුව ගෙනයන්න දෙන්නේ නැතිව ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් එතුමන්ලා පෙනී සිටිනවාය කියලා සහතිකයක් දුන්නා. නමුත් අද දෛවෝපගතව එතුමන්ලාට සිද්ධ වෙලා තිබෙනවා -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මෙතුමා එක දවසක් රවි කරුණානායක මහත්මයා ගැන කියලා බඩ කපා ගන්නවා කිව්වා. පසුව දා ඇවිත් සමාව ගත්තා. තව දවසක් මොකක්ද කියලා සමාව ගත්තා. දැන් මම එතුමාගෙන් නිශ්චිත වශයෙන් අහනවා, අපි මේ ආණ්ඩුව පිළිබඳ සහතිකයක් දුන්නේ කවදාද, කොතැනදීද කියලා. ඒ වාගේම 2015 අගෝස්තු මාසයේ පැවැති මහා මැතිවරණයේදී රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවක් හදන්න දිවුරා සපථ වූ කණ්ඩායමක් ගිහින් තමයි රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කැබිනට් මණ්ඩලයේ වාඩි වුණේ. ඒක විතරක් මතක තබා ගන්න. ඒ නිසා මේ ආණ්ඩුව හැදුවේ, කැබිනට් මණ්ඩලය හැදුවේ, බහුතරය-

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමන්ලා කරපු කාර්ය භාරය එතුමන්ලාට නැහැ කියන්න බැහැනේ. එතුමන්ලා රාජපක්ෂ වෛරයකින් තමයි එදා කටයුතු කළේ. එතුමන්ලා රජයක් හදන්න උදවු කළා පමණක් නොවෙයි, දින සියයේ විප්ලවය කිරීම සඳහා පැහැදිලිව විධායක සභාවක් ලෙස දායකත්වය සැපයුවා. ඒක නැහැ කියන්න බැහැ නේ. අපි කියන්නේ මේ රජය කෙරෙහි විශ්වාසය භංග වෙන්න ඕනෑ මේ අවස්ථාවේ නොවෙයි කියලායි. මේ රජය මීට පෙර විශාල ලෙස විශ්වාසය කඩ කළා. පෙබරවාරි 27වැනි දින වෙනකොට දවස් සියයේ විප්ලවය යටතේ මහ දවල් මහ බැංකුවේ මහා මුදල් කොල්ලය වුණාම සමස්ත මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය, ණය ක්‍රමය පිළිබඳ විශ්වසනීයභාවය සම්පූර්ණයෙන් පලුදු වුණා. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අපේ රට පිළිබඳව තිබුණු, මුදල් ක්‍රමය පිළිබඳව තිබුණු විශ්වාසය පලුදු වීමෙන් සිදුවූ ආවස්ථික අලාභය ගත්තොත්, රුපියල් බිලියන 2,000කට වැඩියි කියලා ආර්ථික විශේෂඥයෝ ප්‍රකාශ කළා. අවුරුදු 30ක බැඳුම්කරයෙන් සිදු වුණු ආවස්ථික අලාභය මතු පිටින් පෙනෙන අලාභය නොවෙයි. ඒ තරම් විශාල සොරකමක් වුණා නම්, ඒ ආණ්ඩුව පහුවැනි දාම ඉවත් විය යුතු විශ්වාස භංගයක් ඇති වෙනවා.

දෙවනුව, මේ රජය මේ රටේ එතෙක් පැවැති සංවර්ධන ව්‍යාපෘති සියල්ල අත් හිටෙව්වා. Port City ව්‍යාපෘතිය අත් හිටෙව්වා; නෙලුම් කුලුන අත් හිටෙව්වා; උමා ඔය ව්‍යාපෘතිය නතර කළා. පැවතුන දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණය අහෝසි කරලා, අවුරුදු එක හමාරක් ඒ ව්‍යාපෘති එහෙම පිටින් නතර කරපු අවස්ථාවේ රජය පිළිබඳව වූ විශ්වාසය

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

මුළුමනින්ම බිඳ වැටුණා. ඒ අවස්ථාවේදී මේ රටට එන්න බලාපොරොත්තුවෙන් සිටි ආයෝජකයන් හිටියා නම්, ඒ අය ආයෝජනය කිරීම නතර කළා. මොකද, මේ ආණ්ඩුව මොනවා කරනවාද දන්නේ නැති නිසා. අත්සන් කළ ගිවිසුම්වලට පටහැනිව ඒ සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණයෙන් නතර කරලා වැඩ බිමක් වශයෙන් තිබුණු රට මුඩු බිමක් බවට පත් කළාම, මේ ආණ්ඩුව පිළිබඳව තිබුණු විශ්වාසය නැති වුණා.

තුන්වනුව, මේ ගරු සභාව නොමඟ යැව්වා. අය වැය ලේඛනයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට රවි කරුණානායක අමාත්‍යවරයා රුපියල් බිලියන 125ක් වෙන් කළාය කියනකොට, ඒ රුපියල් බිලියන 125 තියා සත 25ක්වත් ඒ මුදලින් වියදම් කළේ නැහැ. අපි ඒ පිළිබඳව ඒකාබද්ධ විපක්ෂය වශයෙන් විශ්වාස භංග යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. පාර්ලිමේන්තුව ඒ විශ්වාස භංග යෝජනාව විවාදයට ගත්තේ නැහැ. මොකද, අය වැය සම්මත වෙලා අවසන් කියන පදනම යටතේ. ලංකාවේ කිසිම මුදල් අමාත්‍යවරයෙක් සත පහක්වත් වියදම් නොකර රුපියල් බිලියන 125ක් පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගත් අවස්ථාවක් අපේ රටේ ඉතිහාසයේ නැහැ. ඒ විධියට පාර්ලිමේන්තුව නොමඟ යවලා, පාර්ලිමේන්තුවේ ඇසට වැලි ගහලා විශ්වාසය කඩ කිරීම එදා රවි කරුණානායක මුදල් අමාත්‍යවරයා විසින් ඒ අය වැය ලේඛනය හරහා කළා.

සිංගප්පූරු ගිවිසුම අත්සන් කරනකොට, මේ රටේ විද්වතුන්, විවිධ ක්ෂේත්‍රවල සිටින දේශීය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සියලුදෙනා විරුද්ධ වුණා. එම විරෝධය සත පහකට ගණන් ගන්නේ නැතිව ජාත්‍යන්තර ගිවිසුමක් ලෙස සිංගප්පූරු ගිවිසුම අත්සන් කළා. මේ රටට බලපාන, රටේ ජනතාවගේ නිෂ්පාදනයට, ආදායමට, සේවා නියුක්තියට, මිල මට්ටමට බලපාන ගිවිසුම් මෙලෙසින් අත්සන් කළාම -අත්සන් කරන්නේ කෙසේද කියලා දන්නේ නැතිව අත්සන් කරපු- රජය කෙරෙහි වූ විශ්වසනීයභාවය සම්පූර්ණයෙන් නැති වුණා.

අපේ රටේ රණවිරුවෝ මේ රට කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් කියන සියලු ජනතාවට අභය දානය -ජීවත්වීමේ අයිතිය- ලබා දුන්නා. ජනාධිපතිවරයාගේ ඇස්වලට වැලි ගහලා ප්‍රදීප් කාරියවසම්ලා හරහා මංගල සමරවීර අමාත්‍යවරයා ජිනීවා මානව හිමිකම් කොමිසමට ගිහිල්ලා මේ රටේ රණවිරුවෝ පාවාදීලා, රණවිරුවන් එළව-එළවා දඬු කඳේ ගහනකොටත් මේ රජය ගැන තිබෙන විශ්වාසය සම්පූර්ණයෙන්ම පලුදු වුණා. ඇමෙරිකානු ගිවිසුම පිළිබඳව මා සතුව තිබෙන සියලු ලේඛන ප්‍රසිද්ධ ලේඛන බවට පරිවර්තනය විය යුතු නිසා **සභාගත*** කරනවා.

අපේ රටේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු බටහිර අධිරාජ්‍යවාදයට පාවාදීම සඳහා උත්සාහ දරනකොට, පාර්ලිමේන්තුවට දන්වන්නේ නැතිව, ජනාධිපති වරයාගේ විරෝධය තකන්නේ නැතිව, මහජනතාවගේ විරෝධය තකන්නේ නැතිව මෙවැනි ගිවිසුම් අත්සන් කිරීම ගැන අපි රජයට විරුද්ධ වෙනවා. අපි මේ රජය මීට කලින් ගෙදර යවන්න ඕනෑය කියන විශ්වාසය ඇතිව තමයි පාර්ලිමේන්තුව විසුරුවා හරින තත්ත්වයක් එදා නිර්මාණය කළේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම කියවන්න කැමතියි, 2018 නොවැම්බර් 10වැනි දා "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේ පළ වූ සිරස්තල කිහිපයක්.

ඒවා මෙසේයි:

"මැතිසබය විසුරුවයි. ඡන්දය ජනවාරි 5: නාම යෝජනා මෙම මස 19 සිට 26 දක්වා"

"අපි කළදේ හරිදැයි ජනතාවගෙන් අහන්න ඕනෑ
අගමැති මහින්ද කියයි"
"මැතිසබය විසිර වූ ගැසට්ටුව පෙන්වමින්"
"විසුරුවා හැරීම ව්‍යවස්ථාවට පටහැනියි
එක්සත් ජාතික පෙරමුණ කියයි"

පසුගිය ජනවාරි මාසයේ 5වෙනි දා මේ රටේ මහ මැතිවරණයක් පැවැත්වූවා නම්, නියත වශයෙන්ම මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ වර්තමාන විපක්ෂය බලයට පත් වෙලා ආණ්ඩුවක් හැදෙනවා. එහෙම වුණා නම්, මේ රජය මේ වනවිට පෙරළිලා, පාස්කු දින ප්‍රහාරය ඇති වන්නේත් නැහැ. එහෙම වුණා නම්, අපේ ආණ්ඩුවේ ආරක්ෂක මණ්ඩලය රැස් වූ වහාම මේ අන්තවාදී ප්‍රහාරය එල්ල කිරීමට සූදානම් කර තිබූ අයගේ නම්, ගම්, ලිපින සහ පුරවැසි හැඳුනුම්පත් අංක ආදී සියලු විස්තර බොහොම කෙටි කාලයක් තුළදී -මාර්තු මාසය වෙන්න ඉස්සෙල්ලා- අපට සොයා ගත හැකි වනවා. අපි ජනවාරි මාසයේදී බලය ගත්තා නම්, පෙබරවාරි හෝ මාර්තු වනකොට මේ ඉලක්කගත අන්තවාදී ත්‍රස්තවාදය කිසි සැකයක් නැතිව ඉවර කරන්න පුළුවන්කම තිබුණා. එදා ඒ වෙනස සිද්ධ වුණා නම්, මේ ප්‍රහාරය එල්ල වෙන්නේ නැතිව මනුෂ්‍ය ජීවිත 350ක්, 400ක් අපට බේරා ගන්න තිබුණා. නමුත්, පමා වෙලා හෝ ඒ වෙනස හෙට හෝ වෙනවා නම් හොඳයි. අපි හිතන විධියට මේ ආණ්ඩුව තව දවසක් හරි තිබීම රටට, රටේ ජනතාවට, ජනතාවගේ ජීවිතවලට, අනාගත පැවැත්මට හානිකරයි. ඒ තත්ත්වය තුළ ඕනෑම අවස්ථාවක මේ ආණ්ඩුව ගෙදර යැවීම සඳහා වන ඕනෑම උත්සාහයකදී -විශ්වාස භංග යෝජනාවකින් හෝ පාර්ලිමේන්තුවෙන් පිටතදී දරන උත්සාහයකදීත්- ඒකාබද්ධ විපක්ෂයේ අපි ජනතාවගේ පැත්තේ ඉන්නවාය කියන එක සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.1.00]

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ ආණ්ඩුවට විරුද්ධවයි. මේ යෝජනාව ජයග්‍රහණය කරන්න මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාටම එකතු වෙන්න කියලා මම පළමුවෙන්ම ආරාධනය කරනවා. දැන් ගතවෙන්නේ මේ ආණ්ඩුවේ අවසාන කාලයයි. අවුරුදු හතරහමාරක් මේ රට පාලනය කරපු යහ පාලන ආණ්ඩුව කියලා මුලින් මේ ආණ්ඩුව ගැන සඳහන් කළා. දැන් කියනවා, "එක්සත් ජාතික පක්ෂයේ තනි ආණ්ඩුවක් අපි හදනවා, ඒකෙන් ගොඩක් දේවල් කරනවා" කියලා. එහෙම කියලා තමයි මේ ආණ්ඩුව හැදුවේ. නමුත්, අද වනකොට රටේ ආරක්ෂාව සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. සංහිඳියාව ඇති කරනවා කිව්වාට, තිබුණු සංහිඳියාවත් අද වනකොට සම්පූර්ණයෙන්ම නැති කරලා තිබෙනවා.

අද මේ රටේ ආගම්වාදය ඉහ වහා ගොස් තිබෙනවා. අද ජාතිවාදය ඇවිස්සිලා තිබෙනවා. එවැනි වාතාවරණයක් තුළ දැන් මේ ආණ්ඩුවේ කාලය අවුරුදු හතරහමාරක් ගෙවිලා තිබෙනවා. තව මාස තුනකින් ජනාධිපතිවරණය එනවා. ජනාධිපතිවරණය

තමයි මේ රටේ තීරණාත්මක මැතිවරණය. රටේ රාජ්‍ය නායකයා තෝරන, පාලකයා තෝරන, විධායකය තෝරන එම මැතිවරණයට මාස තුනක් තිබියදී තමයි මේ විශ්වාස භංග යෝජනාව විවාදයට ගෙන තිබෙන්නේ. මේ වනකොටත් ආණ්ඩු පක්ෂයේ, විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා තෝරා ගන්න බැරිව බොහොම දඟලමින් සිටිනවා. අපේ අපේක්ෂකයා විධියට මේ වනකොට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නම් කරන්න අපි සියලුදෙනාම තීන්දු කර තිබෙනවා. ඒකාබද්ධ විපක්ෂය හැටියටත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියටත් අපි අනෙක් පක්ෂත් එක්කත් කථා කරගෙන යනවා. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළොත් වඩාත් හොඳයි. ජයග්‍රහණය නොකළාය කියලාත් අපට ප්‍රශ්නයක් නැහැ. අපි ඊළඟ ජනාධිපතිවරණයට සූදානම් වෙමින් ඉන්නේ. හැබැයි, මේක අද ජයග්‍රහණය කරන්න පුළුවන් වුණොත්,- [බාධා කිරීමක්] ගෝඨාභය රාජපක්ෂ මහත්මයා තමයි අපේ අපේක්ෂකයා. ඒක ස්ථිරයි. ඒකේ ගැටලුවක් නැහැ. මම වගකීමක් ඇතිවයි කියන්නේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා ඒක එහාට මෙහාට හරවන්න හැදුවාට අපි එක ස්ථාවරයක ඉන්නවා.

විශේෂයෙන්ම අද මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාගෙන් වැඩි පිරිසකගේ සහයෝගයෙන් අපට මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන්න පුළුවන් වුණොත්, හදිසියේ මහ මැතිවරණයකට යන්න අපට පුළුවන්. එතකොට අපේක්ෂකයන් තෝරා ගන්න බැරිව දඟලන අයටත් බොහොම පහසුයි කියලා හිතෙනවා. විශේෂයෙන් දෙමළ ජාතික සන්ධානයට මේ අවුරුදු හතරහමාර තුළ කිසිම දෙයක් මේ ආණ්ඩුවෙන් කර ගන්න බැරි වුණා. එදා අපි යුද්ධය අවසන් කරලා, ත්‍රස්තවාදය අවසන් කරලා, උතුරේ පාරවල් ටික හදලා, කැඩිලා ගස් වැවී තිබුණු කෝච්චි පාරවල් ටික හදලා, දිසාපති කාර්යාල හදලා, ඉස්පිරිතාල හදලා, පරිපාලනය සම්පූර්ණයෙන් ස්ථාපිත කළා. පළාත් සභා මැතිවරණය තියලා, පළාත් සභාව ස්ථාපිත කරලා, ඒවායේ ගොඩනැඟිලි හදලා, පළාත් සභා පාලනය උතුරට ලබා දෙන්න කටයුතු කළා. නමුත්, මේ ආණ්ඩුවෙන් කිසිම දෙයක් උතුරේ ජනතාවට කරලා නැහැ. ඒ නිසා ඉදිරියේ දී TNA එකට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙනවා. හේතුව තමයි ජනාධිපතිවරණයෙන් අපේ අපේක්ෂකයා ජයග්‍රහණය කළාට පස්සේ අපි එක්කෝ ආණ්ඩුව හදනවා. එහෙම නැත්නම් මහ මැතිවරණයකට යනවා. ඊට පස්සේ TNA එකට ජනතාවට මුහුණ දෙන්න හම්බ වෙන්නේ නැහැ. මේ ආණ්ඩුවට කඩේ ගිහිල්ලා අන්තිමට උතුරේ ජනතාවට මුහුණ දෙන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා TNA එකට අද හොඳ අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා. මේ අවස්ථාවේ මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය ලබා දීමෙන්, ඒ අය සිදු කරෙගෙන තිබෙන පව්වලින් යම් කිසි ප්‍රමාණයක් සෝදා ගන්න පුළුවන් වෙනවා කියලායි අපි විශ්වාස කරන්නේ.

ඒ වාගේම, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ රටේ ආරක්ෂාව නැතිකම සහ රටේ පාලනයේ තිබෙන දුර්වලකම නිසා විතරක් නොවෙයි. අද රටේ ජනතාවට කන්න බොන්න නැහැ. ජනතාව මන්ද පෝෂණයට ලක් වෙලා. ලක්ෂ 30ක් විතර මේ රටේ ඉන්නවා, එක වේල කන්න බැරිව. අපි ආණ්ඩුව භාර දෙන කොට මිනිස්සු තුන් වේල කෑවා. වී ගබඩාවල වී පුරවා තිබුණා. ආණ්ඩුවේ ඇමතිවරු මත්තල ගුවන් තොටුපොළේත් වී ගබඩා කළා, වී වැඩිකමට. එහෙම ස්වයංපෝෂිත වෙලා තිබුණු රට අද කාලකණ්ණි රටක් බවට පත් කරලා, විනාශ කරලා තිබෙනවා. අද මිනිසුන්ට කන්න නැතිව, පාරේ යන්න නිදහසක් නැතිව, අවිශ්වාසය, ජාතිවාදය, ආගම්වාදය පතුරවන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නොයෙක් ආකාරයට මේ රට විනාශ කරපු මේ ආණ්ඩුව එක පැයක්වත් තබා ගන්නේ නැතිව ගෙදර යවන්න පුළුවන් නම් ඒක තමයි යුතුකම.

මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225 දෙනාම පාර්ලිමේන්තුවට එවා තිබෙන්නේ ජනතාවයි. ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නයි අප එවා තිබෙන්නේ. එහෙම නැතිව තමා වෙනුවෙන් පෙනී සිටින්න, තමන්ගේ වාසියට ආණ්ඩුවට කඩේ යන්න, යම් යම් ඵලප්‍රයෝජන සඳහා නොවෙයි. ඒ නිසා මේ ආණ්ඩුව ගෙදර යවන්න තිබෙන හොඳම අවස්ථාව අද මේ විශ්වාස භංග යෝජනාවයි කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.1.06]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විසින් ගෙනෙන ලද විශ්වාස භංග යෝජනාව අද විවාදයට ගැනෙනවා. ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා, ජනතාවගේ යම් ගෞරවයක් ප්‍රසාදයක් තිබෙන ජනතා නායකයකු හැටියට තමයි මගේ දේශපාලන ජීවිතයේ දී එතුමා දකින්නේ. ගරු අනුර කුමාර දිසානායක මැතිතුමනි, ඔබතුමා ගෙනැවිත් තිබෙන මේ චෝදනා සියල්ල දෙස බැලුවාම, මේ චෝදනා, වැරදි සියල්ලම එල්ල විය යුත්තේ කොතැනටද කියන කාරණය දේශපාලන පක්ෂයක නායකයකු හැටියට ඔබතුමාත් දන්නවා ඇති. එතැනටයි මේක එන්න ඕනෑ. එම ත්‍රස්තවාදී ප්‍රහාරය සිදු වීම වළක්වා ගැනීම සඳහා වන ක්‍රියාදාමයේ දී සෘජු ලෙස එය වැළැක්වීමට මැදිහත් විය යුතු, එය වළක්වා ගත යුතු මේ රටේ ප්‍රධාන පුරවැසියාට එල්ල විය යුතු දෝෂාභියෝගය මේ පාර්ලිමේන්තුවට ගෙනාවා නම් නිසැකවම ඒ සඳහා චමින්ද විජේසිරිගේ සහයෝගය ලැබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Anura Dissanayake, what is your point of Order?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතැන තර්කයක් තිබෙනවා. ආරක්ෂක අමාත්‍යවරයා හැටියට ජනාධිපතිවරයා මෙයට සෘජුව වගකිව යුතුව තිබෙනවා. ඒක ඇත්ත. හැබැයි ජනාධිපතිවරයාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙන ඒමේදී, දෝෂාභියෝගයක් භාර දීම සඳහා අවම වශයෙන් මන්ත්‍රීවරු තුනෙන් එකක්, ඒ කියන්නේ මන්ත්‍රීවරු 75 දෙනෙක් අත්සන් කරන්නට ඕනෑ. එහෙත් අපේ පක්ෂයෙන් ඉන්නේ මන්ත්‍රීවරු 6දෙනායි. එම නිසා මෙයට වගකිව යුත්තේ ආරක්ෂක අමාත්‍යවරයාය කියලා ගරු මන්ත්‍රීතුමාට වැටහෙනවා නම්, ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු 75 දෙනෙක් අත්සන් කර භාර දුන්නා නම්, අපටත් එම දෝෂාභියෝගයට සහභාගී වෙන්න තිබුණා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඔබතුමන්ලා හය දෙනායි, මාත් එක්ක හතයි. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, තව මන්ත්‍රීවරු 68යි ඕනෑ. මේ උත්තරීතර සභාව තුළ සිටින හැමෝටම එම අවශ්‍යතාව තිබෙනවා. අද උදේ කථා කළා, දේශප්‍රේමියෙක්; ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. තවත් කළා, ආර්ථික විද්‍යාඥයකු වන ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. එතුමන්ලාටත් පුළුවන් එකතු වෙන්න. ඒකාබද්ධ විපක්ෂයේ එතුමන්ලා කියනවා, "දෝෂාභියෝගයක් ගෙනෙන්න, අපි සූදානම්" කියලා. එම නිසා සමාජයට, රටට අවශ්‍ය කරන දේ ගෙනෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ගෙන ආ යුතුයි කියන කාරණය තමයි පසු පෙළ මන්ත්‍රීවරයකු හැටියට මම කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද රටේ තිබෙන මේ ප්‍රශ්න ගත්තාම, රටේ නීතිය තුළිනුත් පහදා දී තිබෙනවා, වැරැද්ද කළේ කොතැනින්ද කියන එක. එතැනට දඬුවම් දීම සඳහා, මේ රටේ අනාගතය පැහැදිලිව නිර්මාණය කිරීම සඳහා නිර්භයව පෙනී සිටිය යුතුය යන කාරණය මට කියන්න වෙනවා. මේ ආණ්ඩුවේ ආරම්භයේ සිටම මේ ආණ්ඩුව රැකගෙන ඉදිරියට ගෙනෙන්න පුළුවන් පන්නරය, ශක්තිය අපි පසු පෙළ ඉඳගෙන ලබා දුන්නා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අදටත් අපේ ආණ්ඩුව රැක ගැනීමේ අවශ්‍යතාව අපට තිබෙනවා, රට නිවැරදි දිශානතියට අප ගෙන ගිය නිසා. අප ක්‍රියාත්මක කළ දේවල් නිසා තමයි මේ රට ආරක්ෂා වුණේ.

2015 ජනවාරි 08 වැනි දා අපි මේ ආණ්ඩුව හදලා යහපාලනය ගොඩනැඟුවා. ස්වාධීන කොමිෂන් සභා නිර්මාණය කළා; පොලිස් කොමිසම නිර්මාණය කළා. එම නිසා අද රට සුරක්ෂිත වෙලා තිබෙනවා. ඒකාබද්ධයේ කණ්ඩායම ලජ්ජා නැතිව පසුගිය ඔක්තෝබර් 26 වැනි දා මේ ආණ්ඩුව ගන්න, අගමැතිකම ගන්න අත්වැල් බැඳ ගත්තා. ඒ දින 52 ක් ගත කළ ආණ්ඩු කාලය තුළවත්, මේ සිදුවන්නට තිබුණු දේ පිළිබඳවවත් අනෙක් ත්‍රස්තවාදී කල්ලි පිළිබඳවත් සොයා බැලුවේ නැහැ. මේ ත්‍රස්තවාදීන්ට උදවු කළ අය බවට පැහැදිලිව පෙනී ගොස් තිබෙන්නේ කවුද? ඒ පසුගිය ආණ්ඩුව කාලයේ මුදල් ගෙවා පෝෂණය කළ උදවිය කියන කාරණය පැහැදිලියි.

ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ රටේ ආර්ථිකය ගැන කථා කළා. අද රුපියල අධිප්‍රමාණය වෙලා තිබෙනවා. මේ වෙනකොට රුපියල අධිප්‍රමාණය වෙලා සියයට තුනයි දශම හතරකින් ඉහළ ගිහින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. විදේශීය ආයෝජන අද වර්ධනය වෙලා. අද විදේශීය මුදල් ගත්තොත්, ස්ටර්ලිං පවුමේ අගය රුපියලට සාපේක්ෂව සියයට තුනයි දශම දෙකකින් ඉහළ ගිහින් තිබෙනවා. මේ ආණ්ඩුව මේ රට යම්කිසි තැනකට ගෙන ගියා. මේ ඇති කර තිබෙන දැවැන්ත වැඩ පිළිවෙළ තුළින් රටේ ආර්ථිකය ශක්තිමත් කරන කටයුතු කර තිබෙනවා. ත්‍රස්තවාදී ප්‍රහාරය - පාස්කු ප්‍රහාරය- නිසා ඇති වූ මේ කුමන්ත්‍රණයටත් මුහුණ දෙමින්, ඊයේ රාත්‍රී වෙනකොට ඉන්ධන මිල අඩු කරන්නටත් වැඩ පිළිවෙළක් අපි ඇති කර තිබෙනවා. අපේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා ප්‍රමුඛ කණ්ඩායම මේ දැවැන්ත අර්බුදවලට - ආණ්ඩුව ඇතුළේ තිබෙන අර්බුදයට, ආණ්ඩුවෙන් පිට තිබෙන අර්බුදයට, ලෝක ත්‍රස්තවාදයට - සාර්ථකව මුහුණ දීලා තිබෙනවා.

එම නිසා අපි මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරන්නට කටයුතු කරනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. විශ්වාසනීයව ගොඩනැඟෙන ආණ්ඩුවක්, ඊට එහා ගිය තවත් ශක්තිමත් ආණ්ඩුවක් 2020දී අපි ගොඩනඟනවාය කියන කාරණය සඳහන් කරමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[பி.ப. 1.12]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நன்றி! "ஊர் இரண்டுபட்டால் கூத்தாடிகளுக்குக் கொண்டாட்டம்" என்பார்கள். இங்கே ஆட்சி இரண்டுபட்டிருக்கின்றது. இதைக் கொண்டாடுகின்ற கூத்தாடிகள் யார்? என்று பார்க்க வேண்டும். இந்த ஆட்சிக்குள்ளேயே சிலருக்கும் இந்த ஆட்சியைக் கொண்டுவந்தவர்கள் எனக்கூறிக் கொள்கின்ற பலருக்கும் எதிர்த் தரப்பு அரசியலில் இருக்கின்ற சிலருக்கும் கோமாளி வேடங்கள் வெகுவாகப் பொருந்துகின்றதாகக் கூறுகின்ற மக்கள், இந்த நாடு அரசியல் கேலிக்கூத்துக்களுடன் போய்க்கொண்டிருப்பதையே பார்த்துக் கொண்டிருப்பதாகவும் கூறுகின்றனர். அடுத்த ஜனாதிபதி வேட்பாளர் தானே என்று கட்சிக்குக் கட்சி, ஆளுக்காள் தம்மைத் தாமே சிபாரிசு செய்துகொண்டிருக்கின்ற நிலையில், மக்களின் அனைத்துப் பிரச்சினைகளும் மறைக்கப்பட்டு, மறுக்கப்பட்டுத் தேவைக்கு உதவாத வெவ்வேறு தலைப்புகள் முன்னிறுத்தப்பட்டு, அவை தொடர்பில் விவாதித்துக் காலத்தை வீணடித்துக் கொண்டிருக்கின்ற ஒரு நிலைமை தொடர்ந்து கொண்டிருக்கின்றது.

அமெரிக்க செனட் சபையின் வெளிவிவகாரக் குழு உறுப்பினர்கள் யாழ்ப்பாணம், மயிலிட்டிப் பகுதிக்குச் சென்று ஆராய்கின்ற வரையில் அது குறித்துப் பாதுகாப்புத் தொடர்பில் பொறுப்புக் கூற வேண்டியவர்கள் அறிந்திருக்கவில்லை எனக் கூறப்படுகின்ற நிலையில், இந்த நாட்டில் தேசியப் பாதுகாப்பு உறுதிப்படுத்தப்பட்டுள்ளதாகவும் கூறப்படுகின்றது. இந்த நாட்டை எவருக்கும் தாரைவார்க்கப் போவதில்லை என்றும் கூறப்படுகின்றது. இத்தகைய நாட்டின் நடைமுறை நிலைமைகளைப் பார்க்கின்றபோது, கூத்தாடிகள் யார் என்பது தொடர்பில் புரிந்துகொள்ள முடியாத நிலையில் இந்த நாட்டு மக்கள் இல்லை என்றே நினைக்கின்றேன். கூத்தாடிகள் தங்கள் தங்களது நிகழ்ச்சிநிரலுக்கு ஏற்ற வகையில் பல்வேறு நாடகங்களை அரங்கேற்றிக் கொள்கின்ற ஒரு மேடையாக இந்த நாடு மாற்றப்பட்டுக் கொண்டிருக்கின்றது. எமது நாட்டு மக்கள் இலவசப் பார்வையாளர்களாக இவையனைத்தையும் பார்த்துக் கொண்டிருக்கின்ற நிலையில், எமது மக்களது உரிமைகள் மென்மேலும் உருவப்பட்டு வருவதுடன், அவர்களது அன்றாட வாழ்க்கை பெரும் சுமையாக்கப்பட்டு அவர்களிடமே திணிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. இந்த நாட்டில் தேசியப் பாதுகாப்புத் தொடக்கம் அனைத்துத் துறை சார்ந்தும் உரிய அவதானங்கள் தொடர்ந்து செலுத்தப்பட்டிருக்குமானால், கடந்த உயிர்த்த ஞாயிறு தினத் தாக்குதலை மட்டுமல்லாது, எமது மக்களுக்கெதிரான அனைத்து நேரடி மற்றும் மறைமுகத் தாக்குதல்களையும் நிச்சயமாகத் தவிர்த்திருக்க முடியும் எனக் கருதுகின்றேன்.

எமது மக்களுக்கான அரசியல் உரிமை தொடர்பிலான பிரச்சினைக்குரிய தீர்வு கிடைப்பதற்குப் புலிகள் இயக்கம் அழிகின்ற வரையில் பார்த்துக் கொண்டிருந்ததாகவும், புலிகள் இயக்கம் அழிந்தும் இன்னமும் பார்த்துக் கொண்டிருப்பதாகவும் இந்த அரசாங்கத்தைக் கொண்டுவந்ததாகக் கூறுகின்ற தமிழ்த் தரப்பினர் கூறுகின்றனர். இந்தத் தமிழ்த்

தரப்பினருக்கு இன்றிருக்கின்ற அரசியல் பலத்தை வைத்துக் கொண்டு, இவர்கள் தங்களது தனிப்பட்ட தேவைகளை மாத்திரம் கவனித்துக்கொண்டு, அரசாங்கத்தைப் பாதுகாக் கின்ற வேலையை மட்டுமே சரியாகச் செய்து கொண்டிருக்கின்றார்களே அன்றி, எமது மக்களது பிரச்சினைகளைத் தீர்ப்பதற்கு இதுவரையில் எவ்விதமான முயற்சிகளையும் அவர்கள் மேற்கொள்ளவில்லை என்பதை எமது மக்கள் அறிவார்கள்; இந்த அரசாங்கமும் நன்கு அறியும். எனவே, இந்தத் தமிழ்த் தரப்பினர் தங்களது சுயநலன்களை மாத்திரமே கருதுகின்றவர்கள் என்பதை இந்த அரசு அறிந்துகொண்டும், இவர்களைத் தடவிக் கொடுப்பதிலேயே காலத்தைக் கழித்து வருகின்றதே தவிர, எமது மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு நேர்மையான முன்னெடுப்புக் களைத் தானாகவேனும் மேற்கொள்ளவில்லை என்ற கருத்து எமது மக்களிடத்தில் இருக்கின்றது என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இந்தத் தமிழ்த் தரப்பினர் அண்மையில் மகாநாடு நடத்திக்கொண்டிருந்த நிலையில், எமது மக்கள் - குறிப்பாகத் தாய்மார் அந்த மகாநாட்டு நுழைவாயிலில் இருந்து இட்ட சாபங்கள் இந்தத் தமிழ்த் தரப்பு அரசியல்வாதிகளின் அரசியற் செயற்பாடுகளுக்கு எமது மக்கள் கொடுத்த சான்றிதழ் என்றே கருத வேண்டியிருக்கின்றது. இத்தகைய சான்றிதழ்கள் நிறையவே எமது மக்களிடம் இருக்கின்றன. காலப்போக்கில், குறிப்பாக தேர்தல்களின்போது அவை இவர்களுக்குக் கிட்டும் என்றே எமது மக்கள் கூறிக் கொண்டிருக்கின்றார்கள்.

எமது மக்களின் வாக்குகளைப் பொய் கூறிப் பறித்த இவர்களால், எமது மக்களுக்கு வயிற்றெரிச்சலைத் தவிர, இதுவரையில் வேறெதனையும் கொடுக்க முடியாதிருக்கின்றது எனில், எதற்காக இவர்கள் இந்த அரசை இன்னமும் தாங்கிப் பிடித்துக்கொண்டிருக்க வேண்டும்? என எமது மக்கள் கேட்கிறார்கள். எமது மக்கள் தங்களது அடிப்படை உரிமைகளுக்காக வருடக் கணக்கில், இன்னமும் வீதிகளில் இறங்கி, அஹிம்சைப் போராட்டங்களில் ஈடுபட்டுக் கொண்டிருக்கின்றார்கள். எமது மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு மட்டுமன்றி, எமது மக்களுக்கு ஓர் ஆறுதல் வார்த்தையைக்கூடக் கூறுவதற்கு வக்கினை இல்லாத இவர்கள், இந்த அரசாங்கத்தைக் கொண்டு வந்தவர்கள் தாங்களே எனக் கூறிக்கொள்வதில் இன்னமும் கூச்சப் படுவதாகத் தெரியவில்லை என்றே எமது மக்கள் கருதுகின்றனர். எனவே, இந்த அரசு தொடர்பில் எமது மக்கள் மத்தியில் ஆரம்பத்திலிருந்த நம்பிக்கையானது இன்று படிப்படியாகக் குறைந்துவிட்டுள்ளது. இந்த அரசைக் கொண்டுவந்ததாகக் கூறும் தமிழ்த் தரப்பினரும், அவர்களது ஆதரவுக்காக அவர்கள் சொல்வதைக் கேட்டு, எமது மக்களது பிரச்சினைகளைத் தீர்க்காதிருக்கின்ற அரசு தரப்புமே இதற்குக் காரணமாக விளங்குகின்றன என்பதே எமது மக்களது கருத்தாக இருக்கின்றது. தாங்கள் சொல்வதைக் கேட்டுதான் இந்த அரசாங்கம் அனைத்தையும் செய்யுமென இந்தத் தமிழ்த் தரப்பின் தலைமைகள் அன்றே கூறின. ஆக, இவர்கள் சொல்லித்தான் இந்த அரசு எமது மக்களுக்கு எதையுமே செய்யாதிருக்கின்றது என்றுதானே எமது மக்களும் நம்புவார்கள்.

தமது சொந்தக் காணி, நிலங்களைக் கேட்டு எமது மக்கள் இன்னமும் நடுத்தெருவில் நிற்கிறார்கள். தமிழ் அரசியல் கைதிகளின் விடுதலையைக் கோரி அவர்களது உறவுகள் இன்னமும் கண்ணீருடன் காத்திருக்கின்றார்கள். காணமற் போன உறவுகளைக் கண்டறிவதற்காக அவர்களது உறவுகள் இன்னமும் நடுத்தெருவில் காத்துக் கிடக்கின்றனர். கடற்றொழி லாளர்கள் சுதந்திரமாகத் தங்களது தொழிற்துறை களில் ஈடுபடுவதற்கான வாய்ப்புகள் தடுக்கப்பட்டு வருகின்றன. நியாயமான விலையோ, ஒழுங்கான சந்தைவாய்ப்புகளோ இன்றி எமது விவசாய மக்கள் தங்களது உற்பத்திகளுடன் போராடிக் கொண்டிருக்கின்றார்கள். ஒரு கையால் கொடுத்து மறு கையால் பறிப்பதுபோல், விடுவிக்கப்பட்டதாகக் கூறப்படுகின்ற எமது மக்களின் காணி, நிலங்கள் வெவ்வேறு பெயர்களால் மீளவும் பறிக்கப்பட்டு வருகின்றன. வேலைவாய்ப்புகள் இன்றி ஆயிரக்கணக்கான எமது பிள்ளைகள் காத்துக்கிடக்கின்றனர். கைத்தொழிற்றுறை முன்னேற்றங்கள் அறவே இல்லாத நிலையில், எமது மக்கள் தொழில்வாய்ப்புகளுக்காக அலைந்து திரிகின்றனர். படுகடன்கள் அதிகரித்து, தற்கொலையை நாடும் அளவிற்கு எமது சமூகம் தள்ளப்பட்டு வருகின்றது. இவையெல்லாம் இன்று எமது மக்களின் உணர்வுபூர்வமான பிரச்சினை களாகவும் அடிப்படைப் பிரச்சினைகளாகவும் அடிப்படியே தேங்கி நிற்கின்றன.

கடந்த ஜனாதிபதித் தேர்தல் காலகட்டங்களிலும் அதன் பின்னராகக் கடந்த பொதுத் தேர்தல் காலகட்டங்களிலும் எமது மக்களின் மேற்படி பிரச்சினைகள் தீர்க்கப்படுமென வாக்குறுதிகள் வழங்கப்பட்டன. இன்று இருக்கின்ற அரசாங்கத்தாலும், இந்த அரசாங்கத்தைக் கொண்டு வந்ததாக் கூறிக்கொள்கின்ற தரகுத் தமிழ் அரசியல் தரப்பாலும் அந்த வாக்குறுதிகள் எமது மக்களுக்கு வழங்கப்பட்டன. தங்களது நியாயமான கோரிக்கைகளைக் கேட்டு, அவற்றை நிறைவேற்றித் தருவார்கள் என நம்பித் தேர்தலில் வாக்களித்திருந்த எமது மக்களின் கைகளில் நான்கு வருடங்கள் சென்ற நிலையில், வெறும் கடன் அட்டைகளே கொடுக்கப்பட்டுள்ளன. அதற்குக்கூட ஒருவரிடமிருந்து 500 ரூபாய் வீதம் வசூலித்துக் கொண்டிருக்கின்றீர்கள். வெறும் அறிக்கை அரசியல் செய்துகொண்டிருக்கின்ற தமிழ்த் தரப்புபோல், இங்கே வெறும் அறிக்கை அரசாங்கமே நடந்து கொண்டிருப்பதுபோல்தான் எமது மக்கள் காண்கின்றனர். ஒரு வண்டி, இரண்டு சாரதிகள்! இரண்டு பேருமே தான், தான் செல்வதுதான் சரி என்றால், இறுதியில் அதில் பயணிப்போரின் நிலைதான் இன்று இந்த நாட்டு மக்களுக்கு ஏற்பட்டுள்ளது. மக்கள் திக்குத் தெரியாத காட்டில் தத்தளித்துக் கொண்டிருக்கிறார்கள். தங்களது துயரங்களை யாரிடம் போய்ச் சொல்வதென்றே தெரியாத நிலையில் இருக்கிறார்கள்.

அரசியல் கட்சிகள் பிரிந்திருக்கலாம், ஆளுங்கட்சியும் எதிர்க்கட்சியும் பிரிந்திருக்கலாம். ஆனால், அரசாங்கமே பிரிந்து நின்றால், எப்படி இந்த நாடு முன்னேறப்போகின்றது? என்பது தொடர்பில் சிந்தித்துப் பார்க்கவேண்டும். இந்த ஸ்திரமற்ற நிலையிலான அரசாங்கத்தைத் தொடர்ந்து முன்னெடுப்பதானது, இந்த நாட்டு மக்களுக்குச் சாத்தியமான வழிவகைகளை ஏற்படுத்திக்கொடுக்க இயலாமல்போகின்றது என்பதற்கு இன்று பல்வேறு விடயங்கள் உதாரணங்களாக முன்வைக்கப்படுகின்றன.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

மாண்புமிகு உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

எனக்கு கொடுக்கப்பட்டது 12 நிமிடங்கள். என்னுடைய நேரத்தில் 8 நிமிடங்கள் முடிந்து இப்பொழுது 9 வது நிமிடம் ஆரம்பித்திருக்கின்றது.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
இல்லை! உங்களுக்கு இன்னும் ஒரு நிமிடம்தான் இருக்கின்றது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
இந்த நம்பிக்கையில்லாப் பிரேரணைக்கு ஆதரவாக வாக்களிப்பதா? அல்லது எதிராக வாக்களிப்பதா? என்ற வாதப்பிரதிவாதங்களுக்கு அப்பால், தமிழ் பேசும் மக்களுக்கு இந்த அரசின்மீதும், இந்த அரசினைக் கொண்டுவந்ததாகக் கூறும் தமிழ்த் தரப்பினர்மீதும் இருக்கும் நம்பிக்கையீனங்கள் குறித்தே இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன், எமது மக்கள் சந்தித்துவரும் பலத்த ஏமாற்றங்களுக்கு யார் காரணம் என்பது குறித்தே நான் பேச விரும்புகின்றேன். "தமக்கு வாக்களித்தால் தமிழர் வாழ்வு விடியும்" என்று தமிழ் மக்களுக்கு வாக்குறுதிகளை அள்ளி வழங்கினார்கள்! வேதாளம் குடிபுகுந்த வீடுகூட விடியும்! ஆனாலும் அங்கு வெளிச்சம் வராது! இந்த உண்மையைக்கூட உணர மறுத்து, தரகு அரசியல் தமிழ்க் கட்சித் தலைமைகளின் தகிடு தத்தங்களும், மலையைப் புரட்டி, மா கடலையும் தாண்டி, சொர்க்கவாசலுக்குத் தமிழர்களை அழைத்துச் செல்வோம் என்ற அடையமுடியாத ஆசைகளுக்கும், வாக்களித்து ஆணை வழங்கிய தவறை இன்று தமிழ் பேசும் மக்கள் உணரத்தொடங்கிவிட்டார்கள். இது தமிழ்பேசும் மக்களின் வாக்குப்பலத்தில் நிலைத்திருக்கும் அரசு! அந்த வாக்குப்பலத்தை அரசுக்குப் பெற்றுக்கொடுத்தவர்கள் யார்? அவ்வாறு தமிழர்களின் ஆதரவைப் பெற்றவர்களும், இந்த ஆட்சியைத் தொடர்ந்தும் தக்கவைத்து வருபவர்களும் இந்த அரசிடமிருந்து தமிழ்பேசும் மக்களுக்கு எதைப் பெற்றுக்கொடுத்திருக்கிறார்கள்? இந்த அரசு ஆட்சியேறிய போது, அதற்கு ஆதரவளித்த தரகு அரசியல் தமிழ் கட்சிகள் தமது அரசியல் பலத்தை வைத்துப் பேரம்பேசி பெற்றதுதான் என்ன? ஆட்சிக்கவிழ்ப்பு நடந்தபோதுகூட ஓடிச்சென்று இந்த அரசைக் காப்பாற்றித் தாம் இன்றும் ஒட்டுண்ணிகளே என்பதை நிரூபித்திருக்கின்றார்கள். அந்த வாய்ப்பைப் பயன்படுத்தித் தாம் வாக்குறுதியளித்த தமிழ் மக்களுக்கு நிரந்தர அரசியல் தீர்வைப் பெற்றுக்கொடுத்தார்களா?

இந்தத் தமிழ்த் தரகு அரசியல் கட்சிகளை 'மன்னிப்போம் மறப்போம்' என்று தமிழ் மக்கள் சிலவேளை எண்ணியிருந்தாலும், இன்று வந்திருக்கும் நம்பிக்கையில்லாப் பிரேரணை விடயத்திலாவது பேரம்பேசி, தமக்கு வாக்களித்த தமிழ்பேசும் மக்களின் அபிலாஷைகளுக்காக எதையாவது இவர்கள் பெறுவார்களா? என்பதையே தமிழ்பேசும் மக்கள் எதிர்பார்க்கிறார்கள். தமது கட்சி மாநாட்டில் தமிழ் மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு மூன்று மாதகால அவகாசம் கொடுத்திருக்கிறார் தமிழ்த் தரகு அரசியல் கட்சியொன்றின் தலைவர் ஒருவர். அடுத்த சில நாட்களில் வரப்போவது அரசின்மீதான நம்பிக்கையில்லா பிரேரணை என்பதைத் தெரிந்து கொண்டும் அவர் அரசிற்கு மூன்றுமாத அவகாசம் கொடுத்தது அரசின்மீதான நம்பிக்கையில்லாப் பிரேரணையை எந்தவித அரசியல் பேரமுமின்றி ஆதரிப்பதற்கான அத்திவாரமா? அல்லது இன்னும் சில மாதங்களில் அடுத்த தேர்தல் வரப்போவதைத் தெரிந்து போராட்டம் வெடிக்கும் என்ற அவரது வெடிப்புளுகின் வான வேடிக்கையா?

நாம் ஓரளவு அரசியல் பலத்தோடு இருந்தபோது, எமது அரசியல் அழுத்தத்தாலும் நல்லிணக்க சமிக்ஞையாலும் உருவாக்கப்பட்ட சந்திரிகா அரசு கால அரசியல் தீர்வுத் திட்டத்தை இந்த நாடாளுமன்றத்தில் எதிர்த்து எரித்தவர்களில் இந்தத் தரகு அரசியல் தமிழ்க் கட்சித் தலைவர்களும் உள்ளடங்குகின்றனர். அந்த வரலாற்றுத் தவறுக்கு -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய உரையை முடித்துக்கொள்ளவேண்டும்.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, என்னுடைய மிகுதி உரையைச் சபைக்குச் *சமர்ப் பிக்கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, நன்றி. அடுத்ததாக, மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் அவர்கள்! உங்களுக்கு 5 நிமிடங்கள் இருக்கின்றன.

[பி.ப. 1.25]

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நன்றி! இன்றைய தினம் ஜனதா விமுக்திப் பெரமுனவினால் கொண்டுவரப்பட்டிருக்கின்ற அரசுக்கெதிரான நம்பிக்கை யில்லாப் பிரேரணை தொடர்பிலே பேசச் சந்தர்ப்பம் தந்தமைக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். கௌரவ அநுர திஸாநாயக்க அவர்கள் நான் மிகவும் விரும்புகின்ற ஒரு நல்ல தலைவன். அந்தத் தலைவன் இன்று இந்த அரசாங்கத்திற்கு எதிராக ஒரு நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவந்திருக்கின்றார். ஆனால், கடந்த காலத்திலே அவர் பேசுகின்றபொழுது, முஸ்லிம் அரசியல் தலைவர்கள் வியாபாரத்தை மாத்திரம்தான் செய்து கொண்டார்கள்; அரசியலை வைத்து வியாபாரம்தான் செய்தார்கள் என்றும் முஸ்லிம் தலைவர்கள் இந்தத் தாக்குதலுக்குப் பொறுப்புக்கூறவேண்டும் என்றும் இந்தச் சபையிலே கூறியதை இந்த இடத்திலே நான் ஞாபகப்படுத்த வேண்டும். அவரிடத்திலே நான் ஒன்றைக் கேட்க விரும்புகின்றேன். ஒரு பொறுப்புவாய்ந்த கட்சி என்கின்ற ரீதியிலே ஒவ்வொரு தடவையும் இந்தப் பாராளுமன்றத்திலே கேள்விகளைக் கேட்டுக் குவிக்கின்ற ஜனதா விமுக்திப் பெரமுன கட்சியானது, கடந்த ஏப்பிரல் மாதம் 21ஆம் திகதி இடம்பெற்ற தாக்குதல் சம்பந்தமாக அவர்களுக்குக் கிடைத்த தகவல்கள் குறித்து, இந்தப் பாராளுமன்றத்திலே ஒரு நாளும் கேள்வி கேட்டது கிடையாது. அதனை மிகுந்த கவலையளிக்கின்ற விடயமாக நாங்கள் பார்க்கின்றோம். வியாபாரம் செய்வதற்காக நாங்கள் முயற்சி செய்ததாகக் கூறிய விடயத்தை நான் இந்த இடத்திலே வன்மையாகக் கண்டிக்கின்றேன்; அதை மறுக்கின்றேன். தேசியப் பட்டியலுக்காக நீங்கள் முன்மொழிந்த இப்ராஹீமும் ஒரு

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

வியாபாரி ஆவார். அதுவல்ல, நிகழ்ச்சி நிரல்! இப்படியொரு விடயம் நடந்திருக்கின்றது; இது தொடர்பாக ஆராயவேண்டும் என்கின்ற விடயத்திலே உங்கள் எல்லோருடைய ஒத்துழைப்பையும் வேண்டி நிற்கின்றோம். இது முஸ்லிம் சமூகத்திற்கு எதிராக வீசப்பட்டிருக்கின்ற கல் என்ற காரணத்தினால் ஒரு நியாயபூர்வமான விசாரணையின் மூலம் இதற்குத் தெளிவுபெற வேண்டுமென்று இந்த இடத்திலே வேண்டுகொள் விடுக்கின்றேன்.

තවද, මගේ වරප්‍රසාද පිළිබඳව ප්‍රශ්නයක් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. පසුගිය ජූලි 9වැනි දා "මව්බිම" පත්තරේ මා ගැන වැරැදි ප්‍රවෘත්තියක් පළවී තිබුණා. - [බාධා කිරීමක්] - කියන්නම්, මම කියන්නම්. "සිංහල බෞද්ධ ඡන්දවලින් ජනාධිපතිවරයෙක් පත් කරන සිහිනය බිඳ දැමිය යුතුයි." කියා මම කිව්වා කියලා මේ පත්තරේ සඳහන් වෙලා තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා එහෙම කිව්වේ නැද්ද?

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
මම එහෙම කිව්වේ නැහැ. ඒ වාගේම ඒක පදනම් කරගෙන 10වැනි දා "දිවයින" පත්තරේ කතුවැකියක පළවී තිබුණා, "අමීර් අලිගේ ගොන් කථා" කියලා. කතුවැකිය ලියපු කෙනාටයි මම කියන්න ඕනෑ ඒක ගොන් කථා කියලා. ඒ ගොල්ලන් තමයි ගොන් කථා පළ කළේ. පසුගිය මාස 3 ඇතුළතදී සහරාන්ගේ ප්‍රශ්න ආවාට පස්සේ මේ හැම පත්තරේකම ඒ වාගේ කථා තමයි පළවී තිබුණේ. Dr. Shafi සිසේරියන් සැත්කම් 8,000ක් කළා කිව්වා. ආයෙත් එකපාරටම ඒක 4,000ට අඩු කළා. ඊට පස්සේ ඒක 340කට අඩු කළා. රිසාඩ් බදියුදීන් ත්‍රස්තවාදියෙක් කිව්වා. මේ සියලු කථා පත්තර විකුණා ගන්න කරපු උපාය මාර්ග කියලා මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ලියන එක වැරැදි නැහැ. නමුත් news එක සම්පූර්ණයෙන්ම අහලා ලිව්වා නම් වටිනවා කියලා මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
Thank you.

මේ ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන්ම විකෘති කරපු එකක් කියලා මම ඉතා වගකීමකින් කියන්න කැමැතියි. මම කිව්වේ, ජනාධිපතිවරණයට තරග වදින එක්කෙනා රටේ තිබෙන සියලු ජන කොටස් ඒකරාශී කරගෙන යන්න පුළුවන් කෙනෙක් වෙන්න ඕනෑ කියලායි. එහෙම නැත්නම්, එයාට ඉදිරි ගමනක් යන්න බැහැ; බිඳ වැටෙනවා. රටේ කවුරු හරි කෙනෙක් ජනාධිපතිවරණයට තරග වදිනවා නම්, සියලු ජන කොටස් ඒකරාශී කරගෙන යන්න පුළුවන් කෙනෙකුට තමයි මේ රටේ හොඳ නායකත්වයක් දරන්න පුළුවන් කියලායි මම ප්‍රකාශ කළේ. சரிதானே! கැමැතිதானே!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
மாண்புமிகு உறுப்பினர் அவர்களே, உங்களது உரையை நிறைவுசெய்ய வேண்டும்.

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මම මුලින් කථා කරපුවාත්, අන්තිමට කථා කරපුවාත් ඔක්කෝම cut and chop කරලා එක කෑල්ලක් විතරක් අරගෙන අවස්ථාවාදී විධියට ජාතිවාදය අවුස්සන විධියට ලියන්න එපා කියලා, මම "මව්බිම" පත්තරෙන් සහ "දිවයින" පත්තරෙන් ඉල්ලීමක් කරනවා. මේ ගැන සොයා බලා මේ ගැන නිවැරැදි ප්‍රවෘත්තියක් පළ කරන්න ඔබතුමන්ලාට යුතුකමක් තිබෙනවා. එසේ කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. ඒක මගේ වරප්‍රසාදයක් හැටියට මම මේ සභාව දැනුවත් කරනවා.

இந்த நாட்டிலே சஹ்ரானுடைய பிரச்சினைக்குப் பின்னர் பத்திரிகைகளில் இனவாதத்தைத்தான் எழுதினார்கள். றிஸாட் பதியுதீன் ஒரு பயங்கரவாதியென்று சொன்னார்கள். இந்தப் பாராளுமன்றத்திலே அவருக்கெதிராக நம்பிக்கையில்லாத் தீர்மானத்தைக் கொண்டுவந்தார்கள்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
நன்றி!

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
ஒரு நிமிடம் தாருங்கள்!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
இல்லை; ஏற்கெனவே ஒரு நிமிடம் தரப்பட்டுவிட்டது.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் றிஸாட் பதியுதீன் அவர்களுடைய நேரத்தைத்தான் நீங்கள் எடுக்கின்றீர்கள்!

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
பாராளுமன்றத் தெரிகுழுவை நியமித்து, அதனூடாக விடுதலை பெற்றுக்கொண்ட பிற்பாடும், இந்தப் பிரச்சினையைத் தொடர்ந்தேர்ச்சியாகக் கொண்டுபோக வேண்டுமென்ற காரணத்தினால் இன்று ஒரு சிலருக்கு அரிப்பு ஏற்பட்டிருக்கின்றது. ஆனால், பாராளுமன்றத் தெரிகுழுவின் செயற்பாடுகள் தொடர்ந்தேர்ச்சியாக நடக்க வேண்டும்; உண்மை கண்டறியப்பட வேண்டும். இதற்கு எல்லாக் கட்சிகளும் ஒத்துழைப்பு வழங்க வேண்டுமென்று கேட்டு, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

[අ.භා.1.31]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ ඇත්ත වශයෙන්ම සද්භාවයෙන් නම්, මම හිතනවා, මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන එක මහ කජ්ජක් නොවෙයි කියලා. හැබැයි, අපට තිබෙන ගැටලුව මේ ගැන අනෙකුත් පක්ෂ සමඟ සාකච්ඡා කළාද කියන එකයි. මේ පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂයට නොවෙයි විපක්ෂයටයි බහුතරයක් තිබෙන්නේ. ආණ්ඩුවට බහුතරයක් නැහැ. බහුතරයක් තිබෙන විපක්ෂය සමඟ මේ යෝජනාව ගැන සාකච්ඡා කළාද කියන ප්‍රශ්නය අපි එතුමන්ලාට යොමු කරනවා. එහෙම නැත්නම් මේ යෝජනාව ගෙන ඒම පසුගිය දවස්වල ඇති වුණු බෝම්බ සිද්ධියෙන් පීඩාවට පත් වුණු, අසරණ වුණු, අන්ත අසරණ වුණු ජනතාවට කරන විශාල කෙනෙහිලිකමක් කියන එක අපි යෝජනා කරනවා. දාන්නම් වාලේ, ආවාට ගියාට යෝජනාවක් ගෙනැල්ලා ආයෙත් ආණ්ඩුවේ ප්‍රතිරූපය ගොඩ නඟා ගන්නට, මේ විශ්වාස භංග යෝජනාවෙන් පස්සේ ආණ්ඩුවේ ප්‍රතිරූපය තව තවත් වැඩි වර්ධනය කරන්නට දෙන සහයෝගයක්ද මේකෙන් දෙන්නේ කියන සැකය, චකිතය අපට තිබෙනවා. කෙසේ වෙතත් අපි මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය පාවිච්චි කරනවා.

මේ විශ්වාස භංග යෝජනාවෙන් අනිවාර්යයෙන්ම මේ ආණ්ඩුව ගෙදර යවන්නට පුළුවන් නම් ඒ ගැන සතුටුවෙන එකම පිරිස ඒකාබද්ධ විපක්ෂය විතරයි. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාටත් වඩා අපි සතුටු වෙනවා. ඒකට හේතුව වෙන දෙයක් නොවෙයි. අපි එදා කිව්වා, මේ ආණ්ඩුව බලයට ආපු දා ඉඳන් ජනතාවගේ විශ්වාසය නැති කළ බව. ඒ විශ්වාසය කොච්චර දුරට නැති වුණාද? මහ බැංකුව කොල්ල කාපු දවසේ ඉඳන් අපි ඒ වෙනුවෙන් පාර්ලිමේන්තුවේ කථා කළා. එදා මහ බැංකුවෙන් පටන් ගත්ත මේ ආණ්ඩුව ඒ කටයුතු නැවැත්වූවේ නැහැ. දිගින් දිගටම, දිගින් දිගටම රාජ්‍ය දේපොළ විකුණන්නට, කොමිස් ගහන්නට, ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන්නට, හොරකම් කරන්නට, හොර ගිවිසුම් ගහන්නට කටයුතු කළා. මේ සියල්ල කරලා අන්තිමට රටට ඉතුරුවෙලා තිබුණු ජාතික ආරක්ෂාවත් මේ ආණ්ඩුව නැති කළා. ජාතික ආරක්ෂාව නැති කළා! ජාතික ආරක්ෂාව නැතිවීමත් සමඟ තමයි අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට මේ ආණ්ඩුව ඇතිවෙලා තිබෙන්නේ, මේ ආණ්ඩුව පන්නන්න ඕනෑ කියලා හිතිලා තිබෙන්නේ. එතුමන්ලා කළුතර ඉඳලා පයින් ආවා. ඇත්තටම ඒක හොඳයි. අපි නුවර ඉඳන් පයින් එද්දී අපට චෝදනා කළාට, එතුමන්ලාත් ඒ අභියෝගය භාර ගත්තා.

එදා, ඔක්තෝබර් මාසයේ අපි මේ ආණ්ඩුව එළවන්නට කටයුතු කරද්දී අපට ප්‍රජාතන්ත්‍ර විරෝධියෝ කියලා කිව්වා. හැබැයි, 2015 ජනාධිපතිවරණයෙන් පසුව අගමැතිවරයා පස්සා දොරෙන් ඇවිල්ලා දිවුරුම් දීපු දවසේ එතුමන්ලා ඒ ක්‍රියාව ප්‍රජාතන්ත්‍ර විරෝධියි කිව්වේ නැහැ. අපි අහන්නේ, 1988දී ප්‍රජාතන්ත්‍රවාදීවද, තමුන්නාන්සේලා ආණ්ඩු බලය අල්ලන්නට උත්සාහ කළේ කියලායි. ප්‍රජාතන්ත්‍රවාදය දෙන්න ඕනෑ. හැබැයි, ඊට වඩා ජනතාවට ආරක්ෂාව ලබා දෙන්නට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මන්ත්‍රීවරුන් වගකීමක් ඇතිව කටයුතු කරන්නට ඕනෑ.

දැන් අපි ඊයේ මොකක්ද දැක්කේ? මේ ආණ්ඩුව ගැන විශ්වාසය තියන්නට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඊයේ මේ පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඊයේ මේ විවාදය පැයකට කලින් අවසන් කළා. ආණ්ඩු පක්ෂයේ කථිකයන් කථික ලැයිස්තුවට නම් ඇතුළත් කරලා, කථා කරන්න ආවේ නැහැ. ඒ තරමටම ආණ්ඩුව පැත්තේ සිටින අයටත් මේ ආණ්ඩුව ගැන විශ්වාසයක් නැහැ. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන්න අවශ්‍ය නම්, , අනුර දිසානායක මන්ත්‍රීතුමායි, සුමන්තිරන් මන්ත්‍රීතුමායි කථා කළා නම්, "මේක ගොඩ" කියලා. ඒ ගැන අපි වැඩිය කථා කරන්න ඕනෑ නැහැ. අනුර දිසානායක මන්ත්‍රීතුමායි, සුමන්තිරන් මන්ත්‍රීතුමායි එකතු වුණා නම්, මේ ආණ්ඩුව අද හවස 6.30 -7.00 වෙද්දී ගෙදර යන්න ඕනෑ; මේ අගමැතිවරයා බඩු-මුට්ටු pack කරගෙන ගෙදර යන්න ඕනෑ. එදා අරලියගහ මන්දිරය බදාගෙන හිටියා වාගේ අද ඉන්න බැහැ. හැබැයි, ඒක කරන්න පුළුවන් අනුර දිසානායක මන්ත්‍රීතුමාටයි, සුමන්තිරන් මන්ත්‍රීතුමාටයි මිසක්, මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාට නොවෙයි. මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා අද මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙනවා. ඒ වාගේම සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරලා තිබෙනවා, කරුණාකර ආණ්ඩුව එළවන්න ඡන්දය දීමට පැමිණෙන්න කියලා. හැබැයි, ඔබතුමන්ලා මේ යෝජනාව ගෙනාවේ "හාමු" පරිස්සම් කරන්න නම්, එම බෝම්බ ප්‍රහාරයෙන් මිය ගිය කටුවාපිටිය ජනතාවටවත්, මඩකලපුවේ ජනතාවටවත්, අද වෙනකම් දැඩි සත්කාර ඒකකවල සිටින කිසි කෙනෙකුටවත් සාධාරණයක් වෙන්නේ නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, ජනතා විමුක්ති පෙරමුණ මේ ගෙනා විශ්වාස භංග යෝජනාව වෙනුවෙන් ඒ විධියට පෙනී සිටින්න ඕනෑය කියලා.

අපි එදා රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. අපි එතුමාට යම්කිසි ගරුත්වයක් දෙනවා, මේ ව්‍යසනයෙන් පස්සේ තවම ඇමතිකම ගත්තේ නැති එකට. නමුත් හෙට ගනියිද අපි දන්නේ නැහැ. එතුමා කටයුතු කරන්න ඕනෑ පත්කර තිබෙන අර එක එක කමිටුවලට ඕනෑ විධියට නොවෙයි. ඒවා නාඩගම් මඩු වෙලා ඉවරයි. ඒ කමිටුවේත් මේ විශ්වාස භංග යෝජනාව ගෙනා පක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ කමිටුවේ සිටින අයටත් විශ්වාසයක් නැති නිසා තමයි, ආණ්ඩුවට විරුද්ධව මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මේ විශ්වාස භංගයෙන් හෝ මේ ආණ්ඩුව ගෙදර යවන්න පුළුවන් නම්, එහි මූලික අදියරට අපි-තමුන්නාන්සේලා එක්ක එකතු වෙනවාය කියලා.

හැබැයි, මේක මේ ආණ්ඩුවට විරුද්ධව ආපු පළමුවැනි විශ්වාස භංග යෝජනාව නොවෙයි, මේ ඇමතිවරුන්ට විරුද්ධව ආපු පළමුවැනි විශ්වාස භංග යෝජනාව නොවෙයි. ඉතිහාසය ගත්තාම, වැඩිම විශ්වාස භංග යෝජනා ආපු ආණ්ඩුව මේ ආණ්ඩුවයි. ඒ නිසා මේකෙන්වත් මේ ආණ්ඩුව කුජීත වෙලා, රටට යහපත් ආණ්ඩුවක් පත් කරගැනීමේ හැකියාව රටේ ජනතාවට ලැබෙනවා නම්, මම හිතන විධියට ඒක තමයි රටේ ආරක්ෂාව වෙනුවෙන් කරන්න පුළුවන් වටිනාම කටයුත්ත කියමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

[අ.භා.1.37]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම හිතන විධියට අපට තවත් එක අවස්ථාවක් ලබා දීලා තිබෙනවා, මේ ආණ්ඩුවේ ශක්තිමත්භාවය උරගා බැලීමට. ඒ අවස්ථාව තමයි අද හවසට යෙදී තිබෙන්නේ. නැවතත් අපේ ආණ්ඩුවේ ශක්තිමත්භාවය තහවුරු කරන්නට අවශ්‍ය සහයෝගය ලබාදීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආ! Deal එකක් නේද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාටත් පුළුවන්, පොඩි පොඩි අවපැහැ ගැන්වීම් වෙලා තිබෙන අපේ ආණ්ඩුවේ මලකඩ ටික කඩා, පොල්කුඩු ටිකක්, ගඩොල් කුඩු ටිකක්, මොනවා හෝ පවුඩර් ටිකක්, පොල් මුඩු ටිකක් අරගෙන ඇවිල්ලා අද හවසට අපේ ආණ්ඩුව පොඩ්ඩක් පොලිෂ් කරන්න. ඒ සඳහා තමුන්නාන්සේලා සියලුදෙනාටම එන්න පුළුවන්. මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, අපේ ආණ්ඩුවට හෙට උදේ ඉඳලා නව ජවයක්, නව පෙනුමක් ලබා දෙන්නට තමුන්නාන්සේලා සියලුදෙනා කටයුතු කිරීම පිළිබඳව.

හැබැයි, ඉතින් මෙතැන එක දෙයක් තිබෙනවා. මේක ඉතින් කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වාගේයි. බෝම්බ පුපුරලා අපේ අහිංසක ජනතාව මැරුණා. ඒ මරණවලට වගකිව යුතු අය කියලා දැන් එක එක අවස්ථාවට එක එක අය අල්ලනවා. වෙලාවකට කියනවා, පොලිස්පතිවරයා කියලා. වෙලාවකට කියනවා, ආරක්ෂක ලේකම්වරයා කියලා. වෙලාවකට කියනවා, අග්‍රාමාත්‍යතුමා කියලා. වෙලාවකට කියනවා, මේ ආණ්ඩුව කියලා. හැබැයි, මේකට හේතුව ජනාධිපති කියලා කියන්න හයයි. නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කිව්වා, -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා නව ජවයකින් යන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්කද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔව්, අනිවාර්යයෙන්ම.

එතුමා ජනාධිපතිවරයාට ඇඟිල්ල දිගු කරන්න හයයි. අපි දැක්කා, ජනතා විමුක්ති පෙරමුණේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් කියනවා, අවශ්‍ය - [බාධා කිරීමක්] ඔව්, හිරේ දමයි කියලා හයයි. තමන්ට තිබෙන ප්‍රශ්න ටිකෙන් බේරෙන්න බැරි වෙයි, හිරේ දමයි කියලා හයයි. අපි කියනවා, පුළුවන් නම් ජනාධිපතිතුමාටත් දෝෂාභියෝගයක් ගෙනෙන්න, ඒකට අපිත් අත් දෙකම ඔසවා ඡන්දය දෙනවා කියලා. හැබැයි, ඉතින් ගැරඬි මරා පව් -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සාමාන්‍යයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවනවා ඇති නේ?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඔව්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජනාධිපතිවරයෙකුට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙන ඒම සඳහා අවම වශයෙන් මන්ත්‍රීවරු කී දෙනෙකු අත්සන් කරන්න ඕනෑද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
තමුන්නාන්සේලාට ඉන්නේ හය හත්දෙනායි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මන්ත්‍රීවරු කී දෙනෙකු අත්සන් කරන්න ඕනෑද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
හරි. අපි සූදානම්, අත්සන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක නොවෙයි, ඔබතුමාගෙන් මම සරල ප්‍රශ්නයක් අහන්නේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
අපි සූදානම්, තමුන්නාන්සේලා ගෙනාවොත් -[බාධා කිරීමක්] අපි කිව්වේ ගේන්න කියලා. [බාධා කිරීමක්] මම තමුන්නාන්සේගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න නොවෙයි ඉන්නේ. තමුන්නාන්සේ දෝෂාභියෝගයක් ගේනවා නම්, ඒකට අත්සන් කරන්න අපි සූදානම්.

ගරු සුජීව සේනසිංහ මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Non Cabinet Minister of Science, Technology and Research)
තමුන්නාන්සේලායෝජනාවක් ගේන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
තමුන්නාන්සේලා එහෙම යෝජනාවක් ගේන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවට අලුතින් මන්ත්‍රීවරයෙකු පත්වනකොටත්, අලුතින් පාර්ලිමේන්තුවට එනකොටත් ප්‍රධාන පොත් දෙකක් දෙනවා. එකක්, වරප්‍රසාද පිළිබඳ නීතිය හා සම්බන්ධ පොතක්. අනික් එක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දෙන්නේ ඒකත් එක්ක- [බාධා කිරීම්] මම එක් දෙයක් අහනවා. [බාධා කිරීම්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

පාර්ලිමේන්තුවට ආපු පළමුවෙනි දවසේත් තමුන්නාන්සේ අපි නිකම් පොල් කුඩු ගණනට දමලා කථා කළා. මතක තබා ගන්න. ඉස්සෙල්ලා තමුන්නාන්සේගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කපාගෙන ඉන්න. අපි අලුත් තමයි. අපි අලුතින් තමයි ආවේ. තමුන්නාන්සේ බක පණ්ඩිතයෙක් වාගේ අපේ ආධුනිකකම හැල්ලු කරන්න හදන්න එපා. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න මට කිසිම අවශ්‍යතාවක් නැහැ. මම කියන්නේ පඳුරුවලට විදින්නේ නැතිව කරුණාකරලා-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ mike දෙකම on වෙලා තියෙද්දි කොහොමද කථා කරන්නේ? එතුමාගේ mike එක off කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ඔබතුමා ඉක්මනට කියන්න කෝ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මන්ත්‍රීතුමනි, ඔබතුමා කලබල වන්න එපා. මම කියන්න හදන්නේ ඔබතුමා අලුත් කියන එක නොවෙයි. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

That is not a point of Order.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අපි මේ පාර්ලිමේන්තුවට ආ දවස්වලත් තමුන්නාන්සේ අප හැල්ලු කරලා තමයි කථා කළේ. මම තමුන්නාන්සේ ගණන් ගන්නේ නැහැ.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Sir, I rise to a point of Order. Can I have the mike?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Sujeewa Senasinghe, what is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මතු කරන කාරණය වෙනත් දෙයක්. තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කිව්වේ දෝෂාභියෝගය ගෙනෙන නීති ක්‍රමය ගැන නොවෙයි. ඕනෑ නම් දෝෂාභියෝගයක් ගේන්න පුළුවන්, ඇයි ගෙනාවේ නැත්තේ කියලායි එතුමා ඇහුවේ. එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන හොඳට දන්නවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

අනුර දිසානායක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාට කථා කරන්න විනාඩි 30ක්, 40ක් දුන්නාට අපට කථා කරන්න තිබෙන්නේ විනාඩි 5යි, 6යි. එම නිසා තමුන්නාන්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන, පාර්ලිමේන්තු ක්‍රමවේද ගැන කථා කරන්න කාලය නාස්ති කරන්න එපා. අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේ ශත 50කටවත් ගණන් ගන්නේ නැහැ. අපි පාර්ලිමේන්තුවට ආපු මුල්ම දවස්වලත් ඔබතුමා අපට බොහොම හැල්ලු කරලා කථා කළා. තමුන්නාන්සේ හිතාගෙන ඇති, තමුන්නාන්සේ "පොරක්" කියලා. මම තමුන්නාන්සේ ශත 5කට ගණන් ගන්නේ නැහැ. මම කියනවා, හාවෝ ඉන්දෙද්දි පඳුරුවලට විදින්න එපා කියලා. මේ සිද්ධියේ සැබෑ වග කිවයුත්තා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියන එක මම කියනවා. හැබැයි, සැබෑ වග කිවයුත්තා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නම්, ඇත්ත වශයෙන්ම ඒකට අපිත් වග කිවයුතුයි. මොකද එතුමාට ඡන්දය දෙන්න කියලා අපිත් කිව්වානේ. මේ යෝජනාව ගෙනෙන ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමන්ලාත් මේ සිද්ධියට වග කිවයුතුයි. මේ සිද්ධියට වග කිවයුත්තා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වාගේ වගකීම් පැහැර හරින කෙනකු පත් කරන්න අනුර කුමාර දිසානායකලාත් රට පුරා ගියා; වේදිකා ගණනේ කෑ ගැහුවා; තමුන්නාන්සේලාගේ සුරතින් මනාපයක් ප්‍රකාශ කළා. ඒක නිසා මෙතැනදී අප බිත්තියට හේත්තු කරන්න හදන්න එපා. මේකට වගඋත්තරකරු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නම්, ඒ වෙනුවෙන් අපි වගකීම භාරගතයුතු නම්, ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලාත් ඒ වගකීම භාරගතයුතු බව මතක තබාගන්න. ඒ නිසා තමුන්ගේ ඇඟේ කුණු තබාගෙන අනුන්ගේ ඇඟට කුණු දමන්න හදන්න එපා කියන එකත් මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියනවා. ඒක ඉතාම අසාධාරණයි. පසුගිය දිනක කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ

මහෙස්ත්‍රාත්තුමිය කරපු ප්‍රකාශය අපි දැක්කා. ඒ මහෙස්ත්‍රාත්තුමිය හිටපු පොලිස්පතිතුමාට, ආරක්ෂක ලේකම්වරයාට ඇප දෙනකොට කිව්වා, "ආරක්ෂක ලේකම්වරයා බැඳී ඉන්නේ රටේ ආරක්ෂක ඇමතිට. එතකොට ආරක්ෂක ලේකම්වරයාට කලින් ආරක්ෂක ඇමති මේ වගකීම භාර ගත යුතුයි" කියලා. එහෙම තමයි එතුමිය ප්‍රකාශ කළේ. එම නිසා අපි කියනවා, කරුණාකරලා කැකිල්ලේ තීන්දු අරගෙන, ආරක්ෂාව අතේ නැති අප, ආරක්ෂාව භාර නැති අප, ආරක්ෂක කවුන්සිලයට කැඳවන්නේ නැති අප බිත්තියකට හේත්තු කරන්න හදන්න එපා කියලා. මේ දේවල්වලට සැබෑ වග කිවයුත්තන් සොයා ගෙන සැබෑ වග කිවයුත්තන්ට අවශ්‍ය දඬුවම් දෙන්න. නිකම් පඳුරුවලට විදින්න එපා. හාවෝ ඉන්නේ පඳුරු අස්සේ. හරිම හාවා බලාගෙන හරිම හාවාට විදින්න කියන එකත් මම මේ අවස්ථාවේදී කියනවා.

[අ.භා.1.44]

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කරපු විශ්වාස භංග යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. විශේෂයෙන් පාස්කු ප්‍රහාරය අල්ලා තමයි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ මාසයේ 21වැනි දා වෙන කොට මාස තුනක් ගත වෙනවා, ඒ ත්‍රස්තවාදී පාස්කු ප්‍රහාරය එල්ල වෙලා. එයින් අපේ ජනතාව, විශේෂයෙන් කතෝලික ජනතාව 250කට වඩා වැඩි පිරිසක් මරණයට පත් වුණා; 500කට වැඩි පිරිසක් තුවාල ලැබුවා. එදා ඉඳලා අද දක්වා මේ ප්‍රහාරය පිළිබඳව මේ සමාජය තුළ කථා වෙන ඒවා ඇහුවාම අපට ඉතාම පැහැදිලිව පෙනෙන්න තිබුණු දේ තමයි, මේ ප්‍රහාරය එල්ල වෙන්න ඉස්සෙල්ලා, මේ ප්‍රහාරය සැලසුම් කළ සහරාන් ඇතුළු පිරිස ගැන මේ ආණ්ඩුවට තොරතුරු ලැබිලා ඒ පිළිබඳව කටයුතු නොකිරීම නිසා තමයි මේ ප්‍රහාරය එල්ල වුණේ කියන කාරණය. ඒ නිසා තමයි කුඩා දරුවන් ඇතුළු අහිංසක ජනතාව විශාල ප්‍රමාණයක් මරු මුවට පත් වුණේ.

ගරු තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා ජනාධිපතිතුමාට විතරක් මේ චෝදනාව ඉදිරිපත් කරන්න ගියා. මම කියනවා, මේ ප්‍රහාරයට ආණ්ඩුවේ සියලුදෙනාම වග කියන්න ඕනෑ කියලා. මේක තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. තමුන්නාන්සේලා ගෙනාපු ජනාධිපතිතුමා ගැන තමුන්නාන්සේලාම තමයි බලා ගන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලා තමයි හංසයාට කතිරය ගහලා එතුමා ගෙනාවේ. අද ඒක අපේ පිටට දාන්න හදන්න එපා. ඒක තමුන්නාන්සේලා භාරගන්න. මේ සිද්ධියට වග කීම තිබෙන්නේ ආණ්ඩුවටද, ජනාධිපතිතුමාටද කියන එක හොයන්න වෙන්නේත් තමුන්නාන්සේලාටමයි, අපට නොවෙයි. අපට කරන්න පුළුවන් කෙංගෙඩියක් නැහැ. කතෝලික ජනතාව 300කට වඩා මැරිලා, අද ඒ වින්දිතයෝ, වූදිතයෝ වෙන තත්ත්වයට පත් වෙලායි තිබෙන්නේ. තමුන්ගේ හෘදය සාක්ෂියට අනුව කටයුතු කරලා බලන්න. 2016දී විජේදාස රාජපක්ෂ මහත්තයා ඒ ත්‍රස්තවාදීන්ගේ සම්බන්ධතා ගැන කියද්දී තමුන්නාන්සේලාගේ මැති - ඇමතිවරු වෙනත් කාරණා කිව්වා. ඊළඟට 2018 දිගන - මාවනැල්ල සිද්ධියේදී මේ ගැන එළිවුණා. 2018දී වනාතවිල්ලුව සිද්ධිය සිදු වුණා. මේ සිද්ධි එකක්වත් ගැන හරියට පරීක්ෂණ නොකර, පරීක්ෂණ කරගෙන යද්දී මඟ නවත්වපු නිසා තමයි මේ ප්‍රහාරයට කතෝලික ජනතාවට මුහුණපාන්න සිදු වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම විදේශ බුද්ධි සේවාව 4වැනි මාසයේ 04වැනි දා, හතර වැනි මාසයේ 08වැනි දා, හතර වැනි මාසයේ 10වැනි දා, හතරවැනි මාසයේ 19වැනි දා, හතරවැනි මාසයේ 20වැනි දා, හතර වැනි මාසයේ 21වැනි දා සැරින් සැරේ මේ ආණ්ඩුවට කිව්වා, සහරාන් ඇතුළු පිරිසගෙන් ප්‍රහාරයක් එල්ල වෙන්න යනවා කියලා. හැබැයි, ආණ්ඩුව ගත්තු ක්‍රියාමාර්ගයක් නැහැ. විශේෂයෙන් දේවස්ථානවලට මේ ප්‍රහාර එල්ල වෙනවා කියලා කිව්වා. විශේෂයෙන් කතෝලික ජනතාවට මේ ප්‍රහාර එල්ල වෙනවා කියලා කිව්වා. හැබැයි, මේ ආණ්ඩුව, කතෝලික ජනතාවට මැරෙන්න ඉඩ දීලා බලාගෙන හිටපු ආණ්ඩුවක් කියන එක තමුන්නාන්සේලා පිළිගන්න ඕනෑ. [බාධා කිරීමක්] ආණ්ඩුවට තමයි කිව්වේ. ආණ්ඩුව තමයි වග කියන්න ඕනෑ. මේවා කරන්නේ කවුද, ජනාධිපතිද, ආණ්ඩුවද කියන එක අපි දන්නේ නැහැ. තමුන්නාන්සේලාට ජනාධිපතිතුමා එක්ක ආණ්ඩුව කරන්න බැරි නම් පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා පාර්ලිමේන්තු මැතිවරණයකට යන්න. අපි ලැහැස්තියි. [බාධා කිරීමක්] අපට ඕනෑම මැතිවරණයක් ඔට්ටුයි, තමුන්නාන්සේලා එක්ක. තමුන්නාන්සේලා තමයි භයේ හැංගිලා ඉන්නේ. අපි පැහැදිලිව ඔක්තෝබර් 26වැනි දා, මැතිවරණයකට යන්න සූදානමින් හිටියා. තමුන්නාන්සේලා තමයි උසාවි ගිහිල්ලා ඒක නැවැත්වුයේ. අපි පැහැදිලිව කියනවා, කතෝලික ජනතාවගේ මරණවලට තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ කියලා. ඒ ප්‍රහාර වළක්වා ගන්න කටයුතු නොකිරීම පිළිබඳව තමුන්නාන්සේලා ඒ වග කීම ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විසින් මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම සතුටු වෙනවා. මොකද, එතුමන්ලා තමයි යහපාලන ආණ්ඩුව ගෙනෙන්න 2015දී විශාලම කාර්යභාරය කළේ. හැබැයි, දෛවයේ සරදමකින් කොහොම හරි එතුමන්ලාටම මේ ආණ්ඩුව ගෙදර යවන්න, මේ ආණ්ඩුව පරද්දන්න කටයුතු කරන්න අද සිද්ධ වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව ගෙදර යැවිය යුතුයි කියා කල් ගිහිල්ලා හරි එතුමන්ලා පිළිගැනීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම 2015 දින 100 ආණ්ඩුව කාලය තුළ අපි දැක්කා, ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට උදව් කළ බව. ඒ දින 100 ආණ්ඩුව තුළ මේ රටේ වෙච්ච දැවැන්තම හොරකම -මහ බැංකුවේ මහ දවල් කොල්ලය- සිදු කරන්න එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට අවස්ථාව ලබා දුන්නා. එදා ව්‍යවස්ථානුකූල නොවන විධියට කළ ඒ පත් කිරීමට විරුද්ධ වුණා නම් ඒ මහ බැංකු කොල්ලය සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා අපි කවුරුත් පිළිගන්න ඕනෑ, මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන් විනාශ වුණේ ඒ දින 100 ආණ්ඩුව කාලය තුළදීය කියන එක. ඊට පස්සේ අපි දැක්කා, 2015 අගෝස්තු මැතිවරණයෙන් පස්සේ පළාත් සභා මැතිවරණය කල් දමන්න විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණ උදව් කළ බව. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කිව්වා, පළාත් සභා මැතිවරණය කල් දමන්න බැහැ කියලා. මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍ය තමයි සර්වජන ඡන්ද බලය. ඒ ඡන්ද බලය ජනතාවට ලබා නොදී කල් දමන්න ජනතා විමුක්ති පෙරමුණ උදව් කළා. ඒ පිළිබඳව එතුමන්ලා අද කනගාටු වනවා ඇතැයි කියා මම හිතනවා.

2018.10.26 වැනි දින අගමැතිතුමා වෙනස් කරලා ජනාධිපතිතුමා නව අගමැතිතුමෙක් පත් කළාම ජනතා විමුක්ති පෙරමුණ කිව්වා, "කුමන්ත්‍රණකාරී වැඩවලට අපි එකඟ වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඒකට විරුද්ධයි" කියලා. විජිත හේරත් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුව තුළ කටයුතු කරපු ආකාරය අපි දැක්කා. මේ ආණ්ඩුව වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ උසාවි ගානේ බඩගෑවා; පාරවල් ගානේ ඇවිද්දා. හැබැයි, අද එතුමන්ලා තේරුම් ගෙන තිබෙනවා එදා ඒ විධියට ගෙනාපු ආණ්ඩුව නිසා තමයි පාස්කු ප්‍රහාරය එල්ල වුණේ කියන එක. ඒක පිළිගැනීම පිළිබඳව අපි ජනතා විමුක්ති පෙරමුණට ස්තුති වන්ත වෙනවා. මොකද, කතෝලික ජනතාව මරණයට පත් වුණේ මේ ආණ්ඩුවේ නොසැලකිලිමත්භාවය නිසායි. ඒක වුණේ එක්සත් ජාතික

[ගරු නිමල් ලාන්සා මහතා]

පක්ෂයේ නොසැලකිලිමත්භාවය නිසාය කියන කාරණය අපි පිළිගන්න ඕනෑ. ඒ නිසා අපි පැහැදිලිවම මේ ආණ්ඩුවට, විශේෂයෙන්ම මේ සඳහා පංගුකාරයන් වෙලා තිබෙන ඒ සියලු දෙනාට අපේ අකැමැත්ත ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කතෝලික මන්ත්‍රීවරුන්ට තමන්ගේ හෘදය සාක්ෂිය පිළිබඳව තීන්දු ගන්න අද ඉතාම හොඳ දවසක්. අද කතෝලික ජනතාව වෙනුවෙන් එල්ල වෙච්ච ප්‍රහාරයක් පිළිබඳව අද ආණ්ඩුවට විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. කතෝලික මන්ත්‍රීවරු අද තීන්දු කරන්න ඕනෑ තමන්ගේ පක්ෂය බේරා ගන්න හදනවාද, තමන්ගේ ආණ්ඩුව බේරා ගන්න හදනවාද, එහෙම නැත්නම් කතෝලික ජනතාවට සාධාරණයක් ඉටු කරන්න කටයුතු කරනවාද කියන කාරණය. මේ වෙලාවේ කතෝලික මන්ත්‍රීවරු මේ සභාවේ නැති වුණත්, හෘදය සාක්ෂියට අනුව තමන්ගේ ජනතාව වෙනුවෙන් පෙනී සිටිමින් කටයුතු කරන්න අද එතුමන්ලාට සිදු වෙයි කියලා මම හිතනවා.

ඒ වාගේම, TNA මන්ත්‍රීවරු ගැනත් කියන්නට ඕනෑ. මඩකලපුවේ සියොන් දේවස්ථානයේදී එතුමන්ලාගේ ජනතාවයි මැරුණේ. ඒ නිසා TNA මන්ත්‍රීවරුන්ටත් වෙනදා වාගේ අද ඇවිල්ලා ආණ්ඩුවට සහයෝගය දක්වන්න පුළුවන්කමක් නැහැ. තමන්ගේ ජනතාව වෙනුවෙන් අද පෙනී සිටින්න එතුමන්ලාට සිදු වෙනවා. විශේෂයෙන්ම කුඩා දරුවන් වැඩිම පිරිසක් මැරුණේ මඩකලපුවේ සියොන් දේවස්ථානය තුළ. කුඩා දරුවෝ පාස්කු මංගල්‍යයට එන්නේ ලස්සන ඇඳුම් ඇඳගෙන; අලුත් ඇඳුම් ඇඳගෙන. ඒ ළමයින්ගේ ලේවලින් මුළු දේවස්ථානයම තෙත් වුණා. වැඩිම ළමයින් පිරිසක් මැරුණේ සියොන් දේවස්ථානය තුළ. ඒ නිසා TNA එකේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යුතුකමක් සහ වග කීමක් තිබෙනවා, මේ අවස්ථාවේ දී මෙම විශ්වාස භංග යෝජනාවට සහාය පළකරන්න. එහෙම සහාය පළකරන්නේ නැතුව එතුමන්ලා සහයෝගය දෙන ආණ්ඩුව රැකගන්න, එතුමන්ලා සහයෝගය දෙන UNP ආණ්ඩුව රැකගන්න කටයුතු කරනවා නම්, ඒක එතුමන්ලාගේ ප්‍රදේශයේ ජනතාවට කරන විශාල ද්‍රෝහීකමක් කියලා මම හිතනවා.

අද දින මම විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ කථා කරන්නේ කතෝලික මන්ත්‍රීවරයකු විධියටයි. අපේ කතෝලිකයකු වන එක්සත් ජාතික පක්ෂයේ නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමා පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ඉතාම හොඳින් අදහස් ප්‍රකාශ කළ ආකාරය මම දැක්කා. අද එතුමාට තීන්දුවක් ගන්න අවස්ථාව තිබෙනවා. ඒ වාගේම, කාවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා කතෝලිකයන් වෙනුවෙන් පෙනී සිටි ආකාරය අපි දැක්කා. එතුමාත් අද තීන්දුවක් ගන්න ඕනෑ. විශේෂයෙන්ම රන්ජන් රාමනායක රාජ්‍ය ඇමතිතුමා කතෝලික ජනතාව වෙනුවෙන් කථා කළා. එතුමා කිව්වා, පසුගිය පාස්කු ප්‍රහාරයෙන් පස්සේ මුස්ලිම් ජනතාව ලක්ෂයක් විතර මේ සිද්ධියට සම්බන්ධ වෙලා තිබෙනවා කියලා. අපි නොවෙයි ඒක කිව්වේ, එක්සත් ජාතික පක්ෂයේ රන්ජන් රාමනායක රාජ්‍ය අමාත්‍යතුමායි. එහෙම නම්, ඒ අය දැන් අල්ලාගෙන තිබෙනවාද කියන එක අපි අහනවා. එක්සත් ජාතික පක්ෂයේ රාජ්‍ය අමාත්‍ය රන්ජන් රාමනායක කිව්වා, මුස්ලිම් ජනතාව ලක්ෂයක් විතර මේකට සම්බන්ධයි කියලා.

රන්ජන් රාමනායක ඇමතිතුමා ඇතුළු ආණ්ඩුවෙන් අපි අහනවා, මේ සිද්ධියට සහයෝගය දුන් ලක්ෂයක් ඉන්නවා නම්, ඒ ලක්ෂය අත් අඩංගුවට ගත්තාද කියලා. ඒ වාගේම රන්ජන් රාමනායක ඇමතිතුමාගෙන් අපි අහනවා, අද තමුන්නාන්සේ කතෝලික ජනතාව වෙනුවෙන් කතෝලික ජනතාවගේ පැත්තේ හිටගන්නවාද කියලා. විශේෂයෙන් අපි දැක්කා තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමා ජනතා විමුක්ති පෙරමුණේ නායකයා එක්ක හැප්පුණු හැටි. තුෂාර ඉඳුනිල් මන්ත්‍රීතුමාට අමතක වෙලා තිබෙනවා, ජනතා විමුක්ති පෙරමුණ උදවු කිරීම නිසා මේ ආණ්ඩුව බිහිවුණාය කියන කාරණය. එහෙම නොවුණා නම් ඔක්තෝබර් 26 වැනිදායින් පසුව මේ ආණ්ඩුව නැහැ. මේ රටේ ජනතාවට තිබෙන සර්වජන ඡන්ද බලය පාවිච්චි කිරීමේ අවස්ථාව පසුගිය ඔක්තෝබර් 26 වැනි දාට පසුව අපි ලබා දෙන්න යනකොට, TNA එක, JVP එක, UNP එක, මුස්ලිම් පක්ෂ සියල්ලම එකතු වෙලා "ඡන්දය එපා" කියලා උසාවි ගියා. ඒ නිසා තමයි අද මෙවැනි බෝම්බ ප්‍රහාරයකට ලක් වන්නට සිද්ධ වුණේ. අපේ ආණ්ඩුව තිබුණා නම් ඔය සහරාන්ලා අල්ලලා, කොටු කරලා, නීතිය ක්‍රියාත්මක කරනවා. එතකොට මුස්ලිම් ජනතාවට ප්‍රශ්නයකුත් නැහැ, ද්‍රවිඩ ජනතාවට ප්‍රශ්නයකුත් නැහැ, වෙනත් කිසිම ජනතාවකට ප්‍රශ්නයක් ඇති වෙන්නේත් නැහැ. එදා මැතිවරණයකට යන්න නොදී, ජනතාවගේ පරමාධිපත්‍ය බලය උපරිමයෙන් ක්‍රියාත්මක වෙන තැනින් මැතිවරණය කල් දමන්න කියලා, මැතිවරණය එපා කියපු නිසා තමයි මේ අහිංසක කතෝලික පොඩි දරුවෝ, වැඩිහිටියෝ විශාල පිරිසක් ජීවිතක්ෂයට පත් වුණේ. ඒ නිසා එදා මේ අගමැතිතුමා නැවත පත් කරන්න කටයුතු කළ ඒ සිවිල් සංවිධාන සියල්ල, උසාවි ගිය සියලුදෙනා, විශේෂයෙන් මේ පාර්ලිමේන්තුව තුළ විශාල ජවනිකා පවත්වපු ඒ සියලුදෙනා මෙහි වගකීම ගන්නට ඕනෑය කියන කාරණය ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා, ස්තුතියි.

[අ.භා.1.55]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මා නිමල් ලාන්සා මන්ත්‍රීතුමාගෙන් අහනවා, එතුමා පාර්ලිමේන්තුව නියෝජනය කරද්දී, මගේ ගමේ වැලිවේරිය කතෝලික දේවස්ථානය තුළට හමුදාවේ අය ගිහිල්ලා බොන්න වතුර ඉල්ලපු අහිංසක පුද්ගලයන්ට වෙඩිතබා මරනකොට ඔය විධියට ඇඬුවාද කියලා.

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඉන්න, ඔබතුමාට අන්තිමට උත්තර දෙන්න පුළුවන්. දැන්ම බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, what is your point of Order?

ගරු නිමල් ලාන්සා මහතා
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, point of Order එකක් නොවෙයි. එතුමා මගෙන් ප්‍රශ්නයක් ඇහුවා. මා එතුමාගේ

ප්‍රශ්නයට උත්තර දෙන්නම්, අහගන්න. එතුමා ඇහුවා, එදා ගම්පහදී වූ සිද්ධියටත්, අනෙක් සිද්ධිවලටත් ආණ්ඩුව වග කියන්න ඕනෑද කියලා. හැබැයි එදා ඒ ආණ්ඩුව වග කියන්නට ඕනෑය කියලා තමුන්නාන්සේලා ජනතාව අතරට මතයක් ගෙන ගිය නිසා තමයි අපි ආණ්ඩුව -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මං විශේෂයෙන් කියනවා, හලාවත ඇන්තනි කියන්නේ කතෝලිකයෙක්. කතෝලික ධීවර ජනතාව ඉන්ධන සහනධාරය ඉල්ලනකොට, වෙඩි තබා මරා දැමූ කතෝලික ධීවරයා වෙනුවෙන් නිමල් ලාන්සා මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ දී ඇඩුවාද? EPF ඉල්ලන්න ගිහින් රොෂේන් චානක ඝාතනයට ලක් වුණා. තමන් නියෝජනය කරන දිස්ත්‍රික්කයේ මිනිසුන් මරනකොට නිමල් ලාන්සා මන්ත්‍රීතුමා ඇඩුවාද? ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ වැලිවේරියේ පල්ලියක් තුළ කතෝලික ජනතාව ඝාතනය කළාය කියලා ඔබතුමා ඇඩුවාද? අද ඔබතුමාට මීගමුව කොට්ඨාසය දිනාගන්න බැරුව කතෝලික ඡන්ද ලබාගැනීම සඳහා තවත් දේශපාලන උප්පරවැට්ටියක් කරනවා මිසක්, සැබෑ ප්‍රේමයක්ද ඔය තිබෙන්නේ? මේ විධියට රඟපාන්න එපා කියලා මා කියනවා.

මීට පෙර කථා කළ ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කිව්වා, "අපට නම් මේ විශ්වාස භංග යෝජනාව දිනවන්න බැහැ. අනුර දිසානායක මන්ත්‍රීතුමායි, සුමන්තිරන් මන්ත්‍රීතුමායි එකතු වුණොත් නම් දිනවන්න පුළුවන්" කියලා. ඒකාබද්ධ කණ්ඩායමට විශ්වාස භංග යෝජනාව දිනවන්න බැරි නම් විපක්ෂ නායක ධුරය එක්කෝ සුමන්තිරන්ට හෝ අනුර දිසානායකට හෝ භාර දෙන්න කියලා මා කියනවා. විපක්ෂයේ ඉඳගෙන මෙවැනි කථා කියනවා නම් මොන තරම් බංකොලොත් විපක්ෂයක්ද තිබෙන්නේ? අද ඒ, මන්ත්‍රීවරුන්ටත් මේ විශ්වාස භංග යෝජනාව ගැන විශ්වාසයක් නැහැ. "මේ විශ්වාස භංග යෝජනාව අපට දිනවන්න බැහැ. දිනවන්න පුළුවන්, සුමන්තිරන් මන්ත්‍රීතුමාට හෝ අනුර දිසානායක මන්ත්‍රීතුමාටයි" කියලා එතුමා කිව්වා. එහෙම නම් දෙවියනේ, විපක්ෂ නායක ධුරය ඒ ගොල්ලන්ට දෙන්නකෝ. අගමැති ධුරය බලෙන් ගත්තා වාගේ විකාර කරන්නේ නැතුව ඒ ගොල්ලන්ට දීලා යන්න කෝ.

අනුර දිසානායක මන්ත්‍රීතුමා මීට පෙරත් 2018.11.16 වන දා විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළා, මහින්ද රාජපක්ෂ මැතිතුමා බලහත්කාරයෙන් ලබාගත් ආණ්ඩුවට ගෙදර යැවීම සඳහා. ඒ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළා. මා අනුර දිසානායක මන්ත්‍රීතුමාගෙන් අහනවා, මෙවැනි ප්‍රශ්නයක් වුණාම අපි ඒක නිවැරදි කරගන්නවා මිසක්, වැරැද්ද තිබෙන්නේ කොතැනද කියා සොයා බලා එය නිවැරදි කරන්න කටයුතු කරනවා මිසක්, ආණ්ඩුව ගෙදර යවනවාය කියන එකේ ප්‍රතිඵලයක් තිබෙනවාද කියලා. මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළොත් අන්තිමට මොකක්ද වෙන්නේ? ජනාධිපතිතුමාට මේ මැති සබය තුළ තවත් මැති සබයක් පත්කිරීමේ අවස්ථාව ලැබෙනවා. මැතිවරණයක් එනවා නොවෙයි නේ. එතකොට අගමැති ධුරය ඔබතුමාට දෙයිද? ඔබතුමාට ආණ්ඩුව භාර දෙයිද? එතකොට මොකක්ද වෙන්නේ? නැවත මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුවක් පත් වුණොත්, මේ ආණ්ඩුවට වඩා මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව හොඳයි කියලා ඔබතුමාට විශ්වාසද? මේ රටේ ජනතාවට විශ්වාසද? ජනතාවට අමතක නැහැ. අද ඔබතුමා විශ්වාස භංග යෝජනාව ගෙනාවාට, එදා හමුදාවට අණ දීලා හමුදාව ලවා මේ රටේ කීදෙනෙකු මැරෙව්වාද? සුදු වෑන්වලින් අරගෙන ගිහින් කීදෙනෙකු මැරුවාද? සුදු වෑන්වලින් අරගෙන ගිහින් රහසිගතව කීදෙනෙකු මැරුවාද? ඒ විතරක් නොවෙයි. මගේ සහෝදර මන්ත්‍රීවරුන් හම්බන්තොට වරාය බලන්න යනකොට, මත්තල ගුවන් තොටුපොළ බලන්න යනකොට අපට පිස්තෝලවලින් ගැහුවා. ඒ පිළිබඳව තොරතුරු දැනගන්න ලැබුණාද? ඔබතුමාට ඒ රජය විශ්වාසද? නැවතත් ඒ කාලකණ්ණි රජය ගෙනෙන්නද මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ? ඒකද කරන්න යන්නේ?

පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ වැරැදිකරුවන් සොයන්න විශේෂ කාරක සභාවක් තිබෙනවා. සියලුදෙනාම කැඳවා ඒ විශේෂ කාරක සභාව තුළ ප්‍රශ්න කරනවා; මාධ්‍යයට විවෘත කරලා ප්‍රශ්න කරනවා. ඒ විධියට පසුගිය ආණ්ඩුව කාලයේ කේපී කැඳවා ප්‍රශ්න කළාද? මාධ්‍ය ඉදිරියේ ප්‍රශ්න කළාද? ස්වාමීන් වහන්සේලාගේ ඝාතන පිළිබඳව වග කිව යුතු කරුණා අම්මාන් කැඳවා, පිල්ලෙයාන් කැඳවා ජනතාවට පෙනෙන්න ප්‍රශ්න කළාද? නැහැ. ඒ අයගේ ඉඩම් තිබෙන්නේ කොහේද, ඒ අයගේ නැව් තිබෙන්නේ කොහේද, ඒ අයගේ ෂෙඩ් තිබෙන්නේ කොහේද, ඒ අයගේ ව්‍යාපාර තිබෙන්නේ කොහේද කියලා අහගෙන, ඒවා ගන්න රාජපක්ෂ පවුලේ අය පොරකෑවා මිසක් ඒ අයගෙන් ඒවා ගැන ප්‍රශ්න කළාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ වැරැදි තිබෙනවාය කියන එක අප පිළිගන්නවා. අප්‍රේල් 21වන දා එල්ල වූ ප්‍රහාරයේ වගකීම අප භාර ගත්තා. එහි වගකීම භාරගත්තා විතරක් නොවෙයි, ඊට පස්සේ ඒකට දෙන්න ඕනෑ උත්තර ටිකත් අපි දුන්නා. ඒ ප්‍රහාරයෙන් නැතිවුණු අයගේ ජීවිත අපට ආපසු ගන්න බැහැ. ඒක කනගාටුදායක සිද්ධියක්. නමුත් රජයක් වශයෙන්, එතැනින් එහාට කරන්න ඕනෑ දෙය අපි කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ සිද්ධිය වුණේ කාගේ වරදින් ද, තිබෙන වැරදි මොනවාද කියා සොයන්න අපි විශේෂ කාරක සභාවක් පත් කළා. ඒ සිද්ධිය වන විට සිටි ආරක්ෂක ලේකම්තුමා ඉල්ලා අස්වෙලා තිබෙනවා. පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්මයා අනිවාර්ය නිවාඩු යවා තිබෙනවා. ඒ පිළිබඳව නඩු කටයුතු සිද්ධ වෙනවා. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව, වගකිව යුතු අය ගෙන්වලා ඒ පිළිබඳව ප්‍රශ්න කරනවා; කවුද, අඩු වුණේ, මොනවාද අඩු වුණේ, තිබුණු ප්‍රශ්නය මොකක්ද කියන කාරණා දැන් හොයනවා. ඒ කරුණු සොයන එක අප අත්හැර නැහැ.

මේ සිද්ධියට මුහුණ දීලා තුවාල ලැබූ අයට, ජීවිත අවදානමට ලක්වූ අයට අප රුපියල් මිලියන 233ක් -කෝටි 23ක්- ප්‍රදානය කර තිබෙනවා. ඒ වාගේම ඒ ප්‍රහාරයෙන් මිය ගිය අයගේ පවුල්වලටත් මුදල් ලබාදී තිබෙනවා. ඒ තුවාලකරුවන්ට, අනතුරට ලක්වී ජීවත්වෙන අය හැකි තරම් යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා අප මුදල් ලබාදී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් පියතුමාගේ උපදෙස් මත අප අනිකුත් සියලු කටයුතු ලැහැස්ති කර තිබෙනවා. දේවස්ථාන ප්‍රතිසංස්කරණය කරන්න අපි මුදල් දීලා තිබෙනවා. කටුවාපිටිය දේවස්ථානය ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා රුපියල් මිලියන 10ක් -කෝටියක මුදලක්- දීලා තිබෙනවා. ඊළඟට, මඩකලපුව Church එකට රුපියල් මිලියන 5ක් දීලා තිබෙනවා. හමුදාව යොදවා දැන් එහි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනවා. ඒ වාගේම කොච්චිකඩේ Church එක අලුත්වැඩියා කරන්නත් රුපියල් මිලියන 10ක් දීලා තිබෙනවා. එම දේවස්ථාන තුන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පමණක් රුපියල් මිලියන 25ක් -කෝටි දෙකහමාරක්- මේ රජය ලබාදී තිබෙනවා. අපේ අඩුපාඩු

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ඇති. ඒත් අපි විනිවිදභාවයෙන් යුතුව වැඩ කරනවා. අපේ අඩු පාඩු ජනතාවට පෙනෙන්න පුළුවන්. ඒවා පුවත් පත්වල පළ කරන්න පුළුවන්; TV එකේ පෙන්වන්න පුළුවන්. නමුත් අපි ඒ මාධ්‍යවේදීන්ව මරන්නේ නැහැ; පත්තර කන්තෝරුවලට ගිනි තියන්නේ නැහැ. අපි කරන ඒවා සියලුදෙනාටම බලන්න පුළුවන්. ජනතාව අපේ අඩු පාඩු දකිනවා. අපේ ඒ අඩු පාඩු ජනතාව දැන ගත්තාට, මීට වඩා වහගෙන හොරකම් කළ, වහගෙන මිනී මරපු ආණ්ඩුවකට නැවත බලයට එන්න ඉඩ දෙන්නද මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ කියන ප්‍රශ්නය අසමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා.2.02]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විසින් රජයට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම යෝජනාව ගැන කථා කරන මේ වෙලාවේ, ආණ්ඩුවේ මැති ඇමතිතුමන්ලා කියන කථා අහගෙන ඉන්නකොට මට ජනතා විමුක්ති පෙරමුණ ගැන අනුකම්පාවක් ඇති වෙනවා. මොකද, 2015දී මේ ආණ්ඩුව බලයට පත් කරන්න ජනතා විමුක්ති පෙරමුණ දැඩි කැපවීමෙන් කටයුතු කළා. ඒ ආණ්ඩුවේ ඇමතිකම් ගත්ත මැති ඇමතිවරු අද ජනතා විමුක්ති පෙරමුණට බණිනවා. තමුන්නාන්සේලා අද ඔය ඇමතිකම් අරගෙන තිබෙන්නෙත් එතුමන්ලා ආණ්ඩුව හදන්න උදවු කළ නිසායි.

ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස භංග යෝජනාව ගෙන ආ කථාවත් හරියට අර, "අන්දරේ ගල ඉස්සුවා වාගේ" කියන කථාව වාගේ තමයි. අන්දරේ මාස ගණනක් හොඳට කාලා බීලා, ගල ළඟට ගිහිල්ලා මිනිසුන්ට කිව්වා, "ගල උස්සලා කරේ තිබ්බොත් ගෙනයන්නම්" කියලා. ජනතා විමුක්ති පෙරමුණ මේ ආණ්ඩුවට විරුද්ධව ගෙන ආ විශ්වාස භංග යෝජනාවත් ඒ වාගේ වැඩක් තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, අපි එදා රිසාඩ් බදියුදීන් ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ආ බව. ඒ විශ්වාස භංග යෝජනාව විවාදයට ගත්තා නම්, මේ වෙනකොට ආණ්ඩුව පරාජයට පත් වෙලා ඉවරයි. නමුත් අපි ඒ විශ්වාස භංග යෝජනාව ගෙනෙනකොටම ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ආවා. "මේකෙන් වෙන්නේ ආණ්ඩුව ශක්තිමත් වීමක්" කියලා ඒ වෙලාවේ අපි කිව්වා. ඒ වෙලාවේ ආණ්ඩුව උත්සාහ කළා, රිසාඩ් බදියුදීන් ඇමතිතුමාගේ විශ්වාස භංග යෝජනාව පස්සට දමලා ආණ්ඩුවට විරුද්ධව ගෙන ආ විශ්වාස භංග යෝජනාව ගෙනැත් ආණ්ඩුව ශක්තිමත් කර ගන්න. අවුරුදු හතරහමාරකට පස්සේ, ජනතා විමුක්ති පෙරමුණ දැන් ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ආවත්, "මේක ආණ්ඩුවට විරුද්ධව නොවෙයි, ආණ්ඩුව රැක ගන්න ගෙන ආ විශ්වාස භංග යෝජනාවක්" කියලා ජනතාව අතර සැකයක් මතු වෙලා තිබෙනවා. අන්න එහෙමයි රටේ මිනිස්සු හිතාගෙන ඉන්නේ. ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කර තිබෙන මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරන්න නම්, එතුමන්ලා සියලු දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කරලා, මේ රජය පරාජය කිරීමට කටයුතු කරන්න ඕනෑ. මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ ආණ්ඩුව පරදවන්නයි. එහෙම නම්, ජනතා විමුක්ති පෙරමුණ මේ පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ සමඟ සාකච්ඡා කරලා, මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරවීමට කටයුතු කරන්න ඕනෑ. නමුත් මේ යෝජනාව ජයග්‍රහණය කිරීම සඳහා ඔබතුමන්ලා ළඟ වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. ඒ නිසා, මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ සැබැවින්ම මේ ආණ්ඩුව පරාජය කිරීමේ අරමුණින්ද, එහෙම නැත්නම් ආණ්ඩුව ශක්තිමත් කිරීමේ අරමුණින්ද කියන චෝදනාව අද ජනතා විමුක්ති පෙරමුණට එල්ල වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ නොවෙයි, මොන දේශපාලන පක්ෂය මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවත් විපක්ෂය හැටියට -ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හැටියට- මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් අපි සියලුදෙනා මේ ආණ්ඩුවට විරුද්ධව හැම දාම එකට හිට ගන්නවා. මේ ආණ්ඩුවට විරුද්ධව ගෙනෙන ඕනෑම යෝජනාවකට අපේ සහයෝගය ලබාදෙනවා.

ඔබතුමන්ලා දන්නවා නේ, මේ ආණ්ඩුව බලයට පත් වුණේ 2015 ජනවාරි මාසයේ 08වන දා බව. මේ ආණ්ඩුව බලයට පත් කරගන්න ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජාතික හෙළ උරුමය, TNA එක කියන සියලු පක්ෂ එදා වේදිකාවේ එකට හිටියා. වේදිකාවේ සිටිමින් එතුමන්ලා කිව්වේ, "රාජපක්ෂ පාලනය ගෙදර යවන්න තමුන්නාන්සේලා අපට ඡන්දය දෙන්න" කියායි. මේ ආණ්ඩුව හදන්න එදා තමුන්නාන්සේලා ඉල්ලපු ජන වරමේදී -තමුන්නාන්සේලා සිටි වේදිකාවේදී- පොරොන්දු වුණු එක් සුවිශේෂී කාර්යයක් තිබුණා. තමුන්නාන්සේලා ඉෂ්ට කරනවාය කියපු පළමුවැනි කාර්යය අපට මතකයි. රාජපක්ෂ ආණ්ඩුවේ තිබෙන හොරකම නවත්වන්න තමුන්නාන්සේලාට -මේ ආණ්ඩුවට- ඡන්දය දෙන්නය කියලා එදා කිව්වා. බදු බර අඩු කරන්න තමන්ට ඡන්දය දෙන්න කියලා එදා තමුන්නාන්සේලා කිව්වා. ඒ විතරක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න, යහ පාලනය ගෙනෙන්න, මාධ්‍ය නිදහස වෙනුවෙන් තමුන්නාන්සේලාට ඡන්දය දෙන්න කිව්වා. එහෙම පොරොන්දු දුන් තමුන්නාන්සේලා 2015 ජනවාරි මාසයේ 08වන දා ජයග්‍රහණය ලබා ගත්තා. ඉන් පසු, පෙබරවාරි මාසයේ 26වන දා තමුන්නාන්සේලාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහ බැංකුව කොල්ල කෑවා. මහ බැංකු සිද්ධියේ වූදිතයන්ට අද චෝදනා පත්‍ර ඉදිරිපත් කර තිබෙනවා. අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒකේ වූදිතයකු නොවෙයි; ඒකෙන් සල්ලි ගත්ත

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මහත්මයා වූදිතයෙක් නොවෙයි; ඒකේ සල්ලි ගත්ත ආණ්ඩුවේ මන්ත්‍රීවරු, ඇමතිවරු, කෝප් කමිටු සාමාජිකයෝ වූදිතයන් නොවෙයි. හැබැයි, නිකම් පිරිසක් -සාමාන්‍ය පිරිසක්- අල්ලාගෙන ඒ අයට දැන් චෝදනා එල්ල කර තිබෙනවා.

අද මේ ආණ්ඩුවට විරුද්ධව බරපතළ ලෙස දූෂණ චෝදනා එල්ල වෙලා තිබෙනවා. දූෂණය නවත්වනවාය කියලා නේ තමුන්නාන්සේලා බලයට පත් වුණේ. ජනතාවගේ බදු බර අඩු කරනවාය කියපු ආණ්ඩුව අද රාජ්‍ය බදු ආදායම සියයට සියයකින් වැඩි කර තිබෙනවා. ඒ නිසා අපට පෙනෙනවා, මේ ආණ්ඩුව මේ රටේ ජනතාව දුන් ඒ වරම අනුව කිසිසේත් කටයුතු කර නැති බව.

ඒ විතරක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය ගැන කථා කළ මේ ආණ්ඩුව අද මැතිවරණ කල් දමා තිබෙනවා; මැතිවරණ සිතියම සම්පූර්ණයෙන් අකුළා දමා තිබෙනවා. යහ පාලනය ගෙනෙනවා කියලා තමයි තමුන්නාන්සේලා බලයට ආවේ. එහෙම කියපු මේ ආණ්ඩුව මොනවාද කළේ කියන කාරණය අලුතින් කියන්න ඕනෑ නැහැ නේ.

ඊළඟට, තමුන්නාන්සේලා මාධ්‍ය නිදහස ගැන කථා කළා. මාධ්‍ය නිදහස ගැන කථා කළ ආණ්ඩුව මේ වනවිට ආණ්ඩුවට එරෙහිව තිබෙන මාධ්‍ය 1,500කට වැඩි ප්‍රමාණයක් තහනම් කර තිබෙනවා. තමුන්නාන්සේලා සියලු ෆේස්බුක් ගිණුම් තහනම් කරනවා. ඒ විධියට තමුන්නාන්සේලා ආණ්ඩුවට විරුද්ධව තිබෙන සියලු දේ තහනම් කරමින් කටයුතු කරගෙන යනවා. ඒ නිසා, මේ ආණ්ඩුවට එරෙහිව එක විශ්වාස භංග යෝජනාවක් නොවෙයි, දවසකට එක ගණනේ විශ්වාස භංග යෝජනා ගෙනාවත් පාඩු නැහැ.

2015 ජනවාරි මාසයේ 08වන දා දුන් කිසිදු පොරොන්දුවක් ඉෂ්ට කර ගන්න තමුන්නාන්සේලාට හැකියාව ලැබිලා නැහැ. හැබැයි තමුන්නාන්සේලා එක දෙයක් කළා. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ අජිත් මාන්නප්පෙරුම රාජ්‍ය ඇමතිතුමා මීට ටිකකට කලින් නැඟිටලා, මහ ලොකුවට කෑ ගහලා, කටුනායක වෙඩි තැබීමේ සිද්ධියේදී පුද්ගලයකු මිය යෑම ගැන කථා කළා. කටුනායක, එක් කෙනෙකු මිය ගිය එකක් ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කරනවා. ඔබතුමන්ලාගේ කාලයේ මිනිසුන් 300කට ආසන්න සංඛ්‍යාවක් මැරුණා නේ. අපේ කාලයේ එක් කෙනෙකු මිය ගිය බව අපි පිළිගන්නවා. එවකට සිටි පොලිස්පතිවරයා එහි වගකීම බාරගෙන ඉල්ලා අස් වුණා. නමුත් මේ සිද්ධියේදී තමුන්නාන්සේලා මොනවාද කළේ? 300කට ආසන්න සංඛ්‍යාවක් මිය ගිය එකේ වගකීම තමුන්නාන්සේලා බාර ගන්නවාද? අගමැතිවරයා ඒ වගකීම බාර ගන්නවාද? ජනාධිපතිවරයා ඒ වගකීම බාර ගන්නවාද? ඒ සිද්ධියට පොලිස්පති හා ආරක්ෂක ලේකම්වරයා හිරේ දැම්මා. ඔවුන් හිරේ දමලා අන්තිමට මොකක්ද වුණේ? ආණ්ඩුවේ රෙදි ගැලෙව්වා; තමුන්නාන්සේලාගේ රෙදි ගැලෙව්වා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. State Minister, what is your point of Order?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරමින් කථා කළා. වැලිවේරියේ කී දෙනෙකු මැරුවාද? ඔබතුමා දන්නේත් නැතිව ඇති. කී දෙනෙකුට තුවාල කළාද? කී දෙනෙකු මූනිස්සම්,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මහවැලි සංවර්ධන සහ පරිසර රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට බොහොම ගරු කරනවා. පරිසර රාජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේ මෙන්න මේ කාරණය අහ ගන්න. අපේ කාලයේ එක් කෙනෙකු මිය ගිය වැරැද්දට අපි දඬුවම් වින්දා. එවකට සිටි පොලිස්පතිවරයා ඉල්ලා අස් වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

තමුන්නාන්සේලා කතෝලික බැතිමතුන් 300කට ආසන්න පිරිසක් ඝාතනය කළා.

500කට පමණ තුවාල සිදු වුණා. ලජ්ජා නැතුව තමුන්නාන්සේ කථා කරනවා තමුන්නාන්සේගේ ගම්පහ දිස්ත්‍රික්කයේ මියගිය කෙනෙකු ගැන. තමුන්නාන්සේ කියනවා, දන්නේ නැහැ, දැක්කේ නැහැ කියලා. අපි ඔබතුමන්ලාට කියන්නේ, එක් කෙනෙකු මිය ගිය කථාව කියන්න කලින් සිතා බලන්න කියලා. මොකද, ඔබතුමන්ලාට ඇඟිල්ල දික් වෙනවා. ඔබතුමන්ලා 300ක් පමණ ඝාතනය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ වූ සිදුවීම් ඔක්කෝම එකතු කරලා බලන්න. ඒ සිද්ධිවලදී හතර දෙනෙක් මිය යන්න ඇති. අද බලන්න, තත්පර 10කට 300යි!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ජාතික ආරක්ෂාව අද නැති කරලා තිබෙනවා. කිසිම දෙයක් නොකරපු මේ ආණ්ඩුව තමන්ගේ අන්තිම මාස හයේ මොනවාද කරන්නේ? දැන් සමෘද්ධිය දෙන්න හදනවා, ගම්පෙරළිය වැඩසටහන කරන්න හදනවා. මේ අවුරුදු හතරහමාරට කිසිම දෙයක් නොකරපු මේ ආණ්ඩුව දැන් ගම්වලට ගිහින් මිනිසුන්ට රස්සා දීලා, ජනතාව වෙත පිය නගන්න බලනවා. හැබැයි, ඔබතුමන්ලා මෙය හොඳට මතක තබා ගන්න. තමුන්නාන්සේලා මොනවා කථා කළත් මේ ආණ්ඩුවට විරුද්ධව මේ රටේ ජනතාව තීන්දුව අරගෙන ඉවරයි. තමුන්නාන්සේලා හෙට මැතිවරණයකට යන්න. තමුන්නාන්සේලා මැතිවරණයට යන්න තවම භයයි. ජනාධිපතිවරණය පවත්වන්නේ නැහැ. පළාත් සභා මැතිවරණය, අරවා මේවා ගැන අහනවා. නමුත්, තමුන්නාන්සේලා තවම මැතිවරණයකට යන්න භයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව තමුන්නාන්සේලාට ජනාධිපතිවරණය පවත්වන්න සිදු වනවා. අපි ජනාධිපතිවරණයට ලෑස්තියි. තමුන්නාන්සේලාගේ පැත්තේ හතර දෙනෙක් සූට් මහලා ඉවරයි. ගරු කථානායකතුමා සූට් එක මහලා අඳින්න බලාගෙන ඉන්නවා, සජිත් ප්‍රේමදාස මහත්තයා බලාගෙන ඉන්නවා. නමුත්, අපි අපේ ජනාධිපති අපේක්ෂකයා ඉදිරිපත් කරලා, ජයග්‍රහණය කරවලා මේ ආණ්ඩුව ගෙදර යවන බව කියමින් මම නිහඬ වනවා.

[අ.භා.2.11]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழில் பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විපක්ෂයක් හැටියට, විපක්ෂයේ කාර්යයක් හැටියට

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඒක එම මන්ත්‍රීවරුන්ගේ අයිතියක්. එම විශ්වාස භංග යෝජනාවට මුහුණ දීලා, එය පරාජය කිරීම ආණ්ඩුවක් හැටියට අපේ කටයුත්තක්. ඒක තමයි දැන් මෙතැන සිද්ධ වෙමින් තිබෙන්නේ. නමුත්, මේ විවාදය ඇතුළේ පුදුම කථා සිද්ධ වනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කියනවා, "ආණ්ඩුව 300 ගණනක් මැරුවා" කියලා. මොකක්ද ඒ කරන්න හදන්නේ? ඒ සිදු වූ ජන ඝාතනවලට වග කිවයුතු ඉස්ලාම් ආගමික අන්තවාදී ත්‍රස්තවාදය වසන් කරලා, ඒකෙන් දේශපාලන ප්‍රයෝජනයක් අරගෙන, මේ ප්‍රශ්නය විසඳන්න තිබෙන මාවත අහුරන්න නේද මේ හදන්නේ? එම නිසා මේ විශ්වාස භංග යෝජනා විවාදය ඒ වාගේ අවාසනාවන්ත තැනකට පත් වනවාය කියන එකත් යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරු දැන ගත්තා නම් හොඳයි කියා මා හිතනවා.

ජනතා විමුක්ති පෙරමුණ ගෙනා විශ්වාස භංග යෝජනාවට අපි විරුද්ධ වුණත්, මේ විවාදයේදී වැදගත් කාරණා ටිකක් කථා වනවා. ඒ තමයි, අපේ රටේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් හිඩැසක් ඇති වෙලා තිබෙනවා, අපි ඒක නිවැරදි කර ගන්නේ කොහොමද කියන කාරණාව. අගමැතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුවේ මැතිඇමතිවරු මේ සිද්ධිය ඇති වුණාට පස්සේ රජයක් හැටියට ප්‍රකාශ කළා, "ඔව්. ආණ්ඩුවට වග කීමක් තිබෙනවා" කියලා. නමුත්, නිශ්චිතවම එම වගකීම භාර ගත යුත්තේ කවුද, ඒ හිඩැස ඇති වුණේ කොහේද කියන කාරණාව සම්බන්ධයෙන් මූලික සොයා බැලීමක් කරන්න ඕනෑ. ඒ නිසා තමයි මේ පිළිබඳව සොයන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අත්සන් කරලා පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනාවේ. දැන් ඒ විශේෂ කාරක සභාව සාක්ෂි විභාග කරමින් පවතිනවා. ඒ විශේෂ කාරක සභාවේ වාර්තාවත් ආවාට පස්සේ මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් වුණා නම් වඩා සුදුසුයි කියන එක මගේ මතය හැටියට මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

අපි හිතමු, මේ විශ්වාස භංග යෝජනාවෙන් අපේ ආණ්ඩුව පරාජයට පත් වුණා කියලා. එතකොට පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන පක්ෂයට ආණ්ඩුව පිහිටුවන්න කියලා ජනාධිපතිතුමා ආරාධනාවක් කරනවා. දැන් කාටද බහුතරය තිබෙන්නේ? එක කණ්ඩායමක් එනකොට ඒ අයට බහුතරය නැහැ කියලා ඔප්පු වුණාම, අපට නැවත විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්න වනවා. එතකොට මොකද වෙන්නේ? නැවත වතාවක් පෙර මෙන් මිරිස් කුඩු ගහගන්න සිද්ධ වනවා, මයික් කඩනවා, ගරු කථානායකතුමාට එතුමාගේ ආසනයේ වාඩි වෙන්න ඉඩ දෙන්නේ නැහැ. ඉතා අශෝභන සිද්ධි මාලාවකට මුලාරම්භයක් එනවා. ඊට වඩා හොඳයි, ටික කාලයක් බලාගෙන ඉන්න එක. මොකද, වැඩි කාලයක් නොගිහින් ජනතාවට ඒ සඳහා අවස්ථාව හම්බ වනවා. මේකට ජනාධිපතිතුමා වග කියන්න ඕනෑ -විධායකයේ ප්‍රධානියා වග කියන්න ඕනෑ- කියලා හිතනවා නම්, ඔන්න ළඟදීම ජනාධිපතිවරණයක් එනවා. ඒ වාගේම වැඩි කාලයක් නොගිහින් මහා මැතිවරණයකුත් එනවා. ඒකටත් ජනතාවට අවස්ථාව හම්බ වනවා. එම නිසා මම හිතන හැටියට අද අපි මේ සිද්ධියෙන් ආගමික බෙදුම් රේඛාව තව පළල් කර ගන්නේ නැතුව, ඇත්ත ප්‍රහාරකයා, ඇත්ත ත්‍රස්තවාදියා වසන් කරන්න නොදී, දේශපාලන ඵල ප්‍රයෝජනය උදෙසා මේ විවාදය කරන්නේ නැතුව, මේ රටේ මේ ප්‍රශ්නය විසඳන්න අපි ඉදිරියේදී ගන්න ඕනෑ මොන වාගේ ඵලදායි ක්‍රියා මාර්ගද කියන කාරණය කථා කළා නම් වඩා හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම විවාදය ඇතුළේ මහා පුදුමාකාර දේවල් වෙනවා. අපට පෙනෙනවා, SOFA එක, ACSA එක, Millennium Challenge Corporation එක මේ විවාදය ඇතුළට ගෙනෙන්න හදනවා. මේක මාර වැඩක්! ඇමෙරිකන් විරෝධය දක්වලා යටි ගිරියෙන් කෑ ගහනවා. හයියෙන් කෑ ගහන්න, කෑ ගහන්න, වහලේ උළු උඩ විසිවෙන්න යටි ගිරියෙන් කෑ ගහන්න, කෑ ගහන්න, සද්දේ වැඩි වෙන්න, වැඩි වෙන්න මේ කියන කාරණාවල සත්‍යතාවත් වැඩි වෙනවා කියලා ඒ අය විශ්වාස කරනවා වාගේ තමයි අපට පෙනෙන්නේ. නමුත් එහෙම එකක් නැහැ. අපි ඉතා පැහැදිලිවම කියනවා, අපේ රජය මොන ගිවිසුම අත්සන් කළත්, ඒවා පාර්ලිමේන්තුවට හොර රහසේ, ජනතාවට හොර රහසේ, කුස්සිය ඇතුළේ ඉඳලා, කාමර ඇතුළේ ඉඳලා කරන්නේ නැති බව. බොහොම විනිවිද පෙනෙන ආකාරයෙන් තමයි ඒවා කරන්නේ. ඇමෙරිකන් විරෝධය මතු කරන අයගේ කෙරුවාව මොකක්ද, ඇත්ත තත්ත්වය මොකක්ද? ඒ ගොල්ලන්ගේ නායකයෝ, ඒ ගොල්ලෝ ගෙනෙන්න හදන නායකයෝ මේ රටට අමතරව ඇමෙරිකාවේත් පුරවැසිභාවය අරගෙන තිබෙනවා. ඒ ගොල්ලෝ එහේ තමයි පදිංචි වෙලා ඉන්නේ. ලොස් ඇන්ජලීස්වල ගෙවල් තිබෙනවා. සමහර අයගේ දරුවෝ එහේ විශ්වවිද්‍යාලවලටයි යන්නේ. තව සමහර අය නිවාඩු කාලයට ළමයි එක්ක ගෙන ඩිස්නිලන්තයට යනවා. මේක මාර ඇමෙරිකන් විරෝධයක්. හැබැයි, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා බෙරිහන් දෙනවා. දැන් මේ විසූක දස්සනය මේ රටේ ජනතාව හොඳට අවබෝධ කරගෙන තිබෙනවා. ව්‍යාජ දේශප්‍රේමීන් කවුද, ඇත්ත දේශප්‍රේමීන් කවුද කියන එක ජනතාව හොඳින් අවබෝධ කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නියම දේශප්‍රේමියා ජාතිවාදය අවුස්සන්නේ නැහැ, පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජන වර්ගයකට විරුද්ධව කථා කරන්නේ නැහැ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා ආගමික නායකයන්ට අපහාස කරන්නේ නැහැ. අද අවශ්‍ය වෙලා තිබෙන දේශප්‍රේමී ස්වභාවය තමයි, මීට කලින් මන්ත්‍රීතුමෙක් කථා කළා වාගේ සියලු ජාතීන් එකට තබා ගැනීම.

මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව එකට තියන්න පුළුවන්, ඔවුන්ට ඇතිවෙලා තිබෙන ආතතිය නැති කරන්න පුළුවන්, ඇතිවෙලා තිබෙන ගින්න නිවන්න පුළුවන් නායකත්වය තමයි නියම දේශප්‍රේමී නායකත්වය. මෙතැන කරපු කථාවලින් එහෙම නායකයෝ ඉන්නවා කියලා පෙනෙනවාද? මේ හදන්නේ මෙම ගින්න තවත් වැඩි කරන්න නේද? මේ ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය වැරදි අර්ථ කථනවලට -ව්‍යාජ අර්ථ කථනවලට- ලක් කරලා ජනතාවගේ දේශපාලන විඥානය මොට කරන්න නේද මේ හදන්නේ?

මේ ආරක්ෂාවේ හිඩැස ඇති වුණේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් විශේෂ කාරක සභාව ඉතාම වටිනා නිරීක්ෂණ කරමින් සිටින බව අපි ඉතාම කරුණාවෙන් මතක් කරන්න කැමැතියි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුත් ඒකට සහභාගි වෙලා ඉන්නවා. අපට කනගාටුයි, ඒකට අත්සන් කරපු විපක්ෂයේ අනෙක් මන්ත්‍රීවරුත් එම කාරක සභාවට ඇවිල්ලා වාඩි වෙන්නේ නැති එක ගැන. එහෙම ආවා නම්, ඒ ගොල්ලන්ට තවත් මේ වගේ විසූක දස්සනවලට එන්නේ නැතුව ඇත්ත කරුණුවලට බහින්න ඉඩකඩ ලැබෙනවා. දැන් අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ, එම කරුණු කාරණාත් සොයාගෙන, අනාගතයේදී මේ විගේ අන්තවාදයක්, ගෝලීය ත්‍රස්තවාදයට මේ රට සරු පසක් නොවන ආකාරයට ආරක්ෂක, නීතිමය, අධ්‍යාපනමය, පරිපාලනමය ප්‍රතිසංස්කරණ ටික කරන එකයි. එහෙම නැතුව ඵල රහිත වාද විවාදවලට කල් ගත කරන එක නොවෙයි කළ යුත්තේ. පාර්ලිමේන්තුව දැන් ඒකට අදාළ මූලික කෙටුම්පත් සකස් කරලා තිබෙනවා. ඉදිරි දින කිහිපය ඇතුළත, විශේෂයෙන්ම කියනවා නම් ඊළඟට එන ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාව ආගමික බෙදුම් රේඛා මත බෙදන්න ඉඩ තියන්නේ නැතුව එම ප්‍රතිසංස්කරණ ටික කඩිනමින් සම්මත කරලා මේ රටේ දැනට

ඇතිවෙලා තිබෙන වාර්ගික, ආගමික ආතතිය නිවන්න වැඩ කරනවා නම්, එය අපි සියලුදෙනාම -මේ 225දෙනාම- ලබාගත් ජන වරමට යුක්තිය ඉෂ්ට කළා වෙනවා. මෙම විවාදයත් අපි ඒ පැත්තට යොමු කළා නම් වඩා හොඳයි කියන එක මම මතක් කරන්න කැමැතියි. එසේ පවසමින් මගේ කථාව මෙතෙකින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.2.19]

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. මේ ආණ්ඩුව ආවේ මේ රටේ ස්වර්ග ලෝකයක් හදන්න. මේ රටේ අල්ලස, දූෂණය නැති කරලා, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරලා, දුගී දුප්පත්භාවය නැති කරලා, මේ රට සෑම අතින්ම ස්වංපෝෂිත කරලා, ලිච්ඡවී රජ දරුවෝ වාගේ මේ රට පාලනය කරනවා කියලා තමයි බලයට ආවේ. හැබැයි, මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණු දේ මේ රටේ ජනතාවට සිද්ධ වුණේ නැහැ කියමින් මේ ආණ්ඩුවට බලයට එන්න උදව් කරපු කණ්ඩායමක් ම අද මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. ලිච්ඡවී රජ දරුවන් වාගේ සාකච්ඡා කිරීම කෙසේ වෙතත් විපක්ෂයේ මතයට එදා පොඩ්ඩක් හෝ ඇහුම් කන් දුන්නා නම් මේ ආණ්ඩුවට මේ තරම් අගාධයකට යන්න සිද්ධ වෙන්නේ නැහැ කියලා මම හිතනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එදා මහ බැංකු අධිපතිවරයා පත් කරන කොට ඔබතුමාත් මාත් සිටින මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පැහැදිලිව කිව්වා, "මහ බැංකුවේ අධිපතිවරයා හැටියට ඔහු පත් කර ගන්න එපා. ඔහුට යම් යම් චෝදනා නඟා තිබෙනවා. ඔහු පිළිබඳව විශ්වාස තබන්න බැහැ" කියලා. එහෙම කිව්වාම මොකක්ද කළේ? එදා අගමැතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා, අප දිහා සමච්චලයෙන් බලා, අපට හිනා වෙලා "මේ වගකීම මම භාර ගන්නවා" කියලා පැහැදිලිව කිව්වා. පැහැදිලිවම වගකීම භාර ගන්නවා නම් ඒ මහ බැංකු බැඳුම්කර කොල්ලයේ පළමුවන විත්තිකාරයා ලෙස අගමැතිවරයාගේ නම සඳහන් විය යුතුයි. එදා අගමැතිවරයා විපක්ෂය කියපු දේ ගැන පොඩ්ඩක් කල්පනා කළා නම්, විපක්ෂයේ මතය ගැන ටිකක් සිතුවා නම් අද මේ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ නැහැ කියලායි මා හිතන්නේ. එදා ඔබතුමන්ලා කිව්වේ "ලිච්ඡවී රජ දරුවන් වාගේ මේ රට පාලනය කරනවා" කියලායි. නමුත්, ජනාධිපතිවරයාට අගමැති කන් දෙන්නේ නැහැ, අගමැතිට ඇමතිවරු කන් දෙන්නේ නැහැ, ඇමතිවරුන්ට නියෝජ්‍ය ඇමතිවරු කන් දෙන්නේ නැහැ. මේ අය අතර කිසිම සමඟියක් තිබුණේ නැහැ. සමඟිය නැති වීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි ඒ පාස්කු ඉරිදා අපේ ලංකාවේ ජනතාවගෙන් 300කට ආසන්න සංඛ්‍යාවකට මිය යන්න සිද්ධ වුණේ සහ සිය ගණනකට රෝහල්ගත වෙන්න, රෝගීන් බවට පත් වෙන්න සිද්ධ වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආණ්ඩුව මහ ලොකුවට කිව්වා, එදා ජනාධිපතිතුමා දිවුරුම් දෙන කොට, අගමැතිවරයා දිවුරුම් දෙන කොට වියදම් කළේ රුපියල් 7,500යි කියලා. මරණාධාර සමිතියක සභාපතිවරයා හා සමානව තමයි එදා මේ රටේ ජනාධිපතිවරයා දිවුරුම් දුන්නේ. හැබැයි, ඊට පසුව මොකද වුණේ? අද කෝටි ගණන් වියදම් කරනවා, උත්සව සඳහා සහ දැන්වීම් සඳහා. මම එක උදාහරණයක් කියන්නම්. මාතර නිවාස 25ක් හදනවා. රුපියල් ලක්ෂ 2 බැගින් දීලා ඒ ගෙවල් හදන්නේ මාතර ප්‍රදේශයෙයි. හැබැයි, මොකක්ද කරලා තිබෙන්නේ? කලා වැවේ වැව් බැම්මේ බෝඩ් එකක සඳහන් කර තිබෙනවා, මාතර ප්‍රදේශයේ ගෙවල් 25ක් විවෘත කරනවා කියලා. මේ ආකාරයට මේ ආණ්ඩුව ප්‍රචාරණය සඳහා කෝටි ගණන් වියදම් කරනවා. මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ? මේ රටේ ජනතාවගේ සල්ලි විවිධාකාර විධියට, අනවශ්‍ය විධියට වියදම් කරලා ජනතාවට බර පටවනවා. ආර්ථික නිදහස ලබා දීලා මේ රට සුබිත මුදිත කරනවාය කියපු ආණ්ඩුව අද කරලා තිබෙන දේ මොකක්ද බලන්න. අද ජීවත් වෙන්න බැරිව සමහර අය මැරිලා යනවා; සමහරු ජීවිත විනාශ කර ගන්නවා. අපි ඊයේ පෙරේදා පුවත් පත්වල දැක්කා, අම්මායි දුවයි දෙන්නා දුම්රියට පැනලා ජීවිතය පූජා කරන්න පාර අයිනේ අඬ අඬා ඉන්නා පුවතක්. ඇත්ත වශයෙන්ම මේක විශාල ජාතික ප්‍රශ්නයක්. එහෙම තත්ත්වයක් තිබියදී, මේ රටේ ජනතාව දුක් විඳිද්දී මේ රටේ ඇමතිවරුන් ජනතාවට ලැබෙන්න තිබෙන දේ ලබා දෙන්නේ නැතිව නතර කර තිබෙනවා, ඒවා උත්සව පවත්වලා තමන්ගේම අතින් ලබා දෙන්න ඕනෑ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හොරොව්පතාන ප්‍රදේශයේ යාන්ඔය ව්‍යාපෘතිය ගැන කියන්න ඕනෑ. දැන් යාන්ඔය පිරිලා; වතුර ඇරලා. ඒ ගොවීන්ගේ ගොවි බිම් වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලක්ෂ 300ක චෙක් පත් ලියා තිබෙනවා. ඒ චෙක් පත් ලියා දැනට මාස හතරක් පහක් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු එස්.සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තවත් ටික වෙලාවක් දෙන්න.

ඒ චෙක් පත් ලියා අවසන් වෙලා මාස තුනහතරක් වෙනවා. නමුත්, ඒ චෙක් පත් ටික ජනතාවට දෙන්නේ නැහැ, උත්සවය පවත්වන්න ඇමතිවරයා යන්න ඕනෑ කියලා. අද මේ විධියට මේ රටේ ජනතාව පීඩනයෙන් පීඩනයට පත් වෙලා ඉන්නවා. මෙහෙව් ඇමතිවරුන් තමයි මේ රට පාලනය කරන්නේ. අපි මේ විශ්වාසභංග යෝජනාවට පක්ෂව ඡන්දය පාවිච්චි කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[2.25 p.m.]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

Mr. Deputy Chairman of Committees, we are debating today a No-Confidence Motion in the Government. I decided to speak in English because the circumstances which led to the Easter Sunday attacks were really inspired by global terrorism.

I want to say why we need to have confidence in our Government. What has this Government done since coming to power in 2015? We have focused on the politics of unity built on key principles. We have tried

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

hard to build an inclusive Sri Lanka. In our efforts, we established the Office for National Unity and Reconciliation and the National Reconciliation Policy was adopted in 2017. We established the Office on Missing Persons in 2017 to help bring justice and closure to the families who have lost loved ones in a conflict. We passed the Office for Reparations Act in 2018 and established the Office for Reparations to provide compensation for those who were victimized during this period.

We have focused on reconciliation through economic development, which includes avenues of debt relief for communities in the Northern and Eastern Provinces, injecting cash into Government-run reconciliation programmes. In terms of individual freedoms, we have also achieved much during this period. The Government has passed tough, major governance reforms and institutionalized basically the rule of law in Sri Lanka and have upheld individual freedoms. We started by passing the Nineteenth Amendment to the Constitution, which has come in for much discussion in the recent period. We established the Constitutional Council and curtailed the powers of the Executive President and constituted Independent Commissions to ensure that all future decisions will be taken free of politicization. We passed the Right to Information Act in 2016 to give the civil society the tools to question the Government and thereby, facilitate transparency.

Prior to 2015, there were abductions, death threats and other means used to silence those who were opposed to the then Government. Since our Government came into office, we have ensured freedom of speech and civil rights to oppose the Government, protest and to express people's views without fear. We saw the strength of the civil society during the Constitutional coup in October last year. Not only was the civil society freer, but the judicial system of this country also worked and we saw it for ourselves. The Supreme Court's Ruling given in December, 2018 was clear evidence of how far we have come over the past four years. We still need to go further, but we have achieved much. We must consider the reasons for the Easter Sunday attacks and the attacks in Gampaha and Wayamba recently in this light. We do not condone for a moment the Easter Sunday attacks. We apologized for the failure of the Government in preventing what really happened.

Sadly, violence against Muslim families and businesses in Minuwangoda and other areas was unleashed by those who cannot politically survive in a free and inclusive society. These politicians have been looking for a new scapegoat and their political careers thrive on hatred. Sadly these individuals have systematically used the Easter Sunday attacks to plant suspicion in the hearts of Sri Lankans. By Stories of forced sterilization, proliferation of "Buy Sinhala" Facebook groups and shaming of children using "Atlas" products, they want us all to feel victimized and threatened by our neighbour to perpetuate the dark fear we felt on April 21st. These stories paint a narrow form of nationalism that politicians also advance by drawing fantasies about the SOFA and MCC Agreement with the Untied States of America.

Sir, I would like, for a moment, to talk about the MCC Agreement. The MCC Agreement was pioneered by Prof. Ricardo Hausmann of Harvard University, identifying two key binding constraints on Sri Lanka's growth. One is economic growth because of weak transport infrastructure and the other is, land administration practices.

The transport project is budgeted at US Dollars 350 million and aims to improve urban and rural mobility in the Western, Central, Sabaragamuwa and Uva Provinces. First, it will reduce traffic congestion and improve public transportation in the Colombo Metropolitan Region. Getting transport right will make Colombo a more livable, well-functioning city with better connectivity.

The land project is budgeted at US Dollars 67 million and aims to expand and improve the existing GOSL initiatives to increase the availability of land rights. This project will help identify underutilized State lands and maximize rents from State lands. Most importantly, it certifies each individual's right to the land that they own. Digitizing deeds will make them less vulnerable to damage, theft and loss. This is what the MCC project is about and it has been discussed over a long period of time, since 2016.

Sir, there has been a lot of public scrutiny regarding ACSA - Acquisition and Cross-Servicing Agreement. This was first signed by Mr. Gotabaya Rajapaksa in 2007 and the details of that Agreement were not made public. We have extended and re-signed it and the details have still not been made public.

SOFA is another agreement. It is important to note that both these Agreements are standard Agreements that the USA has made with many other countries. These Agreements have been signed with nearly 100 countries. Our Government will not sign an agreement which is detrimental to the citizens of this country. We have not signed the SOFA, and the public debate on SOFA is welcome.

Being nationalistic and outward-looking are not mutually exclusive. Racism and fear disguised as nationalism have been used as a political tool. There is no room for racism in a peaceful and thriving society. Even as we see a global rise of intolerant governments that use racist rhetoric, the people in every such country of the world have continued to speak out against it. Governments will change, sometimes quite unexpectedly as we saw recently, but people and the society that they chose to make for themselves will remain.

Sir, I am reminded of a story some 40 years ago of the United States of America. When the United States of America was a very racist society, Martin Luther King spoke out against discrimination against the Black. It was his dream that has come about. He said, "We must

learn to live together as brothers or perish together as fools. We must come to see that the end we seek is a society at peace with itself, a society that can live with its conscience."

I want to wind up my speech with this, Sir. I was also a foreign student in a different land before I came back for my postgraduate education. A black African student had come to the United States of America and had given birth to a child through a white woman. But, when he returned to his home country, that black child had the opportunity of becoming the President of the United States of America. We must create unity, equality and peace. That is the Sri Lanka we must create. Mahatma Gandhi said, "An eye for an eye only ends up making the whole world blind".

Let us together create meritocracy. Everything must not depend on age and experience only, but let us create meritocracy. Whenever there is a promotion or an appointment, it must be made based on merit. Let us look at people and see whether they are fit and proper for the task that is ahead.

I am calling upon this House to defeat this Motion of No-Confidence. Thank you, Sir, for the time extended to me.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Sunil Handunnetti. Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to the Chair?

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் உலர் வலய அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs and Dry Zone Development)

Sir, I propose that the Hon. (Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

[අ.භා.2.34]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ලැබී තිබෙන කෙටි වේලාවේදී විශ්වාස භංග යෝජනාවේ තිබෙන කරුණු පිළිබඳව දිගින් දිගට සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, අපේ පැත්තෙන් අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරද්දී ඒ කරුණුවලට අදාළව සැලකිය යුතු, ප්‍රමාණවත් අවබෝධයක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට සහ ජනතාවට ලබා දුන්නාය කියලා මම විශ්වාස කරන නිසා. නමුත්, මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය කරගෙන යනකොට මතු වූ තවත් කරුණු ගණනාවක් තිබෙනවා. එසේ මතු වූ කරුණු මේ විශ්වාස භංග යෝජනාවට මුහුණ දෙන ආණ්ඩු පක්ෂයෙනුත් මතු වෙනවා; විපක්ෂයෙනුත් මතු වෙනවා. විපක්ෂය හැටියට ඒකාබද්ධ විපක්ෂයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායම මේ විශ්වාස භංග යෝජනාවට සහාය දෙනවාය කියන කාරණය ඉදිරිපත් කරන ගමන්, එතුමන්ලා ඉදිරිපත් කරන තර්ක කිහිපයක් තිබෙනවා.

එකක් තමයි, "අපිත් එක්ක කථා කරලා මේ යෝජනාව ගෙනාවේ නැහැ" කියන එක. දෙවැනි තර්කය තමයි ජනතා විමුක්ති පෙරමුණ මේ ආණ්ඩුව හදන්න 2015දී උදවු කරලා, මේ ආණ්ඩුව රකින ගමන්, දැන් මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවාය කියන එක. මේ විශ්වාස භංග යෝජනාව අපි න්‍යාය පුස්තකයට ඇතුළත් කරන වේලාවේත් මාධ්‍ය තුළත්, රටේත් මේ මතයම හදන්න එතුමන්ලා උත්සාහ කළා. ආණ්ඩුව රකින්න අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනැත් තිබෙනවාය කියන කාරණයත් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාරණාව ගැන කිව්වොත්, 2015 අගෝස්තු මාසයේ 16වැනි දින මහ මැතිවරණයෙන් මේ ආණ්ඩුව පිහිටෙව්වේ රනිල් වික්‍රමසිංහ මහත්මයා විතරක් හදපු ආණ්ඩුවක් විධියට නොවෙයි; ජනතා විමුක්ති පෙරමුණේ අපි හයදෙනා සම්මාදම් වෙලා, දායක වෙලා නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ අගමැති ධුරය රැකලා දුන්නේ එදා මේ ඒකාබද්ධ විපක්ෂයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරග කරපු මන්ත්‍රීවරු. මන්ත්‍රී ධුර 140ක් විතර තියාගෙන, ආණ්ඩුවක් හදන්න පුළුවන්කම තිබියදී, රනිල් වික්‍රමසිංහ මහත්මයාට ආණ්ඩුවක් හදලා දුන්නේ අනුර දිසානායක මන්ත්‍රීතුමාවත්, ජනතා විමුක්ති පෙරමුණේ අපිවත් නොවෙයි, එදා එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය අරගෙන ගිහින් මේ ආණ්ඩුවේ ඇමතිකම් ගත්ත කට්ටියයි. දැන් අපට කලින් කථා කරපු මන්ත්‍රීතුමන්ලාත් එක්ක, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමන්ලාත් එක්ක එක ලැයිස්තුවේ තරග කරපු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා එක්සත් ජනතා සන්ධානයෙන්, බුලත් කොළයෙන් ඡන්ද අරගෙන ගිහින් වාඩි වුණේ කොයි පැත්තේද කියලා අපි අහනවා. අගමැතිකම දෙන්න ඡන්දය දුන්නේ කාටද? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවක් හදාගන්න තමයි එතුමන්ලා මැතිවරණය කළේ. හැබැයි, හැදුවේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවක්. ඒ අය තමයි ඒ කැබිනට් මණ්ඩලයේ හිටියේ. ප්‍රශ්නය තිබෙන්නේ අගෝස්තු 16වැනි දින අනුර යාපා මන්ත්‍රීතුමා, ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා, තව ගොඩක් අය -මම ඒ ලැයිස්තුව කියන්න යන්නේ නැහැ- එකතු වෙලා ආණ්ඩුවක් හැදුවා. ඒ බව මේ රටේ ජනතාව දන්නවා. ඊට පසුව ඔක්තෝබර් 26වන දා මොකද කළේ? තව කණ්ඩායමක්, එක්සත් ජාතික පක්ෂයේ කට්ටියක් එකතු වෙලා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවක් හැදුවා. එතකොට රනිල් වික්‍රමසිංහ මහත්මයාට ආණ්ඩුවක් හදන්න උදවු කළේ, බුලත් කොළෙන් ඡන්දය ගත්ත කට්ටියයි; එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය ගත්ත කට්ටියයි; අපි නොවෙයි. නැවතත් මහින්ද රාජපක්ෂ මහත්මයාට ආණ්ඩුවක් හදන්න ඔක්තෝබර් මාසයේ 26වැනි දින එක්සත් ජාතික පක්ෂයෙන් ආපු කීපදෙනෙක් මේ පැත්තෙන් වාඩි වෙලා උදවු කළා. ඒ අපි නොවෙයි. එතකොට ආණ්ඩුවට උදවු කළේ කවුද? අපි අහනවා, ඒ අපිද කියලා. ඒ නිසා වැරැදි තැන්වල වාඩි වෙලා කථා කරන්න එපා. මේවා දේව වාක්‍ය වාගේ. විපක්ෂයේ මන්ත්‍රීවරු විශ්වාස භංගය ගැන කථා කරනකොට හැම තිස්සේම පටන් ගන්නේ කොතැනින්ද? ජනතා විමුක්ති පෙරමුණට

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගහගෙන; ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුව රකිනවා කියාගෙන. හැබැයි, ඒ දේව වාක්‍ය එතුමන්ලාටයි අදාළ. මොකද, මෙච්චර කල් එතුමන්ලා තමයි ආණ්ඩුව රැකලා තිබෙන්නේ. අය වැය විවාදයේදීත් එහෙමයි. රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව ගෙනාපු විශ්වාස භංග යෝජනාවේදී 76දෙනායි මේ පැත්තේ හිටියේ. පාර්ලිමේන්තුවට 95දෙනෙක් ඇවිත්, 76දෙනයි හිටියේ. එයින් හයදෙනෙක් අපි. මෙතුමන්ලාගේ 70දෙනයි. හැබැයි, අපට මෙතුමන්ලා කිව්වේ නැහැ, "අපි රනිල් වික්‍රමසිංහ මහත්තයාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙනවා, ඔයගොල්ලන් එන්න, අපේ 95 දෙනාම එනවා. අපි ඔක්කෝම එකතු වෙලා ඒ ගැන කටයුතු කරමු" කියලා. එහෙම කථා කර ගත්තේ නැහැ. කථා කරගන්න දෙයක් එතැන තිබුණෙු නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙනකොට, ආයෙත් අපෙන් අහන්න දෙයක් තිබෙනවාද? අපේ කුස්සියට ඇවිල්ලා කථා කරන්න ඕනෑ නැහැ. අපේ කාමරවලට ඇවිල්ලා කථා කරන්න ඕනෑ නැහැ. අපි දන්නවා කරන්න ඕනෑ දේ. අපි විශ්වාසභංග යෝජනාවක් ගෙනාවාම ඒක සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ලියලා තිබෙනවා. භාෂාව තේරෙනවා නම්, අකුරු කියවන්න පුළුවන් නම් ඒක තේරුම් ගන්න පුළුවන්. අනුර දිසානායක මන්ත්‍රීතුමා ඊයේ පැයක් විතර කියපු ටික අහගෙන හිටියා නම්, මේ විශ්වාසභංග යෝජනාව ගෙනැත් තිබෙන්නේ මොකටද කියලා නොතේරෙන කෙනෙකුට වුණත් තේරෙනවා. එතකොට ආයෙත් අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ. මේ "කුටු කුටු ගාන්න" එන්න කියන්නේ මොකටද? මේ කථා කරගන්න එන්න කියන්නේ මොකටද? ආයෙත් ඒ ගැන කාමර ගණනේ කථා කරන්න දෙයක් නැහැ. අපි කථා කරන්නේත් නැහැ. එතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාවට සහය දෙනවා නම් දෙගිඩියාවකින් තොරව සහය දෙන්න පුළුවන්. අපට තිබෙන ප්‍රශ්නය, මේ කෙකර ගාන්නේ මේ විශ්වාස භංග යෝජනාවට සහය දෙන්න වුවමනාවකට ද, එහෙම නැත්නම් ආයෙත් අර කලින් බිත්තර රැක්කා වාගේ රකින්න වුවමනාවකට ද කියන එකයි. ආණ්ඩු රැක්කේ මෙතුමන්ලා. කනගාටුවෙන් වුණත් මේ කියන්නේ ඇත්ත.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අනෙක් කාරණාව මෙයයි. ඇත්තටම දැන් අපට කථා කරන්න ඕනෑ නැහැ. රවි කරුණානායක මැතිතුමාට විරුද්ධව විශ්වාස භංග යෝජනාව ගෙනා අවස්ථාවේදී කවුරුවත් අප සමඟ කථා කළේ නැහැ. අපි අහන්නේ, කථා කරන්න තිබෙන්නේ මොකක්ද කියලායි. මොකක්ද කථා කරන්න තිබෙන ඕනෑකම? මොනවාද ඒ ගැන කියන්න තිබෙන්නේ? එතුමන්ලාට භාෂාව තේරෙන්නේ නැද්ද? වචන තේරෙන්නේ නැද්ද? අපට විපක්ෂ නායකතුමාගෙන්, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් එක ඉල්ලීමයි කරන්න තිබෙන්නේ. දැන් ඔබතුමන්ලාට පක්ෂව මන්ත්‍රීවරුන් 97 දෙනෙක් ඉන්නවා. ඔක්තෝබර් 26වෙනි දා ඒ කුමන්ත්‍රණය කරපු වෙලාවේ එකතු කර ගත්ත අයත් එක්ක විපක්ෂයේ මන්ත්‍රීවරු 91දෙනෙක් ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයෙන් ගත්ත **5** දෙනෙක් ඉන්නවා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමෙක් ඉන්නවා. අන්න, ඒ 97 දෙනා අද හවසට ගෙන්වන්න. ඒ වගකීම තිබෙන්නේ අපි 6 දෙනාට නොවෙයි නේ. අපට කෙකර ගාන්නේ නැතිව, අපට කෑ ගහන්නේ නැතිව ඒ 97 දෙනා පුළුවන් නම් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න. මම හිතන්නේ දැන් ඒක තමයි විපක්ෂ නායකතුමාට තිබෙන අභියෝගය සහ වගකීම. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් එහෙට මෙහෙට පැනලා ලැගලා ඉන්න කට්ටියයි, ඒ වාගේම විපක්ෂ නායකතුමා ඔක්තෝබර් මාසයේ 26වෙනි දා කුමන්ත්‍රණය කරලා හදා ගත්ත කැබිනට් මණ්ඩලයට පත් කරපු අයයි ඉන්නවානේ. ඒ ගොල්ලන් කැබිනට් ඇමතිවරු. මහින්ද රාජපක්ෂ අගමැතිතුමා -ඒ මොහොතේ, දින 51 අගමැතිතුමා- විශ්වාස කළ පරිදි වඩාත් විශ්වාසවන්තම පිරිස තමයි එතුමා කැබිනට් මණ්ඩලයට නම් කළේ. එතුමන්ලා අද ඉන්නවා. මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමාත් ඉන්නවා. අන්න! පුළුවන් නම් දැන් එතුමන්ලා අද ගෙන්වා ගන්න. එදා කැබිනට් ඇමතිකම් දුන්නේ ඒ කට්ටියට. ඒ ගොල්ලන් තමයි වඩාත් විශ්වාසවන්තම කට්ටිය. ඒ කැබිනට් මණ්ඩලයේ ගාමිණී විජිත් විජිතමුණි සොයිසා මැතිතුමා හිටියා. අද එතුමාත් ගෙන්වා ගන්න. එදා විශ්වාසවන්තම කට්ටියට තමයි ඒ කුමන්ත්‍රණය කරලා ඇමතිකම් දුන්නේ. අපි තමුන්නාන්සේලාට කියනවා, පුළුවන් නම් දැන් ඒ 97 දෙනා ගෙන්වා ගන්න කියලා. එතකොට බලන්න පුළුවන් මොකද වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට ආණ්ඩුවටත් කියන්න දෙයක් තිබෙනවා. දැන් ආණ්ඩුවෙන් කියනවා, මේ විශ්වාසභංග යෝජනාවට ආරක්ෂක ඇමතිතුමාත් ඇතුළත් කරලා ගෙනාවේ නැත්තේ මොකද කියලා. ඒ කියන්නේ මේ විශ්වාසභංග යෝජනාවේ කරුණු ටික ඔබතුමන්ලා පිළිඅරගෙන ඉවරයි කියන එක. විශ්වාසභංග යෝජනාවේ කරුණු අනුව ආණ්ඩුවම කියන්නේ, "විශ්වාසය භංග වෙච්ච එක හරි. මේ ප්‍රහාරයට වග කියන්න ඕනෑ ආණ්ඩුවමයි. හැබැයි, අපි විතරක් නොවෙයි, අරයාත් ඉන්නවා, ඒ හාමුදුරුවන්ටත් බෙදන්න" කියලා. "අරයාත් ඉන්නවා, එයාවත් ගෙන්වා ගන්න" කියලායි කියන්නේ. හැබැයි, අපි ඒක නොදැන නොවෙයි, එයා ඇතුළු නොකළේ. අපි එතුමාත් ඇතුළත් කරලා ගෙනාවා නම් මේ විශ්වාසභංග යෝජනාවේ විෂය පථයට ගැළපෙන්නේ නැහැයි කියලා කථානායකතුමා ඒ කොටස ඉවත් කරනවා. මොකද හේතුව, එතැනදී ගෙනෙන්න ඕනෑ විශ්වාසභංග යෝජනාවක් නොවෙයි, දෝෂාභියෝගයක්. ඒ දෝෂාභියෝගය ගෙනෙන්න අපි 6 දෙනාට බැහැ. ඒකට 75දෙනෙක් ඕනෑ. මේ විශ්වාසභංග යෝජනාව කරුණු අනුව හරි කියලා දැන් ඔබතුමන්ලා පිළිගන්නවා නම් මම ඔබතුමන්ලාට කියනවා දෝෂාභියෝගයත් ගෙනෙන්න කියලා. ඒ දෝෂාභියෝගය ගෙනෙන්න පාර්ලිමේන්තුවේ මේ පැත්තේ 90 දෙනෙක් ඉන්නවා. අනෙක් පැත්තේත් ඉන්නවා 106 දෙනෙක්. ඒ දෙගොල්ලන්ටම එකතු වෙලා ඒක ගෙනෙන්න පුළුවන්. දෝෂාභියෝගයක් ගෙනෙන කොට අපි ඒකට මොකද කරන්නේ කියන එක, ඒකට සහය දෙන එක ගැන අපට විවාද ඕනෑ නැහැ. ඒ ගැන අපෙන් අහන්න එන්න ඕනෑත් නැහැ. අපට ඒකට සහාය දෙන්න පුළුවන්. ආණ්ඩුවේ හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා, "මේ විශ්වාස භංග යෝජනාව අපි ආණ්ඩුවක් හැටියට පරද්දන්න කටයුතු කළාට, අඩංගු මේ කරුණුවලට එකඟයි" කියලා. එතුමා කියපු දේම තමයි සමහර අය කියන්නේ. "ඇයි, අපට විතරක් ගෙනෙන්නේ, ජනාධිපතිතුමාත් ඇතුළත් කරලා ගෙනෙන්න" කියලායි කියන්නේ. එහෙම කියන කොටම විශ්වාස භංග යෝජනාවේ තිබෙන කරුණු අනුව, මේ ආණ්ඩුව කෙරෙහි තිබුණු විශ්වාසය භංග වෙලා තිබෙනවාය කියන එක පිළිගෙන ඉවරයි. ඒකෙන්ම මේ විශ්වාස භංගය අපි දිනලා ඉවරයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකෙන්ම අපි දිනලා ඉවරයි. මොකද, මේ ආණ්ඩුව කියනවා නේ, ආරක්ෂක ඇමතිතුමාත් මේකට ඇතුළත් කරන්න කියලා. සාමාන්‍යයෙන් එහෙම වෙනවා හොරකම් කරන්න ගිහිල්ලා අහු වුණාමත්. පොලීසියෙන් දෙකක් දෙන කොට කියනවා, "මම විතරක් නොවෙයි, අරයාත් හිටියා" කියලා. දැන් හුඟක් දෙනෙක් එහෙම කිව්වා. "අපි විතරක් නොවෙයි, අරයාත් ඉන්නවා, මෙයාත් ඉන්නවා" කියලා කිව්වා. ඒකත් එක තර්කයක්. ඒ නිසා ඉතාම පැහැදිලියි, මේ ආණ්ඩුව ජනතාවට වග කියන ආණ්ඩුවක් නොවෙයි කියන එක.

ඒ වාගේම, මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා ජයග්‍රහණය කරලා, ආණ්ඩුවක් හදන්නත් ඒ ආණ්ඩුවේ බහුතරය කවුද කියලා හොයන්නත් මේ පාර්ලිමේන්තුවට අයිතියක් නැහැ. මොකද, මේක විකෘති පාර්ලිමේන්තුවක්; මහජන වරම විකෘති කරපු පාර්ලිමේන්තුවක්. ඒ නිසා මේ පාර්ලිමේන්තුව ආයෙත් ආණ්ඩු හදන එක නොවෙයි කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුව

විසුරවලා මේ රටේ ජනතාවට අවස්ථාව දෙන්න ඕනෑ ජන වරමට ගරු කරන, ජන වරමට එකඟ පාර්ලිමේන්තුවක් හදන්න. ඒකාබද්ධ විපක්ෂයේ මහත්වරු නිතරම අපට ඇඟිල්ල දිගු කරලා කියන කථාවක් තමයි, "ඔයගොල්ලන් අද ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංගයක් ගෙනාවා නම්, ඔක්තෝබර් 26 ගෙනාපු ආණ්ඩුව රැක්කේ නැත්තේ ඇයි" කියන එක. ඔක්තෝබර් 26 කුමන්ත්‍රණය රැක්කෙ නැත්තේ මොකද කියලා අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපට මේ පාර්ලිමේන්තුවේ සිටින ඔළු ගෙඩි ගණන වැදගත් නැහැ කියන ඒක අපි අදත් කියනවා. 10ක්, 20ක්, 30ක්, 40ක් වෙන්න පුළුවන්, අපි 06 දෙනා වෙන්න පුළුවන්, පසුගිය ඔක්තෝබර් 26 වැනි දා කළ ජාතියේ කුප්‍රකට කුමන්ත්‍රණය නැවත කළොත්, ඒ කුමන්ත්‍රණය පරාජය කරන්නත් අපි හෙට කටයුතු කරනවා. ඒක ශ්‍රේෂ්ඨාධිකරණය විතරක් නොවෙයි, මේ රටේ ජනතාවත් අනුමත කරනවා ඇතැයි කියලා අපි විශ්වාස කරනවා. අපි පිළිගන්නේ නැහැ, මේ ව්‍යවස්ථාව සර්ව සම්පූර්ණ වශයෙන් උත්තරීතරයි කියලා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යම් රටක පැවැත්මට ඒ රටේ මහජනතාව අනුමත කරපු යම් හෝ ව්‍යවස්ථාවක් තිබෙනවා නම්, එම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම ක්‍රමවේදයක්.

පසුගිය ඔක්තෝබර් 26වැනි දා ඒකාබද්ධ විපක්ෂයේ තමුන්නාන්සේලා මේ වාගේ විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා නම්, ඒ විශ්වාස භංගයේ කරුණු අනුව මේ ආණ්ඩුව ගෙදර යවන්න ඕනෑය කියලා පාර්ලිමේන්තු ක්‍රමයට ආවා නම්, මිරිස් කුඩු ගහන්නේ නැතිව, මරා ගන්න එන්නේ නැතිව, කථානායක පුටුව පෙරළන්නේ නැතිව ආවා නම් අපි එකඟ වෙනවා. එදා මහ රෑ ඇමතිකම් දුන්නා. විනාඩි 45ක් පමණ ඇමතිකම දරපු ඇමතිවරුත් හිටියා. විනාඩි 45යි! රාත්‍රී 9.30ට විතර ඇමතිකම භාර ගන්නවා, අභයාරාමයට යනවා, එතැන ආගමික වතාවත් කරනවා, 10.15ට අමාත්‍යාංශයට යනවා, 10.45ට විතර ඇමතිකම නැහැ. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගිනස් වාර්තා පොතට යනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම ඇමතිවරුත් හිටියා. ඒ වාගේ කුප්‍රකට, යටි කුමන්ත්‍රණ, ඩීල්වලට අපි එකඟ නැහැ. ඒ නිසා ඔක්තෝබර් 26 වැනි දා වාගේ කුමන්ත්‍රණයක් ආයෙත් ආවොත් ඒක එක්සත් ජාතික පක්ෂයෙන් - ඒ පැත්තෙන්- ආවාද, මේ පැත්තෙන් ආවාද කියන එක අපට වැදගත් නැහැ. ඒක පරාජය කරන්න අපි කටයුතු කරනවා. හැබැයි, දැන් අපි මේ අනුගමනය කර තිබෙන ක්‍රමය තමයි ජන සම්මත ක්‍රමය. මේක තමයි ව්‍යවස්ථානුකූල ක්‍රමය. එදා තමුන්නාන්සේලාත් මේ ක්‍රමයට ආවා නම් ජනතා විමුක්ති පෙරමුණේ අපි හය දෙනාගේ සහයෝගයත් ගන්න තිබුණා. ඒකාබද්ධ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු හෘදය සාක්ෂියට එකඟව අදත් පිළිගන්නවා, ඒ ජාතියේ බාල ගේම් එකකට යන්නේ නැතිව, ළඟ බලය අල්ලන ගේම් එකකට යන්නේ නැතිව වැදගත් විධියට ඒ වැඩේ කරන්න තිබුණාය කියන එක. දැන් මහින්ද රාජපක්ෂ මහත්මයාත් ඒක පිළිගන්නවා. ජනාධිපතිතුමා එක්ක ඒ ගහපු ගැහිල්ල ගහලා දිගටම ආවා නම් නියම ගේම් එකක් බලන්න තිබුණා අපට. මේ රටේ හොඳම විහිළුව වෙන්නේ එහෙනම් ඒකයි. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, ඔබතුමන්ලා අද මේ විධියට බේරිලා ඉන්නේ වාසනාවකට.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලාත් බේරිලා ඉන්නේ වාසනාවකට.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මේ නටන පිස්සු නැටිල්ලේ හැටියට ඔබතුමන්ලාට තමයි ඔබතුමන්ලා හදා ගන්නා ජනාධිපතිතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙනෙන්න වෙන්නේ. ඒකයි ඇත්ත තත්ත්වය. ඒ නිසා නැවතත් මේ රටේ ජනතාවට අවස්ථාවක් ඕනෑය කියන එක අපි විශේෂයෙන් කියනවා. මේ පාර්ලිමේන්තුව විකෘතියක්. ඒක අපි කවුරුත් පිළිගන්නවා. මේ පාර්ලිමේන්තුව දැන් ජනවරම නියෝජනය කරන්නේ නැහැ. දැන් මන්ත්‍රීවරයකු දිහා බැලුවොත්, ජනතාවට කියන්න බැහැ කොයි පැත්තේද ඉන්නේ කියලා. එහෙට පැනලා, මෙහෙට පැනලා, ආයෙත් එහෙට පනිනවා. හොඳම උදාහරණය තමයි ගාමිණී විජිත් විජයමුණි සොයිසා මන්ත්‍රීතුමා. අද එතුමා කොයි පැත්තේද ඉන්නේ? දැන් කාගෙන්ද ඡන්දය අරගෙන තිබෙන්නේ? කොයි පැත්තෙන්ද එතුමාට ඡන්දය දෙන්නේ?

විශේෂයෙන්ම දෙමළ ජාතික සන්ධානයට- දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ට - අද ලොකු වග කීමක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු, උතුරේ ජනතාවගේ විතරක් නොවෙයි මේ රටේ ජනතාවගේ යම් නියෝජනයක් අති විශාල විධියට නියෝජනය කරන්නට පුළුවන් මන්ත්‍රීවරුන් කියලා අපි විශ්වාස කරනවා. ඒ ඡන්ද ප්‍රමාණය, මන්ත්‍රී ධුර ප්‍රමාණය මේ මොහොතේ දී ඉතාම බාල විධියට, ලාභ විධියට ආණ්ඩුව ආරක්ෂා කරන්න යොදවන්න එපා. මේ සිදු වූ ප්‍රහාරය නිසා ඇති වූ අනාරක්ෂිතභාවය උතුරු නැඟෙනහිර ඔබතුමන්ලාට හෙට ඇති වෙන්නට පුළුවන්. විශේෂයෙන් නැඟෙනහිර, මඩකලපු ජනතාවට ඇති වෙන්න පුළුවන්. ඒක අදත් සිද්ධ වෙලා තිබෙනවා, සිද්ධ වෙමින් තිබෙනවා. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේ විශ්වාස භංග යෝජනාව හොඳට කියවන්න කියලා. මේ ආණ්ඩුව, මහජන ආරක්ෂාව සලසන්න පුළුවන් ආණ්ඩුවක් නොවෙයි කියන එකයි අපි කියන්නේ. මේ යෝජනාව හොඳට කියවා බැලුවොත් ඔබතුමන්ලාට ඒක පෙනෙයි. හිටපු විපක්ෂනායකතුමා වාගේම මාවෙ සේනාධිරාජා මන්ත්‍රීතුමන්ලා වැදගත් දේශපාලනයක් කරන්නට පුළුවන් අය; වැදගත් දේශපාලනයක් කළ අය; පාර්ලිමේන්තු ඉතිහාසයක් තිබෙන අය. ඒ නිසා අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. අපි මේ ආණ්ඩුව මේ යන ගමන නතර කරමු. එසේ නතර කරන්න කියන්නේ නැවත මේ ජාතියේ විකෘති පාර්ලිමේන්තුවක් හදන්න නොවෙයි. ජනතාවට වග කියන, ජනතා නියෝජනයක් තිබෙන, ඔබතුමන්ලාගේ නියෝජිතයන්ට පවා පැහැදිලි නියෝජනයක් තිබෙන පාර්ලිමේන්තුවක් හදන්න අවශ්‍ය ඉඩ කඩ මේ රටේ ජනතාවට හදා දෙන්නයි. ඒ සඳහා ඔබතුමන්ලාගේ ඡන්දය අද දිනයේ දී වැදගත් විධියට පාවිච්චි කරන්න. ඒ වාගේම විපක්ෂ නායකතුමා, විපක්ෂනායක කාර්යභාරය කරලා ඔබතුමාත් එක්ක ඉන්න 97 දෙනා පාර්ලිමේන්තුවට කැඳවා ගන්න කියා ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.2.50]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණෙන් ආණ්ඩුවට විරුද්ධව ගෙනාපු විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගැන ස්තුතිවන්ත වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ විශාල බාධාක මැද්දේ, අවලාද මැද්දේ, මඩ ප්‍රහාර මැද්දේ තමයි මේ විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ. තමුන්නාන්සේලා වාඩි වෙලා සිටින පැත්තේ විපක්ෂයේ මන්ත්‍රීවරු රාශියක්ම ජනතා විමුක්ති පෙරමුණ මෙම විශ්වාස භංග යෝජනාව ගෙන ඒම ගැන ආශිර්වාද කළාට වඩා චෝදනාවන් තමයි එල්ල කළේ. තමුන්නාන්සේලා පිළිබඳ වැරදි අදහසක් එතුමන්ලා මේ ගරු සභාව තුළ මතු කරන්නට උත්සාහ කළා, ජනතා විමුක්ති පෙරමුණ පසු ගිය කාලයේ මේ ආණ්ඩුව ආරක්ෂා කරන්න වැඩ කළා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යහපාලන ආණ්ඩුව බලයට ආවාට පස්සේ ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රතිසංස්කරණ, ඒ වාගේම යම් යම් ස්වාධීන කර්තව්‍ය වෙනුවෙන් -මේ රටේ නීතියේ ආධිපත්‍යය වැනි කරුණු කාරණාවලදී- මේ රජය ගෙන ආපු ප්‍රතිසංස්කරණ යෝජනාත් එක්ක එකට වැඩ කළ බව අපි දන්නවා. ඒවාට ජනතා විමුක්ති පෙරමුණ සහයෝගය ලබා දීලා තිබෙනවා. විශේෂයෙන්ම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ගෙනාපු බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණවල දී ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුව තුළදී විශාල සහයෝගයක් ලබා දුන් පක්ෂයක්. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණ එතුමන්ලාගේ දේශපාලන ඉතිහාසය තුළ ගත් යම් යම් වැරදි තීන්දු තීරණ වෙනස් කර ගෙන තිබෙනවා. ලෝකයත් එක්ක ඉදිරියට යන්න ඕනෑය කියන එක ගැන, බලය බෙදීම ගැන, ජාතික ප්‍රශ්නය ගැන එදා දරපු අදහස්වලට වඩා ප්‍රගතිශීලි අදහස් දරන පක්ෂයක් බවට අද වෙනකොට එම පක්ෂය පරිවර්තනය වෙලා තිබෙනවා. ඒක ගැන අපට කිසිම ගැටලුවක්, වාද විවාදයක් නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ අදහස්, එතුමන්ලාගේ දේශපාලන පක්ෂයේ තිබෙන යම් යම් සක්‍රිය ක්‍රියාදාම මේ රටට වැදගත් කියලා අපිත් හිතනවා. ඒ වාගේම, ජනතා විමුක්ති පෙරමුණ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට ඕනෑය කියන එක ගැන අපට කිසිම වාදයක් විවාදයක් නැහැ.

නමුත් ජනතා විමුක්ති පෙරමුණ මේ ගෙනැවිත් තිබෙන විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරලා, ආණ්ඩුව පරාජයට පත් කරලා මොකක්ද කරන්න යන්නේ කියන ගැටලුව අපට තිබෙනවා. මේ ආණ්ඩුව පරාජය කරලා ඊළඟ ආණ්ඩුවක් මේ පාර්ලිමේන්තුව තුළ හදන්න ජනතා විමුක්ති පෙරමුණට පුළුවන්ද? ඒක කරන්න මේ ජනතා විමුක්ති පෙරමුණට බලයක් නැහැ. එහෙම නම්, මේ ආණ්ඩුව පරාජයට පත් කරලා ඊළඟ ආණ්ඩුව හදන්න පුළුවන් යම් බහුතර බලයක් ඒකාබද්ධ විපක්ෂයට තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ පරිවර්තනය වෙලා, ප්‍රගතිශීලි කර්තව්‍ය රාශියක් කරන්න ආණ්ඩුවත් එක්ක දීර්ඝ ගමනක් ඇවිත් තිබෙනවා. ඒ ප්‍රගතිශීලී වැඩවලට එතුමන්ලාගේ ඡන්දය ලබා දීලා අලුත් ශ්‍රී ලංකාවක් - අලුත් රටක්- හදන්න ආපු ගමන වෙනස් කරලා, දැන් ජනතා විමුක්ති පෙරමුණ නැවත මේ රට ආපස්සට ගෙන යන්නද මේ හදන්නේ? එහෙම නම්, තමුන්නාන්සේලා-අපි පසුගිය කාලයේ කථා කළ පවුල් බලය නැවත මේ රටට ගේන්නද මේ හදන්නේ? එහෙම නැත්නම්, නැවත මේ රටට සුදු වෑන් සංස්කෘතිය ගේන්නද හදන්නේ? එහෙමත් නැත්නම්, මේ රටේ මාධ්‍ය නිදහස විනාශ කළ, මාධ්‍ය ආයතනවලට ගිනි තැබූ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කළ, වර්ගවාදය ජාතිවාදය ඇති කරලා, මේ රට උගන්ඩාව, සිම්බාබ්වේ වාගේ ගෙනයන්න හදපු නායකයන් හිටපු පක්ෂයක් නැවත බලයට ගේන්න ද ජනතා විමුක්ති පෙරමුණ මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ කියන ප්‍රශ්නය අප තුළ මතු වෙලා තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළත් ජනතා විමුක්ති පෙරමුණට ආණ්ඩුක් හදන්න නොහැකි බව අප දන්නවා. මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කළත්, අනුර කුමාර දිසානායක මන්ත්‍රීවරයාට මේ රටේ අගමැති වෙන්න බැහැ. මේ රට ආපස්සට අරගෙන ගිය, තමුන්නාන්සේලා- අපි එකතු වෙලා පරාජයට පත් කළ ඒ පවුල් බලය, මේ රටේ ඒකාධිපතිවාදය ඇති කළ, රටේ මාධ්‍ය නිදහස නැති කළ, වර්ගවාදය ජාතිවාදය ඇති කළ ඒ පාලක පක්ෂය නැවත බලයට ගේන්නද ඔබතුමා මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවේ කියන ගැටලුවත් අප ඉදිරියේ තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 26වන දා මේ රටේ දේශපාලන කුමන්ත්‍රණයක් සිදු වුණා. ඒක ව්‍යවස්ථාමය කුමන්ත්‍රණයක්. ඒ ව්‍යවස්ථාමය කුමන්ත්‍රණයෙන් පස්සේ, මේ රටේ ජනතාවගෙන් ජනාධිපතිතුමාට බලපෑමක් ආවා. පාර්ලමේන්තුවේ බහුතරයත් නැඟී සිට කිව්වා, "මේක ව්‍යවස්ථා විරෝධී කුමන්ත්‍රණයක්" කියලා. මේ රටේ ජනතාව ඡන්දය දීපු ඒ ආණ්ඩුව නැවත පත් කරන්නය කියමින් මේ රටේ ජනතාව වීදිවලට බැහැලා, පාරට බැහැලා උද්ඝෝෂණය කළා. ඒ උද්ඝෝෂණ හමුවේ තමයි ජනාධිපතිතුමා ආපසු හැරුණේ. එතුමා ආපසු හැරිලා අපට නැවත මේ රටේ පාලන බලය ලබා දුන්නා. නමුත්, ජනාධිපතිතුමා එක දෙයක් අපට දුන්නේ නැහැ. ඒක තමයි, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය. ජනාධිපතිතුමා ඒක අපට දුන්නේ නැහැ. ඔක්තෝබර් මාසයේ 26වන දායින් පස්සේ ආරක්ෂක අමාත්‍යාංශයට අමතරව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයත් ජනාධිපතිතුමා එතුමා යටතේ තියාගෙන හිටියා. ඒක එතුමා එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුවට දුන්නේ නැහැ. ඇයි, ඒක දුන්නේ නැත්තේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ ආණ්ඩු දෙකක් තිබෙනවා. එකක් තමයි, ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් තිබෙන ආණ්ඩුව. ඒ ආණ්ඩුවේ ආරක්ෂක කවුන්සලවල රැස්වීමට මහින්ද අමරවීර මන්ත්‍රීතුමා සහභාගි වෙනවා; දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සහභාගි වෙනවා; තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා සහභාගි වෙනවා.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක්ද?

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට අමාත්‍යාංශ දෙකක් හම්බ වුණේ නැහැ කියලා ඔබතුමා දැන් සඳහන් කළා. තමුන්නාන්සේගේ ආණ්ඩුව යටතේ තිබුණු අනෙක් අමාත්‍යාංශවලින් මොනවාද කළේ කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම කථාව කරගෙන යනකොට ඔබතුමාට දැනගන්න පුළුවන් වෙයි අපි ගත්ත අමාත්‍යාංශවලින් මොනවාද කළේ කියලා. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය කියන්නේ, මේ රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් තිබෙන වැදගත්ම අමාත්‍යාංශයයි. ඉතින් මේ නීතිය හා සාමය කියන විෂයය පසුගිය ඔක්තෝබර් 26වන දා සිට ජනාධිපතිතුමා යටතේ තියා ගත්තා. ඒක අපට දුන්නේ නැහැ. ඒ අමාත්‍යාශය තියා ගත්ත එතුමාට විරුද්ධව අද චෝදනා තිබෙනවා.

මේ බෝම්බ පිපිරීමේ සිද්ධියෙන් පස්සේ ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා. මොකක්ද ඒ කමිටුව? නීතිමයභාවයක් නැති, කිසිදු වලංගුභාවයක් නැති ත්‍රිපුද්ගල කමිටුවක් තමයි එතුමා පත් කළේ. ඒ කමිටුවට නීතියෙන් හව්හරණක් නැහැ. ඒකට නීතිමය බලයක් නැහැ. එතුමාට මේ සඳහා විශේෂ ජනාධිපති කොමිසමක් පත් කරන්න තිබුණා නේ. ඒ විශේෂ ජනාධිපති කොමිසම ජනාධිපතිතුමා පත් කළේ නැහැ. ඇයි ඒ? ඒක පත් කළා නම් ජනාධිපතිතුමාත් මේ සිද්ධියේ වරදකාරයා බවට පත් වෙනවා; එතුමා හිතාමතාම එතුමාගේ වගකීම පැහැර හැරියාය කියන කාරණය එළියට එනවා. ඒ විතරක් නොවෙයි, ඒ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව ජනතාව ඉදිරියේ තියන්න ඕනෑ; ඒක ජනතාවට ලබා දෙන්නත් ඕනෑ. ඒ හින්දා ජනාධිපතිතුමා විශේෂ ජනාධිපති කොමිසමක් පත් කළේ නැහැ. ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරලා, ඒ වාර්තාව අනුව තමයි ආරක්ෂක ලේකම්වරයායි, පොලිස්පතිතුමායි හිරේ දැම්මේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජූලි 09වන දා -පෙරේදා- මේ දෙදෙනා සම්බන්ධයෙන් තීන්දුව ලබා දුන් කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්තුමිය හොඳ කථාවක් කියා තිබෙනවා. 2019 ජූලි 10වන දා පළ වූ "ලංකාදීප" පුවත් පතේ 10වන පිටුවේ එතුමිය ලබා දුන් ඒ නියෝගය සඳහන් වෙනවා. එහි එක් කොටසක මෙසේ සඳහන් වෙනවා:

> "ඒ අනුව රාජ්‍ය බුද්ධි සේවාව මෙන්ම පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳ සියලු වගකීම් පැවරෙන්නේ ආරක්ෂක අමාත්‍යවරයා වෙතයි. ආරක්ෂක ලේකම්වරයා හරහා අමාත්‍යවරයාගේ වගකීම ඉටු කරගත නොහැක. මෙවන් වූ බුද්ධි තොරතුරක වගකීම තනිව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා දැරිය යුතු බවට නිගමනය කළ නොහැක. තවද, මෙවන් තොරතුරක් ලද විට ආරක්ෂක අමාත්‍යවරයා වූ ජනාධිපතිවරයාට මෙන් ත්‍රිවිධ හමුදාවට නියෝග නිකුත් කිරීමේ බලයක් ආරක්ෂක ලේකම්වරයාට නැත. මෙම තත්ත්වය යටතේ පළමුවන සැකකරු ඔහුගේ තනතුරේ වගකීම නිසි පරිදි ක්‍රියා කර ඇති ආකාරය නිරීක්ෂණය වෙයි."

කවුද මේ කියන්නේ? හිටපු ආරක්ෂක ලේකම්වරයාටත්, පොලිස්පතිවරයාටත් ඇප ලබාදෙමින් කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත්වරිය පසුගිය 09වන දා නිකුත් කළ වාර්තාවේ කොටසක් තමයි මම ඒ කියෙව්වේ. එතකොට, මේ ජනාධිපතිවරයාට සෘජුවම චෝදනාවක් තිබෙනවා. නමුත්, ජනතා විමුක්ති පෙරමුණ කියන විධියට මෙතැන තිබෙන තාක්ෂණික කරුණු අනුව මේ විශ්වාස භංග යෝජනාවට ජනාධිපතිතුමාගේ නම ඇතුළත් කරලා නැහැ. එතුමන්ලා එහෙම කියනවා. අපි එතුමන්ලාගෙන් මේ කාරණයත් අහනවා. තමන් යටතේ සිටින නිලධාරින්ට, මේ විශේෂ කාරක සභාවට යන්න එපා කියලා ජනාධිපතිතුමා කියා තිබෙනවා. එතුමා ප්‍රසිද්ධියේ ඒක කිව්වා; "මම කාටවත් යන්න දෙන්නේ නැහැ" කියලා එතුමා කිව්වා. ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලාත් මේ විශේෂ කාරක සභාව නියෝජනය කරනවා නේ. තමුන්නාන්සේලා ඒ ගැන දරන මතය මොකක්ද? මගේ කථාවෙන් පස්සේ ඒක කියන්න. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීවරයකු කථා කරන අවස්ථාවක ඒ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න කියන්න. මොකද, නැත්නම් මගේ වෙලාවයි ඒකට ගත වෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ තමුන්නාන්සේලා කියන්න ඕනෑ තමුන්නාන්සේලාගේ මතය මොකක්ද කියලා. [බාධා කිරීමක්] කියන්න, කියන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හරි වැදගත් ප්‍රශ්නයක්. දහනව වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ඉතා පැහැදිලි ලෙස ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කියනවා. ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තුවේ ස්ථාවර ආසනයක් ජනාධිපතිවරයා වෙනුවෙන් වෙන් කොට තිබෙනවා. පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාට වග කියන තත්ත්වයක් නැහැ. එම නිසා ජනාධිපතිවරයා යටතේ ඉන්න නිලධාරින් පමණක් නොවෙයි විශේෂ කාරක සභාව හමුවට ජනාධිපතිවරයාත් කැඳවිය යුතුයි. ඒකයි අපේ ස්ථාවරය. ඒ මොකද, පාර්ලිමේන්තුවට වග කියන්නට ජනාධිපතිවරයා බැඳී සිටින නිසා. පාර්ලිමේන්තුව නියෝජනය කරමින් තමයි විශේෂ කාරක සභාවක් හදලා තිබෙන්නේ. එම නිසා විශේෂ කාරක සභාව ප්‍රතික්ෂේප කරන්නට ජනාධිපතිවරයාටවත් බැහැ. එම නිසා අපි විශේෂ කාරක සභාවට ලිඛිතව ලබා දීලා තිබෙනවා ජනාධිපතිවරයාත් කැඳවන්න කියලා. ඒ අනුව, එතුමා යටතේ ඉන්න නිලධාරින් කැඳවන්න කියන එක අරුම පුදුම දෙයක් නොවෙයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

බොහොම ස්තුතියි.

ඒ වෙලාව මගේ වේලාවෙන් අඩු කරන්න එපා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

දැන් මම කථා කරමින් ආවේ නීතිය හා සාමය පිළිබඳ විෂයය ගැනයි. පසුගිය ඔක්තෝබර් 26වෙනි දායින් පසුව ජනාධිපතිතුමා ඒ විෂයයන් එතුමා යටතේ තියා ගත්තා. ඒක තියා ගත්තේ මොකක් නිසාවත් නොවෙයි. ජනාධිපතිතුමාට මේ රටේ දේශපාලනය කරන්නට ඒ විෂයයන් අයත් වන අමාත්‍යාංශය එතුමා යටතේ තියා ගත්තා. ඒ අමාත්‍යාංශය අපට දුන්නේ නැහැ. ඔක්තෝබර් 26වෙනි දායින් පසුව එතුමාගේ ඉදිරි ගමන යන්නට, මේ රටේ දේශපාලනය කරන්නට පොලීසියයි, නීතියයි එතුමා යටතේ තියා ගත්තා. ආණ්ඩුවක වැදගත්ම දේ තමයි පොලීසිය සහ නීතිය. ඒ දෙකම එතුමා තියාගෙන හිටියා. නීතිය හා සාමය කියලා කියන්නේ ආණ්ඩුවකට තිබෙන වැදගත්ම විෂයයන් දෙකක්. එවැනි වැදගත් විෂයයන් අයත් වන අමාත්‍යාංශයක් නැතිව ආණ්ඩුවක් ගෙනියන එකත් වැඩක් නැති වැඩක් කියලායි මම හිතන්නේ.

අපි මොන සංවර්ධන වැඩ කළත්, අපි මොන වැඩ කළත්, අපි ජනතාවට ඇහට දැනෙන මොන වෙනස කළත් මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්නට පොලීසියට ඒ නිදහස ලබා දෙන්නේ නැත්නම් ජනතාව අතරේ අපි තමයි ඒකේ විත්තිකරුවන් බවට පත් වෙන්නේ. ඒකයි මම කිව්වේ. නීතිය හා සාමය කියන විෂයයන් ඔක්තෝබර් 26වෙනි දා ඉඳලා ජනාධිපතිතුමා තියාගෙන හිටියා. අඩුම තරමින් ජනාධිපතිවරයා රට යන කොටවත් රුවන් විජේවර්ධන මැතිතුමා ඒ අමාත්‍යාංශයේ වැඩබලන ඇමතිවරයා විධියට පත් කළේ නැහැ. නමුත්, බෝම්බ පිපිරුණාට පසුව දැන් පත් කරනවා; යනවා. මම නම් රුවන් විජේවර්ධන මැතිතුමාට කියන්නේ එ්කෙන් අස්වෙන්න කියලායි. මම රුවන් විජේවර්ධන ඇමතිතුමාට කියනවා ආරක්ෂක රාජ්‍ය ඇමතිකමෙන් ඉල්ලා අස්වෙන්න කියලා. මොකද, පොලිස්පතිතුමාට නියෝග දෙන්නට ඔබතුමාට බලයක් නැහැ. ඔබතුමා කියන දේවල් පොලීසිය කරන්නේ නැහැ. ඔබතුමා නියෝග දුන්නත් ඒ හැම එකක් ගැනම ජනාධිපතිතුමාගෙන් අහලා තමයි පොලීසිය කටයුතු කරන්නේ. ඒ නිසා ඒ රාජ්‍ය ඇමතිකමෙන් වැඩක් නැහැ. ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ධුරය රුවන් විජේවර්ධන මැතිතුමා ජනාධිපතිතුමා යටතේ තියා ගැනීම තුළ මොකක්ද වෙන්නේ? ජනාධිපතිතුමා වග කියන්නට ඕනෑ දේවලටත්, ජනාධිපතිතුමා වැරදිකාරයා බවට පත්වෙලා ඉන්න මේ බෝම්බ ප්‍රහාරයටත් අද රුවන් විජේවර්ධන මැතිතුමාට වග කියන්නට වෙලා තිබෙනවා. ඒක අපටත් බලපා තිබෙනවා. ඒකයි අද එක්සත් ජාතික පෙරමුණට වග කියන්නට වෙලා තිබෙන්නේ. ඒකයි අපිත් දැන් මඩ නාගන්නේ, ඒකයි අපට ප්‍රහාර එල්ල වන්නේ. ඒකයි මේ විශ්වාස භංග යෝජනාව අද අපට

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

විරුද්ධව ගෙනෙන්නට තිබෙන ප්‍රධානම කාරණය. මොකද, අපි ඒකේ කොටස්කාරයෝ බවට පත්වෙලා ඉන්නවා. එම නිසා මම කියනවා රුවන් විජේවර්ධන මැතිතුමාට, ඒ ධුරය තමුන්නාන්සේ තියා ගන්න එපා, ඒක ජනාධිපතිතුමාටම තියා ගන්න දෙන්න කියලා. මොකද, තව මාස දෙකයි, තුනයි මේ රටේ ජනාධිපතිවරණයට කාලය තිබෙන්නේ. ඔක්තෝබර් 26වෙනි දා ඉඳලා බෝම්බ පිපිරෙනකම් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු නීතිය හා සාමය විෂයයන් ජනාධිපතිතුමා තියා ගත්තා වාගේ ඊළඟ මාස තුනත් ඒක එතුමාටම දීලා දමන්න. ඒක තියාගෙන අපට වැඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දන්නවා විපක්ෂයේ සමහර දේශපාලන පක්ෂවල නායකයෝ විශාල බිල්ලෝ මවන බව. මේ රටේ මුස්ලිම් ප්‍රජාව බෝම්බවලට කලින් සහරාන් ගැන තොරතුරු දුන්නා. ඊළඟට, මුස්ලිම් ප්‍රජාව බෝම්බ පිපිරුණාට පසුව යම් යම් අය ගැන තොරතුරු ලබාදීලා තිබෙනවා. ඒ අනුව ප්‍රජාවක් හැටියට මේ රටේ ආරක්ෂාව වෙනුවෙන් ඉෂ්ට කරන්න ඕනෑ වගකීම මුස්ලිම් ප්‍රජාව ඉෂ්ට කරලා තිබෙනවා. එහෙම නම් ඒ වගකීම ඉෂ්ට කළේ නැත්තේ කවුද? ඒ වගකීම ඉෂ්ට කළේ නැත්තේ ජනාධිපතිතුමා. ජනාධිපතිතුමා එතුමාගේ තනතුරේ වගකීම ඉෂ්ට කළේ නැහැ. නමුත්, විපක්ෂයේ ඉන්න බොහෝ උදවිය ජනාධිපතිතුමාට විරුද්ධව වචනයක්වත් කථා කරන්නේ නැහැ.

නුගේගොඩ රැස්වීම් පවත්වනවා වහාබ්වාදයට විරුද්ධව. ඒ අය කාලයක් මේ රටේ බෙදුම්වාදය ගැන කථා කළා. බෙදුම්වාදය ගැන කථා කරලා දෙමළ විරෝධී තත්ත්වයක් මේ රට තුළ ඇති කළා. දැන් වහාබ්වාදය ගැන කථා කරමින් මේ රටේ මුස්ලිම් විරෝධයක් ඇති කරනවා. නමුත්, ජනාධිපතිතුමා ගැන කථාවක් නැහැ. ඒ ගොල්ලන්ගේ කථා අනුව මේ රටේ ආරක්ෂක ඇමතිවරයෙක් නැහැ, පොලීසිය සහ නීතිය භාර ඇමතිවරයෙක් නැහැ.

ඒ ගොල්ලන්ට විරුද්ධව කථා කරන්නේ නැහැ. ජනාධිපතිතුමා බේරලා තමයි මේ ගමන යන්න හදන්නේ. ඇයි, ඒ? මේ රටේ නැවත ජාතිවාදය, ආගම්වාදය අවුස්සලා ඒ හරහා තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කිරීමේ උත්සාහයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒකට ඉඩ දෙන්න එපා. අපි විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා, අපි ඒ ප්‍රගතිශීලී අදහස් දරන මන්ත්‍රීවරුන්ටත් කියනවා, මේ ආගම්වාදී, ජාතිවාදී ගිනි දැල් අවුළුවන්නට දෙන්න එපා කියලා. තමුන්නාන්සේලාගේ කණ්ඩායම තුළ ඉඳගෙන, තමුන්නාන්සේලාගේ පැත්තේ ඉඳගෙන ඒ බෝම්බ ප්‍රහාරය තුළින් ගිනි දැල් අවුළුවන්න යම් කණ්ඩායමක් හිතාමතාම වැඩ කරනවා. අන්න ඒ ගොල්ලන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ ගොල්ලන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒකයි මම ඒ ගැන කිව්වේ. ජනාධිපතිතුමා නීතිය තියාගෙන ඉන්නවා, පොලීසිය තියාගෙන ඉන්නවා, හදිසි නීතිය තියාගෙන ඉන්නවා. නමුත් මේ රටේ වර්ගවාදය, ආගම්වාදය අවුස්සන පිරිස්වලට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ ගොල්ලන් බේරාගෙන තමයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටට අලුත් ගමනක් අවශ්‍යයි. මේ රට අලුත් ගමනක් යන්න ඕනෑ. මේ රටට අලුත් දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍ය වෙලා තිබෙනවා. ජාතිවාදයෙන්, ආගම්වාදයෙන් තොරව, ශ්‍රී ලාංකිකයන් හැටියට මේ රටේ එකට ජීවත් විය හැකි පරිසරයක් ගොඩනහන්න පුළුවන් දේශපාලන ව්‍යාපාරයක් අපට අවශ්‍යයි. ඒ නිසා අනුර දිසානායක මන්ත්‍රීතුමාගෙන්, ජනතා විමුක්ති පෙරමුණෙන් අපි ඉල්ලා සිටිනවා, එවැනි ව්‍යාපාරයක් හදන්න ලැහැස්ති වෙන්නේ නැතුව, විශ්වාස භංග යෝජනා ගෙනැල්ලා නැවත මේ රට මිලේච්ඡත්වයට ගෙන යන, වර්ගවාදයට ගෙන යන උදවියට පාලන බලයට එන්න ඉඩ තබන්න එපාය කියලා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.06]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அதிகாரத்தில் இருக்கும் ஆட்சியின்மீது நம்பிக்கை உண்டா? இல்லையா? என்கின்ற விடயம் சம்பந்தமான விவாத்திற்காக நாங்கள் இங்கு கூடியிருக்கின்றோம். இந்த நிலை தமிழர் களுக்கும் சிங்களவர்களுக்கும் வேறு வேறானவை. எந்தவொரு சிங்கள, பௌத்த ஆட்சியையும் தமிழர்களாகிய எங்களால் மனாசீகமாக ஆதரிக்க முடியாது. பல்லின, பல மத, பல சமூக நாடாக இலங்கை ஆக்கப்படும்பொழுது ஆட்சியைப் பிடிக்கக்கூடிய நேர்மையான தரப்பு ஒன்றை மட்டுமே தமிழர்களால் ஆதரிக்க முடியுமே தவிர, இன்று அதிகாரத்தைத் தக்க வைத்துக்கொள்ளும் கட்சியையும் அதிகாரத்தைப் பிடிப்பதற்கு முயற்சிக்கும் கட்சியையும் தமிழர்களால் ஒருபோதும் ஆதரிக்க முடியாது. அரசியலில் தமிழ்களின் நிலை இன்று பரிதாபகரமானது. அவர்களுக்கு முன்னாலுள்ள தெரிவு யார் நல்லவர்? யார் கெட்டவர்? என்பதல்ல. இருக்கின்ற கெட்டவர்களில் யாரைத் தேர்ந்தெடுப்பது என்பதுதான். இன்றைய ஆட்சிக்கு ஆதரவு வழங்க வேண்டுமா? என்பதல்ல எம்முன் உள்ள கேள்வி! தமிழர்களுக்கு இதைவிட நரகத்தைத் தந்துவிடக்கூடியவர்கள் ஆட்சிக்கு வந்துவிடக்கூடாதே என்கிற பதற்றம்தான் எங்கள் முடிவுகளின்மீது செல்வாக்குச் செலுத்தக்கூடியது. "தெரியாத தேவதையைவிட, தெரிந்த பேய்களே மேலானவை" என்கிறது ஆங்கிலப் பழமொழி! தமிழர்களுக்கு முன்பாக உள்ளதோ தெரிந்த பேய்களும் நன்கு தெரிந்த பிணந்தின்னிப் பிசாசுகளும்தான்! இவற்றில் ஒன்றைத் தெரிந்தாக வேண்டும் என்பதுதான் தமிழர்களின் நிர்ப்பந்தம்! எனவே, களச்சூழல் தமிழர்களுக்கு நேர்மையான தெரிவுகள் எதனையும் விட்டுச் செல்லவில்லை.

இன்றைய ஆட்சியையும்கூட தமிழர்களின் பிரதிநிதி களாகிய நாங்கள் ஏன் ஆதரிக்க முடியாது என்பதை நான் இங்கு விளக்க வேண்டியது இந்தச் சந்தர்ப்பத்தில் அவசியம் என்று நினைக்கின்றேன். 2015ஆம் ஆண்டு புதிய ஆட்சி மாற்றம் ஒன்றை ஏற்படுத்துவதில் தமிழர்களும் மிக முக்கிய பங்காற்றினார்கள் என்பதும், ஏன் அந்தப் பங்கையாற்றி னார்கள் என்பதும் உலகறிந்த இரகசியமாகும். ஆனால், இன்றைய அரச தலைவரும் தலைமை அமைச்சரும் தமிழர்களை நம்ப வைத்துக் கழுத்தறுத்தவர்கள்! "தீர்வைத் தருகின்றோம், புதிய அரசியலமைப்பைக் கொண்டு வருகின்றோம்" என்று நம்பவைத்து நம்பவைத்தே ஏமாற்றியவர்கள்! ஏமாற்றுகின்ற சிங்களத் தலைவர்களின் வாரிசுகளாக அவர்களும், நம்பி ஏமாறுகின்ற தமிழ்த் தலைவர்களின் வாரிசுகளாக நாங்களும் இருக்கின்றோம் என்பது இந்த நாட்டின் துரதிருஷ்டமாகும். எம்மை நம்பவைத்து ஏமாற்றியது மட்டுமல்ல, ஐக்கிய நாடுகள் சபையையும் பன்னாட்டுச் சமூகத்தையும்கூட நம்ப வைத்து ஏமாற்றியது இந்த ஆட்சி! தேர்தலில் வழங்கிய வாக்குறுதிகளை நிறைவேற்றவில்லை. நிலைமாறு கால நீதி இல்லாமலேயே அந்தக் காலம் கடந்து போய்க்கொண்டிருக் கின்றது. தமிழர்களின் படுகொலைகளுக்கு நீதி வழங்கப் படவேயில்லை. வடக்கு, கிழக்கில் பௌத்தமயமாக்கல்

நிறுத்தப்படவில்லை. அரச வேலைவாய்ப்புக்களில் தமிழர் களைப் புறந்தள்ளி, சிங்களவர்களுக்கே வாய்ப்புக்கொடுக்கும் போக்கு நிறுத்தப்படவில்லை. வடக்கு, கிழக்கில் தமிழர்களின் இனப் பரம்பலைச் சிதைக்கும் நோக்கோடு அரசால் திட்டமிட்டு மேற்கொள்ளப்படும் சிங்களக் குடியேற்றங்கள் மற்றும் இருக்கும் இடங்களைச் சிங்களமயமாக்குதல் தொடர்கின்றது. இப்படித் தமிழர்கள் தனிநாடு கேட்டுப் போராடுவதற்கு என்னென்ன நியாயங்களை எல்லாம் 30 வருடங்களுக்கு முன்னர் வைத்தார்களோ அவையெல்லாம் இன்றும் நவீன வடிவத்தில் 30 வருடங்களுக்கு முன்னர் இருந்ததைவிட, வேகமாக நிகழ்ந்துவரும் நிலைமைதான் தமிழர்களால் அதிகாரத்துக்குக் கொண்டுவரப்பட்ட ஆட்சியின் சாதனை! அப்படிப்பட்ட ஓர் ஆட்சியைத் தமிழர்கள் ஏன் ஆதரிக்க வேண்டும். கூடாதுதான்! ஆனால், இவர்களை ஆட்சியிலிருந்து அகற்றிவிட்டால், அடுத்துவரப்போகின்ற ஆட்சியாளர்கள் தமிழர்களை மீண்டும் இனப்படுகொலைக்கு உள்ளாக்கி சுத்தமாகத் துடைத்தழித்துவிடுவார்களோ என்கிற அச்சம் ஏற்படுகிறதல்லவா? அதுதான் நிதானித்துச் சிந்திக்க வைக்கின்றது. இன்று, இந்த ஆட்சி தொடர்வதற்காக நாம் ஆதரவளிக்கும் ஒரு நிலை ஏற்பட்டால்கூட இந்த ஆட்சியின் மீதான நம்பிக்கையால் அல்ல; நாம் அழித்தொழிக் கப்பட்டுவிடக்கூடாதே என்கிற அச்சத்தால் ஏற்படுகின்ற முடிவு என்பதை இந்த உலகம் ஏற்றுக்கொள்ள வேண்டும். எந்தவொரு சிங்கள, பௌத்த ஆட்சியின்மீதும் தமிழர்களுக்கு நம்பிக்கை கிடையாது என்பதுதான் எமது அறுதியும் இறுதியுமான முடிவாகும்.

கடந்த ஏப்பிரல் மாதம் உயிர்த்தெழுகை நாளன்று இடம்பெற்ற பயங்கரவாதத் தாக்குதல் காரணமாக எமது நாடு ஒரு பேரழிவுக்கு முகங்கொடுக்க வேண்டிய நிலை ஏற்பட்டது. இதன் காரணமாக உயிர்ப்பலிகள், படுகொலைகள், சொத்திழப்புகள் எனப் பல நெருக்கடிகள் ஏற்பட்டமை மட்டுமன்றி, எமது பொருளாதாரத்தின் பிரதான வருவாய் மூலமான சுற்றுலாத்துறைக்கும் பெரும் பாதிப்பு ஏற்பட்டது. இப்பெரும் பாதிப்பிலிருந்து மீண்டெழும் முயற்சியில் பங்குகொள்வது இந்த நாட்டின் ஒவ்வொரு பிரஜையினதும் கடமையாகும். ஆனால், இன்று சில இனவாத அமைப்புகளும் சில பௌத்த அமைப்புகளும் இச்சம்பவங்களை அடிப்படை யாகக் கொண்டு முஸ்லிம்கள்மீது வன்முறைகளைக் கட்டவிழ்த்து வருகின்றனர். முஸ்லிம்களுக்கு இந்த நாட்டில் பாதுகாப்பு இல்லையா? எனக் கேட்குமளவுக்கு முஸ்லிம்கள் அச்சத்துடனேயே வாழவும் நடமாடவும் நிர்ப்பந்திக்கப் பட்டுள்ளனர். இப்படியாக ஒருபுறம் முஸ்லிம்கள்மீதான பிரகடனப்படுத்தப்படாத ஒடுக்குமுறை மேலெழுந்துள்ள நிலையில், கண்டியில் இடம்பெற்ற நிகழ்வில் உரையாற்றிய பொதுபலசேனாவின் பொதுச் செயலாளர் ஞானசார தேரர், இது ஒரு சிங்கள தேசம் எனவும் தான் இதைக்கூறும்போது தமிழர்கள் கோபிக்கமாட்டார்கள் எனவும் தெரிவித்திருந்தார். வடக்கு, கிழக்கு தமிழர் தேசம் எனவும் ஏனைய பிரதேசங்கள் சிங்கள தேசம் எனவும் கூறியிருந்தால் நாம் கோபிக்கமாட்டோம் என்பது உண்மைதான்! ஆனால், இந்த நாடு சிங்கள மக்களுக்கு மட்டுமே சொந்தமான தேசம் எனவும் தமிழ், முஸ்லிம் மக்களுக்கு இங்கு உரிமையில்லை என்பதையும் வலியுறுத்தும் வகையிலேயே அவரின் உரை - அவரின் வார்த்தைகள் அமைந்திருந்தது. இந்த நிலையில் அவரின் கூற்றுக்கு அரசாங்கமோ எதிர்க்கட்சிக் கூட்டணியோ, ஏன், ஜே.வி.பி. யினரோகூட எதிர்ப்புத் தெரிவிக்கவில்லை. அப்படியானால் இந்த நாட்டில் தமிழர்களுக்கும் முஸ்லிம் களுக்கும் உரிமையில்லை என்ற கூற்றை இவர்கள் அனைவரும் ஏற்றுக்கொள்கின்றார்களா? என நான் கேட்க விரும்புகின்றேன்.

விரும்பியோ விரும்பாமலோ, மறைமுகமாகவோ வெளிப் படையாகவோ தமிழர்களின், முஸ்லிம்களின் உரிமைகளை மறுதலிக்கும் நீங்கள், எங்களை இந்த நாட்டுப் பிரஜைகளாக ஏற்க முழுமனதுடன் விருப்பம் கொள்ளாத நீங்கள், ஏன் உங்களுக்கு நெருக்கடி வரும் நேரங்களிலெல்லாம் எங்கள் ஆதரவைக் கோரி நிற்கிறீர்கள்? 2015இல் இந்த ஆட்சி அமைக்கப்பட்ட பின்பு நாம் ஒவ்வொரு சந்தர்ப்பத்திலும் இந்த அரசாங்கத்துக்கு ஆதரவு வழங்கினோம். வரவு செலவுத் திட்டங்கள், பிரதமருக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை, ஒக்ரோபர் 26இல் ஏற்படுத்தப்படவிருந்த ஆட்சி மாற்றம் என ஒவ்வொரு சந்தர்ப்பத்திலும் நாம் அரசாங் கத்துக்கு உறுதியான ஆதரவை வழங்கி வந்திருக்கின்றோம். புதிய அரசியலமைப்பு உருவாக்கத்தின்மூலம் இனப் பிரச்சினைக்குத் தீர்வு காணப்படுமென வாக்குறுதியளிக்கப் பட்டது. அரசியலமைப்புச் சபை 70 தடவைகளுக்கு மேல் கூடிக் கலைந்த நிலையில், 4 வருடங்கள் கடந்துவிட்டபோதும் அது ஆலோசனை என்ற அளவிலேயே உள்ளது. 1972ஆம் ஆண்டின் அரசியலமைப்பு, 1978ஆம் ஆண்டின் அரசியலமைப்பு என்பன ஒருசில மாதங்களில் தயாரித்து நிறைவேற்றப்பட முடியுமானால், தற்போதைய நகல் அரசியலமைப்பு நான்கு வருடங்கள் கடந்தும் ஏன் உயிர்பெறவில்லை? இந்த நிலையில் தமிழ் மக்கள் தாங்கள் தொடர்ந்து ஏமாற்றப்படுவதாக உணர்வதில் என்ன தவறு இருக்க முடியும்? அதேவேளையில், காணாமல்போனோர் விவகாரம் தொடர்பாக ஒரு நகர்வுகூட முன்நோக்கி மேற்கொள்ளப்படவில்லை. அரசியல் கைதிகள் எத்தனையோ போராட்டங்கள் நடத்திய பின்னர், அவர்களை விடுவிக்க நடவடிக்கையெடுக்கப்படுமென வாக்குறுதியளிக்கப்பட்டது. கண்துடைப்புக்காக ஓரிருவரைப் புனர்வாழ்வுக்காக அனுப்பிவிட்டு, பலருக்கு ஆயுள்தண்டனை, 100 வருடங்கள், 200 வருடங்கள் எனக் கொடிய தண்டனைகள் வழங்கப் பட்டன. ஒருபகுதி காணிகள் விடுவிக்கப்பட்டதை ஏற்றுக் கொள்கின்றோம். ஆனால், பல முக்கிய இடங்களிலிருந்து படையினர் வெளியேற மறுக்கின்றனர். எமது மக்களோ நிவாரண முகாம்களில் அல்லற்படுகின்றனர்.

என் மதிப்புக்குரிய அரச தரப்பு உறுப்பினர்களே! தொடர்ந்தும் நாம் அரசாங்கத்துக்கு எமது ஆதரவை உறுதி யான முறையில் வழங்கி வந்தபோதிலும் தொடர்ந்தும் நாம் ஏமாற்றப்பட்டே வந்துள்ளோம். தொடர்ந்தும் நாம் ஏமாற்றப்பட வேண்டுமா? நாம் இப்போதும் உங்களுக்கு ஆதரவு தருவதன்மூலம் மீண்டும் ஒருமுறை நாம் ஏமாற்றப்பட வேண்டுமா? இது சிங்கள - பௌத்த தேசம் என்பதை உங்களில் சிலர் ஏற்றுக்கொண்டவர்கள். அப்படியானால் உங்களுக்கே உரிய தேசத்தின் ஆட்சியைக் காப்பாற்ற ஏன் எங்களின் உதவியைக் கோருகின்றீர்கள்?

மதிப்பிற்குரிய ஜே.வி.பீ. தோழர்களே! இந்த நம்பிக்கை யில்லாத் தீர்மானத்தை நீங்கள் முன்வைப்பதற்காகக் கூறும் காரணங்கள் நியாயமானவை என்பதை நாம் ஏற்றுக் கொள்கிறோம்; வாழ்க்கைச் செலவு உயர்வினால் எமது மக்கள் மூச்சுத் திணறுவதை நாங்கள் உணர்கின்றோம்; அமெரிக்காவுக்கும் ஜப்பானுக்கும் இந்தியாவுக்கும் நாடு துண்டாடப்பட்டு விற்கப்படுவதாகக் கூறப்படுவதை நாமும் ஏற்கிறோம். எதிர்காலத்தில் இலங்கை மேற்கு நாடு களுக்கும் சீனாவுக்கும் இடையேயான ஆயுத, பொருளா தார போட்டியின் மையமாக மாறுவதை நாமும் விரும்ப வில்லை. இந்த நிலையில், உங்கள் நம்பிக்கையில்லாப் பிரேரணைமூலம் இந்த அரசாங்கம் வீழ்த்தப்பட்டால் உங்கள் அடுத்தகட்ட நடவடிக்கை என்ன? உங்களால்

[ගරු ඊ. සරවනපවන් මහතා]

ஆட்சி அமைக்க முடியுமா? நிச்சயமாக முடியாதே! அடுத்த தரப்பு மஹிந்த தரப்பு! மீண்டும் நாம் ராஜபக்ஷ சகோதரனின் ஆட்சிக்கு வழிதிறந்துவிட வேண்டுமா? ஆளும் தரப்பினரிடமும் எதிர்த் தரப்பினரிடமும் நாம் கேட்பது ஒன்றைத்தான். எமது உரிமைப் பிரச்சினைகளை நேர்மையாக அணுகுங்கள்! நேர்மையாகத் தீர்க்க முயற்சி செய்யுங்கள்! அப்போதுதான் எங்கள் ஆதரவு உங்களுக்குக் கிடைக்கும். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ඊළඟට ගරු අරවින්ද් කුමාර් මහතා.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
நன்றி! Madam, may I know how many minutes have been allotted to me?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have five minutes.

[பி.ப. 3.16]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Thank you.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று அரசாங்கத்துக்கு எதிராக நம்பிக்கையில்லாத் தீர்மானமொன்று முன்வைக்கப்பட்டுள்ள நிலையில், அது தொடர்பான விவாதத்திலே நாங்கள் கலந்துகொண்டு உரையாற்றிக் கொண்டிருக்கின்றோம். எம்மைப் பொறுத்தளவிலே, இந்த நாட்டிலே எமக்கு வாக்குரிமை கிடைத்த பிறகு எல்லா அரசாங்கங்களுக்கும் நாங்கள் எங்களது ஆதரவைத் தெரிவித்து வந்திருக்கின்றோம். இந்த நாட்டிலே மாறி மாறி வெவ்வேறு கட்சிகள் அரசாங்கத்தை ஏற்படுத்தியிருக்கின்றன - ஆட்சி செய்திருக்கின்றன. வடக்கு, கிழக்கிலே இருக்கும் தமிழர்களாக இருக்கலாம், மலையகத்திலேயிருக்கும் தமிழர்களாக இருக்கலாம், ஒட்டுமொத்தமாகப் பார்க்கும்போது, எங்களது பிரச்சினைகள் எந்த அரசாங்கத்தின் காலத்திலும் தீர்ந்ததாக இல்லை. தற்போதைய அரசாங்கத்தைப் பொறுத்தளவிலே, இந்த அரசாங்கத்தை ஆட்சியிலே அமர்த்துவதற்கு நான் சார்ந்த மலையக மக்களின் ஆதரவு மிக அதிகமாக இருந்தது என்பதை எவராலும் மறுக்க முடியாது. அந்தவகையிலே, இந்த அரசாங்கத்தை நாங்கள் ஏற்படுத்தியிருக்கின்றோம். இந்த அரசாங்கத்தினூடான எமது மக்களின் எதிர்பார்ப்பு மிக அதிகமாக இருக்கின்றது. மலையகத்திலேயிருக்கின்ற பிரச்சினைகளைத் தீர்த்துக் கொள்வதற்கு அரசாங்கம் எமக்குத் துணைபோகும் என்ற நம்பிக்கை வெகுவாக மலையக மக்கள் மத்தியிலேயிருக்கின்றது; மலையக மக்களின் பிரதிநிதிகள் என்ற வகையிலே எமக்கும் இருக்கின்றது.

மலையகத்தைப் பொறுத்தளவிலே, அதனை மிக அதிக மாக, மிக மோசமாகப் பின்தங்கிய ஒரு நிலைமையுடைய, பல்லாண்டு காலமாக ஒதுக்கப்பட்ட ஒரு பிரதேசமாக நாங்கள் அடையாளப்படுத்த முடியும். மலையகத்தின் அபிவிருத்தியாக இருக்கலாம், மலையக மக்களின் உரிமைகளாக இருக்கலாம், ஏனைய தேவைகளாக இருக்கலாம், இவையனைத்தும் மிக உச்சக்கட்ட நிலுவையிலே இருப்பதை இந்த உயரிய சபையிலே நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஆனால், இந்த எமது அரசாங்கத்தைப் பொறுத்தளவிலே, முன்பிருந்த அரசாங்கங்கள் மலையக மக்கள்மீது காட்டியதைவிட அதிக கரிசனை காட்டுவதை நாங்கள் அனுபவ ரீதியாகப் பார்க்கக் கூடியதாக இருக்கின்றது. அந்தவகையிலே, எமக்கொரு நம்பிக்கை இருக்கின்றது; எமக்கொரு எதிர்பார்ப்பிருக்கின்றது. அதாவது, எமது பிரச்சினைகளை இந்த ஆட்சியினூடாக முடிந்தளவிலே நிவர்த்தி செய்துகொள்ளலாம் என்ற நம்பிக்கை, எதிர்பார்ப்பு எமக்கிருக்கின்றது. நாங்கள் அந்த நம்பிக்கையோடுதான் செயற்பட்டுக் கொண்டிருக்கின்றோம். இன்று இங்கே கொண்டுவரப்பட்டிருக்கின்ற இந்த நம்பிக்கை யில்லாப் பிரேரணைக்கு எதிராக வாக்களிக்க நாங்கள் அந்த நம்பிக்கையினூடாகத்தான் முடிவெடுத்திருக்கின்றோம். இவ்வாறு நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டு வருபவர்கள் மலையக மக்கள் மனதிலே ஓர் இடத்தைப் பிடிக்கவேண்டும்; மலையக மக்கள் மத்தியிலே ஒரு நம்பிக்கையை ஏற்படுத்த வேண்டும். அவர்களை மலையக மக்கள் நம்பும்வண்ணம் அவர்கள் செயற்பட்டால், நிலைமை மாறக்கூடிய வாய்ப்பிருக்கின்றது. இல்லையென்று சொல்ல நான் வரவில்லை. ஆனால், தற்போதிருக்கின்ற நிலைமை யிலே இந்த அரசாங்கத்தை நாங்கள் முழுமையாக நம்புகின்றோம்; இந்த அரசாங்கத்திலேயிருந்து எமது பிரச்சினைகளைத் தீர்த்துக்கொள்ள முடியுமென்ற எதிர்பார்ப்போடு இந்த அரசாங்கத்தோடு நாங்கள் இணைந்து செயற்பட்டுக் கொண்டிருக்கின்றோம். அரசாங்கம் ஒன்றைப் புரிந்துகொள்ள வேண்டும்; தெரிந்துகொள்ள வேண்டும். அதாவது, எமது பிரச்சினைகள் இன்னும் முழுமையாகத் தீர்ந்தபாடில்லை. இன்னும் நாங்கள் அடிமட்டத்திலேதான் இருக்கின்றோம். ஆகவே, எமது பிரச்சினைகளைத் தீர்ப்பதில் அரசாங்கம் கரிசனை கொள்ளவேண்டுமென்று இந்த சபையிலே நான் பதிவுசெய்ய விரும்புகின்றேன். மலையக மக்களின் வாழ்க்கையில் ஒரு முன்னேற்றத்தை ஏற்படுத்த வேண்டுமென்றால், அதற்கு அரசாங்கங்கள் எம்மோடு இசைவாகச் செயற்படவேண்டும், அரசாங்கங்கள் நடுநிலைத் தன்மையைக் கடைப்பிடித்து, அனைத்து மக்களுக்கும் சமமான வாய்ப்பை ஏற்படுத்திக்கொடுக்க வேண்டும் என்ற நிலைப்பாட்டிலே இருக்க வேண்டும். அவ்வாறு இருந்தால்தான், அரசாங்கம் நிலைத்திருக்க முடியும்; அரசாங்கம் மக்கள் மனதிலே தங்களது செல்வாக்கைத் தொடர்ச்சியாகத் தக்கவைத்துக்கொள்ள முடியும். அந்த வகையிலே, இந்த அரசாங்கம் அதனைச் செய்யுமென்ற நம்பிக்கை எனக்கிருக்கின்றது.

இந்த நாட்டிலே பல்வேறு காலகட்டங்களில் பல்வேறு துரதிருஷ்டவசமான சம்பவங்கள் இடம்பெற்றிருக்கின்றன. 1971, 1979, 1981, 1983ஆம் ஆண்டுகளில் இவ்வாறான சம்பவங்கள் இடம்பெற்றிருக்கின்றன. 1988 -1989களிலே இன்னுமொரு பாரிய உள்நாட்டுப் புரட்சி ஏற்பட்டது. 30 வருட கால உள்நாட்டுப் போர் தொடர்ச்சியாக இடம்பெற்றது. அதன்போது எந்த மதஸ்தலம் என்று இல்லாமல் அனைத்து மதஸ்தலங்களும் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன; தாக்கப் பட்டிருக்கின்றன; அழிவுற்றிருக்கின்றன. அவ்வாறு ஆலயங்கள் தாக்கப்படும்போதும், பொதுமக்களுக்குக் கேடு ஏற்படும்போதும் மற்றும் உயிர்க் கொலைகள் இடம்பெறும் போதும் ஒருதரப்பு மற்ற தரப்பைக் குறைசொல்வதைக் கண்டோம். அரசாங்கம் ஏனையவர்களைக் குறைசொல்வது,

ஏனையவர்கள் அரசாங்கத்தைக் குறைசொல்வது என மாறி மாறிக் குறைசொல்லிச் சம்பந்தப்பட்டவர்கள் தப்பித்துக் கொள்ளும் ஒரு நிலைமையைத்தான் நாங்கள் கடந்த காலங்களில் பார்த்தோம். கடந்த ஏப்ரல் மாதம் 21ஆம் திகதி நடந்த சம்பவத்தின்போதும் அவ்வாறான ஒரு நிலைமைதான் ஏற்பட்டது. அதேநேரம் இன்று இந்தச் சம்பவம் குறித்த விடயங்களை ஊதிப் பெருப்பிக்கின்றார்கள். ஆனால், இந்தச் சம்பவத்துக்கு எந்த வகையிலும் நாங்கள் ஆதரவு தெரிவிக்க முடியாது. நாங்கள் எந்த வகையிலும் அதற்குச் சார்பானவர்கள் அல்லர். படுகொலைகளுக்கு மற்றும் பயங்கரவாதச் செயற்பாடுகளுக்கும் நாங்கள் நிச்சயமாக ஆதரவு தெரிவிக்க முடியாது. பயங்கரவாதச் செயற்பாடுகளை முற்றாக நிராகரிக்கின்றோம். எப்படி இருந்தாலும்கூட இவ்வாறு எதிர்பாராத நிகழ்வுகள் நடக்கும்போது, அவை பல்வேறு தாக்கங்களை ஏற்படுத்துகின்றன என்பதை நாங்கள் ஒவ்வொருவரும் புரிந்துகொள்ள வேண்டும். அண்மையில் இடம்பெற்ற அந்தத் துரதிருஷ்டவசமான சம்பவத்துக்கு இந்த உயரிய சபையிலே நான் எனது மக்களின் சார்பிலே மீண்டும் எதிர்ப்பைத் தெரிவித்துக்கொள்வதோடு, இவ்வாறான சம்பவங்கள் தொடர்ந்தும் இடம்பெறுவதற்கு நாங்கள் இடமளிக்கக்கூடாது என்ற விடயத்தையும் பகிர்ந்துகொண்டு, சந்தர்ப்பமளித்த அவைத் தலைவர் அவர்களுக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා.3.22]

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අද ජනතා විමුක්ති පෙරමුණ ගෙනා විශ්වාස භංග යෝජනාව සම්බන්ධව කථා කරන්න ලැබීම පිළිබඳව මා ඉතාම සතුටුවනවා. ඒ වාගේම මේ විශ්වාස භංග යෝජනාවට ඒකාබද්ධ විපක්ෂය හැටියට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මේ විශ්වාස භංග යෝජනාව විවාද වන මේ දින දෙකේදීම වැඩිපුරම සාකච්ඡාවට භාජන වුණේ පාස්කු ඉරිදා ඇති වූ සිද්ධියේදී අහිංසක ජනතාවට සිදු වූ ඛේදනීය තත්ත්වය පිළිබඳවයි. හැබැයි, මේ රජයට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගේන්න හේතු වුණේ පාස්කු ඉරිදා ඇති වූ සිද්ධියම විතරක් නොවෙයි. ඊට පෙර වූ සියලු සිද්ධීන් එක්ක බලනකොටත් පැහැදිලි ලෙසම රජයට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා ඉතාම කෙටි කාලයක් ඇතුළත -ඒ දිනවලම- ඉවත් කරන්න තිබුණු ආණ්ඩුවක් තමයි මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තවත් කාරණයක් කියන්න තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා ගෙනා මේ විශ්වාස භංග යෝජනාවට ඒකාබද්ධ විපක්ෂයේ සහයෝගය ලබා දෙන අතර, ඒ ගැන අපි යම් යම් කරුණු කාරණා කිහිපයකුත් මතු කළා. ඒ කරුණු කාරණා පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණේ සහෝදර මන්ත්‍රීවරු විසින් ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු විවේචනයට ලක් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා මගේ කථාව ආරම්භයේදීම මගේ ආතා කියපු කථාවක් මට මතක්වනවා. ඔබතුමියත් දන්නවා ඇති, "සූටි ගමරාළ අලියාගේ නැට්ටේ එල්ලිලා දිව්‍ය ලෝකයේ ගිය හැටි" කියලා ඉතාම සුන්දර හා රසවත් කථාවක් තිබෙනවා. ඒ සූටි ගමරාළ අලියාගේ නැට්ටේ එල්ලිලා දිව්‍ය ලෝකයට ගියේ නැති වුණාට, හන්දියක් හන්දියක් ගණනේ - බෝක්කුවක් බෝක්කුවක් ගණනේ සූටි ගමරාළ කියපු කථාව තමයි, "හරිම සුන්දරයි ඒ ගමන, හරිම ලස්සනයි දිව්‍ය ලෝකය. දිව්‍ය ලෝකයේ හරි පුදුම දේවල් මම දැක්කා" කියන එක. ඒ වාගේම අවුරුදු 4ක් තිස්සේ අලියාගේ නැට්ටේ එල්ලිලා දිව්‍ය ලෝකයේ යන්න උත්සාහ ගත් අයත් අවුරුදු 4ක් තිස්සේ ඒ වාගේ කථා කළා. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂයට එක එක චෝදනා එල්ල කළාට අපි පැහැදිලිවම දන්නවා, මේ ආණ්ඩුව මේ රටට කරපු සහ මේ රටේ ජනතාවට කරපු විනාශයට පාර්ලිමේන්තුව ඇතුළේ සහ පිටත අපි දිගින් දිගටම අපේ සටන දියත් කළ බව.

අපි මේ ආණ්ඩුවට විරුද්ධ ඇයි? අපි මේ ආණ්ඩුවට විරුද්ධ වන්න හේතුව, එදා පාස්කු ඉරිදාවේ අහිංසක ජීවිත ඝාතනයට ලක්වීම විතරක් නොවෙයි. ඒ සිද්ධියට වග කියන්න ඕනෑ මේ ආණ්ඩුව තමයි. හැබැයි, මේ වනවිට මේ රට ආර්ථික අර්බුදයක, සමාජයීය අර්බුදයක, දේශපාලන අර්බුදයක දැවැන්ත විධියට පැටලී ඉන්නවා. එම නිසා මේ ආණ්ඩුවට තව මාස කීපයක් නොවෙයි, දින කීපයක්වත් යන්න දෙන්න හොඳ නැහැයි කියන එකයි මගේ මතය.

අද වෙනකොට මේ රටේ ජාතික සම්පත් ටික කුණුකොල්ලෙට විකුණා රට විනාශ කරන, මේ රටේ ජාතිවාදය-අන්තවාදය ඇති කරන්නට විවිධ උපක්‍රම යෙදූ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුව, ජීවත් වෙන්න බැරිව අද වහ බීලා මැරෙන තත්ත්වයකට අහිංසක ජනතාව පත් කරපු මේ ආණ්ඩුව ඉතාම ඉක්මනින් ගෙදර යවන්න ඕනෑය කියන පණිවුඩය අපි ලබා දෙනවා. මේ රට අනාථ කරපු, මේ රට නන්නත්තාර කරපු, මේ රට කුජීත කරපු ආණ්ඩුවක් දේශපාලන ඉතිහාසයේ තිබෙනවා නම්, ඒ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ රනිල් වික්‍රමසිංහගේ මේ ආණ්ඩුවයි කියන එක අපි පැහැදිලිවම කියනවා. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ නොවෙයි, ඕනෑම පක්ෂයක් මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ගෙනෙනවා නම්, අපි පැහැදිලිවම ඒ විශ්වාසභංග යෝජනාවට සහයෝගය දීලා මේ ආණ්ඩුව ගෙදර යවන්න වැඩ කටයුතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද වෙන කොට මේ අය -මේ ආණ්ඩුවේ අය- මැතිවරණ පවත්වන්න බය නිසා, මැතිවරණ කල් දමමින් ඉන්නවා. නමුත් හෙට දවසේ පැවැත්වෙන පළමුවැනි මැතිවරණය වන ජනාධිපතිවරණයේදී අපි මේ ආණ්ඩුවට පාඩමක් උගන්වනවා, උගන්වනවාමයි කියන පණිවුඩය ලබා දෙමින්, මේ ආණ්ඩුව එළවන්න ඕනෑම පක්ෂයක් ගෙන එන ඕනෑම වැඩ පිළිවෙළකට අපි සහයෝගය ලබා දෙන බවටත් දිවුරා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා.3.29]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - State Minister of Transport and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණ විසින් ඊයේ ඉදිරිපත් කරන ලද විශ්වාසභංග යෝජනාවට පදනම වෙලා තිබෙන්නේ පසුගිය පාස්කු ඉරිදා එල්ල වුණු අනපේක්ෂිත ප්‍රහාරයයි. විශේෂයෙන්ම එම ප්‍රහාරයෙන් පසුව අප රජය නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා, මේ රජය කෙරෙහි විශ්වාසයක් නැතැයි කියමින් පාර්ලිමේන්තුවට විශ්වාසභංග යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. මම වගකීමෙන් කියනවා, ඒ අනපේක්ෂිත ප්‍රහාරයෙන් පසුව ලෝකයේ කිසිම රටකට නොදෙවෙනි විධියට, වෙනත් රටවලට මෙවැනි අනපේක්ෂිත ප්‍රහාර එල්ල වුණු පසු

[ගරු අශෝක් අබේසිංහ මහතා]

නොකළ හැකි දේවල් අපේ රජය කළාය කියන එක. ඒ කියන්නේ පැය 48ක් යන්න ප්‍රථම එම ප්‍රහාරය සිදු කළ අයගෙන් බහුතරයක් අත්අඩංගුවට ගැනීමට අපි කටයුතු කළා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා රජයක් වශයෙන් මේ ප්‍රහාරයේ වගකීම භාරගෙන, ඉදිරියේදී කළ යුතු සියල්ලම සිදු කරන බවට ප්‍රකාශ කළා. ඒ අතර, අතිගරු ජනාධිපතිතුමා කමිටුවක් පත් කළා. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවකුත් පත් කරලා මේ පිළිබඳව සොයා ගෙන යන තත්ත්වයක් අද තිබෙන්නේ. ඒ නිසා මේ අනපේක්ෂිත ප්‍රහාරයෙන් පසු අපි රජයක් වශයෙන් ඒ අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ප්‍රකාශ කරනවා.

මේ විවාදයට සහභාගි වූ හුඟක් මන්ත්‍රීවරුන් ජනතා විමුක්ති පෙරමුණට දෝෂාරෝපණය කළා, රජයට මුලින් සහයෝගය දුන් නිසා ඔවුන්ට මේ ගැන කථා කරන්න අයිතියක් නැහැ කියලා. නමුත් එතුමන්ලා ප්‍රකාශ කරනවා, මේ රජය පලවා හරින්න ඕනෑම කෙනෙකු එක්ක එකතු වෙනවා කියලා. ලද සැනින් මේ රජය පළවා හරින්න ඒ සියලු දෙනා වැඩකටයුතු කරනවාය කියනවා. ඇයි, මේ රජය විශ්වාස භංග යෝජනාවකින් පරාජය කරලා වෙනත් රජයක් ගෙනෙන්න හදන්නේ? එහෙම කරන්නේ මම මේ කියන දේවල් කළ නිසාද කියලා මම මේ රටේ ජනතාවගෙන් අහනවා. මේ රජය ඉවත් කළ යුත්තේ ඇයි කියලා විපක්ෂය කියන්නේ මෙන්න මේ වැඩ කටයුතු අප කළ නිසාද? 2015 ජනවාරි 08වැනි දා මේ රජය බලයට පත් වුණාට පසු තොරතුරු දැන ගැනීමේ පනත ඉදිරිපත් කළ නිසාද? අධිකරණය ස්වාධීන කළ නිසාද? පොලීසිය ස්වාධීන කළ නිසාද? මාධ්‍යවේදීන් ඝාතනය නොකළ නිසාද? මාධ්‍යවේදීන් අතුරුදහන් නොකළ නිසාද? විශේෂයෙන්ම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළ නිසාද? විශේෂයෙන්ම 2015-

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
Sir, I rise to a point of Order.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔය ලැයිස්තුවේම මහ බැංකු හොරකම ගැනත් කියන්න.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඒක point of Order එකක් නොවෙයි නේ. ඔබතුමා ඉඳගන්න.

2015 ජනවාරි 08වැනි දාට පසු, අපේ රටේ ජීවත් වෙන පවුල් පනස්දෙලක්ෂයෙන් පවුල් දාහතර ලක්ෂයකට සෘජු ප්‍රතිලාභ දෙන, රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කරලා, ඒක මූලික වැටුපට එකතු කරලා, ඒ වාගේම මේ මාසයේ තවත් 2,500ක් එකතු කරලා, 2015 වර්ෂයේ තිබුණු වැටුප වාගේ දෙගුණයක් 2020දී පඩි වැඩි වන ලෙස කටයුතු කළ නිසාද මේ රජය ඉවත් කරන්න අවශ්‍යයි කියන්නේ? අපේ රටේ හතළිස්පන් ලක්ෂයක් වන දරුවන්ට "සුරක්ෂා" කියන රක්ෂණ ක්‍රමයක් ඇති කරලා, ඒ රක්ෂණ ක්‍රමයට ඔවුන් ඇතුළත් කරපු නිසාද මේ රජය ඉවත් කරන්න ඕනෑය කියන්නේ? අපේ රටේ 30,000ක් වන ගරුතර ස්වාමීන් වහන්සේලා රක්ෂණ ක්‍රමයකට ඇතුළත් කරලා, ඒ රක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ දෙන්න තීන්දු කරලා තිබෙන නිසාද මේ රජය ඉවත් විය යුතුයි කියන්නේ? ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලංකාවේ තිබෙන 10,100ක් වන පාසල් සියල්ලටම ප්‍රතිපාදන ලබා දීලා ඒවාට අවශ්‍ය භෞතික සම්පත් ලබා දීම නිසාද මේ රජය ඉවත් කළ යුතුයි කියන්නේ? සාමාන්‍යයෙන් අපේ රටේ දුප්පත්කම රජයේ සංඛ්‍යාලේඛනවලට අනුව සියයට පහක් කියනවා. නමුත් පසු ගිය රජය දේශපාලනය නිසාම සමෘද්ධිය පවුල් දාහතර ලක්ෂයකට ලබා දීලා තිබුණා; අනවශ්‍ය අයටත් සමෘද්ධිය ලබා දීලා තිබුණා. අපේ රජය 2015 බලයට පත් වුණාට පසු සමෘද්ධි දීමනාව තුන් ගුණයකින් වැඩි කළ නිසාද මේ රජය ඉවත් කළ යුතුයි කියන්නේ? ලැබිය යුතු තවත් පවුල් හය ලක්ෂයකට සමෘද්ධිය ලබා දීපු නිසාද මේ රජයට ඉවත් විය යුතුයි කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ පවුල් පනස් දෙලක්ෂයක් තිබෙනවා. මේ පවුල් පනස් දෙලක්ෂයටම සෘජු ප්‍රතිලාභ මේ රජය ලබා දීලා තිබෙනවා. රජයේ සේවකයන් දාහතර ලක්ෂයක් ඉන්නවා. ඒ අතර පවුල් දස ලක්ෂයකට අධික ප්‍රමාණයක් ඉන්නවා. අපි ඔවුන්ගේ වැටුප දෙගුණයකින් වැඩි කරලා තිබෙනවා. ඒ අනුව 2020දී ඔවුන්ගේ වැටුප දෙගුණයකින් වැඩි වෙනවා. ඒ වාගේම ලංකාවේ විශ්‍රාමිකයන් ඉන්නවා, හය ලක්ෂයක්. මේ විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කරලා රුපියල් 20,000 දක්වා වෙන කල් විශ්‍රාම වැටුප වැඩි කරලා තිබෙනවා. ඒක නිසාද මේ රජය ඉවත් කළ යුතුයි කියන්නේ?

ඒ වාගේම අපේ රටේ තිබෙන සමස්ත විහාරස්ථාන වෙනුවෙන් ඉතිහාසයේ පළමුවැනි වතාවට කිසිම රජයක් නොදුන් විධියට විශාල මුදලක් වෙන් කළ නිසාද මේ රජයට ඉවත් වෙන්න කියන්නේ? මේ රජය, ඉතිහාසයේ තිබුණු සියලු රජයන්වලට වඩා දැවැන්ත ප්‍රතිලාභ ජනතාවට ලබා දීලා තිබෙනවා. මේ වසරේ පමණක් සෑම මැතිවරණ කොට්ඨාසයකටම ලක්ෂ 3,000ක මුදලක් ලබා දීලා තිබෙන නිසාද මේ රජය ඉවත් විය යුතුයි කියන්නේ? ඒ වාගේම "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ ස්වයං රැකියා කරන පුද්ගලයන් සඳහා ණය යෝජනා ක්‍රම ඉදිරිපත් කරලා, ඉතා අඩු පොලී අනුපාතයක් යටතේ ණය ලබා දීම සිදු කරන නිසාද මේ රජය ඉවත් විය යුතුයි කියන්නේ?

විශේෂයෙන්ම බංකොලොත් ඒකාබද්ධ විපක්ෂය දැන් කරන්න දෙයක් නැතුව ජනතා විමුක්ති පෙරමුණ ගෙන එන ලද විශ්වාස භංග යෝජනාවේ එල්ලිලා මේ රජය පරාජය කිරීමේ අසාර්ථක ව්‍යායාමයක යෙදෙනවා. මම වග කීමෙන් කියනවා, අද මේ විශ්වාස භංග යෝජනාව අපි පරාජයට පත් කරන බව. අපි ඡන්ද 120ක් ලබා ගෙන වැඩි ඡන්ද ප්‍රමාණයකින් මෙම විශ්වාස භංග යෝජනාව පරාජය කරලා, රජය ජයග්‍රහණය කරන බව විශේෂයෙන් මම ප්‍රකාශ කරනවා. ඒකාබද්ධ විපක්ෂය, ජනතා විමුක්ති පෙරමුණට උදේ ඉඳන් බනිනවා. බැනලා, එතුමන්ලා ගෙනාපු විශ්වාස භංග යෝජනාවට සහයෝගය ලබා දෙනවා. මොකක්ද මේ වැඩේ? එතුමන්ලාට බැන බැන මොකටද සහයෝගය ලබා දෙන්නේ? විශේෂයෙන්ම රජයක් වශයෙන් අපේ ස්ථාවරභාවය රටට පෙන්වන්න අපට හොඳ අවස්ථාවක් මේකෙන් ලැබිලා තිබෙනවා. අපි ඒ අවස්ථාව භාර ගන්නවා. භාර අරගෙන, අපේ රජයේ තිබෙන ස්ථාවරභාවය අපි රටට පෙන්වනවා. ඊළඟ ජනාධිපතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙක් ජයග්‍රහණය කරලා, එක්සත් ජාතික පක්ෂ ජනාධිපතිවරයෙක් පත් කිරීමේ මූලික අඩිතාලම අද මේ විශ්වාස භංග යෝජනාව තුළින් අපි රටේ ජනතාවට පෙන්වන බව විශේෂයෙන් මම ප්‍රකාශ කරනවා.

මේ සඳහා අපට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණට අපි ස්තුති වන්ත වෙනවා. ආණ්ඩුවේ ශක්තිමත්භාවය පෙන්වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව එතුමන්ලාට ස්තුති වන්ත වෙමින්, අද මෙම විශ්වාස භංග යෝජනාව පරාජය කර, ඉතා විශාල වැඩි ඡන්ද ප්‍රමාණයකින් රජය ජයග්‍රහණය කරන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

[අ.භා.3.36]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණ ලෙස අප මෙම ආණ්ඩුවට එරෙහිව ඉදිරිපත් කරන ලද විශ්වාස භංග යෝජනාව පිළිබඳව විවාදය පැවැත්වෙන දෙවැනි දිනයේ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට කැමැතියි. විශේෂයෙන්ම මේ විශ්වාස භංග යෝජනාව අප ඉදිරිපත් කර තිබෙන්නේ වර්තමාන ආණ්ඩුවට එරෙහිවයි. ඒ නිසා දැන් වර්තමාන ආණ්ඩුවේ මන්ත්‍රීවරු කිසිම අදාළත්වයක් නැති දේවල් කියමින් අපට විවිධ විවේචන ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම විශ්වාස භංග යෝජනාවේ අදාළ කරුණු එකක්වත් ප්‍රතික්ෂේප කරන්නට බැරි නිසා එතුමන්ලා වෙන වෙන දේවල් තමයි කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අප මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ, පැහැදිලි තොරතුරු තිබියදී අප්‍රේල් 21 ප්‍රහාරය වළක්වා නොගැනීමත්, ඒ ප්‍රහාරයෙන් පසු, පශ්චාත් බෝම්බ තත්ත්වය ඇතුළේ මේ රටේ උද්ගත වූ ජාතිවාදී, අන්තවාදී තත්ත්වය පාලනය කිරීමට අසමත් වීමත්, රටේ සාමාන්‍ය පරිපාලනය සාමාන්‍ය මට්ටමට ගෙනෙන්නට මාස එකහමාරකට ආසන්න කාලයක් ගත කිරීමත් කියන කරුණු මත පදනම් වෙලායි.

අපි ආණ්ඩු පාර්ශ්වය පරාජයට පත් කරන්න ක්‍රිකට්වලින් තරගය ඉල්ලුවාම, ආණ්ඩුව නිකම් මොනවා හෝ ඇටබෝල වාගේ එකකින් තමයි උත්තර දෙන්න හදන්නේ. අපි කියන්නේ, අපි මේ විශ්වාස භංගයෙන් ඉදිරිපත් කර තිබෙන කරුණු වැරැදියි කියලා කියන්න කියලායි. නමුත් කොහොමද එහෙම කියන්නේ? ඒක කියන්නේ නැතුව වෙන වෙන වල්පල් කියලා වැඩක් නැහැ නේ. අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ නිශ්චිත නඩුවක්; නිශ්චිත විවේචනයක්. ඒකේ තිබෙන්නේ තමුන්නාන්සේලා මහ බැංකුව කොල්ලකාපුවා, තවත් කරපු එක එක දූෂණ ගැන නොවෙයි. මෙහයි නිශ්චිත කරුණක් තිබෙන්නේ. එම නිශ්චිත කරුණට අදාළව උත්තර දීලා තමයි තමුන්නාන්සේලා මේ චෝදනාවෙන් නිවැරැදි වෙන්න ඕනෑකම තිබෙන්නේ. මේ විශේෂ කාරක සභාවේ දී ඔප්පු වෙමින් තිබෙන දේවල් හැම දෙයක්ම බැලුවාම පෙනෙනවා, තමුන්නාන්සේලා රට පරිස්සම් කරන්න අසමත් වුණු බව. බෝම්බයට කලින් පරිස්සම් කරන්නත් බැරි වුණා; බෝම්බයෙන් පස්සේ පරිස්සම් කරන්නත් බැරි වුණා. "කොහේද යන්නේ? මල්ලේ පොල්" ජාතියේ විවේචන තමයි තමුන්නාන්සේලාගෙන් ඉදිරිපත් වෙන්නේ. ඒක පළමුවැනි කාරණය.

දෙවැනි කාරණය මේකයි. විශේෂයෙන්ම ඊයේ මේ විවාදයට ඇහුම් කන් දෙද්දී මට හිතුණා, ජනතා විමුක්ති පෙරමුණ විසින් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවටද, නැත්නම් ඒකාබද්ධ විපක්ෂයටද කියලා. දැන් මෙහිදී හොයන්න තිබෙන්නේ සහරාන්ට පක්ෂද, නැද්ද කියන කාරණයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. වෙන දෙයක් හොයන්න නැහැ නේ. සහරාන් කරපු දේට පක්ෂ ද, විරුද්ධ ද? මේ තුළ අපි මුළු මහත් ආණ්ඩුවක ප්‍රතිපත්ති සාකච්ඡා කරලා නැහැ නේ. අපි මේ විශ්වාස භංග යෝජනාවෙන් සහරාන්ට විරුද්ධව; ඒ ත්‍රස්තවාදී ව්‍යාපාරයට විරුද්ධව කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. සහරාන්ගේ භූමිකාවට සහමුලින්ම ඉඩ කඩ දුන්නේ මේ ආණ්ඩුවේ නොසැලකිල්ල හේතුවෙන්. අපි එලෙස කරුණු ඉදිරිපත් කර තිබියදී, ඒකාබද්ධ විපක්ෂය සහ පොහොට්ටු පක්ෂයේ විවිධ කණ්ඩායම්වල පුද්ගලයන් ජනතා විමුක්ති පෙරමුණට තමයි දෙස් දෙවොල් තියන්නේ. හැන්සාඩ් වාර්තා බැලුවොත් ඒ කාරණය තේරෙයි. නමුත් මේ දවස් දෙකේ කරන්න තිබුණේ මේ සාහසික නොසැලකිලිමත්කමට අදාළව ආණ්ඩුවට විවේචන ඉදිරිපත් කරන්නයි. ඒකාබද්ධ විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා දෙස් දෙවොල් තියන්නේ, එලොවක් මෙලොවක් නැතුව කෑ ගහන්නේ ජනතා විමුක්ති පෙරමුණටයි. ජනතා විමුක්ති පෙරමුණට බණින්න වුවමනා නම්, තව ඕනෑ තරම් අවස්ථා ගන්න පුළුවන් නේ. මේ නිශ්චිත දවස් දෙක ඒ වෙනුවෙන් ගන්න ඕනෑ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම දැක්කා ආණ්ඩුවේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඇතුළු විවිධ මන්ත්‍රීවරු කියනවා, අපි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්නේ ඒකාබද්ධ විපක්ෂයට ආණ්ඩුවක් හදන්න උදවු කරන්නයි කියලා. ඒකාබද්ධ විපක්ෂයේ සමහර අය කියනවා, අපි මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ ආණ්ඩුවට උදවු වෙන්නය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා හිතන විධියට, මේ විවේචන දෙකෙන්ම ඉතා පැහැදිලිව ඔප්පු වෙනවා, ජනතා විමුක්ති පෙරමුණ ඉන්නේ නිවැරැදි තැනයි කියලා. ඒ කියන්නේ, "උනුත් එකයි, මූනුත් එකයි" කියන ප්‍රතිපත්තියේ හරිහැටි ඉඳලා තමයි අපි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. එහෙම නැත්නම් මේ දෙගොල්ලන්ටම වදින්න හේතුවක් නැහැ නේ. මේක පුදුම විශ්වාස භංග යෝජනාවක් කියලායි දැන් කියන්න වෙන්නේ. විශ්වාස භංග යෝජනාවට භාජන වන ආණ්ඩුවත් අපට ගහනවා. තමන් විපක්ෂයේ කියලා කියා ගන්නා, එක එක කතන්දර voice-cutsවලින් කියලා, විපක්ෂයේ විශාල භූමිකාවක් ඉටු කරන ඒකාබද්ධ විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලාත් මේ ආණ්ඩුවට ගහනවාට වඩා අපට ගහනවා. පක්ෂයක් ලෙස අපේ ස්ථාවරය නිවැරැදිද, නැද්ද කියන එක තේරුම් කර ගන්න අවශ්‍ය වෙන්නේ අපේ මිතුරන්ගේ ඇගැයීම් නොවෙයි. ඉතිහාසයේ යම්කිසි දවසක මාඕ සේතුං සහෝදරයා කියා තිබෙනවා, "අපි අපේ නිවැරැදිභාවය තක්සේරු කරනු ලබන්නේ මිතුරන්ගේ ඇගැයීම්වලින් නොව අපේ සතුරන්ගේ රුදුරු සෝෂාවලින්ය" කියලා. අපට මේ දෙපැත්තේම සෝෂා ඇහෙනවා. මේ සභාවේදී අපේ ඉස්සරහිනුත් සෝෂා එනවා. අපට දකුණු පැත්තෙනුත් සෝෂා එනවා. කම්බිය හරියටම tune කරලා, මේ දෙපැත්තේම තිබෙන භූමිකාව හෙළිදරවු කරන්න පුළුවන් වන විධියේ කටයුත්තක් මේ විශ්වාස භංග යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙනවාය කියලා ජවිපෙ වශයෙන් අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කිරීමට අදාළ කරුණු කාරණා මා දැන් කියන්න යන්නේ නැහැ. මොකද, ඒ පිළිබඳව ඇති වෙන්න කියා තිබෙනවා. මෙහි ඉදිරිපත් වී තිබෙන චෝදනා අතර ප්‍රධාන කාරණයක් තමයි, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළේ ඇයි කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් දන්නවා, මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ විශ්වාස භංග යෝජනාවලින් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්න පුළුවන් සහ ආණ්ඩුව සැබෑ ලෙසම පරාජය කරන්න පුළුවන් විශ්වාස භංග යෝජනාව මේ විශ්වාස භංග යෝජනාවයි කියලා. මා ඒක අභියෝග කරනවා.

විපක්ෂ ගත්තොත්, TNA එකේ මන්ත්‍රීවරු 14 දෙනෙක් ඉන්නවා. TNA එකේ එක මන්ත්‍රීවරයෙක් ස්වාධීනව සිටිනවා. එතකොට 15 දෙනායි. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 6 දෙනෙක් ඉන්නවා. එතකොට 21 දෙනෙක් ඉන්නවා. ඔක්තෝබර් 26වන දා මහින්ද රාජපක්ෂ මහතා අගමැති වශයෙන් පත් කළ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයෙන් ආපු මන්ත්‍රීවරුන් 5 දෙනෙක් තවම මහින්ද රාජපක්ෂ මහත්මයා සමඟ ඉන්නවා. ඒ පස්දෙනාත් එක්ක 26 දෙනායි. TNA එකේ වියාලේන්දිරන් මන්ත්‍රීතුමා දැන් කෙළින්ම ඒකාබද්ධ විපක්ෂයට සම්බන්ධවෙලා ඉන්නවා. එතුමාත් ඒකාබද්ධ විපක්ෂයට ආවේ මහින්ද රාජපක්ෂ මහත්මයා

[ගරු බිමල් රත්නායක මහතා]

අගමැති වශයෙන් පත් කළ වෙලාවේදීයි. එතුමාත් එක්ක 27 දෙනායි. එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඩග්ලස් දේවානන්දා මැතිතුමාගේ ඡන්දයත් එකතු වුණාම 91 දෙනෙක් ඉන්නවා. මා දන්නා තරමින් ඩග්ලස් දේවානන්දා මැතිතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානයත් එක්ක, ඒකාබද්ධ විපක්ෂයත් එක්ක දිගටම ඡන්දය දීලා තිබෙනවා. නිශ්චිතව ගත්තොත්, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු 6 දෙනා ස්ථිරවම මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දෙනවා නේ. අපි දිගටම එහෙම කරලාත් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා පසුගිය අය වැය හතරේදීම, ඒවාට විරුද්ධව ජවිපෙ ඡන්දය දුන් බව. හැබැයි එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන වර්තමාන විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා ඡන්දය දීලා තිබෙන්නේ එක අය වැයකට විරුද්ධව පමණයි. මා දන්නා තරමින් මහින්ද අමරවීර මැතිතුමා -විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා- මේ එකම එක අය වැයකටවත් විරුද්ධව ඡන්දය දීලා නැහැ. හැබැයි එතුමා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයායි. ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂයට උදවු කරනවා කියලා විවේචනය කළ බොහෝදෙනෙක් එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ සාක්කුවට බැහැලා ඇමති ධුර ලබාගෙන තිබෙනවා. විශේෂයෙන්ම, 2015 මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහත්මයා ඡන්දය ඉල්ලුවා නේ. මහින්ද රාජපක්ෂ මහත්මයා පැරදුණාම ඒ මන්ත්‍රීවරු රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ සාක්කුවට බැහැලා ඇමති ධුර ලබාගත්තා. ඊට පස්සේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා පරදින්න වාගේ යනකොට එතුමන්ලා නැවතත් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පැත්තට පනිනවා. එවැනි මන්ත්‍රීවරු රොත්තක්ම විපක්ෂය පැත්තේ ඉන්නවා. ඒ ගොල්ලන් එකම එක අවස්ථාවයි අය වැයකට විරුද්ධව ඡන්දය දීලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැයක් සහ විශ්වාස භංග යෝජනාවක් පමණයි, මැතිවරණ දෙකක් අතරදී ආණ්ඩුවක් ගෙදර යවන්න තිබෙන ක්‍රමය කියන එක ඔබතුමියත් දන්නවා නේ. ඒ සඳහා වෙනත් ක්‍රමයක් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැහැ. අය වැයක් පරද්දලා ආණ්ඩුවක් ගෙදර යවන්න පුළුවන්. එහෙම නැත්නම් විශ්වාස භංග යෝජනාවක් මඟින් ආණ්ඩුවක් ගෙදර යවන්න පුළුවන්. ඉතාම තීරණාත්මක, කල් තබා සූදානම් විය හැකි අය වැයකදීවත් ආණ්ඩුව පරද්දන්න වර්තමාන විපක්ෂ නායකතුමා -හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා- කටයුතු කළේ නැහැ.

මම අනික් ලැයිස්තුවත් කියවන්නම්. ඒ අතරේ මම ඒ තර්කය ඉවර කරන්නම්. 2018 අප්‍රේල් 4වන දා, මහ බැංකු වංචාව මුල් කරගෙන රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහ බැංකු වංචාව සම්බන්ධයෙන් වූ ඒ විශ්වාස භංග යෝජනාවට ඡන්දය දෙන්න අද රාජපක්ෂ මහතා සමඟ ඉන්න මේ මන්ත්‍රීවරුන්ගෙන් 26 දෙනෙක් පැමිණියේ නැහැ. රටටම අදාළව මේ කාරණය ගත්තාම, විශේෂයෙන්ම ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කියන විධියට, රනිල් වික්‍රමසිංහ මහත්මයා හම ගහන්න ඕනෑ ප්‍රධාන වැරැද්ද තමයි ඒක. එතුමන්ලා නිතර නිතර ඒක කියනවා. ඇත්ත තමයි. ඒක ලොකු වැරැද්දක්. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහ දවල් කළ ඒ මහ බැංකු කොල්ලය සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව ගෙන ආ විශ්වාස භංග යෝජනාවට ඡන්දය දෙන්න ආවේ නැති අය කවුද? මහින්ද අමරවීර මන්ත්‍රීතුමා, සරත් අමුණුගම මන්ත්‍රීතුමා, නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීතුමා, ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා, රංජිත් සියඹලාපිටිය මන්ත්‍රීතුමා, මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා, දුමින්ද දිසානායක මන්ත්‍රීතුමා, ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මන්ත්‍රීතුමා, මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා, ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමා, හිස්බුල්ලා මන්ත්‍රීතුමා සහ ඒ.එච්.එම්. ෆවුසි මන්ත්‍රීතුමා තමයි එදා ඡන්දය දෙන්න ආවේ නැත්තේ. අන්න වාගේ නාම ලේඛනයක් තිබෙනවා. ඒ වාගේම, නිශාන්ත මුතුහෙට්ටිගමගේ මන්ත්‍රීතුමා. විශ්වාස භංග යෝජනාවට අත්සන් කරලා ඒකට පක්ෂව ඡන්දය දෙන්න ආවේ නැති සමහර අයත් මෙතැන ඉන්නවා. මම නම් කියපු අයගෙන් එක්කෙනෙක් එහෙම කෙනෙක්. එතුමා තමයි, නිශාන්ත මුතුහෙට්ටිගමගේ මන්ත්‍රීතුමා. ඒ වාගේම අතුරලියේ රතන ස්වාමීන් වහන්සේත් ඉන්නවා. දැන් නම් රනිල් වික්‍රමසිංහ මහත්මයා හම්බ වුණොත් හක්කේ තියලා සෙම අරින සයිස් එකෙන් තමයි උන්වහන්සේ ඉන්නේ. හැබැයි, මීට මාස කිහිපයකට කලින්, සහරාන්ලා බෝම්බ හදන්න test කරන කාලයේ, සහරාන්ලා බෝම්බ හදන්න කටයුතු කරමින් ඉන්න කාලයේ අතුරලියේ රතන හාමුදුරුවෝ රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව ඡන්දය දුන්නේ නැහැ; මේ සභාවට වැඩියේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ඒ වාගේ දේශපාලන "ඩීල්" කරන, දේශපාලන විකට ජවනිකා සපයන කට්ටිය නොවෙයි. අපි 2015දී රාජපක්ෂ පරදවන්න වැඩ කළා. අපි ඒක 2015දී පටන් ගත් එකක් නොවෙයි. මෛත්‍රීපාල සිරිසේන කෙනෙක් ඡන්දය ඉල්ලන්න එනවාද, නැද්ද කියලා දන්නේ නැති කාලයේ ඉඳලාම අපි රාජපක්ෂලාගේ වංචා, දූෂණ ගැන එළිදරවු කළා. ජවිපෙ තමයි රාජපක්ෂ ආණ්ඩුවට විරුද්ධව ලොකුම ප්‍රහාර එල්ල කළේ. ඒ, රනිල් වික්‍රමසිංහ මහත්මයා සහ මහින්ද මහත්මයා කෝපි බිබී හිටපු කාලයේයි. නමුත් මේ රටේ ජනතාව තවමත් දූෂිත නායකත්වයක් දරන මේ පක්ෂ දෙක පස්සේ යනවා. මිනිස්සු හැම වෙලාවේම මේ දූෂිතයන් පත් කරගෙන, ඊට පස්සේ "කනවෝ, කනවෝ" කිය කියා ඉන්නවා. ඒ වැරැද්ද අපට ගන්න බැහැ. ඒ නිසා අපි රාජපක්ෂ පැරැද්දුවා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට අපි කියන්න ඕනෑ, 2015 අගෝස්තු මාසයේදී අපි වෙනම ඡන්දය ඉල්ලුවාය කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට "ඩීල්" තිබෙනවා නම්, දේශපාලන වාසි ගන්න නම් අපට කරන්න තිබුණු හොඳම දේ මොකක්ද? 2015දී පවත්වපු පාර්ලිමේන්තු මැතිවරණයේදී අපට තිබුණා, ඒ වෙලාවේ ජයග්‍රාහී පක්ෂය වුණු එක්සත් ජාතික පක්ෂය සමඟ සන්ධානගත වෙලා ඒකෙන් ඡන්දය ඉල්ලන්න. මම බොහොම නිහතමානීව කියනවා, අපෙන් අපේක්ෂකයන් 50 දෙනෙක් ඉදිරිපත් කළා නම් ඒ 50 දෙනාම මිනිස්සු විසින් දිනවන බව. ඒ ගැන අපට කිසිම සැකයක් නැහැ. 2004දීත් ඒක වුණා. ප්‍රාදේශීය සභාවකවත් හිටපු නැති අපේ අපේක්ෂක අපේක්ෂිකාවන්ව, ලංකාවේ අවුරුදු 50ක විතර කාලයක් තිස්සේ මැති ඇමතිකම් දරපු අයට වඩා උඩින් ඡන්දය දීලා ගෙනාවා, අපේ ජනතාව. අනුර බණ්ඩාරනායක මැතිතුමාට වඩා විජිත හේරත් සහෝදරයාට ගම්පහ මිනිස්සු ඡන්දය දුන්නා. ඒ නිසා, අපට මන්ත්‍රීකම් වැඩි කර ගන්න ඕනෑ නම් 2015දීත් එහෙම කරන්න තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. නමුත් අපි එහෙම කළේ නැහැ. අපි වෙනම ඡන්දය ඉල්ලුවා. අපි හෙට කරන්නේත් ඒකයි. ඒ නිසා මම කියන්නේ මේකයි. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ සාක්කුවට බැහැලා, මහා පරිමාණ අපරාධ කරපු කාලයේ එතුමා රැකපු කට්ටිය අද අපට ඇවිල්ලා කියනවා, අපි "ඩීල්" දමනවා කියලා. ඒ නිසා මම කියන්නේ, දැන් ඒ බොරු චෝදනා පැත්තකින් තියන්න කියායි. "ඩීල්" කථා ඕනෑ වෙලාවක කියන්න. හැබැයි, අද නොවෙයි.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ මෙච්චරයි. මහින්ද රාජපක්ෂ මැතිතුමනි, මේක ඔබතුමාටමයි කියන්නේ. ඔබතුමා මේ වෙලාවේ පාර්ලිමේන්තුව ඇතුළේ ඉන්නවා ඇති කියලා මම හිතනවා. ඉන්නවා නම් ඔබතුමා මේ ගරු සභාවට එනවා නම් හොඳයි. දැනට TNA එකේ

මන්ත්‍රීවරුන්ගේ ඡන්ද සංඛ්‍යාව නැතිව ඡන්ද 103ක් තිබෙනවා. ඒ, TNA එකේ ඡන්ද 14යි, සිවශක්ති ආනන්දන් මැතිතුමාගේ ඡන්දයයි නැතිව. ඊළඟට, ජනතා විමුක්ති පෙරමුණේ 6 දෙනායි, UNP එකෙන් cross over කරලා, මහින්ද මහත්මයාගේ පැත්තට පැමිණි 5 දෙනායි, TNA එකේ එස්. වියාලේන්ද්‍රිරන් මැතිතුමාගේ ඡන්දය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඩග්ලස් දේවානන්දා මැතිතුමාත් එක්ක 91 දෙනෙක් ඉන්නවා. ඔක්කෝම 103 දෙනෙක් ඉන්නවා. එතකොට ආණ්ඩුවට කීදෙනාද ඉන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුවට ඉන්නේ 106 දෙනායි. ඒ නිසා දැන් කරන්න ඕනෑ මොකක්ද? මහින්ද රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමා ජනතා විමුක්ති පෙරමුණට ඕනෑ දෙයක් කියලා බණින්න. ඒක අපට අවුලක් නැහැ. අපට විවේචන පුරුදුයි. ඔබතුමාගේ ගෝලයෝ දමලා ඕනෑ තරම් අපට බන්නවන්න. ඒකත් ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන විපක්ෂ නායකවරයා; පොහොට්ටුවේ නොවෙයි. අපි ඔබතුමාට කියන්නේ මේකයි. වෙන කථා මොනවත් ඕනෑ නැහැ. අපට ගහන්න ඕනෑ නම් පොලුවලින් ගැහුවත් කමක් නැහැ. ඒකට කමක් නැහැ. ඔබතුමා අද ඒ මන්ත්‍රීවරුන් 97 දෙනා ගෙනැල්ලා පෙන්වන්න. ඔබතුමාගේ මන්ත්‍රීවරුන් 97 දෙනා ගේනවාද, නැද්ද කියලා අපට කියන්න. වෙන මොනවත් එපා. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ සභාවට එනවා නම්, මගේ කථාව දැන් නතර කරලා ඕනෑ නම් කථා කරන්න වෙලාව දෙන්නම්. මොකද, අද එතුමාගේ කථාවකුත් නැහැනේ. දෙයියනේ, එතුමා රටේ විපක්ෂ නායකවරයා. ආණ්ඩුවට විරුද්ධ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී එතුමා කථා කරන්න එපායැ. ආණ්ඩුවට විරුද්ධ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදයේදී එතුමා කථා කරන්නේ නැහැ. මා දන්නේ නැහැ, ඊයේ එතුමා කථා කළාද කියලා. එතුමා අද කථා කරනවා නම් මා දැක්කේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මහින්ද රාජපක්ෂ විපක්ෂ නායකතුමාගේ ප්‍රධානත්වයෙන් මීට සති දෙකකට කලින් පැවති එක්සත් ජනතා නිදහස් සන්ධාන මන්ත්‍රී කණ්ඩායමේදී මේ යෝජනාවට දින නියම කර ගත්තා. ඒ දවසේ සිට අපි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න තීරණයක් ගත්තා. ඒ ආකාරයට මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ තීරණය ගත්ත බව මා කියන්න ඕනෑ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අපි ඒ වෙනුවෙන් එතුමාට ස්තුති කරලා තිබෙනවා. මා කියන්නේ ඒක නොවෙයි. ඒ ස්ථාවරය ගැන අපි දන්නවා. මා කියන්නේ ඒක න◌ා◌ාවෙයි. ඒ මන්ත්‍රීවරු 97 දෙනා අද ගෙනෙන්න ඕනෑ. එතකොට තමයි 103ක් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, TNA එකේ මන්ත්‍රීවරු එක්ක දැනට ඡන්ද තුනක වෙනසක් තිබෙන්නේ. අපි ඒකාබද්ධ විපක්ෂය එක්ක කථා කරන්න ඕනෑ නැහැනේ. මොකද, ඒ ගොල්ලන් තද ආණ්ඩු විරෝධී බවක්නේ voice-cutsවලින් පෙන්වන්නේ. ඔය ඒකාබද්ධ විපක්ෂය ආණ්ඩුවට විරුද්ධව මේ මාස හයට එක පෝස්ටර් එකක් ගහලා නැහැ, එක picket එකක් කරලා නැහැ, එක පෙළපාළියක් ගිහිල්ලා නැහැ. හැබැයි, ඔබතුමාට පක්ෂ රූපවාහිනී නාලිකා දෙකක් තිබෙනවා. ඒ පක්ෂ රූපවාහිනී නාලිකා දෙ හරහා ඔබතුමන්ලා ආණ්ඩුවට විරුද්ධව දැවැන්ත දේශපාලනයක් කරනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. මා කියන්නේ මේකයි. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමා ඒ මන්ත්‍රීවරුන් 97 දෙනා අද ගෙනෙනවාද? විපක්ෂ නායකවරයා වශයෙන් විශ්වාස භංග යෝජනාව ගැන ඔබතුමාට කථා කරන්න බැරි වෙලා තිබෙන්නේ ඇයි? මේ පැත්තට ආපු එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීතුමන්ලා -අශෝක ප්‍රියන්ත, නාවින්න මැතිතුමා ඇතුළු - පස් දෙනෙකු ඉන්නවා. "ඡන්දය දීමට එන්න එපා. ඡන්දය දුන්නොත් මන්ත්‍රීකම් නැති වෙන්න ඉඩ තිබෙනවා" කියලා මේ පස් දෙනාට කියලා තිබෙනවා කියලා අද අපට ආරංචියක් ලැබිලා තිබෙනවා. මට ඒ ගැන බරපතළ සැකයක් තිබෙනවා. ඔබතුමන්ලාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමා එතුමන්ලාට එහෙම කිව්වා කියලා තමයි දැනට ආරංචි වෙලා තිබෙන්නේ. ඒ පස් දෙනා මහින්ද රාජපක්ෂ මහත්තයා අගමැති කරන්න මේ පැත්තට මාරු වුණු අය. ඒ අයට විනය පරීක්ෂණ ප්‍රශ්නයක් තිබෙනවා නම් එදා ඒ වෙලාවේ ඒක එන්න ඕනෑ. දැන් ඒ අයට විනය පරීක්ෂණ කරන්න කාලයක් නැහැ. තව මාස කීපයකින් -උපරිම වශයෙන් මාර්තු 01 වැනි දා වනකොට- පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් අපි ඉල්ලන්නේ වෙන කතන්දර නොවෙයි. ඔබතුමා ඔබතුමාගේ මන්ත්‍රීවරුන් 97දෙනා අද ගෙනෙන්න. ජවිපෙ හයදෙනාගේ ඡන්දය අපි දෙනවා. ඔබතුමන්ලාට "ඩීල්" නැත්නම්, අද අගමැතිතුමා එක්ක මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ගැන හොරෙන් විශේෂ සාකච්ඡාවක් පැවැත්වුයේ නැත්නම්, - මා දන්නා තරමින් විශේෂ සාකච්ඡාවක් තිබුණා. මා කියන දේ වැරැදි නම් එතුමාට එය ප්‍රතික්ෂේප කරන්න පුළුවන්. මා දන්නා තරමින් විශේෂ සාකච්ඡාවක් පැවැත්වූවා. ඊට පස්සේ තමයි අපි දැන ගත්තේ යූඑන්පී මන්ත්‍රීවරු පස් දෙනාට ඡන්දය දෙන්න එපා කිව්වා කියලා. ඒක එහෙම නොවෙයි නම් එතුමා ඇවිල්ලා එය ප්‍රතිකේෂ කළොත් හොඳයි. වෙන අය ඒක කියලා වැඩක් නැහැ. අපි කියන්නේ මේකයි. මහින්ද රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමා ඒ මන්ත්‍රීවරුන් 97 දෙනා අද ගෙනෙන්න. අපි TNA එකත් එක්ක නිල වශයෙන් සාකච්ඡා කීපයක්ම පවත්වලා තිබෙනවා. ඔබතුමන්ලාත් අපේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දෙන්න. TNA එක අවුරුදු හතරක් තිස්සේ විපක්ෂයේ ඉන්නවා. නමුත් දිගටම ආණ්ඩුවට පක්ෂව ඡන්දය දීලා තිබෙනවා. අඩුම ගණනේ මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඔබතුමන්ලා ඡන්දය දෙන්න. එහෙම බැරි නම් ඡන්දය දීමෙන් වැළකී සිටින්න. මොකද, ඡන්ද 103ක් සහ ඡන්ද 106ක් වශයෙන් බෙදීමක් තමයි මෙතැන තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කුමන්ත්‍රණකාරී ලෙස, ව්‍යවස්ථා කඩාගෙන, විනිශ්චයකාරවරු හත් දෙනෙකු,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

තව විනාඩි දෙක හමාරක් තිබෙනවා. මම stopwatch එක දාලා කථා කරන්න පටන් ගත්තේ. මම තව විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්.

සහරාන්ට පක්ෂව ඡන්දය දීලා, TNA එකේ මන්ත්‍රීවරුන්ට ගමට යන්න බැරි බව අපි හොඳටම දන්නවා. සහරාන්ට පක්ෂව ඡන්දය දීලා, එතුමන්ලාට උතුරට යන්න බැහැ. ඒ නිසා මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දෙන්න කියලා අපි TNA එකේ නායකයන්ට කියනවා. වියාලේන්ද්‍රිරන් මන්ත්‍රීතුමා ඔබතුමන්ලාගේ පැත්තට ගන්න තිබුණු උනන්දුවෙන් දශමයක් දැන් ඔබතුමන්ලා පෙන්වන්නේ නැහැනේ, TNA එකේ හෝ වෙන කෙනෙකු සම්බන්ධ කර ගන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාටද කියන්නේ?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමන්ලාගේ හිටපු ජනාධිපතිතුමාටයි මා මේ කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වෙන කතන්දර ඕනෑ නැහැ. අපට කියන්න තිබෙන ප්‍රධාන කරුණ මෙයයි. ආණ්ඩුව පරද්දන්න බරපතළ අවස්ථාවක් මෙතැන තිබෙනවා. මේ ආණ්ඩුව පරද්දලා තව ආණ්ඩුවක් හදන්න බැරි නම් ඊළඟට අපි යෝජනා කරන්නම්, පාර්ලිමේන්තුව විසුරුවා හරින්න කියලා. අපි ඒ යෝජනාවත් ගෙනෙන්නම්. ඒ යෝජනාවට පක්ෂව ඡන්ද 150ක් තිබෙනවා නම් ඒක කරන්න පුළුවන්. රනිල් වික්‍රමසිංහ හෝ මහින්ද රාජපක්ෂ හෝ වෙන කෙනෙක් අගමැති පුටුවේ වාඩි කරවන්න අපට අවශ්‍ය නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයට මන්ත්‍රීවරු 200ක් හිටියත් ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ යෝජනාව ගෙනෙනවා. මේක ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක්. මේ ආණ්ඩුව සහමුලින්ම -අමු අමුවේ- විශ්වාස භංගයක් උපයාගෙන තිබෙන බව මේ ගරු මැතිඇමතිවරු සියලු දෙනා හෘදය සාක්ෂියට අනුව දන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් නියමිත කාලය අවසානයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තව තත්පර 50ක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා ඔබතුමියගේ අණට කීකරු වෙමින් අමතර කරුණක් ගැන ඉතාම කෙටියෙන් කියන්න කැමැතියි.

ගාල්ල, මානවිල, උපනන්ද ජාතික පාසලේ වෙඩි තැබීමක් සිදු වුණා. එයත් බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ ඇති වූ තත්ත්වයක්. මොකද, ඉස්කෝල ළඟ හමුදා සොල්දාදුවන් දැමීම නිසා. එහිදී නාවික හමුදාවේ තූර්ය වාදක කණ්ඩායමේ හිටපු සාමාජිකයකු වන උදය ප්‍රදීප් කුමාර කියන දරු තුන්දෙනෙකුගේ තාත්තෙකුට වෙඩි තියලා, මැරුණා. අද ශ්‍රී ලංකා යුද හමුදාව වරද භාර ගැනීම ප්‍රතික්ෂේප කරනවා, ඒ තාත්තා අවිය උදුර ගන්න ගිය නිසා සිදු කළ දෙයක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මම අහන්නේ, මේවා හෘදය සාක්ෂියට එකඟව කියන දේවල්ද? මට කියන්න වෙන දෙයක් නැහැ. ඒක මොන හෙණ ගහන කථාවක්ද? ඒ දරු පැටියා අඬ අඬා කියනවා, "තාත්තා මගේ කකුල් දෙක ළඟ වැටුණා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අම්මා කෙනෙක්. මම තාත්තා කෙනෙක්. යුද හමුදාවට පිළිගන්න බැරි ඇයි, තමන්ගේ සොල්දාදුවාගෙන් වැරැද්දක් වුණා කියලා. මට වෙඩි තියලා මගේ දරුවාගේ කකුල් දෙක ළඟ මම වැටුණොත්, එහෙම නැත්නම් කාට හෝ එහෙම වුණොත්- [බාධා කිරීමක්]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මගේ කථාවට බාධා කරන්න එපා. ඔබතුමා ඉදිරිපත් කරන්නේ point of Order එකක් නොවන බව මම ස්ථිරවම දන්නවා. ඒ නිසා ඔබතුමා පසුව කථා කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කරුණාකරලා ඒ සාහසික අපරාධය කරන්න එපා කියලායි මම යුද හමුදාවෙන් ඉල්ලා සිටින්නේ. මුළු හමුදාවේ අයම වෙඩි තියලා මිනිසුන් මරන්නේ නැහැ නේ. අපි යුද හමුදාවෙන් ඉල්ලා සිටින්නේ, මේ වැරැද්ද පිළිගන්න; පිළිගෙන ඒ පවුලට වන්දි ගෙවන්න කියලායි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ කාරණය ඉදිරිපත් කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒක point of Order එකක් නොවෙයි නේ. කරුණාකරලා මගේ කාලය ලබා දෙන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒ මිය ගිය හමුදා නිලධාරියාගේ බිරිඳ සහ දරුවන් තුන්දෙනා මේ මොහොතේ මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ගරු අගමැතිතුමා හමු වෙලා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමියට ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියන්නේ, ඒ දරු පවුලට වන්දි ගෙවන්න කියලා විතරක් නොවෙයි. යුද හමුදාව පිළිගත යුතුයි, තම සොල්දාදුවාගෙන් ඒ වැරැද්ද වුණා කියලා. යුද හමුදාවේ නාමයට ඒකෙන් කැළලක් වෙන්නේ නැහැ. කරුණාකරලා ඒ වරද පිළිගන්න කියලා යුද හමුදාවෙන් ඉල්ලා සිටිමින් අපි රාජපක්ෂ මැතිතුමාටත්, සම්පන්දන් මැතිතුමාටත් කියනවා, නිකම් බොරු, "ඩීල්" යනාදි කථා කියන්නේ නැතුව අද එතුමන්ලාගේ ඡන්ද ටික ගෙනැල්ලා පෙන්වන්න කියලා. බොහොම ස්තුතියි.

[பி.ப. 3.58]

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மக்கள் விடுதலை முன்னணியினால் அரசாங்கத்துக்கு எதிராகக் கொண்டுவரப்பட்டுள்ள நம்பிக்கையில்லாப் பிரேரணை தொடர்பான விவாதத்திலே பேசச் சந்தர்ப்பம் தந்தமைக்கு முதலிலே நன்றியைக் கூறிக்கொள்கின்றேன். JVP இனால் கொண்டுவரப்பட்டுள்ள இந்த நம்பிக்கையில்லாப் பிரேரணை யிலே குறிப்பிடப்பட்ட விஷயங்களை ஒவ்வொன்றாக நான் வாசித்தபோது அதிலே அவர்கள் நூற்றுக்குநூறு வீதம் உண்மையைத்தான் சொல்லியிருக்கின்றார்கள் என்பது தெரிய வந்தது. ஆகவே, இந்த நம்பிக்கையில்லாப் பிரேரணைக்கு

ஆதரவாக வாக்களிக்க வேண்டுமென்று என்னுடைய மனச்சாட்சி சொல்கின்றது.

இந்த நாட்டிலே உயிர்த்த ஞாயிறு தினத் தாக்குதல் இடம்பெற்றதன் பின்னர், அந்தப் பயங்கரவாதச் செயலைச் செய்த சஹ்ரான் தலைமையிலான கூட்டத்தினருடைய அநியாயம் தொடர்பிலான குற்றச்சாட்டை எதிர்த்தரப்பினர் என்மீதும் என் சமுதாயத்தின்மீதும் என்னைப்போன்ற அரசியல்வாதிகள்மீதும் திணித்து, அதன்பிறகு என்மீது நியாயமில்லாமல் 10 குற்றச்சாட்டுக்களை சுமத்தி, ஒரு நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவந்தார்கள். அந்த 10 குற்றச்சாட்டுக்களும் பயங்கரவாதத்தோடு சம்பந்தப் படுத்தப்பட்ட குற்றச்சாட்டுக்களாகும். அதாவது, நான் இந்த நாட்டுக்குக் கேடான செயலைச் செய்ததுபோல நினைத்துச் சொல்லப்பட்ட மிக ஆபத்தான, மோசமான குற்றச் சாட்டுக்களாகும். இந்த நாடே இந்தத் தாக்குதலினால் அஸ்த்தமித்திருந்தபொழுது, என்மீது அபாண்டமான குற்றச்சாட்டுக்களைச் சுமத்தி, அவ்வாறான குற்றச்சாட்டுக்கள் பற்றி இந்தப் பாராளுமன்றத்திலே தெரிவித்து, அவசர அவசரமாக குறித்த நம்பிக்கையில்லாப் பிரேரணையை முன்னெடுத்து, அதிலே என்னைத் தோற்கடித்துத் தங்களுடைய எதிர்பார்ப்பை வெற்றிகொள்ளலாம் என்று எதிர்க்கட்சியினர் நம்பியிருந்தார்கள். உண்மையிலே எதிர்க்கட்சியிலே இருந்து அதைச் செய்தவர்களில் அதிகமானோர் என்னுடைய நண்பர்களாவர்; அதிக காலம் என்னோடு அமைச்சர்களாகச் சேவை செய்தவர்கள். அவர்களும் எதிர்த்தரப்பிலிருந்து அந்தப் பிரேரணையிலே கையொப்பமிட்டிருந்தார்கள். விருப்பத்துடனா அல்லது விருப்பமின்றியா அவர்கள் அதில் கையொப்பமிட்டார்கள் என்பது எனக்குத் தெரியாது.

என்மீது அவ்வாறான குற்றச்சாட்டுக்கள் சுமத்தப் பட்டிருக்குமாகவிருந்தால், அது சம்பந்தமாகப் பொலிஸில் முறைப்பாடு செய்யுங்கள் என்று பொலிஸார் பகிரங்கமாகவே ஊடகங்கள் மூலமாக அழைப்பு விடுத்தார்கள். ஓர் அமைச்சருடைய பெயரைச் சொல்லி, அவருக்கு எதிராகக் குற்றச்சாட்டுக்கள் இருந்தால் - பயங்கரவாதத்தோடு தொடர்புபட்ட விடயங்கள் இருந்தால், அது பற்றிப் பொலிஸில் முறைப்பாடு செய்யுங்கள் என்று கடந்த யூன் மாதம் 12ஆம் திகதி வரை காலக்கெடு கொடுத்து, ஒவ்வோர் ஊடகத்திலும் அறிவிக்கப்பட்டமை இந்த நாட்டின் வரலாறாக இருக்கின்றது. என்மீது பாரிய 10 குற்றச்சாட்டுக்களைச் சுமத்தியவர்களில் எத்தனை பேர் எனக்கு எதிராக பொலிஸிலே போய் முறைப்பாடு செய்தார்கள்? என்று கேட்கிறேன். உண்மை யாகவே அவர்கள் දේශප්‍රේමී - தேசப்பற்றுடையவர்களாக இருந்தால், அந்த நம்பிக்கையில்லாப் பிரேரணையில் உள்ளத்தால் கையொப்பமிட்டிருந்தால், பொலிஸிலே போய் எனக்கு எதிராக 10 குற்றச்சாட்டுக்கள் தொடர்பில் முறைப்பாடு கொடுத்து, என்னைச் சிறையில் அடைப்பதற்கு அல்லது இந்த நாட்டிலே இருக்கின்ற அதிகபட்ச தண்டனையான மரண தண்டனையை எனக்குப் பெற்றுக் கொடுப்பதற்கு முயற்சி செய்திருக்க வேண்டும். ஆனால், அந்த 10 குற்றச் சாட்டுக்களையும் நான் நிராகரிக்கின்றேன். அவை உண்மைக்குப் புறம்பான விடயம் எனப் பொலிஸ்மா அதிபரும் தெரிவித்திருக்கின்றார். பாராளுமன்றத் தெரிகுழுவின்முன் என்னை அழைத்தபொழுது, அந்தக் குற்றச்சாட்டுக்களுக்கான பதில்களை நான் சொல்லியிருந்தேன். நான் எதிர்க்கட்சியில் இருக்கின்ற எனது நண்பர்களுக்குச் சவால் விடுக்கின்றேன். இந்தப் 10 குற்றச்சாட்டுக்களில் ஒரு குற்றச்சாட்டையாவது உங்களால் நிரூபிக்க முடியுமாக இருந்தால், நான் என்னுடைய அரசியல் வாழ்விலிருந்து விடைபெறுவதற்குத் தயாராக இருக்கிறேன் என்று இந்த உயர் சபையிலே கூறிக்கொள்ள விரும்புகிறேன். உயிர்த்த ஞாயிறு தினத் தாக்குதலை அரசியலுக்காகப் பயன்படுத்தாதீர்கள்!

இத்தாக்குதலினால் கிட்டத்தட்ட 250 உயிர்கள் காவு கொள்ளப்பட்டன. உங்களுக்கும் தாய், தந்தை, பிள்ளைகள், உறவுகள் இருக்கிறார்கள். அவ்வாறே எனக்கும் இருக் கிறார்கள். அந்த வகையில் இந்தத் தாக்குதலின்போது காவுகொள்ளப்பட்ட அந்த 250 உயிர்களையும் நினைத்து இன்றும் நான் வேதனையினால் வாடிக்கொண்டிருக்கிறேன். உதாரணமாகச் சொன்னால், 6 அங்கத்தவர்கள் குடியிருந்த ஒரு வீட்டிலே ஒருவர்தான் இன்று இருக்கின்றார் என்று கூறலாம். அதாவது, 4 பேர் இல்லை; 5 பேர் இல்லை அல்லது பிள்ளை இருக்கின்றது! தாய் இல்லை! அந்த 250 உயிர்களையும் பலி கொடுத்தவர்களுடைய குடும்பங்கள் இன்று வேதனையின் விளிம்பில் இருக்கின்றன. இந்த 250 பேரின் உயிரைப் பலியெடுத்து, 500 பேரைக் காயப்படுத்திய இந்தப் பாவச் செயலை யார் செய்தாலும் அவர்கள் நிச்சயமாகத் தண்டிக்கப் படவேண்டும். இந்தப் பயங்கரவாத நடவடிக்கையில் ஈடுபட்ட சஹ்ரான் உட்பட கொலையாளிகள் அத்தனை பேரும் அவர்களுக்குப் பக்கபலமாக இருந்த அத்தனை பேரும் நிச்சயமாகத் தண்டிக்கப்படவேண்டும். இந்த நாட்டிலே இடம்பெற்ற உயிர்த்த ஞாயிறுத் தாக்குதல் தொடர்பாக ஜே.வீ.பீ. கட்சியினால் கொண்டுவரப்பட்ட பிரேரணையில் சுட்டிக்காட்டப்பட்ட அத்தனைக் குற்றச்சாட்டுக்களும் உண்மையானதாகும்.

இந்த அரசாங்கத்தில் அமைச்சராக இருந்தவன் என்ற வகையில் நான் உட்பட இங்கிருக்கின்ற கௌரவ அக்கில விராஜ் அவர்கள் உட்பட, கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்கள் உட்பட, எங்களுடைய மேதகு ஜனாதிபதி அவர்கள் உட்பட மற்றும் பாதுகாப்புத் தரப்பினர் உட்பட அத்தனைபேரும் குறித்த விடயம் சம்பந்தமாக இறைவனிடத்தில் பதில் சொல்லியாகவேண்டும் என்பதை நீங்கள் விளங்கிக் கொள்ளுங்கள். சஹ்ரான் செய்த இந்த அநியாயச் செயலுக்கான இன்னொருவரின்மீது பழிசுமத் தாதீர்கள். "சஹ்ரான் என்ற ஒருவர் இருக்கின்றார். அவருடைய பேச்சு, செயற்பாடு, பிரச்சாரம் முதலியன ISIS அமைப்புடன் சம்பந்தப்பட்டதாக இருக்கின்றது" என்று எங்களுடைய உலமா சபையினர் மற்றும் சஹ்ரான் பற்றித் தெரிந்த ஒரு சிலர் பொலிஸாரிடம் சென்று முறையிட்டிருந்தும், இப்படியொரு தாக்குதல் கிறிஸ்தவ ஆலயங்களிலே நடக்கவிருக்கின்றது என்று 4ஆம் திகதி தெரிந்திருந்தும், சம்பந்தப்பட்டவர்களின் தொலைபேசி இலக்கம், பெயர் உட்பட எல்லாம் சொல்லப்பட்ட பின்னரும் இந்தத் தாக்குதலைத் தடுக்க வக்கில்லாதவர்கள் என்மீதும் எனது சமுதாயத்தின்மீதும் அத்தனை பழியையும் திணிக்கப் பார்க்கின்றார்கள். இந்த நாட்டிலிருக்கின்ற 22 இலட்சம் முஸ்லிம் மக்களும் அனைத்து முஸ்லிம் அரசியல்வாதிகளும் இந்தத் தாக்குதலைக் கண்டித்தது மட்டுமல்ல, Roadற்கும் வந்தார்கள். பயங்கரவாதத்தோடு தொடர்புடைய அநியாயத்தைச் செய்தவர்களுக்குரிய உச்ச தண்டனையைக் கொடுங்கள் என்று உலமா சபையினர் மற்றும் மார்க்கத் தலைவர்கள், புத்திஜீவிகள், அரசியல் வாதிகள் ஒன்றுபட்டுச் சொன்னார்கள். அதுமட்டுமல்ல, தற்கொலை முயற்சியை மேற்கொண்டு, பல உயிர்களைப் பலியெடுத்தவர்களுடைய பிணத்தைக்கூட எங்களுடைய 'மையத்'தை அடக்குகின்ற 'மையத்து' வாடிகளிலே அடக்கம் செய்ய வேண்டாம்; அந்த உடல்களை வேறு எங்கேயாவது கொண்டு போய்ப் புதையுங்கள் அல்லது எரியுங்கள் என்று சொன்னோம்; அவர்கள் இஸ்லாமியர்கள் அல்லர் என்று சொன்னோம். இஸ்லாத்திலே அடிப்படைவாதம் என்பது கிடையாது, பயங்கரவாதம் என்பது கிடையாது என்று

[ගරු රිෂාඩ් බදියුදීන් මහතා]

சொன்னோம். ஆனால், ரத்ன தேரர் அவர்கள் 'இஸ்லாமியப் பயங்கரவாதம்' என்று அடிக்கடி பேசுகின்றார். ISIS வாதிகள் இஸ்லாமியர்கள் அல்லர். இவ்வாறான கொடூரமான தாக்குதல் களைச் செய்யுமாறு இஸ்லாமிய மார்க்கத்திலே எங்கும் சொல்லப்பட்டது கிடையாது. உலகமெல்லாம் 54 முஸ்லிம் நாடுகள் இருக்கின்றன. 54 முஸ்லிம் நாடுகளையும் அழிப்பதற்காக, முஸ்லிம்களுடைய நிம்மதியைத் தொலைப் பதற்காக, முஸ்லிம் நாடுகளினுடைய பொருளாதாரத்தை நசுக்குவதற்காக உருவாக்கப்பட்ட agentsதான் ISIS பயங்கரவாத அமைப்பு! இந்த ISIS agents இங்கே நுழைவதற்கு யார் காரணமாக இருந்தார்கள்?

குறித்த நாளிலே இவ்வாறெல்லாம் குண்டுவைக்கப் போகின்றார்கள் என்றெல்லாம் தெரிவித்தபோதும் இவை அத்தனையும் நடந்து முடியும்வரை இருந்துவிட்டு, 10 குற்றச்சாட்டுக்களை என்மீது சுமத்தி ஒரு நம்பிக்கையில்லாப் பிரேரணையினைக் கொண்டுவந்தார்கள். முஸ்லிம்களாகிய எங்களுடைய சொத்துக்களைச் சூறையாடுகின்ற செயற்பாடு களைக் காடையர்கள் மேற்கொண்டார்கள். மினுவான் கொடையிலே, ஹெட்டிப்பொலவிலே, சிலாபத்திலே இன்னும் பல ஊர்களிலே சென்று, சொத்துக்களையெல்லாம் அநியாய மாகச் சிதைத்தார்கள்; 29 பள்ளிவாசல்களை உடைத்தார்கள். அமீர் என்ற ஒரு சகோதரரை அவரின் 4 பிள்ளைகளும் பார்த்துக்கொண்டிருக்க வாய்க்குள்ளே 'அசிற்றை' ஊற்றி அடித்துக்கொன்றார்கள். இவற்றை யெல்லாம் பொலிஸாரும் இராணுவமும் பார்த்துக் கொண்டிருந்தார்கள். இங்கே சகோதரர் பிமல் ரத்நாயக்க அவர்கள் பேசும்போது, அண்மையிலே பாடசாலைக்குத் தனது பிள்ளையைப் பார்க்கச் சென்ற தந்தையொருவரைப் பாதுகாப்புத் தரப்பு சுட்டுக் கொலை செய்ததாகச் சொன்னார். நிராயுதபாணியாகச் சென்ற ஒரு தந்தை சுடப்பட்டிருக்கின்றார். ஆனால், 300 - 400 பேர் அடங்கிய காடையர் கூட்டம் சிலாபத்திலே, ஹெட்டிப்பொலவிலே பகலிலே தொடங்கி இரவு வரை 10 - 12 மணித்தியாலத்திற்குள்ளே 300 கடைகளை எரித்து, 900 வீடுகளை உடைத்து, 29 பள்ளிவாசல்களை உடைத்து, ஒரு சகோதரரைக் கொலை செய்து, 7 பேரை அடித்துக் காயப்படுத்தி அநியாயம் செய்தபொழுது பொலிஸாருடைய, இராணுவத்தினருடைய துவக்கு வெடிக்கவில்லை! அவர்களுடைய துவக்குக்குள்ளே குண்டிருக்கவில்லை! அங்கு வந்தவர்களைத் துரத்துவதற்குக்கூட அவர்களுடைய கையிலே யிருந்த ஆயுதம் பயன்படுத்தப்படவில்லை! ஆனால், இந்த நாட்டிலே நடக்கின்ற நியாயமான செயல்போல சிலர் இதைச் சித்தரிக்கின்றார்கள். அந்தச் சம்பவம் குறித்த 'வீடியோ'க் களிலே அடையாளம் தெரிந்த - முகம் தெரிந்த 300க்கும் மேற்பட்டவர்கள் பிடிக்கப்பட்டார்கள். இவர்களை ஒன்றரை வருடம் தடுத்து வைப்போம் அல்லது கொஞ்சக் காலம் தடுத்து வைத்து எச்சரித்து, இனிமேல் இவ்வாறான கேவலமான செயற்பாடுகளை நாட்டிலே இவர்கள் செய்யாமலிருக்க நடவடிக்கையெடுப்போம் என்று எல்லாம் சொன்னார்கள். ஆனால், ஒரு வார காலத்திலேயே அவர்களை விடுதலை செய்துவிட்டார்கள். இவர்களை யார் விடுதலை செய்தாலும் தவறு! படைத்த இறைவன் இருக்கிறான். அவன்தான் அத்தனையையும் நடாத்திக் கொண்டிருக்கின்றான். இந்தத் தவறுகளை அரசியலுக்காகச் செய்வீர்களாகவிருந்தால் அவன் உங்களை நிச்சயமாகத் தண்டிப்பான்! இந்த 250 உயிர்களைப் பலியெடுப்பதற்கு யாரெல்லாம் காரணகர்த்தாவாக இருந்தார் களோ, அத்தனை பேருக்கும் இறைவனின் தண்டனை நிச்சயமாக வந்துசேரும்.

பேராயர் கர்தினால் மெல்கம் ரஞ்சித் ஆண்டகை அவர்களை இந்த உயர் சபையிலே கௌரவத்தோடு நான் பாராட்டுகின்றேன். ஏனெனில், "முஸ்லிம்களைத் தாக்காதீர்கள், முஸ்லிம்களுக்கு இதில் சம்பந்தமில்லை, ஏதோ வொரு வேறு சக்தி இதில் சம்பந்தப்பட்டிருக்கின்றது, பாதுகாப்புத் தரப்பினர் தற்பொழுது விசாரணை செய்கி றார்கள், சிலரைக் கைது செய்திருக்கிறார்கள். சாய்ந்தமருதிலே முஸ்லிம்கள் காட்டிக்கொடுத்து, தங்களுக்குத் தாங்களே குண்டைவைத்துச் சம்பந்தப்பட்டவர்கள் 15 பேர் செத்துவிட்டார்கள்; எனவே, பொறுமையாக இருங்கள்" என்று அவர் தொடர்ந்து சொல்லி வந்தார். ஆனால், 21ஆம் திகதி இந்தச் சம்பவம் நடந்து 20 நாட்களுக்குப் பிறகு இந்தக் காடையர் கூட்டம் - கள்வர் கூட்டம் அல்லது சுயநலவாதிகள் - சந்தர்ப்பவாதிகள் - கொலைகாரர்கள் மினுவாங்கொடையிலும் நிக்கரவெட்டி போன்ற இடங்களிலும் இந்த அநியாயங்களை எல்லாம் செய்தார்கள். அவர்கள் யாராக இருந்தாலும் அவர்களுக்குரிய தண்டனையை வழங்குங்கள்! என்று கேட்கின்றேன்.

இங்கு ஒருசில எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள் எனக்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை பற்றிச் சொன்னார்கள். ஐக்கிய தேசியக் கட்சியின் ஒருசில உறுப்பினர்களும் எனக்கு எதிராகப் பேசினார்கள். ஆனால், என்னைப் பாதுகாக்க வேண்டிய தேவை ஜே.வீ.பீ. க்குக் கிடையாது. ரதன தேரர் அவர்கள்தான் மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கத்தைத் தோற்கடிப்பதற்கான செயற்பாட்டுக்குத் தலைமைதாங்கி அன்று முதலிலே வெளியே போனவர். பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களை வீட்டுக்கு அனுப்ப வேண்டுமென்ற முயற்சிகளையும் அவர்தான் இன்று செய்கின்றார். அவர்களால் பாராளுமன்றத் தேர்தலிலே ஒரு மாவட்டத்தில் தனித்து நின்று போட்டிபோட முடியுமா? என்று கேட்கின்றேன். ஆனால், எனக்குத் தைரியம் இருக்கிறது, SLFP உம் தேவையில்லை; UNP உம் தேவையில்லை. *இன்ஷா அல்லாஹ்!* என்னுடைய கட்சியிலே நான் தனித்துப் போட்டியிட்டு இன்றிருக்கும் எனது கட்சியின் உறுப்பினர்களைவிட அதிகபட்ச உறுப்பினர்களுடன் பாராளுமன்றத்திலே வந்து அமர முடியும் என்று. இவர்கள் இந்தப் பாராளுமன்றத்திலே மிக மோசமாக இனவாதம் கக்குகின்றார்கள். பௌத்த மதம் - බෞද්ධ දර්ශනය இல் இனவாதம் பற்றிக் குறிப்பிடப்படவில்லை. உண்ணாவிரத மிருக்குமாறு பௌத்த தர்மத்திலே சொல்லப்பட்டிருக்கிறதா? என்று கேட்க விரும்புகின்றேன். இவர் உண்ணாவிரதமிருந்தது மட்டுமல்ல, கல்முனையிலே முஸ்லிம்களுக்கும் தமிழர் களுக்கும் இடையில் பிரதேச செயலகம் சம்பந்தமாக இருக்கின்ற பிரச்சினையைத் தீர்க்கப்போயுள்ளார். "பௌத்தர்கள் 74 வீதமாகவும் தமிழர்கள் 16 வீதமாகவும் இருக்கின்றோம். எனவே, 90 வீதமாகவுள்ள நாங்கள் எல்லோரும் சேர்ந்து இந்த நாட்டிலே 10 வீதமாக இருக்கும் முஸ்லிம்களை அடக்கி ஒடுக்குவோம்" என்று யாழ்ப்பாணத்திலே போய்ச் சொல்லி, தமிழ் மக்களிடத்தில் அழைப்பு விடுக்கின்றார்! தமிழ் மக்கள் மடையர்கள் அல்லர்! தமிழ்ச் சமூகம் மடைச் சமூகம் அல்ல! ஆனால், எங்களுக்குள் உள்ள நியாயமான பிரச்சினைகளை நாங்களே பேசித் தீர்ப்போம்!

எனக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவந்தபொழுது, எங்களுடைய சம்பந்தன் ஐயாவை நான் போய் சந்தித்தேன். "சம்பந்தன் ஐயா அவர்களே! இந்த நம்பிக்கையில்லாப் பிரேரணை பற்றிய விடயத்திலே நீங்கள் என்ன செய்யப் போகிறீர்கள்?" என்று கேட்டேன். "தம்பி! உம்முடைய சமூகம் கஷ்டத்தில் இருக்கிறது. இந்த

நாட்டிலிருக்கின்ற கிட்டத்தட்ட 22 இலட்சம் முஸ்லிம்களோ அல்லது இந்தப் பாராளுமன்றத்தில் அங்கம் வகிக்கின்ற முஸ்லிம் உறுப்பினர்களோ இந்தப் பயங்கரவாதத்தோடு சம்பந்தப்பட்டர்வர்கள் அல்லர் என்பதை 100 வீதம் அறிந்தவன் - உணர்ந்தவன் நான். ஆனால், முஸ்லிம்களுடைய வியாபாரத்தையும் முஸ்லிம் அரசியல்வாதிகளையும் நசுக்குகிறார்கள். முஸ்லிம் சமுதாயத்திற்காகப் பேசுகின்ற உன்னுடைய குரலை நசுக்கப் பார்க்கிறார்கள்" என்று அவர் என்னிடம் கூறியதுடன், உன்னுடைய பாதுகாப்பு எப்படித் தம்பி இருக்கிறது? என்றும் கேட்டார். "உன்னுடைய பாதுகாப்பிலே நீர் கவனம் செலுத்திக்கொள்!" என்று சொன்னார். அதுமட்டுமல்ல, "நீர் ஒரு சிறுபான்மை இனத்தவன்; நாங்கள் ஒரு மொழி பேசுகின்ற இனம். இன்று உங்களுடைய இனம் நொந்துபோயிருக்கின்றது. நீர் அந்த இனத்தின் ஓர் அரசியல் தலைவன்! உன்னை வீழ்த்துவதற்குப் பெரும்பான்மைச் சக்தி சதி செய்கின்றது. ஒருபோதும் நான் உன்னை விழவிடமாட்டேன்" என்றும் அவர் என்னிடம் சொன்னார். அவர்தான் சம்பந்தன் ஐயா! அவர்களுக்கும் எங்களுக்குமிடையே அரசியல் ரீதியான கருத்து வேறுபாடுகள் இருக்கின்றன. ஆனால், என்மீது அநியாயமாக அபாண்டமான குற்றச்சாட்டைச் சுமத்தி, அரசியலிலிருந்து என்னை ஒதுக்கலாம் அல்லது சிறையிலே அடைக்கலாம் அல்லது என்னை அடக்குவதனூடாக என் சமுதாயத்தின் பொருளா தாரத்தை நசுக்கலாம், என் சமுதாயத்தை வீழ்த்தலாம் என்று இவர்கள் சதி செய்த காரணத்தினால்தான், தமிழ் தேசியக் கூட்டமைப்பின் தலைவர் சம்பந்தன் ஐயா அவர்கள் இவ்வாறு என்னிடம் சொன்னார்.

இன்னும் சில விடயங்களை இங்கு நான் சொல்ல வேண்டும். இன்று என்மீது அபாண்டமான குற்றச் சாட்டுக்களைச் சுமத்துகிறார்கள். அதாவது, என்னுடைய நண்பரும் முன்னாள் அமைச்சருமான எஸ்.பி. திசாநாயக்க அவர்கள் எனக்கு 8,000 ஏக்கர் காணி இருக்கிறதென்று அடிக்கடி சொல்கின்றார். பொலிஸிலும் இன்னும் பல இடங்களிலும் முறைப்பாடு செய்கின்றார். அவர் முறைப்பாடு செய்ததற்காக நான் நன்றி சொல்கிறேன். ஏன்? ஒருவர்மீது குற்றத்தைச் சுமத்தினால், உண்மையாக அந்தக் குற்றம் பற்றிப் பொலிஸ் நிலையத்திலேதான் முறைப்பாடு செய்ய வேண்டும். ஆனால், முடிந்தால் என்மீதான குற்றச்சாட்டை நிரூபித்துக் காட்டுங்கள் என்று இந்த உயர் சபையிலே சொல்கிறேன். எனக்கு அவ்வாறு காணிகள் இல்லை என்பதை பாராளுமன்றத் தெரிகுழு முன்னிலையிலும் சொன்னேன். கடந்த பெப்ருவரி மாதம் உள்ளூராட்சி மன்றத் தேர்தல் காலத்தின்போது, என்னுடைய மனைவி bank இலே 'முஷாரக்கா' என்கின்ற ஒரு கடன் திட்டத்தின்கீழ் ஐந்தரைக் கோடி ரூபாய் கடன் பெற்றிருந்தார். ஆனால், என்னுடைய மனைவியினுடைய பெயரில் உள்ள கணக்கில் சந்தேகத்திற்கிடமான முறையிலே ஐந்தரைக் கோடி ரூபாய் இடப்பட்டிருப்பதாக, ஒன்றரை வருடத்திற்குப் பிறகு - சில தினங்களுக்கு முன்பு media இலே செய்தி வெளியிடப்பட்டதாக நான் அறிந்தேன். என்னைத் தாக்கியவர்கள் இன்று என்னுடைய மனைவிமீது தாக்குதலைத் தொடங்கியிருக்கிறார்கள். என்மீதோ என் குடும்பத்தின்மீதோ என்ன வேண்டுமென்றாலும் செய்யுங்கள்! பரவாயில்லை! ஆனால், முஸ்லிம்களின் கடைகளில் சமான் வாங்காதீர்கள் என்று ஒரு சிலர் கூறுகின்றார்கள். டாக்டர் ஷாபி என்பவர் குற்றவாளியாக இருந்தால் அவரைத் தண்டிக்க வேண்டும். அவர் குற்றம் செய்திருந்தால் தண்டியுங்கள்! ஆனால், அவர் ஒரு முஸ்லிம் என்பதற்காகக் அவர்மீது குற்றம் சுமத்தாதீர்கள்! இந்த நாட்டிலே முஸ்லிம் doctors எவ்வளவோ சேவைகளைச் செய்திருக்கின்றார்கள். அத்தனை பேரினதும் உள்ளங்களையும் உடைக்கின்ற முறையிலே குறித்த தேரர் நீதிமன்றத்திற்கு முன்னால் போய் ஆர்ப்பாட்டம் செய்திருக்கின்றார். நீதிமன்ற நடவடிக்கையிலே யாரும் தலையிட முடியுமா? என்று கேட்கிறேன்.

இந்த CID இனுடைய, பொலிஸாருடைய, இராணுவத் தினுடைய செயற்பாட்டால், இந்த நாட்டிலே 30 வருட கால யுத்தம் முடிவுறுத்தப்பட்டது. உயிர்த்த ஞாயிறன்று தாக்குதலை மேற்கொண்ட பயங்கரவாதிகள் குறுகிய காலத்தினுள் ஒட்டுமொத்தமாக அடக்கப்பட்டிருக்கிறார்கள்; கட்டுப்படுத்தப் பட்டிருக்கிறார்கள். அவ்வாறு இருக்கின்றபோதிலும் குறித்த தேரர் அவர்கள் தான் விரும்பிய தீர்ப்பு வெளியில் வர வேண்டும் என்று எதிர்பார்க்கின்றார். அதாவது, doctor ஷாபி நிரபராதியாக இருந்தாலும் அவர் குற்றவாளியாகக் கருதப்பட வேண்டும் என்று எதிர்பார்க்கின்றார்! doctor ஷாபியைக் குற்றவாளி என்று தேரர் சொன்னால், பொலிஸாரும் நீதிபதியும் அதையே சொல்ல வேண்டும் என்று அவர் எதிர்பார்க்கின்றார். தான் விரும்புகின்ற ஒரு தீர்ப்பைப் பொலிஸார் வழங்க வேண்டும் என்று எதிர்பார்ப்பது எவ்வளவு மடமைத்தனமான செயலாகும்.

அரசியல் வங்குரோத்து நிலையிலுள்ளவர்கள் கடந்த 4ஆம் திகதி 'வஹாபிஸ'த்துக்கெதிரான ஒரு போராட்டம் என்று ஒரு கூட்டத்தை நடாத்தினார்கள். அரசியல் வங்குரோத்து நிலையிலுள்ள அந்தக் கட்சியின் தலைவருக்கு நான் சவால் விடுக்கிறேன். அவர் அப்பட்டமாக உண்மைக்குப் புறம்பான விடயங்களை இந்த நாட்டிலே பரப்பிக் கொண்டிருக்கிறார். நீங்கள் சொல்கின்ற மாவட்டத்திலே எனக்குத் தேர்தலிலே போட்டியிட முடியும். உங்களால் முடிந்தால், உங்களுடைய கட்சிச் சின்னத்தில் தனியாகப் போட்டியிட்டுப் பாராளு மன்றத்திற்கு வந்துகாட்டுங்கள் என்று அவர்களிடம் கூறுகின்றேன். 'வஹாபிஸ'த்துக்கெதிரான ஒரு முன்னணியாம்! இந்த நாட்டிலே, காத்தான்குடியிலே ஷரிஆ சட்டத்தின்கீழ் 20 பேருக்கு மரண தண்டனை விதிக்கப்பட்டுக் கொல்லப்பட்டிருக்கிறார்கள் என்று அங்கேயொரு தேரர் சொல்லியிருக்கிறார். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, காத்தான்குடியிலே இவ்வாறான சம்பவம் நடந்ததா? எப்பொழுது நடந்தது? யார் அந்த 20 பேர்? அந்தத் தண்டனையை வழங்கியவர்கள் யார்? எந்தப் பள்ளிவாசல் தலைவர் இவ்வாறான ஒரு ஷரிஆ சட்டத்தை நடைமுறைப் படுத்தினார்? என்பது தொடர்பில் குற்றச்சாட்டைச் சுமத்திய தேரரை விசாரணை செய்யும்படி சபாநாயகர் அவர்கள் ஊடாக பொலிஸ்மா அதிபருக்கு அறிவியுங்கள்! உண்மையிலே அவ்வாறான தண்டனை வழங்கப்பட்டிருந்தால், அவ்வாறு செயற்பட்டவர்களுக்கு இந்த நாட்டில் கொடுக்கக்கூடிய அதிகபட்ச தண்டனையை வழங்குங்கள்! அவ்வாறு மரண தண்டனை விதித்துக் கொல்லப்படவில்லை என்றால், இந்த நாட்டிலே சிங்கள, முஸ்லிம் மக்கள் மத்தியில் குரோதத்தை உண்டாக்குவதற்காக, ஒற்றுமையாக வாழுகின்ற சிங்கள - முஸ்லிம் சமுதாயத்தைப் பிரித்து அரசியல் செய்வதற்காக அல்லது தாங்கள் விரும்பியவர்களை அரசியல் மேடையிலே அல்லது அரசியல் ஆசனத்திலே அமரச் செய்ய வேண்டும் என்பதற்காக உண்மைக்குப் புறம்பான விடயங்களைச் சொல்லியவருக்கு உரிய தண்டனையை வழங்குவதற்கு நடவடிக்கை எடுங்கள் என்று தலைமைதாங்கும் உறுப்பினர் அவர்களிடத்தில் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன். கிழக்கு மாகாணத்திலே முஸ்லிம் பெண்களுக்குக் கல்வி தடை செய்யப்பட்டிருப்பதாகவும் தேரர் சொல்கின்றார். ஆனால், இன்று முஸ்லிம் வாலிபர்களைவிட, முஸ்லிம் பெண்கள்தான் அதிகமாகக் கல்வி கற்கின்றார்கள். SLAS இலும் முஸ்லிம் பெண்கள் இருக்கின்றார்கள். இந்த நாட்டிலே இருக்கின்ற அமைச்சுக்களில் ஓர் அமைச்சின் செயலாளராகவும் முஸ்லிம்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

பெண் ஒருவர் நியமிக்கப்பட்டிருக்கின்றார். ஆகவே, இன்று முஸ்லிம் பெண்கள் கல்வி கற்கின்றார்கள். முஸ்லிம் பெண்கள் கல்வி கற்பதைத் தடை செய்யுமாறு இஸ்லாம் மார்க்கத்தில் எந்த இடத்திலும் சொல்லப்படவில்லை என்பதை இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

என்னுடைய அரசியல் வரலாற்றிலே ராஜபக்ஷ குடும்பத்துக்கு எதிராகவோ எஸ்.பி. திசாநாயக்க அவர்களுக்கு எதிராகவோ அல்லது வீரவங்சவுக்கு எதிராகவோ அல்லது வேறு எந்தவோர் அரசியல்வாதிக்கும் எதிராகவோ நான் பேசியது கிடையாது. அதாவது, தனிப்பட்ட ரீதியாக எந்தவொரு வகையிலும் அவர்களின் குடும்பத்தை, கோத்திரத்தை, அவர்களுடைய செயற்பாட்டைப் பற்றி அல்லது அவர்கள் மீதிருக்கின்ற குற்றச்சாட்டைப் பற்றி நான் இந்த உயர் சபையிலே பேசிய வரலாறு கிடையாது. இனியும் பேசமாட்டேன். ஆனால், இந்தப் பயங்கரவாதத் தாக்குதல் நடந்த தினத்திலிருந்து இன்றுவரை நீங்கள் என்மீது எத்தனை எறிகணைகளை எறிந்தீர்கள்? நான் 9 வருடங்கள் எதிர்த் தரப்பிலே இருந்து அரசியல் செய்தவன். யுத்தம் நடந்த இக்கட்டான காலத்திலேயும் எதிர்த் தரப்பிலே இருந்து அரசியல் செய்தவன். மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கு என்னைப்பற்றித் தெரியும். அவரோடு நீண்டகாலம் அரசியல் செய்த ஒருவன்.

உயிர்த்த ஞாயிறு தினத் தாக்குதலோடு என்னைச் சம்பந்தப்படுத்திக் குற்றஞ்சாட்டினார்கள். என்மீது சொல்லப் பட்ட குற்றச்சாட்டுக்கள் எல்லாம் பயங்கரவாதம் தொடர்பான குற்றச்சாட்டுக்கள்! ஆனால், வேறு எந்தக் குற்றச்சாட்டைச் சுமத்தியிருந்தாலும் அது நியாயமாக இருந்திருக்கும். ஓர் உயர் மதகுரு சொல்கின்றார், "Doctor சாபி இவ்வளவு பெரிய அநியாயத்தைச் செய்துவிட்டார்; அவரைக் கல்லால் எறிந்து கொல்லவேண்டும்" என்று. அப்படியானால் இந்த நாட்டிலே என்ன நியாயம் இருக்கின்றது? முஸ்லிம்களின் கடைகளுக்குச் செல்ல வேண்டாம் என்று சொல்ல முடியுமா? இது புத்த தர்மத்திலே இருக்கின்றதா? இந்த நாட்டில் முஸ்லிம்களும் சிங்களவர்களும் தமிழர்களும் சண்டை பிடித்தால் வெளிநாடு களிலிருந்து நாட்டுக்கு முதலீடுகள் வருமா? குறித்த தேரர் அம்பாறையிலே போய், முஸ்லிம் நாடுகளிலிருந்து பெற்றோல், டீசல் வருவதைத் தடைசெய்துவிட்டு, சூரிய சக்திமூலம் நாட்டுக்கு மின்சாரம் தருவோம் என்று பேசுகின்றார். சம்பந்தப்பட்டவர்கள் புத்திசுவாதீனத்தோடு தான் இவ்வாறு எல்லாம் சொல்கின்றார்களா? அப்படியானால் அவர்களின் மூளையை check பண்ணுமாறு நாங்கள் சொல்ல வேண்டுமா? இவ்வாறு பேசுவதினூடாக எதனை நீங்கள் எதிர்பார்க் கின்றீர்கள்?

இந்த நாடு தொடர்பில் ஜெனீவாவிலே பிரச்சினை எழுப்பப்பட்டபொழுது, உலகிலுள்ள அத்தனை முஸ்லிம் நாடுகளும் இலங்கைக்கு உதவி செய்ய வந்தன. யுத்தம் இறுதிக்கட்டத்தை அடைந்தபொழுது பெற்றோல் வாங்கக்கூட நாட்டில் பணம் இருக்கவில்லை. இந்த நாட்டினுடைய பொருளாதாரம் அதலபாதாளத்தில் இருந்தது. இது பற்றி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கும் தெரியும். அப்போது, ஈரான் 6 மாதக் கடன் அடிப்படையில் 150 மில்லியன் டொலர் பெறுமதியான டீசலையும் பெற்றோலையும் நமது நாட்டுக்குக் கொடுத்தது. எனினும், அமெரிக்கா போட்ட தடையைச் சொல்லிச் சொல்லி, அந்தப் பணம் இன்னும் திருப்பிச் செலுத்தவில்லை. அதேபோல, சுனாமி அனர்த்தம் ஏற்பட்ட பொழுது, யுத்தம் நடந்தபொழுது, மூன்று இலட்சம் மக்கள் அகதிகளாக வந்தபொழுது எல்லாம் இஸ்லாமிய நாடுகள் முன்வந்து எமது நாட்டுக்கு உதவி செய்தன. அப்படியானால் ஏன், இஸ்லாமிய நாடுகளைப் பகைத்துக்கொண்டு செயற்படவேண்டும்?

ஒருவர் மௌலவியாக வரவேண்டுமானால் 8 வருடங்கள் மத்ரஸாவில் படிக்கவேண்டும். சில்லறை சஹ்ரான் "தான் மட்டும்தான் மௌலவி" என்று சொன்னான். அவன் 04 வருடங்களில் மத்ரஸாவிலிருந்து துரத்தப்பட்டான். ஆகவே, அவன் மௌலவி அல்ல! அதேபோல், அவனோடு இந்தத் தாக்குதலில் சம்பந்தப்பட்ட ஒருவர்கூட மத்ரஸாவிலே ஓதவில்லை. அவர்கள் எவரும் இஸ்லாம் மார்க்கத்தைப் படித்தவர்கள் அல்லர். 'இன்ஜினியர்'களும் மற்றும் உயர் படிப்புப் படித்தவர்களும் பணக்காரர்களும்தான் இந்தத் தாக்குதலில் சம்பந்தப்பட்டிருந்தார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
முஸ்லிம் சமுதாயத்துக்கும் இந்தத் தாக்குதல் சம்பவத் துக்கும் எந்தச் சம்பந்தமும் இல்லை. இந்த நாட்டிலே எந்தவோர் அடிப்படைவாதமும் வளராமல் இருப்பதற்கு, இந்த நாட்டிலே இன்னுமொரு பயங்கரவாதம் வந்துவிடாமல் இருப்பதற்கு நாங்கள் உங்களுக்கு உதவத் தயாராக இருக்கிறோம். இந்த அழகான பூமியைப் பாதுகாப்பதற்கு முழு முஸ்லிம் சமூகமும் ஒன்றுபட்டுச் செயற்படுவதற்குத் தயாராக இருக்கின்றது. இந்த நாட்டில் கடந்த ஆயிரம் வருடங்களாக வாழ்ந்து வருகின்ற முஸ்லிம் சமூகம் ஒருபொழுதும் எந்தப் பயங்கரவாதச் சம்பவத்துடனும் தொடர்புபட்டிருக்கவில்லை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
தொடர்ந்தும் அதேபோலவே செயற்படுவதற்கு நாங்கள் தயாராக இருக்கிறோம். இந்த நாட்டிலே அஸ்கிரிய, மல்வத்து மகாநாயக்க தேரர்கள், ஏனைய தேரர்கள், Cardinal அவர்கள், Bishop அவர்கள், இந்து மதத் தலைவர்கள், இஸ்லாமிய மதத் தலைவர்கள் எல்லோரும் ஒன்றுபட்டுச் செயற்பட வேண்டும். எல்லா மதத்தவர்களும் ஒன்றுபடுவோம்! கட்சி பேதங்களை மறப்போம்!

இன்று JVP கொண்டுவந்திருக்கின்ற இந்த நம்பிக்கை யில்லாப் பிரேரணைக்கு ஆதரவாக வாக்களிக்க வேண்டுமென்று என்னுடைய மனம் சொல்லுகிறது. ஏன்? அதிலுள்ள அத்தனையும் உண்மையான விடயங்கள். நாங்கள் அமைச்சுப் பதவிகளை துறந்தபொழுது, கௌரவ றவுப் ஹகீம் அவர்கள் எங்கள் சார்பாகப் பேசினார். அப்போது அவர் ஒரு விடயத்தைச் சொன்னார், அதாவது, "அமைச்சுப் பதவிகளைத் துறந்தாலும் இந்த அரசாங்கத்துக்குரிய பதவிக்காலம் முடிவடையும்வரை அரசாங்கத்தை விழவிடமாட்டோம்" என்று. ஆகவே, நாங்கள் கொடுத்த வாக்குறுதியை மீறமுடியாது.

அதேநேரம் எங்களுடைய மனச்சாட்சிக்கு விரோதமாகத்தான் இந்தப் பிரேரணைமீது நாங்கள் வாக்களிக்கப் போகின்றோம். இந்த இடத்திலே எதிர்த்தரப்புக்கு ஒன்றைச் சொல்லிவைக்க விரும்புகின்றேன். அதாவது, பயங்கரவாதத்தோடு சம்பந்தப் பட்ட யாராக இருந்தாலும் அவர்களைக் கண்டுபிடித்து, உச்சபட்ச தண்டனையை வழங்குவோம். இந்த நாட்டிலே இனங்களுக்கிடையிலே ஒற்றுமையை ஏற்படுத்துவதற்குத் நாங்கள் எல்லோரும் தயவுசெய்து ஒன்றுபடுவோம் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ නම කියැවුණු නිසායි මම නැඟිට්ටේ. එතුමා කියපු ලෙසම, එතුමාගේ ඉල්ලීම අනුව, ඒ කර තිබෙන වංචා, හොරකම් හා අපරාධ සියල්ල අපි ඔප්පු කරන බව එතුමාට ප්‍රකාශ කරන්න කැමැතියි.

[අ.භා.4.23]

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේ මෙම ආණ්ඩුවට විරුද්ධව විපක්ෂයෙන් ඉදිරිපත් කර තිබෙන, ජනතා විමුක්ති පෙරමුණෙන් ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට පෙර එක් කරුණක් පැහැදිලිව සඳහන් කළ යුතුයි. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නායකත්වය දරන හිටපු ජනාධිපති, වත්මන් විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ ආණ්ඩුව පත් වුණු දවසේ සිට, මේ ආණ්ඩුව විසින් මේ රටේ ජනතාවට කරපු දැවැන්ත විනාශය නිසා, මේ ආණ්ඩුව විසින් මේ රට දැවැන්ත අගාධයකට අරගෙන ගිය නිසා, මේ ආණ්ඩුව විසින් මේ රට ඇදගෙන ගිය තත්ත්වය නිසා මේ ආණ්ඩුව පළවා හැරීම සඳහා දැවැන්ත අරගලයක්, දැවැන්ත සටනක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ විපක්ෂය හැටියට අපි ඉෂ්ට කරලා තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ස්ථාවරය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලාගෙන් වැරැදි මතයක් ආවා. අපේ ස්ථාවරය තමයි, එල්ටීටීඊ එක මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවත් මේ ආණ්ඩුව පළවා හැරීමට අපට ලබා දිය හැකි උපරිම සහයෝගය අනිවාර්යයෙන්ම ලබා දෙනවාය කියන එක. අපි හිතනවා, තමුන්නාන්සේලා මේ විශ්වාස භංග යෝජනාව සද්භාවයෙන් ගෙනාවා කියලා. මේ විශ්වාස භංග යෝජනාව යට තමුන්නාන්සේලාට වෙන න්‍යාය පත්‍ර නැහැ කියලා අපි හිතනවා. මේ ආණ්ඩුව පළවා හැරීමේ සැබෑ වුවමනාවක් තමුන්නාන්සේලාට තිබෙන නිසා මේ විශ්වාස භංග යෝජනාව ගෙනාවා කියලා අපි හිතනවා. එහෙම තිබෙනවා නම්, මේ කාරණා අනිවාර්යයෙන්ම සත්‍ය වෙයි. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේගේ කථාවේදී තමුන්නාන්සේ කිව්වා තමුන්නාන්සේගේ හෘදය සාක්ෂියට විරුද්ධව අද තමුන්නාන්සේට ඡන්දයක් දෙන්න සිදු වෙලා තිබෙනවා කියලා. තමුන්නාන්සේ හෘදය සාක්ෂියත් එක්ක වැඩ කරනවා නම්, තමුන්නාන්සේලාගේ ජනතාවට විනාශයක් සිදු වෙලා තිබෙනවා නම්, තමුන්නාන්සේ ඔය කියන තරම් මුස්ලිම් ජනතාවට ආදරය කරන ප්‍රධාන නායකයෙක් නම්, තමුන්නාන්සේ ත්‍රස්තවාදය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා නම්, තමුන්නාන්සේ මේ ආණ්ඩුවට විරුද්ධව ගෙනැවිත් තිබෙන විශ්වාස භංග යෝජනාවට පක්ෂව අද ඡන්දය දෙන්න ඕනෑ කියලායි මම හිතන්නේ. හැබැයි, තමුන්නාන්සේගේ නම මේවාට ඇදෙන්නේ කොහොමද?

මෙතැන පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා ආනමඩුවේ. මම වනාතවිල්ලුව සංවර්ධන කමිටුවේ සභාපති ධුරය දැරූ කාලයේ මුසලි කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිටපු මුස්ලිම් ජනතාව එල්ටීටීඊ සංවිධානය විසින් පළවා හැර තිබුණු බව දැනගෙන හිටියා. හැබැයි, ඒ ජනතාව පදිංචි කරවන එක විතරක් නොවෙයි, සිදු කළේ. ඒ ජනතාව පදිංචි කරවීම පිට දමලා සම්පූර්ණයෙන් විල්පත්තුව විනාශ කළා. විල්පත්තුවේ විශාල ප්‍රදේශයක තමන්ගේ ජනතාව පදිංචි කරවනවා කියලා කියාගෙන, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පමණක් නොවෙයි, සිලාවතුර දක්වා සම්පූර්ණ කොටස විනාශ කළා. ඒ, විනාශ කිරීමට කෙළින්ම සම්බන්ධ වුණේ රිසාඩ් බදියුදීන්ගේ නම.

දොස්තර සාෆි ගැන කථා කළා. සාෆි කර තිබෙන විද්‍යාත්මක අපරාධ සම්බන්ධයෙන් විද්‍යාත්මකව පරීක්ෂණ පවත්වලා දඬුවම් දෙන්න ඕනෑ. ඒ ගැන කිසිම කථාවක් නැහැ. හැබැයි, අපට සාෆි ගැන ප්‍රශ්නයක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයට ඡන්දය ඉල්ලපු සාෆි, ඊළඟට ලැයිස්තුවේ ඉන්න සාෆි, රාජ්‍ය සේවයේ අන්තිම නරක විධියට පත්වීම අරගෙන නැවතත් රාජ්‍ය සේවයට ආපු එක ගැනයි අපට ප්‍රශ්නය තිබෙන්නේ. සාෆි කරලා තිබෙන ගබ්සා ගැන විද්‍යාත්මක පරීක්ෂණ පවත්වන්න ඕනෑ. ඒ ගැන කිසිම කථාවක් නැහැ. හැබැයි, එතුමාගේ විශ්වාසය පිළිබඳව, රාජ්‍ය සේවයේ වෛද්‍යවරයකු හැටියට වැඩ කරන එතුමාගේ විශ්වාසය පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. තමුන්නාන්සේත් එක්ක අපි එකට වැඩ කටයුතු කළා. ඒක තමුන්නාන්සේ දන්නවා. මේ ත්‍රස්තවාදී කටයුතු එක්ක තමුන්නාන්සේගේ නම ඇදෙන්නේ කොහොමද? පරීක්ෂණ කරගෙන යන හැම තැනම තමුන්නාන්සේගේ නම පොඩ්ඩ පොඩ්ඩ හෝ කියැවෙනවා. තමුන්නාන්සේත් එක්ක අපට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. අපි තමුන්නාන්සේත් එක්ක එකට වැඩ කළා. අද තමුන්නාන්සේගේ නම සුද්ධ කර ගන්න අවශ්‍ය නම්, තමුන්නාන්සේ මේ පරීක්ෂණවලට ලබා දිය යුතු සහයෝගය ලබා දෙන්න. හැබැයි, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ ආණ්ඩුව ඒ පරීක්ෂණ කටයුතු කරන්නේ සම්පූර්ණයෙන්ම වැරදි විධියට. පරීක්ෂණ පවත්වනවා කියලා මොකක්ද කරන්නේ? පාර්ලිමේන්තුව තුළ විශේෂ කාරක සභාවක් පත් කරගෙන, වෙනම කණ්ඩායමක් දාගෙන ප්‍රශ්න අහනවා. දැන් ඒ විශේෂ කාරක සභාවේ මොකක්ද කරන්නේ? අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ ආණ්ඩුව සුද්ධ කර ගැනීම සඳහා තමයි මේ විශේෂ කාරක සභාව පත් කරගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද වනකොට මේ රට සම්පූර්ණයෙන් විනාශය කරා ගිහින් තිබෙනවා. අද මිනිසුන්ට කන්න-අඳින්න නැති තත්ත්වයට වැටිලා තිබෙනවා. අද වනකොට ව්‍යාපාර සේරම කඩාගෙන වැටිලා. අධික බැංකු පොලී නිසා මිනිසුන් පෑගිලා, මිරිකිලා ඉන්නේ. මේ ආණ්ඩුව යටතේ අද මේ රටේ හැම ක්ෂේත්‍රයක්ම කඩාගෙන වැටිලායි තිබෙන්නේ. ඒ නිසා මේ ආණ්ඩුව වහාම ගෙදර යවන්න සියලුදෙනා එකට පෙළ ගැහිලා ඉන්නවා. අද මිනිසුන් නායකත්වයක් ඉල්ලනවා. මිනිසුන් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඉල්ලන්නේ ඇයි? මිනිසුන් ඉල්ලනවා, මේ රටට විනයක්. මිනිසුන් ඉල්ලනවා, මේ රටට පාලනයක්. මිනිසුන් ඉල්ලනවා කොන්ද කෙළින් තිබෙන නායකයෙක්. එහෙම නායකයෙක් එක්ක තමයි මේ ගමන යන්න ඕනෑ කියලා, මිනිසුන් එතුමා ඉල්ලනවා. තමුන්නාන්සේලා මැතිවරණය තියලා බලන්න. දැන් තමුන්නාන්සේලාට තිබෙන වුවමනාව මොකක්ද? පුළුවන් නම් අප කොටු කරන්න. තමුන්නාන්සේලාට තිබෙන වෙන වෙන න්‍යාය පත්‍රත් එක්ක අද වනකොට අධිරාජ්‍යවාදී බලකඳවුරුවල අතකොළුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. අධිරාජ්‍යවාදී බලකඳවුරුවල, ඇමෙරිකාව ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල්වල අතකොළුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. සිදු වෙච්ච බෝම්බ ප්‍රහාර

[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

පිටුපස ඒ රටවල් ඉන්නවාද කියලා අපට සැකයක් තිබෙනවා. මොකද, මේ රට දෙකඩ කරලා, මුස්ලිම් ජනතාව හා දෙමළ ජනතාව මහින්ද රාජපක්ෂ කඳවුරෙන් අයින් කරවලා, මේ ආණ්ඩුව තවදුරටත් රැකගෙන යන ගමන් තමන්ගේ වුවමනා එපාකම් ඉෂ්ට සිද්ධ කර ගන්න ඒ අය වැඩකටයුතු කරනවාද කියන සැකය අපට තිබෙනවා.

අද ලෝකයේ ප්‍රධාන මුස්ලිම් රටවල් කීයක් ඇමෙරිකාව විසින් විනාශ කර තිබෙනවාද කියලා තමුන්නාන්සේලා කල්පනා කර බලන්න.මේ ආණ්ඩුව ඉන්නේ ඒ කඳවුරේයි. තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියට එකඟව වැඩ කටයුතු කරනවා නම්, මුස්ලිම් ජනතාව ගැන හිතනවා නම්, තමුන්නාන්සේලාට අද මේ විශ්වාස භංග යෝජනාවට විරුද්ධව ඡන්දය දෙන්න බැහැ. ලෝකයේ මුස්ලිම් ජනතාවට අද අත්වෙලා තිබෙන ඉරණම ගැන තමුන්නාන්සේලා පොඩ්ඩක් හිතලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තව එක කාරණයක් කියන්නට ඕනෑ. මේ ආණ්ඩුවේ අවසාන හෝරාව තමයි දැන් පැමිණ තිබෙන්නේ. තව පොහොය කිහිපයයි තිබෙන්නේ. අපි මේ රටේ ජනාධිපති ධුරය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත්, අග්‍රාමාත්‍ය ධුරය මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් ලබා දීලා, කලින් තිබුණු රට නැවත හදනවාය කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු එස්.බී. දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, මට කළ චෝදනා ඔප්පු කරන්න පුළුවන් කියලා. පුළුවන් නම් ඒවා ඔප්පු කරන්නය කියා මම එතුමාට අභියෝග කරනවා. මට අක්කර 8,000ක් නැහැ. ඒ නිසා ඔබතුමාට එය ඔප්පු කරන්න බැහැ. නමුත්, එතුමා ඒක ඔප්පු කළොත් මම දේශපාලනයෙන් ඉවත් වෙනවා. ඔබතුමාට එය ඔප්පු කරන්න බැරි වුණොත්, ඔබතුමා දේශපාලනයෙන් ඉවත් වෙනවාද කියලා මට කියන්න.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඔබතුමාට අයත් ඉඩම්වල ඔප්පු මා ළඟ තිබෙනවා. ඔබතුමාගේ, ඔබතුමාගේ පවුලගේ, ඔබතුමාගේ අම්මාගේ, ඔබතුමාගේ සහෝදරයන්ගේ ඔප්පු මා ළඟ තිබෙනවා. ඒවායේ තිබෙන ඉඩම් ප්‍රමාණය අක්කර 4,000කටත් වඩා වැඩියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඔබතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කථා නේ කියන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීවරුනි, දැන් ඔය කථාව අවසන් කරන්න.

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඔබතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කථා නේ, කියන්නේ. ඔබතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA left the Chair, and THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA took the Chair.

[අ.භා.4.32]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කර තිබෙන මෙම විශ්වාස භංග යෝජනාවේ අඩංගු කාරණා දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරලා අප ජයග්‍රහණය ලැබුවත්, මේ තුළ අපට අමතක කරන්න බැරි, මඟ හරින්න බැරි කාරණා ගණනාවක්

තිබෙන බව. රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වුණු, රටේ ජාතික ආරක්ෂාව අත හැර දැමූ, ඒ ගැන සැලකිල්ලක් නොදැක්වූ කාරණා ගැන අපට ඊළඟට අවධානය යොමු කරන්න සිද්ධ වෙනවා.ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, රාජ්‍ය බුද්ධි අංශ සේවාව මඟින් ලබා දී තිබෙන වාර්තා එකින් එක ඊයේ මේ සභාවට ඉදිරිපත් කර තිබුණා. අපේ රාජ්‍ය බුද්ධි අංශය කොච්චර ශක්තිමත්ද, ඔවුන් මේ පිළිබඳව නිසියාකාරව, ක්‍රමානුකූලව, තොරතුරු සහිතව දැනුවත් කර තිබෙනවාද කියා එම වාර්තා දිහා බැලුවාම තේරෙනවා. එතකොට, රාජ්‍ය බුද්ධි අංශයේ කාර්යභාරය වෙන්නේ දැනුවත් කිරීමයි. එසේ දැනුවත් කළාට පස්සේ තීරණ ගැනීමේ වගකීම කාටද තිබෙන්නේ? පොලිස්පතිවරයාටත්, ආරක්ෂක ලේකම්වරයාටත්, ආරක්ෂක ඇමතිවරයාටත් තමයි ඒ වගකීම තිබෙන්නේ. එතකොට, පොලිස්පතිවරයා සහ ආරක්ෂක ලේකම්වරයා ක්‍රියාමාර්ග ගැනීමේ ඒ වගකීම පැහැර හැර තිබෙනවා. ඒ වගකීමම ආරක්ෂක ඇමතිවරයාටත් එනවා. හැබැයි, ආරක්ෂක ඇමතිවරයා මොකක්ද කරන්නේ? ඔහු ඒ වගකීම ගන්නේ නැතිව, කට උත්තරයක්වත් ගන්නේ නැතිව, -2010දී සරත් ෆොන්සේකා මහත්මයා අත්අඩංගුවට ගත්තා වාගේ- පොලිස්පතිවරයාත්, ආරක්ෂක ලේකම්වරයාත් අත්අඩංගුවට ගන්නවා, මේ වන විට අධිකරණයෙන් ඒකට හොඳ උත්තරයක් ලැබී තිබෙනවා.

මේ විශේෂ කාරක සභාව පටන් ගනිද්දී සියලු පක්ෂ එකඟ වෙලා එය පටන් ගත්තත්, අන්තිමේදී එක කණ්ඩායමක් ඒකට ආවේ නැහැ. හැබැයි, ආරක්ෂක ඇමතිවරයා හැටියට ජනාධිපතිවරයා මේ සිද්ධියට වග කියන්න ඕනෑ බව එම විශේෂ කාරක සභාව ඉදිරියේ ඔප්පු වෙමින් තිබියදී, රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන පරිදි, රාජ්‍ය බුද්ධි අංශය අකර්මණ්‍ය කරන්න හෝ ඔවුන්ට මඩ ගහන්න හෝ කවුරුන් හෝ මේ හරහා උත්සාහ කරනවා නම්, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට මම ඒකට විරුද්ධයි කියන එක ඉතා පැහැදිලිව හා වග කීමෙන් කියනවා. ඒකට හේතුව මේකයි. අපි පක්ෂයක් තෝරාගෙන තිබෙන්නේ තාත්තා යූඑන්පී නිසා පුතා යූඑන්පී වෙන්න ඕනෑය කියන කාරණය හන්දා නොවෙයි. මේ රට තුළ සංහිඳියාව තිබෙන්නට ඕනෑ, රට දියුණු කරන්න ඕනෑ, ලෝකයාත් එක්ක තරග කරලා දිනන්න පුළුවන් රටක් බවට මේ රට පත් කරන්න ඕනෑ. එම නිසා, අප අංක එක හැටියට සලකන්නේ පක්ෂය නොවෙයි. මම නම් මගේ පක්ෂයට වඩා අපේ රට තමයි අංක එක ලෙස සලකන්නේ.

මෙම ක්‍රියාදාමය දිහා බලාගෙන යනකොට අපට තේරෙනවා, පසුගිය කාලයේ කරන්න ඕනෑ බොහෝ දේවල් කරලා නැති බව. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. බරපතළ වංචා, දූෂණ පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව භාර දීලා තිබෙනවා. නමුත් ඒක හමස් පෙට්ටියේ දමාගෙන බලාගෙන ඉන්නවා. ඒ නිසාම, බොරු දේශප්‍රේමී සළු ඇතුළේ ඉන්න හොර තක්කඩි ටිකකට නටන්න පුළුවන් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම, අපි මිනී මරලාත් නැහැ, හොරකම් කරලාත් නැහැ, වංචා කරලාත් නැහැ. ඒ වාගේම, අපි පක්ෂයට වඩා රටට ආදරෙයි. ඒ නිසා අපි තමයි සැබෑ දේශප්‍රේමීන්.

පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරය අල්ලාගෙන, එම ප්‍රහාරය නාට්‍යයක් බවට පත් කරගෙන, ඒක උඩින් දේශ ප්‍රේමයක් අවුළාගෙන, "යම් යම් සිදුවීම් අතැන වෙනවා, මෙතැන වෙනවා, මහියංගනයේ වෙනවා, මිනුවන්ගොඩ වෙනවා, හෙට්ටිපොළ වෙනවා" කියමින් සමහර අය දැන් campaign එකක් ගෙන යනවා. මේ ඔක්කෝම ඉතාම සැලසුම්සහගත වැඩ කටයුතු. ඇත්ත වශයෙන්ම, මෙතැන තිබෙන්නේ ආණ්ඩුවේ කශේරුකාව පිළිබඳ ප්‍රශ්නයක්. මම එහෙම කියන්න හේතුව මොකක්ද? ඒ campaign එක දැන් යනවා. එය ජනාධිපතිවරණය දක්වාම යනවා. එහෙම කරන්නේ මොකද දන්නවාද? එහෙම කරන්නේ, ඉන්දියාවේ පසුගිය දා පැවැති මහා මැතිවරණයේදී BJP පක්ෂය තනිකරම හින්දු ඡන්දවලින් ජයග්‍රහණය කළා වාගේ, මේ අන්තවාදය, ජාතිවාදය දිගටම ගෙන ගිහින් බහුතර සිංහල ඡන්දවලින් තමන්ට බලයට එන්න පුළුවන්ද කියලා බලන්නයි. අනෙක් අතට, ඒ අය මුස්ලිම් ජනතාවට ඒත්තු ගන්වන්න හදනවා, "ඔයගොල්ලන්ගේ මැදිහත් වීමෙන් ආ ආණ්ඩුව යටතේ ඔයගොල්ලන් අනාරක්ෂිතයි, ඔයගොල්ලන්ට ආරක්ෂාව දෙන්න පුළුවන් අපට පමණයි, ඒ නිසා ඔයගොල්ලන්ගෙන් කොටසක් අපිත් එක්ක එකතු වෙන්න" කියලා. මේ ජවනිකාව තේරුම් අරගෙනත් ක්‍රියාත්මක වෙන්න ආණ්ඩුවට හැකියාවක් ලැබී නැහැ. මේ අයගේ අවංකභාවය පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. මේ අයගේ දේශ ප්‍රේමය අවංක නම් මොකක්ද කරන්න ඕනෑ?

මේ දේශ ප්‍රේමය තුළ අධ්‍යාපන ක්‍රමය ගැන කථා කරනවා; අරාබි පාසල් ගැන කථා කරනවා; මද්රසා පාසල් ගැන කථා කරනවා. මම පෞද්ගලිකව විශ්වාස කරනවා, මේ රටේ මිශ්‍ර අධ්‍යාපන ක්‍රමයක් ඇති වන්න ඕනෑ බව; සිංහල, දෙමළ, මුස්ලිම් දරුවන් එකට ඉගෙන ගන්නා තත්ත්වයක් තිබෙන්න ඕනෑ බව. බොහෝ මුස්ලිම් ගම්මාන තිබෙන්නේ සිංහල ගම්මාන මැදයි. ඒ ප්‍රදේශවල සිංහල පාසල්වල ඉගෙන ගන්න බැරි වුණාම ඒ පැත්තේ දේශපාලනඥයන් අල්ලා ගෙන මුස්ලිම් ඉස්කෝලයක් පිහිටුවනවා. එහෙම කළාම, සංස්කෘතික වෙනසක් එතැනින්ම පටන් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා එක උදාහරණයක් කියන්නම්. මේ බොහෝ අය කථා කරමින් කියනවා, "ඉම්තියාස් බාකීර් මාකාර් මහත්මයා ආනන්ද විද්‍යාලයේ හොඳ සිසු දරුවෙක්" කියලා. මම ඉගෙන ගත්තේ මාතර රාහුල විද්‍යාලයේයි. මා ගැනත් යම් පිරිසක් ඒ විධියට කියනවා. හැබැයි, ඉම්තියාස්ලා, අප වාගේ අයට බිහි වෙන්න මේ කණ්ඩායම, මේ system එක අද ඉඩ දෙන්නේ නැහැ. මරදානේ ආනන්ද විද්‍යාලයට අවුරුද්දකට ළමයින් 400ක් ගන්නවා. ඒ අය අතරට එකම එක මුස්ලිම් ළමයකු පමණයි ගන්නේ. ලංකාවේ හැම පාසලකටම බලපාන, පදිංචි අනුපාතයට අදාළව ගන්නා ප්‍රමාණය එම පාසලට දෙන්නේ නැහැ. ආනන්ද සහ නාලන්දා විද්‍යාල සම්බන්ධයෙන් විතරක් ඇයි එහෙම කරන්නේ? හැම තැනටම එකම නීතිය ඕනෑය කියන අය ආනන්ද සහ නාලන්දා විද්‍යාල සම්බන්ධයෙන් ඒ නීතිය ඉල්ලන්නේ නැහැ.

මද්රසා අධ්‍යාපනය හරහා කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළවල් සිද්ධ වෙනවාය කියනවා. මම ඉතා පැහැදිලිව මේ කාරණය කියනවා. මද්රසා වර්ග දෙකක් තිබෙනවා. එකක් තමයි, පාසල් යන දරුවන්ට දහම් පාසල්වල වාගේ ඉරිදා උදේට ආගමික අධ්‍යාපනය ලබා දෙන ආයතන. ඒක මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ තිබුණාදෙන්. හැබැයි, මවුලවිවරුන්ට ලබා දෙන මද්රසා අධ්‍යාපනය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය නිර්දේශය යටතට ගෙනැල්ලා, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගුරුවරුන් දීලා පිරිවෙන් අධ්‍යාපනය වාගේ පවත්වාගෙන යන්නය කියලා අපිත් කියනවා. නමුත්, ඒවා කරන්න වුවමනාවක් නැහැ. ඒවා නොකරන කොට තමයි විවිධ සංවිධාන මැද පෙරදිග රටවල් අල්ලාගෙන, ඒවායෙන් ආධාර උපකාර අරගෙන එවැනි ආයතන පවත්වාගෙන යන්නේ. නිසි ක්‍රමවේදයක් ඇත්තටම හදන්න ඕනෑ නම් මා කියපු ඒ system එක නවත්වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් මහා ලොකුවට කෑ ගැහුවාට මඩකලපුව විශ්වවිද්‍යාලය හදන්න ගිවිසුම් අත්සන් කළේ කොයි කාලයේද? පසුගිය ආණ්ඩුව කාලයේ, ඩලස් අලහප්පෙරුම මැතිතුමා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාව සිටි කාලයේයි ඒක කළේ.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

දැන් විල්පත්තුව ගැන කථා කරනවා. විල්පත්තුවට අදාළ කටයුත්ත පටන් ගත්තේ කොයි කාලයේද? පසුගිය ආණ්ඩුව කාලයේයි ඒක පටන් ගත්තේ. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය තිබියදී, හලාල් සහතික නිකුත් කරන්න ඒ ආයතනයට දෙන්නේ නැතිව ජම්ඉයියතුල් උලමා සංගමයට දුන්නේ කවුද? ඒ, 2007 වර්ෂයේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේදීයි. ඒ නිසා මේ දේශ ප්‍රේමීන්ගේ හෙලුව මේකයි. මේ කරුණු එළියට දමන්න අපේ ආණ්ඩුවට තේරෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආණ්ඩුවේ අඩු පාඩු තිබෙනවා. මේ ආණ්ඩුවට මිනිස්සු බණිනවා. එහෙම එකකුත් තිබෙනවා. එහෙමයි කියලා, ඒකට විකල්පය හැටියට කලින් අය ගෙන එන්න මිනිස්සු කැමැති වෙන්නේ නැහැ. රටේ අද තිබෙන අලුත් ප්‍රවණතාව තේරුම් අරගෙන නැහැ. අද රට යන්නේ කොයි පැත්තටද කියන එක තේරුම් ගන්නේ නැහැ. මට එක දෙයක් ඉතා පැහැදිලිව, වගකීමෙන් කියන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ සිටින මේ මන්ත්‍රීවරු 225 දෙනාගෙන් බහුතරයක් -හැම පක්ෂයකින්ම- ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණය දිනන්නේ නැහැ. ඒක නම් මට අනිවාර්යයෙන්ම කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණ මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම ජනතා විමුක්ති පෙරමුණට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මොකක්ද, ඒකට හේතුව? හැංගුණු කරුණු මේ හරහා හෙළි වෙනවා; හැංගුණු කරුණුවල තිබෙන යටගියාව මේ හරහා හෙළි වෙනවා. ඒක රටේ ජනතාවට දැනගැනීමේ අයිතියක් තිබෙනවා. ඒ අයිතිය අනුව මෙහි සැබෑ ස්වරූපය එළියට දමන්න ඕනෑ. අප විධායක ජනාධිපතිවරයකු පත් කළේ එතුමා කරන කරන හැම එකටම හරියි කියන්න නොවෙයි. එතුමා පටන් ගත් දා ඉඳලා කිව්වා, "දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හොඳ නැහැ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හොඳයි" කියලා. හැබැයි දැන් යන්න කිට්ටු වුණාම කියවනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හොඳ නැති ලු. මම අහන්නේ මේකයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනයෙන් පාර්ලිමේන්තුවේ හා විධායකයේ කාලය අවුරුදු හයේ ඉඳලා පහට අඩු කරපු එක නරකද? තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගෙනාපු එක නරකද? මාධ්‍යවේදීන්ට නිදහස ලබා දුන්නු එක නරකද? ඒ වාගේම අවුරුදු හතරහමාරක් යනතෙක් පාර්ලිමේන්තුව විසුරුවන්න බැහැයි කියපු එක නරකද? තමන් බලයට පත් වෙනකොට කියපු දේවල් ටික ඔක්කෝම අමතක වෙලා, ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා පාර්ලිමේන්තුව නීතිවිරෝධීව විසුරුවන්න ගිහිල්ලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එකේ තරහ තමයි මේ පිට කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම පැහැදිලිව කියනවා, පොලිස්පතිවරයාට වාගේම ආරක්ෂක ලේකම්වරයාටත් මේ වගකීම තිබෙනවා කියලා. අත්තනෝමතික ලෙස ආරක්ෂක මණ්ඩලය කැඳවන්නේ නැතිව, ආරක්ෂක මණ්ඩලය එක්ක සාකච්ඡා කරන්නේ නැතිව, බුද්ධි අංශ නිර්දේශ ලිඛිතව දීලා තිබෙද්දි ඒවා ක්‍රියාත්මක නොකිරීමේ වගකීම ආරක්ෂක ඇමතිවරයාට තිබෙනවා. ඒ නිසා අපි ජනාධිපතිතුමාට කියනවා, එන්න පාර්ලිමේන්තුවට, එන්න විශේෂ කාරක සභාවට. ඇවිල්ලා ඔබතුමාගේ නිරවද්‍යාභාවය ඔප්පු කරන්න. ඔබතුමාට කියන්න තිබෙන දේ රටට කියන්න, මිනිසුන්ට කියන්න. ඇයි මඟ හරින්නේ? මඟ හරින්නේ නැතිව වරද පිළිගන්නවා නම් කිසි ගැටලුවක් නැහැ කියන එකත් මම ප්‍රකාශ කරන්න ඕනෑ.

මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව ශ්‍රී ලාංකිකයන් හැටියට එකට ජීවත්වීමෙන් පමණයි අපට දියුණු රටක් බවට පත් වෙන්න පුළුවන් වෙන්නේ. එක එක පක්ෂවල, එක එක්කෙනාට ඊළඟ වතාවේ ජාතික ලැයිස්තුවලින් එන්න තිබෙන චුවමනාවලට රට ගිනි තියන්න ඉඩ දීලා බලාගෙන ඉන්නවාද නැද්ද කියන තීරණය මේ ආණ්ඩුව ගන්න ඕනෑ. එහෙම රට ගිනි තියන්න දීලා බලා ඉන්නවා නම්, මේ ආර්ථිකය පමණක් නොව සම්පූර්ණ රටම ලෝකයා ඉදිරියේ විහිළුවකට ලක් වෙලා කඩා වැටෙන එක නවත්වන්න බැහැ. විවිධ අයගේ බොරු දේශප්‍රේමය එළියට දමලා, සැබෑ යථාර්ථය මොකක්ද කියන එක අවබෝධ කරලා, සංහිඳියාව කියන කාරණය පාසලෙන් ආරම්භ කරලා කටයුතු කිරීමේ අලුත් න්‍යාය පත්‍රයක් මේ රටට අවශ්‍ය වෙලා තිබෙනවා. එවැනි අලුත් වැඩ පිළිවෙළක් මේ රටට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ සුදු වෑන් ගෙනෙන එක නොවෙයි. ඒ වැඩ පිළිවෙළ මාධ්‍ය නිදහස නැති කරන එක නොවෙයි. ඒ වැඩ පිළිවෙළ නැවත වතාවක් මිනිස්සු හයේ ජීවත් කරවන එක නොවෙයි. ඒ නිසා ඔය කියන අපේක්ෂකයා ද්විත්ව පුරවැසිභාවය අහෝසි කර ගත් බවට announce කළ දවසට තමයි මාධ්‍යවේදීන්ට ආයෙත් කල්පනා කරන්න පටන් ගන්න වෙන්නේ මේකේ කොයි කොටසද edit කරන්න ඕනෑ, කොයි කොටස ද ලියන්න ඕනෑ නැත්තේ, ඒක ලිව්වොත් ගුටි කන්න වෙයිද, මේක ලිව්වොත් සුදු වෑන් එකක යන්න වෙයිද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් කියන්නේ මෙයයි. මේ රටට අලුත් න්‍යාය පත්‍රයක් ලබා දෙන්න අපි අලුත් වැඩ පිළිවෙළක් එක්ක සූදානම්. ඒ නූතන දර්ශනයට අදාළ සංහිඳියාවත් එක්ක එන වැඩ පිළිවෙළක් මිසක, බොරු දේශප්‍රේමයක් ඇතුළේ ඉඳගෙන මිනී මරන නායකත්වයක් හෝ න්‍යාය පත්‍රයක් නොවන බවත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.\

[අ.භා.4.42]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද අපේ පාර්ලිමේන්තුවට විශේෂ දවසක්. අද අපේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළත්, ලෝක පාර්ලිමේන්තු ඉතිහාසය තුළත්, ආණ්ඩු පාර්ශ්ව නියෝජනය කරන කණ්ඩායමක් විසින්ම ආණ්ඩුව රැක ගැනීම සඳහාත්, ආණ්ඩුවට සුජාතභාවයක් ලබාදීම සඳහාත් විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ අපට මේ පූර්වාදර්ශය ලබාදීම පිළිබඳව බොහොම ස්තුතිවන්ත වනවා. මේ ආණ්ඩුවේ විශ්වාසය නැති වුණේ අද නොවෙයි. මේ ආණ්ඩුව බලයට පත් වුණු දවසේ ඉඳලාම මේ ආණ්ඩුව කෙරෙහි ජනතාවගේ විශ්වාසය නැති වෙලා තිබෙනවා. අද අපගේ විශ්වාසය පලුදු වෙලා තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මිරිස් කුඩු ගහලා,-

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මිරිස් කුඩු නොවෙයි, ගහන්න ඕනෑ බෝම්බ. ජනතාව කියන්නේ ඒකයි. අද මේ රට එවැනි තත්ත්වයකට පත් වෙලායි තිබෙන්නේ. අපි කියනවා, ජනතා විමුක්ති පෙරමුණ ඉතිහාසයේ

ඉදලාම ඉටු කළේ එක්සත් ජාතික පක්ෂයේ වග කීමයි කියලා. එතුමන්ලා ඒ කොන්ත්‍රාත්තුව තමයි ඉෂ්ට කළේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව සමයේ -1977 දී- හිරේ හිටපු රෝහණ විජේවීර මැතිතුමා එළියට ගෙනැල්ලා "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව ගමනක අවසානය" කියලා වේදිකාවෙන් වේදිකාවට අරගෙන ගිහිල්ලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වාමාංශික බලවේගය විනාශ කරන්න කටයුතු කළා. ඊට පසුව 1982 කොබ්බෑකඩුව මහත්තයාට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් වෙලා ජේ.ආර්.ජයවර්ධන මහත්තයා ජයග්‍රහණය කරවන්න කටයුතු කළා. 1989 සිරිමාවෝ මැතිනියට විරුද්ධව වාමාංශික පුළුල් බලවේගයක්, රට සුරකින බලවේගයක් එන වෙලාවේ ඒ ඡන්දය වර්ජනය කරලා නැවත ප්‍රේමදාස මහත්මයා මේ රටේ ජනාධිපති කිරීමෙන් ලැබුණු ප්‍රතිඵලය මොකක්ද? හැටදහසක් දං ගෙඩියට යැව්වා. 2010 ඉතිහාසය ගත්තත් එහෙමයි. 2010 සරත් ෆොන්සේකා මහත්මයා ජනාධිපතිවරණයට ඉදිරිපත් වන වෙලාවේදීත් ඒ ව්‍යාපාරය අරගෙන ගියා. ඊළඟට, 2015 "යහපාලනය" කියන වචනය ගෙනැල්ලා මේ ආණ්ඩුව, මේ ජනාධිපති ගෙනෙන්න කටයුතු කළා. අද නිකම් ලෝකයට පෙනෙන්න එතුමන්ලා විශ්වාස භංග යෝජනා ගෙනෙනවා. අද රටේ ජනයා දන්නවා ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරකම් පිළිබඳව. හැබැයි, අද බැරි වුණත්, මේ පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩි ගණනින් නොව ජනතාවගේ සැබෑ ජන මතයෙන් මේ ආණ්ඩුව ගෙදර යවනවාය කියන එක පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

මේ රටේ අධිරාජ්‍ය විරෝධී අරගළයේ පුරෝගාමීන් ලෙස කටයුතු කරන්නේ ජනතා විමුක්ති පෙරමුණේ අයයි. හැබැයි, අධිරාජ්‍යවාදී ඒජන්තකරුවා විධියට වැඩ කටයුතු කරන, මේ රටේ රාජ්‍ය සම්පත්, ජාතික සම්පත් විකුණන, අධිරාජ්‍යවාදීන්ට පක්ෂව සහ ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කරන රනිල් වික්‍රමසිංහට විරුද්ධව අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනාපු වෙලාවේ, අපි ආණ්ඩුවක් හදන්න යන වෙලාවේ මතකද ඔබතුමන්ලා කරපු වැඩේ? මේ ආණ්ඩුව වෙනුවෙන් විශාල ලෙස කඩේ ගියා; එහෙට මෙහෙට දිව්වා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ?

පසුගිය දවස්වල පනත් කිහිපයක් ගෙනාවා. මුදල් පනතක් ගෙනාවා. බදු පනතක් ගෙනාවා. ඉඩම් විකිණීම සඳහා, "ආර්ථික කොරිඩෝව" ව්‍යාපෘතිය හරහා ඇමෙරිකාවට ඉඩම් ලබා දීමේ වැඩ පිළිවෙළ සැකසීම සඳහා ඉඩම් පනත ගෙනෙන වෙලාවේත් එයට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණ එක උසාවියකවත් නඩුවක් දමා තිබුණේ නැහැ. හැබැයි, එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව අධිකරණයට මුලින්ම ගිහිල්ලා නඩු පැවරුවේ ජනතා විමුක්ති පෙරමුණයි. මේක තමයි ඇත්ත තත්ත්වය. අද මේ රටේ දරුවන් මන්ද පෝෂණයෙන් මැරෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දෙමාපියන් සමඟ දරුවන් අද කෝච්චියට පනින තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ රටේ තරුණ තරුණියන්ට රැකී රක්ෂා අහිමි වෙලා මේ රටේ ආර්ථිකය විශාල ලෙස විනාශ වෙලා තිබෙනවා.

ඒ වාගේම සුළු අපනයන භෝග කෘෂිකර්මාන්තය විනාශ වෙලා ඉවරයි. සුළු අපනයන භෝග නිෂ්පාදකයන් වන තේ, රබර්, කරාබු නැටි, එනසාල්, ගම්මිරිස්, කුරුඳු ගොවියා අද විනාශ වෙලා. ඒ ගොවියා අද ගොවිකමින් ඈත් වෙලා. අද ගොවීන් වහ බොන තත්ත්වයට පත් වෙලා.

එදා මහින්ද රාජපක්ෂ යුගයේ වැඩ බිමක්ව පැවැති මේ රට අද මුඩු බිමක් බවට පත් වෙලා තිබෙනවා. එදා පැවැති ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය අද විනාශ කරලා දමලා ගොවියා ඇතුළු සියලුදෙනා විනාශ කරලා ඉවරයි.

ඒ වාගේම මේ රටේ ජාතික ආරක්ෂාව විනාශ කරලා ඉවරයි. එදා පාස්කු ප්‍රහාරයේදී මිය ගිය ජනතාව, තුවාල ලැබූ ජනතාව වෙනුවෙන් අද සාධාරණයක් ඉටු වෙලා නැහැ. ඒ වෙනුවෙන් කථා කරපු කාදිනල් හිමිපාණන්ලා අද වැරදිකාරයෝ වෙලා; ස්වාමීන් වහන්සේලා වැරදිකාරයෝ වෙලා. ඒ වෙනුවෙන් පත් කරපු සභා අද රෙදි හෝදන තත්ත්වයට, වැරදිකරුවන් ශුද්ධ කරන තත්ත්වයට, ආණ්ඩුව ශුද්ධ කරන තත්ත්වයට පත් වෙලා. සාෆිලා වැනි ජන සංහාරයට ලැස්ති වෙන මිනිසුන් ශුද්ධ කරන තත්ත්වයට පත් වෙලා. ඒ වෙනුවෙන් පෙනී සිටින මිනිසුන් අද වැරදිකරුවන් බවට පත් කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ කාලකණ්ණි ආණ්ඩුවට අපි කියනවා, අපට අද මේ ආණ්ඩුව පාර්ලිමේන්තුවේ ඔළු ගෙඩි ගණනින් පරාජය කරන්න බැරි වුණත් තව මාස කීපයකින් ජනතාවත් එක්ක එකතු වෙලා ජනතා මතයෙන් පරාජය කරනවාය කියන එක. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඒ.එච්-.එම්. ෆවුසි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[4.49 p.m.]

ගරු ඒ.එච්-.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

Madam Chair, I thank you for the opportunity given to me to participate in the Debate on the No-Confidence Motion moved by the Janatha Vimukthi Peramuna against the Government.

The No-Confidence Motion attempts to lay the entire blame of the Easter Sunday attacks on the Prime Minister and the Cabinet and accuses them of failing to take steps to prevent the occurrence of these terrorist attacks.

Before I comment on the contents of the Motion, please permit me to make a few preliminary remarks on the situation that exists in the country after the horrible attacks that targeted innocent Christian worshippers in churches as well as tourists in our high-end hotels.

April 21, 2019 is a black day in the history of the country. No amount of words can remove the pain of the victims and their families. The least we, as a nation, can do for them is to ensure that never again an incident like this would take place in this country. While the Catholic and Christian community has endured their ordeal with dignified patience, it is unfortunate that there are other evil forces trying to capitalize on the situation and are spreading hate and venom against the Muslim community in order to achieve their own vested interests.

On the one hand, some religious personalities are going round the country uttering half-truths and untruths that create fear and suspicion in the minds of the ordinary Sinhalese. On the other hand, there are politicians who are spreading communal sentiments in pursuit of their electoral agenda. There are also business interests who are attempting to further their own objectives by creating baseless stories against businesses owned by Muslims.

[ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා]

Apart from the damage caused to religious harmony by all these campaigns, these will also result in long-term damage to the economy of the country. It is, therefore, imperative that the Government takes immediate steps to curb the actions of these destructive forces.

Coming back to the No-Confidence Motion itself, I must stress that the events of 21st April could not be prevented because of a system failure as opposed to a governmental failure. Although there was evidence available to the intelligence services for several years before this Government came to power that there were some individuals who were indulging in unacceptable behaviour, no action was taken. These individuals had several brushes with the law and had warrants issued against them, but no action against them was forthcoming.

One cannot blame this Government alone for the system not getting activated. In the final analysis, it is the responsibility of the Government to ensure safety and security of the people. What the Government needs to do is to ensure that systems are strengthened so that in a given situation, they can immediately respond without waiting for political direction. The Prime Minister and the Cabinet were unaware of the buildup to the attacks on April 21, 2019 because the Prime Minister was kept out of the Security Council Meetings since October, 2018.

It must be remembered that in the absence of the President who was out of the country, it was the Prime Minister who took control of the situation and immediate action to bring back a degree of normalcy. What we should do is, not take political advantage, but get together as a country to strengthen systems as well as initiate new steps to prevent a recurrence of any form of terrorism. Unfortunately, instead of engaging in this national task, we only see attempts to demonize the Muslim community and spread communal disharmony despite the active support rendered by the Muslims to the security forces to dismantle the terrorist network and arrest the remaining suspects. Additionally, we see a campaign made by various vested interests as well as religious personalities who are now trying to spread hate among the Sinhalese and attempting to drive a wedge between Muslims and Tamils.

Madam, I wish to take this opportunity to call upon the Government to reassure the Muslim community that their safety and security will be ensured. The Muslim community will stand together with the Sinhalese and Tamil communities in protecting and rebuilding this country, as we have done for centuries. We cannot go on a destructive path. We must build national unity and as a country, we must march forward unitedly to correct the mistakes of the past and move ahead. I, therefore, call upon all Hon. Members to vote against this No-Confidence Motion.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.56]

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම අහගෙන සිටියා, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ කථාව, ඒ වාගේම ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාත් කථාව සහ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාගේ කථාව. 2015දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පරාජය කළා. එදා රජය තිබුණු කාලයේදී බේරුවලදී යම් ප්‍රශ්නයක් ඇති වුණා. එදා හිටපු ආරක්ෂක ලේකම්, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාව හා පොලීසිය විසින් දවස් කිහිපයකින් එය අවසන් කළා.

හැබැයි, තමුන්නාන්සේලා එක්කාසු වෙලා ගෙනාපු බස් එකේ ප්‍රධාන රියැදුරු, විමල් වීරවංශ මැතිතුමා කිව්වා වාගේ කොන්දොස්තර මහත්තයා, ඒ බස් එකේ යන ජනතාව, අද එක්කෙනාට එක්කෙනා රුස්සන්නේ නැතිව කලබල වෙලා තමයි මේ විධියට විශ්වාස භංග යෝජනාවක් ගෙන එන තත්ත්වයට පත් වුණේ.

විශේෂයෙන් නැඟෙනහිර පළාතේ ජීවත් වෙන මන්ත්‍රීවරයකු හැටියට මම මතක් කර දෙන්න කැමැතියි, ආරක්ෂක හමුදා දුන් තොරතුරු අනුව, 21 වැනි දා බෝම්බ ටික පත්තු වෙන එක වැළැක්වූවා නම් මේ තත්ත්වය ඇති වෙන්නේ නැහැයි කියන එක. ඒ ආරක්ෂක හමුදාවලට ඒ පසුබිම සකස් කර දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ උදවිය. ඒවා ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වුණු නිසා තමයි බෝම්බ තොරතුරුත් ආවේ. හැබැයි ඒ තොරතුරුවලට අනුව ක්‍රියාත්මක නොවීමේ හේතුව මත බෝම්බ පුපුරන එක නතර කරන්නට බැරි වුණු නිසා තමයි අද මේ විශ්වාස භංග යෝජනාවත් ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් ගෙනාවේ. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාත් මේ යෝජනාවට පක්ෂයි. හැබැයි, පක්ෂව ඡන්දය දෙන්න විධියක් නැහැ. එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාටත් මේ යෝජනාව හොඳයි. නමුත් පක්ෂව ඡන්දය දෙන්න විධියක් නැහැ. සමහරවිට මගේ හිතමිත්‍ර ගරු සම්බන්ධන් මැතිතුමා ඇතුළු ඒ කණ්ඩායමටත් මේ ආණ්ඩුවට දායක වෙච්ච නිසා අද මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳව හිතේ පොඩි කලබලයක් ඇති. එහෙම ඇති වන්නට ඕනෑ. ඒ මොකද, එතුමන්ලා ගෙනා රටේ ප්‍රධානියාගෙන්, එතුමන්ලා ඊළඟට ගෙනාපු පාර්ලිමේන්තුවේ ප්‍රධානියාගෙන් එතුමන්ලාට වෙලා තිබෙන දේ හරිද වැරදිද කියන එක බලනවිට එතුමන්ලාගේ හෘදය සාක්ෂියේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ජනතාවගේ පැත්තෙන් බැලුවත්, ගම්වලට ගියාම මේ ප්‍රශ්නය තිබෙනවා, "අපට හරි දෙය වුණාද?" කියලා. මේවා වටහාගෙන තමයි අද අපි විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට මේ විශ්වාස භංග යෝජනාවට සහයෝගය දෙන්නේ.

අපට මේ සම්බන්ධව කරුණු කීපයක් කියන්න තිබෙනවා. මේ රටේ ප්‍රථම වතාවට මෙන්න මේ වාගේ දෙයක් "මවුබිම" පත්තරයේ පළවෙලා තිබෙනවා. "අස්ගිරි නාහිමි අත්අඩංගුවට ගන්න පාක්‍යසෝතිගෙන් වැඩ බලන පොලිස්පතිට පැමිණිල්ලක්" කියලා මෙහි සඳහන්ව තිබෙනවා. මේ වාගේ කියමන් මේ රටේ

මීට පෙර සිටි රාජ්‍ය නායකයන් යටතේ සිදු වුණේ නැහැ. අස්ගිරි නාහිමි කියන්නේ අපේ ප්‍රධානම බෞද්ධ නායකයෙක්. මෙය ප්‍රජාතන්ත්‍රවාදය හැටියට සලකන්නටත් බැහැ. මෙය ආගමික නායකයෙකුට කළ අපහාසයක්.

දෙවෙනි කාරණය, අපේ මුදල් ඇමතිතුමා කියනවා, "බහුතරයක් සිංහල බෞද්ධයන් වීම වෙනම කරුණක්. ශ්‍රී ලංකාව සිංහල බෞද්ධ, කතෝලික, හින්දු ආගමික සැමටම අයිති රටක්." කියලා. ඊට විරුද්ධව මැල්කම් රංජිත් හිමිපාණන් වහන්සේ කියනවා මේ රට බෞද්ධ රටක් කියලා. දකුණේ, මාතරින්, සිංහල බෞද්ධ බහුතර ජනතාවගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට ආපු සිංහල බෞද්ධයකු වන මංගල සමරවීර කියනවා, මේ රට බෞද්ධ, කතෝලික, හින්දු තුන්ගොල්ලන්ටම අයිති රටක් කියලා. එහෙම නැත්නම් මේ රට බෞද්ධ රටක් නොවෙයි කියන අර්ථය එතුමා දෙනවා. මේවාත් මීට පෙර රජයන්වල හිටපු කිසි කෙනෙක් - විශේෂයෙන්ම ඇමතිවරයෙක්- නොකී කථා. එතුමා දකුණේ සිංහල බෞද්ධ බහුතර ජනතාවගේ ඡන්දයෙන් ආපු කෙනෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු මොනවා කිව්වත් අද එක්තරා පුවත් පතක කතුවැකියේ සඳහන් කොටසක් මම කියවන්නම්. "පාරවල් දෙපැත්තේ කුණු කඳු ගොඩ ගැහිලා තිබෙන ලංකාව, ඇමෙරිකාවේ කොලනියක් කරන්න ගිවිසුම් ගහන්න යන, ඡන්ද කල් දමා ප්‍රජාතන්ත්‍රවාදය බල්ලාට දමන, ආර්ථික මර්මස්ථාන විකුණන, කැලෑ විනාශ කරන, අන්තවාදීන් පෝෂණය කරන, රැකියා වියුක්තිය සියයට 4.9 දක්වා ඉහළ දමා ඇති, රාජ්‍ය ණය කෝටි 90,000කින් ඉහළ දමා ඇති, කොටස් වෙළෙඳ පොළ පහළට දමා ඇති, රුපියලේ අගය 28කින් බස්සවා ඇති, ආර්ථික වර්ධනය සියයට 3.6 දක්වා පහළ වැටී ඇති තත්ත්වයකට ඇද දමපු රටක් හඳනවාය කියන එක හතරබීරි කථාවක්ය. තමන්ගේ අමාත්‍යාංශවල වියදමින් දැන්වීම් නිර්මාණය කරවා ඒ හරහා තමාටම යකඩ මිනිහා යැයි කියා ගැනීම ඊටත් එහාය." මේ රජයේ ඇමතිවරයෙක් ගැනයි මේ කියන්නේ. මම ඒ ඇමතිවරයාගේ නම මෙතැන කියන්න කැමැති නැහැ, ඒක මට අදාළ නැති නිසා. මේක තමයි අද රටේ මහජන මතය. ඒ මහජන මතය තමුන්නාන්සේලාට වැඩි කල් යන්න ඉස්සෙල්ලා පවත්වන මැතිවරණයෙන් මනාවට දැනගන්නට ලැබෙයි. මම එහෙම කියන්නේ මොකද? තමුන්නාන්සේලා ඇතුළු මේ සියලුදෙනාම එක්කහු වෙලා හදපු රජය යටතේ තමයි අප්‍රේල් 21වැනි දා බෝම්බ පිපුරුවේ. හැබැයි, මගේ හිතවත් ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා නිතරම ඒක මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පැත්තට, විපක්ෂයේ පැත්තට බැර කරන්න බැලුවා. ඒක කොතෙක් දුරට සාධාරණද කියන එක අපි සොයා බලන්න ඕනෑ.

අපේ විපක්ෂය හැදිලා තිබෙන්නේ පක්ෂ කිහිපයක් නියෝජනය කරන සංයුතියකින්. ඒකේ ඉන්න නායකයන්ට ප්‍රජාතන්ත්‍රවාදය අනුව ඕනෑම ප්‍රකාශයක් කිරීමේ අයිතිය තිබෙනවා. ඒ ප්‍රකාශ කරන අදහස්, ඒ අයගේ අදහස් වෙන්න පුළුවන්. නමුත්, බහුතර විපක්ෂයට, එහෙම නැත්නම් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ගොඩට ඒවා බැර කරන්න සාධාරණ අයිතියක් නැහැ කියන එකයි මගේ මතය. [බාධා කිරීමක්] නැහැ, විපක්ෂය සමන්විත වෙලා තිබෙන්නේ තව තව පක්ෂ එක්ක නේ. ඒ ගොල්ලන් කියන එක අපට බැර කරන්න මෙතුමාට බැහැනේ. එහෙම දෙයක් මහින්ද රාජපක්ෂ මහත්මයා කොහේවත් කියලා නැහැනේ. රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාට පුළුවන් ඒ කියපු අයත් එක්ක ඒ ගනුදෙනුව බේරා ගන්න, ඉස්සෙල්ලා එස්.බී. දිසානායක මන්ත්‍රීතුමාත් එක්ක බේරා ගත්තා වාගේ. ඒක කොතෙක් දුරට සාධාරණ ද කියලා මම දන්නේ නැහැ. මේ ගරු සභාව ඇතුළේ එහෙම ප්‍රශ්න බේරා ගන්න ගියාම රටේ ලක්ෂ ගණනක් ජනතාව ඒවා බලලා තමයි තීන්දු කරන්නේ මේ මන්ත්‍රීවරු 225දෙනා ගැන. මේ ගරු සභාව තිබෙන්නේ මන්ත්‍රීවරු 225දෙනාට ඇවිල්ලා තමුන්ගේ ප්‍රශ්න විසඳාගන්න ද කියන ප්‍රශ්නයත් තිබෙනවා නේ. අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ අපේ පෞද්ගලික ප්‍රශ්න විසඳා ගන්න නොවෙයි. අපි නියෝජනය කරන ප්‍රදේශවල ජනතාවගේ ප්‍රශ්නයක්, රටේ ප්‍රශ්නයක් තිබෙනවා නම් කථා කරලා විසඳා ගන්නයි අපි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. අපට අනන්ත අප්‍රමාණ පෞද්ගලික ප්‍රශ්න තිබෙනවා. අනෙක් අයටත් තිබෙන්න පුළුවන්.

විශේෂයෙන්ම අපි මේ ආණ්ඩුවට විරුද්ධ වෙන කාරණා තව තිබෙනවා. උදාහරණයක් හැටියට රටට අහිතකර වෙලා තිබෙන මහ බැංකු කොල්ලය සම්බන්ධයෙන් තවමත් මොනවත් දැනෙන නීතිමය ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැනේ. ඒ හොරකම කළා. මුළු රටම, ලෝකයම ඒක දන්නවා. කුඩා දරුවෙකුගෙන් ඇහුවත් කියනවා, මහ බැංකුවෙන් හොරකම් කළේ ආණ්ඩුවේ අය කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යෝජනාවක් එවලා තිබෙනවා. ඒ කාරක සභාවේ සභාපති හැටියට ඉන්නේ එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමායි. ඒ ලියුමේ ජනාධිපතිතුමාගේ නිරීක්ෂණයක් තිබෙනවා. ඒකේ කියලා තිබෙන්නේ, විශේෂඥ දැනුම ගන්න, විශේෂඥ දැනුම අරගෙන මේ කටයුතු කරන්න කියලා. ඒක කරන්නේ නැතිව කටයුතු කළොත් නැවත ඕනෑම කෙනෙකුට ඕනෑම විධියකට මහ බැංකුවෙන් හොරකම් කිරීමට ලයිසන් එකක් දුන්නා වාගේ තමයි. ඒ විධියට තමයි පෙනෙන්නේ.

විශේෂයෙන්ම මම මතක් කරලා දෙන්නට ඕනෑ, අපි මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂ වෙන්න එක හේතුවක් තිබෙන බව. අපි මේ ආණ්ඩුවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරනවා. විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන්නට හේතුවෙන එකම කාරණය මෙයයි. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, 4. (අ) ව්‍යවස්ථාවේ තිබෙනවා, "රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේය;" කියලා. තමුන්නාන්සේලා විසින් පත් කර ගත්ත ජනාධිපතිවරයා විසින් ආරක්ෂාව පිළිබඳ ක්‍රියාමාර්ග නිවැරදිව නොගත්ත නිසා ඇති වුණු තත්ත්වයක් මේක. ඒ වාගේම අගමැතිතුමාට එන්න කිව්වේ නැහැ කියලා නොගිහින් ඉන්න බැහැ, එතුමාට වගකීමක් තිබෙනවා ආරක්ෂක කවුන්සලයට යන්නට. මම දන්නා විධියට හැම සතියේම ඒක රැස් වෙන්නට ඕනෑ. ඒවා නොකළ නිසා තමයි අප්‍රේල් මාසයේ 21වෙනි දා මේ සිද්ධිය වුණේ. ඒ නිසා තමයි අද මෙතුමන්ලා ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ. එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාත් හෘදය සාක්ෂියට විරුද්ධ වෙන්නට බැරි නිසා තමයි එවැනි කථාවක් කළේ. ඒ ගැන තමයි රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාත් කථා කළේ. විරුද්ධ පක්ෂයේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ගෙන එන ලද විශ්වාස භංග යෝජනාවට පක්ෂව ඡන්දය දීලා මේ ආණ්ඩුවට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒ වාගේම, නුදුරු අනාගතයේදී පවත්වන්නා වූ මැතිවරණයේදී මේ තිබෙන ආණ්ඩුව ගෙදර අරින්නට අපි කටයුතු කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)

මට විනාඩි 10ක් තිබුණා

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වේලාව අඩු කරන්නට සිදුවෙලා තිබෙනවා. දැන් කථාව පටන් ගන්න.

[අ.භා.5.08]

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඇත්තටම අනුර කුමාර දිසානායක මැතිතුමා ප්‍රමුඛ ජනතා විමුක්ති පෙරමුණ විශ්වාස භංග යෝජනාවක් ගෙන එමින්, විපක්ෂයක් විධියට කළ දේ හරි. එතුමන්ලාගේ රාජකාරිය එතුමන්ලා ඉටු කරලා තිබෙනවා. නමුත් ඇත්තටම ජනතා විමුක්ති පෙරමුණට කලින් මේ සභාවේ ඉන්න විපක්ෂයේ අනෙක් උදවිය තමයි මේ විශ්වාස භංග යෝජනාව ගේන්නට තිබුණේ. ඇත්තටම අද වන විට විපක්ෂයේ කාර්යභාරය ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉතාම ලස්සනට කරනවා. නමුත් මේ ගෙනැල්ලා තිබෙන විශ්වාස භංග යෝජනාවේ පොඩි අඩු පාඩුවක් තිබෙනවා. මේ විශ්වාස භංග යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ අගමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයට විතරයි. ජනාධිපතිතුමා ගැන මේ යෝජනාවේ නැහැ. හැබැයි ජනාධිපතිතුමා යන යන තැන කථා කරන්නේ නම් විපක්ෂයේ ජනාධිපතිතුමා විධියට. සමා වන්න, ජනාධිපතිතුමා කියන වචනය මට කියන්නට බැහැ, කිව්වොත් හැන්සාඩ් වාර්තාවෙන් මගේ කථාව අයින් කරනවා. ඒ වෙනුවට මම වෙනත් වචනයක් යොදා ගන්නම්, නෙල්සන් මැන්ඩෙලා කියලා, එහෙම නැත්නම් "වෙන්ඩ මැන්ඩෙලා" වාගේ එකක්. මම "වෙන්ඩ මැන්ඩෙලා" කියන්නම්. මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැතිතුමා මේකට සම්බන්ධයි කියන එක ඔබතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාවට දාලා නැහැ. ඒකට හේතුව විය හැක්කේ, දෝෂාභියෝගයකට අත්සන් කරන්නට මන්ත්‍රීවරුන් 70ක්, 75ක් පමණ අවශ්‍ය වීම වෙන්න ඇති. ඇත්තටම ඇවිල්ලා අපෙන් ඇහුවා නම්, මම ඔබතුමාට අත්සන් 75කට වඩා අරගෙන දෙනවා. දැන් මේ සභාවේ ජනාධිපතිතුමාට විරුද්ධව ඉන්න කට්ටිය කරුණාකරලා අත උස්සන්න බලන්න. ආණ්ඩුව පැත්තේ 6 දෙනෙකු ඉන්නවා, ඔබතුමන්ලාගේ පැත්තේ 6 දෙනෙකු ඉන්නවා. මේ ඉන්නේ. භය නැතිව අත උස්සනවා මේ අය. සරත් ෆොන්සේකා මැතිතුමා ඇතුළු මේ ඔක්කොම අත්සන් කරයි. අපරාදේ, මුලින්ම අපට කිව්වා නම්, මම අත්සන් 75කට වඩා අරගෙන දෙනවා. ඒක තමයි ඔබතුමන්ලාට වුණු අතපසුවීම කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ කෙසේ වෙතත් මම කැමැතියි, මගේ කථාව මෙතැනින් පටන් ගන්නට. ඊයේ ගරු අධිකරණය විසින් ඉතා අපූරු තීන්දුවක් දුන්නා. මේ, ගරු අධිකරණය විසින් විධායකය අබිබවා දීපු තුන්වෙනි තීන්දුව. පෙරේදා තීන්දුවක් දුන්නා. හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මැතිතුමාටත්, පොලිස්පතිතුමාටත් දාලා තිබෙන චෝදනා අනුව ඝාතනය කියන චෝදනාව යටතේ ඔවුන් වරදකරුවන් කරන්නට විධියක් නැහැ, කාගේවත් මනදොළ සැපිරීම සඳහා මට මේ තීන්දුව දෙන්න බැහැයි කියන එක ඉතා අපූරු විධියට විග්‍රහ කරලා ගරු විනිසුරුතුමිය ප්‍රකාශ කරලා තිබුණා. ඇත්තටම එතුමියට සහ අධිකරණයට අපි සිරස නමා ආචාර කරනවා. ඒකට හේතුව තමයි, මේ ආණ්ඩුවෙන් කළ හොඳම සහ ඉතාම වටිනාම දේ ඒ කාරණය වීමයි. ඒ කියන්නේ විධායකයට, අධිකරණයට බලපෑම් කිරීමට නොහැකිවීම. අන්න එතැනිනුත් ඒක ඔප්පු වෙනවා. එක එක්කෙනාට බෝලය පාස් කරලා තමන්ගේ අත්දෙක පිසදාගන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැතිතුමාට අවශ්‍ය වුණාට, ඇත්තටම පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවේ දී සාක්ෂි ලබා දෙන අයගේ සාක්ෂිවලින් ඔබතුමන්ලා සඳහන් කර තිබෙන ආකාරයේ සාපරාධී නොසැලකිල්ල - criminal negligence - කියන එක ඇත්තටම වෙලා තිබෙන්නේ කොතැනද කියලා එතැනිනුත් ඉතා අපූරුවට ඔප්පු වෙනවා.

දැන් මෙහෙම හිතන්න කෝ. අප්‍රේල් 21 වැනි දා මේ ප්‍රහාරය එල්ල වුණා. ඒ වෙලාවේ මැන්ඩෙලා මැතිතුමා සිංගප්පූරුවේ Mustafa Centre එකේ shopping කරමින් හිටියේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැතිතුමාට call එක ආවාට පසුව, මේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ අයිතිකාරයා විධියට වහාම ලංකාවට එන්න එතුමාට වුවමනාවක් තිබුණේ නැද්ද? සිංගප්පූරුවේ ඉඳලා ලංකාවට එන්න ඕනෑ තරම් ගුවන් යානා - flights - තිබෙනවා. එතුමා කළේ මොකක්ද? රාත්‍රී 12ට තිබෙන flight එක තමයි එතුමා තෝරාගත්තේ. ඇයි? Shopping කරන ඒවා ඔක්කෝම ඉවර කරලා එන්න ඕනෑ නිසා. එතැනිනුත් පෙනෙනවා, සාපරාධී නොසැලකිල්ල කාගේද කියන එක.

අනෙක් එක, ඒ වේලාවේදී අග්‍රාමාත්‍යතුමා විසින් සියලු ආරක්ෂ අංශවල රැස්වීමක් කැඳවා තිබුණා. මෙතුමා පළමුවෙන්ම මොකක්ද කළේ? එතුමා සිංගප්පූරුවේ ඉඳගෙන ආරක්ෂක අංශවලට call එකක් දීලා කිව්වා, "යනවා එහෙම නොවෙයි" කියලා. ඇත්තටම ප්‍රහාරය එල්ල වුණාට පසුව අග්‍රාමාත්‍යතුමා විසින් ගතයුතු ක්‍රියාමාර්ග හැම එකක්ම වාගේ ගන්න උත්සාහ කළා; ගත්තා. හැබැයි, තිබෙන කුහකකම නිසා, එහෙම නැත්නම් ඒ තිබෙන තරහ නිසා, තිබෙන බාල වැඩ නිසා තමයි ඒ අවස්ථාවේ දී "අග්‍රාමාත්‍යතුමා ළඟට යන්න එපා" කියලා ආරක්ෂක අංශ දැනුවත් කළේ. හරිම ළාබාල ළමයෙක් වාගේ තමයි හැසිරෙන්නේ.

ඊළඟට, ජනාධිපතිතුමාම කමිටුවක් පත් කළා මේ සිද්ධිය ගැන හොයන්න. එම කමිටුවේ ඉන්නේ හිටපු පොලිස්පති ඉලංගකෝන් මැතිතුමා වාගේ කීප දෙනෙක්. මේ කමිටුව දැන් වෙනකොට ගැසට් කරලාවත් නැහැ කියන එක තමයි අපට ආරංචි වුණේ. එතකොට මේක නීත්‍යනුකූලව, හරි ක්‍රමවේදයකට පත් කළ කමිටුවක්ද කියන එක ගැන සැකයක් ඇති වෙනවා. අනෙක් එක, මේ කමිටුව පත් කළේ අපේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේ කමිටුව 22 වැනි දා තමයි නම් කළේ. ඊට පසුව - සමාවෙන්න, 22 වැනි දා මෙතුමා ඉලංගකෝන් මැතිතුමා ආරක්ෂක උපදේශක විධියට නම් කරනවා. 29 වැනි දා මෙතුමා මේ කාරක සභාව නම්

කරනවා. එතකොට එතුමා විසින් නම් කරපු උපදේශක කෙනෙක් තමයි, එතුමාගේම කාරක සභාවට පත් කරන්නේ. ඉතින් ඒ උපදේශකතුමා එතුමාට විරුද්ධව හෝ එතුමා මේකට සම්බන්ධයි කියලා හෝ එතුමාගේ නොහැකියාව ගැන හෝ නොසැලකිල්ල ගැන හෝ කථා කරයිද? ඒ වාගේ තීන්දුවක් දෙයිද? කල්පනා කරලා බලන්න. එතැනත් bribe කිරීමක්. ඒ දවස්වල - පසුගිය ඔක්තෝබර් 26 වැනි දා - කළ bribe කිරීම තමයි එතැනදීත් යම්කිසි විධියකින් කරලා තිබෙන්නේ.

ඊළඟට, පොලිස්පතිතුමාට එන්න කියලා එතුමා කියා තිබෙනවා, “වැරැද්ද භාරගන්න. මම තානාපතිකමක් දෙන්නම්” කියලා. අපි නොවෙයි ඒක කියන්නේ, පොලිස්පතිතුමා. එතකොට පැහැදිලිව එතුමා සෑම අවස්ථාවකම උත්සාහ ගත්තේ මේක ආණ්ඩුව පැත්තට, ඒ කියන්නේ එතුමා නැති ආණ්ඩුව පැත්තට දමා, කැබිනට් මණ්ඩලය පැත්තට දමා පැත්තකට වෙලා අත සෝදා ගන්නයි. ඒක කරන්න බැහැ. මේ රටේ ජනතාව දැන් වෙනකොට දන්නවා, පාස්කු ඉරිදා එල්ල වුණු ප්‍රහාරයට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නොසැලකිල්ල තමයි සෘජුව බලපෑවේ කියලා.

මම ජනතා විමුක්ති පෙරමුණට ආරාධනාවක් කරනවා. ඔබතුමන්ලා දෝෂාභියෝගයක් ගෙනාවොත් ඒකට 75කට වඩා අත්සන් අරගෙන දෙන්නම්. සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා ඉන්නවා, මම ඉන්නවා, රෝහිණී විජේරත්න මන්ත්‍රීතුමිය ඉන්නවා, හේෂා විතානගේ මන්ත්‍රීතුමා ඉන්නවා, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ඉන්නවා, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉන්නවා, මරික්කාර් මන්ත්‍රීතුමා ඉන්නවා, සරත් ෆොන්සේකා මන්ත්‍රීතුමා ඉන්නවා, රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ඉන්නවා. මම නම් ටිකක් විතරයි කිව්වේ. අජිත් පී. පෙරේරා ඇමතිතුමා ඉන්නවා. ඔබතුමාට 75කට වැඩිය අත්සන් මම අරගෙන දෙන්නම්. අපි මුලින් ඒක කරලා ඉඳිමු. මොකද, සමස්තයක් විධියට මේ මුළු රටම අගාධයට ඇද දැම්මේ, අග්‍රාමාත්‍යතුමාවත්, කැබිනට් මණ්ඩලයවත් නොවෙයි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මම ඒක වතාවකදීත් කිව්වා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තිබෙන මේ හීනමානය කියලා. ඒකට වෙන මොකුත් වචනයක් නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

විශාල හීනමානයක් තිබුණා. අග්‍රාමාත්‍යතුමාත් එක්ක එතුමාට වැඩ කරගෙන යන්න බැරි තත්ත්වයක් තිබුණා. මේ සෑම අවස්ථාවකදීම යම්කිසි හොඳ දෙයක් වුණොත් අනිවාර්යයෙන් එතුමාගේ account එකටත්, යම්කිසි වැරදි දෙයක් වුණොත් අග්‍රාමාත්‍යතුමාගේ account එකටත් දමන පුරුද්ද එතුමාට ඒ කාලයේ ඉඳලා තිබෙනවා.

කෙසේ හෝ වේවා, මම අද විශේෂයෙන්ම දෙයක් කියනවා. 2018 අගෝස්තු 08 වැනි දා warrant එකක් නිකුත් කරලා තිබෙනවා, සහරාන් අත්අඩංගුවට ගන්න කියලා. හැබැයි, එසේ තිබියදී ඒ කාලයේ හිටපු ආරක්ෂක ලේකම්තුමා - ප්‍රේමසිරි නේද? නැහැ, එතුමාට කලින් හිටපු එක්කෙනා? 2018 අගෝස්තු 08 වැනි දා, ඒ කියන්නේ සහරාන් අත්අඩංගුවට ගත යුතුයි කියලා කියපු කාලයේ හිටපු ආරක්ෂක ලේකම්තුමා හරියට රාජකාරිය සිද්ධ කළා නම්, වර්තමාන ආරක්ෂක ලේකම්තුමාට මේ විධියේ වැරැද්දක් පැටවෙන්නේ නැහැ. කපිල වෛද්‍යරත්න. කපිල වෛද්‍යරත්න ආරක්ෂක ලේකම්තුමාගේ කාලයේ සහරාන් අත්අඩංගුවට ගන්න කියලා කීප සැරයක් කිව්වා. ඒ වාගේම බුද්ධි අංශයේ ප්‍රධානියාත් ජනාධිපතිතුමාගේ ගජ මිතුරෙක්. බුද්ධි අංශයේ ප්‍රධානියා දවසකට තුන් හතර වතාවක් ජනාධිපතිතුමාත් එක්ක දුරකථනයෙන් කථා කරනවා කියලා කියනවා. අපි නොවෙයි එහෙම කියන්නේ. හේමසිරි ප්‍රනාන්දු මැතිතුමාත්, පොලිස්පතිතුමාත් එදා විශේෂ කාරක සභාවට ඇවිල්ලා ඒ සම්බන්ධයෙන් සාක්ෂි දුන්නා. එහෙම නම්, අප්‍රේල් 21 වැනි දා මේ වාගේ දෙයක් වෙන්න තිබෙනවා කියන එක පළමුවෙන්ම එතුමන්ලා දන්වන්නේ ජනාධිපතිතුමාටයි. ජනාධිපතිතුමා මොකක්ද කළේ? මම එක වතාවකත් මේක කිව්වා. එක්කෝ එතුමා මේක වෙන්න දීලා බලාගෙන හිටියා. එතකොට අග්‍රාමාත්‍යතුමාගේත්, කැබිනට් මණ්ඩලයේත් තිබෙන නොහැකියාව නිසා මේක වුණාය කියලා එතුමාට අත් දෙක පිහදාගන්න පුළුවන්. නමුත් එතුමාට ඒක පාරාවළල්ලක් විධියට කැරකුණා. එහෙම නැත්නම් හැම දාම වාගේ එතුමා එදාත් ඒක ගණන් ගත්තේ නැහැ. ඒක තමයි වුණේ. එතුමා සාමාන්‍යයෙන් කිසි දෙයක් ගණන් ගන්නේ නැහැ. මේ ළඟදි මගේ මිත්‍රයෙකුට කියලා තිබෙනවා, "ඕක ගණන් ගන්න එපා මචං, අද වෙච්ච දේ ඊ ළඟ දවසේ මිනිසුන්ට මතක නැහැ. ඒ හින්දා ඊළඟ සැරේත් මමයි ජනාධිපති" කියලා. දැන් ආරංචියක් තිබෙනවා, එතුමා යම් කිසි තැනක කියලා තිබෙනවා, එතුමාට ජනාධිපති අපේක්ෂකත්වය දෙනවා කියලා මහින්ද රාජපක්ෂ මැතිතුමා පොරොන්දු වුණු බව. අපි ඉතා ආසාවෙන් බලාගෙන ඉන්නවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා එතුමාට ජනාධිපති අපේක්ෂකත්වය දීලා එතුමා ජනාධිපතිවරණයට තරග කරන්න එනතෙක්. ඒ සඳහා එතුමාට අපි ආරාධනා කරනවා. එහෙම වුණොත් ඉතින් පොහොට්ටුවට දෙවියන්ගේම පිහිටයි කියන එකත් මේ වෙලාවේ කියන්න ඕනෑ. ඒ වාගේම අබ සරණයි කියන එකත් මේ වෙලාවේ කියන්න ඕනෑ.

ඒ වාගේම, ජනාධිපතිතුමා විසින් පත් කළ කාරක සභාවට කිසිම විධියේ වලංගුතාවක් නැහැයි කියන එකත් පසුගිය දා තීරණයක් දුන් විනිසුරුතුමියගේ submission එකේ, එතුමියගේ ප්‍රකාශයේ පැහැදිලිව තිබෙනවා. මේ විශේෂ කාරක සභාවලට, එහෙම නැත්නම් ජනාධිපතිතුමා පත් කරපු කමිටුවකට අදාළව එතුමියට තීරණයක් දෙන්න විධියක් නැහැයි කියලා එහි සඳහන් වනවා.

බොහෝ දෙනෙක් මට දොස් කියනවා, "වෙන්න මැන්ඩෙලා" මැතිතුමාට මම නිරන්තරයෙන් දොස් කියනවාය කියලා. මම එහෙම දොස් කියනවා නොවෙයි. සමහර විට එතුමා ගැන හෝ මේ පිළිබඳව මම කථා කරන අවසාන අවස්ථාව මෙය වෙන්න පුළුවන්. මට කියන්න තිබෙන්නේ මේකයි. අපට ලොකු කනගාටුවක් තිබෙනවා. විමල් වීරවංශ මැතිතුමනි, ඒ දවස්වල - 2015 දී- ඔබතුමා අපට අනන්ත කිව්වා, මේ වැඩේ කරන්න එපා කියලා. මට ඒ ගැන කනගාටුවක් තිබෙනවා. මොකද, එතුමා වෙනුවෙන් මම එළියට බැහැලා විශාල කර්තව්‍යයක් කළා. එහෙම කරලා එතුමා රටේ ජනාධිපති කළා. අද මට කාලය අවුරුදු හතරහමාරක් පිටුපසට යවන්න පුළුවන් නම්, සමහර විට අද මගේ තීරණය වෙනස් වන්න පුළුවන්. හැබැයි, මෙහිදී එක හොඳ දෙයක් වුණා. ඒ තමයි, අපි බලාපොරොත්තු වුණු යහ පාලනය තුළින්

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

යම්තාක් දුරකට නීතියේ ආධිපත්‍ය වැනි සමහර දේවල් අපි ගොඩනැඟුව එක. මට කියන්න තිබෙන්නේ අපට මෙහෙම නම්, ඔබතුමන්ලාට කොහොම කරයිද කියලායි. එතුමා එක සැරයක් ඔබට කොකා පෙන්වූවා, ඊ ළඟට අපට කොකා පෙන්වූවා, දැන් නැවතත් ඔබට කොකා පෙන්වනවා. එම නිසා ඔබතුමන්ලා බොහොම පරිස්සමෙන් කටයුතු කරන්න කියන එකත් මම කියනවා.

මේ වෙලාවේ එස්.බී. දිසානායක මැතිතුමා මා දිහා ඔරවා ගෙන බලාගෙන ඉන්නවා. මට තව එක කාරණයක් කියන්න තිබෙනවා. ජනාධිපතිතුමාත් එක්ක ඉන්න හැම කෙනාටම මම එක දෙයක් කියන්න ඕනෑ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේ වෙලාවේ නිවෙන දැල්වෙන පහනක් වාගේයි. නිවෙන දැල්වෙන බල්බ් එකක් වාගේයි. හෙට-අනිද්දා වනකොට ඒ බල්බ් එකේ fuse යනවා. ඒ හින්දා දැන් දැන්ම තමන්ගේ ඊ ළඟ පාර්ලිමේන්තු සීට් එක ආරක්ෂා කර ගන්න, දිගටම බල්බ් එක දැල්වෙලා තිබෙන තැනකට ගිහිල්ලා රොක්වන්න කියලා ඔබතුමන්ලාට ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development, Wild Life and Christian Religious Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතු ය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

[අ.භා.5.19]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කෙටි කාලයක් හෝ ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වනවා. ජනතා විමුක්ති පෙරමුණ විසින් ගෙනෙන ලද මේ විශ්වාස භංග යෝජනාව සද්භාවයෙන් ගෙනාවා නම්, අප සියලුදෙනාටම විපක්ෂයක් හැටියට සතුටුවන්න පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණ හෝ ඊට සම්බන්ධ සියලුදෙනා මේ යෝජනාව තුළින් හෘදය සාක්ෂියට විරුද්ධව යම් දෙයක් කරනවා නම්, ඒක අප සියලුදෙනාටම කරන අගෞරවයක් කියලා මම හිතනවා.

මේ තුළින් අපට දේශපාලන වශයෙන් යමක් කර ගන්න පුළුවන් වෙයි කියා මා හිතන්නේ නැහැ. මොකද අද මේ රට ආර්ථික, සමාජයීය හා දේශපාලන වශයෙන් සම්පූර්ණයෙන්ම කඩා වැටිලායි තිබෙන්නේ. විදුලිය කපනවා, භාණ්ඩාගාරය ඒක දන්නේ නැහැ. මහ රෑට පවා විදුලිය කපනවා. වුවමනා වෙලාවට විදුලිය නැහැ. ජනාධිපතිතුමා එක දෙයක් කරනවා, අගමැතිතුමා තවත් දෙයක් කරනවා. රටේ පාලනයක් ඇත්තේ නැහැ. පොලිස්පතිතුමා එක දෙයක් කරනවා, ආරක්ෂක ලේකම්වරයා තව දෙයක් කරනවා. මේ රටම අංජබජල් තැනකට ගෙනියලා තිබෙන්නේ. මෙය, ජනතා විමුක්ති පෙරමුණ සද්භාවයෙන් ගෙනා යෝජනාවක් නම් අපි බොහොම සතුටු වෙනවා. ඔබතුමන්ලාත් යම්කිසි බලවේගයක් නියෝජනය කරන, මේ රටේ දේශපාලන ධාරාවේ ඉන්න පිරිසක්. ඒ නිසා තමුන්නාන්සේලා සියයට සියයක් ප්‍රතික්ෂේප කරගෙන මේ කටයුත්ත කරන්න බැහැය කියන එක තමයි මගේ පෞද්ගලික මතය වන්නේ. විපක්ෂයක් හැටියට අප ප්‍රධාන සතුරාට පහර දෙනවා නම්, අප සියලුදෙනා එක කඳවුරකට පැමිණිය යුතුයි.

ජනාධිපතිතුමා පත් කරන්න ඡන්දය දීලා, ආසනයත් දිනාගෙන වැඩ කළ කෙනෙක් මම. මෙතැනදී ජනාධිපතිතුමා ගැන කඳුළු හෙළන බොහෝ පිරිසක් එතුමාට ඡන්දය දීලා නැහැ; එතුමා වෙනුවෙන් වැඩ කර නැහැ. ඒ නිසා, මට නම් ජනාධිපතිතුමා විවේචනය කරන්න පුළුවන්. එතුමාට පක්ෂව ඡන්දය දෙන්නත් පුළුවන්, විරුද්ධව ඡන්දය දෙන්නත් පුළුවන්. නමුත් ජනාධිපතිතුමා සමඟ මීට පස්සේ මගේ කිසිම සම්බන්ධයක් නැහැ. මොකද, අවුරුදු හතරහමාරක් තිස්සේ ජනාධිපතිතුමා විනාශයක් මිසක්, මේ රටේ කළ දෙයක් නැහැ. අප නම් පාරේ බස් එකේ තමයි යන්නේ. අප ඉස්කෝලේ ගියේ පයින්. අප තවමත් කුඹුරේ ඉන්න මිනිස්සු. මේ රටේ අගමැතිවරයා කවදාවත් බස් එකක ගිහින් නැහැ. එතුමා කවදාවත් පයින් ගිහින් නැහැ. එතුමාට සරමක් ඇඳගෙන යන්න අමාරුයි. මොකද, සරම කැඩිලා බිමට වැටෙයි. එතුමන්ලා මේ රටට සුදුසු නැති පාලකයෝයි. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ, මේ සියලු දෙයට ඔරොත්තු දෙන පක්ෂයක්. ඒ නිසා මම තමුන්නාන්සේලාට දෝෂාරෝපණය කරන්නේ නැහැ. දෝෂාරෝපණ කර කර ඉන්න නොවෙයි, පක්ෂ නායකයන්ට මේ අවස්ථාව ලැබිලා තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මෙතැනදී තමුන්නාන්සේලාගේ යම්කිසි යටි අදහසක් තිබෙනවා නම් ඒක වැරැදියි. මහින්ද රාජපක්ෂ මහත්මයා, තමුන්නාන්සේලා ගෙනාපු මේ යෝජනාවට ඡන්දය දෙන්න තමන්ගේ මන්ත්‍රීවරුන් 97 දෙනාටම එන්න කියලා, කවුරු හෝ එක් මන්ත්‍රීවරයෙක් අඩු වුණොත්, "මහින්ද මහත්මයා තමයි මේක පැරැද්දුවේ" කියලා කියන්න තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නවාද කියා මම දන්නේ නැහැ. එහෙම නම්, මේක තමුන්නාන්සේලා සද්භාවයෙන් ගෙන ආ යෝජනාවක් නොවෙයි. එන ජනාධිපතිවරණයේදී බොහොම

පැහැදිලිවම අපි ජනාධිපතිවරයා ගැන නොවෙයි විශ්වාසය තබන්නේ. හැබැයි, මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති කරන programme එකේ තමයි මම නම් ඉන්නේ.

තමුන්නාන්සේලා අපි නොහිතපු වෙලාවකදී පළාත් පාලන මැතිවරණය පැවැත්වූවා. ඒ ඡන්දයේදී එක්සත් ජාතික පක්ෂයට සමහර තැන්වල තුන්වන, හතරවන ස්ථානයයි හිමි වුණේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පහ නැත්නම් හයවැනි තැන තමයි ලැබුණේ. රටේ පළාත් පාලන මැතිවරණයේදී මෙන්න මේ බලවේගය ඉස්මතු වුණා. ඒ මැතිවරණ ප්‍රතිඵලවලින් අපට මොකක්ද පැහැදිලි වුණේ? කවදාවත් ඡන්දයක් ඉල්ලා නැති අය ඒ ඡන්දයෙන් දිනලා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු බවට පත් වුණා. මන්ත්‍රීවරයා කවුද කියා තවම අඳුරන්නේවත් නැහැ. ජනතාව මහින්ද රාජපක්ෂ මහත්මයාටයි ඒ ඡන්දය දුන්නේ, එතුමා අගමැති කරන්න කියලා. එන ජනාධිපතිවරණයේදී තමුන්නාන්සේලා ජනාධිපති අපේක්ෂකයා ලෙස කවුරු ඉදිරිපත් කළත්, ඒ ජනාධිපති අපේක්ෂකයාට නොවෙයි, මහින්ද රාජපක්ෂ කියන නාමයටයි අප ඡන්දය දෙන්නේ කියන කාරණයත් මා මතක් කරන්න කැමැතියි.

"අප නීතියේ ආධිපත්‍යය පැතිරෙව්වා" කියා තමුන්නාන්සේලා කියනවා. ඊළඟට, සමානාත්මතාව ඇති කළාය කියනවා. මේ ඔක්කෝම හදන්න රටක් තිබෙන්න ඕනෑ නේ. අපේ රටට අයිති මුහුදෙන් තුනෙන් දෙකක කොටසක් අපට නැතිවයි තිබුණේ. රටෙන් තුනෙන් එකක් අපට නැතිවයි තිබුණේ. එහෙම තිබුණු මේ රට එක් සේසත් කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමායි.

ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමනි, තමුන්නාන්සේ ළඟ හොඳ ගතිගුණත් තිබෙනවා. වැරදි ගතිගුණත් තිබෙනවා. අපේ හාමුදුරුවෝ හොඳ දේත් කරනවා. වැරදි දේත් කරනවා. වැරැද්ද දැකපු තැන, ඒක වැරදියි කියපු කෙනෙක් මම. කුළල් කාගෙන අපිට මේ රටේ මේ දේශපාලන ධාරාව ගෙන යන්න බැහැ. මෙහි සිටින මුස්ලිම් මිනිස්සු නැති කරන්න බැහැ; දෙමළ ජාතිය නැති කරන්න බැහැ. ඒ අය චිරාත් කාලයක් තිස්සේ අපිත් එක්ක සිටියා. ඒ නිසා ඒ අය සමඟ අපි බොහොම සුහදත්වයෙන් කටයුතු කළ යුතුයි.

ජනතා විමුක්ති පෙරමුණ ගෙනැවිත් තිබෙන මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව අපි ඡන්දය දෙනවා. ඒ වාගේම දෙමළ ජාතික සන්ධානයේ, ගහක් ගලක් වාගේ නොසැලී ඉන්න අපේ මන්ත්‍රීවරයෙකුත් ඉන්නවා. එතුමාත් අපිත් එක්ක එකතු වෙයි කියා මට විශ්වාසයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. Hon. Member, please wind up your speech now.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මට තව සුළු වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතුමාත් අපට එකතු වෙයි කියන විශ්වාසය තිබෙනවා. [බාධා කිරීම්] තමුනාන්සේලා මොනවා කිව්වත්, කොයි තරම් කෑ ගැහුවත්, මන්ත්‍රීකම නැති කළත් විපක්ෂය සමඟ එකතු වෙලා මම මේ යෝජනාවට පක්ෂව ඡන්දය දෙනවා. විපක්ෂය සමඟ මම හිටගෙන අවසානයි. තමුන්නාන්සේලා මොන දේවල්, මොන වරදාන දෙන්න කථා කළත්, අපි විපක්ෂයේ ඉඳගෙන එක හඬින් කථා කරලා, තමුන්නාන්සේලාට විරුද්ධ වෙලා තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුව ගෙදර යවන්න කටයුතු කරනවාය කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි. [බාධා කිරීම්]

[අ.භා.5.25]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම, අප්‍රේල් 21වන දා වූ සිදුවීමෙන් මිය ගිය අයගේ පවුල්වල අයට සහ එම සිද්ධියෙන් රෝගාතුර වූ සියලුදෙනාටම මගේ කනගාටුව ප්‍රකාශ කර සිටිනවා. ඒ සිද්ධිය නිමිති කරගෙන, ආණ්ඩුවටත්, කැබිනට් මණ්ඩලයටත්, අග්‍රාමාත්‍යවරයාටත් විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කර තිබෙන විශ්වාස භංග යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

අවාසනාවට, මෙම ජාත්‍යන්තර ත්‍රස්තවාදී දැලට හසුවීම නිසා අපේ රටටත්, ජනතාවටත් විශාල හානියක් සිදු වුණා. එක පැත්තකින් එහිදී ජීවිත ගණනාවක් විනාශ වුණා. ඒ වාගේම, රටක් හැටියට අපට තිබෙන ලොකුම සම්පතක් හැටියට සැලකෙන සංචාරක ක්ෂේත්‍රයටත් තවත් ක්ෂේත්‍ර ගණනාවකටත් මේ තුළින් විශාල හානියක් වුණා. මෙවැනි සිදුවීමක් වුණේ, එක පැත්තකින් දේශපාලන නායකත්වයේ තිබුණු අඩු පාඩු නිසාද, එහෙම නැත්නම් අපේ ආරක්ෂක අංශවල, බුද්ධි අංශවල තිබුණු අඩු පාඩුවක් නිසාද කියන එක අපට ලොකු ගැටලුවක්. මට හිතෙන විධියට නම් දෙපැත්තෙන්ම ලොකු අඩු පාඩුවක් සිදු වෙලා තිබෙනවා. ඒකට දේශපාලන නායකත්වයත් වග කියන්න ඕනෑ. ඒ වාගේම ආරක්ෂක අංශවලින් -විශේෂයෙන් බුද්ධි අංශවලින්- වූ අඩු පාඩුවකුත් මේ සිදුවීමට විශාල වශයෙන් බලපෑවා. ඇත්තටම අපට ඉන්දියාවෙන් තමයි ඒ තොරතුරු ලැබුණේ. [බාධා කිරීමක්] ඔව්, ගරු මන්ත්‍රීතුමනි. රටක් හැටියට ඒ වාගේ අඩු පාඩු රාශියක් අප අතින් සිදු වෙලා තිබෙනවා. හැබැයි, ISIS සංවිධානය අපේ රටේ විතරක් නොවෙයි මේ විධියට ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. දකුණු ආසියාව ගත්තොත්, ඉන්දියාව, පාකිස්තානය, ඇෆ්ගනිස්තානය වැනි රටවල මේ ISIS ත්‍රස්තවාදය නිසා බරපතළ සිදුවීම් වෙලා තිබෙනවා. නැඟෙනහිර ආසියාව ගත්තොත්, ඉන්දුනීසියාව, මලයාසියාව වැනි රටවලත්, ඒ වාගේම සංවර්ධිත, දැඩි ආරක්ෂාවක් තිබෙන, ආරක්ෂක අංශ තුළ වැඩිම තාක්ෂණයක් තිබෙන, ආරක්ෂාව වෙනුවෙන් වැඩිම මුදල් ප්‍රමාණයක් වියදම් කරන ඇමෙරිකාව, මහා බ්‍රිතාන්‍යය, ජර්මනිය වැනි ප්‍රධාන රටවලටත් මෙම ISIS සංවිධානයේ ප්‍රහාර එල්ල වෙලා තිබෙනවා. නමුත්, එවැනි අවස්ථාවකින් පසුව මේ එක රටක්වත් දේශපාලන වාසියක් ලබා ගත්ත අවස්ථාවක් ගැන මම දන්නේ නැහැ. එක්කෙනෙක් කිව්වා, "මම හිටියා නම් එහෙම වෙන්නේ නැහැ" කියලා. "මම ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනවා, මේ වාගේ දෙයක් යළි ඇති නොවෙන්න" කියලා තවත් කෙනෙක් කිව්වා. මේ විධියට, මේ සිද්ධිය හරහා දේශපාලන වාසියක් ලබා ගන්න උත්සාහ කළ කණ්ඩායමක් එක පැත්තකින් හිටියා. තව පැත්තකින්, ජාතිවාදය, ආගම්වාදය අවුස්සලා, එය ඊළඟ ජනාධිපතිවරණයට ප්‍රයෝජනවත් වන ආකාරයට උපයෝගි කරගන්න උත්සාහ කළ, ඒ විධියට හැසිරුණු තව කණ්ඩායමක් හිටියා. මෙවැනි අවාසනාවන්ත සිදුවීමක් වෙලා තිබෙන අවස්ථාවක, අපි හැමෝම එකතු වෙලා සහයෝගයෙන්, මෙතැනින් ඉදිරියට යන්නේ කොහොමද කියන එක හිතලා කටයුතු නොකිරීම ඉතාම කනගාටුදායකයි.

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

මොන දේශපාලනය කරන්නත්, මොන මැතිවරණය පවත්වන්නත් අපට රටක් ඉතිරි වෙන්න ඕනෑ. ජාත්‍යන්තර ත්‍රස්තවාදයට ලක් වූ රටවල් දිහා බැලුවාම, ඒ එක රටකවත් පවතින ආණ්ඩුවට විරුද්ධව මේ විධියට විශ්වාස භංග යෝජනා ගෙනැත් තිබෙනවාය කියලා මම නම් හිතන්නේ නැහැ. ඔවුන් එහෙම ගෙනැල්ලා නැහැ. ඒ ආණ්ඩු කණපිට හරවලා, වෙන කෙනෙක් ඒ රටවල අගමැති කරවන්න උත්සාහ කරලාත් නැහැ. ඒ අවස්ථාවලදී විපක්ෂය සහ ආණ්ඩු පක්ෂයේ සියලුදෙනා එකතු වෙලා, ත්‍රස්තවාදයට එරෙහිව කටයුතු කර තිබෙනවා. මේ ත්‍රස්තවාදයට, යූඑන්පී එකද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද, ජේවීපී එකද, පොහොට්ටුවද කියන කාරණය අදාළ වෙන්නේ නැහැ. මේ සියලුදෙනාටම විරුද්ධව තමයි ත්‍රස්තවාදය ක්‍රියාත්මක වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මේ ත්‍රස්තවාදය අපේ රටෙන් තුරන් කර ඉදිරියට යන්න අපි සියලුදෙනා එකතු වෙන්න ඕනෑ. මෙතැනදී දේශපාලන කෝණයෙන් බලා අපි තවතවත් ඈත් වෙන්නේ නැතුව කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම මේ රටේ ශක්තිය වෙන්නේ, සිංහල බෞද්ධ වන අපට මුස්ලිම් ජනතාවට, කතෝලික ජනතාවට, ද්‍රවිඩ ජනතාවට හා හින්දු ජනතාවට එක හා සමානව සලකන්න පුළුවන් නම් පමණයි. මේ සිද්ධිය වෙලා දැනට මාස දෙකක්, තුනක් ගත වුණත් මේ සියලුදෙනා එකතු කරගෙන ශ්‍රී ලාංකිකයන් හැටියට ඉදිරියට යන්නට අපට තවම හැකියාවක් ලැබිලා නැහැ. මේ විශ්වාස භංග යෝජනාව පරාජය කරලා අපට ජයග්‍රහණය කරන්න පුළුවන් කියන ලොකු විශ්වාසයක් තිබෙනවා. ඊට පස්සේ හෝ මේ රට ඉදිරියට ගෙන යන්න අපිත් එක්ක එකතු වෙන්න එන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා.5.31]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණට මේ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න සිද්ධ වුණේ, පසුගිය අප්‍රේල් 21 වන දා ඇති වුණු ත්‍රස්තවාදී ප්‍රහාරය නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 21 වන දා මඩකළපුව දේවස්ථානයේ වූ සිදුවීමෙන් අනතුරුව ලක් වූ අවුරුදු 22ක තරුණ කාන්තාවක් අද රාගම රෝහලේදී මිය ගියා. බෝම්බ ප්‍රහාරය වෙලා දැනට මාස තුනක් වෙන්න එනවා. ඒ ප්‍රහාරය හේතුවෙන් මේ වනකොටත් ජීවිත නැති වෙනවා. ආණ්ඩුව එක වරක් කිව්වා, තුන්සිය ගණනක් මිය ගිහින් තිබෙනවාය කියලා. ඊට පස්සේ ආණ්ඩුව ඒ මිය ගිය සංඛ්‍යාව දෙසිය ගණනට අඩු කළා. දැනටත් මිය යන අයත් එක්ක බැලුවාම හරියාකාර ගණනක් ආණ්ඩුවට කියන්නත් බැහැ. ඒ නිසා මේ ප්‍රහාරයේ වගකීම ආණ්ඩුව භාර ගන්න ඕනෑ. ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ කැබිනට් මණ්ඩලය තමයි මේ ආණ්ඩුව. මේ ප්‍රහාරය ගැන විතරක් නොවෙයි, තවත් චෝදනා රාශියක් මේ ආණ්ඩුවට විරුද්ධව තිබෙනවා. මේ ආණ්ඩුව ජාතික ආරක්ෂාව දුර්වල කළා. ඒ වාගේම ආර්ථිකය කඩා වට්ටවා තිබෙනවා. රටේ මහ බැංකුව කොල්ල කන්න ඉඩ දුන්නා. ඒ වාගේම අද ගොවි ජනතාව අසරණවෙලා ඉන්නවා. මෙවැනි කරුණු කාරණා රාශියක් තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවාම ආණ්ඩුව ආරක්ෂා කරන්න එක පිරිසක් කටයුතු කරනවා.

රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා විනාඩි 20ක් මේ ගරු සභාවේ කථා කළා. අපි දන්නවා, පසුගිය ප්‍රහාරය සිදු වී දවස් 21ට පස්සේ සිද්ධියක් වුණාය කියලා. එතුමා කථා කළ ඒ විනාඩි 20 තුළ එතුමා කියනවා, "ඒ සිද්ධි සිදු වනකොට හමුදාව බලාගෙන සිටියා; පොලීසිය බලාගෙන සිටියා. අපේ මිනිසුන්ගේ කඩ ගිනි තැබුවා. ගෙවල් 800ක්, 900ක් පිච්චුවා. එක් කෙනෙක් මැරුණා. මේකට ආණ්ඩුව වග කියන්න ඕනෑ"යි කියලා. ඒකට වග කියන්න ඕනෑ, එතුමා වාඩිවෙලා ඉන්න පැත්තේ අය තමයි. මේක එතුමන්ලාගේ ආණ්ඩුව. පොලීසියට, හමුදාවට නියෝග දෙන්නේ එතුමන්ලා. එතකොට ඒ වගකීම පැහැර හැරියේ කවුද? මුස්ලිම් ජනතාවට ගැහුවා නම්, මුස්ලිම් ජනතාව මැරුණා නම්, දේපොළවලට හානි වුණා නම් ඒ මුස්ලිම් ජනතාවට වග කියන්න ඕනෑ මේ ආණ්ඩුව. එදා මාවනැල්ලේ සිද්ධියක් වුණා. එදා ඒ සිද්ධිය වෙලාවේ අපේ ආණ්ඩුවට අත දික්කරලා කිව්වා, "ආණ්ඩුව මේකේ වගකීම භාර ගන්න" කියලා. ඊට පස්සේ අලුත්ගම සිද්ධියක් වුණා. එහිදීත් කිව්වා, "ආණ්ඩුව මේ වගකීම භාර ගන්න ඕනෑ" කියලා. හැබැයි අද මේ සිදුවීමේදී මුස්ලිම් ඇමතිවරු ආණ්ඩුවට දික්කරලා කියන්නේ නැහැ, ආණ්ඩුවට මේ වගකීම භාර ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා අන්තිමට කිව්වා, "මගේ හෘදය සාක්ෂියට විරුද්ධවයි මම මෙහිදී ඡන්දය දෙන්නේ" කියලා. එතුමා එතුමාගේ හෘදය සාක්ෂියට විරුද්ධව ඡන්දය දෙන්නේ ඇයි? එතුමා ආරක්ෂා කරලා තිබෙන්නේ ආණ්ඩුව තමයි. එතුමාම දන්නවා, ආණ්ඩුවේ වගකීම පැහැර හැරපු නිසා තමයි පසුගිය දවස්වල මුස්ලිම් ජනතාවට හිරිහැර සිද්ධ වුණේ කියලා. මුස්ලිම් ජනතාවගේ කඩ ගිනි තැබුවා නම්, ඒ අයට හිරිහැර වුණා නම් එහෙම වුණේ ආණ්ඩුවේ වගකීම පැහැර හැරපු නිසායි. ඒ නිසා එතුමාම පිළිගන්නවා, එතුමා ඉන්න ආණ්ඩුව ආරක්ෂා කරන්න අද ඡන්දය දුන්නත්, මේ ආණ්ඩුවේ වගකීම පැහැර හැරලා තිබෙනවාය කියලා. හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන්න බැරි නම් මේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩක් නැහැ. අපට මන්ත්‍රී ධුර නැති වුණත් අපි හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරනවා. හෘදය සාක්ෂියට විරුද්ධව ඡන්දය දෙනවාය කියන්නේ මුස්ලිම් ජනතාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරනවාය කියන එකයි. ආණ්ඩුව එතුමන්ලා ආරක්ෂා කළා. එහෙම ආරක්ෂා කරපු නිසා තමයි අද මේ ආණ්ඩුව ආරක්ෂා කරන්න එතුමන්ලා කටයුතු කරන්නේ. ආණ්ඩුවේ අගමැතිවරයා හැටියට අගමැතිතුමා මේකට වග කියන්න ඕනෑ. ඒ නිසා මේ ප්‍රශ්නයේදී කාටවත් ගැළවෙන්න විධියක් නැහැ කියලා අපි කියනවා. ඒ අයට ගැලවිලා යන්න විධියකුත් නැහැ. දැන් කියනවා, මේ මන්ත්‍රීවරු 225ම මේකට වගකියන්න ඕනෑ කියලා. අපි 21 වෙනි දාට කලින් මේ සිද්ධි ගැන යමක් කියලා තිබුණා නම්, එතකොට කිව්වා කොරහේ කිඹුල්ලු දකිනවා කියලා. පෙරේදා අගමැතිතුමා කියනවා, "SOFA එක, ඇතුළු වෙන එකක්වත් අත්සන් කරලා නැහැ. මේ ගොල්ලන් නැති බිල්ලෝ මවනවා" කියලා. අපි යමක් කියලා තිබුණා නම්, එතකොට කියනවා නැති බිල්ලෝ මවනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි දැන ගත්ත දෙයක් වුණත් අද කියන්න භයයි. ඒකට හේතුව තමයි ඒ දේ සිද්ධ වුණේ නැත්නම් එහි වගකීම අපට ගන්න වෙන එක. අපේ රටේ තියෙන බුද්ධි අංශයට වඩා අද ඉන්දියාවේ ඔත්තු සේවය බලවත් වෙලා තිබෙනවා. ඇයි ඒ? මේ තොරතුර ඉන්දියාවෙන් දීපු තොරතුරක්. අපේ අය හොයා ගත්ත තොරතුරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අපේ බුද්ධි අංශයෙන් වැඩක් තියෙනවාද? වැඩක් නැහැ. මොකද, අපේ අයට ඉන්දියාවෙන් කියපු දේවත් හරියට ක්‍රියාත්මක කරගන්න බැරි වුණා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අද සුළුතර ආණ්ඩුවක්.

තමුන්නාන්සේලා පුළුවන් නම් 113ක් අරගෙන මේ විශ්වාස භංග යෝජනාව දිනලා පෙන්වන්න කියා අභියෝග කරනවා.

අපි ඉතා ඉක්මනින් ජනතාවාදී රජයක් බලයට පත් කරන බව කියමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[பி.ப. 5.37]

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, அரசாங்கத்திற்கு எதிரான நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டு நேற்றும் இன்றும் அது தொடர்பான விவாதம் இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. இந்த விவாதத்திலே கலந்து கொண்ட சகலரது உரைகளையும் நான் செவிமடுத்துக் கொண்டிருந்தேன். இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்ததிலிருந்தே ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பினருக்கு அரசாங்கத்தின்மீது நம்பிக்கை இல்லாமல் போயிருக்கின்றது. இந்த அரசாங்கத்தை அவசர மாகப் பதவி கவிழ்த்துவிட்டு, தாங்கள் ஆட்சிக்கு வர வேண்டும் என்ற முனைப்பிலே அவர்கள் தொடர்ந்தேச்சியாகச் செயற்பட்டுக் கொண்டிருக்கின்றார்கள். ஆகவே, அவர்க ளுடைய ஏற்பாடாகவே இந்த நம்பிக்கையில்லாப் பிரேரணையை நான் பார்க்கிறேன். அதாவது, மக்கள் விடுதலை முன்னணியினால் இந்தப் பிரேரணை கொண்டுவரப்பட்டாலும் அதன் ஏற்பாட்டாளராக ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பையே நான் பார்க்கிறேன்.

உண்மையிலே, தாங்கள் இழந்த ஆட்சியை மீண்டும் அவசரமாகக் கொண்டு வந்து ஆட்சி அதிகாரத்தில் இருக்க வேண்டும் என்பது மாத்திரமே அவர்களின் எண்ணமாக இருக்கின்றது. ஆனால், அவர்கள் நம்பிக்கொண்டிருக்கின்ற பெரும்பான்மை பௌத்த மக்கள்கூட அவர்கள் தொடர்பில் அச்சம் கொண்டிருக்கின்றார்கள். வெறுமனே இனவாதத்தைத் தூண்டி, மக்கள் மத்தியிலே குழப்பங்களை ஏற்படுத்தி, சிறுபான்மையின மக்களை அடக்குமுறைமுலம் ஆட்டிப் படைத்து அதிகாரம் செலுத்தலாம் என்று அவர்கள் செயற்பட முனைவது பெரும்பான்மைச் சிங்கள மக்கள் மத்தியில் அச்சத்தை ஏற்படுத்தியிருக்கின்றது. பௌத்த தர்மத்தின்படி வாழும் பெரும்பான்மை இனப் பௌத்த மக்கள் அமைதியை விரும்புகின்றவர்கள். அமைதியின்மை எந்தவகையிலும் உதவாதது என்பதை அவர்கள் விளங்கியிருக்கிறார்கள். இன முறுகலைத் தொடர்ந்தேச்சியாக ஏற்படுத்தி, இனவாதத்தைத் தூண்டி, சிறுபான்மை இன மக்களை அடக்குமுறைமூலம் மிகக் கடுமையாக நடாத்தி, அவர்களுடைய உரிமைகளைப் பறித்து, அவர்களுடைய வாழ்விடங்களைத் தாக்கி, நிம்மதியற்ற சூழ்நிலைக்குள் அவர்களைக் கொண்டு சென்று ஆட்சி நடத்தினால், அந்த ஆட்சி எல்லோருக்கும் குந்தகமாக அமையும் என்பதை அவர்கள் உணர்ந்திருக்கின்றார்கள். கடந்த 30 வருட கால யுத்தத்தின்போது அதை அவர்கள் மிகத் தெளிவாக உணர்ந்திருந்தார்கள். அவ்வாறு இருக்கிற சூழலிலே, நீங்கள் உங்களுடைய தற்போதைய செயற்பாடு களைச் சற்று மாற்றிச் செயற்பட்டுக் கொண்டு மீண்டும் அதிகாரத்துக்கு வருவது பற்றி ஏன் சிந்திக்கக்கூடாது? என்று எதிர்க்கட்சி உறுப்பினர்களிடம் நான் விநயமாகக் கேட்க விரும்புகின்றேன். நீங்கள் நாட்டை நேசிக்கின்றவர்களாக இருந்தால், உண்மையான தேசப்பற்றுடையவர்களாக இருந்தால், அவற்றுக்கு எந்தத் தாக்கமும் ஏற்படாத வகையில் அதிகாரத்துக்கு வருவது பற்றியே யோசிக்கவேண்டும்.

அண்மையில் நடந்த அனர்த்தங்கள் தொடர்பில் நாங்கள் எல்லோருமே அச்சப்பட்டோம்; பயந்திருந்தோம். இந்த நாட்டிலே மீண்டும் பயங்கரவாதம் தோன்றி, அதன் தாக்கத்தி லிருந்து எங்களால் நீண்ட காலத்திற்கு மீளமுடியாமல் போய்விடுமோ என்று அச்சம் கொண்டிருந்தோம். ஆனால், குறுகிய காலத்திலேயே அமைதி ஏற்பட்டது. அந்த அமைதியைக் கொண்டுவருவதற்கு ஒட்டுமொத்த முஸ்லிம் சமுதாயம் உதவியிருக்கின்றது. அந்த வகையில் சம்பந்தப்பட்டவர்களைக் கைது செய்வதற்கும் முஸ்லிம் சமூகத்தினர் உதவியிருக்கின்றார்கள். மென்மேலும் அனர்த் தங்கள் இடம்பெறாமல் தடுப்பதற்குத் தேவையான நடவடிக்கைகளை மேற்கொள்வதற்கு அவர்களால் சாதகமான தகவல்கள் வழங்கப்பட்டிருக்கின்றன. ஆனால், சில உறுப்பினர்கள் ஒட்டுமொத்த முஸ்லிம் சமுதாயத்தையும் மிக மோசமான பயங்கரவாதிகளாகச் சித்தரிக்கின்ற நிலைமை காணப்படுகின்றது. அதை நான் மிக வன்மையாகக் கண்டிப்பதோடு, ஆட்சேபனையும் தெரிவித்துக் கொள்கின்றேன். இவர்களின் வேலைத்திட்டத்துக்கு கௌரவ பாராளுமன்ற உறுப்பினரான எங்களுடைய சங்கைக்குரிய அத்துரலியே ரதன தேரர் அவர்கள் பயன்படுத்தப் பட்டிருக்கின்றார். அந்த வகையில் அவர் நேற்றுத் தெரிவித்த அதிக கருத்துக்கள் எங்களது ஆட்சேபனைக்குரியனவாகவே காணப்பட்டன. கொழும்பிலே முஸ்லிம் மாணவர்களை முக்கியமான சிங்களப் பாடசாலை களிலே அனுமதிக்கக் கூடாது என்ற அறிவுரையைச் சொல்லுகின்ற எங்களுடைய சங்கைக்குரிய அத்துரலியே ரதன தேரர் அவர்கள், முஸ்லிம் பெண்களுக்கு கல்வி மறுக்கப் படுவதாகவும் நேற்று இந்தச் சபையில் கவலை தெரிவித்தார். அதனை நகைப்புக்குரிய ஒரு விடயமாகவே நான் பார்க்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
Sir, please let me wind up in one minute.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Unfortunately, I cannot. Please wind up now.

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)

இந்த நாட்டிலே அண்மையில் உருவாகிய மோசமான நிலைமையைக் கருத்திற்கொண்டு, ஆட்கள் முகத்தை மறைக்கக்கூடாது என்ற சட்டத்திற்கு இசைந்து நடக்க நாங்கள் விரும்பி, அதற்கு ஆதரவளித்தாலும், முஸ்லிம் பெண்கள் அரைகுறை நிர்வாணமாக நடமாட வேண்டும் என்ற விதத்தில் கருத்துச் சொல்பவர்களும் இங்கே இருக்கின்றார்கள். இவ்வாறாகக் கருத்துத் தெரிவிப்பதைத் தவிர்த்து நாங்கள் எல்லோரும் இந்த நாட்டினுடைய பிரஜைகள் என்பதை உள்வாங்கிச் செயற்பட வேண்டும்; நாங்கள் எல்லோரும் ஒற்றுமையாக வாழ்வதற்கு ஏற்றவகையில் எங்களுடைய நிகழ்ச்சித்திட்டத்தை மாற்றியமைக்க வேண்டும். இந்த

[ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා]

நாட்டை நாங்கள் நேசிக்காவிட்டால், நிச்சயமாக சந்தோஷ கரமான - மகிழ்ச்சிகரமான ஓர் எதிர்காலத்தை எங்களுடைய அடுத்த சந்ததிக்குக் கொடுக்க முடியாது போய்விடும் என்று எச்சரித்து, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. Rajavarothiam Sampanthan.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Thank you, Mr. Presiding Member. Might I know how many minutes I have, Sir?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you have seven minutes.

[5.43 p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Sir, we are debating the Vote of No-Confidence against the current Government based on material relating to one event, the Easter Sunday Attack on 21st of April. There can be no question that the Government needs to be condemned, particularly on account of its failure to act despite information made available to the Government by a friendly, neighbouring country. But, we are concerned about the fact that governance is related to a wide range of issues.

One important question that does arise is what happens when the Government loses the confidence of the House. Under the Constitution, the Government must remit office. At the 2015 General Election, people changed the Government; they changed their President. There were several reasons for what has happened. There was a very, very serious violation of human rights in all parts of the country: civil and political rights, economic, social and cultural rights. That was the main reason for the people to bring about a change in the Government. The minority people, the Tamil people in particular, were largely victimized. They had a reason to vote the way they did. The position of the present Government is perhaps, on certain fronts, particularly human rights, better than under the former Government, may not be to our complete satisfaction, but certainly better. If the Government is to be changed and a new Government is to come to office, we do not know what the policies of the new Government are. The Hon. Mahinda Rajapaksa was the former President, former Prime Minister and currently, he is the Leader of the Opposition. He may try to come to office, but he has not outlined to the country and to the minority Tamil people in particular, what the policies of the new Government will be. There have been no enunciation of the proposed policies by the new Government. How can we take a decision consciously to bring down the present Government, which, as I said before, at least on the human rights front, is performing better than the previous Government? We have been sent to Parliament to protect the rights of our people.

A General Election is due, in any event, in a short time. All the people in this country will decide who will govern then. The Government, under the Constitution, has been elected for a certain period in office. Overall, are the circumstances such that we feel compelled to make a contribution that brings about a change in Government? That is the main question we have to address. Overall, are the circumstances of such a nature that we feel compelled to subscribe to bring about a change in Government? It is in these circumstances that we have to take a decision.

We have to be cautious. It is not that we do not have complaints against the present Government. We have several complaints against the present Government. In fact, this morning in front of my House in Trincomalee, there has been a demonstration by some youth who say "Mr. Sampanthan is unable to get jobs for us from this Government. Why is he supporting this Government? We want him today to vote against the Government." So, our people, our youth who have been victimized for decades on the question of employment are not receiving justice even under the present Government and that is the complaint that we are very concerned about.

Sir, we have nothing against the SLFP. As far as the UNP and the SLFP are concerned, those are the two main political parties in this country. As far as the SLPP is concerned, it is a new political party. We do not know their thinking; we do not know what their policies are. We have to wait and see. But, we must impress upon the leadership of the SLPP that they need to enunciate their policies, particularly on the minority question, the Tamil question, to the people of the country - particularly to the minority people and more particularly, to the Tamil people of the North and the East. We need to know what their policies are and that is what the SLPP has thus far failed to do. As far as the SLFP is concerned, we have supported SLFP presidential candidates against UNP candidates. We have supported the SLFP to bring down the UNP Government.

The late Hon. S.W.R.D. Bandaranaike was the first Sinhalese leader who signed an agreement - a pact - with a Tamil leader, the late Hon. S.J.V. Chelvanayakam to create regional councils, keep power over land and establish regional councils with sufficient adequate devolved power to enable them to govern the territories in which the Tamil people lived. We are mindful of all these, Sir.

Of course, we will be voting in a short while, we will make a decision and with divine assistance, we do hope that we will make the right decision.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you do have more time left, if you need.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

No, Sir.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Okay. Next, the Hon. Hector Appuhamy.

[අ.භා.5.50]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය වෙලාවේ කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරලා තිබෙන විශ්වාස භංග යෝජනාවේ තිබෙන කරුණුවලට කතෝලිකයෙකු හැටියට මට එකඟ වෙන්න සිදුවෙලා තිබෙනවා. හැබැයි, මේ කරුණුවලට එකඟ වුණාට, මේ කරුණුවලින් කළ යුතු කාර්යය මේකද කියන ප්‍රශ්නය ඊළඟට පැන නඟිනවා. මෙම කරුණු මේ ආකාරයෙන් රටේ සිද්ධ වුණාය කියන කාරණය මේ රටේ ඉන්න හැම දෙනෙකුම විවෘතව දන්නවා. හැබැයි, මේ ප්‍රශ්නය පැන නැඟුණේ වෙනත් ආකාරයකින්. මේ රටේ ගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ ආණ්ඩුවට සහ පක්ෂ - විපක්ෂ අප සියලුදෙනාට ආරක්ෂක අංශ සියල්ලගෙන්ම සහ බුද්ධි අංශවලින් මේ ත්‍රස්තවාදී ප්‍රහාරය සම්බන්ධව දැනගන්න ලැබුණේ මේ කරුණු කාරණා ඇතුළත් පණිවුඩයෙන් තමයි. මේ පණිවුඩය අලුත් එකක් නොවෙයි. දැන් ප්‍රශ්නය තිබෙන්නේ, මේ සිද්ධිය මේ ආකාරයෙන් මේ රටේ සිද්ධ වුණාය කියලා අපි සියලු දෙනාම දැන ගත්තත්, මේ විශ්වාස භංග යෝජනාව හරහා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී ඒ සම්බන්ධයෙන් මොනවාද කළ හැක්කේ කියන එකයි. උත්තරීතර පාර්ලිමේන්තුවේදී "මේ විශ්වාස භංග යෝජනාව ජයග්‍රහණය කරලා, මෙන්න මේ කණ්ඩායම තමයි ඊළඟට මේ රට පාලනය කරන්නේ, මෙයා තමයි අගමැති, මේ අය තමයි කැබිනට් මණ්ඩලය" කියලා ඔබතුමන්ලා මේ විශ්වාසභංග යෝජනාවත් එක්ක කරුණු කිව්වා නම් අපට මීට වඩා කතිකාවතකට යන්න තිබුණා.

ඔබතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරද්දී, 'පොහොට්ටුවේ' සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර අය මොනවාද කිව්වේ කියන කාරණයත් මතක තියා ගන්න. ඒ අය මොනවාද කිව්වේ? ආණ්ඩුව එළවලා ඒගොල්ලන්ට බලය ගන්න ඕනෑය කිව්වා. ජනතා විමුක්ති පෙරමුණේ ඔබතුමන්ලා විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළේ ඒ ගොල්ලන්ට බලය දෙන්න කියලාද? නැහැ. එතුමන්ලාට බලය දෙන්න නොවෙයි ඔබතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළේ කියලා අපි හොඳටම දන්නවා. ඔබතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළේ එතුමන්ලාට බලය දෙන්න නොවෙයි. එතුමන්ලාට බලය දෙන්න නොවෙයි නම්, මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරලා, අදහස් හුවමාරු කරගෙන, ඒ වෙනුවෙන් ඡන්ද පාවිච්චි කරලා අපට මොනවාද කළ හැක්කේ? ඒක තමයි ප්‍රධාන ප්‍රශ්නය. මේ විශ්වාස භංග යෝජනාව දිහා බලමින් මේ අය කෙළ හලන්නේ කොහොමද කියලා අපි දැක්කා. ඔබතුමන්ලා මේ විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කළාම සමහර අය කථා කරන ආකාරයත් මා දැක්කා.

ඒ ත්‍රස්ත ප්‍රහාරයෙන් මැරුණේ කතෝලික අහිංසක ජනතාව. ඒ ජනතාව විකුණාගෙන කන්න සූදානම් වෙන්න එපා. ඒ අය මැරුණු එකේ වගකීම අපි සියලුදෙනාම බාරගෙන, ඒ උවදුරෙන් මේ රටේ ජනතාව බේරා ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළ යුතුයි. හැබැයි, ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා වෙනුවට දැන් කරන්න බලාපොරොත්තු වන්නේ මොකක්ද? සහරාන් මුදල් දුන්නු අය ඇල්ලුවා. හැබැයි, සහරාන්ට මුදල් දුන්නු අය ඉන්නවා. සහරාන් පළමුවෙන්ම මේ රටේ හුරතලකු විධියට හදා ගත්ත කණ්ඩායමක් ඉන්නවා. හැබැයි, ඒ අය සම්බන්ධයෙන් කරන පරීක්ෂණ තවම ප්‍රමාදයි.

ජනතා විමුක්ති පෙරමුණේ සියලු සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටින්නේ මේ ත්‍රස්ත ප්‍රහාරයත් එක්ක රටේ සිද්ධ වෙච්ච විනාශය ගැන පරීක්ෂණ කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළට අපි සියලුදෙනාම සහයෝගය දෙමු කියලායි. ඒ සහයෝගය දීලා අපට අවශ්‍ය වෙන්නේ ආණ්ඩුව ඇතුළේ තනතුරු මාරු කරන එක නොවෙයි; පාර්ලිමේන්තුව ඇතුළේ ඔළු ගෙඩි එහා පැත්තට මෙහා පැත්තට මාරු කරන එක නොවෙයි. අපට පැහැදිලි ලෙසම අවශ්‍ය වන්නේ මේ රටේ ජාතිවාදී, අන්තවාදී ත්‍රස්තවාදය තුරන් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපි කොහොමද සහයෝගය දෙන්නේ සහ ශක්තිය දෙන්නේ කියන එකයි. ඒකයි අපි තෝරා ගන්න ඕනෑ.

ඊළඟ කාරණාව තමයි ප්‍රධාන චූදිතයා මේ චෝදනාවේ නැති එක. මේ ආණ්ඩුවට විශ්වාස භංග යෝජනාවක් ගෙන එනකොට, ප්‍රධාන චූදිතයා මේ යෝජනාවෙන් ගැලවිලා. ඒ නිසා මේ රටේ ඒ මියගිය අහිංසක ජනතාව වෙනුවෙන් අපි සියලුදෙනාම කළ යුත්තේ ත්‍රස්තවාදයෙන් මේ රට බේරාගන්න අවශ්‍ය වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමයි කියන එක තමයි මගේ යෝජනාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ.භා.5.56]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේ කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මොකද, ඔබතුමා අපි ගරු කරපු මේ රටේ ජාතික නායකයෙකුගේ දරුවකු නිසා ඔබතුමා ඉදිරියේ මේ වචන ටික කියන්න ලැබෙන එක මට ලොකු සන්තෝෂයක්. ඔබතුමාගේ පියා සියලු ජන කොටස් සමඟ ඉතාම සහයෝගයෙන් කටයුතු කරපු බුද්ධිමත් නායකයෙක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

අපට එතුමා නැති වුණා. ඒක අපේ අවාසනාවක් කියලායි මම කියන්නේ. අපට අද තියෙන බරපතළ ප්‍රශ්නය තමයි එතුමා වාගේ

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

නායකයන් අපට නැතිවීම. එතුමා වාගේ නායකයන් අද මේ සභාවේ නැති එක අපේ රටේ ජීවත් වෙන අප සියලුදෙනාම දැඩි ශෝකයට පත් වෙන තත්ත්වයක්.

අද මේ විශ්වාස භංග යෝජනාව ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරලා, දැන් විවාද කරනවා. විවාද කරලා අපි කොටසක් ඒකට පක්ෂව ඡන්දය දෙනවා; කොටසක් ඒකට පක්ෂව ඡන්දය දෙන්නේ නැහැ. එතකොට මොකක්ද මේ කෙරෙන්නේ? මේ කෙරෙන්නේ මේ ආණ්ඩුවට විරුද්ධව ගෙන ආ යෝජනාවක් විවාදයට ගැනීම. මේ ආණ්ඩුව අපේද? කවුද, මේ ආණ්ඩුව ගෙනාවේ?

දැන් හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය ජනාධිපතිතුමා ගැන සඳහන් කළා, "වෙන්ඩ මැන්ඩෙලා" කියලා. එතුමා ජනාධිපති ලෙස බලයට ගෙනාවේ කවුද? අපිද? මේ ප්‍රශ්නය අපේද? එහෙම නම් මොනවාද මේ කියන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය අපේ රට තවත් අවුල් කරපු ප්‍රශ්නයක්. එදා 2015දී කළේ අපේ රට අවුල් කරපු එක. ඒ අවුල ලිහා ගන්න බැරිව තමයි මේ දඟලන්නේ. එදා අපි භාර දුන්නේ, බෝම්බ පිපිරෙන්නේ නැති සාමකාමී රටක්. ඒ වාගේම කිසිම කලකෝලාහලයක් තිබුණේ නැති රටක්. උදේ ඡන්ද ප්‍රතිඵල පිට වෙන්නත් කලින් අපි ආණ්ඩුව භාර දුන්නා; ඡන්ද ප්‍රතිඵලය මහ එළිදී ආණ්ඩුව භාර දුන්නා. කාටද භාර දුන්නේ? තමුන්නාන්සේලාට භාර දුන්නේ. ඒ භාර දුන්නු ආණ්ඩුව හරියට කළාද? ඔබතුමන්ලා මේ වනතෙක් හරියට ආණ්ඩු කරලා තිබෙනවාද? මේකයි අද අපි අහන ප්‍රශ්නය. මේ ආණ්ඩුවට ආණ්ඩු කරන්න බැහැ. බැරි, බෑ දෙකක් වෙලා තිබෙන නිසා. බැරි, මේ ආණ්ඩුවේ බෑ දෙකක් තිබෙන නිසා. ඒ බෑ දෙක එකතු කරන්න බැහැ. ඒ නිසා අද මේ රට යන එන මං නැති තැනට පත් වෙලා, අරාජික වෙලා තිබෙනවා.

ඒ බෝම්බ පිපිරීම නිසා මුස්ලිම් උදවිය මිය ගියා නම්, ඒ බෝම්බ පිපිරීම නිසා කතෝලික උදවිය මිය ගියා නම්, ඒ බෝම්බ පිපිරීම නිසා දෙමළ උදවිය මිය ගියා නම්, ඒ සියලුදෙනා වෙනුවෙන් මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ. ඒක, මේ ආණ්ඩුවේ වැරැද්ද.

දැන් බුද්ධි අංශයට දොස් කියනවා; රිසාඩ් බදියුදීන් මැතිතුමාට දොස් කියනවා. අපි දොස් කියන්නේ නැහැ. රිසාඩ් බදියුදීන් මැතිතුමාට මම දොස් කියන්නේ නැහැ. සමහර අය සියලු මුස්ලිම් ජනතාවට දොස් කියනවා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මොකක්ද මේ කරන්නේ? ඒ උදවිය කරන්නේ මේ රට තවත් අගාධයකට හෙළීමයි. මේ විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා අපි මේ අසාර්ථක ආණ්ඩුවෙන් ඉල්ලන්නේ,-

ගරු සම්පන්දන් මැතිතුමා කියනවා, "මේ ආණ්ඩුවෙන් වැඩක් නැහැ" කියලා අද උදේ එතුමාගේ ගෙදර ඉස්සරහ උද්ඝෝෂණයක් කළා ලු. එතුමා එතෙක් ඒ ගැන දැනගෙන හිටියේ නැද්ද? තරුණයන් ගෙදර ළඟට ඇවිල්ලා උද්ඝෝෂණය කරනතෙක්, "මේ ආණ්ඩුවෙන් වැඩක් නැහැ" කියලා එතුමා දැනගෙන හිටියේ නැද්ද? එතුමා ඒක දැන ගත්තේ අද ද? ඒක නොවෙයි හේතුව. එතුමා දෙමළ ජනතාවත් පාවලා දුන්නා. මේ මුස්ලිම් නායකයෝ, මුස්ලිම් ජනතාව පාවලා දුන්නා. ඒකයි ඇත්ත තත්ත්වය. ඊළඟට අපේ අප, අපේ මිනිස්සුත් පාවලා දුන්නා. බෝම්බ ප්‍රහාරවලින් ඒ මිනිස්සුත් මැරුණා; කතෝලික උදවියත් මැරුණා. මේකයි ඇත්ත තත්ත්වය. මේ ආණ්ඩුව මේ රට පාලනය කළේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළිගත්ත එක විතරයි කළේ; ඒකයි කළේ. පළිගත්ත එක විතරයි තමුන්නාන්සේලා කළේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා මොනවා කිව්වත් මේ පසුගිය අවුරුදු හතරහමාර තුළ කළේ පළිගන්න උත්සාහ කළ එක විතරයි. රාජපක්ෂලා එළවන්න උත්සාහ කළා. රාජපක්ෂලා එක්ක ඉන්න හැමෝම හිරේ දාන්නයි කටයුතු කළේ.

ඊයේ දයා ගමගේ ඇමතිතුමා මෙතැන විළි ලජ්ජා නැතුව කිව්වා, "ලක්ෂ 3,000ක් වියදම් කරලා මේ රටේ දුප්පත් අහිංසක මිනිහෙකුට ටීෂර්ට් එකක් ගානේ දුන්නාම තමුන්නාන්සේලා මෙච්චර කෑ ගහයි කියලා මම හිතුවේ නැහැ. මම ඒ ගැන ලජ්ජා වනවා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අහිංසක වයසක උදවියට පසුගිය ආණ්ඩුව සිල් රෙදි බෙදා දුන්නා කියලා නිලධාරින් හිරේ දැම්මා. දැන් ඒවා ගැන කථා නැහැ. මෙතැන තිබෙන ප්‍රශ්නය, ඒ ටීෂර්ට් එක නිෂ්පාදනය කළේ කොහේද කියන එකයි. තමුන්ගේ සාක්කුවට සල්ලි දා ගන්න, තමුන්ගේ මඩිය තර කර ගන්න, සමෘද්ධියේ මුදල් ටික හොරකම් කරලා අද විළි ලජ්ජා නැතුව අහනවා, "ලක්ෂ 3,000ක් කියන්නේ ගණනක් ද?" කියලා. ඒක වඩා බරපතළ කථාවක්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතුමා සිරිකොතේ electricity bills ගෙව්වා කිව්වානේ.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එතුමා සිරිකොත electricity bills ගෙව්වාය කියනවා. මම දන්නේ නැහැ ඒක. "ලක්ෂ 3,000ත් ගණනක් ද?" කියලා එතුමා මේ ගරු සභාවේදී ඇහුවා. ටීෂර්ට් එකක් දුන්නාම අපි කෑ ගහනවා ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිල් සමාදන් වෙන්නේ වයසක අත්තම්මලා. ඒ අත්තම්මලාට රෙදි කැල්ලක් දුන්නාය කියලා ඒ නිලධාරියා හිරේ දැම්මා. එහෙම කරපු අයගෙන් එක්කෙනෙක් මෙතැනට ඇවිල්ලා අහනවා, රුපියල් ලක්ෂ 3,000ත් ගාණක්ද, ඒ ටික බෙදුව එකත් කථා කරන්න දෙයක්ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි අද වෙලා තිබෙන විනාශය. ඒ ප්‍රතිඵලය තමයි මේ තිබෙන්නේ. මේ විශ්වාස භංග යෝජනාව දිනන්නවත්, වෙනත් වුවමනාවකටවත් අපි ඡන්දය දෙනවා නොවෙයි. අපි මේ ආණ්ඩුවට පක්ෂව ඡන්දය දෙන්නේ නැහැ. මේ ආණ්ඩුව කෙරෙහි කවදාවත් අපට විශ්වාසයක් තිබුණේ නැහැ. හෙට තියෙන්නෙත් නැහැ. එම නිසා අපි අදත් ඒ ස්ථාවරයේ ඉන්නවා. ආණ්ඩුවක් මාරු කරන්න බලාගෙන අපි මේ විවාදයට ආවා නොවෙයි. ආණ්ඩුව මාරු කරන්න ඕනෑ, මේ රටේ ජනතාව විසින්. ඒ ජනතාවට ඒ අවස්ථාව නොදෙන එක තමයි මෙතැන තිබෙන වැරැද්ද. මෙතැන කථා ඕනෑ නැහැ, ආණ්ඩුවක් හදන්න ජනතාවට අවස්ථාව දෙන්න. ඒක නේ ප්‍රජාතන්ත්‍රවාදය, ඒක නේ මනුස්සකම. ඒක නේ මේවායේ අවසාන ප්‍රතිඵලය වෙන්න ඕනෑ.

ගරු ෆවුසි මන්ත්‍රීතුමා කලින් මෙතැන සිටියා. මම කනගාටු වෙනවා, දැන් එතුමා මෙතැන නැති එක ගැන. ෆවුසි මන්ත්‍රීතුමාට අපි සැලකුවේ අපේම පවුලේ කෙනෙකුට වාගේ. එතුමා මුස්ලිම් ජාතිකයෙක් කියලා කවදාවත් අපට හිතුණේ නැහැ. එතුමා අපේ ගෙදර කෙනෙක්, අපේ ඥාතියෙක්, අපේ හිතවතෙක්, අපේ ආදරණීය වැඩිහිටියෙක් හැටියටයි අපි එතුමාට සැලකුවේ. නමුත්, අවසානයේ එතුමාත් මේ ජාතිවාදයට කොටු වුණා. එතුමා ජාතිවාදයට කොටු වුණු එක ගැන අපි කනගාටු වෙනවා. එතුමා මෙතැන ඉඳියි කියලා මම හිතාගෙන හිටියේ, මේ වචන ටික කියන්න. එතුමා දැන් මෙතැන නැති එක ගැන මම කනගාටු වෙනවා. අවසානයේ එතුමා ජාතිවාදියෙක් වුණා. මුස්ලිම් ජාතිවාදියකු හැටියට පෙනී සිටින්න එතුමාට සිද්ධ වුණා. ඒ වැඩේ කරන්න එපා. අපි අතර එහෙම අවුලක් තිබුණේ නැහැ. අපේ ගම් පළාත්වල මුස්ලිම්, දෙමළ කියලා ප්‍රශ්නයක් නැහැ, අපි හොඳින්

ජීවත් වෙනවා. ඔය මුස්ලිම් කඩ වර්ජනයක් එහේ නැහැ. මාතරත් නැහැ, දකුණු පළාතේත් නැහැ. මුස්ලිම් කඩ වර්ජනය කියලා එකක් අපේ මිනිස්සු දන්නේත් නැහැ. බඩු ඕනෑ වුණාම ඕනෑ තැනකින් අරගෙන එනවා. තමුන්නාන්සේලා ඒ තත්ත්වය හදන්න එපා. තමුන්නාන්සේලා මෙතැන ඉඳගෙන ඒ තත්ත්වය හදනවා. අපි මේ ආණ්ඩුවට කියනවා, මේ රටට ඒ අපරාධය කරන්න එපා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පියා වාගේ නායකයෙක් අද සිටියා නම්, එතුමා මේ ගැන පියවරක් ගන්නවා කියලා මම කිව්වේ ඒකයි. අද මේ ආණ්ඩුව එන්න එන්නම රට අගාධයට ඇදලා දමනවා. අපේ රට විනාශ කරනවා. මේ රටේ කිසිම ජාතියකට අනාගතයක් නැහැ. අපි තවත් යන්නේ අගාධයෙන් අගාධයට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා තමයි මම මේ ආණ්ඩුවට කියන්නේ, මැතිවරණයක් තියන්න, මැතිවරණයක් තියලා ජනතාවට අවස්ථාව දෙන්න කියලා. ඒකයි කෙරෙන්න ඕනෑ. එන්න එන්නම මැතිවරණ කල් දමාගෙන, ජනාධිපතිතුමාට බණිනවා, තවත් උදවියට දොස් කියනවා. ඒක නොවෙයි ප්‍රශ්නය. මුන්නැහැලාගේ බැරිකමයි තිබෙන්නේ. මුන්නැහේලා කල්පනා කරන්නේ, ඉදිරි කාල සීමාව තුළ පුළුවන් තරම් හම්බ කරගෙන යන්නයි. පුළුවන් තරම් ගොඩ ගසාගෙන යන්නයි. ඒක තමයි මේ සටන. ඒක තමයි මේ අරගළය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න හදන්නේ මට නියමිත කාලය අවසන් කියලායි. මම කියන්නේ, වහාම මේ ආණ්ඩුව ඉල්ලා අස්වෙලා ගෙදර යන්න, මැතිවරණයක් පවත්වන්න කියලායි. මේ විශ්වාස භංගවලින් වැඩක් නැහැ. ජාතිය වෙනුවෙන් ඒ යුතුකම දැන්වත් ඉෂ්ට කරන්න කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා මගේ ශ්‍රේෂ්ඨ පියා ගැන කියපු දේවල් මම ගොඩක් අගය කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.6.06]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Development Strategies and International Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා කිව්වා, අපට අයින් වෙලා ගෙදර යන්න කියලා. කලබල වෙන්න ඕනෑ නැහැ, තව මාස කීපයකින් ජනාධිපතිවරණය පවත්වනවා. ඒ, ජනාධිපතිවරණයේ දී අපි එම ප්‍රශ්නය විසඳාගනිමු කියලා මම ඔබතුමාට කියනවා.

අපි දන්නවා, ඔබතුමන්ලාට නම් ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් කරන්න අපේක්ෂකයන් ගොඩක් සිටින බව. දැන් ඒ ප්‍රශ්නය විසඳාගන්න බැරිවෙලා තිබෙනවා. පවුල ඇතුළේ, එහෙම නැත්නම් වරිගෙ ඇතුළේ විශාල ඒ ගැන අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා. චමල් රාජපක්ෂ මහත්මයා වාගේ කෙනෙක් පත් කළොත් නම් අපි ටිකක් සතුටු වෙනවා. ඇමෙරිකානු පුරවැසියන් දමනවාට නම් අපි කැමැති නැහැ. මම දන්නවා, චමල් රාජපක්ෂ මහත්මයා ඇමෙරිකානු පුරවැසියෙක් නොවෙයි කියලා. [බාධා කිරීමක්] මේ කථා කරන ඔබතුමන්ලා මීට මාස 6කට කලින් ආණ්ඩුවක් කරපු අය. අපට මතකයි, මීට මාස 6කට කලින් ඔබතුමන්ලා දවස් 52ක ආණ්ඩුවක් කළා. ඇමතිධුරවල දිවුරුම් දුන්නා; අමාත්‍යාංශවලට ගිහිල්ලා වැඩ භාර ගත්තා. සමහරු වැඩ භාර අරන් ගෙදර යනකොට ඇමතිකම නැහැ, උසාවියෙන් අහෝසි කරලා. සමහරු සභානායක කාර්යාලයට ඇවිල්ලා වැඩ භාර ගත්තා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයට ඇවිල්ලා වැඩ භාර ගත්තා. අපට මතකයි, ඒ විධියට ඔබතුමන්ලා දවස් 52ක ආණ්ඩුවක රස විඳීමක් කළා. ඔබතුමන්ලාට පුදුම හදිස්සියක් තිබුණා, මේ ආණ්ඩුව ගන්න. ඒ සඳහා කරන්න පුළුවන් සෑම දෙයක්ම කරලා තමයි අද මෙහි සිටින්නේ. ඒවා කළේත් වෙනත් කවුරුවත් එක්ක නොවෙයි ජනාධිපතිතුමාත් එක්ක එකතු වෙලායි. අපි දන්නේ නැහැ ජනාධිපතිතුමාත් එක්ක දැන් මොන වාගේ සංහිඳියාවක්ද තිබෙන්නේ කියලා. කරන්න තිබෙන සියල්ලක්ම කරලා, නීතිය කඩලා, නීතිය අස්සෙන් රිංගලා, ව්‍යවස්ථාව කඩ කරලා, මිරිස් කුඩු ගහලා, මෙහි තිබෙන උපකරණ කඩලා, පාර්ලිමේන්තුවට අගෞරව කරලා එදා කටයුතු කරපු හැටි අපට හොඳට මතකයි. අපිත් විපක්ෂය පැත්තේ දවස් 52ක් සිටියා. ඒ නිසා අපට ඒවා හොඳට මතකයි; මේ රටේ ජනතාවට මතකයි. ඔබතුමන්ලා තුළ බලයට කොච්චර කෑදරකමක් තිබෙනවාද? අපේ කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා නම් කිව්වා, 'බොරු වැඩක් මේ කරන්නේ. මේක ආණ්ඩුව ගන්න ඕනෑ වෙලාවක් නොවෙයි. හරි වෙලාවට ආණ්ඩුව ගනිමු' කියලා. ඒ මතය දරපු කීප දෙනෙක් ඔය පැත්තේ සිටියා. එවැනි බුද්ධිමත් පිරිසක් සිටියා. මා කියන්නේ නැහැ, සියලුදෙනාම ආණ්ඩු බලය ගන්න එවැනි කටයුතුවල යෙදුණා කියලා. හැබැයි, සමහරුන්ට නම් පුදුම හදිස්සියක් තිබුණා ආණ්ඩුව පැත්තේ ඉඳගන්න. මොකද, ඒ අයට එහෙම කරන්න හේතු වන කරුණු කාරණා කීපයක් තිබුණා. ඒ අයට විපක්ෂයේ වැඩි කාලයක් ඉන්න බැරිකම තිබුණා; ප්‍රශ්න තිබුණා. ඒ නිසා ඒ අයට හදිස්සියක් තිබුණා. අපි දන්නවා දැනුත් ඒ හදිස්සිය තිබෙනවා කියලා. දැන් අපි මැතිවරණවලට පෙළ ගැසී ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමා මූලාසනයට පැමිණීම ගැන මම සතුටු වෙනවා.

අපට ඒ සිදුවීම් අමතක කරන්න බැහැ. ආණ්ඩු බලය ගැනීමේ හදිස්සිය තිබෙන අය මේ ගරු සභාවේ ඉන්නවා. ඒ කෙසේ වෙතත්, අපි මේ අවුරුදු හතර, හතරහමාර ඇතුළත මේ රට හොඳ තැනකට ගෙන ආ බව අපි දන්නවා. පාස්කු ඉරිදා එල්ල වූ ප්‍රහාරයත් එක්ක රටේ යම් කඩා වැටීමක් සිදු වුණාට මේ රට මැදි ආදායම් ලබන රටක් බවට පත් වී තිබෙන බව, වාර්ෂික ඒකපුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000 සීමාව පසු කර තිබෙන බව අපි දන්නවා. අපේ සංචාරක ක්ෂේත්‍රය විශාල දියුණුවක් ලැබුවා. ඒ වාගේම කර්මාන්තකරණය විශාල වශයෙන් සිදුවූ කාලයක් තමයි,

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මේ අවුරුදු හතරහමාර. ඒ විධියට රට දියුණු වෙමින් තිබෙන අවස්ථාවක තමයි ලෝක ත්‍රස්තවාදයත් එක්ක බැඳුණු එම ත්‍රස්තවාදී ක්‍රියාව අප කවුරුත් බලාපොරොත්තු නොවුණු ආකාරයට සිදු වුණේ. හැබැයි, අපි අද එතැනින් නැඟිටිමින් ඉන්නවා. විපතට පත් අපේ ජනතාව ගැන තිබෙන වේදනාව, දුක අපේ හද පතුලේ තියාගෙන රටක් විධියට අපි ඒ වැටුණු තැනින් නැඟිටිමින් ඉන්නවා. ඒ නිසා අප ලබා ගත් මේ ජයග්‍රහණය නැවත උදුරා ගන්න අපි කාටවත් ඉඩ දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ජනාධිපතිවරණය මේ අවුරුද්දේ අග පවත්වන්න ඕනෑ බව අපි දන්නවා. ඒක කාටවත් පස්සට දමන්න බැහැ. ව්‍යවස්ථාව පෙරළා, තවත් නොයෙක් විධියේ කුමන්ත්‍රණ කරලා බලය එහාට මෙහාට කරන්න සමහරු උත්සාහ කරනවා. මම දන්නවා, ඒක කාටවත් කරන්න බැරි බව. හැබැයි, හරි වෙලාවට හරි තීන්දු තීරණ අරගෙන අවශ්‍ය කටයුතු කරන්න අපි සූදානම් වෙලා ඉන්නවා. මේ අයට බලය සඳහා කෑදරකම, හදිස්සිය තිබුණාට වැඩක් නැහැ. ඒක කර ගන්න අවස්ථාව ලැබෙන කල් ඉන්න ඕනෑ. ඒ අවස්ථාව පැහැදිලිවම තවත් මාස හතරකින්, හතරහමාරකින් ලැබෙනවා. තමන්ගේ හෙලුව -නිරුවත - වසා ගන්න විශ්වාසභංග යෝජනාව භාවිත කළාට ඒක සාර්ථක වන්නේ නැහැ කියලායි මා හිතන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, තවත් විනාඩි භාගයක කාලයක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මුළු රටේම ජනතාව දන්නවා, මෙතුමන්ලා මීට අවුරුදු හතරකට, හතරහමාරකට කලින් කළ දේ විතරක් නොවෙයි, මීට මාස හයකට කලින් මොනවාද කළේ කියලා. 2015 වර්ෂයට කලින් කරපු දේවල් ගැන මේ රටම දන්නවා. ඒ වාගේම, මීට මාස හයකට කලින් කරපු දේවල් ගැනත් හොඳින්ම දන්නවා. තමන්ගේ බලය වෙනුවෙන් ඕනෑම දෙයක්, ඕනෑම ව්‍යවස්ථා විරෝධී වැඩක්, ඕනෑම නීති විරෝධී වැඩක් කරන්න පුළුවන් පිරිසක් විධියට අද මේ අය හංවඩු ගැහිලායි ඉන්නේ. තමුන්නාන්සේලා සිතනවා නම් ඒ ත්‍රස්තවාදී ප්‍රහාරවලට මුවා වෙලා බලයට එන්න, අන්තවාදීන්ට මුවා වෙලා බලයට එන්න, රට තුළ ජාතිවාදී ගිනිදැල් අවුළා, වර්ගවාදී ගිනිදැල් අවුළා බලයට එන්න, ඒක කවදාවත් ඉටු වෙන්නේ නැහැ කියන එක මතක් කරන්න කැමැතියි. මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.6.11]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා කෙටියෙන් කතාව කරන්න කැමැතියි. ජනතා විමුක්ති පෙරමුණ විසින් ගෙන එන ලද මේ විශ්වාස භංග යෝජනාවේ අවසාන කොටසේ සඳහන්ව තිබෙනවා, ආණ්ඩුව සම්බන්ධයෙන් විශ්වාස භංගත්වයට පත්ව ඇති බව. අග්‍රාමාත්‍යවරයාට හා ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාව පාර්ලිමේන්තුවේ සම්මත කළාට පසුව ආණ්ඩුව ඇති කරපු මේ තත්ත්වය සම්බන්ධයෙන් වගකීම භාර ගෙන, රජය හා අග්‍රාමාත්‍යතුමා, අමාත්‍ය මණ්ඩලය ඉල්ලා අස් විය යුතුයි. ඉතා පැහැදිලිව පෙනෙනවා, අප්‍රේල් මාසයේ 21වැනි දා -පාස්කු ඉරිදා- එල්ල වූ ප්‍රහාරයෙන් 250ක් 275ක් අතර පිරිසක් දැනටමත් මිය ගිහින් තිබෙන බව. ඒ අයට අදාළ සියලු පරීක්ෂණ කටයුතු තවම අවසන් කර නැහැ. ඒ අයගේ මරණ සහතික පවා නිකුත් කිරීමට තවම බැරි වෙලා තිබෙනවා. මෙන්න මේක තමයි, මේ මාස තුන ඇතුළත ආණ්ඩුවේ තත්ත්වය.

දෙවැනි කාරණය මේකයි. අපේ මාතෘ භූමියේ ආරක්ෂාව සඳහා හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය නිසා, එය පනවන්නට විරුද්ධ පක්ෂයේ නායකතුමා -මහින්ද රාජපක්ෂ මැතිතුමා- දේශපාලන පක්ෂ භේදයෙන් තොරව සහයෝගය ලබා දුන්නා. එය විවෘත සහයෝගයක්. අද මේ ආණ්ඩුව, ඒ ලබා ගත්ත සහයෝගයෙන් ප්‍රයෝජනයක් ලබා ගෙන නැහැ.

ඊළඟට, අග්‍රාමාත්‍යතුමාට අස් වෙන්න කියලා අද යෝජනාවක් සම්මත කිරීම සාධාරණයි කියන එකට තව කාරණාවක් එකතු කරන්න මම කැමැතියි. ආණ්ඩුව හදිසි නීතිය ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවෙන් පැනලා ගියා. ආණ්ඩුව එදා හදිසි නීතිය සම්මත කිරීමට මන්ත්‍රීවරු ගෙනාවේ නැහැ; අග්‍රාමාත්‍යවරයා ආවේ නැහැ. පාර්ලිමේන්තුවෙන් පැනලා ගිය ආණ්ඩුව එදා බලාපොරොත්තු වුණේ මොකක්ද? ත්‍රස්තවාදයට කප්පම් ගෙවීමයි, හදිසි නීතිය යටතේ වැරැදිකරුවන් පිළිබඳ ආරක්ෂක සේවා, පොලිසිය අරගෙන තිබෙන පියවර සියල්ල අවුල් ජාලයකට පත් කිරීමයි ආණ්ඩුවේ අරමුණ වුණේ. එදා හදිසි නීතිය සම්මත වුණේ විරුද්ධ පක්ෂය නිසාය කියන කාරණය අපි ඉතා ඕනෑකමින් ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ විධියට බලනකොට අගමැතිවරයා දෙවතාවක් අස් විය යුතුයි. එදා හදිසි නීතිය අවස්ථාවේ අනුගමනය කළ ක්‍රියාවලිය තුළින්, තමන්ගේ ආණ්ඩුවේ ආරක්ෂාව ගැන, රටේ ආරක්ෂාව ගැන අග්‍රාමාත්‍යවරයාට සහ අමාත්‍ය මණ්ඩලයට කිසිම හැඟීමක්, කිසිම ඕනෑකමක් නැහැ කියන කාරණය තව දුරටත් පෙන්නුම් කරනවා.

අව ආර්ථිකයේ කඩා වැටීම සිදු වෙලා ඉවරයි. නීතියේ කඩා වැටීම සිදු වෙලා ඉවරයි. අපේ රටේ විදේශ ප්‍රතිපත්තියට පයින් ගහලා ඉවරයි, ගරු කථානායකතුමනි. මම කෙටියෙන් කියවන්න කැමතියි what the Mauritian Prime Minister Kumar Jugnauth stated about the International Court of Justice's opinion on Chagos Archipelogo. He says, "General Assembly Welcomes the International Court of Justice (ICJ) Opinion on Chagos Archipelogo, chain of Islands, and adopts non-binding Text calling for the Mauritius' Complete Decolonization. Chagos includes the all important military base of 'Diego Garcia', known to be the 'unsinkable aircraft carrier' of the Indian Ocean." What happened at the UN? We kicked the Non-Aligned Policy. මෙන්න, අග්‍රාමාත්‍යතුමාගේ ආණ්ඩුව අපේ රටට අද කරන දේ. The UK, the US, Hungary, Israel, Australia and the Maldives voted against the Motion and perhaps the biggest blow was that most of the UK's key allies, including France and Germany abstained from voting and also Sri Lanka.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිය මොකක්ද? විදේශ කටයුතු ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. විදේශ ප්‍රතිපත්තිය වැට උඩ තියාගෙන ඉන්න එක ගැන එතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. මේ, නිදහස් රටකට අයිති දේවල්. "දියේගෝ ගාර්ෂියා" දූපත ඇමෙරිකාවෙන් නිදහස් කර ගැනීමට International Court of Justice දුන්න තීන්දුවට විරුද්ධව, ඒ රටවල් සියල්ල සමඟ ඡන්දය දෙන්නට බැරි වෙලා පැනලා ගිය ඔබගේ නිත්‍ය නියෝජිතයා ආපහු ගෙන්වන්න තිබුණා. මෙන්න, ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිය. මේ ආණ්ඩුවට පැහැදිලි විදේශ ප්‍රතිපත්තියක් නැත්නම්, ආරක්ෂක ප්‍රතිපත්තියක් නැත්නම් ඇයි තවත් රැඳී ඉන්නේ? අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ අපි මේවා රැක්කා. ඒ මත ආරක්ෂා වුණු දේශය

වෙනුවෙන් අද මේ ආණ්ඩුවට වැඩ පිළිවෙළක් නැහැ. අත්අඩංගුවට අරගෙන ඉන්න මේ අය හරියාකාර පරීක්ෂණයකට භාජන කොට ඒ පිළිබඳ යම් ක්‍රියා මාර්ගයක් ගැනීමේ ක්‍රියාවලිය ඉක්මන් කිරීම වෙනුවට, අද ඔබතුමන්ලා වෙන වෙන දේවල් කරමින් සිටිනවා.

ගරු කථානායකතුමනි, දැන් ආණ්ඩු දෙකක් තිබෙනවා. ආණ්ඩු දෙකම යමක් කරන්නේ නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. අගමැතිතුමා එක කණ්ඩායමක් හදාගෙන රට පාලනය කරනවා. ජනාධිපතිතුමා තව කණ්ඩායමක් නියෝජනය කරනවා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදයක් පවතිනවා. ඒකේ හංගන්න දෙයක් නැහැ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට මේක තේරෙන්නේ නැති වුණාට, මේ රටේ ජනතාව එය හොඳින් දන්නවා. මේ නිසා ඇතිවී තිබෙන තත්ත්වය මොකක්ද? ආර්ථිකයේ කඩා වැටීම ගැන මම කලින් කිව්වා.

Sir, I would not take a long time but in conclusion, I quote what the "Daily Mirror" of 10th July, 2019 states in its headlines:

"HSBC paints gloomy economic outlook for Sri Lanka :

* Cuts growth outlook to 2.7%, slowest since 2001 citing policy and political issues

* Says recovery unlikely until key elections held to end current political impasse

* Notes that recent concerns over national security likely to be a further drag on growth recovery"

ආර්ථිකයේ මෙවැනි කඩා වැටීමක් සිදුවෙන කොට, තමුන්නාන්සේලා ආර්ථික ප්‍රගතියක් ගැන කථා කරනවා. ආණ්ඩුවක ප්‍රධානීන් හැප්පෙනකොට, ආණ්ඩුවක් නැහැ. ආණ්ඩුව ඇතුළේ හැප්පීම් වෙනකොට මහජනයාට අලුතින් විශ්වාසයක් ඇති වන්නේ නැහැ. we have lost confidence. This is what has happened to the Colombo Business Association, which carries a membership of over 55,000 business entrepreneurs. With the prevailing situation, they were promised five demands. Their delegation met the Leader of the Opposition, the Prime Minister and the Governor of the Central Bank. When they met the President, the following issues were discussed: issues with regard to the "Sancharaka Podda" loan scheme via RDB. This loan scheme will have to be repaid in three years with the ability for initial instalments to be adjusted to as little as Rs. 8,000 to Rs. 12,000 per year. Even though the Central Bank issued a relief package under "Sancharaka Podda", the banks are not providing any relief *in toto.* Moreover, they discussed about the repossessing and auctioning of any properties and vehicles due to late or non-repayment of loans and leases by enterprises affected by the Easter attacks. The President and the CBSL discussed to issue a fresh circular to banks and finance companies to temporarily avoid repossessing and auctioning of properties and vehicles. ඉතා පැහැදිලියි, මේ ආණ්ඩුව මෙවාවත් ඉෂ්ට කරන්න බැරි ආණ්ඩුවක් බවට පත් වෙලා ඉන්නවා. අද රටේ ආර්ථිකය කඩා වැටිලා, ආර්ථික පොරොන්දු කිසිවක් ක්‍රියාත්මක වෙන්නේ නැතිව, 55,000කට වැඩි ව්‍යාපාරික පැළැන්තිය බංකොලොත් වන අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවට ගෙදර යන්නය කියන එකට වඩා වෙන කියන්න දෙයක් නැහැ. ඔබතුමන්ලාට ආර්ථිකය මෙහෙයවන්නට බැහැ; ආයෝජකයන් ගෙන්වා ගන්නට බැහැ. ඔබතුමන්ලාට නීතිය හා සාමය යළි ගෙනෙන්න බැහැ. ඔබතුමන්ලාට ජනතාවගේ විශ්වාසය දිනා ගන්න බැහැ. රටේ ජන ජීවිතය ආරක්ෂා කරන්න බැහැ.

අන්තවාදී ත්‍රස්තවාදීන් යමක් කළාට, සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය රකින, ඒ ජනතාව ආරක්ෂා කරන ප්‍රතිපත්තියක තමයි විරුද්ධ පක්ෂයේ නායකතුමා හා අප ඉන්නේ. අප ඉතා පැහැදිලිව කියනවා, ඔබතුමන්ලා ත්‍රස්තවාදීන්ට උදව් කළ බව. මේ ප්‍රහාරය සිදුවන බව, එය සිදුවන දිනය හා වෙලාව තමුන්නාන්සේලා දැන ගෙන හිටියා. ඒ වෙනුවෙන් කිසිවක් නොකරපු මේ ආණ්ඩුව ගෙදර යවන්න, මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව විපක්ෂයේ අපි ඡන්දය පාවිච්චි කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා.6.21]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු කථානායකතුමනි, මට නියමිතව තිබුණු විනාඩි හය කප්පාදු වෙලා, විනාඩි හතරක් හෝ ලබාදීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද මේ විවාදයේදී, මේ විශ්වාස භංග යෝජනාවට පක්ෂව කථා කළ කථිකයන් සියලුදෙනාම එක පාර්ශ්වයකට පමණක් චෝදනා එල්ල කරමින් කථා කිරීම පිළිබඳව මා අතිශයින් කනගාටු වෙනවා. මේ රජය පාර්ශ්ව දෙකක් සමඟ එකතු වෙලා තමයි ආණ්ඩු කළේ. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අප ගෙනාවේ විධායක ජනාධිපති ධුරයේ තිබෙන බලතල, එහෙම නැත්නම් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන බලතල කප්පාදු කරලා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිවයි. ඒ සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්තුමා රටේ ජනාධිපතිවරයා වශයෙනුත්, එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා රටේ අග්‍රාමාත්‍යවරයා වශයෙනුත් පත් කරන්න රටේ ජනතාව කටයුතු කළා. මෙතැන ඇති වුණේ සම්මුතියක්. ඒ සම්මුතිය කඩ කරමින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන, අගමැතිවරයා විමසා කටයුතු කිරීමේ කොන්දේසිය -එම නීතිමය කටයුත්ත- පැත්තකට දමලා, බලහත්කාරයෙන් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරේ දමා ගෙන කටයුතු කිරීම තුළ රටේ ව්‍යාකූලභාවයක්, එහෙම නැත්නම් විසම්මුතියක් ඇති වුණා. ඒ සම්මුතිය විනාශ වීම තුළ මේ රටේ විවිධාකාර වූ තත්ත්ව ඇති වුණා. ඒ තත්ත්වය උඩ රටේ ආරක්ෂාව, නීතිය හා සාමය සේනාධිනායකයා භාර ගත්තා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

භාර ගත්ත කොටස හරහා තමයි මෙවැනි විශාල ව්‍යසනයක් ඇතිවීමට කටයුතු යෙදුණේ. මේ විශ්වාස භංග යෝජනාව ගෙනාපු අයටවත්, මේකට පක්ෂව කථා කරපු කිසිම මන්ත්‍රීවරයකුවත් මේ කාර්යභාරයේ වගකීම කාටද තිබුණේ කියන එක කියන්න බැරි වුණා. ඒ වගකීම තිබුණේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමටද, සේනාධි නායකයාටද, එහෙම නැත්නම් ආරක්ෂක ඇමතිවරයාටද කියලා කෙළින් කියා ගන්නට බැරිකමක් මේ කථිකයින් සියලුදෙනාටම තිබුණා. ඒක එක්කෝ, නිවටකම, නැත්නම් "ඩීල්" එකක් එහෙමත් නැත්නම් බියගුලුකම. මෙන්න මේ කාරණා තුන නිසා තමයි මේ වගකීම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

එහෙම නැත්නම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තිබුණේ කියලා ඍජුව කියන්නට බැරි වුණේ. ආරක්ෂක ඇමති මේ කටයුත්ත හරියාකාරව සිද්ධ කළාද, ආරක්ෂක කවුන්සලය කැඳෙව්වාද, ආරක්ෂක කවුන්සලයට වගකිව යුත්තන් කැඳවන්නේ නැතිව හිටියා නම් ඒ කැඳවන්නේ නැතිව හිටපු එක පිළිබඳව මේ කිසිම කථිකයකුට කථා කර ගන්න බැරි වුණා. ඒ ගැන කථා කළේ නැහැ, ගරු කථානායකතුමනි. ආරක්ෂක ඇමතිවරයා වශයෙන්, සේනාධි නායකයා වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනතාව හා දේපොළ ආරක්ෂා කිරීමට වගකීමෙන් බැඳිලා ඉන්නවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒක කරන්න බැරි වුණා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හිතුවක්කාර විධියට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කරේ දමාගෙන, අහෝසි වුණු ව්‍යවස්ථා සංශෝධනයක් කරේ දමාගෙන වැඩ කටයුතු කරපු නිසායි මේ දේ වුණේ කියන එක අපි බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු මේ ආණ්ඩුවේ කොටස්කරුවන් වශයෙන් හිටියා. ඒ අය ආණ්ඩුවේ කොටස්කරුවන් වශයෙන් සිටිමින් හොඳ දේවල් සියල්ලේදීම ඒ ගොල්ලන් ලකුණු දමා ගත්තා. යම් නරක දෙයක් තිබුණා නම් ඒ සියල්ලම රනිල් වික්‍රමසිංහ ප්‍රධාන එක්සත් ජාතික පක්ෂයට බැර කිරීමේ නිර්ලජ්ජිත ක්‍රියාවලියක ඒ අය යෙදී සිටියාය කියන එකත් අපි සිහිපත් කරන්නට ඕනෑ.

ඒ වාගේම මේ සියල්ලට හේතුව පරිණතභාවයක් නැතිකමයි. නායකත්වයේ පරිණතභාවයක් නැතිකමේ ඛේදවාචකයට තමයි අපි මේ මුහුණ දීලා තිබෙන්නේ. නායකයකු විධියට පරිණතභාවයක් තිබුණා නම් අනෙක් අය එක්ක සංහිඳියාවෙන්, සහයෝගයෙන් අනෙක් අයගේ මතයටත් ඇහුම්කන් දීලා, අනෙක් අයගේ සහයෝගය අරගෙන වැඩ කටයුතු කරන්න පුළුවන්. හැබැයි, ඒ පරිණතභාවය නැති නිසා, එවැනි නායකයකුට අනෙක් අයත් එකට එකතු වෙලා වැඩ කරන්න බැරිකමේ ප්‍රතිඵලය නිසා තමයි 21වැනි දා, පාස්කු ඉරිදා ප්‍රහාරය වුණේ. එකෙන් වුණේ මුළු රටටත්, සමස්ත සමාජයටත් හානියක්. ඒ හානිය සම්බන්ධයෙන් අද මේ සභාවේ කථා කරපු අයත් සංහිඳියාව උල්ලංඝනය කරමින් කථා කළා. ආගම සහ ජාතියක් ඉලක්ක කරගෙන මේ පාර්ලිමේන්තුවේ කථා කිරීම, මේ නියෝජිතයන් මෙසේ හැසිරීම ඉතාම කනගාටුදායක බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.6.25]

ගරු අජිත් පී. පෙරේරා මහතා (ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் தகவல் தொழில்நுட்ப அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Non Cabinet Minister of Digital Infrastructure and Information Technology)

ගරු කථානායකතුමනි, ජනතා විමුක්ති පෙරමුණ මූලික වෙලා ඉදිරිපත් කරපු මේ විශ්වාස භංග යෝජනාවේ සාරාංශය, හරය තමයි අපි කවුරුත් හෙළා දකින, අපි කවුරුත් ඉමහත් කම්පනයට පත් වුණු 2019 අප්‍රේල් මාසයේ 21 වැනි දා සිදු වුණු ඒ දුෂ්ට ත්‍රස්තවාදී ප්‍රහාරය පිළිබඳව අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය සහ ආණ්ඩුව වෙත නිල වශයෙන් තොරතුරු ලැබී තිබියදී, සාපරාධී නොසැලකිල්ලෙන් මෙම යෝජනාවේ සඳහන් කෙරෙන ක්‍රියා කරමින් හෝ නොකර හැරීමෙන් කටයුතු කළාය කියන එක.

ඊයේත්, අදත් ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, විපක්ෂයේ අනෙකුත් ගරු මන්ත්‍රීතුමන්ලාත් මේ පිළිබඳව බොහෝ කරුණු ඉදිරිපත් කළා. සමහරු මේ විවාදයට කිසිම අදාළ නැති දේවල් කිව්වා. තවත් අය මේ විවාදයට ඉදිරිපත් වෙලා තිබෙන යෝජනාවට අදාළ දේවල් කිව්වා. හැබැයි, ඒ කිසිම කරුණකදී අග්‍රාමාත්‍යවරයාට, මේ අමාත්‍ය මණ්ඩලයට මෙම ප්‍රහාරය පිළිබඳව කල් තියා තොරතුරු ලැබුණාය කියන මේ යෝජනාවේ තිබෙන මූලික හරය ඔප්පු කිරීමට අවශ්‍ය කිසිම සාක්ෂියක් ඉදිරිපත් වුණේ නැහැ. මේ විවාදය පුරාම ඉදිරිපත් වුණේ, ඊට වඩා සම්පූර්ණයෙන් පරස්පර කරුණු. මේ විවාදයේදී සාක්ෂිමය වශයෙන් යමක් ඉදිරිපත් වුණා නම් ඒ හැම එකකදීම කිව්වේ, ගරු ජනාධිපතිතුමා විසින් විශ්වාසය තබන, පසුගිය අප්‍රේල් මාසයේ 21වැනි දාට අදාළ කාලවකවානුවේ කටයුතු කරපු, ජනාධිපතිතුමා අමාත්‍ය ධුරය දරන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඉන්න නිලධාරීන්, ජනාධිපතිතුමා අමාත්‍ය ධුරය දරන නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඉන්න නිලධාරීන් ඒ තොරතුරු දැනගෙන සිටියා කියන එකයි. එතකොට ඔවුන් විසින් ඒ තොරතුරු වාර්තා කරන්නේ ජනාධිපතිවරයාටයි. එහෙම නම් ඒ තොරතුරු දැනගෙන ඒ තොරතුරු පිළිබඳ නිසි පියවරක් නොගත්තේ ජනාධිපතිවරයා පමණමයි.

අපි හොඳාකාරවම දන්නවා, ගරු අග්‍රාමාත්‍යතුමා කිසිසේත්ම කල් තියා මේ තොරතුරු දැනගෙන සිටියේ නැහැ කියලා. අමාත්‍ය මණ්ඩලය විධියට ඒ අයටත් මේ පිළිබඳව කිසිම ආකාරයක දැනුවත්වීමක් තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. ආණ්ඩුවක් හැටියට අපි දැනගෙන හිටියේත් නැහැ. එහෙම නම්, මේ විවාදයේදී ඉදිරිපත් වෙච්ච සාක්ෂි පිළිබඳව යථාර්ථවාදී විශ්ලේෂණයක් කළොත්, මේ ඉදිරිපත් කරලා තිබෙන විශ්වාස භංගයේ පදනම ඔප්පු කිරීමට සමත් කිසිම සාක්ෂිමය කරුණක් ඉදිරිපත් කරලා නැහැ. අපි ආණ්ඩුවට අකැමැතිද, ආණ්ඩුවට විරුද්ධ ද, ආණ්ඩුවට පක්ෂ ද කියන එක වෙන කථාවක්. මේ විවාදයේ පදනම ගරු කථානායකතුමනි, මේ බෝම්බ ප්‍රහාරයේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමාට දැන් කථාව අවසන් කරන්න වෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මෙයයි. මේ විවාදය පුරා ජනතා විමුක්ති පෙරමුණේ හෝ විපක්ෂයේ වෙනත් පක්ෂයක කිසිම මන්ත්‍රීවරයෙක්, කිසිම

ආකාරයකින් අග්‍රාමාත්‍යවරයා හෝ කැබිනට් මණ්ඩලය හෝ ආණ්ඩුවට වගකීම පවරන්නා වූ කිසිම සාක්ෂියක් ඉදිරිපත් කර නැති නිසා, මේ යෝජනාව කිසිම පදනමක් නැති අර්ථ විරහිත තත්ත්වයට පත් වෙලා තිබෙනවා; යල් පැන ගිහිල්ලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඉදිරිපත් වූ සාක්ෂිවලින් පෙන්නුම් කරන්නේත් ඒ ස්වභාවයයි.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, අද දින සභාවේ වැඩ කටයුතු අවසාන වනතුරු කාලය ලබා ගන්න සභාවේ එකඟතාව අවශ්‍යයි. ඒකට එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර, නිශ්ශබ්ද වන්න. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, සභාව එකඟද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Divide!

බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -
பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -
At the conclusion of the Division Bell -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

කරුණාකරලා දැන් සියලුදෙනාම වාඩි වෙන්න. දැන්, ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)
(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)
(At this stage, the Voting commenced.)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා සිටිනවා නම්, කරුණාකර අත ඔසවන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා?

ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෆයිසාල් කාසිම් මන්ත්‍රීතුමා?

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
විරුද්ධයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සාලින්ද දිසානායක මන්ත්‍රීතුමා?

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
පක්ෂයි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -
வாக்கெடுப்பின் பின் -
On conclusion of the Voting -

මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.

(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)

(At this stage, the following names appeared on the digital screen in the Chamber.)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 92: විරුද්ධව 116: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.

இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 92; எதிராக 116; விலகியிருந்தோர் 0.

According to Electronic Voting, Parliament divided: Ayes 92: Noes 116: Abstain 0.

G 001. Rauff Hakeem	No
G 002. Mangala Samaraweera	No
G 004. John Amaratunga	No
G 005. Gayantha Karunatileka	No
G 006. Lakshman Kiriella	No
G 007. Ranil Wickremesinghe	No
G 009. Tilak Marapana	No
G 010. Wajira Abeywardana	No
G 011. Ravi Karunanayake	No
G 012. Rajitha Senaratne	No
G 013. Rishad Bathiudeen	No
G 014. Patali Champika Ranawaka	No
G 015. Kabir Hashim	No
G 016. Sajith Premadasa	No
G 017. Akila Viraj Kariyawasam	No
G 018. Malik Samarawickrama	No
G 019. Mano Ganesan	No
G 020. Navin Dissanayake	No
G 021. J.M. Ananda Kumarasiri	No

[ගරු සාලින්ද දිසානායක මහතා]

G 022. P. Harrison	No
G 023. R.M. Ranjith Madduma Bandara	No
G 024. Arjuna Ranatunga	No
G 025. Palany Thigambaram	No
G 026. Chandrani Bandara	No
G 027. Thalatha Atukorale	No
G 028. Abdul Haleem	No
G 029. Sagala Ratnayake	No
G 030. Harin Fernando	No
G 031. Daya Gamage	No
G 032. Ravindra Samaraweera	No
G 033. Sujeewa Senasinghe	No
G 034. Harsha De Silva	No
G 035. Ajith P. Perera	No
G 037. Ruwan Wijayawardene	No
G 038. Vasantha Senanayake	No
G 039. Lucky Jayawardana	No
G 040. Dilip Wedaarachchi	No
G 041. Niroshan Perera	No
G 042. A.D. Premadasa	No
G 043. Wasantha Aluwihare	No
G 044. Vijayakala Maheswaran	No
G 045. Eran Wickramaratne	No
G 046. Ranjith Aluvihare	No
G 047. J.C. Alawathuwala	No
G 048. Vadivel Suresh	No
G 049. Ranjan Ramanayake	No
G 050. Ashok Abeysinghe	No
G 051. Ajith Mannapperuma	No
G 052. Edward Gunasekara	No
G 053. Anoma Gamage	No
G 054. Karunarathna Paranawithana	No
G 055. Palitha Kumara Thewarapperuma	No
G 056. Nalin Bandara Jayamaha	No
G 057. Buddhika Pathirana	No
G 058. A.H.M. Fowzie	No
G 059. Piyasena Gamage	No
G 060. Lakshman Senewiratne	No
G 061. Wijith Wijayamuni Zoysa	No
G 062. D.M. Swaminathan	No
G 064. Ameer Ali Shihabdeen	No
G 065. Indika Bandaranayake	No
G 066. Palitha Range Bandara	No
G 068. H.M.M. Harees	No
G 069. Seyed Ali Zahir Moulana	No
G 070. M.S. Thowfeek	No
G 071. Manusha Nanayakkara	No
G 072. Abdullah Mahrooff	No
G 073. Sirinal de Mel	No
G 074. Anura Sidney Jayarathne	No
G 075. K.K. Piyadasa	No
G 076. Lakshman Ananda Wijemanne	No
G 077. A. A. Wijethunga	No
G 078. Hector Appuhamy	No
G 079. Sisira Kumara Abeysekara	No
G 080. Thushara Indunil Amarasena	No
G 081. A. Aravindh Kumar	No
G 082. Velu Kumar	No
G 083. Nalaka Prasad Colonne	No
G 084. Chandima Gamage	No
G 085. Kavinda Heshan Jayawardana	No
G 086. Mylvaganam Thilakarajah	No
G 087. Mayantha Dissanayake	No
G 088. Sujith Sanjaya Perera	No
G 089. Hirunika Premachandra	No
G 090. Bandula Lal Bandarigoda	No
G 091. M. Ibrahim Muhammad Mansoor	No
G 092. S.M. Marikkar	No
G 093. Imran Maharoof	No
G 094. Ishak Rahuman	No
G 095. Mujibur Rahuman	No
G 096. Harshana Rajakaruna	No
G 097. Thusitha Wijemanna	No
G 098. Rohini Kumari Wijerathna	No
G 099. Chaminda Wijesiri	No
G 100. Hesha Withanage	No
G 101. Sandith Samarasinghe	No
G 102. Chathura Sandeepa Senaratne	No
G 103. Wijepala Hettiarachchi	No
G 104. Ashu Marasinghe	No
G 105. Jayampathy Wickramaratne	No
G 106. Mohamadu Nazeer	No
G 107. S.M. Mohamed Ismail	No
G 115. Indika Anuruddha Herath	Yes
G 116. Malith Jayathilake	Yes
O 001. Sarath Amunugama	Yes
O 002. Sumedha G. Jayasena	Yes
O 003. W.D.J. Senewiratne	Yes
O 004. S.B. Dissanayake	Yes
O 005. Dinesh Gunawardana	Yes
O 006. Nimal Siripala de Silva	Yes
O 007. Chamal Rajapaksa	Yes
O 008. Mahinda Rajapaksa	Yes
O 009. Mahinda Amaraweera	Yes
O 010. Arumugan Thondaman	Yes
O 011. Pavithradevi Wanniarachchi	Yes
O 012. Salinda Dissanayake	Yes
O 013. Wimal Weerawansa	Yes
O 015. A.D. Susil Premajayantha	Yes
O 016. Gamini Lokuge	Yes
O 017. Rajavarothiam Sampanthan	No
O 018. Mavai S. Senathirajah	No
O 019. Anura Dissanayake	Yes
O 020. Ven. Athuraliye Rathana Thero	Yes
O 021. Selvam Adaikkalanathan	No
O 022. Anura Priyadharshana Yapa	Yes
O 023. Bandula Gunawardana	Yes
O 026. Janaka Bandara Tennakoon	Yes
O 027. C.B. Ratnayake	Yes
O 028. Muthu Sivalingam	Yes
O 029. Mahinda Yapa Abeywardena	Yes
O 030. Dilan Perera	Yes

O 031. Keheliya Rambukwella	Yes
O 032. Kumara Welgama	Yes
O 033. Dullas Alahapperuma	Yes
O 034. Johnston Fernando	Yes
O 036. T.B. Ekanayake	Yes
O 037. Dharmalingam Sithadthan	No
O 039. Nihal Galappaththi	Yes
O 040. Vijitha Herath	Yes
O 041. S.M. Chandrasena	Yes
O 042. Mahindananda Aluthgamage	Yes
O 043. Ranjith Siyambalapitiya	Yes
O 044. Piyankara Jayaratne	Yes
O 045. Vasudeva Nanayakkara	Yes
O 046. Lakshman Yapa Abeywardene	Yes
O 048. Rohitha Abeygunawardana	Yes
O 050. Chandima Weerakkody	Yes
O 051. Dayasiri Jayasekara	Yes
O 052. Faiszer Musthapha	Yes
O 054. Susantha Punchinilame	Yes
O 055. Lasantha Alagiyawanna	Yes
O 056. Premalal Jayasekera	Yes
O 057. K. Thurairetnasingam	No
O 058. Seeniththamby Yoheswaran	No
O 059. Sunil Handunnetti	Yes
O 060. Bimal Rathnayake	Yes
O 061. Thilanga Sumathipala	Yes
O 063. Sudarshini Fernandopulle	Yes
O 064. Weerakumara Dissanayake	Yes
O 065. Sriyani Wijewickrama	Yes
O 067. Siripala Gamalath	Yes
O 068. Duleep Wijesekara	Yes
O 070. Lakshman Wasantha Perera	Yes
O 071. Nishantha Muthuhettigamage	Yes
O 072. Shantha Bandara	Yes
O 073. Arundika Fernando	Yes
O 074. Tharanath Basnayake	Yes
O 075. Nimal Lanza	Yes
O 076. Anuradha Jayaratne	Yes
O 077. S. Shritharan	No
O 078. E. Saravanapavan	No
O 079. M.A. Sumanthiran	No
O 080. Nalinda Jayathissa	Yes
O 081. H.R. Sarathie Dushmantha	Yes
O 082. K. Kader Masthan	Yes
O 083. Angajan Ramanathan	Yes
O 084. Ananda Aluthgamage	Yes
O 085. S. Viyalanderan	Yes
O 087. Wimalaweera Dissanayaka	Yes
O 088. Jayantha Samaraweera	Yes
O 089. P. Udayashantha Gunasekara	Yes
O 090. Dilum Amunugama	Yes
O 091. Mohan Priyadarshana De Silva	Yes
O 092. T. Ranjith De Zoysa	Yes
O 093. Ramesh Pathirana	Yes
O 094. Vijitha Berugoda	Yes
O 095. Roshan Ranasinghe	Yes
O 096. Lohan Ratwatte	Yes
O 097. Kaveendiran Kodeeswaran	No
O 098. I. Charles Nirmalanathan	No
O 099. Gnanamuthu Srineshan	No
O 100. S. Sivamohan	No
O 101. Namal Rajapaksa	Yes
O 102. Janaka Wakkumbura	Yes
O 103. Vidura Wickramanayaka	Yes
O 104. Thenuka Vidanagamage	Yes
O 105. Shehan Semasinghe	Yes
O 106. Kanaka Herath	Yes
O 107. D.V. Chanaka	Yes
O 108. Sisira Jayakody	Yes
O 109. Piyal Nishantha De Silva	Yes
O 110. Sanath Nishantha Perera	Yes
O 111. S. Premarathna	Yes
O 112. Tharaka Balasuriya	Yes
O 113. Shanthi Sriskandarasa	No
O 114. Prasanna Ranatunga	Yes
O 115. Prasanna Ranaweera	Yes
O 116. Kanchana Wijesekara	Yes

Electronic Voting Results

YES	92
NO	116
ABSTAIN	0

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

ගරු සාලින්ද දිසානායක මැතිතුමාගේ ඡන්දය ලකුණු වෙලා තිබෙනවා. විද්‍යුත් ඡන්ද විමසීම අනුව යෝජනාවට පක්ෂව ඡන්ද 92යි. යෝජනාවට විපක්ෂව 116යි. නැඟීසිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 03යි. ඒ අනුව, යෝජනාවට විපක්ෂව මුළු ඡන්ද 119යි. ඒ අනුව යෝජනාව පරාදයි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ.භා. ***6.30*** *පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. ***6.41ට 2019 ජූලි 12*** *වන සිකුරාදා පූ.භා.* ***10.30*** *වන තෙක් කල් ගියේය.*

அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.41க்கு, பாராளுமன்றம் 2019 யூலை 12, வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

And it being past 6.30 p.m., THE HON. SPEAKER *adjourned Parliament without Question put.*

Adjourned accordingly at 6.41 p.m. until 10.30 a.m. on Friday 12th July, 2019.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.